# වාර්ෂික වාර්තාව
# 2013



**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
පේරාදෙණිය ශ්‍රී ලංකාව

www.pdn.ac.lk

# වාර්ෂික වාර්තාව

## (පාලන හා ගිණුම්)

## 2013

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

## දැක්ම

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කළාපයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැක්ම වනු ඇත.

## මෙහෙවර

සමාජීය වශයෙන් සංවේදීවූත්, සදාචාරාත්මක හා සුසංවර බවින් පිරිපුන්වූත්, අධ්‍යාපනය හරහා ආර්ථිකමය වශයෙන් සෞභාග්‍යමත්වූත් සහ පර්යේෂණ, දැනුම ව්‍යාප්ත කිරීම, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය හා කාර්යක්ෂමව සැලසුම් කරනු ලැබූ සංවර්ධනය යන කර්තව්‍යයන් කෙරෙහි ක්‍රියාශීලි ලෙස සහභාගි විය හැකිවූත්, බුද්ධිමය වශයෙන් ප්‍රබෝධමත් හා වාදභේද රහිතවූත්, විශ්වවිද්‍යාල පරිසරයක් තුළින් දැනුම පාදක කරගත් සමාජ වටපිටාවක් ගොඩනැගීම සඳහා උරදීම විශ්වවිද්‍යාලයේ කාර්යභාරය වනු ඇත.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

# පටුන


| | | |
|---|---|---|
| 1. | උපකුලපතිතුමන්ගේ සමාලෝචනය | 1 |
| | 1.1 කෙටි හැඳින්වීම | 1 |
| | 1.2 අත්කරගත් ජයග්‍රහණ සහ පිළිගැනීම් | 4 |
| | 1.3 බාධක සහ පිළියම් | 16 |
| | 1.4 අනාගත සැලසුම් | 16 |
| | 1.5 පාලක සභාව හා සනාතන සභාව | 16 |
| 2. | සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර | 17 |
| 3. | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 18 |
| 4. | විදෙස් සිසුන් පිළිබඳ විස්තර | 19 |
| 5. | (අ) අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර | 19 |
| | (ආ) අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල විස්තර | 22 |
| 6. | අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර | 22 |
| 7. | පර්යේෂණ, නව නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර | 23 |
| 8. | වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර | 23 |
| 9. | ලද සම්මාන පිළිබඳ විස්තර | 24 |
| 10. | ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර | 24 |
| 11. | පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 25 |
| 12. | මූලධන වියදම් විස්තර | 25 |
| 13. | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) | 25 |
| 14. | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) | 25 |
| 15. | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 25 |
| 16. | මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (සාමාන්‍ය ආදායම) | 26 |
| 17. | 2013 වසරේ මුදල් කාර්ය සාධන විශ්ලේෂණය | 26 |
| 18. | 2013 යටිතල පහසුකම් පිළිබඳ විස්තර | 26 |
| | (අ) 2013 වසරේ ක්‍රියාත්මක වන මූලධන ව්‍යාපෘති | 26 |
| | (ආ) 2013 වසර සඳහා ක්‍රියාත්මක වන සියලු පුනරුත්ථාපන ව්‍යාපෘති | 27 |
| | (ඇ) 2013 වසරේ අවසන් කළ ව්‍යාපෘති | 29 |
| | (ඈ) 2013 වසරේ අවසන් කළ පුනරුත්ථාපන ව්‍යාපෘති | 30 |


**19. උපග්‍රන්ථ**

### උපග්‍රන්ථය A - පීඨ වාර්තා


| | | |
|---|---|---|
| A1 | කෘෂිවිද්‍යා පීඨය | 31 |
| A2 | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 33 |
| A3 | ශාස්ත්‍ර පීඨය | 36 |
| A4 | දන්ත වෛද්‍ය පීඨය | 40 |
| A5 | ඉංජිනේරු පීඨය | 42 |
| A6 | වෛද්‍ය පීඨය | 44 |
| A7 | විද්‍යා පීඨය | 47 |
| A8 | පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය | 50 |
| A9 | පශ්චාත් උපාධි ආයතන | 53 |
| | A9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 53 |
| | A9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 58 |


### උපග්‍රන්ථය B - විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථාන


| | | |
|---|---|---|
| B1 | කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | 64 |
| B2 | කෘෂිව්‍යාපාර මධ්‍යස්ථානය | 67 |
| B3 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 69 |
| B4 | ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය | 71 |
| B5 | මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය | 74 |
| B6 | පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය | 76 |
| B7 | ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය | 78 |
| B8 | හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | 81 |

**උපග්‍රන්ථය C - ඉගෙනුම් සහයක සේවාවන්**

C1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය 83
C2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 85
C3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය 87
C4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය 89

**උපග්‍රන්ථය D - උපස්ථම්භක සේවාවන්**

D1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 91
D2 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන් 94
D3 21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය (HETC) 96
D4 ශාරීරික අධ්‍යාපන අංශය 97
D5 ශිෂ්‍ය සේවා අංශය 100
D6 ආරක්ෂක සේවාවන් 102
D7 විනයාරක්ෂක අංශය 103
D8 උද්‍යාන අංශය 104

**උපග්‍රන්ථය E- පාලක සභාව සහ සනාතන සභාව**

E1 පාලක සභාව 106
E2 සනාතන සභාව සහ එහි සාමාජිකත්වය 107

**උපග්‍රන්ථය F- ව්‍යාපෘති පිළිබඳ විස්තර**

F1 ව්‍යාපෘති (දෙස්/විදෙස් ආධාර කළ) පිළිබඳ විස්තර - 2013 113
F2 ව්‍යාපෘති වැය පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් ) – 2013 120

**උපග්‍රන්ථය G– මුදල් ප්‍රකාශනය**

G1 2013 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්ව ප්‍රකාශනය 126
G2 2013 දෙසැම්බර් 31 දිනට මුදල් කාර්ය සාධන ප්‍රකාශනය 128
G3 2013 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 129
G4 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම් 130
G5 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාන අගය වෙනස්වීම 131

**උපග්‍රන්ථය H - විගණන කමිටු වාර්තාව - 2013** 132

**උපග්‍රන්ථය I – විගණන වාර්තා**

I1 විගණකාධිපති වාර්තාව - 2013 133
I2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර 160



# 01 උපකුලපතිතුමන්ගේ සමාලෝචනය

## 1.1 කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට පසුව 1942 වසරේ ජූලි මස පළමු වැනි දින කොළඹදී ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙරට අනෙකුත් විශ්වවිද්‍යාල අතරින් පැරණිම හා විශාලතම විශ්වවිද්‍යාලයයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය 1952 වසරේ ඔක්තෝබර් මස 06 වැනි දින පේරාදෙණියට ගෙන ඒමත් සමඟම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ස්ථාපිත කිරීම නියමාකාරයෙන් සනිටුහන් කරන ලදි. මධ්‍යම පළාතේ මහනුවර නගරයේ සිට කිලෝමීටර අටකට (08) පමණ ඈත ස්වභාවික සෞන්දර්යයෙන් හෙබි ප්‍රදේශයක පිහිටි විශ්වවිද්‍යාලය අක්කර 1947ක් පුරා පැතිර යන භූමි ප්‍රමාණයකින් යුතු, අධ්‍යාපන, නේවාසික පහසුකම්, ක්‍රීඩා හෝ සංස්කෘතික යන කුමන කරුණකින් වුවත්, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලයන් අතරින් අද්විතීය අත්දැකීමක් දායාද කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි.

පසුගිය වසර 72ක කාලය පුරාවට විශිෂ්ට ගණයේ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ව්‍යාප්ත වී ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව පවතින අතරම, මෙරට එකම කීර්තිමත් විශ්වවිද්‍යාලය ද වෙයි. 1942 වසරේ හතරක්ව පැවති පීඨ සංඛ්‍යාව වර්තමානය වනවිට අට (08) දක්වා ඉහළ ගොස් ඇත. කෘෂිවිද්‍යා, සමසෞඛ්‍ය, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා හා පශු වෛද්‍ය යන පීඨ ඒ අතර වේ. ආරම්භයේදී අධ්‍යයන අංශ 18කට සීමාවූ අතර, එම සංඛ්‍යාව වර්තමානය වනවිට ක්ෂේත්‍ර රාශියකින් සමන්විත අධ්‍යයන අංශ 74ක් වේ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යන පශ්චාත් උපාධි ආයතන දෙකකින් ද මෙම විශ්වවිද්‍යාලය සමන්විත වේ.


අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයකටත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් නේවාසික පහසුකම් සපයන විශ්වවිද්‍යාලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සැලසුම් කරන ලදි. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 80%කට වැඩි පිරිසකට නේවාසික පහසුකම් සපයන නේවාසිකාගාර 17ක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් විශ්වවිද්‍යාලයේ විවිධ ජන කොටස්වල අභිරුචීන් පිරිමසාලන සිද්ධස්ථාන, සංගම් රාශියකින් ඉටු කෙරෙන ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම්වලින් යුතු සිසුන් මෙන්ම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඇතුළත්වීමට අපේක්ෂා කරන්නන් අතරෙහි ද මෙරට වඩාත් දැකුම්කළු විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 10,000ක් පමණ වන අතර, අධ්‍යයන, පරිපාලන හා සේවා අංශ හරහා පැතිර යන මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව ආසන්න වශයෙන් 3300කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කලා, නීතිය හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සිට භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ඉංජිනේරු හා පරිගණක විද්‍යාව, කෘෂි විද්‍යාව, දන්ත වෛද්‍ය, වෛද්‍ය, සම සෞඛ්‍ය, විද්‍යා, පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩ සටහන් 58 ක් ප්‍රදානය කරනු ලබයි. සම සෞඛ්‍ය විද්‍යා පීඨයත්, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයක් හා භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයක් පවතින මෙරට එකම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි සිසුන් ද ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 6416කි.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පැරණි හා මාර්ගගත (Online) යන ක්‍රමයන් භාවිතා කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උපාධි මට්ටමේ සුදුසුකම් ලබා දෙන බාහිර පුහුණු අවස්ථාවන් සැලසුම් කොට පිරිනැමීමේ කාර්ය භාරය උසුලයි. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කලා හා විද්‍යා බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 25000ක් පමණ වන අතර, සිසුන් 500ක් පමණ වෙනත් අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා හදාරති. විශ්වවිද්‍යාල මධ්‍යම පරිපාලනය පරිපාලන අංශ අටකින් (සාමාන්‍ය පරිපාලන පද්ධතිය) මුදල් අංශය, අභ්‍යන්තර විගණන අංශය, සේවා අංශ නවයකින් (සාමාන්‍ය සේවා පද්ධතිය) හා මධ්‍යස්ථාන/ඒකක 22කින් යුක්ත වේ. මධ්‍යම පරිපාලන සැලැස්ම පිටු අංක තුනෙහි (03) දැක්වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන වැඩසටහන්වලට සහය වන වැදගත් ඉගෙනුම් සහයක සේවාවන් හතරකි. ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ලෙස හැඳින්වේ. විශේෂිත පුහුණු හා සේවා කෘත්‍යයන් ඉටු කිරීම සඳහා වෙනත් මධ්‍යස්ථාන හා ඒකක කිහිපයක් ස්ථාපිත කොට ඇති අතර, එම මධ්‍යස්ථාන හා ඒකක විසින් ඩිප්ලෝමා හා සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හා විවිධ තාක්ෂණික හා වෘත්තීය සේවාවන් මූලිකවම ගාස්තු අය කිරීමේ පදනම මත සැලසුම් කොට පිරිනමනු ලබයි. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකකවල ජයග්‍රහණයන් හා සාමාන්‍ය විස්තර උපග්‍රන්ථ 'B' හි විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

## Organization Chart




DR - Deputy Registrar
DB - Deputy Bursar
DIA - Deputy Internal Audit
SAR - Senior Assistant Registrar
AR - Assistant Registrar
SAB - Senior Assistant Bursar
AB - Assistant Bursar
PGIA - Postgraduate Institute of Agriculture

PRO - Public Relations Officer
PM - Project Manager
SO - Statistical Officer
CMO - Chief Medical Officer
CSO - Chief Security Officer
SSA - Senior System Analyst
PGIS - Postgraduate Institute of Science

## 1.2 අත්කරගත් ජයග්‍රහණ සහ පිළිගැනීම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨ, පශ්චාත් උපාධි ආයතන, මධ්‍යස්ථාන හා ඒකකවල සාමාන්‍ය විස්තර හා අත්පත් කරගත් ජයග්‍රහණ විස්තරාත්මකව ග්‍රන්ථ "A" හි දැක්වේ.

සමාලෝචිත වර්ෂයේදී අත්කරගත් ප්‍රධාන ජයග්‍රහණ පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කොට දැක්විය හැකිය.

### 1.2.1 උපාධි ප්‍රදානෝත්සවය 2012

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය 75 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2013 මැයි මස 30 වැනි දින විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි. මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රථම උපාධි 2454ක් හා පශ්චාත් උපාධි 766ක් ප්‍රදානය කරන්නට විය. මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී ශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන් දෙදෙනෙකු වන ජයලත් මනෝරත්න හා ආචාර්ය එච්.ඒ.ඩී. අබේවර්ධන යන සම්භාවනීය කලාකරුවන් දෙපලට ඔවුන්ගෙන් සමාජයට සිදුවූ මෙහෙවර උදෙසා සම්මාන උපාධි ලෙස සාහිත්‍ය දර්ශනශූරී උපාධිය පිරිනමන ලදි.

### 1.2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය (PURSE)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය 2012 විශ්වවිද්‍යාල අධ්‍යයන වාර සටහනේ වඩාත් ඉස්මතුවී පෙනෙන කාර්යයන්ගෙන් එකකි. මෙම සැසියේදී පුළුල් තේමාවන් එනම් සෞඛ්‍ය හා ස්වස්ථතාව, ආහාර පෝෂණය, පශු සම්පත්, ශාඛ විද්‍යාවන් හා වන ජීවින්, ස්වභාවික විද්‍යාවන්, තොරතුරු තාක්‍ෂණය, ගණිතය හා සංඛ්‍යාතය, ඉංජිනේරු අධ්‍යාපනය, සමාජ විද්‍යාවන් හා මානව ශාස්ත්‍ර යන පුළුල් තේමාවන් මත පදනම්ව පර්යේෂණ පත්‍ර 267ක් හා පෝස්ටර ඉදිරිපත් කිරීම් 19ක් ඉදිරිපත් කරන ලදි. 2013 වසරේ මෙම පර්යේෂණ සැසිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසිය (PURSE) ලෙස පැවැත්වෙනු ඇත.

**1.2.3** පේරාදෙණිය විශ්වවිද්‍යාලය අධ්‍යයන කාර්ය සාධනය මත පදනම්ව විශ්වවිද්‍යාල වර්ගීකරණයෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතුරින් ප්‍රථම ස්ථානයත් ලෝක විශ්වවිද්‍යාල අතුරින් 1466 වැනි ස්ථානයත් හිමිකරගෙන සිටී. මෙම ජයග්‍රහණය අත්කර ගැනීම වෙනුවෙන් දායකවූ විශ්වවිද්‍යාල ප්‍රජාවට උපකුලපතිතුමන් ඔහුගේ කෘතඥතාවය පළ කර සිටී.

### 1.2.4 ජපාන තානාපති කාර්යාලයේ සහයෙන් ස්ථාපිත කරන ලද ජපන්-ශ්‍රී ලංකා අධ්‍යයන මධ්‍යස්ථානය

ජපන්-ශ්‍රී ලංකා අධ්‍යයන මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකා ජපන් තානාපති කාර්යාලයේ සහයෝගිතාවයෙනි. ශ්‍රී ලංකාව හා ජපානය අතර පර්යේෂණ සහයෝගිතාවන් තව තවත් ශක්තිමත් කිරීම මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථයයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති, මහාචාර්ය අතුල සේනාරත්න මහතා විසින් 2013 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකාවේ මහනුවර පිහිටි අර්ල්ස් රිජෙන්සි හෝටලයේ පැවති උත්සවයේදී මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම ප්‍රකාශයට පත් කරන ලදි.

### 1.2.5 ලෝක බැංකුවේ සහයෝගයෙන් ඉඩම් අත්කර ගැනීම, නිරවුල්කරණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

### 1.2.6 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මාධ්‍ය ඒකක ප්‍රති-ස්ථාපනය කිරීම

### 1.2.7 2013 සැප්තැම්බර් 06 වැනි දින සිට විශ්වවිද්‍යාල රථවාහන ඒකකය යළි ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම

වසර දෙකක කාලයක සිට අක්‍රියව පැවති විශ්වවිද්‍යාලයීය රථ වාහන ඒකකය එහි කළමනාකරණ ව්‍යුහය ප්‍රතිසංස්කරණය කොට වැඩිදියුණු කිරීමෙන් අනතුරුව උපකුලපතිතුමන්ගේ හා ඉංජිනේරු පීඨයේ පීඨාධිපති මහාචාර්ය එල්. රාජපක්ෂ යන මහතුන්ගේ මග පෙන්වීම යටතේ හා ආචාර්ය ප්‍රසන්න ගුණවර්ධන (වැඩබලන අධ්‍යක්ෂ) හා යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ (අංශ ප්‍රධානි) ඩී.එම්.එම්. දිසානායක (වැඩ අධිකාරි) හා එම ඒකකයේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කරන ලදි. විශ්වවිද්‍යාලයට අයත් වාහන සමුදාය අළුත්වැඩියා කිරීමේ හා නිත්‍ය නඩත්තු කටයුතු සේවාවන් ලබා දීමේ හැකියාව මේ වනවිට මෙම ඒකකයට ලැබී ඇත.

### 1.2.8 විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය උපකුලපති, මහාචාර්ය අතුල සේනාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හා මහනුවර පාසල් කිහිපයක විද්‍යා ගුරුභවතුන්ගේ හා පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් 2013 මාර්තු 18 වැනි දින විවෘත කරන්නට විය. මෙවන් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දක්නට නොමැත. පාසල් දරු දැරියන්ට හා සාමාන්‍ය මහජනතාවට විද්‍යාත්මක සංකල්ප පිළිබඳ දැනුම ලබාදීම සඳහා විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩලය සම්පත්දායකයන් ලෙස ස්වේච්ඡාවෙන්ම දායකත්වය ලබාදේ.

### 1.2.9 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගත් සම්මාන

- **ආනන්ද කුමාරස්වාමි පදක්කම උපකුලපතිතුමන්ට පිරිනැමීම**

ඉහත පදක්කම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ට ප්‍රදානය කරන ලදි. ආනන්ද කුමාරස්වාමි අනුස්මරණ පදක්කම සෑම වසරකම ශ්‍රී ලංකාවේ භූගර්භ විද්‍යා ක්ෂේත්‍රයේ නව එළඹුම් වෙනුවෙන් වැදගත් දායකත්වයක් දක්වන විශිෂ්ට ගණයේ භූගර්භ විද්‍යාඥයාට පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා භූගර්භ විද්‍යා සංගමය මේ වනවිට මෙම පදක්කම ශ්‍රී ලංකාවේ භූගර්භ විද්‍යා ක්ෂේත්‍රය ඉහළ නැංවීම වෙනුවෙන් ඉමහත් සේවාක් ඉෂ්ඨසිද්ධ කළ අග්‍රගණ්‍ය භූගර්භ විද්‍යාඥයන් 14 දෙනෙකුට ප්‍රදානය කොට ඇත.

- **ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉදිරිපත්වූ කණ්ඩායමක් 2013 ABU ROBOCON ජාත්‍යන්තර රොබට් තරඟයේදී පාකිස්තානය පරාජය කරයි.**

ශ්‍රී ලංකා ABU ROBOCON, ඉතිහාසයේ ප්‍රථම වරට ඉතාම තරඟකාරිවූ රොබෝ තරඟ අභියෝගතාවය දිනා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. පේරාදෙණිය ඉංජිනේරු පීඨයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළ කණ්ඩායම මූලික වටයේදී 20-0 ක් ලෙස පාකිස්තානය පරාජය කළේය.

ශ්‍රී ලංකාව 2005 වසරේ සිට මෙම තරඟයට සහභාගිවී ඇත. මෙම තරඟය සඳහා තරඟකරුවන් තෝරාගනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ පවත්වන දේශීය තරඟයකින් අනතුරුවයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨ කණ්ඩායම 2005-2008 වසර දක්වා මෙසේ ලංකාවේ පැවැත්වූ තරඟවල ශූරයන් බවට පතවී නැවත 2011 වසරේදීද මෙම ජාත්‍යන්තර තරඟය නියෝජනය කළේය. එම තරඟවලදී පේරාදෙණිය කණ්ඩායමේ දක්ෂතා ප්‍රශස්ත මට්ටමක පැවතිණ. මෙම අංශයෙන් මෙලෙස ප්‍රතිඵල ලබා ගැනීමට ප්‍රධාන වශයෙන් මේ පිළිබඳව උනන්දුවන සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ ඉමහත් වූ කැපවීම හා වෙහෙස මහන්සිය නිසාවෙනි. විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයේ රොබෝ සංගමයේ සාමාජිකයන්ගේ කැපවීම හා මහන්සිය ද මීට හේතු විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දිලනි ගුණවර්ධන 2013 AARA වාර්ෂික සමුළුවලට සහභාගිවීම සඳහා කෘෂිකර්ම හා ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ අනුග්‍රහය ලද ගමන් ප්‍රදානය දිනාගත් පහළ හා මධ්‍යම ආදායම්ලාභී රටවලින් තෝරාගත් පර්යේෂකයන් හය දෙනාගෙන් එක් අයෙකු විය.

ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිටපු සාමාජිකාවක් වන මාරිකෝ විජේකෝන් මහත්මිය AAEA අරමුදලේ අනුග්‍රහය ලද චෙස්ටර් ඕ.එම්.සී. කොර්කි ශිෂ්‍යත්වය දිනාගනිමින් ඇගේ ජයග්‍රහණයන් වෙනුවෙන් ඉහත සඳහන් කළ උත්සවයේදීම පිළිගැනීමට ලක් වූවාය. ඇය ඇමෙරිකාවේ ක්ලාක් විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධි අපේක්ෂිකාවකි.

සරසවි සංස්කෘත ත්‍යාගය 2012-ශාස්ත්‍ර පීඨයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශයේ රෝහණ සෙනවිරත්න විසින් ඉහත ත්‍යාගය දිනාගන්නා ලදි. සරසවි සංස්කෘත ත්‍යාගය වසර දෙකකට වරක් ප්‍රදානය කෙරෙන අතර, එය 2008 වසරේදී ඉන්දීය සංස්කෘතික සම්බන්ධතා සභාව හා ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු සංස්කෘතික හා ආගමික ඉතිහාස අධ්‍යයන අංශය සමඟ එක්ව ස්ථාපිත කරන ලද්දකි. 2013 මාර්තු 25 වැනි දින නවදිල්ලි නුවරදී පවත්වන ලද නිල උත්සවයකදී මෙම ත්‍යාගය සෙනෙවිරත්න මහතාට ප්‍රදානය කරන ලදි. සියළු පහසුකම් සහිතව දින දහයක් ඉන්දියාවේ සංචාරය කිරීමේ අවස්ථාව ද මෙම ත්‍යාගයට ඇතුළත් විය. සෙනවිරත්න මහතා එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ සංස්කෘත පිළිබඳ දර්ශනශූරී උපාධිය හදාරමින් සිටී. ශ්‍රී ලාංකිකයෙකු විසින් මෙම කීර්තිමත් ත්‍යාග දිනාගත් ප්‍රථම අවස්ථාව ද මෙය වේ.

- **SUSRED ත්‍යාගය 2013 - මහාචාර්ය අයි. බී. ගවරම්මන**

වෛද්‍ය පීඨයේ මහාචාර්ය අයි.බී. ගවරම්මාන මහතාට දර්ශනශූරී උපාධි නිබන්දන අධීක්ෂණය කිරීම වෙනුවෙන් ගෞරවයක් ලෙස ඉහත ත්‍යාගය පිරිනමන ලදි.

- **ඇමෙරිකාවේ රොටරි ඉන්ටනැෂනල් වෙතින් "Rotary Service Above Self Award 2013" ත්‍යාගය ශ්‍රී ලාංකික විද්වතෙකු විසින් දිනාගනී.**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨයේ ප්‍රජාදන්ත වෛද්‍ය අධ්‍යාපන අංශයේ අංශ ප්‍රධානි වෛද්‍ය ඩී. විජයකුමාරන් විසින් ස්වේච්ඡා සේවාවන් තුළින් සාමය ගොඩනැගීම සඳහා ගත් ඔහුගේ කැපවීම හා ආදර්ශමත් උත්සාහයන්ට ගෞරවයක් ලෙස ඉහත සඳහන් ප්‍රසිද්ධ ත්‍යාගය දිනාගෙන ඇත. රොටරි ඉන්ටනැෂනල් රටවල් 200ක සාමාජික සංඛ්‍යාව වන මිලියන 1.2ක් අතුරින් තෝරාගන්නා අග්‍රගණ්‍ය රොටරි සාමාජිකයන් 150කට මෙම ත්‍යාගය වාර්ෂිකව පිරිනමනු ලබයි. එම ආයතනයේ අධ්‍යක්ෂකතුමා විසන් ඔහුට මෙම ත්‍යාගය 2013 පෙබරවාරි මස 13 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද උත්සවයකදී පිරිනමන ලදි. විජයකුමාරන් මෙම ත්‍යාගය දිනාගැනීම තුළින් තම වෘත්තියට මෙන්ම රටට ද කීර්තියක් අත්කර දී ඇත. ඔහු 2001/2002 වසරේ ශ්‍රී ලංකාවේ රොටරි සමාජයේ දිස්ත්‍රික් තනතුර දරමින් ශ්‍රී ලංකාවට මහත් කීර්තියක් අත්කර දෙන්නට විය.

- **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදර්ශන් සෙනවිරත්න ඇමෙරිකාවේ ප්‍රධාන පෙළේ සම්මාන දෙකක් දිනාගෙන ඇත.**

ඇමෙරිකාවේ වයිට්මන් විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ පුරාවිද්‍යාව පිළිබඳ විශිෂ්ට මහාචාර්ය එඩ්වඩ් එෆ්. ආර්නල්ඩ් (2012/2013)

2013 ජනවාරි මාසයේදී ඇමෙරිකාවේ පුරාවිද්‍යා ආයතනය විසින් මෙම ත්‍යාගය පිරිනමන ලදි. (1879 වසරේදී මෙම ත්‍යාගය පිහිටුවීමෙන් අනතුරුව ආසියානු ජාතිකයෙකුට මෙම ත්‍යාගය පිරිනමන ලද ප්‍රථම අවස්ථාව මෙය වේ.)

පහත සඳහන් ජයග්‍රහණ අත්කර ගැනීම වෙනුවෙන් ජූලි 29 වැනි දින පවත්වන ලද සම්මාන උළෙලේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට විශේෂ සම්මාන දෙකක් ලැබී ඇත.

(i) වැඩිම QIG ප්‍රදාන සංඛ්‍යාවක් ලබා ගත් විශ්වවිද්‍යාලය (කැළණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව)
(ii) පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් තරඟයේදී ඉහළම ලකුණු ලබාගත් විශ්වවිද්‍යාලය

- සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලියනගේ අමරකීර්ති ඔහුගේ අළුත්ම, "ඒ මිහිරි සීනු නාදය", කථා එකතුව වෙනුවෙන් විද්‍යෝදය සාහිත්‍ය සම්මානය දිනාගන්නා ලදි.

- **වාණිජමය වශයෙන් වටිනා පර්යේෂණය 2013 සඳහා නේචර්ස් සීක්‍රට් පර්යේෂණ ත්‍යාගය**

  විද්‍යා පීඨයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් ඔවුන්ගේ මිලෙන් අඩු ක්‍රීඩා උපකරණයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙම ත්‍යාගය දිනාගන්නා ලදි. මෙම පර්යේෂණ කාර්යය සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා එක්ව සිදුකළ පර්යේෂණ ව්‍යාපෘතියක ප්‍රතිඵලයකි. මෙම කාර්යයෙහි ප්‍රධාන විමර්ශකයක් ලෙස මහාචාර්ය සාලුක කොඩිතුවක්කු හා ආචාර්ය අමල්කා පිනිදියආරච්චි කටයුතු කළ අතර, දර්ශනපති උපාධි අපේක්ෂක ලෙස ගිහාන් කුරුප්පු කටයුතු කරන්නට විය. ජාතික පර්යේෂණ සභාව මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයූ අතර, මලල ක්‍රීඩාවන්ගෙන් ජාත්‍යන්තර පදක්කම් දිනාගැනීමේ ශ්‍රී ලාංකික අපේක්ෂාවනුත් ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අභිලාෂයනුත් අතර පවතින පරතරය යා කිරීම මෙහි ඉලක්කය විය.

  මෙහි ත්‍යාග පිරිනැමීමේ උත්සවය 2013 අප්‍රේල් මස 22 වැනි දින විද්‍යා පීඨයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ශ්‍රවණාගාරයේදී ජාතික පර්යේෂණ සභාවේ සභාපති මහාචාර්ය එරික් කරුණානායක ප්‍රධාන අමුත්තා ලෙසත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය අතුල සේනාරත්න ගරු ආරාධිතයා ලෙසත් සහභාගිවීමෙන් පවත්වන ලදි. විද්‍යා පීඨයේ පීඨාධිපති, ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, නේචර් බියුටි ක්‍රියේෂන්ස් සමාගමේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ සමන්ත කුමාරසිංහ මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් කිහිප දෙනෙකු හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් ද මෙම උත්සවයට සහභාගි වූහ.

  ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ආර්ථික විද්‍යා කථිකාචාර්ය ආචාර්ය කේ.එම්.ආර්. කරුණාරත්න මහත්මිය ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2012 අධ්‍යයන වර්ෂයේ විශිෂ්ට ගණයේ දර්ශනශූරී උපාධි නිබන්ධන ත්‍යාගලාභියා ලෙස තෝරාගන්නා ලදි.

### 1.2.10 සිසුන් විසින් හිමිකරගත් ත්‍යාග

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශයේ ශිහාරා පෙරේරා මිය හා මේනුක රවෙල් යන දෙදෙනා 2013 NIRMAAN ජාත්‍යන්තර සිවිල් ඉංජිනේරු ශිෂ්‍ය සම්මන්ත්‍රණයේදී පිළිවෙළින් ප්‍රථම හා දෙවන ස්ථාන ලබා ගත්හ. මෙය 2013 සැප්තැම්බර් මස 28-29 යන දෙදින තුළ ඉන්දියාවේ බැංගලෝර්හිදී පවත්වන ලදි. මෙය සංවිධානය කරන ලද්දේ ඉන්දියාවේ බැංගලෝර්හි BMS ඉංජිනේරු විද්‍යාලය විසිනි.

- ශිහාරා පෙරේරා මිය ඇගේ ප්‍රථම උපාධි පර්යේෂණය සඳහා නුවර වැව වටා නව අඩි පාරක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ අතර මේනක රවෙල් මහතා ඔහුගේ ප්‍රථම උපාධි පර්යේෂණය සඳහා "ජලාශවල රොන්මඩ ඉවත් කිරීම පිළිබඳ ගවේෂණාත්මක විමර්ශනයක්" යන යෝජනාව ඉදිරිපත් කරන ලදි.

- ආර්.එස්. තල්ගහගොඩ, වයි.ඒ ඉලංගසේකර හා ඒ.එස්. අභයගුණවර්ධන කතෘත්වයෙන් 'The effect of alternate day corticosteroids on linear growth in childhood nephroticsyndrom' යන උපුටන තේමාවෙන් ඉදිරිපත් කළ පෝස්ටරය හොඳම පෝස්ටරය ඉදිරිපත් කිරීම ලෙස පෝස්ටර 35ක් අතුරින් පොදු රාජ්‍ය මණ්ඩලීය ළමා සංගමයේ විද්‍යාත්මක සැසියේදී තෝරාගන්නා ලදි. මෙය 2013 දෙසැම්බර් මස 06 හා 07 යන දෙදින තුළ පවත්වන්නට විය.

- **ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තරඟ 2013**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාන්තා හොකී කණ්ඩායම 2013 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය කරඟාවලියේදී හොකී කාන්තා ශූරතාවය දිනා ගනිමින් ඔවුන්ගේ විශ්වවිද්‍යාලයට අභිමානයක්

අත්කර දුන්හ. 2013 මැයි මස 8-10 යන දිනවල කොළඹ පොලිස් පිටියේ පැවති මෙම තරඟයෙන් 1-0 ලෙස පරාජයට පත් වූයේ කොළඹ විශ්වවිද්‍යාලයීය කාන්තා හොකී කණ්ඩායමයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මල්ලවපොර ක්‍රීඩකයන් විසින් මොරටුව විශ්වවිද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවති මල්ලව පොර ශූරතා තරඟයේදී තවත් ජයග්‍රහණයක් අත්කර දෙන ලදි. අපගේ මල්ලවපොර කණ්ඩායම එම ශූරතාවයේදී රන් පදක්කම් 02ක්, රිදී පදක්කම් 03ක් හා ලෝකඩ පදක්කම් 02ක් දිනා ගත්හ.

කොළඹ හැව්ලොක් ක්‍රීඩාංගණයේ පැවති රග්බි අවසන් තරඟයේදී තියුණු සටනකින් පසු පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කණ්ඩායම දෙවන ස්ථානය හිමි කර ගත්තේය.

පේරාදෙණිය පිරිමි හා කාන්තා ටෙනිස් කණ්ඩායම් පිළිවෙළින් මොරටුව හා කොළඹ විශ්වවිද්‍යාල පරදවා දෙවන ස්ථාන ලබා ගත්හ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ටෙනිස් ශූරතා තරඟාවලිය කොළඹ ශ්‍රී ලංකා ටෙනිස් සංගම් පිටියේදී මැයි 05-07 දින දක්වා පවත්වන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පිරිමි චෙස් කණ්ඩායම ඉතා දක්ෂ ලෙස ක්‍රීඩා කරමින් දෙවන ස්ථානයට පත් විය.

දැල් පන්දු, කැරම් (කාන්තා), කරාටේ (පිරිමි/කාන්තා) හා පැසි පන්දු පිරිමි යන වෙනත් ක්‍රීඩා අංශවලින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයන් තෙවන ස්ථාන අත්කර ගත්හ. මෙම තරඟ මහරගම ජාතික තරුණ සේවා සභාව හා මොරටුව විශ්වවිද්‍යාලය ඇතුළු විවිධ ස්ථානවලදී පවත්වන ලදි.

අවසන් වසරේ දන්ත වෛද්‍ය ශිෂ්‍යයෙකු වන එම්.පී.එම්. එරංග ප්‍රභාත් "දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස්වැනි හිරෝෂිමා සමුළුවේදී" හා "ආහාර හා පෝෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදීත්" පෝස්ටරයක් ඉදිරිපත් කළේය. මෙය 2013 ඔක්තෝබර් 12 සිට 14 දින දක්වා ජපානයේදී පවත්වන ලදි.

- **11 වැනි අන්තර් වෛද්‍ය පාඨශාලා භෞතික විද්‍යා විවාද තරඟය - මහාචාර්ය ඒ. රාමන් අභියෝගතා ශූරතාව**

ජාත්‍යන්තර අධ්‍යාපනික අංගයක් ලෙස පැවැත්වෙන ඉහත තරඟය 2013 අගෝස්තු මස 28-29 යන දිනවල මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර මැලේසියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේදී පවත්වන ලදි. වාර්ෂික අගංයක් ලෙස පැවැත්වෙන මෙම තරඟය මැලේසියා විශ්වවිද්‍යාලයේ ප්‍රථම මැලේසියානු භෞතික විද්‍යා මහාචාර්යවරයා වන ඒ. රාමන් මහතාට උපහාරයක් ලෙස සංවිධානය කරනු ලබයි. ලෝකය පුරා සිටිනා වෛද්‍ය සිසුන්ගේ අධ්‍යයන සහ සමාජ අන්තර් ක්‍රියා ඉදිරිපත් කිරීම සඳහා සැකසුනු වේදිකාවක් ලෙස මෙම අවස්ථාව සැලකේ. 2013 වසරේ මෙම තරඟය සඳහා රටවල් 21කින් කණ්ඩායම් අසූ තුනක් (83) සහභාගි වූහ.

භෞතික විද්‍යා අධ්‍යයන අංශය විසින් දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දෙවන වසරේ සිසුන් ඔවුන්ගේ දෙවන වසරේ සහ දෙවන සමාසිකවල ප්‍රතිඵල සැලකිල්ලට ගෙන සිසුන් පස් දෙනෙකු තෝරා ගන්නා ලදි. මෙම තරඟය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයෙන් සහභාගි වූ සිසුන් පහත දැක්වේ.

ඒ. රාජරත්නම්, ඒ.කේ.ඒ.බී. බම්නිවන්ත, ඩබ්.එස්.පී.වයි.යූ.එස්. යාපා, එන්.ටී. වීරසිංහ හා අයි.ඩී. විජේරත්න මෙම තරඟය සඳහා සහභාගි වූ අතර ලිඛිත හා වාචික තරඟවලින් හොඳින් දක්ෂතා පෙන්වා කණ්ඩායම් 83 අතුරින් හත්වැනි ස්ථානය ලබාගත් අතර, එම තරඟයට සහභාගිවූ හොඳම නවක කණ්ඩායම ලෙස නම් කරනු ලැබිණ. රටවල් 21කින් සහභාගිවූවන් අතුරෙන් අරුන් රාජරත්නම් ශිෂ්‍යයා එම කාණ්ඩයේ ඉහළම ලකුණු ලබා ගත් සිසුන් පහළොව (15) අතර රැඳී සිටියේය.

- **අන්තර් වෛද්‍ය පීඨ ළමා රෝග විවාද තරඟයේ 2013 ජයග්‍රහකයෝ**

ශ්‍රී ලංකා ළමා රෝග වෛද්‍ය විද්‍යාලය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම තරඟය 2013 සැප්තැම්බර් මස 29 වැනි දින හත්වැනි (7) වරටත් කොළඹ නිදහස් චතුරශ්‍ර ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදි.

පේරාදෙණිය වෛද්‍ය පීඨයෙන් මේ සඳහා සහභාගි වූ තරඟකරුවෝ අති දක්ෂ ලෙස තරග වදිමින් පිළිවෙළින් පස්වැනි වරට අනෙකුත් වෛද්‍ය පීඨ හතර පරාජයට පත් කරමින් මෙම අගනා ත්‍යාගය දිනා ගත්හ.

වෛද්‍ය ඩී.ඒ.සී.එල්. දලුගම, වෛද්‍ය ඩබ්.ආර්.එස්.එම්.ආර්.ඒ. හිග්ගොඩ, වෛද්‍ය ඩී.එස්. ගමගේ, වෛද්‍ය ජේ.පී. රත්කොත්කුඹුර හා වෛද්‍ය ඒ.එල්. නල්ලපෙරුම එම කණ්ඩායමේ සාමාජිකයෝ වූහ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ සිසුන් මෙම තරඟයෙන් 2007, 2009, 2010, 2011, 2012 යන වසරවල ජයග්‍රහකයන් වූ අතර, 2008 වසරේ දෙවැනි ස්ථානය දිනාගත්හ.

### 1.2.11 මධ්‍යම පරිපාලනය

සාමාන්‍ය පරිපාලනයේ සංවිධාන ව්‍යුහය, කෘත්‍යයන් හා රාජකාරි කටයුතු පුළුල්ව සමාලෝචනය කොට සංශෝධනය කිරීම ආරම්භ කොට ඇත. නව අංශ හා ඒකක ස්ථාපිත කොට ඇති අතර, විශ්වවිද්‍යාල පාලන සභාව විසින් පුළුල් වූ නව පද්ධතියක් අනුමත කොට ඇත.

විවිධ පරිපාලන තනතුරු හා බැඳී පවතින වගකීම් පිළිබඳව නිසි අවධානය යොමු කොට සුමට ආකාරයෙන් රාජකාරි කටයුතු බෙදී යාම සඳහා ඉහළ නිලධාරි තන්ත්‍රය ප්‍රති ව්‍යුහගත කිරීම පිණිස පරිපාලනය විසින් කටයුතු සූදානම් කොට ඇත. සාමාන්‍ය පරිපාලනය හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්හට ප්‍රයෝජනවත් වැඩමුළු රාශියක් පවත්වන ලදි. රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම හා කුසලතා සම්බන්ධයෙන් දියුණු කළ යුතු අංශයන් හඳුනා ගැනීමට හැකි විය.

### 1.2.12 මුදල් හා ගිණුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මුදල් අංශයේ ක්‍රියාකාරිත්වය සංවිධිත කොට පවතින දුර්වලතා නිවැරදි කිරීම පිණිස එම අංශ ප්‍රතිසංවිධානය කොට සංශෝධනය කිරීම සඳහා ඵලදායි පියවර කිහිපයක් ගෙන ඇත. මෙතුළින් මුදල් පරිපාලන අංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

මීට අමතරව පරිපාලනය විසින් "මුදල් බල අධිකාරිය" විමධ්‍යගත කිරීම, නම් වූ පුළුල් ලේඛනයක් ද සකස් කොට ඇත.

මුදල් කළමනාකරණය පිළිබඳ මූල්‍යාධිකාරීතුමාගේ වාර්තාව උපග්‍රන්ථ "E1" හි දැක්වේ.

මුදල් කළමනාකරණයේ හා පාලනයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීම සඳහා මහාභාණ්ඩාගාරය විසින් නිර්දේශිත විගණන කමිටුව ස්ථාපිත කරන ලදි. විගණන කමිටුව විසින් යෝග්‍ය නිවැරදි පිළියම් නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා සමාලෝචනය කරන්නට විය. 2013 වසර සඳහා වන විගණන කමිටු වාර්තාව උපග්‍රන්ථ "E2" ඉදිරිපත් කර ඇත.

### 1.2.13 සහායක සේවාවන්

සහායක සේවාවන්ගේ විස්තර හා ජයග්‍රහණ උපග්‍රන්ථ "D" හි දැක්වේ.

### 1.2.14 කාර්ය මණ්ඩල පුහුණුව

සාමාන්‍ය පරිපාලනය හා සම්බන්ධ වූ කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම දීර්ඝ කාලයක සිට දැනුණු අවශ්‍යතාවයකි. පරිපාලන හා මුදල් කළමනාකරණ සංශෝධන හා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමත් සමඟම සාමාන්‍ය පරිපාලනයට අනුබද්ධ කාර්ය මණ්ඩලයේ සියළුම කාණ්ඩ සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් යෝග්‍ය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා පරිපාලනය විසින් පියවර ගෙන ඇත.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන යන කාර්ය මණ්ඩල දෙකම පුහුණු කිරීම සඳහා සුදුසු කාර්ය මණ්ඩල වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ බලය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට පවරා තිබෙන බව සඳහන් කළ යුතුවේ. ඒ අනුව සංයුක්ත කළමනාකරණ අංශය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හා සහයෝගයෙන් මනා ලෙස වැඩ කිරීමේ සංස්කෘතියක් කාර්ය මණ්ඩලය තුළ සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි. මීට අමතරව තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය වෘත්තීය මාර්ගෝපදේශණ මධ්‍යස්ථානය හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලයේ භාෂා හා තොරතුරු තාක්‍ෂණ කුසලතා සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් දියත් කරන්නට විය.

### 1.2.15 තොරතුරු තාක්‍ෂණ හා ඉංග්‍රීසි භාෂා කුසලතා, පුස්තකාල සේවාවන්, වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය විසින් පරිනමන පාඨමාලා හරහා විවිධ මට්ටමේ හැකියාවන්ගෙන් යුක්ත ඉංග්‍රීසි භාෂා කුසලතා හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ සේවාවන්ට අදාළ පුළුල් පරාසයක පාඨමාලා පිරිනමනු ලබයි. සියළුම පීඨවල ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂාව හා දිසානුයෝජන වැඩසටහන පවත්වනු ලැබේ.

සියළුම ප්‍රථම උපාධි අපේක්‍ෂක සිසුන් ඔවුන්ගේ අදාළ උපාධි ලබා ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනණතා පරීක්‍ෂණයෙන් සාමාර්ථයක් ලබා ගත යුතුවේ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ හා තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සහ පුස්තකාල සේවා, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවාවන් ඇතුළු වෙනත් ඉගෙනුම් සහයක සේවාවන්ගේ සමහර අදාළ විස්තර උපග්‍රන්ථ "C" යටතේ දැක්වේ.

### 1.2.16 පර්යේෂණ හා ජාත්‍යන්තර කටයුතු

- **පර්යේෂණ**

පෙර සඳහන් කළ ආකාරයට පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ වඩාත්ම පුළුල් විශ්වවිද්‍යාලයයි. මෙම විශ්වවිද්‍යාලය පිහිටුවා පසුගිය අවුරුදු 60 ක කාලය පුරාම පීඨ හා අධ්‍යයන අංශවල සීමාවන් ඇතුළත රැඳෙමින් පර්යේෂණ පවත්වා ඇත. විශ්වවිද්‍යාල පරිපාලනයේ වර්තමාන පරමාර්ථය වනුයේ අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පවතින අති විශාල වූ සම්පත් යොදා ගැනීමයි. මෙම පරමාර්ථයෙන් යුතුව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කොට ඇත. මෙම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු වනුයේ ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමයි.

විශ්වවිද්‍යාලය Scaning Electron Microscope හා Gamma Camera වැනි අති නවීන උපකරණ මිලදී ගැනීමට හා මෙම උපකරණ විශ්වවිද්‍යාලය තුළ හා බාහිර පර්යේෂකයන්ට ලබා ගත හැකි පරිදි කටයුතු කිරීමට සැලසුම් කරමින් සිටී.

විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය මාධව මීගස්කුඹුර විසින් ශ්‍රී ලංකාවට පමණක් ආවේණිකවූ TARUGA, (ගස් ගෙඩි වර්ගයක්) සොයා ගන්නා ලදි.

පසුගිය වසර කිහිපය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් **"Science"** හා **"Nature"** වැනි ලෝකයේ වඩාත් ප්‍රසිද්ධියක් උසුලන වාර සඟරාවල පර්යේෂණ පත්‍ර පළ කොට ඇත.

- **ජාත්‍යන්තරකරණය**

**ජාත්‍යන්තර සමුළු හා ජාත්‍යන්තර සහයෝගිතා**

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ අපේක්ෂාවෙන් පසුවන පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2013 වසරේදී ජාත්‍යන්තර සමුළු කිහිපයක් හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් කිහිපයක් ද අත්සන් කොට ඇත.

2013 වසරේ පවත්වන ලද සමුළු හා අත්සන් තබන ලද ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වල ලැයිස්තුවක් පහත සඳහන් වගුවේ දැක්වේ.

**2013 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය දරණ ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු පිළිබඳ වගුව**

| අංකය | කාර්යය/තේමාව | සංවිධානය (පීඨ/දෙපාර්තමේන්තු/ මධ්‍යස්ථාන / ඒකක) | පැවැත්වූ දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ජපන් සහයෝගිතා සමුළුව | ජා.ප.ම. | 2013 මාර්තු | 250 |
| 02 | වාර්ෂික අධ්‍යයන සැසිය - 2013 | මනෝවිද්‍යා අංශය, වෛද්‍ය පීඨය | 2013 මාර්තු 01 | 60 |
| 03 | ජලයේ ගුණාත්මක බව හා මානව සෞඛ්‍ය-ඉදිරි අභියෝග පිළිබඳ විශේෂ සම්මන්ත්‍රණය | පේරාදෙණිය විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි ආයතනය හා ජා.ප.ම.සහ ජපානයේ ටොයෝටා විශ්වවිද්‍යාලය හා ජපානයේ ජාතික තාක්ෂණික විද්‍යාලය | 2013 මාර්තු 15 සහ 16 | 118 |
| 04 | බීජ සැකසුම හා වෙළඳාම (නේපාල ජාතිකයන් සඳහා) | කෘ.වි.ප.උ. ආයතනය-කෘෂි ඉංජිනේරු අධ්‍යාපන මණ්ඩලය | 2013 මැයි 05 සහ 10 | 11 |
| 05 | පිටරය ඉගෙනුම් පුහුණු වැඩසටහන (චිරස්ථායි නිවර්තන කෘෂිකර්ම පද්ධතිය) | කෘෂි අධ්‍යාපන ඒකකය, කෘෂි විද්‍යා පීඨය | 2013 මැයි 9 සහ ජූනි 4 | විදෙස් සිසුන් 15 |
| 06 | ඌන උපයෝජිත පලතුරු සඳහා නව සැකසුම් තාක්ෂණයන් පිළිබඳ පර්යේෂණයන් | කෘෂි අධ්‍යාපන ඒකකය, කෘෂි විද්‍යා පීඨය | 2013 මැයි 13 සහ 15 | විදෙස් සිසුන් 35 |
| 07 | Neurology, Endocrinology, Fluid Therapy | පශු සායනික විද්‍යා අංශය | 2013 ජූනි 06 | 85 |
| 08 | පිබිදෙන ශ්‍රී ලංකා ජපන් පාලනය හා සංවර්ධන අත්දැකීම් හුවමාරුව | ජපානයේ ශ්‍රී ලාංකික විද්වත් සංගමය | 2013 ජූනි | 300 |
| 09 | Canine & Feline Nutrition | පශු සායනික විද්‍යා අංශය | 2013 ඔක්තෝබර් 30 | 60 |
| 10 | Parasiticides පිළිබඳ CIC සම්මන්ත්‍රණය | පශු සායනික විද්‍යා අංශය | 2013 නොවැම්බර් 16 | 45 |
| 11 | ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ පරිසර දූෂණය හා දරුණු වකුගඩු රෝගය | ඉංජිනේරු පීඨය හා ජා.ප. මධ්‍යස්ථානය | 2013 නොවැම්බර් | 80 |
| 12 | ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව | ආර්ථික විද්‍යා අංශය | 2013 දෙසැම්බර් 13 සහ 14 | 2000 |
| 13 | ICIIS 2013 | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය | 2013 දෙසැම්බර් 17 සහ 20 | 200 |
| 14 | Diagnostic Imagine පිළිබඳ CPD වැඩ සටහන | පශු සායනික විද්‍යා අංශය | 2013 දෙසැම්බර් 18 | 70 |
| 15 | cardiology පිළිබඳ CPD වැඩසටහන | පශු සායනික විද්‍යා අංශය | 2013 දෙසැම්බර් 30 | 70 |

## 2013 වසරේ අත්සන් තබන ලද ජාත්‍යන්තර ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්

| අංකය | ආයතනය | පීඨ/අංශ/ මධ්‍යස්ථාන/ඒකක පේරාදෙණිය විශ්වවිද්‍යාලය | තේමාව | අත්සන් කළ දිනය |
|---|---|---|---|---|
| 01 | ඩබ්ලින්, ත්‍රිත්ව විද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | විශ්වවිද්‍යාල අතර ආචාර්යවරුන් හුවමාරුව | 2013 - සැප්තැම්බර් |
| 02 | ජපානයේ උට්සුනොමියා විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහනක් ස්ථාපිත කිරීම | 2013 - සැප්තැම්බර් |
| 03 | ජපානයේ ශිෂුඔකා විශ්වවිද්‍යාලය | කලා පීඨය | ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන | 2013-දෙසැම්බර් |
| 04 | හොකයිඩො විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන පුළුල් කිරීම | 2013- ජූලි |
| 05 | නන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | කාර්ය මණ්ඩල හුවමාරුව | 2013-මාර්තු |
| 06 | ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය දකුණු ආසියානු ජල සහෘදත්වය | කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | - | 2013-ජනවාරි |
| 07 | පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය-නිපොන් KOEI සමාගම-ජපානය | ඉංජිනේරු | - | 2013-පෙබරවාරි |
| 08 | SAARC කෘෂිකර්ම මධ්‍යස්ථානය | කෘෂිකර්ම | - | 2013-මාර්තු |
| 09 | බ්‍රැන්ඩික්ස් ලංකා සමාගම | ඉංජිනේරු | - | 2013-අප්‍රේල් |
| 10 | CIC කෘෂි ව්‍යාපාර | කෘෂිකර්ම | - | 2013-මැයි |
| 11 | DIMO Plc | ඉංජිනේරු | - | 2013-ජූනි |
| 12 | ත්‍රිබුවන් විශ්වවිද්‍යාලය, නේපාලය | කලා | - | 2013-ජූලි |
| 13 | හොකයිඩෝ විශ්වවිද්‍යාලය, ජපානය | පශු වෛද්‍ය | - | 2013-අගෝස්තු |
| 14 | ප්ලේන්ටි ෆුඩ් පුද්ගලික සමාගම | වෛද්‍ය | - | 2013-ඔක්තෝබර් |
| 15 | සෞඛ්‍ය විද්‍යා පාසැල, නිගාටා විශ්වවිද්‍යාලය, ජපානය | වෛද්‍ය රසායනාගාර අංශය, විකිරණවේද අංශය | ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු වැඩ සටහන | 2010-පෙබරවාරි 2011-සැප්තැම්බර් 2012-සැප්තැම්බර් 2013-සැප්තැම්බර් |
| 16 | ගුන්මා විශ්වවිද්‍යාලය, ජපානය | හෙදවේද අංශය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය | සංවර්ධනය වෙමින් පවතින රටවල සම වෛද්‍ය වෘත්තිකයන්ගේ සංවර්ධනය හා අධ්‍යාපනයට සහයවීම පිණිස දුරස්ථ අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීම පිළිබඳ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතිය | 2011-අගෝස්තු |
| 17 | ජර්මනියේ බර්ලින් ෆ්‍රී විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම | පුරාවිද්‍යා අධ්‍යයන අංශය හා භූගර්භ විද්‍යා අංශය | පැරණි වාරිමාර්ග, පරිසර/සමාජ පුරා විද්‍යාව පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීම | 2013-අප්‍රේල් |
| 18 | ත්‍රිබුවන් විශ්වවිද්‍යාලය, නේපාලය | දේශපාලන විද්‍යා අංශය | Sough: ප්‍රතිපත්ති හා පාලන අධ්‍යයනය, කලාපීය පශ්චාත් උපාධි හා දර්ශනශූරි උපාධි වැඩ සටහන | 2013-ජූලි |
| 19 | නොරාඩ් ආයතනය නෝර්වේ | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013-දෙසැම්බර් |

| | | | | |
|---|---|---|---|---|
| 20 | බංග්ලාදේශයේ ඉංජිනේරු හා තාක්ෂණික විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013 - දෙසැම්බර් |
| 21 | කාම්බෝඩියාවේ තාක්ෂණික විද්‍යා අංශය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013-දෙසැම්බර් |
| 22 | නෝර්වේ ලයිෆ් සයන්ස් විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013-දෙසැම්බර් |
| 23 | නෝර්වේ ටෙලිමාර්ක් විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013-දෙසැම්බර් |
| 24 | යාපනය විශ්වවිද්‍යාලය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජල කළමනාකරණය හා දේශගුණික විපර්යාසවලට හැඩගැසීමේ ආයතනික හැකියාව ගොඩනැගීම | 2013-දෙසැම්බර් |
| 25 | ශිෂුඔකා විශ්වවිද්‍යාලය-ජපානය | විද්‍යා පීඨය | සෝලා බලශක්ති පරිවර්තනය | 2013-ඔක්තෝබර් |
| 26 | ශිමානේ විශ්වවිද්‍යාලය-ජපානය | විද්‍යා/භූගර්භ | සහයෝගිතා පර්යේෂණ | 2013-දෙසැම්බර් |
| 27 | කැලිෆෝනියා විශ්වවිද්‍යාලය. ඩෙවිස් | කෘෂි ව්‍යාපාරික මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජාතික විද්‍යා පදනමේ අරමුදල් ලද ක්‍රියාකාරකම් කිහිපයක් ඉටු කිරීම සඳහා පර්යේෂණ අනු-ප්‍රදානයක් | - |
| 28 | යෙසුකා තාක්ෂණික ආයතනය | කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජෛව සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය පිරිනැමීම හා ව්‍යවහාරික හා ජෛව සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිරිනැමීම සඳහා | - |

### 1.2.17 ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුබසාධනය හා සේවාවන්

ප්‍රධාන වශයෙන්ම අළුතින් ස්ථාපිත කරන ලද සුබසාධක අංශය හා විවිධ වූ වෙනත් අංශ හා ඒකක මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුබසාධන පද්ධතිය නිසි ලෙස ආවරණය කෙරෙන පැහැදිලි හා මනා යාන්ත්‍රණයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව පවතී. මීට අමතරව උපකුලපතිතුමන් විසින් සභාපතිත්වය දරණ මාසික රැස්වීම්වලදී සිසුන් විසින් මතු කරන ගැටළුවලට ඉහත විස්තර කළ පරිදි පිළියම් ලබා දෙනු ලබයි.

සුබසාධන පද්ධතියට ශිෂ්‍ය නේවාසික පහසුකම්, ආපන ශාලා පද්ධතිය, ශිෂ්‍ය සේවාවන්, ශිෂ්‍ය ලියාපදිංචිය හා වෘත්තීය ශිෂ්‍ය උපදේශනය හා සෞඛ්‍ය ඇතුළත් වේ. මෙම සුබසාධන පද්ධතිය සඳහා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්, ශිෂ්‍ය සේවා අංශය, ශාලාධිපතිවරුන් හා උපශාලාධිපතිවරුන්, මහජන සම්බන්ධතා නිලධාරි, ආරක්ෂක අංශය, ශාලාධිපතිවරුන් හා උපශාලාධිපතිවරුන්, මහජන සම්බන්ධතා නිලධාරි, ආරක්ෂක අංශය, විනයාරක්ෂක, විනයපාලක, සුබසාධන සංවිධාන, ශිෂ්‍ය සංගම් වැනි සම්පත් මෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන අංශය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හා වැඩ අංශය යන නම්වලින් හැඳින්වෙන සේවා ඒකක ද, උපයෝගි කරගනු ලබයි.

**කාර්ය මණ්ඩල සුබසාධනය**

- සුබසාධන අංශයක් ස්ථාපිත කිරීම
- සිසුන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා බස් රථ සේවාවක් සැපයීම
- සුබසාධනය මුල්කරගත් වෙළඳ සංකීර්ණයක් ආරම්භ කිරීම
- මූල්‍ය උපකාරක සේවාවක් ස්ථාපිත කිරීම - මංගල, අවමංගල, ළදරු උපත්

## 1.2.18 අධ්‍යයන සංවර්ධනය, සැලසුම් හා තත්ත්ව සහතිකය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය නිරන්තරයෙන්ම උසස් අධ්‍යාපනයේ ජාතික හා ගෝලීය වශයෙන් සිදුවන වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කරමින් ගමන් කොට ඇත. මතුවන නව ප්‍රවණතා හා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් අධ්‍යයන පුහුණු වැඩසටහන්වල හා ක්‍රියාමාර්ගවල සහ අධ්‍යයන සැලසුම් හා සංවර්ධනයේ වෙනත් සංශෝධනයන් වෙනුවෙන් නව ක්‍රියාමාර්ග අනුගමනය කොට ඇත.

## 1.2.19 සංයුක්ත සැලසුම් /උපක්‍රමික සැලසුම සකස් කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා යටිතල පහසුකම් පිළිබඳ ප්‍රධාන සැලසුමක් සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත බාර දෙන ලදි. විශ්වවිද්‍යාලය සතුව අක්කර 1947ක් පුරා දැනට පවතින හා යෝජිත සියලු සංවර්ධනයන් මීට ඇතුළත් වේ.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දියත් කළ නව ක්‍රියාමාර්ගවලට අනුකූලව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සකස් කෙරෙන සංයුක්ත සැලසුම් හා උපක්‍රමික සැලසුම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. මේ සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ වැඩමුළු, සම්මන්ත්‍රණ ආදියට ක්‍රියාකාරිව සහභාගි විය. අභ්‍යන්තරික වශයෙන් සැලසුම් අවසන් කිරීම සඳහා විවිධ මට්ටමේ කමිටු කිහිපයක් ස්ථාපිත කරන ලදි. ව්‍යුහය තුළ වෙනස්කම් පමණක් නොව පුද්ගලයන්ගේ සාමාන්‍ය ආකල්ප හා බාහිර ස්වරූපය කෙරෙහිද අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව ඉතා වෙහෙස මහන්සිවී කටයුතු කළේය. 2014-2018 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත හා උපක්‍රමික සැලසුම් සකස් කිරීම 2013 වසරේදී අවසන් කරන ලදි.

## 1.2.20 සනාතන සභා නිර්දේශ

සමාලෝචිත වර්ෂයේදී සනාතන සභාව විසින් ගන්නා ලද වැදගත් නිර්දේශවලින් කිහිපයක් පහතින් දැක්වේ.

- උපාධි නිබන්ධන ඡායා පිටපත් කිරීම - පුස්තකාලය
  (2013.03.20 දින පැවැත්වූ සනාතන සභාවේ 376 වැනි රැස්වීමේදී පිළිගෙන 2013.05.28 දින පැවැත්වූ 420 වැනි පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි)

- සනාතන සභා උසස් උපාධි කමිටුවේ කෘත්‍යයන් සනාතන සභා පර්යේෂණ කමිටුවට මාරු කොට (2013.05.15 දින පැවැත්වූ 378 වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2013.07.27 දින පැවැත්වූ 422 වැනි පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි)

- අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුවට සහ සනාතන සභාවට ඉදිරිපත් කරන ලිපි ලේඛණවලට අදාළ මාර්ගෝපදේශ සංශෝධනය 2013.07.17 දින පැවැත්වූ 380 වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2013.09.28 දින පැවැත්වූ 424 වැනි පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි.

- විනය පාලක විසින් බාර දෙන කණ්ඩායම් ඡායා රූපය නිරීක්ෂණය (2012.12.19 දින පැවැත්වූ 373 වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2013.03.03 දින පැවැත්වූ 417 වැනි පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි.)

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් උපාධි පිරිනැමීමේදී "පේරාදෙණිය" වෙනුවට "පේරා" ලෙස කෙටි යෙදුම් යෙදීම නතර කිරීමට ප්‍රතිපත්ති තීරණයක් ගන්නා ලදි. (උදාඃ විද්‍යාවේදී (පේරාදෙණිය) 2013.07.17 දින පැවැත්වූ 380 වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2013.09.28 දින පැවැත්වූ 424 පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි.)

- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සප්ත වාර්ෂික නිවාඩු ලබා මෙරට සිටින විට පුස්තකාල පහසුකම් ලබාදීම සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම. (2013.01.30 දින පැවැත්වූ 110 වැනි පුස්තකාල කමිටුව විසින් නිර්දේශ කොට 2013.10.31 දින පැවැත්වූ 383 වැනි සනාතන සභා රැස්වීමේදී අනුමත කරන ලදි.)

- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින විට පහත සඳහන් කාර්යයන්වල නියැලිය හැකිය.

    1. පර්යේෂණ සිසුන් අධීක්ෂණය කරීම
    2. උසස් උපාධියක් සඳහා සිසුවෙක් ලියාපදිංචි කිරීම
    3. පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම් කිරීම
    4. කවරාකාරයක හෝ පර්යේෂණ කාර්යයක නියැලීම

  (2012.06.06 දින පැවැත්වූ 100 වැනි සනාතන සභා උසස් උපාධි කමිටුව විසින් නිර්දේශ කොට 2013.01.28 දින පැවැත්වූ සනාතන සභා රැස්වීමේදී අනුමත කරන ලදි.)

**යාව ජීව මහාචාර්ය තනතුර ප්‍රදානය**

| | | |
|---|---|---|
| මහාචාර්ය සිරිල් බෝගහවත්ත | - | කෘෂිවිද්‍යා පීඨය |
| මහාචාර්ය ඒ.එල්.ටී. පෙරේරා | - | කෘෂිවිද්‍යා පීඨය |
| මහාචාර්ය ඒ.එම්.ඒ.එන්.කේ. සේනානායක | - | වෛද්‍ය පීඨය |
| මහාචාර්ය ඩී.ටී.බී. තෙන්නකෝන් | - | විද්‍යා පීඨය |
| මහාචාර්ය අයි.ඒ.යූ.එන්. ගුණතිලක | - | විද්‍යා පීඨය |
| මහාචාර්ය පී.කේ. ගුණවර්ධන | - | පශු වෛද්‍ය පීඨය |

**සාහිත්‍ය දර්ශනශූරී උපාධිලාභීන් (ගෞරව උපාධි)**

2013.05.30 දින පැවැත්වූ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රදානය කරන ලදි.

කේ.එම්. ජයලත් මනෝරත්න මයා
ආචාර්ය එච්.ඒ.පී. අබයවර්ධන මයා

**ගරු ආගන්තුක පත්වීම්**

| නම | අධ්‍යයන අංශය | පීඨය | තනතුර | පත් කල දිනය | පත්වීමේ කාලය |
|---|---|---|---|---|---|
| **වෛද්‍ය ලක්ෂ්මන් කරල්ලියද්ද** | භිෂග්වේද අංශය | වෛද්‍ය | ආගන්තුක මහාචාර්ය | 2012.01.01 | 2016.12.31 |
| **වෛද්‍ය ඩී.ජේ. අබේසේකර** | භිෂග්වේද අංශය | වෛද්‍ය | ආගන්තුක සහෘදත්ව | 2012.01.01 | 2016.12.31 |

## 1.3 බාධක සහ පිළියම්

2013 වසර සඳහා සැලසුම් කළ බොහොමයක් ව්‍යාපෘතීන් සමහර අවස්ථාවන්වලදී ප්‍රමාදයන් සිදුවුවද අවසන් කොට ඇත. webometric ශ්‍රේණිගත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ඇති අතර, විශ්වවිද්‍යාල වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කර ඇත. මෙම කාල පරිච්ඡේදය තුළ මෙම ශ්‍රේණිගත කිරීම මඳ වශයෙන් පහළ බැස ඇතත් වෙබ් අඩවියට නව අංගයන් එකතු කොට එය ප්‍රති ව්‍යුහගත කොට පෙර පැවති තත්ත්වයට පැමිණවීම අපගේ අපේක්ෂාවයි.

## 1.4 අනාගත සැලසුම්

ශාස්ත්‍ර පීඨය යළි පිබිදීමේ වසර ලෙස 2014 වර්ෂය නම් කර ඇති අතර, අධ්‍යාපනවේදී/ ත්‍රිභාෂා හා තොරතුරු තාක්ෂණ පාඨමාලා මෙම වසර සඳහා සැලසුම් කෙරේ.

2014 වර්ෂය අවසාන වනවිට පර්යේෂණ පත්‍ර 2000 ඉලක්කය කරා ගමන් කිරීම අපගේ සැලසුමයි.

## 1.5 පාලක සභාව හා සනාතන සභාව

පාලක සභාවේ හා සනාතන සභාවේ විස්තර උපග්‍රන්ථ " E" හි ඉදිරිපත් කර ඇත.

## 02. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලා | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **කෘෂිවිද්‍යා පීඨය** | කෘෂි තාක්ෂණ හා කළමනාකරණය | 501 | 102 | 99 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණවේදය | 52 | | |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය | 137 | | |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | ඖෂධවේද | 70 | 29 | 42 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 91 | | |
| | හෙදවේද | 183 | | |
| | භෞත චිකිත්සාව | 125 | | |
| | විකිරණවේදය හා විකිරණ චිකිත්සාව | 109 | | |
| **කලා පීඨය** | කලා පීඨය | 2833 | 195 | 80 |
| | ව්‍යාපාර පරිපාලනය | 544 | | |
| | නීති | 203 | | |
| **දන්ත වෛද්‍ය පීඨය** | දන්ත වෛද්‍ය විද්‍යාව | 416 | 51 | 136 |
| **ඉංජිනේරු පීඨය** | ඉංජිනේරු විද්‍යා | 1307 | 100 | 161 |
| **වෛද්‍ය පීඨය** | ගණනය හා කළමනාකරණය | 1064 | 105 | 166 |
| **විද්‍යා පීඨය** | ජීව විද්‍යාව | 429 | 96 | 109 |
| | භෞතික විද්‍යාව | 653 | | |
| | ගණනය හා කළමනාකරණය | 180 | | |
| | සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ | 129 | | |
| **පශු වෛද්‍ය පීඨය** | පශු වෛද්‍ය විද්‍යා | 294 | 37 | 58 |
| **එකතුව** | | **9320** | **715** | **851** |

## 03. දේශීය සිසුන් පිළිබඳ විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර | උපාධි ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | කෘෂි තාක්ෂණ හා කළමනාකරණය | ඉ | 151 | 171 | 179 | - | - | 166 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණවේදය | | 12 | 22 | 18 | - | - | 22 |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය | | 45 | 42 | 50 | - | - | 38 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | ඖෂධවේද | | 27 | 23 | 20 | - | - | 25 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | | 28 | 26 | 24 | 13 | - | 22 |
| | හෙදවේද | | 49 | 46 | 49 | 39 | - | 43 |
| | භෞත චිකිත්සාව | | 40 | 30 | 24 | 31 | - | 30 |
| | විකිරණවේදය හා විකිරණ චිකිත්සාව | | 51 | 19 | 21 | 18 | - | 27 |
| කලා පීඨය | කලා පීඨය | ඉ/සි/දෙ | 956 | 668 | 709 | 500 | - | - |
| | ව්‍යාපාර පරිපාලනය | ඉ | 82 | 135 | 156 | 171 | - | - |
| | නීතිය | ඉ | 57 | 46 | 51 | 49 | - | - |
| දන්ත වෛද්‍ය | දන්ත වෛද්‍ය | ඉ | 100 | 80 | 82 | 83 | 71 | - |
| ඉංජිනේරු පීඨය | ඉංජිනේරු | | 477 | 415 | 415 | - | - | - |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය | | 231 | 195 | 197 | 200 | 196 | 172 |
| විද්‍යා පීඨය | ජීව විද්‍යාව | | 144 | 150 | 135 | - | - | 137 |
| | භෞතික විද්‍යාව | | 194 | 239 | 220 | - | - | 203 |
| | ගණනය හා කළමනාකරණය | | 83 | 50 | 47 | - | - | 50 |
| | සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ | | 54 | 46 | 29 | - | - | 48 |
| පශු වෛද්‍ය පීඨය | පශු වෛද්‍ය | | 80 | 79 | 72 | 63 | - | 59 |
| **එකතුව** | | | **2861** | **2482** | **2498** | **1167** | **267** | **1042** |

ඉ – ඉංග්‍රීසි    සි – සිංහල    දෙ – දෙමළ

## 04. විදෙස් සිසුන් පිළිබඳ විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | බඳවා ගැනීම 2013 | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර | උපාධි ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | කෘෂි තාක්ෂණ හා කළමනාකරණ | ඉංග්‍රීසි | - | - | - | - | - | - | - |
| | ආහාර විද්‍යා හා තාක්ෂණවේදය | | - | - | - | - | - | - | - |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය | | - | - | - | - | - | - | - |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | | - | - | - | - | - | - | - |
| කලා පීඨය | - | | 145 | 48 | 24 | 35 | 26 | 25 | 42 |
| දන්ත වෛද්‍ය පීඨය | - | | 02 | 02 | 01 | 02 | 05 | - | - |
| ඉංජිනේරු පීඨය | - | | - | - | - | - | - | - | - |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය | | 10 | 10 | 09 | 10 | 07 | 09 | 04 |
| විද්‍යා පීඨය | - | | - | - | - | - | - | - | - |
| පශු වෛද්‍ය පීඨය | - | | - | 01 | - | - | - | - | - |
| එකතුව | | | **157** | **60** | **34** | **47** | **38** | **34** | **46** |

## 05. (අ) අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | අධ්‍යයන අංශය | මාධ්‍යය | සහය මහාචාර්ය | ජ්‍යෙ. මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | සත්ව විද්‍යා | ඉංග්‍රීසි | 1 | 3 | 5 | 5 | 2 |
| | කෘෂි ජීව විද්‍යා | | 2 | 1 | 2 | 4 | 2 |
| | බෝග විද්‍යා | | 1 | 4 | 5 | 9 | 2 |
| | කෘෂි ආර්ථික | | - | - | 3 | 1 | 3 |
| | කෘෂි ඉංජිනේරු | | 1 | 2 | 2 | 7 | - |
| | කෘෂි ව්‍යාප්ති | | - | 1 | 1 | 3 | 1 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | | 2 | - | 1 | 5 | - |
| | පාංශු විද්‍යා | | - | 2 | 3 | 3 | 2 |
| | ජෛව තාක්ෂණ මාධ්‍ය | | - | - | - | 1 | - |
| | මහඉලුප්පල්ලම | | - | - | - | 7 | 3 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය රසායනාගාර විද්‍යා | ඉංග්‍රීසි | - | - | - | 4 | 1 |
| | හෙදවේද | | - | - | - | - | 5 |
| | ඖෂධවේද | | - | - | - | 2 | 6 |
| | භෞතචිකිත්සක | | - | - | - | - | 5 |
| | විකිරණ හා විකිරණ චිකිත්සක | | - | - | - | 1 | 4 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කලා පීඨය | අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාරය | ඉ.දෙ. | - | - | - | 5 | 1 |
| | පුරාවිද්‍යා | ඉ.සි. | - | - | 1 | 6 | - |
| | සම්භාව්‍ය භාෂා | ඉ.සි. | - | - | - | 3 | 3 |
| | ආර්ථික විද්‍යා | ඉ.සි.දෙ. | - | - | 1 | 18 | 3 |
| | අධ්‍යාපන | ඉ.සි.දෙ. | 1 | - | - | 3 | 4 |
| | ඉංග්‍රීසි | ඉ. | - | 1 | 1 | 5 | 2 |
| | ලලිත කලා | ඉ.සි. | - | - | - | 4 | 1 |
| | භූගෝල විද්‍යා | ඉ.සි.දෙ. | 1 | - | 3 | 11 | 8 |
| | ඉතිහාසය | ඉ.සි.දෙ. | - | - | 3 | 6 | 4 |
| | නීතිය | ඉ. | - | - | - | 1 | 2 |
| | කළමනාකරණ අධ්‍යයන | ඉ.සි.දෙ. | - | - | 1 | 10 | 10 |
| | පාලි හා බෞද්ධ අධ්‍යයන | ඉ.සි. | 1 | - | 1 | 3 | - |
| | දර්ශනය හා මනෝවිද්‍යාව | ඉ.සි.දෙ. | - | - | 1 | 12 | 4 |
| | දේශපාලන විද්‍යාව | ඉ.සි.දෙ. | - | 3 | - | 5 | 4 |
| | සිංහල | සි. | - | - | - | 8 | 5 |
| | සමාජ විද්‍යාව | ඉ.සි.දෙ. | - | 1 | 4 | 9 | 4 |
| | දෙමළ | දෙ. | - | - | 1 | 1 | 2 |
| දන්ත වෛද්‍ය පීඨය | මූලික විද්‍යා | ඉංග්‍රීසි | - | 1 | - | 10 | - |
| | ප්‍රජා දන්ත වෛද්‍ය | | - | 2 | 1 | 4 | 2 |
| | මුඛ වෛද්‍ය හා පරිදන්ත | | - | - | 3 | 6 | 3 |
| | මුඛ ව්‍යාධිවේද | | - | - | 3 | 3 | - |
| | මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය | | - | - | 1 | 4 | - |
| | සංලග්න දන්ත වෛද්‍ය විද්‍යාව | | - | - | - | 3 | - |
| | සංරක්ෂණ දන්ත වෛද්‍ය | | - | - | 2 | 2 | - |
| | දන්ත සංවර්ධන අධ්‍යාපන ඒකකය | | - | - | - | 1 | - |
| ඉංජිනේරු පීඨය | රසායන හා සැකසුම් ඉංජිනේරු | ඉංග්‍රීසි | - | 1 | - | 3 | 1 |
| | සිවිල් ඉංජිනේරු | | - | 2 | 5 | 17 | 6 |
| | පරිගණක ඉංජිනේරු | | - | - | - | 8 | - |
| | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු | | - | - | 3 | 15 | 3 |
| | ඉංජිනේරු ගණිතය | | - | 1 | - | 9 | 2 |
| | කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශන | | - | - | - | 2 | 2 |
| | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | | - | - | - | - | 1 |
| | යාන්ත්‍රික ඉංජිනේරු | | - | - | 1 | 7 | 1 |
| | නිෂ්පාදන ඉංජිනේරු | | - | - | 1 | 3 | 5 |
| වෛද්‍ය පීඨය | කාය ව්‍යවච්ඡේද | ඉංග්‍රීසි | - | 1 | - | 6 | 4 |
| | නිර්වින්දන | | - | - | - | 1 | 1 |
| | ජෛව රසායන | | 1 | - | 1 | 5 | 1 |
| | ප්‍රජා වෛද්‍ය | | 3 | - | - | 4 | 1 |
| | අධිකරණ වෛද්‍ය | | - | - | - | 3 | 2 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වෛද්‍ය විද්‍යාව | | - | - | 3 | 3 | 2 |
| | ක්ෂුද්‍ර ජීව විද්‍යාව | | - | 1 | - | 2 | 3 |
| | වෛද්‍ය අධ්‍යාපන ඒකකය | | - | - | - | 1 | 1 |
| | න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය | | - | - | - | 2 | - |
| | ප්‍රසව හා නාරිවේද | | - | - | - | 4 | 1 |
| | ළමාරෝග | | - | - | 3 | 2 | 3 |
| | පරපෝෂ විද්‍යාව | | - | - | - | 3 | 1 |
| | ව්‍යාධිවේද | | - | 1 | 1 | 3 | 2 |
| | හිෂග්වේදය | | - | - | - | 1 | 3 |
| | භෞතවේද | | - | - | 1 | 7 | 2 |
| | මනෝ වෛද්‍ය | | - | - | - | 3 | 2 |
| | විකිරණ විද්‍යාව | | - | 1 | - | 1 | - |
| | ශෛල්‍ය වෛද්‍ය | | - | - | 1 | 4 | 3 |
| **විද්‍යා පීඨය** | ශාඛ විද්‍යාව | ඉංග්‍රීසි | - | 1 | 1 | 9 | 3 |
| | රසායන විද්‍යාව | | 1 | 4 | 3 | 5 | 2 |
| | විද්‍යා අධ්‍යාපන ඒකකය | | - | - | - | 1 | - |
| | භූගර්භ විද්‍යා | | - | - | 2 | 8 | - |
| | ගණිතය | | 1 | - | 2 | 2 | 9 |
| | අණුක ජීව විද්‍යා හා ජෛව රසායන | | - | - | - | 3 | 1 |
| | භෞතික විද්‍යා | | - | 1 | 1 | 10 | 2 |
| | සංඛ්‍යානය හා පරිගණක විද්‍යා | | - | - | 2 | 2 | 7 |
| | මූලික පශු වෛද්‍ය | | - | 2 | 1 | 7 | 3 |
| **පශු වෛද්‍ය පීඨය** | මූලික පශු වෛද්‍ය | ඉංග්‍රීසි | - | - | 1 | 7 | 2 |
| | පශු ව්‍යාධ ජීව විද්‍යා | | - | - | 1 | 3 | 3 |
| | ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය | | - | 1 | 1 | 5 | 1 |
| | පශු සායනික විද්‍යා | | - | 1 | - | 4 | 2 |
| | පශු මහජන සෞඛ්‍ය හා හිෂග්වේදය | | - | 1 | - | 2 | 2 |
| **වෙනත්** | පුස්තකාලය | | - | - | - | - | 17 |
| | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | | - | - | - | - | 1 |
| | ඉංග්‍රීසි භාෂා හා ඉංග්‍රීසි ඒකකය | | - | - | - | - | 1 |
| **එකතුව** | | | **16** | **40** | **84** | **382** | **207** |

ඉ - ඉංග්‍රීසි සි - සිංහල දෙ - දෙමළ

## 05.(ආ) අධ්‍යයන සහය කාර්ය මණ්ඩල විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| ශාඛාව | කාර්ය මණ්ඩල තනතුරු | | එකතුව |
|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | 08 | 59 | 67 |
| පුස්තකාලය | 03 | - | 03 |
| ශාරීරික අධ්‍යාපන අංශය | 06 | - | 06 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 02 | - | 02 |
| කෘෂි විද්‍යා | - | - | - |
| දන්ත වෛද්‍ය | 01 | - | 01 |
| ඉංජිනේරු | 09 | - | 09 |
| වෛද්‍ය | 01 | - | 01 |
| විද්‍යා | 03 | - | 03 |
| සාමාන්‍ය පරිපාලන | 01 | - | 01 |
| මුදල් පරිපාලන | - | - | - |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 08 | 03 | 11 |
| **එකතුව** | **42** | **62** | **104** |

## 06. අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර (2013 දෙසැම්බර් 31 දිනට)

| පීඨය / අංශය | වඩාත් ජ්‍යෙෂ්ඨ [1] | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල [2] | ආධුනික කාර්ය මණ්ඩලය[3] | සුළු සේවක[4] |
|---|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලන | 18 | 25 | 76 | 39 |
| මුදල් පරිපාලන | 9 | 12 | 43 | 7 |
| ගබඩා හා සැපයුම් සේවා | 3 | 2 | 13 | 7 |
| ආරක්ෂක සේවා | - | - | 38 | 32 |
| ප්‍රවාහන සේවා | - | - | 2 | 56 |
| විභාග සේවා | 1 | - | 1 | 1 |
| කෘෂිවිද්‍යා පීඨය | 2 | 22 | 35 | 40 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 2 | 1 | 22 | 16 |
| කලා පීඨය | 2 | 8 | 37 | 33 |
| දන්ත වෛද්‍ය පීඨය | 1 | 23 | 70 | 41 |
| ඉංජිනේරු පීඨය | 2 | 25 | 48 | 86 |
| වෛද්‍ය පීඨය | 2 | 42 | 70 | 60 |
| විද්‍යා පීඨය | 2 | 18 | 31 | 61 |
| පශු වෛද්‍ය පීඨය | 2 | 6 | 21 | 32 |
| පුස්තකාල සේවා | 2 | 20 | 36 | 38 |
| සෞඛ්‍ය සේවා | 1 | 6 | 18 | 44 |
| ශාරීරික අධ්‍යාපන | 1 | - | 1 | 18 |
| ශිෂ්‍ය සේවා | - | 2 | 8 | 3 |
| ඉඩම් සහ ගොඩනැගිලි | 4 | 1 | 18 | 211 |
| විදුලි සැපයුම් | - | 1 | - | 26 |
| ජල සැපයුම් | - | - | - | 6 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 2 | 8 | 13 | 3 |

| | | | | |
|---|---|---|---|---|
| නේවාසිකාගාර | 1 | 1 | 17 | 106 |
| දොඩම්ගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය | 1 | 1 | 5 | 38 |
| උඩ පේරාදෙණිය පශු සම්පත් මධ්‍යස්ථානය | 1 | - | - | 24 |
| මහඉලුප්පල්ලම | 1 | - | 3 | 11 |
| දත්ත සැකසුම් ඒකකය/තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය | 1 | - | 1 | - |
| **එකතුව** | **61** | **224** | **627** | **1039** |

1-පරිපාලන හා විධායක
2-ජ්‍යෝෂ්ඨ කාර්ය මණ්ඩල ශ්‍රේණි
3 -ලිපිකාර හා සම ශ්‍රේණි
4- ඉහත ශ්‍රේණිවලට පහළ

## 07. පර්යේෂණ, නව නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර

| | විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|---|
| අ) | පර්යේෂණ සංඛ්‍යාව | 316 | - | 236 |
| ආ) | නව නිපැයුම් සංඛ්‍යාව | 10 | - | 08 |
| ඇ) | වාර සඟරා සංඛ්‍යාව | 168 | - | 06 |
| ඈ) | පොත් සංඛ්‍යාව | 493 | 03 | 21 |
| ඉ) | ලිපි සංඛ්‍යාව | 437 | 06 | 91 |
| ඊ) | වෙනත් (කරගෙන යන හා උපුටන) | 283 | - | 147 |
| **එකතුව** | | **1707** | **09** | **509** |

## 08. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| | විෂය | සහභාගි වූ | අවසන් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|---|
| අ) | පශ්චාත් උපාධි වැඩසටහන් | 245 | 72 | 122 |
| ආ) | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | 52 | 43 | 42 |
| ඇ) | උපාධි වැඩසටහන් | 379 | 242 | 66 |
| ඈ) | ඩිප්ලෝමා වැඩසටහන් | - | 01 | - |
| ඉ) | සහතික පත්‍ර වැඩසටහන් | 19 | 13 | 04 |
| ඊ) | උපුටන | 62 | 56 | 172 |
| උ) | ග්‍රන්ථ පරිච්ඡේද | 23 | 33 | 25 |
| ඌ) | ඉදිරිපත් කිරීම් | 74 | 17 | 110 |
| එ) | වැඩ පත්‍ර | 09 | 15 | 03 |
| ඒ) | පුහුණු වැඩසටහන් | 110 | 82 | 88 |
| ඔ) | වැඩ මුළු | 332 | 96 | 136 |

| | | | | |
|---|---|---|---|---|
| ඕ) | සම්මන්ත්‍රණ | 158 | 94 | 110 |
| ඖ) | වෙනත් | 152 | 71 | 70 |
| **එකතුව** | | **1615** | **835** | **948** |

## 09. ලද සම්මාන පිළිබඳ විස්තර

| | විෂය | සම්මාන සංඛ්‍යාව | ආචාර්යවරුන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අ) | දේශීය සම්මාන | 12 | 08 | 07 |
| ආ) | ජාතික සම්මාන | 21 | 14 | 11 |
| ඇ) | ජාත්‍යන්තර සම්මාන | 14 | 06 | 02 |
| ඈ) | වෙනත් | 5 | 01 | 02 |
| | **එකතුව** | **52** | **29** | **22** |

## 10. ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා | - | - | - | - | - | - | - | - | - |
| සම සෞඛ්‍ය | - | - | - | - | - | - | - | - | - |
| කලා | භූගර්භ විද්‍යා | ඉ. | - | 1 | - | - | - | - | - |
| | - | ඉ/ සි/ දෙ | 1 | - | - | - | - | - | - |
| දන්ත වෛද්‍ය | - | - | - | - | - | - | - | - | - |
| ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාපති/ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ඉ. | - | - | - | 1 | 1 | - | - |
| | PR480 – කර්මාන්ත ඉංජිනේරු හා Decision Sciences | ඉ. | 1 | - | - | - | - | - | - |
| | PR409 – කළමනාකරණ මූලධර්ම හා ආර්ථික විද්‍යාව | ඉ. | 1 | - | - | - | - | - | - |
| | PR513 – Modeling & Control of Mechatronics System | ඉ. | 1 | - | - | - | - | - | - |
| | PR515 – ඉංජිනේරුවන් සඳහා මුදල් හා කළමනාකරණ ගිණුම් | ඉ. | 1 | - | - | - | - | - | - |
| | භූ තාක්ෂණික ඉංජිනේරු හා ඉංජිනේරු භූගර්භ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | ඉ. | - | - | - | 1 | 18 | - | - |
| වෛද්‍ය | - | - | - | - | - | - | - | - | - |
| විද්‍යා | Phytogeography | ඉ. | √ | - | - | - | - | - | - |
| | භෞතික විද්‍යාව හා විසිතුරු පැලෑටි කළමනාකරණ | ඉ. | √ | - | - | - | - | - | - |
| | Biological Mitrogen Fixation | ඉ. | √ | - | - | - | - | - | - |
| | විද්‍යාත්මක රචනය + පර්යේෂණ ක්‍රමවේදය | ඉ. | - | - | - | - | √ | - | - |
| පශු වෛද්‍ය | දර්ශනපති පර්යේෂණ | ඉ. | - | - | - | - | - | 2 | - |

ප්‍රධාන:

01. ප්‍රථම උපාධි පාඨමාලා　　02. සහතික පත්‍ර　　03. ඩිප්ලෝමා
05. පශ්චාත් උපාධි　　06. දර්ශනපති　　07. දර්ශනශූරී
04. පශ්චාත් උපාධි ඩිප්ලෝමා

ඉ - ඉංග්‍රීසි　　සි - සිංහල　　දෙ - දෙමළ

## 11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013 රු: |
|---|---|
| පුද්ගල වේතන | 2,362,377,978 |
| ප්‍රවාහන | 9,879,168 |
| සැපයුම් | 168,380,024 |
| නඩත්තු | 26,096,230 |
| කොන්ත්‍රාත් සේවා | 325,653,070 |
| වෙනත් | 718,669,287 |
| **එකතුව** | **3,611,055,757** |

## 12. මූලධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013 රු: |
|---|---|
| ලී බඩු සහ කාර්යාල උපකරණ ලබා ගැනීම | 392,318,574 |
| යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | 43,681,147 |
| ගොඩනැගිලි හා ව්‍යුහ ලබා ගැනීම | 118,712,921 |
| වෙනත් | - |
| **එකතුව** | **554,712,642** |

## 13. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ)

(දෙස්/විදෙස් අධාර කළ) ව්‍යාපෘති පිළිබඳ විස්තර උපග්‍රන්ථ "F" හි දැක්වේ.

## 14. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ)

මේ පිළිබඳ විස්තර උපග්‍රන්ථ "F" හි දැක්වේ.

## 15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

| විෂය | | 2013 වසරේ ප්‍රතිපාදන රු. | 2013 වසරේ වියදම් රු. | ඉතිරි කිරීම්/අතිරික්ත රු. |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති හැර පුනරාවර්තන | 2,880,960,000 | 3,611,055,757 | (730,095,757) |
| (ආ) | ව්‍යාපෘති හැර මූලධන | 1,018,525,000 | 554,712,641 | 463,812,359 |
| (ඇ) | ව්‍යාපෘති-දේශීය ආධාර කළ | - | - | - |
| (ඈ) | ව්‍යාපෘති-විදෙස් ආධාර කළ | - | - | - |

## 16. මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (සාමාන්‍ය ආදායම)

| ආදායම් මූලාශ්‍ර | 2013 වසරේ ප්‍රතිපාදන රු. | 2013 වසරේ එකතුව රු. | හිඟ/අතිරික්ත රු. |
|---|---|---|---|
| අ) ප්‍රථම උපාධි අධ්‍යයන | 51,850,000 | 89,184,630 | (37,334,630) |
| ආ) පශ්චාත් උපාධි අධ්‍යයන | 2,500,000 | 3,749,950 | (1,249,950) |
| ඇ) උපදේශන | - | - | - |
| ඈ) වෙනත් | 114,110,000 | 149,416,692 | (35,306,692) |

## 17. 2013 වසරේ මුදල් කාර්ය සාධන විශ්ලේෂණය

| විෂය | | එක් සිසුවෙනු සඳහා වියදම (පීඨ වශයෙන්) රු. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෘෂි | සම සෞඛ්‍ය | කලා | දන්ත | ඉංජි. | වෛද්‍ය | විද්‍යාව | පශු වෛද්‍ය |
| අ) එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම | පු./වි.ශිෂ්‍ය සංඛ්‍යාවේ ශක්තිය | 285 | 239 | 1483 | 172 | 541 | 440 | 576 | 121 |
| ආ) එක් සිසුවෙකු සඳහා මූලධන වියදම | මූ./වි. ශිෂ්‍ය සංඛ්‍යාවේ ශක්තිය | 42 | 35 | 217 | 25 | 79 | 64 | 84 | 17 |
| **එකතුව** | | **327** | **274** | **1700** | **197** | **620** | **504** | **660** | **138** |

## 18. 2013 යටිතල පහසුකම් පිළිබඳ විස්තර

### 18. අ) 2013 වසරේ ක්‍රියාත්මක වන මූලධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | වැට් සහිත ටෙන්ඩර මුදල (රු.) | 2013.01.01 දින දක්වා අතුරු ගෙවීම් (රු.) | ගෙවීමට නියමිත ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 1 | සම සෞඛ්‍ය පීඨය සඳහා යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | වෝටර්මෑන් (පුද්.) සමාගම | 43,214,598.56 | 14,533,111.51 | 28,681,487.05 |
| 2 | සරසවි උයන ශිෂ්‍ය නේවාසිකාගාරයේ ගොඩනැගිලි දිගුව | A.S.B කන්ස්ට්‍රක්ෂන් | 77,739,160.97 | 15,285,752.00 | 62,453,408.96 |
| 3 | මාකස් ප්‍රනාන්දු ශාලාවට ජලය සැපයීම | NWS & DB | 7,840,000.00 | 3,733,968.00 | 4,106,032.00 |
| 4 | වෛද්‍ය පීඨයේ සායනික පර්යේෂණ හා සේවා විද්‍යාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල | SEC | 38,778,142.03 | 12,665,112.84 | 26,113,029.19 |
| 5 | පාරා සායනික ගොඩනැගිල්ලේ ඉදිකිරීම් (අදියර (II) | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 608,874,537.92 | 91,331,180.67 | 517,543,357.25 |
| 6 | ශාස්ත්‍ර පීඨයේ කළමනාකරණ අධ්‍යයන අංශය සඳහා යෝජිත ගොඩනැගිල්ල (අදියර I, II) | සුමනසේකර ඉදිකිරීම් (පුද්.) සමාගම | 19,927,276.99 | 7,329,903.89 | 12,597,373.10 |
| 7 | යෝජිත කලාගාරය සහ කෞතුකාගාරය | ෆර්නි ඩයනමික් ඉංජිනේරු | 7,832,683.04 | 2,527,999.35 | 5,304,683.69 |

## 18. ආ) 2013 වසර සඳහා ක්‍රියාත්මක වන සියළු පුනරුත්ථාපන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු | වැට් සහිත ටෙන්ඩර් මුදල (රු.) | 2014.01.01 දින දක්වා අතුරු ගෙවීම් | ගෙවීමට නියමිත ශේෂය |
|---|---|---|---|---|---|
| 1 | ක්‍රීඩාගාරයේ විදුලි පද්ධතිය පුනරුත්තාපනය කිරීම | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 7,842,776.20 | 6,351,248.22 | 1,491,527.98 |
| 2 | විදුලි ඉංජිනේරු අධ්‍යයන අංශයේ නව ගොඩනැගිල්ලේ බිම් මහලේ ජනේල ආවරණය කිරීම | ගයාන් ඉදිකිරීම් | 178,080.00 | 124,656.00 | 53,424.00 |
| 3 | නඩත්තු සේවා ගොඩනැගිල්ලට නව පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම | ඩයනමික් ඉදිකිරීම් | 2,800,000.00 | 1,765,867.25 | 1,034,132.75 |
| 4 | මාර්ස් ශාලාවේ (පළමු මහලේ වම් පැත්තේ) පිරිමි වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම | ITCS සමූහ ව්‍යාපාරය | 1,109,556.00 | 330,305.48 | 779,250.52 |
| 5 | මහඉලුප්පල්ලමේ උප මණ්ඩපයේ ප්‍රතිසංස්කරණ කටයුතු | ගනේගෙදර බිල්ඩර්ස් | 1,346,800.00 | 419,721.82 | 927,078.18 |
| 6 | රාමනාදන් ශාලාව වර්ණ ගැල්වීම | ගාමිණී ඉංජිනියරිං | 15,761,776.80 | 10,129,387.38 | 5,632,389.42 |
| 7 | ශාස්ත්‍ර පීඨයේ ආබාධිත සිසුන් සඳහා යෝජිත අමතර පහසුකම් | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 2,161,282.03 | 1,304,007.79 | 857,274.24 |
| 8 | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ආබාධිත සිසුන් සඳහා යෝජිත අමතර පහසුකම් | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 3,180,519.77 | 1,984,435.90 | 1,196,083.87 |
| 9 | සිවිල් ඉංජිනේරු වැඩපොලේ යෝජිත දිගුව | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 11,330,008.10 | 7,807,554.97 | 3,522,453.13 |
| 10 | සැකසුම් කාර්යාලයේ II (DOII) අදියර 01,01 කොටස නවීකරණ කටයුතු | SD&CC | 11,817,519.42 | 8,701,225.98 | 3,116,293.44 |
| 11 | කෘෂිවිද්‍යා පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදි කොට අවසන් කිරීම II අදියර | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 34,178,475.41 | 11,413,600.00 | 22,764,875.41 |
| 12 | පිහිනුම් තටාකයේ පැති බැම්ම අළුත්වැඩියා කිරීම | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 3,281,236.44 | 1,672,120.97 | 1,609,115.47 |
| 13 | දන්ත වෛද්‍ය පීඨයේ රෝගී වාට්ටුවේ යෝජිත දිගුව | සෙනවිරත්න එන්ටර්ප්‍රයිසස් | 3,291,680.00 | 1,638,593.60 | 1,653,086.40 |
| 14 | වෛද්‍ය පීඨයේ බටහිර දේශන ශාලාවේ ප්‍රතිසංස්කරරණ කටයුතු | ITCS ග්‍රෑප් | 2,682,444.80 | 2,129,816.84 | 552,627.96 |
| 15 | කෘෂිවිද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල පොදු කාමරයේ කොන්ක්‍රිට් වහල ප්‍රතිසංස්කරණ කටයුතු | DAD කන්ස්ට්‍රක්ෂන්ස් | 192,567.20 | 108,548.72 | 84,018.48 |
| 16 | අක්බාර් නෙල් ශාලාවේ පිටුපස කම්බි දැල් වැට ඉදිකිරීම | ITCS ග්‍රෑප් | 2,196,488.00 | 600,808.32 | 1,595,679.68 |
| 17 | නිෂ්පාදන ඉංජිනේරු අංශයේ විද්‍යාගාරය කොටස් කිරීම | ස්පෑන් කන්ස්ට්‍රක්ෂන්ස් | 432,880.00 | 295,708.00 | 137,172.00 |
| 18 | මහකන්ද AQ 88 නිල නිවාසයේ ප්‍රතිසංස්කරණ කටයුතු | වීරරත්න කන්ස්ට්‍රක්ෂන්ස් | 675,852.80 | 540,682.24 | 135,170.56 |
| 19 | අක්බාර් නෙල් ශාලාවේ වර්ණාලේප කිරීම | ගාමිණී ඉංජි. වර්ක්ස් | 16,268,000.00 | 11,237,062.03 | 5,030,937.97 |
| 20 | කෘෂිවිද්‍යා පීඨයේ නව පරිපාලන ගොඩනැගිල්ල සඳහා යෝජිත උද්‍යාන අලංකාර සැකසීම | වීරරත්න කන්ට්‍රැක්ටර් | 609,728.00 | 187,139.74 | 422,588.26 |
| 21 | නව වැඩ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල සඳහා ඇළුමිනියම් යොදා කොටස් කිරීම | ලුම්නෙක්ස් (පුද්.) සමාගම | 3,430,126.00 | 2,924,131.95 | 505,994.05 |
| 22 | කෘෂිවිද්‍යා පීඨයේ කෘෂි ව්‍යාප්ත අංශයේ ප්‍රතිසංස්කරණ කටයුතු (පළමු මහලේ ඇතුල් පැත්ත වර්ණාලේප කිරීම) | කැන්ඩි බිල්ඩර්ස් | 285,768.00 | 200,037.60 | 85,730.40 |
| 23 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ ශිෂ්‍ය පොදු කාමරයට යෝජිත ඇළුමිනියම් ජනේල යෙදීම | DAD කන්ස්ට්‍රක්ෂන්ස් | 1,077,787.20 | 821,618.64 | 256,168.56 |
| 24 | පශු වෛද්‍ය පීඨයේ පශු සායනික සේවා අංශයේ යෝජිත කම්බි දැල් වැට | ITCS ග්‍රෑප් | 1,447,437.60 | 295,725.03 | 1,151,712.57 |
| 25 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාන්තා නේවාසිකාගාරය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ජයරුවන් කන්ස්ට්‍රක්ෂන්ස් | 3,328,830.40 | 1,174,248.38 | 2,154,582.02 |
| 26 | වෛද්‍ය පීඨයේ න්‍යෂ්ඨික වෛද්‍ය අංශයේ | ලුම්නෙක්ස් (පුද්.) | 3,746,144.59 | 1,589,576.53 | 2,156,568.06 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යෝජිත නවීකරණ කටයුතු | සමාගම | | | |
| 27 | ශාස්ත්‍ර පීඨයේ ලලිත කලා අංශයේ ප්‍රතිසංස්කරණ කටයුතු | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 6,721,433.36 | 1,191,520.35 | 5,529,913.01 |
| 28 | වෛද්‍ය පීඨයේ ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශයේ යෝජිත නවීකරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 4,722,608.80 | 843,323.00 | 3,879,285.80 |
| 29 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 5,915,240.97 | 1,056,293.03 | 4,858,947.94 |
| 30 | පශු වෛද්‍ය පීඨයේ පවතින පූර්ව සායනික ගොඩනැගිල්ලේ යෝජිත නවීකරණ කටයුතු | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 3,076,941.84 | 1,123,730.11 | 1,953,211.73 |
| 31 | විද්‍යා පීඨයේ 800 kVA ට්‍රාන්ස්ෆෝමරයෙන් භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලට විදුලිය සැපයීම | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 8,830,701.60 | 5,616,443.00 | 3,214,258.60 |
| 32 | පශු වෛද්‍ය පීඨයේ පීඨාධිපති කාර්යාලයේ යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 13,595,146.88 | 4,502,956.64 | 9,092,190.24 |
| 33 | ගල් බංගලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු | ITCS ග්‍රෑප් | 1,273,440.00 | | 1,273,440.00 |
| 34 | ඉහත ස්ථානයේ අදියර I, II කොටසේ නවීකරණ කටයුතු | ස්ටෙට් ඩිවලොප්මන්ට් | 19,964,835.23 | 3,565,149.15 | 16,399,686.08 |
| 35 | හිල්ඩා ඔබේසේකර ශාලාවේ නැවත රැහැන් ඇදීම | චාන්ස් ඉලෙක්ට්‍රික් | 11,263,084.00 | 3,260,239.08 | 8,002,844.92 |
| 36 | වෛද්‍ය පීඨයේ පීඨාධිපති කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 8,141,601.16 | 1,553,280.23 | 6,588,320.93 |
| 37 | සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ යෝජිත නවීකරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 2,972,188.80 | 526,748.00 | 2,445,440.80 |
| 38 | සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ යෝජිත ට්‍රාන්ස්ෆෝමර් ගෘහය | කැන්ඩි බිල්ඩර්ස් | 830,489.80 | | 830,489.80 |
| 39 | ආපන ශාලාවේ හා ශිෂ්‍ය පොදු කාමරය සඳහා යෝජිත ඉතිරි කටයුතු (කෘෂිවිද්‍යා පීඨය) | Dad කන්ස්ට්‍රක්ෂන්ස් | 1,262,380.00 | 156,161.25 | 1,106,218.75 |
| 40 | සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ ජනේල් සඳහා යෝජිත Al. fly mesh | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,653,120.00 | 1,061,522.78 | 591,597.22 |
| 41 | මාවලවත්ත ගොවිපල කළමනාකරුවන්ගේ නිල නිවාස සඳහා යෝජිත වැසිකිළි පද්ධතිය | ITCS ග්‍රෑප් | 889,832.16 | | 889,832.16 |
| 42 | වෛද්‍ය පීඨයේ යෝජිත විභාග ශාලාව (දේශන ශාලා දෙකක්, විභාග ශාලාවක් බවට හැරවීම) | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 8,490,047.16 | 1,683,449.43 | 6,806,597.73 |
| 43 | ලලිත කලා අධ්‍යයන අංශයේ යෝජිත ශිෂ්‍ය වැසිකිළි | ඉසිර බිල්ඩර්ස් | 2,832,376.96 | 415,367.57 | 2,417,009.39 |
| 44 | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ යෝජිත අළුත්වැඩියා කටයුතු | ඉසිර බිල්ඩර්ස් | 2,342,676.00 | 1,874,140.80 | 468,535.20 |
| 45 | පශු වෛද්‍ය පීඨයේ ව්‍යාධ ජීව විද්‍යා අධ්‍යයන අංශයේ නවීකරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 7,157,481.97 | 1,023,421.78 | 6,134,060.19 |
| 46 | පශු වෛද්‍ය පීඨයේ ජෛව රසායන විද්‍යා අංශයේ යෝජිත නවීකරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 3,452,775.20 | 584,467.00 | 2,868,308.20 |
| 47 | යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ තමෝඩයිනමික් විද්‍යාගාරයේ යෝජිත නවීකරණ කටයුතු | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 8,241,499.62 | 1,596,331.91 | 6,645,167.71 |
| 48 | කෘෂිවිද්‍යා පීඨයේ පවතින සූකර ඒකකයේ යෝජිත අළුත්වැඩියා කටයුතු | ඉසිර බිල්ඩර්ස් | 2,686,908.00 | | 2,686,908.00 |
| 49 | විද්‍යා පීඨයේ අණුක ජීවවිද්‍යා හා ජෛව තාක්ෂණ විද්‍යාගාර ගොඩනැගිල්ලේ යෝජිත අළුත්වැඩියා කටයුතු | DAD කන්ස්ට්‍රක්ෂන්ස් | 244,063.96 | | 244,063.96 |
| 50 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ පොදු ශාලාවේ යෝජිත අළුත්වැඩියා කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,539,916.00 | | 1,539,916.00 |
| 51 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ පවතින මුළුතැන්ගෙයි යෝජිත අළුත්වැඩියා කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 2,621,043.60 | | 2,621,043.60 |
| 52 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාර්ය මණ්ඩල නිල නිවාසවල B-3 යෝජිත අළුත්වැඩියා කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,469,199.20 | | 1,469,199.20 |
| 53 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාර්ය මණ්ඩල නිල නිවාසවල B-2 යෝජිත අළුත්වැඩියා කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,476,759.20 | | 1,476,759.20 |
| 54 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාර්ය මණ්ඩල නිල නිවාසවල B-1 යෝජිත අළුත්වැඩියා කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,397,659.20 | | 1,397,659.20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **55** | කෘෂිවිද්‍යා පීඨයේ පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ භෞතික විද්‍යා විද්‍යාගාරයේ යෝජිත අළුත්වැඩියා කටයුතු | කැන්ඩි බිල්ඩර්ස් | 672,000.00 | | 672,000.00 |
| **56** | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පිරිමි හා කාන්තා වැසිකිළි සංකීර්ණයේ යෝජිත අළුත්වැඩියා කටයුතු | ස්පෑන් කන්ස්ට්‍රක්ෂන්ස් | 2,730,892.08 | | 2,730,892.08 |
| **57** | කාර්ය මණ්ඩල නිල නිවාසවල A-01 හි යෝජිත අළුත්වැඩියා කටයුතු | ස්පෑන් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,483,076.00 | | 1,483,076.00 |
| **58** | ඉංජිනේරු පීඨයේ High Voltage විද්‍යාගාරයේ යෝජිත නවීකරණ කටයුතු | ගාමිණී ඉංජි. වර්ක්ස් | 2,383,981.32 | 419,710.95 | 1,964,270.37 |
| **59** | දන්ත වෛද්‍ය පීඨය සඳහා ලිබඩු සහිත දේශන ශාලාව | ගාමිණී ඉංජි. වර්ක්ස් | 7,966,784.00 | 1,422,640.00 | 6,544,144.00 |
| **60** | දන්ත වෛද්‍ය පීඨයේ ආපන ශාලාවේ යෝජිත දිගුව | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්ස් | 13,689,636.49 | 2,443,837.94 | 11,245,798.55 |

## 18. ඇ) 2013 වසරේ අවසන් කළ ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | කොන්ත්‍රාත්තුවේ වටිනාකම (වැට් සහිතව) |
|---|---|---|---|
| 1 | වෛද්‍ය පීඨය සඳහා පාරා සායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 280,000,000.00 |
| 2 | විද්‍යා පීඨයේ නව භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලක් සැලසුම් කර ඉදිකිරීම | CECB | 87,000,000.00 |
| 3 | සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ සත්වහලට යෝජිත දිගුව ඉදිකිරීම | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 11,111,111.03 |
| 4 | ශාස්ත්‍ර පීඨයේ කළමනාකරණ අධයයන අංශය සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර I, II කොටස | ගාමිණී ඉංජි. වර්ක්ස් rks | 9,647,558..23 |

## 18. ඇ) 2013 වසරේ අවසන් කළ පුනරුත්ථාපන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | කොන්ත්‍රාත්තුවේ වටිනාකම (වැට් සහිතව |
|---|---|---|---|
| 1 | පීඨ ක්‍රීඩා සමාජයේ හා විනෝද සංගමයේ ප්‍රතිසංස්කරණ කටයුතු | ITCS ගෲප් | 938,025.76 |
| 2 | කම්ටු කාමරයේ බිම කලාල එලීම | ඉසුරු ඉන්ටීරියස් | 105,336.00 |
| 3 | සිතියම් විද්‍යාගාරය GIA විද්‍යාගාරයක් බවට පත් කිරීම | යසිත එන්ටර්ප්‍රයිසස් | 1,800,500.80 |
| 4 | දන්ත වෛද්‍ය පීඨයේ ආරෝග්‍ය ශාලා ගොඩනැගිල්ල වර්ණාලේප කිරීම | ගාමිණී ඉංජි. වර්ක්ස් | 3,502,156.00 |
| 5 | දන්ත වෛද්‍ය පීඨයට යෝජිත කම්බි දැල් වැටක් ඉදිකිරීම | වීරරත්න කන්ස්ට්‍රක්ෂන්ස් | 1,464,680.00 |
| 6 | ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශයේ අළුත්වැඩියා කටයුතු (බිම් මහල) | MBR කන්ස්ට්‍රක්ෂන්ස් | 1,445,662.40 |
| 7 | යෝජිත හැකිලෙන ඇළුමිනියම් දොරවල් හා ඇළුමිනියම් දොර | DAD කන්ස්ට්‍රක්ෂන්ස් | 186,989.60 |
| 8 | විද්‍යා පීඨයේ ගිණුම් අංශයේ යෝජිත නවීකරණ කටයුතු | ස්පෑන් කන්ස්ට්‍රක්ෂන්ස් | 476,707.00 |
| 9 | ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයන අංශයට නව කාර්ය මණ්ඩල කාමරයක් ඉදිකිරීම සඳහා රහස්‍ය කාමරය යෝජිත කොටස් කිරීම | DAD කන්ස්ට්‍රක්ෂන්ස් | 369,715.92 |
| 10 | වෛද්‍ය පීඨයේ ජලනල පද්ධතියේ අළුත්වැඩියාව | සී.එච්. ජයසිංහ කන්ස්ට්‍රක්ෂන්ස් | 1,952,242.88 |
| 11 | සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශයේ සිමෙන්ති ටැංකි ඉදිකිරීම | ITCS ගෲප් | 264,936.00 |
| 12 | රාමනාදන් ශාලාවේ ශිෂ්‍ය කාමරයේ යෝජිත කොටස් කිරීමේ කටයුතු (දෙවන මහල) | දූර්රා බිල්ඩිංග්ස් | 1,779,758.40 |
| 13 | විජේවර්ධන ශාලාවේ ශිෂ්‍ය කාමරයේ යෝජිත කොටස් කිරීමේ කටයුතු (තෙවන මහලේ DH I) | දූර්රා බිල්ඩිංග්ස් | 1,812,832.00 |
| 14 | විජේවර්ධන ශාලාවේ ශිෂ්‍ය කාමරයේ යෝජිත කොටස් කිරීමේ කටයුතු (තෙවන මහල DH -2) | දූර්රා බිල්ඩිංග්ස් | 1,795,550.40 |

**මහාචාර්ය අතුල සේනාරත්න**
**උපකුලපති**
**2013 පෙබරවාරි**

## උපග්‍රන්ථය A – පීඨ වාර්තා

### A1 කෘෂිවිද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය කේ. සමරසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)

#### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය පිළිබඳ උසස් අධ්‍යාපනය 1948 වසරේදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් යුතුව පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා සහ පශු වෛද්‍ය යන පීඨවලදී ආරම්භ කරන ලදි. ආරම්භයේදී හඳුන්වා දෙන ලද තුන් අවුරුදු අධ්‍යයන වැඩ සටහන 1968 වසරේදී එක් අවුරුදු ගොවිපල පුහුණු පාඨමාලාවක් ඇතුළත් කිරීම තුළින් සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් බවට පත්විය. මෙම පාඨමාලාව 1968 වසරේ ස්ථාපිත කරන ලද මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ දී පවත්වන ලදි. පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි වැඩසටහන සවිමත් කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස කුණ්ඩසාලේ දොඩංගොල්ලෙන් හෙක්ටයාර 7906ක භූමි භාගයක් එම වසරේදීම විශ්වවිද්‍යාලය විසින් ලබාගන්නා ලදි. 1972 වසරේදී අධ්‍යන අංශ හයකින් (06) යුක්ත අංග සම්පූර්ණ සහ නිදහස් කෘෂිවිද්‍යා පීඨයක් ස්ථාපිත කරන ලද අතර මෙම අධ්‍යයන අංශ හය පසුකාලීනව අධ්‍යයන අංශ අටක් දක්වා පුළුල් කරන ලදි.

පීඨය මඟින් පිරිනමනු ලබන ප්‍රධාන උපාධි වැඩසටහන වන විද්‍යාවේදී උපාධිය රටේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි කෘෂිතාක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය ලෙසට සම්පූර්ණයෙන් සංශෝධනය කරන ලදි. සංශෝධනය කරන ලද උපාධි වැඩසටහනට නූතන ලෝකයට අවශ්‍ය කරන විවිධ කුසලතාවන්ගෙන් හෙබි උපාධිධාරීන් බිහිකිරීමේ හැකියාව ඇත. පසුකාලීනව පීඨය නව උපාධි වැඩසටහන් දෙකක් එනම් ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධිය හා සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී යන සිව් අවුරුදු උපාධි දෙක හඳුන්වා දෙන්නට විය. මෙම උපාධි සඳහා වාර්ෂිකව සිසුන් 275 දෙනකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ඇතුළත් කරගනු ලැබේ. මීට අමතරව පීඨය කර්මාන්ත ක්ෂේත්‍රයේ මිනිස් බලය පුහුණු කිරීමට දක්වනු ලබන දායකත්වයක් වශයෙන් විශේෂ ප්‍රතිපාදන යටතේ උපරිම වශයෙන් සිසුන් 18 දෙනෙකු වාර්ෂිකව බඳවා ගනු ලබයි. වර්තමානය වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ පැරණිම පීඨය පමණක් නොව එය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ විශාලතම හා වඩාත් පිළිගත් කෘෂිවිද්‍යා පීඨය බවට පත්ව ඇත.

#### ජයග්‍රහණ

අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගෙන පවත්වා ගෙන යෑම කෘෂිවිද්‍යා පීඨය මුහුණ දෙමින් පවතින අඛණ්ඩ දුෂ්කරතාවයකි. 2013 වසරේ දී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ පරිවාස කථිකාචාර්යවරුන් සිව් දෙනෙකු බඳවා ගැනීමට පීඨයට හැකි විය. විදෙස් අධ්‍යයන නිවාඩු ලබා සටි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ කිහිප දෙනෙකු ඔවුන්ගේ ආචාර්ය උපාධි සාර්ථකව අවසන් කොට පැමිණ නැවත රාජකාරී ආරම්භ කළහ. මහාචාර්යවරුන් දෙදෙනකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කළ අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු දක්ෂතා පදනම මත මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. පීඨයේ එක් මහාචාර්යවරයෙකුට රජරට විශ්වවිද්‍යාලය විසින් ගෞරව උපාධියක් ප්‍රදානය කරන ලදි. පසුගිය වර්ෂ කිහිපයකදී ගත් අසාර්ථක උත්සහයන්වලින් පසුව කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ස්ථිර පදනමින් බඳවා ගන්නට පීඨයට හැකි විය. 2013 වසරේ විශ්‍රාම ගනු ලැබූ මහාචාර්යවරුන් දෙදෙනෙකුට යාවජීව මහාචාර්ය පදවිය පිරිනමන ලදි. පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවැති පුරප්පාඩු කිහිපයක් පිරවීමට ද 2013 වසරේදී පීඨයට හැකි විය.

කෘෂිවිද්‍යා පීඨය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ව්‍යාපෘති දෙකකට (යළි පුබුදමු ව්‍යාපෘතිය හා දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග දියුණු කිරීමේ ව්‍යාපෘතිය) සහයෝගය දැක්වීම අඛණ්ඩව සිදුකරන ලදි. කෘෂිවිද්‍යා අධ්‍යාපන ඒකකය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩ සටහන සහභාගී වන්නන් සඳහා පිරිනමන සාමාන්‍ය කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම නේවාසික පුහුණු වැඩසටහනට 2013 ඔක්තෝබර් 08 වැනි දින ආරම්භ කරන ලදි. සහතික පත්‍ර පාඨමාලාවක් තුළින් කෘෂි රසායන අලෙවිය පිළිබඳ පුද්ගලයන් පුහුණු කරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිවිද්‍යා පීඨයට බලය ලබා දෙන්නට විය. එවැනි පාඨමාලාවක් තුළින් ලබාදෙන සහතිකය ඉදිරියේ දී කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය සඳහා අවශ්‍යයෙන් තිබිය යුතු අවසර බලපත්‍රයක් ලෙස සලකනු ලබයි. මෙම පාඨමාලාවට සහභාගී වී එය අවසන් කළ පළමු කණ්ඩායමට 2013 සැප්තැම්බර් 28 වැනි දින උපකුලපතිතුමා විසින් සහතික පත්‍ර ලබාදෙන ලදි. දෙවන කණ්ඩායම ද මෙම පාඨමාලාව හැදෑරීම ආරම්භ කොට ඇත. කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය දෙවන වරටත් ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා, චිරස්ථායී නිවර්තන කෘෂිකර්ම පද්ධතිය, පිළිබඳ Study Abroad වැඩසටහන සාර්ථකව පවත්වන්නට විය. සති හතරක් පැවැති මෙම වැඩසටහනට සහභාගී වූවන් එය ඉතා උසස් කොට අගය කළහ.

පුරුදු පරිදිම පීඨය සමාජ ක්‍රියාකාරකම් ලෙස වැඩමුළු, සමුළු හා පුහුණු වැඩසටහන් සංවිධානය කොට පැවැත්වීම යුහුසුළුව සිදුකරන ලදි. 2013 වසර තුළ පීඨය ජාත්‍යන්තර වැඩමුළු/ සමුළු දෙකක් හා ජාතික/ ප්‍රාදේශීය මට්ටමේ වැඩමුළු හා පුහුණු වැඩසටහන් විස්සකට (20) වැඩි ප්‍රමාණයක් පවත්වා ඇත. පීඨයේ පර්යේෂණ හැකියාව ශක්තිමත් කරමින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් දේශීය සහ ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතනවලින් රුපියල් මිලියන 62ක මුළු මුදලක් ලබාගෙන ඇත. ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන HETC (21 වැනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපනය) ව්‍යාපෘතියේ තත්ත්ව සහ නව නිපැයුම් ප්‍රධාන තුනක් ලබාගැනීමට ද පීඨයට හැකිවිය. වින්ඩෝ 02 යටතේ ආහාර විද්‍යා හා තාක්ෂණවේදී උපාධි වැඩසටහන සහ කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණ උපාධි වැඩසටහනට ද HETC වින්ඩෝ 04 යටතේ කෘෂිව්‍යාපාර මධ්‍යස්ථානයට ද ප්‍රදානයන් ලැබුණි. එම ප්‍රධාන තුනෙහි මුළු වටිනාකම රුපියල් මිලියන 60ක් වූ අතර, HETC ප්‍රදානවලින් ඉහළම ප්‍රදානයන් ප්‍රමාණයක් ලබාගැනීමට සමත්වූයේ ද කෘෂිවිද්‍යා පීඨයයි. දීර්ඝ ප්‍රමාදයකින් පසුව පීඨයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා එහි ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට පීඨයට හැකි විය. 2008 වසරේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පීඨයේ ප්‍රදාන සැලසුමට 2013 වසරේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර ඉදිකරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රියාදාමය වර්ෂයේ අවසාන කාලයේ දී ආරම්භ කරන ලදි.

### බාධක සහ පිළියම්

පීඨයට අනුබද්ධව සිටි එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු පෞද්ගලික හේතූන් මත විශ්වවිද්‍යාල සේවයෙන් ඉල්ලා අස්වී පුද්ගලික අංශයට සම්බන්ධ විය. වෙනත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු විශ්වවිද්‍යාල සේවාවෙන් විශ්‍රාම ලබා ගත්හ. සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධියේ සිව්වන සිසු කණ්ඩායමේ අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පවතින යටිතල පහසුකම්වල හිඟය නිසා ඉමහත් ගැටළුවලට මුහුණ දීමට පීඨයට සිදුව ඇත. මුදල් හිඟය නිසා සමහර ප්‍රසම්පාදන සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

### අනාගත සැලසුම්

ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධි සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය කරන අමතර පහසුකම් සැපයෙන නව විද්‍යාගාර ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසානය කරා පැමිණ ඇති හෙයින් ලබන වසරේ සිට ඒ සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය ප්‍රමාණය වැඩි කිරීමට පීඨය අපේක්ෂා කරයි.

# A2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති, වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න විසින් වාර්තා කරන ලද පරිදි)

## හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුඩාම සහ 8 වැනි පීඨය 2007 වසරේ ස්ථාපිත කරන ලද සම සෞඛ්‍ය විද්‍යා පීඨයයි. සම සෞඛ්‍ය විද්‍යා පීඨය මේ වනවිට විද්‍යාවේදී හෙදවේද, විද්‍යාවේදී භෞත චිකිත්සකවේද, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා, විද්‍යාවේදී ඔසුවේද, විද්‍යාවේදී විකිරණවේද හා විකිරණ චිකිත්සාව යන විද්‍යාවේදී උපාධි සඳහා සුදුසුකම් ලැබීම පිණිස හෙදවේද සහ සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු හා තුන් අවුරුදු විශේෂවේදී ප්‍රථම උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි. මෙම පීඨය සතුව ඒ ඒ අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 28 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 41 දෙනෙකුගෙන් යුතු අධ්‍යයන අංශ පහක් ඇත. මෙම පීඨයට බඳවාගත් තුන්වන සිසු කණ්ඩායම ඔවුන්ගේ පාඨමාලාවන් මේ වනවිට අවසන් කොට ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉතිහාසයේ ප්‍රථම වරට නව විද්‍යාවේදී උපාධි පහක් 2012 වසරේ පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රදානය කරන ලදි. වර්තමානය වනවිට ඉහත සඳහන් කරන ලද විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධි පාඨමාලාවන් හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව 722කි. මේ දක්වා පීඨයෙන් බිහිවූ උපාධිධාරීන් සංඛ්‍යාව 322 කි. පීඨය සිසුන්ට රෝහල් මුල්කරගත් පුහුණුව ලබාදීම සඳහා ජාතික සහ පුද්ගලික රෝහල්වල බලධාරීන් සමඟ සහයෝගීතාවන් ගොඩනගාගෙන ඇත. මෙම පීඨයෙන් උපාධි ලබා රෝහල්වල හා විද්‍යාගාරවල රැකියාවන්හි නියුතු වේ. කරුණු එසේ වුව ද පීඨය තවමත් බෙහෙවින්ම රැඳී පවතිනුයේ වෙනත් පීඨවල පීඨාධිපතීන්ගේ හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල සාමාජිකයින්ගේ සුහඳතාවය මතය.

පීඨයේ භෞත චිකිත්සක සේවා අංශය බාහිර රෝගීන් හට ගුණාත්මක භෞත චිකිත්සක සේවාවක් ලබාදෙන අතරම සිසුන්ට යහපත් සායනික පුහුණුව ලබාදෙන විවෘත පරිසරයක් ලෙස පීඨය තුළදීම රෝගී සේවාවක් ලෙස යොදා ගැනීමට ද ඉඩ සලසා ඇත. (X-ray) එක්ස්-කිරණ ඒකකය ප්‍රථම උපාධි අධ්‍යාපනයට මූලිකත්වය දෙන අතරම රෝගී සේවාව ද ලබා දෙයි.

## ජයග්‍රහණ

2009/2010 හෙද සිසු කණ්ඩායම් සිව්වන ලාම්පු දැල්වීමේ උත්සවය 2013 ජනවාරි 04 වැනි දින සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ දී පවත්වන ලදි. ප්‍රධාන අමුත්තා ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද අංශයේ අධ්‍යක්ෂකතුමා, උපකුලපතිතුමා හා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය රැගත් පෙරහැරකින් මෙම උත්සවය ආරම්භ විය. ප්‍රතිඥාදීමේ උත්සවයේ වැදගත්කම ශිෂ්‍ය හෙද/හෙදියන්ට පහදා දෙන ලද්දේ හෙද අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා විසිනි.

- 2011/2012 නවක සිසු කණ්ඩායමේ සමාරම්භක වැඩසටහන 2013 අප්‍රේල් මස පළමු දින මෙම පීඨ පරිශ්‍රයේ දී පවත්වන ලදි.

- ඖසුවේද අධ්‍යයන අංශය සඳහා නව විද්‍යාගාරයක් සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ දී 2013 අප්‍රේල් මස පළමු දින විවෘත කරන ලදි. මෙම විද්‍යාගාරය ඖෂධ ආකෘතීන් සංවර්ධනය කිරීම හා කුඩා ප්‍රමාණයේ බෙහෙත් නිෂ්පාදනය සඳහා යොදාගනු ඇත. මෙය මෙම අධ්‍යයන අංශය අත්කර ගත් විශාල ජයග්‍රහණයක් වන අතර එය ප්‍රථම උපාධි පුහුණු සැසි හා පර්යේෂණ කටයුතු සඳහා ද උපයෝගී කරගනු ඇත.

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඉයන් කැම්බස්ගේ නායකත්වයෙන් යුතු ආගන්තුක කථිකාචාර්යවරුන් සිව් දෙනෙකු ඇතුළත් සායනික ඖෂධ කණ්ඩායමක් පීඨයට පැමිණ 2013 ජූනි 17-21 දින දක්වා රැඳී සිටි කාලය තුළ අවසන් වසර ඖෂවේද සිසුන් සඳහා රෝගී වාට්ටු පදනම් කරගත් තෙදින පුහුණු වැඩසටහනක් කුරුණෑගල ශික්ෂණ රෝහලේ දී පැවැත් වූ අතර දෙවන හා තෙවන වසර ඖෂදවේද සිසුන් සඳහා සායනික ඖෂධ සැසි හා නිබන්ධන පංති පවත්වන ලදි.

- ආරක්ෂක හමුදා විසින් සංවිධානය කොට කිලිනොච්චියේ දී 2013 ජූනි 28-29 යන දිනවලදී පවත්වන ලද අධ්‍යාපන ප්‍රදර්ශනයට සම සෞඛ්‍ය විද්‍යා පීඨය ක්‍රියාශීලිව සහභාගී විය. පීඨයේ අධ්‍යයන අංශ පහෙන්ම සිසුන් 47 දෙනෙකු ඊට සහභාගී වූහ. සෑම අධ්‍යයන අංශයක්ම වෙනම ප්‍රදර්ශන කුටි පැවැත්වූ අතර, පාසල් සිසුන්ගේ හා සාමාන්‍ය මහජනතාවගේ යහපත පිණිස සම සෞඛ්‍ය විද්‍යා වෘත්තීය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීමේ වැදගත්කම හා එහි වටිනාකම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සිසුන් ඔවුන්ගේ ප්‍රදර්ශන කුටි උපයෝගී කර ගත්හ.

- 2010/2011 හෙදවේද සිසු කණ්ඩායමේ ලාම්පු දල්වා ප්‍රතිඥාදීමේ උත්සවය සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ප්‍රධාන දේශන ශාලාවේ දී 2013 අගෝස්තු මස 28 වැනි දින පවත්වන ලදි. ජපානයේ නිගාතා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එච්. ටන්නෝ (ප්‍රධාන අමුත්තා), උපකුලපතිතුමා හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් සැදුම්ලත් පෙරහැරකින් ලාම්පු දැල්වීමේ උත්සවය ආරම්භ විය.

- විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය 1895 නොවැම්බර් 08 වැනි දින එක්ස්-කිරණ (X-ray) සොයා ගැනීම සනිටුහන් කරනු වස්, ලෝක විකිරණ විද්‍යා දිනය, 2013 නොවැම්බර් 08 වැනි දින පීඨ පරිශ්‍රයේ දී පවත්වන ලදි. විකිරණ විද්‍යා වෘත්තීය පිළිබඳ දැනුවත් බව ඇති කිරීමට හා එම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුව වර්ධනය කිරීම සඳහා මෙය වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර උත්සවයකි. අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩල හා සිසුන් 100ට වැඩි පිරිසක් මේ සඳහා සහභාගී විය.

- ආබාධිතයන්ගේ දිනය, සැමරීම සඳහා, "විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වෙනුවෙන් වඩා යහපත් වූ ලෝකයක් බිහි කිරීම සඳහා එකමුතු වෙමු" යන තේමාව යටතේ වැඩ සටහනක් 2013 පෙබරවාරි 11 වැනි දින පීඨ පරිශ්‍රයේ දී පවත්වන ලදි. භෞත චිකිත්සක අධ්‍යයන අංශය විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදි.

- ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය තාක්ෂණ අධ්‍යයන අංශයේ යාවජීව මහාචාර්ය එස්. හිරානෝ මාස දෙකක කාලයක් සඳහා ආගන්තුක මහාචාර්ය ලෙස මෙම පීඨයේ වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශයේ සේවය කළේය.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ලියාපදිංචි වූ 2006/2007 දෙවන සිසු කණ්ඩායම ඔවුන්ගේ නිර්දේශිත පාඨමාලා වැඩ අවසන් කොට උපාධිලාභීන් බවට සුදුසුකම් ලැබීය. 2013 මැයි 19 වැනි දින පවත්වන ලද උපාධි ප්‍රදානොත්සවයේ දී සිසුන් 147 දෙනෙකු ඔවුන්ට අදාළ උපාධි ලබා ගත්හ.

- ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විද්‍යා පීඨය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමක් යටතේ නිගාටා

විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන් තිදෙනෙකු හා සිසුන් 08 දෙනෙකු ඇතුළත් කණ්ඩායමක් පිළිවෙළින් සිව්වන වතාවටත් පීඨයට පැමිණ 2013 අගෝස්තු 25 දින සිට සැප්තැම්බර් 04 දින දක්වා රැඳී සිටියේය. Sister Line වැඩසටහන යටතේ හෙදවේද අධ්‍යයන අංශයේ එම්.එල්. පතිරණ මිය හා යූ.ඩබ්.එස්. රත්නායක නිගාතා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහනකට 2013 මාර්තු 04-09 දක්වා සහභාගි වූහ.

- හෙදවේද, විකිරණ විද්‍යා හා වෛද්‍ය රසායනාගාර යන අධ්‍යයන අංශවලට අයත් සිසුන් නව දෙනෙකුට 2013 ඔක්තෝබර් මුල් සතියේ සිට 2014 පෙබරවාරි අග සතිය දක්වා වූ මාස පහක කාලයක් ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විද්‍යා පීඨයේ දී පර්යේෂණ අධ්‍යයනයක් සඳහා ශිෂ්‍යත්වයක් පිරිනමන ලදි.

- හෙදවේද හා සම සෞඛ්‍ය විද්‍යා උපාධි වැඩසටහන්වල 3+1 විෂය නිර්දේශය විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කරන ලදී. විකිරණ විද්‍යා හා විකිරණ චිකිත්සක විද්‍යාවේදී බාහිර උපාධිය සඳහා වූ අදාළ විෂය නිර්දේශය ද විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කරන ලදි.

- සංවර්ධනය වෙමින් පවතින රටවල සම-වෛද්‍ය වෘත්තියෙහි සංවර්ධනය හා අධ්‍යාපනයට සහයවීම සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීම, පිළිබඳ ජපානයේ ගුන්මා විශ්වවිද්‍යාලය හා හෙදවේද අධ්‍යයන අංශය අතර ඇතිකරගත් සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කරන ලදි.

- හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වූ සම්මානය ශ්‍රී ලංකා මුඛ හා හනුක ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ වාර්ෂික සැසියේ දී වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය ආර්.පී. ඉලේපෙරුමහට ප්‍රදානය කරන ලදි.

### බාධක සහ පිළියම්

- ශ්‍රම බලකාය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පරණ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු අවසන් කිරීමට නොහැකි විය. පීඨය සඳහා ඉදිකෙරෙන නව ගොඩනැගිල්ලේ කටයුතු ද අවසන් කිරීමට නොහැකි වූයේ කොන්ත්‍රාත්කරුගේ කැපවීමේ මන්දගාමීත්වය හේතුවෙනි.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ උනනදුව අඩුවීම නිසා ආසන්න රෝහල්වලින් රෝහල් පදනම් කරගත් පුහුණුව ලබාදීම වෙනුවෙන් ගත් සියලු උත්සහයන් ව්‍යවර්ථ විය.

### අනාගත සැලසුම්

- පීඨය තුළ ඖසුහලක් ස්ථාපිත කිරීම.
- විද්‍යාවේදී භෞත චිකිත්සක සහ විද්‍යාවේදී විකිරණ විද්‍යාව පිළිබඳ බාහිර උපාධි වැඩසටහනක් හඳුන්වාදීම.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය, ප්‍රජා සෞඛ්‍ය අධ්‍යයන මධ්‍යස්ථානයක්, ස්ථාපිත කිරීමේ අදහසින් පසුවේ. මෙහි මූලික අරමුණ වනුයේ ගෘහ මට්ටමින් වැඩිහටියන්ට සෞඛ්‍ය සේවාව ලබාදෙන්නන් සඳහා පුහුණුව ලබා දීමයි.
- රෝග හඳුනාගැනීමේ විද්‍යාගාරයක්, සියලු උපකරණවලින් සමන්විත ක්ෂුද්‍රජීව විද්‍යාගාරයක් හා ශිෂ්‍ය පර්යේෂණ විද්‍යාගාරයක් පීඨය තුළ ස්ථාපික කිරීම.
- රසායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම හා භෞත චිකිත්සක අංශයේ හා විකිරණ විද්‍යා අංශයේ රෝගී සේවා ඒකකය විසින් ලබා දෙන සේවාවන් ඉහළනැංවීම.

## A3 ශාස්ත්‍ර පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ඒ.එම්. නවරත්න බණ්ඩාර විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අංශයේ ක්ෂේත්‍රයන් 15ක් ඔස්සේ ශාස්ත්‍රවේදී උපාධිය පිරිනමමින් සිටින කලා පීඨය මේ වනවිට ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හා නීතිවේදී උපාධිය ද පිරිනමනු ලබයි. මෙය මීට වර්ෂ හතරකට පෙර නව අධ්‍යයන අංශ දෙකක් ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයකි. ව්‍යාපාර පරිපාලනවේදී උපාධියේ පළමු සිසු කණ්ඩායම 2013 වසරේ උපාධි ලබාගත් අතර නීති අධ්‍යයන අංශය 2013 අධ්‍යයන වර්ෂය අවසානයේ පිටවීමට නියමිතව සිටින එහි පළමු සිසු කණ්ඩායමේ අවසන් වසරේ ඉගැන්වීමේ වැඩසටහන ආරම්භ කොට ඇත.

### ජයග්‍රහණ

අමතර සිසුන් පිරිසක් ඇතුළත් කර ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගන්නා ලද තීරණයට ධනාත්මක ප්‍රතිචාරයක් දක්වමින් කලා පීඨය 2013 වසරේ වත්මන් අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 1251ක් ඇතුළත් කරගන්නා ලදි. ඒ අනුව මෙම පීඨය 2013 වසරේදී අමතර සිසුන් 501 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලදි. (ශාස්ත්‍රවේදී 432: ව්‍යාපාරවේදී 51: නීතිවේදී 18) (2013 වසරේ නවක සිසුන් බඳවා ගැනීමෙන් 41% ක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් කොට ගෙන ඇත.)

නවක සිසුන් ජ්‍යෙෂ්ඨ සිසුන්ට වඩා මාස දෙකකින් ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලාවන් ආරම්භ කළද නවක සිසුන්ගේ අධ්‍යයන වාර සටහන සමග සංවිධිත කිරීම පීඨය විසින් සිදුකරන ලදි.

පීඨය 2013 වසරේදී උපාධිධාරීන් 871 දෙනෙකු (ශාස්ත්‍රවේදී 732/ ව්‍යාපාර පරිපාලනවේදී 119/ වාණිජවේදී 20) ශාස්ත්‍රපති 152ක්, දර්ශනපති 08ක් හා දර්ශනශූරි 03ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 223 දෙනෙකු බිහිකරන ලදි.

පීඨය පීඨයෙහි නිත්‍ය වශයෙන් පළකරනු ලබන වාර සඟරා හතරක් පළකරන්නට විය. ඒවා, නූතන ශ්‍රී ලංකා අධ්‍යයන, මානව ශාස්ත්‍ර පිළිබඳ ශ්‍රී ලංකා වාර්තාව, සම්භාවනා(සිංහල) හා පල්බාලෙයි, (දෙමළ) යන නම්වලින් හැඳින්වේ. ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන, දර්ශනය හා මනෝ විද්‍යා, පාලි හා බෞද්ධ අධ්‍යයන හා භූගෝල විද්‍යා යන අධ්‍යයන අංශ විසින් එම අධ්‍යයන අංශවල සිසුන් හා කාර්ය මණ්ඩලයේ ශාස්ත්‍රීය ලිපි පළ කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙමින් එම ශාස්ත්‍රීය ලිපි බොහෝ දෙනාගේ පරිහරණය සඳහා ඉඩසලසමින් ශාස්ත්‍රීය වාරසඟරා පළකරන ලදි.

2013 වසරේදී පීඨය විසින් සම්මන්ත්‍රණ 09ක් සංවිධානය කරන ලදි. (කැනේඩියානු දාර්ශනිකයෙකු වන මහාචාර්ය චාල්ස් ටේලර් පීඨයේ සම්මන්ත්‍රණ මාලාව යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පැමිණියේය.) ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය වාර්ෂික එච්.ඒ.ද.එස්. ගුණසේකර අනුස්මරණ දේශනය සංවිධානය කළ අතර එම දේශනය පවත්වන ලද්දේ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරල විසිනි. එමෙන්ම මෙම පීඨය ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරමින් ශ්‍රී ලංකා ආර්ථික සංසදය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන්නට සත්කාරකත්වය දරන ලදි. තවද, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය එම අංශයේ සිසුන් හා පර්යේෂකයන්ගේ යහපත සඳහා ප්‍රථම වතාවට පේරාදෙණිය ආර්ථික පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන්නට විය. අරාබි හා ඉස්ලාම් අධ්‍යයන අංශය, බහුවිධ සමාජයක (Pluralistic Society)

මුස්ලිම්වරුන්ගේ කාර්යභාරය, පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර දෙමළ භාෂා අධ්‍යයන අංශය විසින් "Tamilology" පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයක් පවත්වන්නට විය.

ආචාර්ය මණ්ඩලයේ උගතුන් 19 දෙනෙකු විසින් බාරදෙන ලද පර්යේෂණ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන දහයකට (10) වැඩි මුදලක් 2013 වසරේදී මෙම පීඨයට ලැබිණි. 2012 වසරේ අනුමත කොට මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ ව්‍යාපෘතීන් සමඟ පීඨයේ කාර්ය මණ්ඩලය 2013/14 වර්ෂයේ ආසන්න වශයෙන් පර්යේෂණ ව්‍යාපෘති 40ක් පමණ භාරගෙන කටයුතු කරමින් සිටියි. පීඨයේ කාර්ය මණ්ඩලය 2013 වසරේ පවත්වන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියට උපුටන (Abstrcts) 33 ක් බාර දී ඇත. පර්යේෂණ හා ඉගැන්වීම් කාර්යයන් සඳහා "GIS" තාක්ෂණය යොදා ගැනීමට දීර්ඝ කාලයක සිට අපේක්ෂාවෙන් පසු වූ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයට එම අපේක්ෂාව මල්පල ගන්වමින් "GISP" ස්ථාන බලපත්‍රය 2013 වසරේදී ලැබිණ.

ශාස්ත්‍ර පීඨය 2013 වසරේ දී පැවති පරිගණක පහසුකම් ඉහළ නංවෙමින් එම පීඨයේ "පහසු පිවිසුම්, භාෂා විද්‍යාගාරය" (EALL) නැවත ක්‍රියාත්මක කරන ලදි. පහසු පිවිසුම් භාෂා විද්‍යාගාරය විසින් පවත්වනු ලබන පරිගණක ආධාරක ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන පුළුල් කිරීම සඳහා HETC අනුග්‍රහය ලද විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදානයෙන් අළුත් පරිගණක පනහක් (50) 2013 දෙසැම්බර් මාසයේ දී පීඨයට ලැබිණ. කලා සිසුන්ගේ නව නිපැයුම් සංවර්ධනය සඳහා පීඨය විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව ලෝක බැංකුව විසින් 2013 වසරේ දී පිළිගන්නා ලදි. මෙම නව ව්‍යාපෘති මඟින් පරිගණක 150ක් සහිත විද්‍යාගාර තුනක් එනනම් තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, ඉංග්‍රීසි භාෂා විද්‍යාගාරය හා මෘදු කුසලතා විද්‍යාගාරය යන නම්වලින් හැඳින්වෙන විද්‍යාගාර තුනක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 68ක ඇස්තමේන්තුගත උපකරණ තොගයක් පීඨයට ලැබෙනු ඇත.

වර්ෂය තුළදී පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන කමිටුව කොළඹ බ්‍රිතාන්‍ය සභාව (British Council) විසින් සැලසුම් කොට ලබාදෙන ලද ශාස්ත්‍රීය රචනය හා ඉංග්‍රීසි පුහුණු වැඩසටහන පරිවාස කථිකාචාර්යවරුන් 20 දෙනෙකු සඳහා සාර්ථකව පවත්වන ලදි. පීඨයේ ඉදිරි අධ්‍යයන සංවර්ධනය ආධුනික කථිකාචාර්යවරුන් මත රැඳී පවතින හෙයින් පීඨය මෙම පුහුණු වැඩසටහනේ දෙවන වටය 2014 දී පැවැත්වීමට සැලසුම් කරන අතර එහි පළමු වැඩසටහන මේ පිළිබඳ රුචිකත්වයක් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සඳහා වෙන් කිරීමට ද අදහස් කරයි.

බාහිර ආයතන කිහිපයක් විසින් කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් 2008 වසරේ ස්ථාපිත කරන ලද "විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ සම්පත් මධ්‍යස්ථානය "(SNRC)" විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වන "මහාචාර්ය බී.පී.එම්. විරක්කොඩි සම්පත් ඒකකය, ලෙස නැවත නම් කරන ලදි. 2013 වසරේ ලියාපදිංචි කළ නවක සිසුන් හය දෙනාත් සමඟ මෙම ඒකකයේ සේවාව ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 20කි. 2013 වසර තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථයින්ගේ සංගමයේ ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා පාර්ශවයෙන් ඩිජිටල් රෙකෝඩර් 04ක් ද, මුදල් පරිත්‍යාගයක් හා මහනුවර බෞද්ධ සංගමයකින් එම සිසුන්ගේ පරිහරණය සඳහා රෝද පුටු තුනක්ද මෙම ඒකකයට ලැබිණ.

**ශිෂ්‍යත්ව/සහෘදත්ව ප්‍රදාන**

2013 වසරේ දී පීඨය විදෙස් විශ්වවිද්‍යාල සමඟ එක්ව ස්ථාපිත කරන ලද සම්බන්ධිත වැඩසටහන යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ සිසුන්ට ශිෂ්‍යත්ව හා සහෘදත්ව ප්‍රදාන කිහිපයක් පිරිනමන ලදි. අමෙරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාල කිහිපයක් විසින් සහභාගීත්වය දරන අන්තර් විද්‍යාලයීය ශ්‍රී ලංකා අධ්‍යාපන වැඩසටහන් ශාස්ත්‍ර පීඨයේ එක් ආධුනික ආචාර්යවරයෙකුට සහෘදත්ව ප්‍රදානයක් පිරිනැමූ අතර එය ඔහුගේ මැලේසියා විශ්වවිද්‍යාලයේ හදාරන ආචාර්ය උපාධියට යන වියදමින් කොටසක් ලෙස ලබාදෙන්නට විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ සිසු කණ්ඩායම් දෙකක් 2013 වසරේදී ISLE වැඩසටහන යටතේ පීඨයට පැමිණ පීඨයේ ආචාර්යවරුන් හා යාවජීව මහාචාර්යවරුන් කිහිපදෙනෙකුගෙන් සැදුම්ලත් සම්පත්දායක පුද්ගලයන් විසින් පවත්වන ලද ක්ෂේත්‍ර පර්යේෂණ හා ඉගැන්වීමේ වැඩසටහනකට සහභාගී වූහ. ජපානයේ fukuoka කාන්තා විශ්වවිද්‍යාලය හා ශාස්ත්‍ර පීඨය අතර ඇතිකරගත් සම්බන්ධිත වැඩසටහන යටතේ සිසුන් සිව් දෙනෙක් 2013 වසරේ අධ්‍යයන පාඨමාලාව සඳහා එම විශ්වවිද්‍යාලයට සම්බන්ධ වූ අතර එකී විශ්වවිද්‍යාලයෙන් එක් ශිෂ්‍යාවක් 2013 අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකයේදී ශාස්ත්‍ර පීඨයට සම්බන්ධ වූවාය. 2014 වසරේදී ජපානයේ ඉහත සඳහන් කළ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා පේරාදෙණිය ශාස්ත්‍ර පීඨයේ සිසුන් පස් දෙනෙකුට ඉඩප්‍රස්ථාව සැලසෙනු ඇත.

උපකුලපතිතුමා විසින් 2013 වසරේ දී පීඨය වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් තබන ලදි. එහි පළමු අවබෝධතා ගිවිසුම යටතේ පුරාවිද්‍යා අධ්‍යයන අංශය භූගෝල විද්‍යා අධ්‍යයන අංශය සමග එක්ව ජර්මනියේ Fire විශ්වවිද්‍යාලය හා සම්බන්ධ වී ජර්මානු රජය වෙත පර්යේෂණ ප්‍රදාන යෝජනාවක් බාරදෙනු ඇත. දෙවන අවබෝධතා ගිවිසුම යටතේ දකුණු ආසියාවේ පර්යේෂණ හා උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැඩසටහනක් බාරගෙන ක්‍රියාත්මක කිරීම පිණිස සංවර්ධනය සඳහා උසස් අධ්‍යාපනයේ හා පර්යේෂණයෙහි හැකියාවන් ගොඩනැගීම සඳහා වන නෝර්වේජියානු වැඩසටහනින් (NORHED) ප්‍රදාන ලබා ගැනීම සඳහා දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය නේපාලයේ ත්‍රිභුවන් විශ්වවිද්‍යාලය හා තවත් විශ්වවිද්‍යාල දෙකක් වන බංග්ලාදේශයේ නෝර්ත් සවුත් විශ්වවිද්‍යාලය හා නෝර්වේ බර්ජින් විශ්වවිද්‍යාලය සමග සම්බන්ධ විය.

2013 වසරේදී විදෙස් නියෝජිත මණ්ඩල කිහිපයක් පර්යේෂණ සහයෝගීතා හා ශිෂ්‍ය හුවමාරු හෝ ආගන්තුක වැඩසටහන් සංවර්ධනය කරගැනීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා පීඨයට පැමිණියේය. වර්ෂය ආරම්භයේදී නේපාලයේ ත්‍රිභුවන් විශ්වවිද්‍යාලයේ, බංග්ලාදේශයේ නෝර්ත් සවුත් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරු හා නෝර්වේ බර්ජින් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු දෙදෙනෙකු පීඨයට පැමිණ පේරාදෙණිය උපකුලපති කාර්යාලයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා නේපාලයේ ත්‍රිභුවන් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කරන අවස්ථාවට සහභාගී වූහ. ඕස්ට්‍රේලියාවේ Macquarie විශ්වවිද්‍යාලයේ පීඨාධිපතීන් දෙදෙනෙකුගෙන් හා නෝර්වේ ඔස්ලෝහි අකර්සුස් විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙකුගෙන් සමන්විත දූත පිරිසක් සහයෝගීතා පර්යේෂණ, ඉගැන්වීම් හා පුහුණු වැඩසටහන් දියත් කිරීමේ හැකියාව සොයා බැලීම පිණිස පීඨයට පැමිණියේය.

## අනාගත සැලසුම්

2014 වසරේදී පීඨය කාර්ය මණ්ඩල සංවර්ධනය, විෂයමාලා සංවර්ධනය හා නව උපාධි පාඨමාලාවන් හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කරමින් උපාධිධාරී සේවා යෝජනය පිළිබඳව කටයුතු කරනු ඇත. 2013 වසරේදී ශාස්ත්‍ර පීඨ මණ්ඩලය විසින් කලා අධ්‍යාපන ඒකකයක් ස්ථාපිත කිරීමේ යෝජනාව අනුමත කරන ලද අතර මෙම ඒකක ස්ථාපිත කිරීම තුළින්,

(අ) කලා උපාධිධාරීන්ගේ තත්ත්ව සහතිකය හා සේවායෝජනය කෙරෙහි අවධානය යොමු කරමින් විෂයමාලා සංවර්ධනය හා නිරීක්ෂණය
(ආ) කාර්ය මණ්ඩල සංවර්ධනය
(ඇ) විශේෂ වැඩසටහන් (ශිෂ්‍ය පුහුණු කිරීම්/වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා පොළවල්)

යන නම්වලින් හැඳින්වෙන ස්ථිර වැඩසටහන් තුන පිළිබඳව කටයුතු කිරීමට අපේක්ෂිතයි. මෙම වැඩසටහන සඳහා වසර දෙකක කාලයක් වෙනුවෙන් අරමුදල් සැපයීම HETC ව්‍යාපෘතියෙන් කැමැත්ත ප්‍රකාශ කර ඇති නිසා අයවැය සහිත එම අනුමත යෝජනාව 2013 වසරේ දී HETC කාර්යාලයට බාරදෙන ලදි. කලා අධ්‍යාපන ඒකකයක් ස්ථාපිත කිරීම 2014 වසරේ පීඨ අධ්‍යයන කැලැන්ඩරයේ මූලික කාර්යයකි.

පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු කිහිපයක්ම කලා උපාධිධාරීන්ගේ සේවා යෝජනය දියුණු කිරීම සඳහා රැකියා මුල් කරගත් පාඨමාලා හඳුන්වා දීමට එකඟ වී ඇත. පීඨයේ අධ්‍යාපන අධ්‍යයන අංශය විශ්වවිද්‍යාලයට ඇතුළත් වන කලා සිසුන් වෙනුවෙන් නව අධ්‍යාපනවේදී උපාධියක් හඳුන්වා දීමට ද එකඟතාවය පළකොට ඇත. මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් ලියාපදිංචි කිරීම ඔවුන්ගේ පළමු අධ්‍යයන වර්ෂය අවසානයේ දී සිදු කරනු ලබයි. මෙම නව අධ්‍යයන වැඩසටහනේ විෂය නිර්දේශයන් මේ වෙනුවෙන්ම පවත්වන ලද වැඩමුළු දෙකකදී පීඨාන්තර සම්පන්දායක පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක සහභාගීත්වයෙන් සකස් කොට වැඩි දියුණු කර ඇත. මෙම නව අධ්‍යාපනවේදී උපාධියේ විෂය නිර්දේශය ශාස්ත්‍ර පීඨ මණ්ඩලයේ අනුමැතිය සඳහා 2014 වසරේ ජනවාරි මාසයේ දී බාරදෙනු ඇත. උපාධිධාරී සේවා යෝජනය කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ විද්‍යා අධ්‍යාපන අංශය සමාජ වැඩ පිළිබඳව ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂය නිර්දේශයක් සැලසුම් කරමින් සිටී.

පීඨය කලා සිසුන් සඳහා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන කුසලතා හා දැනුම දියුණු කර ගැනීම සඳහා 200 හා 300 මට්ටමින් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනය පිළිබඳ වෛකල්පිත පාඨමාලා හඳුන්වාදීමට ද පීඨය අදහස් කරයි. මෙම පාඨමාලාවල විෂය නිර්දේශයන් සකස් කිරීම පිණිස සප්ත වාර්ෂික ආදේශයයකින් යෝග්‍ය ආචාර්යවරයෙකු සොයා ගැනීමට හෝ විද්‍යා පීඨයේ හෝ ඉංජිනේරු පීඨයේ සහයෝගය ලබා ගැනීම සඳහා මුදල් ලබා ගැනීමේ අපේක්ෂාවෙන්

විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස මේ සම්බන්ධ යෝජනාව හැකි විගස විශ්වවිද්‍යාලයට බාර දෙනු ඇත. මෙහි අරමුණ වනුයේ විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කලා සහ මානව ශාස්ත්‍ර ස්ථාවර කමිටුවේදී යෝජනා වූ පරිදි කලා උපාධිධාරීන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය පිරිනැමීමයි.

පීඨ මණ්ඩලය හා අධ්‍යයන අංශ විසින් 2013 වසරේ ගන්නා ලද මූලික පියවර හා තීරණවලට අනුකූලවන පරිදි ඒ ඒ අධ්‍යයන අංශවල සංවර්ධනය සඳහා ඒවාට ආවේණික වූ සැලසුම් සකස් කිරීමට අධ්‍යයන අංශ දිරි ගන්වන අතරම අධ්‍යයන ප්‍රධාන සැලසුමක් 2014 වසරේදී සකස් කල යුතුව ඇත. මේ වන විට පීඨයේ පවතින දුර්වලතා හා සංවර්ධනය විය යුතු අංශයන් හඳුනා ගැනීමට මඟ පෙන්වීමක් මෙතුළින් සලසා දෙනු ඇත.

සිසුන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලය සඳහා ශාස්ත්‍ර පීඨයේ පවතින ඉඩකඩ කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. දැනට පවතින ගොඩනැගිලි මූලාරම්භයේ දී සැලසුම් කරන ලද්දේ සිසුන් සිය ගණනකට වන අතර, වර්තමානයේ දී එම ඉඩ ප්‍රමාණයෙහිම ආසන්න වශයෙන් සිසුන් 4000ට පමණ දේශන කාමර පහසුකම සපයයි. වාර්ෂිකව වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සරිලන පරිදි ගොඩනැගිලි පහසුකම් පීඨයට ලැබී නොමැත. අතීතයේදී සිසුන් වෙනුවෙන් වෙන් කර තිබූ පොදු කාමර ද මේ වනවිට දේශන පැවැත්වෙන කාමර බවට පත්කොට ඇත. 198 ක් වන ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් තනි කාර්ය මණ්ඩල කාමර ලබා දීමට පීඨයට හැකියාව ලැබී ඇත්තේ 71 දෙනෙකුට පමණි. පීඨය එහි අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය දියුණු කිරීමට සැලසුම් කරන විට අවම තරමින් 2015-2016 වර්ෂය වෙනුවෙන් මුදල් වෙන් කරන විට නව කලා ගොඩනැගිල්ල ඉහළනැංවීම සඳහා නලධාරීන්ගේ සහයෝගය ලබා ගැනීමට පීඨය උත්සහ දැරියයුතු වේ.

## A4 දන්ත වෛද්‍ය පීඨය

(පීඨාධිපති, මහාචාර්ය උපුල් බී. දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ඉගැන්වීම, පර්යේෂණ හා රෝගී සත්කාරය යන කාර්යයන්වලට සහයෝගය දක්වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල ජාත්‍යන්තර තත්ත්වයන් හා සංසන්දනය කළ හැකි නවීන උපකරණවලින් හා පහසුකම්වලින් යුක්ත ගොඩනැගිලි සමුදායකින් සමන්විත වේ. රටට අවශ්‍ය කරන දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කරන එකම ආයතනය මෙම දන්ත වෛද්‍ය පීඨය වන අතර, එය අධ්‍යයන අංශ හතකින් යුක්ත වේ. එම අධ්‍යයන අංශ, මූලික විද්‍යාවන්, ප්‍රජා දන්ත සෞඛ්‍ය, මුඛ වෛද්‍ය හා පරිදන්ත විද්‍යා, මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය, මුඛ ව්‍යාධවේදය, කෘතිම දන්ත වෛද්‍ය විද්‍යාව හා සංරක්ෂණ දන්ත වෛද්‍ය යන නම්වලින් හැඳින්වේ. දන්ත වෛද්‍ය පීඨය විසින් වාර්ෂිකව දන්ත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණුව ලබාදීමට අමතරව දන්ත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා එක්ව දන්ත වෛද්‍ය විශේෂඥයන් පුහුණු කිරීම හා වෙනත් දන්ත වෛද්‍ය සහයක වෘත්තිකයන් පුහුණු කිරීම පීඨය විසින් සිදුකරනු ලබයි. තවද මෙම දන්ත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල රෝගී සත්කාරය වෙනුවෙන් තෘතිය මට්ටමේ විශේෂඥ වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාකරන අතර, මෙම පීඨයේ පහසුකම් වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යාපීඨවල සිසුන් විසින් ද ඔවුන්ගේ පුහුණු කටයුතු සඳහා පරිහරණය කරනු ලබයි.

මුඛ පිළිකා, ශල්‍යකර්ම, මුඛ-මුහුණේ ප්‍රතිස්ථාපන ශල්‍යකර්ම, පැලුණු තොල් සහිතව උපත ලද දරුවන්ගේ සම්පූර්ණ සත්කාරය, ශල්‍යකර්ම හා මාර්ග අනතුරු (උදා. කන, නාසය, ඇස්, හනුක ආදිය) වැනි සුවිශේෂී සේවාවන් මෙරට ජනතාවට දන්ත වෛද්‍ය පීඨයෙන් හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහලෙන් ලබාදේ. එමෙන්ම මෙම ආයතන දෙක ශ්‍රී ලංකාවේ සියලුම රෝහල්වල පිළිකා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයක් ද වෙයි.

### ජයග්‍රහණ

දන්ත වෛද්‍ය පීඨය සඳහා  මහල් පහකින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 209 කි. ආපනශාලාවක් හා නව දේශනශාලාවක් සහිත දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2013 වසරේදී ආරම්භ කරන ලදි. පීඨ දෙක අතර ඇති කරගත් ගිවිසුමේ නීති රීතිවලට යටත්ව දන්ත වෛද්‍ය පීඨයේ සේවක තනතුරක් වෛද්‍ය පීඨයට මාරු කරන ලදි.

අමතර සිසුන් බඳවා ගැනීම යටතේ නව අන්වික්ෂ 18ක් හා අලුත් දන්ත වෛද්‍ය පුටු 25ක් පීඨයට ලැබිණ.

දන්ත වෛද්‍ය පීඨය හා යොන්සෙයි විශ්වවිද්‍යාලය අතර පවතින සම්බන්ධිත වැඩසටහන යටතේ Cone Bean දන්ත වෛද්‍ය CT යන්ත්‍රයක් පරිත්‍යාග ලෙස පීඨයට ලැබිණ.

ගොඩනැගිලිවල වර්ණ ආලේප කිරීමේ ව්‍යාපෘතිය අවසන් කරන ලදි.

2013 වසරේ දන්ත වෛද්‍ය ශිෂ්‍යයෙකු වූ එම්.පී.එම්. ප්‍රභාත්ට 2013 ඔක්තෝබර් මස 12-14 දිනයන් දක්වා ජපනයේ පැවැත්වූ ආහාර පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳ පැවැත්වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ

දී හා දන්ත වෛද්‍ය අධ්‍යාපනය හා විද්‍යාව පිළිබඳ 5 වැනි හිරෝෂිමා සමුළුවේ දී පෝස්ටරයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව උදා විය.

මහාචාර්ය උපුල් බී. දිසානායක පීඨයේ පීඨාධිපති ලෙස දෙවන වරටත් අවුරුදු තුනක කාලයක් සඳහා 2013 අප්‍රේල් 10 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි තෝරා පත් කර ගෙන ඇත.

## A5 ඉංජිනේරු පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

2013 වසරේ පීඨය බාරගත් ප්‍රධානම කාර්යය වනුයේ අධ්‍යයන වැඩසටහන සඳහා ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් 480 දෙනෙකු ඇතුළත් කර ගැනීම වන අතර එය සාමාන්‍ය බඳවා ගැනීමට වඩා සිසුන් 65 දෙනෙකුගෙන් වැඩි වීමකි. 2011 වසරේ අ.පො.ස. (උ/පෙළ) විභාගය අවසන් කළ සිසුන්ගේ (E/11 කණ්ඩායම) අධ්‍යයන වැඩසටහන මෙරට අනිකුත් ඉංජිනේරු පීඨ අතුරෙන් පළමුවෙන්ම ආරම්භ කරන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයයි. Z-අගය සම්බන්ධයෙන් පැවැති අර්බුද හේතුවෙන් මෙවර විශ්වවිද්‍යාලයීය ප්‍රවේශය ප්‍රමාද විය. එලෙසින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වුවත් පීඨයේ සම්පත් හා පහසුකම් ප්‍රමාණවත් නොවූ නමුත් පීඨය E/11 සිසු කණ්ඩායමේ අධ්‍යයන වැඩසටහනේ පළමු වසර අපේක්ෂිත ආකාරයෙන්ම නිසි කලට අවසන් කළේය. අමතර සිසුන් බඳවා ගැනීමත් සමඟම අත්‍යාවශ්‍ය විද්‍යාගාර, ඉගැන්වීමේ පහසුකම් හා ශිෂ්‍ය සුභසාධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 40 ක මූල්‍යමය සහයෝගයක් පීඨයට ලැබිණ.

තවද, පීඨය විසින් නිත්‍ය අධ්‍යයන වැඩසටහන පැවැත්වූ අතර 400කට වැඩි විද්‍යාවේදී ඉංජිනේරුවන් පිරිසක් ද බිහිකරන ලදි. බිහිවූ ඉංජිනේරුවන් අතරට සිවිල් ඉංජිනේරුවන් 150ක්, විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන් 100ක්, පරිගණක ඉංජිනේරුවන් 60ක් හා ඉතිරි පිරිසට නිෂ්පාදන, යාන්ත්‍රික, රසායනික සහ සැකසුම් ඉංජිනේරුවන් ඇතුළත් වූහ.

අධ්‍යයන වැඩසටහනට අවහිරතා රාශියක් පැවතිය ද පීඨයේ සිසුන් විසින් වැදගත්කමින් යුතු තාක්ෂණික තරගවලින් සහ ජාත්‍යන්තර තරග කිහිපයකින් ද ජයග්‍රහණ අත්කර ගැනීම ප්‍රශංසනීයයි. මෙම තරග විවෘත කාණ්ඩයෙන් පැවැති අතර ඒ සඳහා මෙරට වෙනත් ඉංජිනේරු පීඨවල සිසුන් ද සහභාගී වූහ. ජාතික තරග ජයගත් අපගේ සිසුහු විදෙස් රටවල පවත්වන ලද ජාත්‍යන්තර තරගවලට ද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූහ. පීඨයට මෙම සියලු ජයග්‍රහණ අත්කරගත හැකි වූයේ කැපවී ක්‍රියා කරන කාර්ය මණ්ඩලයේ නිසි මඟ පෙන්වීම හා අධීක්ෂණය නිසාවෙනි.

පීඨයේ පවත්වන ලද පර්යේෂණවලින් පිළිගත් වාර සඟරා, පොත් හා ග්‍රන්ථ පරිච්ඡේදවල පළ වූ 20කට අධික පර්යේෂණ පත්‍ර ඇතුළුව 200ට වැඩි ප්‍රකාශන සංඛ්‍යාවක් එළි දක්වා ඇත. පීඨය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය සමඟ සහයෝගයෙන් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට ලබාදෙනු ලබන CPD වැඩසටහනත් සම්මන්ත්‍රණ තාක්ෂණික දැනුම ලබාදීම හා පරීක්ෂණ සිදු කිරීම වැනි විවිධ සමාජ සේවාවන් තුළින් පීඨය හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර පවතින සහසම්බන්ධතාවය තහවුරු කර ගන්නා ලදි. ජපානයේ විද්‍යා හා තාක්ෂණ ආයතනය හා JICA ආයතනයේ චිරස්ථායි සංවර්ධනය සඳහා වන විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සහයෝගීතාවේ අරමුදල් යටතේ සයිනමා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් සිදුකරනු ලබන  පස් අවුරුදු (05) මුඩුබිම් ගොඩ කිරීමේ ව්‍යාපෘතිය 2013 වසරේදී මනා ලෙස ක්‍රියාත්මක වූ අතර අතිසාර්ථක මධ්‍යකාලීන ඵලදායීතාවක් පැවතිණ.

තාක්ෂණයේ මෑත කාලීන වර්ධනයන්ට අදාළ නව පාඨමාලා හඳුන්වාදීම අඛණ්ඩව සිදු කරන ලදි. සමහර අධ්‍යයන අංශ එදිනෙදාට සහ අනාගත ඉල්ලුමට සරිලන පරිදි ඒවායේ විෂය නිර්දේශයන් වෙනස් කළ අතර තවත් සමහර අධ්‍යයන දෙපාර්තමේන්තු විසින් ප්‍රථම උපාධි වැඩසටහනට අදාළ නව තාක්ෂණ පාඨමාලා හඳුන්වා දෙන ලදි. පීඨයේ සිදු කෙරෙන විෂයමාලා සංශෝධනය යටතේ සෑම අධ්‍යයන අංශයක්ම ජාත්‍යන්තර නියමයන් හා පැවරුම් අවශ්‍යතාවයන් අනුගමනය කරමින් නව ව්‍යුහයන් යෝජනා කොට ප්‍රථම වසර අධ්‍යයන වැඩසටහනේ ප්‍රධාන සංශෝධනයක් සිදු කරන අතර

එය අවසන්වීමට ආසන්නව පවතී. ඒ ඒ අධ්‍යයන අංශ IESL හි පැවරුම් සභාව විසින් කලින් භාරදෙන ලද වාර්තා මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික අංශය විසින් සිදුකරනු ලබන පීඨයේ සියලුම අධ්‍යයන වැඩසටහන්වල ඇගයීමේ ක්‍රියාවලිය අවසන් කරන ලදි. තවද සමහර අධ්‍යයන අංශ IESL පැවරුම් ක්‍රියාවලියේ දෙවන වටය ද සිදුකරන අතර එතුළින් වෙනත් ඉංජිනේරු පීඨ/අධ්‍යයන අංශවලට මඟ පෙන්වීමක් ද සිදුවේ.

එක් එක් අධ්‍යයන අංශ හා ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන CPD වැඩසටහන් තුළින් දේශිය වෘත්තිකයන්ගේ දැනුම ව්‍යාප්ත කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදි. සමස්තයක් ලෙස කෙටි පාඨමාලා, සම්මන්ත්‍රණ හා විශේෂ සම්මන්ත්‍රණ 35ට අධික ප්‍රමාණයක් පවත්වන ලද අතර ඉන් බොහොමයක් සඳහා අදාළ විදෙස් විශ්වවිද්‍යාලයන්වල සම්පත්දායක පුද්ගලයන් සහභාගී කරවා ගන්නා ලදි. මෙම පීඨය විදෙස් විශ්වවිද්‍යාල සමග පර්යේෂණ සංවර්ධනය කිරීම පිණිස හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සබඳතා ඉහළ නංවා ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් රාශියක් ඇතිකරගන්නා ලදි. මෙම වර්ෂය තුළදී පීඨය විසින් පර්යේෂණ සහයෝගීතා ප්‍රවර්ධනය කිරීමට හා පර්යේෂණ විශේෂඥයින් හුවමාරු කර ගැනීම සඳහා ජාතික හා ජාත්‍යන්තර සමුළු කිහිපයක් සංවිධානය කරන ලදී.

පීඨයේ සැලසුම් කළ යටතල පහසුකම් සංවර්ධන කටයුතුවල සතුටුදායක වර්ධනයක් සිදු නොවිය. කලින් සකස් කළ පරිදි මුදල් නොලැබීම මීට ප්‍රධාන හේතුව විය. පසුගිය දශකයේ දී පීඨයේ ශිෂ්‍ය කණ්ඩායමකට ඇතුළත් කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 150 සිට 450 දක්වා ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමත් එක් සමාසිකයකට පූර්ණ කාලීන ප්‍රථම උපාධිධාරීන් සංඛ්‍යාව 1150ක් ඉක්ම වීමත් නිසා භෞතික හා අධ්‍යයන සම්පත් යන සියලුම අංශවලින් ප්‍රබල පීඩනයක් එල්ල වී ඇත. අධ්‍යයන අංශයන්හි හා ශිෂ්‍ය සුභසාධනය සඳහා යටිතල පහසුකම් කඩිනමින් දියුණු කළ යුතු බව මෙතුළින් ඉස්මතු වී පෙනේ.

සමහර අධ්‍යයන අංශවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැඩි හිඟතාවය 2013 වසරේදී ද පැවති අතර අධ්‍යයන දෙපාර්තමේන්තුවලට ගැළපෙන සුදුසුකම් සහිත අධ්‍යයන කාර්‍ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම තරමක් දුරට සාර්ථක විය. සුවිශේෂී අංශවලට අවශ්‍ය කරන සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් එම සුවිශේෂී අංශවල සේවක පුරප්පාඩු පිරවීමට නොහැකි විය. සමත්කම් සහිත ඉංජිනේරුවන් බිහිකිරීම සඳහා සුදුසුකම් සහිත තරුණ කාර්ය මණ්ඩලයක් බඳවාගෙන, පුහුණු කොට පීඨයේ රඳවා ගැනීම වැදගත් වේ. ඉංජිනේරුවන්ට හා ඉංජිනේරු ආචාර්යවරුන් සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවතින ඉහළ ඉල්ලුම හා උසස් පාරිතෝෂික ලබාදීම කාර්ය මණ්ඩල ශක්තියට අසුභවාදී බලපෑමක් එල්ල වී ඇත. මෙම තත්ත්වය මඟහරවා ගැනීමට නම් විශ්වවිද්‍යාල අධ්‍යයන තනතුරු ආකර්ශණීය කර ගැනීම පිණිස සියුම් උපක්‍රම (එනම්, උදා : ඉංජිනේරුවන්ට දීමනාවන් ලබා දීම, පර්යේෂණයන් සඳහා මුදල් ලබා දීම, ඔවුන්ගේ ළමුන් පාසල්වලට ඇතුළත් කරගැනීම සඳහා සහය වීම) භාවිතා කළ යුතු වේ. එවිට උසස් සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් රඳවා ගැනීමටත්, උපාධි පාඨමාලාවේ උසස් ප්‍රමිතියක් හා ජාත්‍යන්තර තත්ත්වයක් අත්කර ගැනීමට ද හැකිවනු ඇත. සම්පත්වල හා කාර්ය මණ්ඩලයේ හිඟයක් පැවතිය ද දැනට සිටින කාර්ය මණ්ඩලයේ දැඩි වෙහෙස මහන්සිය නිසා ගෙවී ගිය වසර තුළ සතුටුදායක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවිය.

ඉංජිනේරු කළමනාකරණ නව අධ්‍යයන අංශයට නවක සිසුන් බඳවා ගැනීමට හා එහි අධ්‍යයන වැඩ සටහනට සහයෝගය අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, ඒ සඳහා පවතින ඉඩකඩ ගැටළුවක් වන හෙයින් ප්‍රධාන සැලසුමෙන් නව ගොඩනැගිලි අත්කර ගැනීම පිණිස විද්‍යාලයේ සහයෝගය අපේක්ෂා කෙරේ. තවද පීඨය ඉංජිනේරු ක්ෂේත්‍රයේ පවතින ඉල්ලුමට සරිලන පරිදි පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීමට අපේක්ෂා කරන අතර එතුළින් රටේ සංවර්ධන ක්‍රියාදාමයට මහඟු මෙහෙවරක් සැපයෙනු ඇත.

## A6 වෛද්‍ය පීඨය

(පීඨාධිපති, මහාචාර්ය එම්.ඩී. ළමාවංශ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය මේ වනවිට අවුරුදු 52ක් පැරණිය. 2013 වර්ෂය කාර්ය මණ්ඩලයට මෙන්ම සිසුන්ට ද කාර්ය බහුල වසරක් විය. තදාසන්නව පවතින රෝහල්වල කාර්ය මණ්ඩලය පුළුල් කොට පීඨය සමඟ කාර්යක්ෂමව කටයුතු කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. තීරණ ගැනීමේ හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේ නිත්‍ය රැස්වීම් පැවැත්වූ අතර ඒ සඳහා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය පුළුල් ලෙස දක්නට ලැබිණ. සිසුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ නිත්‍ය රැස්වීම් පැවැත්වීම (කලාතුරකින් වුවත්) මේ වසරේ ඉස්මතුව දිස් වූ දෙයකි. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵලවල " Z " අගය සම්බන්ධයෙන් මතුවූ ගැටළු හේතුවෙන් 2012 වසර සඳහා සිසුන් බඳවා ගැනීම ප්‍රමාද වූ අතර, පීඨයේ පවතින සම්පත් ප්‍රමාණය බඳවාගත් විශාල සිසුන් සංඛ්‍යාවට (සිසුන් 240ක් පීඨයට බඳවාගත් වැඩිම සංඛ්‍යාව) කෙලෙසකින්වත් ප්‍රමාණවත් නොවීම නිසා අතිදුෂ්කරතාවයකට මුහුණ දෙන්නට සිදුව ඇත.

### ජයග්‍රහණ

මෙම වසරේදී මුළු වෛද්‍ය සිසුන් 173 දෙනෙකු උපාධි ලබා ගත්හ. අප පීඨයේ සිසුන් දෙදෙනෙකු පසුගිය අවුරුදු හතරක කාලයක සිට සිදුවන පරිදි, **සමස්ත ලංකා දක්ෂතා ලැයිස්තුවේ,** ප්‍රථම හා දෙවන ස්ථානවලට පත්වූහ.

මෙරට සියලුම වෛද්‍ය පීඨයන්හි සිසුන් සඳහා පවත්වන ලද ළමා රෝග විවාද තරගයෙන් අප පීඨයේ අවසන් වසර සිසුහු පිළිවෙළින් සත්වෙනි (07) වරටත් එහි ශූරයන් බවට පත්වූහ. එමෙන්ම අපගේ භෞතික විද්‍යා සිසුන් කණ්ඩායම් 70කට වැඩි ප්‍රමාණයක් සහභාගි වූ මැලේසියාවේ පවත්වන ලද ජාත්‍යන්තර භෞතික විද්‍යා විවාද තරගයෙන් හත්වන ස්ථානයට පත්වූහ.

### විෂය නිර්දේශය

2012 වසරේ ආරම්භ කරන ලද සායනික නොවන විෂයමාලා සංශෝධනය අවසන් කොට ඇති අතර සායනික විෂයමාලා සංශෝධනය අවසන් වීමට ආසන්නව පවතී. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශනවල සමාලෝචනය ආරම්භ කොට මනා ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. සිසුන් විසින් සිදු කරනු ලබන ඉගැන්වීම් වැඩසටහන ඇගයීම ආයතනගත කළ අතර එය සෑම සමාසිකයක් අවසානයේදී ම සිදු කරනු ඇත.

### ශිෂ්‍ය සුභ සාධනය, සේවාවන් හා වැඩසටහන්

ඉංග්‍රීසි භාෂා දැනුම දුර්වල සිසුන් වෙනුවෙන් අමතරව ඉගැන්වීම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි. 2011/12 නවක සිසු කණ්ඩායම සඳහා අධ්‍යයන උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. උපදේශන වැඩසටහනක් හඳුන්වා දුන්න ද සිසුන් එය උපරිම ආකාරයෙන් උපයෝගී කොට ගෙන ඇති බවක් දක්නට නොමැත. මෘදු කුසලතා පුහුණු වැඩසටහනක් (කාල කළමනාකරණය, ඵලදායී අධ්‍යයන ක්‍රම, සන්නිවේදන කුසලතා, ගැටුම් නිරාකරණය ආදිය) ප්‍රථම උපාධි වැඩසටහනට හඳුන්වා දුන් අතර එය සිසුන් විසින් මහත් ඉහළින් ප්‍රයෝජනයට ගෙන ඇත. සිසුන්ට අධ්‍යයන කටයුතු හා ක්‍රීඩා වැඩසටහන් සඳහා විදේශගතවීම පිණිස අවශ්‍ය මුදල් ලබා දෙන ලදි.

**විභාග**

මනා විභාග පුහුණුව පිළිබඳ ලේඛනයක් සකස් කොට එහි නිර්දේශ ක්‍රියාවට නගන ලදී. සියලු විභාග ප්‍රශ්නවලට ආදර්ශ පිළිතුරු පත්‍ර නිරීක්ෂණ මණ්ඩලයෙන් ලබාගැනීමට හැකිවන පරිදි සලස්වන ලදී. සියලුම විභාගවල ප්‍රතිඵල සති හයක් තුළ නිකුත් කිරීමට හැකි විය.

**යටිතල පහසුකම්**

ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශයේ බටහිර දේශන ශාලාව හා වැසිවතුර පවාහන පද්ධතියේ කොටසක් ප්‍රතිසංස්කරණය කරන ලදී. පීඨාධිපති කාර්යාලය හා න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම හා ජීව රසායන විද්‍යා දේශන ශාලාව විභාග ශාලාවක් බවට පරිවර්තනය කිරීම සිදුවෙමින් පවතී. පාරා සායනික ගොඩනැගිල්ලේ බිම් මහල හා පළමු මහලේ කටයුතු අවසන් කොට ව්‍යාධවේදී අධ්‍යයන අංශය හා අධිකරණ වෛද්‍ය අංශය එහි ස්ථාපිත කොට ඇත. එම ගොඩනැගිල්ලේ ඉහළ මහල් හතරේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට ක්‍රියාත්මක වේ. උපයන ලද මුදල් යොදා ගනිමින් ඉදිකෙරෙන සායනික පර්යේෂණ හා සේවා ගොඩනැගිල්ලේ කටයුතු ආරම්භ කොට ඇත. මහාචාර්ය වෛද්‍ය ඒකකයට දිගුවක් ඉදිකිරීම සඳහා වූ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මහනුවර ශික්ෂණ රෝහලේ ළමාරෝග අංශයේ ශිෂ්‍ය ආපනශාලාව හා ශිෂ්‍ය කාමරය අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන ඇත.

සියලුම දේශන ශාලා හා නිබන්ධන කාමර වෙබ් අඩවිය හරහා වෙන් කිරීම සඳහා පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. එදිනෙදා කටයුතු සඳහා වෙබ් අඩවිය පරිහරණය කිරීමෙන් අතිවිශාල වූ වර්ධනයක් පෙන්නුම් කර ඇත. අතිරේක පරිගණක යොදා විද්‍යුත්–පුස්තකාලය ශක්තිමත් කරන ලදී. පීඨය විසින් උපයන ලද මුදල්වලින් අළුත් බස් රථයක් හා ත්‍රීරෝද රථයක් මිලදී ගන්නා ලදී.

**පශ්චාත් උපාධි පුහුණු පර්යේෂණ හා උසස් උපාධි**

පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි සඳහා නවක සිසුන් අටදෙනෙකු ලියාපදිංචි කරන ලද අතර එක් අයෙකු දර්ශනශූරී උපාධියක් අවසන් කරන්නට විය. පීඨය විසින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධිධාරීන් හයදෙනෙකු පුහුණු කරන ලදී. එම සමාලෝචන වාර සඟරාවල ප්‍රකාශන 62ක් පළවූ අතර ඉන් 40ක්ම ජාත්‍යන්තර වාර සඟරාවන්ය. 2013 ජූලි මස පවත්වන ලද ප්‍රමාද වූ 2012 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසියේ සත්කාරකත්වය වෛද්‍ය පීඨය විසින් දරන්නට විය. අභාවයට ගොස් තිබූ (Tropical) වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය නැවත පණගන්වන ලදී. පර්යේෂණ සඳහා අමතර මුදල් ලබා දීම සිදුවිය. සාමාජිකයන් දෙදෙනෙකු NRC ප්‍රදාන ලබාගත්හ. පර්යේෂණ සඳහා වියදම් කරන ලද මුළු වියදම රුපියල් මිලියන 11,439 කි. එක්සත් රාජධානියේ ආගන්තුක මහාචාර්යවරයෙකු පීඨයේ පර්යේෂණ කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව පීඨ පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් සමීක්ෂණයක් සිදු කළේය.

**උසස් වෛද්‍ය විද්‍යා පාසැල**

පීඨය උසස් වෛද්‍ය විද්‍යා පාසැලක් ස්ථාපිත කිරීම සඳහා යෝජනාවක් සකස් කිරීම වෙනුවෙන් සැලකිය යුතු මට්ටමේ කාල පරිච්ඡේදයක් වැය කළ අතර එම යෝජනාව රජය විසින් පිළිගෙන 2013 අයවැය කථාවට ඉදිරිපත් කරන්නට විය.

**සේවාවන්**

මහජනයා වෙනුවෙන් දියත්කළ සායනික සේවාවන් තවදුරටත් පුළුල් කරන ලදි. මෙම වසර තුළදී පීඨය මගින් සිදුකරන සේවාවන් අතරට Lower Gastrointestinal Services, a Pain Clinic and Hepato-biliary යන සේවාවන් එකතු කරන ලදි. බෝ නොවන රෝග හා නිවාරණ සේවාවෙහි ප්‍රජා සමීක්ෂණය පිළිබඳ ව්‍යාපෘතියක් සැලසුම් කරන ලදි. අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගි වන වැඩිහිටි සත්කාරය පිළිබඳ සායනයක් කඩුගන්නාව රෝහලේ ආරම්භ කරන්නට යෙදුණි. න්‍යෂ්ටික වෛද්‍ය සේවාවන් දියුණු කිරීම සඳහා අළුතින් ලබා ගන්නා ලද "gamma" කැමරාවට වැය වන මුදලින් කොටසක් ලබාදීමට විශ්වවිද්‍යාලය කැමැත්ත පළ කළේය. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සායනික හා විද්‍යාගාර සේවාවන්ගේ අතිවිශාල වැඩ කොටසක් සිදු කිරීමට පීඨයට සිදුවිය. රෝගීන්ගේ දත්ත

එක්රැස් කොට පවත්වා ගෙන යාම සඳහා පරිගණක ජාලයක් ස්ථාපිත කිරීමේ මූලික කටයුතු අවසන් කරන ලදි.

**මානව සම්පත් සංවර්ධනය**

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉංග්‍රීසි භාෂා දැනුම හා පරිගණක දැනුම දියුණු කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. කාර්යාල කළමනාකරණය හා විද්‍යාගාර ශිල්පීය ක්‍රම පිළිබඳ විශේෂ පුහුණුවක් ද ලබා දෙන ලදි.

**කාර්ය මණ්ඩලය**

එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස්වීම් ලැබීය. සාමාජිකයන් දෙදෙනෙකු විශ්‍රාම ලැබූ අතර, තව දෙදෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වූහ. නවක සාමාජිකයන් නව දෙනෙකු බඳවා ගනු ලැබීය. ඉගැන්වීමේ වැඩසටහනට අධ්‍යයන කාර්ය මණ්ඩලය මැදිහත් කර ගැනීම පිණිස අධ්‍යයන සේවක තනතුරු පහක් අධ්‍යයන අංශ දහයක් අතර හුවමාරු කර ගන්නා ලදි. අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ හත් දෙනෙකු විශ්‍රාම ලැබූ අතර, නවක සාමාජිකයෝ දොළොස් දෙනෙකු බඳවා ගන්නා ලදි. නව අධ්‍යයන පාඨමාලාවන්ගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නැවත බෙදා හැරීමක් සිදු කරන ලදි.

**බාධක සහ පිළියම්**

පීඨයට සහය පීඨාධිපතිවරුන් (හෝ සමාන තනතුරු) තිදෙනෙකු ලබා ගැනීම පිණිස අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වී ඇත. අමතර සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් විභාග ශාලාවක් හා දේශන ශාලාවක් ඉදි කිරීම සඳහා පීඨාධිපතිතුමා කළ ඉල්ලීම සාර්ථක නොවිය. සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීම මෙතෙක් සිදු වී නොමැත.

**අනාගත සැලසුම්**

දරුණු වකුගඩු රෝග, බෝ නොවන රෝග හා පවුල් සෞඛ්‍ය සේවාව සඳහා පර්යේෂණ කණ්ඩායම් හා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. බෝ නොවන රෝග මධ්‍යස්ථානය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ පිළිගැනීම ලබා ගැනීමට පියවර ගෙන ඇත. නිර්විෂ (anti venom) නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස යෝජනාවක් බාරදෙනු ඇත. උසස් වෛද්‍ය විද්‍යා පාසැල යටතේ පාඨමාලා ආරම්භ කරනු ඇත.

## A7 විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය අනුර වික්‍රමසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

1942 වසරේ කොළඹදී ආරම්භ කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨය පේරාදෙණියට ගෙන එන ලද්දේ 1961 වසරේදීය. ආරම්භයේදී විද්‍යා පීඨය, උද්භිද විද්‍යා, රසායන විද්‍යා හා සත්ව විද්‍යා යන අධ්‍යයන අංශ පහකින් යුක්ත විය. පසුව 1964 වසරේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ භූගර්භ විද්‍යා විශේෂවේදී උපාධිය හා භූගර්භ විද්‍යා සාමාන්‍යවේදී උපාධියට භූගර්භ විද්‍යාව විෂයක් ලෙස හැදෑරිය හැකි එකම භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය ස්ථාපිත කරන ලදි. අනතුරුව 1997 වසරේ දී අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණවේද සහ සංඛ්‍යානය හා පරිගණක විද්‍යා යන අධ්‍යයන අංශ ස්ථාපිත කරන ලදි. එමෙන්ම විද්‍යා අධ්‍යාපන ඒකකයක් ද විද්‍යා පීඨය සතුව පවතී.

මෙම පීඨය වාර්ෂිකව සිසුන් 500ක් පමණ ඇතුළත් කරගන්නා ප්‍රථම උපාධි වැඩසටහන් 14ක් පවත්වනු ලබයි. අධ්‍යයන කාර්ය මණ්ඩලය 94 දෙනෙකුගෙන් සමන්විත වන අතර පීඨයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් 1800කි. සියලුම උපාධි පාඨමාලාවන්ට විශේෂයෙන්ම 2004/05 වසරේදී ආරම්භ කළ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවට අනුව සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රයට යොමු කරමින් එම ක්ෂේත්‍රය සමඟ සබඳතාවයන් ශක්තිමත් කරගන්නා ලදි. විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා සංසදය (SIIC) අධ්‍යයන කාර්ය මණ්ඩලය හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර සමීප සබඳතාවයක් ස්ථාපිත කරගනිමින් පීඨයේ පර්යේෂණ ක්‍රියාකාරකම් පහසුකරවීමට උපස්ථම්භක වන පරිසරයක් නිර්මාණය කර ඇත. ප්‍රථම උපාධි ඉගැන්වීමේ වැඩසටහනට හා රටේ සංවර්ධන අවශ්‍යතාවයන් වෙනුවෙන් උනන්දුවක් හා දැනුමක් ලබාදීමේදී පශ්චාත් උපාධි පර්යේෂණ කාර්යභාරයේ ඇති වැදගත්කම වටහා ගනිමින් පීඨය පශ්චාත් උපාධි ඉගැන්වීම් හා පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සමීපව කටයුතු කරයි. මූලික විද්‍යාවන් මෙන්ම ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳව උසස් තත්ත්වයේ පර්යේෂණ පැවැත්වීම සඳහා අතිනවීන උපකරණ කිහිපයක් හා වෙනත් භෞතික සම්පත් ද පීඨය සතුව ඇත. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සම්මාන ලබා ගැනීමට සමත්ව ඇත. ජාතික හා ජාත්‍යන්තර යන දෙඅංශයෙන්ම පීඨය පළකොට ඇති ප්‍රකාශන සංඛ්‍යාවෙන් හා පේටන්ට් වාර්තාවලින් ඒ බව මනාව ඔප්පු වේ.

### ජයග්‍රහණ

2013 වසරේ දී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හා පරිවාස කථිකාචාර්යවරුන් පස්දෙනෙකු බඳවා ගැනීමට පීඨයට හැකිවිය. සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු හා විදෙස් අධ්‍යයන නිවාඩු ලබා සිටි සාමාජිකයන් දෙදෙනෙකු ඔවුන්ගේ දර්ශනශූරී උපාධියේ පර්යේෂණ කටයුතු නිමාකොට උපාධි නිබන්ධන භාරදී පැමිණ නැවත රාජකාරී ආරම්භ කළහ. එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. දෙදෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ලබා පශ්චාත් දර්ශනශූරී සහෘදත්ව පිළිගැනීම සඳහා පිටත්ව ගිය අතර තවත් සාමාජිකයෙකු ආගන්තුක මහාචාර්ය තනතුර ලබා ගත්තේය. විශේෂ පුහුණු වැඩසටහන්, වැඩමුළු, සමුළු හා සහයෝගීතා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සාමාජිකයෝ කිහිපදෙනෙකු විදෙස් විශ්වවිද්‍යාලවලට හා විද්‍යාගාරවලට ගියහ. ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන යටතේ පර්යේෂණ කටයුතු අවසන් කළ සාමාජිකයෝ හයදෙනෙකු ජාතික විද්‍යා පදනමේ හොඳම පර්යේෂණ ත්‍යාගය ලබා ගත්හ. තවත් තිදෙනෙකු පර්යේෂණ කටයුතු අධීක්ෂණය කිරීමේ ත්‍යාගය ලබා ගත්හ. කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනෙකු හා පශ්චාත් උපාධි සිසුවෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් 2013 වසරේ හොඳම

වාණිජමය වටිනාකමක් සහිත පර්යේෂණ සඳහා වන සම්මානය දිනාගන්නා ලදි. ජාත්‍යන්තර සංඛ්‍යාන වසර-2013 විසින් මහාචාර්ය පී. විජේකෝන් සතියේ "සංඛ්‍යාලේඛනඥයා" ලෙස නම් කරන ලදි.

පීඨය ඌව පළාතේ අ.පො.ස. (උ/පෙළ) ජීවවිද්‍යා ගුරුවරුන්ට හා අ.පො.ස. (උ/පෙළ) භෞතික විද්‍යා ගුරුවරුන් සඳහා තෙදින පුහුණු වැඩමුළුවක් පවත්වන්නට විය. විද්‍යා පීඨය කැළණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව දෙදින නේවාසික සංඛ්‍යාන කඳවුරක් සාර්ථකව පවත්වන ලදි. Alliance Francaise de Kandy සහ ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය එක්ව "ජලය" පිළිබඳ දින දහයක (10) ප්‍රදර්ශනයක් පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදි. තවද මෙම පීඨය කාර්ය මණ්ඩලය සඳහා e-Lerning වැඩමුළුවක් හා සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුවක් හා මෘදු කුසලතා සංවර්ධන වැඩමුළුවක් ද පවත්වන ලදි. මේ අතර 1986 වසරේදී රසායන විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගලාභී මහාචාර්ය යුවාන් ලී පීඨයට පැමිණ "අධ්‍යාපනය හා විද්‍යාඥයන් පුහුණු කිරීම" යන තේමාව යටතේ විශේෂ දේශනයක් පැවැත්විය. මේ හැරුණු කොට වෙනත් විදෙස් අගන්තුකයන් පීඨයට පැමිණ විවිධ තේමාවන් යටතේ සම්මන්ත්‍රණ රාශියක් පවත්වන්නට වූහ.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිපදෙනෙකු මෙරට වෙනත් ජාතික ආයතනවල අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් හා කණ්ඩායම් නායකයන් ලෙස ඔවුන්ගේ සේවාවන් ලබාදුන් අතර තවත් සමහරුන් මහනුවර - බදුල්ල මහා මාර්ගයේ EIA අධ්‍යයනය, උතුරු මැද පළාතේ දරුණු වකුගඩු රෝගය පිළිබඳ විමර්ශනය, වැලිගම කොළ ආශ්‍රිත රෝග විමර්ශනය, ශ්‍රී ලංකාවේ ජල විදුලි ව්‍යාපෘතියේ මූලික විමර්ශන, ඛනිජ ගවේෂණ ව්‍යාපෘතිය, නායයෑමේ විමර්ශන ව්‍යාපෘති හා ආපදා අවධානම කළමනාකරණ වැඩසටහන් වැනි ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතිවලට සම්බන්ධ වී කටයුතු කළහ.

පීඨය NRC ප්‍රදාන හා INRC ප්‍රදාන හරහා රුපියල් මිලියන 35 ක මුළු වියදමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ උපකරණ රාශියක් ලබා ගැනීමට සමත් විය. පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ දේශීය මෙන්ම ජාත්‍යන්තර වාර සඟරාවල පර්යේෂණ පත්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් පළකළ අතර ඔවුන්ගේ කටයුතු ජාත්‍යන්තර සමුළුවලදී ඉදිරිපත් කළහ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජපානයේ ෂිෂුඔකා විශ්වවිද්‍යාලය අතර, අධ්‍යයන කාර්ය මණ්ඩල හා තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් හුවමාරු කර ගැනීම පහසුකරවන අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි.

විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය 2013 මාර්තු මස ආරම්භ කරන ලදි. එම මධ්‍යස්ථානය විවෘත කළ දින සිට අ.පො.ස. (උ/පෙළ) විද්‍යා සිසුන් සඳහා විද්‍යා ප්‍රායෝගික වැඩමුළු නවයක් පවත්වා ඇත.

ක්ෂේත්‍ර හා විද්‍යාගාර පංති පැවැත්වීම සඳහා පවතින උපකරණ පහසුකම් අවම වුවත් බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 20 කින් වැඩිකිරීමට භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයට හැකි විය.

### බාධක සහ පිළියම්

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් පස්දෙනෙකු විශ්වවිද්‍යාල සේවාවෙන් විශ්‍රාම ලබාගත් අතර, ඔවුන්ගෙන් සිව් දෙනෙකු වර්ෂ 40ට වැඩි කාලයක් විශ්වවිද්‍යාලයට සේවය කර ඇත. එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුද විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස්විය. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව්දෙනෙකු විශ්‍රාම ගිය අතර, නවක කාර්මික නිළධාරීන් දෙදෙනෙකු පත්කර ගන්නා ලදි. ව්‍යවහාරික විද්‍යා වැඩසටහන දියුණු කිරීම සඳහා බාරදුන් HETC වින්ඩෝ 02 යෝජනාව සාර්ථක නොවිය. භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය සඳහා ඉදිකළ ගොඩනැගිල්ලට අවශ්‍ය ලීබඩු ලබා ගැනීම ප්‍රමාදවීම නිසා එම ගොඩනැගිල්ල පරිහරණයට ගැනීමට නොහැකි වී ඇති අතර, මේ දක්වා විද්‍යාගාර කිහිපයක් පමණක් එම ගොඩනැගිල්ලට ගෙන ගොස් ඇත. මෙම ගොඩනැගිල්ලේ දෙවන අදියර ඉදි කිරීම සඳහා බාරදෙන ලද ව්‍යාපෘති යෝජනාව සලකා බැලීම, මේ වනවිට විශ්වවිද්‍යාලයේ අනුමත කොට ඇති ව්‍යාපෘති අවසන් නොකිරීම නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ව්‍යාපෘති තක්සේරු කිරීමේ හා නිරීක්ෂණ කමිටුව විසින් ප්‍රතික්ෂේප කොට ඇත. සත්ව විද්‍යා අංශයේ සත්වහලේ දීර්ඝ කිරීමේ කටයුතු අවසන් කර ඇතත් පීඨයේ අනෙකුත් ප්‍රතිසංස්කරණ කටයුතු ඉතා මන්දගාමී වී ඇත.

## අනාගත සැලසුම්

සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සඳහා නව සිව්මහල් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පීඨය අපේක්ෂා කරයි. පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාවක් හඳුන්වාදීම සඳහා යෝජනාවක් සනාතන සභාවේ අනුමැතිය සඳහා මේ වනවිටත් බාර දී ඇත. භූගර්භ විද්‍යා ප්‍රථම උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සියලුම අදාළ අංශ සමඟ සාකච්ඡා කොට සංශෝධනය කිරීමට පීඨය අදහස් කරයි.

## A8 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය පිරිනැමීමේ බලය ඇති එකම ආයතනය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයයි. සිව් අවුරුදු කාල පරිච්ඡේදයක් සහිත මෙහි අධ්‍යයන වැඩසටහනට වාර්ෂිකව බඳවාගනු ලබන සිසුන් සංඛ්‍යාව ආසන්න වශයෙන් (100) සියයකි. අධ්‍යයන අංශ පහක් අතර බෙදී යන විවිධ විෂය පරාසයන්හි නිපුණත්වයකින් යුත් පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 37 දෙනෙකුගෙන් සමන්විත වේ. උසස් තත්ත්වයේ අධ්‍යයන හා පරිපාලන ව්‍යුහයක් පවත්වා ගැනීමේ අපේක්ෂාවෙන් පීඨාධිපතිතුමා වෙත පවරා ඇති බලතලවලට අනුව පීඨ මණ්ඩලය විසින් පත්කරනු ලබන අනුකමිටු 15ක් හරහා වගකීම් විමධ්‍යගත කොට ඇත. පශු ශික්ෂණ රෝහල, ගිලන් සායනය, පශු ශික්ෂණ ගොවිපල, පශු වෛද්‍ය පුස්තකාලය, පරිගණක ඒකකය, ජලජ සත්ව රෝග හඳුනාගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානයකින් හා ආදර්ශ කිරිහලකින් හා ජලභීතිකා රෝග හඳුනා ගැනීම් ඒකකය ඇතුළත් සේවා ඒකක රාශියකින් පීඨයේ අධ්‍යයන පරිසරය ඉහළනංවා ඇත. සත්ව සෞඛ්‍ය හෝ සත්ව නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති සහිත සමාසික එකකින් හෝ දෙකක කාල පරිච්ඡේදයක් පුරා ඉගැන්වෙන අධ්‍යයන වැඩසටහන සමස්ත විෂයන් 23කින් යුක්ත වේ. ඒ අනුව පීඨය පාඨමාලා ඇගයීම, සමාසික අවසාන හා වර්ෂාවසාන පරීක්ෂණ ලෙස විවිධ ඇගයීම් ක්‍රම පවත්වනු ලබයි.

### ජයග්‍රහණ

බඳවාගනු ලබන වාර්ෂික සිසුන් සංඛ්‍යාව සියය (100) දක්වා වැඩි කිරීමේ අරමුණින් යුතුව පීඨයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු රාශියක් ද ආරම්භ කර ඇත. ඒ අතරට මූලික විද්‍යා, ජෛව රසායන, ව්‍යාධ ජීව විද්‍යා, ගොවිපළ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය යන ගොඩනැගිලිවල පංති කාමර හා විද්‍යාගාර පුළුල් කිරීම ඇතුළත් වේ. පශු ශික්ෂණ රෝහලේ බිම් මහළ සියලු පහසුකම්වලින් යුතු පීඨාධිපති කාර්යාලය බවට පරිවර්තනය කොට ඇති අතර, එම ගොඩනැගිල්ලේ පළමු මහළ සේවා ඒකක බවට පත් කොට ඇත. ඉදිකිරීම් කටයුතු අවසන් වීමත් සමඟම පශු සායනික විද්‍යා අධ්‍යයන අංශය නව පරිශ්‍රයට ගෙන ගිය අතර, සත්ව සත්කාරය සඳහා විසිහතර පැයේම විවෘතව පවතින නූතන සියලු පහසුකම් සහිත පශු ශික්ෂණ රෝහල ස්ථාපිත කරන ලදි. ශිෂ්‍ය නේවාසිකාගාරයක්, වසාදමා ඇති සත්ව ඒකකය, ගව ඒකකය දීර්ඝ කිරීමට හා කුඩා සත්ව ඝාතක හළක් ඉදිකිරීම සඳහා HETC වින්ඩෝ 02 ව්‍යාපෘතියේ මුදල් යොදා ගනිමින් පශු ශික්ෂණ ගොවිපළ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. අළුතින් සේවක තනතුරු අටක් (08)ක් ලැබීමත්, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බොහෝ දෙනෙක් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කොට පැමිණීමත් සමඟ පීඨයේ අධ්‍යයන වැඩසටහන් සංවර්ධනය කරන ලදි.

පහතින් දැක්වෙනුයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයන්ය.

- ශ්‍රී ලංකා වනජීවී සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කොටස්කරුවෙකු ද වන පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය "ශ්‍රී ලංකාවේ වනජීවී හා මානව සෞඛ්‍ය පිළිබඳ පර්යේෂණ විශිෂ්ටතා ගොඩනැගීම" සඳහා කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙන් අවුරුදු හතරක කාලයක් සඳහා සහයෝගිතා පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමට සමත්විය.
- පර්යේෂණ වාණිජකරණය අරමුණු කරගත් HETC-QIG WINDOW-02 ව්‍යාපෘතියෙන් තරඟකාරී ප්‍රදානයක් ලබා ගැනීමට හැකිවිය.
- ප්‍රථම උපාධි විෂයමාලාව දියුණු කිරීම අරමුණු කරගත් HETC-QIG WINDOW-04 ව්‍යාපෘතියෙන් තරඟකාරී ප්‍රදානයන් ලබාගැනීමට ද පීඨයට හැකිවිය.
- ලන්ඩන් විශ්වවිද්‍යාලයේ රාජකීය පශු වෛද්‍ය විද්‍යාලය විසින් පශු වෛද්‍ය අධ්‍යාපන සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව දෙකක් පීඨයට පිරිනැමීය.
- ආචාර්ය කේ.එස්.ඒ. කොට්ටාවත්තට තුන් අවුරුදු දර්ශනශූරී උපාධියක් හැදෑරීම සඳහා හොංකොං විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය හිමිවිය.
- මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න, මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ, වෛද්‍ය පණ්ඩුක ගුණවර්ධන හා වෛද්‍ය අනුර ජයසූරිය 2007-2009 කාල පරිච්ඡේදය තුළ ඔවුන්ගේ පර්යේෂණ දායකත්වය උදෙසා ජනාධිපති පර්යේෂණ සම්මාන ලබාගත්හ.
- පීඨ ඉතිහාසයේ ප්‍රථම වතාවට තෙවන වසර අවසානයේ දී ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ සායනික පුහුණුව ආරම්භ කිරීම සමරනු වස් සුදු කබා උත්සවයක් සංවිධානය කරන ලදි. මෙම උත්සවය ඉදිරි අනාගතයේ දී වාර්ෂික සංසිද්ධියක් ලෙස පැවැත්වෙනු ඇත.
- සිව්වන සමාසික පරීක්ෂණය අවසානයේ දී පශු වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා විෂයට ඉහළම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට ප්‍රදානය කිරීම සඳහා මියගිය එස්. මහලින්ගම් සිහි කිරීම පිණිස ඔහු නමින් රන් පදක්කමක් ප්‍රදානය කිරීම ආරම්භ කරන ලදී.
- එන්නත් කිරීමේ නව ක්‍රමයක් සොයා ගැනීම වෙනුවෙන් අයි.පී.පී.එච්.යූ. දිසානායකට පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලදි. මේ පිළිබඳ ගැසට් නිවේදනය 2012 සැප්තැම්බර් 14 වැනි දින පළකරන්නට විය.

## බාධක සහ පිළියම්

සමහර අධ්‍යයන අංශවල පවතින පුරප්පාඩු සුදුසුකම් සහිත අයදුම්කරුවන් අයදුම් නොකිරීම නිසා පිරවිය නොහැකිවිය. පශු ශික්ෂණ රෝහල විසින් දියත් කරනු ලබන සේවාවන්ගේ කොටසක් ලෙස රෝගී වනසතුන් ස්ථානගත කිරීම සඳහා සුදුසු ස්ථානයක් පීඨය විසින් හඳුනාගෙන ඇත. මෙම ස්ථානය එම කාර්යය සඳහා ප්‍රයෝජනයට ගතහැකි වන පරිදි ඊට පිවිසෙන මාර්ගය සකස් කරදීම විශ්වවිද්‍යාල පරිපාලනය විසින් මෙතෙක් අවසන් කොට නොමැත.

## අනාගත සැලසුම්

### යටිතල පහසුකම් සංවර්ධනය

- ප්‍රධාන සැලසුමෙන් යෝජනා වී ඇති පරිදි පශු වෛද්‍ය ශික්ෂණ රෝහල ආසන්නයේ ව්‍යාධ ජීව විද්‍යා අධ්‍යයන අංශය ස්ථානගත කිරීම සඳහා තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සැලසුම් කෙරේ.

**අධ්‍යයන වැඩසටහන**

- විෂයමාලා සංශෝධනයක් සිදුකෙරෙමින් පවතින අතර පීඨයේ විස්තරාත්මක විෂය නිර්දේශයන් අඩංගු පොතක් සකස් කිරීම සඳහා සැලසුම් කෙරේ.
- පශු වෛද්‍ය විද්‍යාපති වැඩසටහනේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම මේ වනවිට සිදු කෙරෙමින් පවතින අතර මානව සම්පත් හා මුදල් නිසි කලට ලැබුණහොත් පශු වෛද්‍ය විද්‍යාපති තුන්වන සිසු කණ්ඩායම ලියාපදිංචි කිරීම සඳහා පියවර ගනු ඇත.

## A9 පශ්චාත් උපාධි ආයතන

### A9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය බී.සී.එන්. පීරිස් විසින් වාර්තා කරන ලද පරිදි)

#### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ මෙරට එකම කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනය ලෙස කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 09 දරන පනතට අනුව 1975 වසරේ ජූනි මස ස්ථාපිත කරන ලදි. මෙම ආයතනයේ පාලනය කෘෂිවිද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයන්ට කෘෂිකර්ම, පශු සම්පත්, පරිසර හා වනජීව, වැවිලි, උසස් අධ්‍යාපන, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ආදී කොට ඇති අමාත්‍යාංශවලට අයත් කීර්තිමත් පුද්ගලයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයකට පවරා ඇත. කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට ආයතනයක් සංවර්ධනය කිරීම හා මෙරට සීඝ්‍රයෙන් වර්ධනය වන කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයට නිසි ආකාරයෙන් පුහුණු කරන ලද විද්‍යාත්මක පුද්ගලයන් ලබාදීම මෙම ආයතනය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ විය. අපේක්ෂිත ආකාරයෙන්ම මෙම ආයතනය ශතවර්ෂ කාලක පමණ කාලයක් පුරාම එම ජාතික අවශ්‍යතාවන් සපුරා ඇති අතර, පරිසර දූෂණය, ආහාර සුරක්ෂිතතාව, හා ආරක්ෂණය, ජෛව විවිධත්වය ආදී හේතූන් නිසා මෙරට කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින නව අභියෝගයන්ට මුහුණදීම සඳහා උපක්‍රම සකස් කරමින් සිටී.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉගැන්වීමේ කාර්යය බොහෝ සෙයින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පීඨයේ, සුදුසුකම්වලින් පරිපූර්ණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉටුකරනු ලබන අතර, විශ්වවිද්‍යාල පද්ධතියේ, රජයේ ආයතන හා පුද්ගලික අංශයේ ආයතන වලින් ආගන්තුක දේශක පදනමින් පැමිණෙන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිපදෙනෙකු විසින් ද ඉටුකරනු ලබයි. කෘෂිවිද්‍යා පීඨයේ හා මෙම ආයතනයේ පවතින විද්‍යාගාරය, තොරතුරු තාක්ෂණය, පුස්තකාලය හා දේශන ශාලා පහසුකම් උපයෝගී කර ගනිමින් හැකියාවන්ගෙන් පරිපූර්ණ හා මනා පළපුරුද්දෙන් හෙබි අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ට සහාය දක්වනු ලබයි. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ විෂයන් නියෝජනය කරමින් අධ්‍යයන මණ්ඩල එකොළහක් (11ක්) හරහා ආගන්තුක දේශකවරුන් 300කට වැඩි පිරිසක් ඉගැන්වීමේ කාර්යයෙහි නිරතව සිටිති. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය වර්තමානයේදී උපාධි වැඩසටහන් 31ක් පිරිනමනු ලබයි. පශ්චාත් උපාධි ඩිප්ලෝමා දෙකක්, ව්‍යාපාර පරිපාලනය, දර්ශනපති, දර්ශනශූරී හා ව්‍යාපාර පරිපාලනශූරි උපාධි ඇතුළත් පශ්චාත් උපාධි 26ක් ඊට ඇතුළත් වේ. වාර්ෂිකව බඳවා ගනු ලබන සිසුන් ප්‍රමාණය 450-500ක් පමණ වන අතර වාර්ෂික සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2000ක් පමණ වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨයට සමාන්තරව යමින් මෙහි ශිෂ්‍ය සංඛ්‍යාවට විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම පීඨවල උපාධිධාරීන් ඇතුළත් වේ. සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යයන මණ්ඩල 11ට ලියාපදිංචි කළ ශිෂ්‍ය සංඛ්‍යාව 431කි. එහි විස්තර පහත පරිදි වේ.

- අධ්‍යයන මණ්ඩල 10ක් විසින් පිරිනමනු ලබන විවිධ විද්‍යාපති උපාධි වැඩසටහන් 28ක් සඳහා-330
- ව්‍යාපාර පරිපාලන අංශය විසින් පිරිනමනු ලබන ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා-48
- දර්ශනපති හා දර්ශනශූරී උපාධි සඳහා පිළිවෙලින් 35ක් හා 18ක්

2013 වසරේදී සිසුන් 283 දෙනෙකු ඔවුන්ගේ අදාළ උපාධි පාඨමාලා අවසන් කළහ. ඒ පිළිබඳ විස්තර ස්ත්‍රී පුරුෂ භේදය අනුව පහත දැක්වේ.

- විද්‍යාපති - 59/ 118
- ව්‍යාපාර පරිපාලනපති - 31/ 07
- දර්ශනපති - 7/ 14
- දර්ශනශූරී - 3/2 (පුරුෂ/ස්ත්‍රී)

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශේෂයෙන්ම ජාතික අවශ්‍යතාවයන් හා රටේ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරමින් ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ පදනම ශක්තිමත් කිරීම සඳහා විශාල වෙහෙසක් දරමින් සිටී. මෙම උතුම් කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සියලුම අධ්‍යයන මණ්ඩලවල සමස්ත විෂයමාලාවන් සංශෝධනය කොට ඇත. මේ සඳහා සියලුම පාර්ශවකරුවන් ක්‍රියාශීලිව සහභාගි වූහ. ශිෂ්‍ය අත්පොත මුද්‍රණය කොට 2013/14 අධ්‍යයනය වර්ෂය සඳහා බඳවාගනු ලබන නවක සිසුන් වෙත එය නිකුත් කිරීමට නියමිතය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නව වැඩසටහන් දෙකක් බිහිවන අතර නව පාඨමාලා රාශියක් ද හඳුන්වා දී ඇත. මේ වනවිට පවතින පාඨමාලා සුපෝෂණය කිරීම සඳහා නවීකරණය කළ පාඨමාලා ඒකක ඇතුළත් කරන ලදි. මේ තුළින් රැකියා විරහිත උපාධිධාරීන් රැකියාවන්හි නිරතවීම ඉහළ යන අතර උපාධිධාරී ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය ද දියුණුවනු ඇත.

සමාලෝචිත වර්ෂයේ විශේෂිත සිදධියක් වූයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන දින දර්ශනයේ කැපීපෙනෙන සිද්ධීන්ගෙන් එකක් වන ආයතනයේ වාර්ෂික සමුළුවේ "රිදී ජුබිලි" උත්සවය පැවැත්වීමයි. මෙම සමුළුව පැවැත්වීම තුළින් දේශීය හා ජාත්‍යන්තර ආයතනවල පර්යේෂකයන්ට, ආයතනයේ කාර්ය මණ්ඩලයට හා සිසුන්ට ඔවුන් පර්යේෂණ තුළින් එක්රැස් කරගත් දැනුම සාකච්ඡා කිරීමට, හුවමාරු කර ගැනීමට එම දැනුම ව්‍යාප්ත කරලීමට ඉඩප්‍රස්ථාව සැලසේ. ශ්‍රී ලංකාව හා මාලදිවයිනේ FAO නියෝජිත බෙත් එස්. ක්‍රොෆඩ් මහත්මියගේ අනුග්‍රහය යටතේ මෙය 2013 නොවැම්බර් 20-22 යන දිනවල මහනුවරදී පවත්වනු ලැබීය. මෙහිදී ආයතනයේ පර්යේෂකයන් විසින් පෝස්ටර් 10ක් ඇතුළුව ඉදිරිපත් කිරීම් 55ක් ඉදිරිපත් කළ අතර ඕස්ට්‍රේලියාව, කැනඩාව හා ඉන්දියාව යන රටවලින් පැමිණ සහභාගිවූවන් කිහිපදෙනෙකු ද පර්යේෂණ ඉදිරිපත් කිරීම් සිදුකළහ. එහිදී තේමාවන් 12ක් යටතේ හොඳම ඉදිරිපත් කිරීම් කළ දෙළොස් දෙනෙකුට ත්‍යාග පිරිනැමීය. මෙම සුවිශේෂී උත්සවයේදී ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන්ට සහ පෙර පැවැත්වූ වාර්ෂික සමුළුවල සම්බන්ධීකාරකවරුන්ට ඔවුන් විසින් ආයතනයට හා වාර්ෂික සමුළුවට දැක්වූ අගනා දායකත්වය උදෙසා උපහාර දක්වා ගෞරවයට පාත්‍ර කරන ලදි.

### ජයග්‍රහණ

1981 වසරේ ඉදිකරන ලද මෙම ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලට නව පෙනුමක් ලබාදෙන ලදි. පංති කාමර 13-17 දක්වා වැඩිකළ අතර ඒවා නව පහසුකම්වලින් යුක්ත වේ. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුතු ආචාර්යවරුන් හා සිසුන් යන දෙපාර්ශවයටම වෙබ් පදනම් කරගත් පරිසරයක පහසුකම් සලසමින් කළමනාකරණ තොරතුරු පද්ධතිය ආරම්භ කරන ලදි. එතුළින් බලධාරීන්ට කාලෝචිත තීරණ ගැනීමට හා ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව වැඩිකිරීමටත් හැකිවනු ඇත. ආයතනයේ මූලධන ප්‍රදාන එහි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඵලදායි ලෙස යොදා ගන්නා ලදි. පාඨමාලා ගාස්තු එකතු කර බලන විට 80 දක්වා ළඟා වී ඇති අතර එය මෙම ආයතනයේ ඉතිහාසය හා සන්සංදනය කර බලන විට අතිවිශාල වූ වර්ධනයකි. මෙම වර්ධනය කරා ළඟා විය හැකි වූයේ නිරන්තර නිරීක්ෂණය හා යොදාගන්නා ලද උපක්‍රම නිසාවෙනි. ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු අවසානයට පැමිණ ඇති අතර පසුගිය දශකයේදී සමහරවිට ඊට පෙර සිට පැවැත එන විගණන විමසුම් ප්‍රමාණය අවම කර ගැනීමට ද පියවර රාශියක්

ගෙන ඇත. පුරප්පාඩුව පැවැති අනධ්‍යයන සේවක පුරප්පාඩු හතර එක් ලිපිකරුවෙකු (III ශ්‍රේණිය) හා කම්කරුවන් තිදෙනෙකු බඳවා ගනිමින් පුරවන ලදි. තවද අධ්‍යයන මණ්ඩලවල ඉගැන්වීමේ කටයුතු පූර්ණ කාලීන උපකාරක ආචාර්යවරයෙකු හා ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු බඳවා ගෙන පහසු කරවන ලදි. රියදුරු තනතුරක් සඳහා නව සේවක තනතුරකට අනුමැතිය ලබා ගෙන ඇත.

## බාධක සහ පිළියම්

සමාලෝචිත වර්ෂයේදී විශේෂ වූ බාධක කිසිවකට මුහුණ පෑමට සිදු නොවීය. කෙසේ වෙතත් දරන ලද උත්සාහයන් හා සසඳා බලන විට දේශීය වශයෙන් සිසුන් බඳවා ගැනීමේ දියුණුවක් අත්කර ගැනීමට නොහැකි වූ අතර පාඨමාලා හැරයන ප්‍රමාණය අඩුකර ගැනීමට ද නොහැකි විය. එපමණක් නොව ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දී තිබුණත් විදෙස් සිසුන් බඳවා ගැනීමත් අපේක්ෂිත ආකාරයෙන් වර්ධනය නොවිය. රට මැද සිට ආයතනය දුරින් පිහිටා තිබීමත් විදෙස් සිසුන්හට නේවාසික පහසුකම් හිඟවීමත් වැනි කරුණු ඉහත පසුබෑමට හේතු සාධක ලෙස දැක්විය හැකිය. පුරප්පාඩු පිරවීමේ දී අනුගමනය කරනු ලබන පරිපාටියේ ස්වභාවය නිසා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගේ හිඟය මත පුරප්පාඩුව පවතින සේවක තනතුරු දෙකක් පිරවීමට නොහැකි විය.

## අනාගත සැලසුම්

පිළිගෙන ඇති ආකාරයට අනාගතයේදී ද ආයතනයේ ප්‍රධාන සැලකිල්ල වනුයේ ගුණාත්මකභාවයයි. මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා තත්ත්ව සහතික රාමුවට අනුකූලව 2014 වසරේ සිට සියලුම වැඩසටහන් පිළිගැනීමට ලක්කිරීම සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ග යොදනු ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා යෙෂුආ තාක්ෂණ ආයතනය අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම යටතේ 2014 මාර්තු මාසයේ සිට ගහනාවේ අදාළ අධ්‍යයන මණ්ඩලය විසින් පවත්වන ජෛව සංඛ්‍යාන විද්‍යාපති උපාධි වැඩසටහන පිරිනැමීම සඳහා කටයුතු සකස් කෙරෙමින් පවතී. මෙම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන්ම ගහනාවෙන් හා තදාසන්න රටවලින් සිසුන් 30 දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂිතයි. මේ සඳහා මෙම ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉගැන්වීමේ කාර්යය සඳහා සකස් කරන ලද අධ්‍යයන වාර සටහනකට අනුව ගහනාවට සංචාරය කරනු ඇත. තවද මෙම ආයතනයේ පාඨමාලා ගාස්තු වෙළඳ පොලෙහි පවතින මිල ගණන් මත පදනම්ව සියලුම පාඨමාලාවල ගාස්තු ඉහළ නැංවීමට ද අපේක්ෂා කරයි. විශේෂයෙන්ම කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආහාර පදනනම් කරගත් පර්යේෂණ සිදුකිරීම සඳහා මධ්‍යම විද්‍යාගාරයක් ස්ථාපිත කොට එහි ශාඛා විවෘත කිරීමට ද පියවර ගනියි. එහි ප්‍රථම ශාඛාව කොළඹ ස්ථාපිත කොට එහි සාර්ථකත්වය මත COPE විසින් නිර්දේශ කරන පරිදි වෙනත් ශාඛාවක් කිලිනොච්චියේ පිහිටවනු ඇත. ඒ හැරුණු කොට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ගොඩනැගිල්ලක් අයිති කර ගැනීමට ද පියවර ගනු ඇත. මෙතුළින් බඳවා ගනු ලබන විදෙස් සිසුන් සංඛ්‍යාව වැඩි කොට නවාතැන් පහසුකම් සපයාදීමට හැකිවේ. මෙම සියලු උත්සාහයන් දරනු ලබන්නේ 2014-2017 සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත කොට ඇති ප්‍රධාන අරමුණුවලින් එකක් වන මූල්‍යමය ස්වශක්තතාව ලඟාකර ගැනීම සඳහායි.

**සම්පත්, කාර්ය මණ්ඩලය හා සිසුන් පිළිබඳ විස්තර**

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩලය | | සිසුන් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යයන | අනධ්‍යයන | 2013 බඳවා ගැනීම් | | 2012 බඳවා ගැනීම් | | 2013 උපාධි ලබාගත් සංඛ්‍යාව | |
| | | | | දේ | වි | දේ | වි | දේ | වි |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 431 | 2 | 40 | - | - | 10 | - | 16 | - |
| විද්‍යාපති | | | | 326 | 01 | 03 | - | 177 | - |
| ව්‍යාපාර පරිපාලනපති | | | | 47 | - | 03 | - | 38 | - |
| දර්ශනපති | | | | 28 | - | 03 | - | 21 | - |
| දර්ශනශූරි | | | | 18 | - | 14 | - | 05 | - |
| අනියම් | | | | - | - | 02 | - | - | - |
| එකතුව | | | | 419 | 01 | 35 | - | 261 | - |

දේ - දේශීය සිසුන්
වි - විදෙස් සිසුන්

**2013 වසරේ වැඩසටහන් විස්තරය**

| විෂය | සහභාගී වූවන් | අවසන් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| අ) පශ්චාත් උපාධි වැඩසටහන | - | - | 30 |
| ආ) උපුටන | - | - | 55 |
| ඇ) ඉදිරිපත් කිරීම් | - | 26 | 26 |
| ඈ) පුහුණු වැඩසටහන් | 20 | - | - |
| ඉ) වැඩමුළු | 05 | - | - |
| ඊ) සම්මන්ත්‍රණ | - | - | 26 |
| **එකතුව** | **25** | **26** | **137** |

2013 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් හා කෙටි පාඨමාලා

| අංකය | කාර්ය / තේමාව | ආයතනය | සහභාගී වූවන් | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| 1 | පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය | කෘ.වි.ප.උ ආයතනයේ ජෛව-සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 8 | 01-05/04/2013 |
| 2 | ජල වෘත්තීය දිනය | කෘ.වි.ප.උ ආයතනයේ කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | 150 | 01/10/2013 |
| 3 | කණ්ඩායම් වැඩ සහ නායකත්ව පුහුණු වැඩසටහන | කෘ.වි.ප.උ ආයතනයේ කෘෂි ව්‍යාප්ති අධ්‍යයන මණ්ඩලය | 45 | 22-24/11/2013 |
| 4 | සාම්පල ශිල්පීය ක්‍රම, සමීක්ෂණ සැලසුම් හා විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 130 | 04-06/09/2013 |
| 5 | බීජ සැකසුම හා වෙළඳාම | කෘ.වි.ප.උ ආයතනයේ කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | 11 | 05-10/05/2013 |

2013 වසරේ ආයතනය විසින් සත්කාරකත්වය දැරූ ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු පිළිබඳ විස්තර

| අංක | කාර්යය/තේමාව | සංවිධානය කළේ (පීඨය/ දෙපා/මධ්‍යස්ථා/ඒකකය) | සහභාගී වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| 1 | බීජ සැකසුම හා වෙළඳාම (නේපාල ජාතිකයන් සඳහා) | කෘ.වි.ප.උ. ආයතනයේ කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | 11 | 05-10/05/2013 |

## A9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ මහාචාර්ය එච්.එම්.ඩී. නාමල් ප්‍රියන්ත විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. මෙම ආයතනය 1996 වසරේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පණතක් මගින් ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි විද්‍යා අධ්‍යාපනය, පර්යේෂණ හා සංවර්ධනය, ප්‍රවර්ධනය කිරීම සඳහාය. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ උපාධිධාරී අධ්‍යයන පළපුරුද්ද ඉහළනංවමින් විවිධ විද්‍යාත්මක අංශවලට පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කොට ලබා දීමයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සේවාස්ථ පුහුණු වැඩසටහන්, කෙටි පාඨමාලා, වැඩමුළු ආදිය පවත්වන අතරම විද්‍යාපති, දර්ශනපති හා දර්ශනශූරී උපාධි වැඩසටහන් මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවක් ද පවත්වනු ලබයි. මෙම ආයතනයේ ඉහත වැඩසටහන් පවත්වනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සමඟ සමීප සහයෝගීතාවෙන් යුතුව අධ්‍යයන මණ්ඩල දහයක් (10) මගිනි. මෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ අටෙන් හා වෙනත් විශ්වවිද්‍යාලවලින් හා ආයතනවලින් සම්බන්ධ කරගත් සාමාජිකයන්ගෙන් යුක්ත වේ. දේශීය කර්මාන්තවලට හා රාජ්‍ය/පුද්ගලික අංශයේ ආයතනවලට උපදේශන සේවාවක් ද මෙම ආයතනය මගින් ලබා දෙනු ලබයි. ජාත්‍යන්තර ආයතන හා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ප්‍රංශය, ස්විඩනය, ජපානය, ඉතාලිය, තායිලන්තය, දකුණු කොරියාව, බෲනායි ද රුසලම් හා වෙනත් රටවල විශ්වවිද්‍යාල සමඟ එක්ව සහයෝගිතා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පවත්වා ඇත.

### ජයග්‍රහණ

සිසුන් 1471 දෙනෙකු ඇතුළත් විද්‍යාපති උපාධි වැඩසටහන් හතරක් හා සිසුන් 37 දෙනෙකු ඇතුළත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක්, දර්ශනශූරි උපාධි 04ක්, දර්ශනපති උපාධි 15ක්, විද්‍යාපති උපාධි 162ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා 89ක් 2013 වසරේ දී ප්‍රදානය කරන ලදී. අයි.ජී.එල්. ජයරත්න (මහාචාර්ය ආර්. විරසිංහ හා ආචාර්ය ඩබ්.එම්.ඒ.ටී. බණ්ඩාර පී.එච්. පෙරමුණුගම (මහාචාර්ය වී. කරුණාරත්න හා ආචාර්ය ඩී.එස්.එම්. විජේසුන්දර) ඩබ්.එච්.එම්.ඒ.ටී. හේරත් (මහාචාර්ය ආර්. මනුජිත්, මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම් හා ආචාර්ය සී.එල්. අබයසේකර) ඩබ්.ජී.සී.එම්. අලහකෝන් (මහාචාර්ය බී.එස්.බී. කරුණාරත්න හා මහාචාර්ය මාර්ක් ස්මිත් හා ආචාර්ය ආර්.එස්. දොබේඩෝ) යන මහත්ම මහත්මීන්ට වරහන් තුළ දක්වා ඇති ආචාර්ය මහාචාර්යවරුන්ගේ අධීක්ෂණය යටතේ පිළිවෙළින් රසායන විද්‍යා, ශාඛ විද්‍යා හා භෞතික විද්‍යා යන අධ්‍යයන මණ්ඩල හරහා ආචාර්ය උපාධි පිරිනමන්නට විය. ඒ.එම්.ටී.කේ. බණ්ඩාර (මහාචාර්ය ජේ.පී.එස්. රණසිංහ හා ආචාර්ය ජේ.පී.එස්. රාජපක්ෂ) කේ.එච්.කේ.ටී. නිරෝෂිනි (මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ හා මහාචාර්ය ජේ.පී.එස්. රණසිංහ) ආර්. සෙන්තුරන් මිය (මහාචාර්ය එච්.එම්.ඩී. නාමල් ප්‍රියන්ත) අයි.එම්.සී.සී.ඩී. බණ්ඩාර (මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ හා ආර්.ජී.එස්.සී. රාජපක්ෂ) එම්. මාකෙහෙල්වල මිය (මහාචාර්ය ආර්. වීරසූරිය හා ආචාර්ය ඩබ්.එම්.ඒ.ටී. බණ්ඩාර). එච්.පී.එස්. සෙනරත් මිය, (මහාචාර්ය එම්.එම්.ඩී. නාමල්

ප්‍රියන්ත, ආචාර්ය එම්.එස්.ඩබ්. ද සිල්වා හා ආචාර්ය ඊ.එම්.ආර්.කේ.බී. එදිරිසිංහ), ඩබ්.එම්.සී.එම්. විජේසිංහ (ආචාර්ය ජගත් ගුණතිලක හා ආචාර්ය පී.එච්.ඩී. කුසුමාවතී), එස්.එස්.ආර්.එම්.ඩී.එච්.ආර්. විජේසේකර (මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක හා ආචාර්ය එම්. විතානගේ) ජේ.සී. රංගනේෂන් (මහාචාර්ය එච්.එම්. නෂීර්), එම්.ඒ.ඒ.එම්. ෆාහම් යූ.වී.ඒ. බුද්ධිකා මිය (මහාචාර්ය පී. සෙනෙවිරත්න හා ආචාර්ය සී.එල්. අබයසේකර), එල්.එන්.එස්. පෙරේරා (ආචාර්ය ඩබ්. ඒ.එන්. දවුන්දසේකර හා ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර) ඊ.ආර්.එල්.බී. ඇටම්පාවල (මහාචාර්ය සී.වී.එස්. ගුණතිලක, මහාචාර්ය අයි.ඒ.යූ.එන්. ගුණතිලක හා ආචාර්ය කේ.යූ. තෙන්නකෝන්) කේ.එම්.ඩී. ගුණතිලක මිය (මහාචාර්ය එස්.ඒ. කුලසූරිය, ආචාර්ය ආර්. රත්නායක හා ආචාර්ය ඩී.එම්. කරුණාරත්න, ආර්.එම්.එන්.බී. රත්නායක (මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු හා ආචාර්ය ප්‍රසාද් එම්. ජයවීර) යන මහත්ම මහත්මීන්ට වරහන් තුළ දක්වා ඇති ආචාර්ය මහාචාර්යවරුන්ගේ අධීක්ෂණය යටතේ පිළිවෙළින් ජීව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා, රසායන විද්‍යා, භෞතික විද්‍යා, පරිසර විද්‍යා, ගණිත විද්‍යා, ශාබ විද්‍යා සහ සංඛ්‍යාන හා පරිගණක විද්‍යා යන අධ්‍යයන මණ්ඩල හරහා දර්ශනපති උපාධි පිරිනමන ලදි.

ජාතික වැදගත්කමින් යුතු මුළු ක්‍රියාකාරකම් 31ක් (වැඩමුළු, කෙටි පාඨමාලා, සංසද, විශේෂ සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ආදිය) 2013 වසරේදී සාර්ථකව පවත්වන ලදී, මෙම ක්‍රියාකාරකම් තුළින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව පැමිණ සහභාගී වූවන් 1307 දෙනෙකු ප්‍රතිලාභ ලැබූහ. කෙටි පාඨමාලා 16ක්, වැඩමුළු නවයක්, එක් පුහුණු වැඩසටහනක්, එක් ජාත්‍යන්තර විශේෂ සම්මන්ත්‍රණයක්, සංසද දෙකක් හා එක් සමුළුවක් මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් විය. ADPC සමග එක් අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලද අතර, ආපදා කළමනාකරණ සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කොට ඇත. පශ්චාත් උපාධි සිසුන්ගේ ක්ෂේත්‍ර/අධ්‍යයන කටයුතු ශක්තිමත් කිරීම සඳහා ආසන 30ක බස් රථයක් මිළදී ගන්නා ලදි. විද්‍යා පීඨය සමග එක්ව HETC ප්‍රදාන (පශ්චාත් උපාධි පර්යේෂණ) බාරදුන් යෝජනාව සාර්ථක විය. මෙම ප්‍රදානය යටතේ රුපියල් මිලියන 30ක් පිරිනමන ලද අතර දර්ශනශූරී උපාධි සිසුන් නව දෙනෙකු පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘතිවල කටයුතු කරමින් සිටිති.

1. Development of dye-sensitized solar cells for solar energy conversion
2. Assessing geo-thermal energy development potential in thermal spring areas of Sri Lanka
3. Development of nanoclay-polymer materials as low-cost oxygen reduction electrodes for fuel cell applications
4. Development of modified photochromic compounds with improved properties for ñe in molecular electronics.
5. Assessment of antimicrobial agents in plant-mineral formulations
6. Improving the bioavailability of natural bioactive components for drug and cosmetic based application
7. Assessment of environmental impacts of the Mahaweli Diversion Scheme in selected downstream locations (two students)
8. Role of small mammals as reservoir hosts of rickettsioses and leptospirosis in Sri Lanka

වත්කම් ප්‍රතිගණනය කිරීම හා නිසි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දීර්ඝ කාලයක සිට පැවති අවශ්‍යතාවයකි. රජයේ ඇගයීම් දෙපාර්තමේන්තුව හරහා වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා පහසුවෙන් හැසිරවිය හැකි පරිගණක පැකේජයක් මිළදී ගෙන ඇත. මෙතුළින් ස්වයං ක්‍රියාකාරීත්වය සහතික කෙරෙන අතර භාණ්ඩ ලේඛණ පරීක්ෂාව, භාණ්ඩ තබා තිබෙන ස්ථාන, භාණ්ඩවල ශුන්‍ය වූ අගය, ආදිය පරීක්ෂා කිරීම වැනි ව්‍යවස්ථාපිත ක්‍රියාවලීන් සඳහා කෙරෙන ඉල්ලීම්වලට ඉක්මන් ප්‍රතිචාර දැක්වීමට ද හැකිවනු ඇත.

### බාධක සහ පිළියම්

පශ්චාත් උපාධි වැඩසටහන්වල විශේෂයෙන්ම විද්‍යාපති උපාධි වැඩසටහන් උපාධිලාභීන්ගේ සංඛ්‍යාව පහළ වැටීමට ප්‍රධාන හේතුව වනුයේ පර්යේෂණ ව්‍යාපෘති/උපාධි නිබන්ධන අවසන් කිරීම ප්‍රමාද වීමයි. එමෙන්ම මෙම ප්‍රමාදයට බලපාන වෙනත් හේතු වශයෙන් සිසුන්ට ඔවුන්ගේ අදාළ සේවා ස්ථානවලින් අවශ්‍ය අවස්ථාවන්ට අනුකූලව නිවාඩු ලබාගැනීමේ අපහසුව, සිසුන්ගේ රැකියාවන් හා සම්බන්ධ ගැටළු හා පුද්ගලික කැපවීම සහ දුර්වල විද්‍යාත්මක ලේඛන කුසලතා යන කාරණා දැක්විය හැකිය. ව්‍යාපෘති වාර්තා/නිබන්ධනවල ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා මෙන්ම ඒවා නිසි කලට අවසන් කිරීම සඳහාත් විද්‍යාත්මක රචනය පිළිබඳ නිත්‍ය වැඩමුළු පැවැත්වීම, ඒ පිළිබඳව සාකච්ඡා කිරීම වැනි පිළියම් මේ වන විට ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2006 සිසු කණ්ඩායම දක්වා පැවැති ගැටළු නිරාකරණය කර ගැනීමට අපට හැකිවිය. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තරුණ පර්යේෂකයන්ගේ සංසදය හරහා දර්ශනපති හා දර්ශනශූරී සිසුන් දැනුවත් කිරීම සඳහා ද ඒ හා සමාන උත්සාහයක් ගෙන ඇත. මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය උපාධි ප්‍රදානෝත්සවයේ දී දර්ශනශූරී සිසුන් සිව් දෙනෙකු, දර්ශනපති සිසුන් 15 දෙනෙකු හා විද්‍යාපති සිසුන් 118 දෙනෙකු උපාධි ලබා ගත්හ. පශ්චාත් උපාධි පර්යේෂණ ශක්තිමත් කිරීමට බලපාන ප්‍රධාන බාධක අතර ප්‍රධාන පර්යේෂණ උපකරණ සඳහා මුදල් නොලැබීම, පර්යේෂණ ප්‍රදාන නොලැබීම යන කරුණු මුල්තැනක් ගනියි. මෙය තවදුරටත් උග්‍ර ගැටළුවක් බවට පත්වනුයේ විද්‍යා වාර සඟරාවන්ට On Line හරහා ප්‍රවේශවීමට පවතින නොහැකියාවයි.

### අනාගත සැලසුම්

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැක්ම සහ මෙහෙවරට අනුව යමින් ඉදිරි වර්ෂ කිහිපය සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කොට ඇත. (මේ පිළිබඳව විස්තර සංයුක්ත සැලැස්මේ හා ප්‍රධාන සැලසුමෙහි දැක්වේ) උපකරණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම, තොරතුරු තාක්ෂණ විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම, දර්ශනපති හා දර්ශනශූරී වැඩසටහන් පුළුල් කිරීම, පූර්ණ කාලීන පර්යේෂණ සිසුන් සඳහා නවාතැන් ලබාදීම, සාකච්ඡා කාමර, කියවීමේ කාමර, පොදු කාමරයක් හා අපනශාලාවක් ආදිය ස්ථාපිත කිරීම සඳහා ශිෂ්‍ය සේවා ගොඩනැගිල්ලක් ඉදි කිරීම මෙම සැලසුම්වල ඇතුළත් වේ.

**සම්පත්, කාර්ය මණ්ඩලය හා සිසුන් පිළිබඳ විස්තර**

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩලය | | සිසුන් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යයන | අනධ්‍යයන | බඳවා ගැනීම 2013 | | බඳවා ගැනීම 2012 | | උපාධි ලබාගත් සංඛ්‍යාව 2013 | |
| | | | | දේ | වි | දේ | වි | දේ | වි |
| ප.උ.ඩිප්ලෝමා | 37 | 2 | 20 | 37 | | 22 | | 89 | |
| විද්‍යාපති | 1471 | | | 373 | 3 | 72 | 1 | 162 | |
| ව්‍යාපාර පරිපාලනපති | | | | | | | | | |
| දර්ශනපති | 213 | | | 30 | | 37 | | 15 | |
| දර්ශනශූරී | 38 | | | 2 | | 2 | | 4 | |
| අනියම් | | | | | | | | | |
| එකතුව | 1759 | | | 442 | 3 | 133 | 1 | 270 | |

වැඩසටහන් පිළිබඳ විස්තර - 2013

| විෂය | | සහභාගී වූ | අවසන් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන | දර්ශනශූරී | 373 | | |
| | විද්‍යාපති | 30 | | |
| | දර්ශනපති | 02 | | |
| පුහුණු වැඩසටහන් | | 17 | 17 | 17 |
| වැඩමුළු | | 479 | 479 | 479 |
| වෙනත් - ජාත්‍යන්තර සම්මන්ත්‍රණ | | 118 | 118 | 118 |
| කෙටි පාඨමාලා | | 608 | 608 | 608 |
| සංසඳ | | 54 | 54 | 54 |
| සමුළු | | 30 | 30 | 30 |
| **එකතුව** | | **1711** | **1306** | **1306** |

**2013 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ වැඩමුළු පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන හා කෙටි පාඨමාලා**

| අංකය | කාර්යය/තේමාව | ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| 1 | ජෛව යන්ත්‍ර විද්‍යාව සමග ක්‍රීඩා ශිල්පීය ක්‍රම ඇගයීම පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 68 | ජනවාරි 10 |
| 2 | GIS හා එහි යෙදුම පිළිබඳ 49 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 7 | ජනවාරි 28- පෙබරවාරි 2 |
| 3 | විද්‍යාත්මක ලේඛනය පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 100 | පෙබරවාර 15 |
| 4 | R සහ R studio යොදා ගනිමින් දත්ත විශලේෂණය පිළිබඳ කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 49 | පෙබරවාරි 21 - 22 |
| 5 | GIS හා එහි යෙදුම පිළිබඳ 50 වැනි කෙටි පාඨමාලාව. | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 37 | මාර්තු 4 - 9 |
| 6 | ජලයේ ගුණාත්මක බව හා මානව සෞඛ්‍ය : අනාගත අභියෝග පිළිබඳ සම්මන්ත්‍රණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජා.ප.ම. සහ ජපානයේ ටොයාමා විශ්වවිද්‍යාලය | 118 | මාර්තු 15 - 16 |
| 7 | GIS හා එහි යෙදුම පිළිබඳ 51 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 23 | අප්‍රේල් 1 - 6 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | R සහ R-Studio යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය පිළිබඳ 2 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 47 | අප්‍රේල් 18 - 19 |
| 9 | "වනාන්තරයේ අනාගතය" පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ශ්‍රී ලංකා වනජීවී දෙපාර්තමේන්තුව | 69 | මැයි 3 |
| 10 | GIS හා එහි යෙදුම පිළිබඳ 14 වැනි උසස් පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 10 | මැයි 16 - 17 |
| 11 | 'මානව සම්පත් කළමනාකරණය 'පිළිබඳ කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය | 128 | මැයි 18 - 19 |
| 12 | GIS හා එහි යෙදුම පිළිබඳ 52 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 08 | මැයි 27 - ජූනි 1 |
| 13 | ආපදා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාවේ 4 වැනි පීඨ සංවර්ධන වැඩමුළුව- ආචාර්ය මණ්ඩලය හා කොටස්කරුවන් | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය BMGF, TU, DRLA සහ ADPC* | 12 | ජූනි 1 - 2 |
| 14 | තත්ත්ව හා පරිසර කළමනාකරණ පද්ධතියේ ප්‍රමිතිකරණය පිළිබඳ කෙ‍ා පාඨමාලාව<br>ISO 9001සහ 14001 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ පාරිසරික අධ්‍යාපන මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 88 | ජූනි 1 - 2 |
| 15 | නායකත්ව පිළිබඳ කෙටි පාඨමාලාව<br>(2 වැනි කලාපීය පුහුණු පාඨමාලාව) | PGIS, BMGF, TU, DRLA සහ ADPC* | 27 | ජූනි 3 - 7 |
| 16 | ජ්‍යෙෂ්ඨ ඇත්ගොව්වන් සඳහා පුහුණු වැඩසටහන | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා ජාතික උද්භිද විද්‍යා උද්‍යාන දෙපාර්තමේන්තුව | 17 | ජූනි 3 - 9 |
| 17 | 'Getting started with Flowers and Foliage' පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 49 | ජූනි 28 |
| 18 | GIS සහ එහි යෙදුම පිළිබඳ 15 වැනි උසස් පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 11 | ජූනි 1 - 6 |
| 19 | මධ්‍යම පළාතේ ආපදා පිළිබඳ නායකයන් සඳහා නාය යෑම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | PGIS, BMGF, TU, DRLA and ADPC* | 36 | ජූලි 12 - 13 |
| 20 | භූමිකම්පන අවම කිරීම පිළිබඳ 5 වැනි පීඨ සංවර්ධන වැඩමුළුව | PGIS, BMGF, TU, DRLA and ADPC* | 14 | ජූලි 16 - 18 |
| 21 | R and R-Studio යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය පිළිබඳ 3 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 31 | ජූලි 18 - 19 |
| 22 | GIS හා එහි යෙදුම පිළිබඳ 53 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 26 | සැප්. 9 - 14 |
| 23 | 2013- විෂයමාලා සංශෝධන වැඩමුළුව-ආපදා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව- ආචාර්ය මණ්ඩලය හා කොටස්කරුවන් | PGIS, BMGF, TU, DRLA and ADPC* | 13 | ඔක්. 25 - 26 |
| 24 | ආපදා වැළැක්වීම පිළිබඳ නායකත්වය-ශ්‍රී ලංකා සංසදයේ විද්වතුන් | PGIS, BMGF, TU, DRLA and ADPC* | 12 | නොවැ.24 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | විද්‍යාත්මක ලේඛනය පිළිබඳ 2 වැනි ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ජාත්‍යන්තර විද්‍යා පදනම , පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 98 | නොවැ. 28 - 29 |
| 26 | GIS හා එහි යෙදුම පිළිබඳ 54 වැනි ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 20 | දෙසැ. 2 - 7 |
| 27 | ආපදා වැළැක්වීමේ විද්වත් සමුළුව (මීගමුවේදී) | PGIS, BMGF, TU, DRLA and ADPC* | 30 | දෙසැ. 9 - 11 |
| 28 | ආපදා වැළැක්වීමේ විද්වත් සමුළුව (මීගමුවේදී) | PGIS, BMGF, TU, DRLA and ADPC* | 42 | දෙසැ. 11 |
| 29 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ -2012/13 හා 2013/14 විද්‍යාපති GIS හා Rs සිසුන් සඳහා Open Street Maping පිළිබඳ කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 38 | දෙසැ. 14 - 15 |
| 30 | ආපදා කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ අ.ක. මධ්‍යස්ථානය | 22 | දෙසැ. 20 |
| 31 | ‘මානව සම්පත් කළමනාකරණය ’ පිළිබඳ කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ජාත්‍යන්තර විද්‍යා පදනම , පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 57 | දෙසැ. 21-22 |

* BMGF - Bill and Melinda Gates Foundation
* DRLA - Disaster Resilience Leadership Academy
* TU - Tulane University
* ADPC - Asian Disaster Preparedness Centre

# උපග්‍රන්ථය B - විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථාන

## B1 කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, ආචාර්ය ප්‍රදීප් සී.ජී. බණ්ඩාරනායක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පීඨයේ කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ පර්යේෂණ පහසුකරවීම හා ශක්තිමත් කිරීමත්, හැකියාවන් ගොඩනැගීම හා අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණ විද්‍යාව යොදා ගනිමින් වෙළඳපොළට ඉදිරිපත් කළ හැකි නිෂ්පාදන උත්පාදනය කිරීමත් සඳහායි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ජෛව තාක්ෂණය සඳහා කැපවී ඇති මෙරට එකම ආයතනය කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය බව මෙහිදී සඳහන් කිරීම වැදගත් වේ. මෙම මධ්‍යස්ථානය කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ හා පූර්ණ කාලීන අධ්‍යක්ෂවරයෙකුගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ. මෙහි අධ්‍යක්ෂකවරයා වනුයේ ද එම පීඨයේම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. නව අධ්‍යක්ෂ ආචාර්ය ප්‍රදීප් සී.ජී. බණ්ඩාරනායක 2013 මාර්තු 11 වැනි දින කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ රාජකාරී ආරම්භ කළේය.

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ජෛව තාක්ෂණය හා ඒ හා සම්බන්ධ වූ වැඩසටහන්වලට දායකවීම පිණිස පර්යේෂණ, විද්‍යාත්මක ප්‍රජාව, පර්යේෂණ ආයතන, පර්යේෂණ විද්‍යාගාර හා පුද්ගලික අංශය සමග සබඳතා ගොඩනගා ගැනීම පිණිස බහු ක්ෂේත්‍ර පරිසරයක් ලබාදෙනු ලබයි. මෙම මධ්‍යස්ථානය ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ නවීනතම ශිල්පීය ක්‍රම පිළිබඳ කුසලතාවයන් දියුණු කර ගැනීම සඳහා විද්‍යාත්මක ප්‍රජාවට වැඩමුළු, පුහුණු වැඩසටහන් හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව ද ලබා දෙයි. කෘෂි ජෛව තාක්ෂණ ආයතනයේ අනාගතය ඉතා පැහැපත් වන අතර අනෙකුත් ඉලක්කයන් අතර මෙරට හා කලාපයේ වර්ධනය වෙමින් පවතින ඉල්ලුමට සරිලන පරිදි අපගේ පර්යේෂණ හා පුහුණු පහසුකම් පුළුල් කිරීමට ද අප බලාපොරොත්තුවෙන් සිටිමු. එමෙන්ම අප සමාජයේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා අපගේ අපේක්ෂිත ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කැපවී සිටින බව ද සහතික කරමු.

### ජයග්‍රහණ

**සහතික පත්‍ර පාඨමාලා**

**01. අණුක ජීව විද්‍යාවේ ශිල්පීය ක්‍රම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

මෙම සහතික පත්‍ර පාඨමාලාව 2013 මැයි මස 13-17 දින දක්වා පැවැත්විණ. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, රජයේ පර්යේෂණ ආයතනවල හා කර්මාන්තවල පර්යේෂණ නිලධාරීන් හා පර්යේෂණ සහයකයින් හා රසායන විද්‍යා ආයතනයේ සිසුන්ගෙන් සැදුම්ලත් 17 දෙනෙකු මේ සඳහා සහභාගි වූහ. මෙම පාඨමාලාවේ පැය හයක් න්‍යායන් වෙනුවෙන් හා පැය 24ක් ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන් කොට තිබිණ. DNA හා මෙම ක්ෂේත්‍රයට අදාළ වෙනත් අංශ බොහොමයක් පිළිබඳ පළපුරුද්ද ලබාදෙන ආකාරයෙන් මෙම පාඨමාලාව සැලසුම් කොට තිබිණ. දින පහේ වැඩසටහනට ද දෙමුහුන්කරණය, Gene Gun හා Bioreactor පිළිබඳ ඉදිරිපත් කිරීම් ද ඇතුළත් විය.

**02. අණුක ජීවවිද්‍යා මූලික ශිල්පීය ක්‍රම පිළිබඳ සහකිත පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය හා කෘෂිවිද්‍යා පීඨයේ ජීව විද්‍යා සංසදය එක්ව සංවිධානය කරන ලදි. මෙම පාඨමාලාව ද DNA හා වෙනත් අදාළ අංශ හා දත්ත විශ්ලේෂණය යන අංග ඇතුළත් වන පරිදි සැලසුම් කොට තිබිණ.

## 03. ජාන පිළිබිඹු කෙරෙන විශ්ලේෂණය හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, රජයේ පර්යේෂණ ආයතන හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පර්යේෂණ නිලධාරීන් හා පර්යේෂණ සහයකයින් සහ පශ්චාත් උපාධි සිසුන් නියෝජනය කරමින් 23 දෙනෙකු සහභාගි වූ මෙම පාඨමාලාව 2013 ජූලි 11-12 යන දිනවලදී පවත්වන ලදී.

## 04. අණුක ජීවවිද්‍යා ශිල්පීය ක්‍රම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

දෙවන වරටත් පවත්වන ලද මෙම වැඩසටහනට 12කු සහභාගි වූ අතර, එය 2013 නොවැම්බර් 4-7 දින දක්වා පැවැත්විණ. විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, රසායන විද්‍යා ආයතනයේ සිසුන්, පශ්චාත් උපාධි සිසුන්, පර්යේෂණ නිලධාරීන් හා නීති සිසුන් මේ සඳහා සහභාගි වූහ.

**පර්යේෂණ**

## 01. ලද පර්යේෂණ ප්‍රදාන

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය අත්කරගත් පර්යේෂණ ප්‍රදාන පහත පරිදිය. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවෙන් ලද මුදල - රුපියල් 14,592,054.00 කාලය - වර්ෂ 03, සැලසුම් කළ පශ්චාත් උපාධි - දර්ශනශූරී උපාධි 02යි.

පේරාදණිය විශ්වවිද්‍යාලයීය, ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලද මුදල, රුපියල් 2500000/-. කාලය අවුරුදු 03යි. සැලසුම් කළ පශ්චාත් උපාධි, දර්ශනශූරී උපාධි 01යි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලද මුදල, රුපියල් 500000/-. කාලය - වර්ෂ 03යි.

## 02. අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම් හා ලද විදෙස් මුදල්

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ දී පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා කැලිෆෝනියා විශ්වවිද්‍යාලය සමඟ පහත සඳහන් ගිවිසුම්වලට එළඹෙන ලදි.

උප ප්‍රදාන අංකය. 201223330-01 උපාධිලාභී. ප්‍රදීප් සී.ජී. බණ්ඩාරනායක. මෙම ව්‍යාපෘතියේ මුදල : ඇ. ඩොලර් 10,000යි. කාලය :2013/01/08 සිට 2016/07/31

තේමාව : "Evolutionary Gain And Loss Of Function In Parasitic Plant Genomes"

ප්‍රධාන අනුග්‍රාහක : ජාතික විද්‍යා පදනම, ප්‍රදානය #IQS-1238057 යූ.සී. ඩේවිස් PI : ජෝන් යොදර්

**සම්මන්ත්‍රණ**

ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය හා කෘෂිවිද්‍යා පීඨයේ කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාල සමඟ එක්ව "ජෛව ආරක්ෂණය" පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කොට ඇත. මෙහිදී විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ ජෛව තාක්ෂණිකව වෙන්කරගත් ආහාර/පෝෂණයේ ජෛව ආරක්ෂණය හා කෘමිනාශක භාවිතයේ ජෛව ආරක්ෂණය පිළිබඳවයි. දිනය 2013-10-22 දින, කාලය පෙ.ව. 9.00 සිට ප.ව. 12.30 දක්වා. ස්ථානය-පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ්‍රවණාගාරය

## බාධක සහ පිළියම්

කෘෂිවිද්‍යා පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් 160 දෙනෙකු පමණ සහභාගී වන ලෙස ප්‍රදානය කරනු ලබන අණුක ජීවවිද්‍යා මූලික ශිල්පීය ක්‍රම පිළිබඳ පාඨමාලාව හැදෑරීමට උනන්දුවක් දැක්වූහ. කෙසේ වෙතත් සති අන්තයේදී සිසුන් නොපැමිණීම නිසා මෙම පාඨමාලාව අවසන් කළේ එක් කණ්ඩායමක් පමණි.

## අනාගත සැලසුම්

දෙස් විදෙස් සහයෝගිතාකරුවන් සමඟ වැඩි වැඩියෙන් සහයෝගිතා පර්යේෂණ කටයුතු සඳු කිරීම. ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා වැඩසටහනක් සංවර්ධනය කිරීම පිණිස සංකල්පමය පත්‍රයක් බාර දෙන ලදි. කෘෂිවිද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් බාර දෙන ලද ජාතික විද්‍යා පදනමේ ආධාර ලබන ව්‍යාපෘති දෙකකට මුදල් ලබාදීම සඳහා පිළිගෙන ඇත. මේ යටතේ අණුක ජීවවිද්‍යා කටයුතු කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේදී සිදුකරනු ඇත.

2014 වසරේදී පැවැත්වීම සඳහා පුහුණු වැඩසටහන් හතරක් සැලසුම් කෙරේ.

# B2 කෘෂිව්‍යාපාර මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එල්.එච්.පී. ගුණරත්න විසින් වාර්තා කරන ලද පරිදි)

## හැඳින්වීම

කෘෂිව්‍යාපාර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විද්වත් ප්‍රජාවගේ උපයෝගී කර නොගත් විශේෂඥ දැනුම කාර්යක්ෂමව හා ඵලදායී ආකාරයෙන් යොදා ගැනීමයි. එතුළින් විද්වත් ප්‍රජාවට බහු ක්ෂේත්‍ර ව්‍යවහාරික පර්යේෂණ, පුහුණු වැඩසටහන් හා උපදේශන සේවාවන් කරගෙන යාමට හැකිවන අතර එමගින් පීඨයට අවශ්‍ය කරන විෂය මාලා වෙනස්කම් සිදු කිරීමට හා අභියෝගයන් ජය ගැනීම සඳහා ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට පර්යේෂණ හා වැඩ අධ්‍යයන අවස්ථා උදාකර දීමටත් පීඨයට හැකිවනු ඇත.

කෘෂි ව්‍යාපාරික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ වෙනත් අභිලාෂයන් අතර විශ්වවිද්‍යාලය පුද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධාන අතර සබඳතා ශක්තිමත් කිරීම, පුද්ගලික අංශයේ පවතින අවශ්‍යතාවන්ට සරිලන ලෙස ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් සකස් කිරීම, කර්මාන්ත ක්ෂේත්‍රය ඇතුළත් වන පරිදි ජාතික අවශ්‍යතාවන් සඳහා විශ්වවිද්‍යාලය පදනම් කරගත් පුහුණුව, පර්යේෂණ, සංවර්ධනය මෙන්ම උපදේශන සේවාවන් ලබාදීම ද ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ජන ප්‍රජාව හා කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ කටයුතු කිරීම සඳහා පීඨය දිරිමත් කෙරෙනු ඇත. සමාජ පුහුණුව හා පර්යේෂණ සිදු කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන්ය.

**කෘෂි ව්‍යාපාරික මධ්‍යස්ථානයේ සමාජ කටයුතු**

- සියලුම පුද්ගලික ව්‍යවසායකයන්, සමූහ අනුබද්ධ සේවා සංවිධාන සඳහා ව්‍යාපාරික උපදේශන සේවාවන් ස්ථාපිත කොට පවත්වාගෙන යෑම.
- පුහුණුවන්නන් හා ව්‍යවසායකයන් සඳහා (කෘෂිකර්ම හා කෘෂිකාර්මික නොවන) ඉල්ලුම පවතින පුහුණු වැඩසටහන් සැලසුම් කොට පවත්වාගෙන යෑම.
- ව්‍යාපාරික සේවා බෙදාහැරීමේ පද්ධති දියුණු කොට වෙනත් සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- තරුණයන්ට ව්‍යාපාරික අදහස් හඳුනා ගැනීමට හා එම අදහස් සැබෑ ව්‍යවසායකයන් බවට සංවර්ධනය කිරීම සඳහා පුහුණු අවස්ථා උදා කර දීම.

**පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය**

- ව්‍යවසායක කුසලතා සංවර්ධනය කිරීම සඳහා ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට පුහුණුව හා වැඩ අත්දැකීම් ලබාදීම.
- ව්‍යාපාරික අදහස් දියුණු කර ගැනීමට ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට උපකාර කොට එම අදහස් සැබෑ ව්‍යවසායකයින් බවට පත්කොට ගෙන එතුළින් ස්වයං ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ඉඩකඩ ලබාදීම.
- ප්‍රථම උපාධි අපේක්ෂකයන් මුල්කොට ගෙන අනාගත විවිධ වැඩසටහන් සඳහා අර්ධ කාලීන පුහුණු අවස්ථා සෙවීම.
- කෘෂිකර්ම උපාධිධාරීන්ගේ වෘත්තීය ස්ථානගත කිරීම් හා සංවර්ධනය පිළිබඳ පර්යේෂණ බාර ගැනීම.
- උපාධිධාරීන්ගේ වෘත්තීය චලනතාවයට මංමාවත් විවර කිරීම පිණිස පීඨාධිපති කාර්යාලය සමඟ සහයෝගතාවයෙන් යුතුව පීඨයේ සියලු උපාධිධාරීන්ගේ දත්ත ගබඩාවක් පවත්වා ගැනීම.
- කෘෂිකර්ම සිසුන්ට කර්මාන්ත සබඳතාවන්හි මූලිකාංග හා වෘත්තීය සංවර්ධන කුසලතා ඉගැන්වීම.

- පීඨයේ උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා එම වැඩසටහන්වලට අවශ්‍ය නිසි වෙනස්කම් කිරීම සඳහා TMU හා CDC වැඩසටහන්වලට ප්‍රතිපෝෂණය ලබා දීම.
- තරුණයන් හා සාමාන්‍ය සමාජය අතර ව්‍යවසායකත්වය කෙරෙහි සුබවාදී ආකල්ප සංවර්ධනය කිරීම.

**පර්යේෂණ**

- ජාත්‍යන්තර හා දේශීය ආයතන සමග සහයෝගිතාවයෙන් පර්යේෂණ බාරගෙන සිසුන්ට, පීඨයට හා සමස්තයක් ලෙස මුළු රටටම ප්‍රතිඵලදායක වැඩසටහන් අධ්‍යයනය කිරීම.

කෘෂිව්‍යාපාරික මධ්‍යස්ථානය කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපති විසින් සභාපතිත්වය දරණ කළමනාකරණ හා සම්බන්ධීකාරක කමිටු විසින් කළමනාකරණය කරනු ලබයි. පහත සඳහන් සාමාජිකයන්ගෙන් කළමනාකරණ කමිටුව යුක්ත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව, කෘෂිකර්ම අපනයන අංශය, අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, මධ්‍යම පළාතේ කාන්තා වාණිජ සංසදය, සර්වෝදය, නිෂ්පාදන ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා කෘෂි විද්‍යා පීඨයේ සියලුම අධ්‍යයන අංශ නියෝජිතයන්ගෙන් සමන්විත සම්බන්ධීකාරක කමිටු සාමාජිකයන්ගෙන් යුක්ත වේ. මෙම මධ්‍යස්ථානය පරිපාලනය කරනු ලබන්නේ ගරු කටයුතු පදනමෙන් පත්කළ අධ්‍යක්ෂවරයෙකු විසිනි. රුපියල් 5000.00ක මාසික දීමනාවක් ලබා දෙන අර්ධ කාලීන ලේකම්වරයෙකු බඳවා ගන්නා ලදි.

**2013 වසරේ ජයග්‍රහණ**

**අවසන් කළ ව්‍යාපෘති**

- ශ්‍රී ලංකාවේ කරවල නිෂ්පාදනයේ වෙළඳපොළ හා තරඟකාරී විශ්ලේෂණය. මේ සඳහා අරමුදල් සපයන ලද්දේ කලාපීය මත්ස්‍ය ජීවන වැඩසටහනයි.
- අරණායක හා මල්වත්තගම යන ප්‍රදේශවල කුළුබඩු සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ හැකියාව සොයා බැලීමේ අධ්‍යයනය කෘෂිකර්ම අමාත්‍යාංශයේ වියළි කලාපීය ජීවන සහයක හා සම්බන්ධිත වැඩසටහන විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදි.
- කෘෂිකර්ම අමාත්‍යාංශයේ වියලි කලාපීය භුක්තිය හා සම්බන්ධිත වැඩසටහන් පිළිබඳ තක්සේරුව.

**ආරම්භ කළ ව්‍යාපෘති**

- HETC-QIG (වින්ඩෝ - 04) මගින් අනුග්‍රහය දැක්වූ කෘෂිවිද්‍යා පීඨයේ පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය.

**පැවැත්වූ වැඩමුළු**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ දී IPRS හරහා පර්යේෂණ වාණිජකරණය.

**අනාගත සැලසුම්**

- කෘෂිවිද්‍යා පීඨයේ HETC ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම. (ක්‍රියාකාරකම්-02)
- එම ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවා මධ්‍යස්ථානයේ හැකියාව පුළුල් කිරීම.

## B3 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, ආචාර්ය ඒ.පී.එච්.ජේ. එදිරිසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය 1979 වසරේ ස්ථාපිත කරන ලද බාහිර විභාග අංශය දක්වා දිවයයි. සංවර්ධන අදියර කිහිපයකින් හා විවිධ නම් වලින් හැඳින්වීමෙන් අනතුරුව නව පරිපාලන ව්‍යුහයකින් යුතු 'දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය' යන නමින් 2007 වසරේ අප්‍රේල් මාසයේ දී ප්‍රසිද්ධියට පැමිණියේය. මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණ වනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සංයුක්ත සැලසුමේ දැක්වෙන එක් ඉලක්කයක් වන 'විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීමේ" අරමුණ සාක්ෂාත් කර ගැනීමයි.

''තවදුරටත් වෘත්තීය ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට සමාන අවස්ථාවන් ලබා දීම" දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ දැක්ම වේ. අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නන් හට බාධාවකින් තොරව එම කාර්යය ඉටු කර ගැනීම සඳහා අධ්‍යාපන අවස්ථා ලබා දෙමින් සියලුම දෙනාට අධ්‍යාපනය ලබා දීම, මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර ලෙස හඳුනාගෙන ඇත.

උපකුලපතිතුමා විසින් සභාපතිත්වය දරන දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ පාලනය යටතේ මෙම මධ්‍යස්ථානය පවතින අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු මෙහි අර්ධ කාලීන අධ්‍යක්ෂවරයෙකු ලෙස ප්‍රධානත්වය දරනු ලබයි. තවද ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් තිදෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ලෙස අධ්‍යක්ෂවරයාට සහය වෙති. එහි පරිපාලන ක්‍රියාකාරීත්වය ලේඛකාධිකාරිවරයාගේ පාලනය යටතටම වැටෙන අතර, මූලිකවම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයෙකු, සහකාර ලේඛකාධිකාරීවරයෙකු හා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු විසින් එය කළමනාකරණය කරනු ලබයි. ලිපිකාර හා සම ශ්‍රේණිවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය 19 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් එක් අයෙකු පුහුණු ශ්‍රේණියේ ද තිදෙනෙකු නුපුහුණු ශ්‍රේණිවලට ද අයත් වේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යයන පරිපාලනය විශ්වවිද්‍යාල පනතේ මධ්‍යස්ථානවලට හා ඒකකවලට අදාළ විධිවිධානවලට අනුව සිදුවේ. 1979 වසරේ සිට පවත්වනු ලබන ශාස්ත්‍රවේදී උපාධිය සහ 2008 වසරේ ආරම්භ කළ ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) යන උපාධි වැඩසටහන් පමණක් වර්තමානයේදී පිරිනමනු ලැබේ. මෙම උපාධි දෙක අධ්‍යයන මණ්ඩල දෙකක් යටතේ පවත්වනු ලබන අතර, ඒවා අනුමත කරන ලද්දේ ශාස්ත්‍ර පීඨය, අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුව හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසිනි.

### 2012 වසරේ ජයග්‍රහණ

බාහිර උපාධි සඳහා විසි එක්වන ශත වර්ෂයේ උසස් අධ්‍යාපනය සඳහා සකස් කළ යෝජනාව මූලිකවම පිළිගත් අතර, උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය දියුණු කිරීම හා මධ්‍යස්ථානයේ පරිපාලන පහසුකම් දියුණු කිරීම අරමුණු කරගත් මෙම වැඩසටහන සුමට ආකාරයෙන් ක්‍රියාත්මක වේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කාර්යාලය හා වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම 2013 වසරේ ආරම්භ කළ අතර, ඉදිකිරීම් කටයුතු අවසන්වීමට ආසන්නව පවතී.

### 2013 වසරේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කළ ප්‍රධාන ක්‍රියාකාරකම්:

- කාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුව 2013 ජනවාරි 24 වැනි දින වෛද්‍ය පීඨයේදී පවත්වන ලදි.
- ශාස්ත්‍රවේදී උපාධි සම්මන්ත්‍රණ මාලාව - 2013 පෙබරවාරි 09 වැනි දින සිට මාර්තු 31 දක්වා පවත්වන ලදි.

- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහනේ දිසානුයෝජන වැඩසටහන 2013 අප්‍රේල් 04 වැනි දින මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදි.
- කලා සාමාන්‍ය උපාධි පරීක්ෂණය 2013 අප්‍රේල්/මැයි මාසවලදී පවත්වන්නට විය.
- කළමනාකරණ හා සංවර්ධන වැඩසටහන් ඩිප්ලෝමාව –2013, මෙය මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ශාලාවේදී 2013 ජූනි 01 වැනි දින පවත්වන ලදි.
- බාහිර උපාධිධාරීන්ගේ උපාධි ප්‍රදානෝත්සවය 2013 ජූනි 27 වැනි දින පල්ලේකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ දී පවත්වන ලදි.
- බාහිර උපාධි යෝග්‍යතා පරීක්ෂණ සම්මන්ත්‍රණ මාලාව 2013 ජූනි 15 වැනි දින සිට අගෝස්තු 10 දක්වා පවත්වන්නට විය.
- කලා ප්‍රථම පරීක්ෂණය (බාහිර) 2013 අගෝස්තු සැප්තැම්බර් මාසවලදී පවත්වන ලදි.
- ඵලදායීතාව දියුණු කිරීමේ සූදානම පිළිබඳ වැඩමුළුව - කළමනාකරණ උපකරණ භාවිතය 2013 සැප්තැම්බර් 06 වැනි දින මධ්‍යස්ථානයේ ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදි.
- මෙම මධ්‍යස්ථානයේ කාර්‍යයන් සංවිධිත කිරීමේ වැඩමුළුව 2013 නොවැම්බර් 29-30 යන දිනවල කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ දී පවත්වන ලදි.

## අනාගත සැලසුම්

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් පිරිනමනු ලබන වැඩසටහන් සඳහා දේශන හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ඉඩපහසුකම් අවශ්‍ය බැවින් මෙම මධ්‍යස්ථානයට සිව්මහල් ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා යෝජනාවක් පිළිබඳව සාකච්ඡා කෙරේ. ශ්‍රී ලංකා සැලසුම් ආයතනයේ සහයෝගයෙන් "සන්නිවේදනය" පිළිබඳ නව ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම කෙරෙහි සලකා බලමින් සිටින අතර, එම වැඩසටහන 2014 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

**මුහුණපාන දුෂ්කරතා**

පරිපාලන කාර්ය මණ්ඩලයේ නිරන්තරයෙන් සිදුවන වෙනස්වීම් හේතුවෙන් මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී බාධා සිදුවිය.

## B4 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, එස්.බී. විජේකෝන් මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 1993 වසරේ පොදු රාජ්‍ය මණ්ඩලයීය විද්‍යා සභාවේ සහයෝගය සහිතව ස්ථාපිත කරන ලදී. ආරම්භයේ දී මෙම මධ්‍යස්ථානයට ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ විද්‍යා හා තාක්ෂණ පුද්ගල සංවර්ධන ව්‍යාපෘතිය විසින් අරමුදල් සපයන ලද අතර මේ වන විට එය විශ්වවිද්‍යාලයේ පූර්ණ වශයෙන් ස්වාධීන ඒකකයකි. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ වාණිජ හස්තයකි.

විශ්වවිද්‍යාලයේ නීති හා රෙගුලාසිවලට අනුව මෙම මධ්‍යස්ථානය පාලනය වන අතර විධායක කමිටුවක් විසින් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබයි. මෙම කමිටුව පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් නව දෙනෙකුගෙන් හා කර්මාන්ත ක්ෂේත්‍රයේ එක් සාමාජිකයෙකුගෙන් සමන්විත වේ.

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂවරයෙකුගෙන්, ඉංජිනේරුවන් දෙදෙනෙකුගෙන්, ලිපිකරුවන් තිදෙනෙකුගෙන් හා කම්කරුවෙකුගෙන් යුක්ත වේ. මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ක්‍රියාකාරකම්වල සුමට ගලනය සඳහා අධ්‍යක්ෂකවරයා වගකිව යුතු වේ.

### ජයග්‍රහණ

පුද්ගල සංවර්ධනය පිළිබඳ පාඨමාලා නවයක් (09) පවත්වන ලද අතර මෙම වැඩසටහන් සඳහා 250 දෙනෙකු සහභාගි වූහ.

- ව්‍යාපෘති හා පුද්ගල සංවර්ධන වැඩසටහන් ඇතුළත් වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන 22කි.
- තෙල්දෙණිය මූලික රෝහලේ ශල්‍යාගාරය හා දැඩි සත්කාර ඒකකයේ සැලසුම් කටයුතු මධ්‍යම පළාත් සභාවේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් භාර ගෙන ඇත.
- මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති හයකට භූ තාක්ෂණික සේවාවන් ලබා දෙන ලදි. කොත්මලේ ජාත්‍යන්තර පුහුණු පාසලේ සිසුන්ට සම්බන්ධීකරණය කළ ප්‍රායෝගික පුහුණු සැසි සිවිල් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව හරහා පවත්වන ලදි.
- ගෙවී ගිය වසර තුළදී උපදේශන ව්‍යාපෘති 60ක් අවසන් කරන ලදි. මාතලේ අලුවිහාරේ උසස් තාක්ෂණික පුහුණු ආයතනයේ සිසුන් සඳහා සැහැල්ලු ඉංජිනේරු වැඩසටහන පැවැත්වීම පිණිස තාක්ෂණික සහයෝගය ලබා දෙන ලදි.
- 2013 ඔක්තෝබර් මාසයේ දී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ ජාතික ඉංජිනේරු හා තාක්ෂණික ප්‍රදර්ශණය "Techno – 2013" සඳහා සහභාගි විය.
- කැළණි කේබල් පුද්ගලික සමාගම සමඟ එක්ව පාසැල් හැරගිය අයවලුන් සඳහා විදුලි රැහැන් ඇදීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදි. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ ව්‍යාපෘති හා පුද්ගල සංවර්ධන වැඩසටහන් තුළින් රුපියල් මිලියන 5.5 ක මුදලක් උපයා ඇත.

### බාධක සහ පිළියම්

- සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවුන බැවින් පුද්ගල සංවර්ධන වැඩසටහන් තුනක් (03) කල්දමන ලදි.
- ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ පාලනයෙන් පරිබාහිරව කටයුතු කිරීමේ හේතුවෙන් රුපියල් මිලියන තුනක ඇස්තමේන්තුගත ව්‍යාපෘති අතහැර දමන ලදි.

## අනාගත සැලසුම්

- 2014 වර්ෂය තුළදී පුද්ගල සංවර්ධන වැඩසටහන් 15ක් පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය සැලසුම් සකස් කර ඇති අතර එතුළින් රුපියල් මිලියන හතක (07) ආදායමක් ලැබීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව උපදේශන ව්‍යාපෘති 50ක් බාරගැනීමට සැලසුම් කරන අතර එයින් රුපියල් මිලියන 23ක ආදායමක් ලැබීමට අපේක්ෂිතයි.
- ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය තුළ පුද්ගලිකව වගකියන සමාගමක් ලෙස ස්ථාපිත කිරීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

2013 වසරේදී ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විසින් මෙහෙයවන ලද ප්‍රධාන ව්‍යාපෘති

| අංකය | විස්තරය |
|---|---|
| 1 | මිනිපේ ඇලේ ජලයේ අවසාධනය ගුණාත්මක බව පිරික්සීම |
| 2 | පරණ ලක්ෂපාන විදුලි බලාගාරයේ පවතින කොන්ක්‍රීට් ව්‍යුහයේ ශක්තිය පරීක්ෂා කිරීම |
| 3 | මැදිරිගිරිය කවුඩුළු ඔය හරහා පයිප්ප පාලමක් සැලසුම් කිරීම පිළිබඳ උපදේශන සේවාව |
| 4 | Ceytea හි බලශක්ති විගණනය හා සැකසුම් අධ්‍යයනය |
| 5 | විදුලිය සවි කිරීමේ පද්ධතියේ සැලසුම් සමාලෝචනය |
| 6 | මාන්කුලම් - මුලතිව් මාර්ගයේ කි.මී. 26 - 410 අතර පාලමේ අසාර්ථක බව තක්සේරු කිරීම |
| 7 | නිකවැරටිය ජල සම්පාදන ක්‍රමයේ හානි වූ මෝටර පාලන පද්ධතියේ පරීක්ෂාව |
| 8 | හිල්ටොප් හෝටලය ප්‍රදේශයේ නාය යෑමේ ස්ථාන පරීක්ෂාව |
| 9 | මාතලේ උසස් තාක්ෂණික පුහුණු පාසලේ 8 හා 9 කණ්ඩායම් නිරීක්ෂණය හා ඇගයීම |
| 10 | නුවරඑළියේ යෝජිත ගොඩනැගිල්ලේ ස්ථාන පරීක්ෂාව |
| 11 | ට්‍රාන්ස්ෆෝමර පහක් පරීක්ෂා කිරීම |
| 12 | මහියංගනයේ යෝජිත ජල පිරිපහදුවේ ජලවිද්‍යාත්මක අධ්‍යයනය |
| 13 | නුවරඑළිය සඳතැන්න අපවිත්‍ර ජල පිරිපහදුවේ ප්‍රතිශෝධනය සඳහා යෝජනාව |
| 14 | තෙල්දෙණිය අසාර්ථක පැති බැම්මට ප්‍රතිශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ස්ථාන පරීක්ෂාව |
| 15 | මහනුවර දෙවැනි රාජසිංහ මාවතේ අංක 40, රජින හෝටලය සඳහා මාර්ග තදබදයෙහි බලපෑමෙහි තක්සේරුව |
| 16 | දංගල්ලේ සිට වතුමුල්ල දක්වා උඩුපුස්සැල්ලාව-නිල්දණ්ඩාහින්න - වතුමුල්ල මාර්ගයේ ස්ථාන පරීක්ෂාව |
| 17 | Capacity Building for Clean Power Development - Part B Preparation of Renewables Development And Wind Park Master Plans and Business Model for Wind Park |
| 18 | මාතලේ HTTI ආයතනයේ 8 සහ 9 කණ්ඩායම් නිරීක්ෂණය හා ඇගයීම |
| 19 | Conceptual Design for Municipal Solid Waste Compost Plant at Seeduwa (Inq - 1209) |
| 20 | තෙල්දෙණිය දිස්ත්‍රික් රෝහලේ මහල් පහකින් යුතු ශල්‍යාගාර සංකීර්ණය හා දැඩි සත්කාර ඒකකය ඉදිකිරීම සඳහා උපදෙස් සේවාවන් ලබා දීම |
| 21 | Inundation Modeling of Upper Hulu Ganga Mini Hydro-Power Project |
| 22 | මුතුර් ජල පිරිපහදුවේ ව්‍යුහයෙහි පිපිරීම් පිළිබඳ මූලික විමර්ශනය |

| | |
|---|---|
| 23 | Water Quality Study, NCP Canal Benefitted Area and Yan Oya Irrigation System |
| 24 | Inspection of Mill Motor at Holcim Lanka (Pvt) Ltd, Galle |

**ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විසින් 2013 වසරේදී පවත්වන ලද වැඩමුළු හා කෙටි පාඨමාලා**

| අංකය | විස්තර | 2013 වසරේ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 2013 වසරේ පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | ආරම්භ කළ හා අවසන් කළ දින | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | තෙදින හා දෙදින වාෂ්ප ඉංජිනේරු හා බලශක්ති සංරක්ෂණ වැඩසටහන් | 2 | 22 | 2013 මැයි හා ඔක්තෝබර් | 30 & 34 |
| 2 | කැළණි සවිය වැඩසටහන සඳහා පාඨමාලා මොඩියුල තුනක් | 1 | 4 | 2012 මැයි 2013 ඔක්තෝබර් | 40 |
| 3 | සිව්දින වැඩමුළුව "Practical Finite Element Analysis Concepts & Applications" | 1 | 1 | 2013 මාර්තු 15 සිට 23 දක්වා | 26 |
| 4 | Hydraulic Modeling පිළිබඳ සිව්දින කෙටි පාඨමාලාව | 1 | 2 | 2013 මැයි 31- ජූනි 08 දක්වා | 24 |
| 5 | කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ සිසුන් සඳහා විද්‍යාගාර පංති පැවැත්වීම | 1 | 1 | ජූනි 29 - අගෝස්තු 17 | එම ආයතනයේ සිසුන් |
| 6 | Commercial Arbitration as an ADR. mechanism | 1 | 1 | 2013 සැප්තැම්බර් 14 | 29 |
| 7 | යකඩ ව්‍යුහයන් සැලසුම්කරණය පිළිබඳ සිව්දින කෙටි පාඨමාලාව | 1 | 1 | 2013 සැප්තැම්බර් 27 ඔක්තෝබර් 05 | 19 |

## B5 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එම්. සෝමතිලක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය පාලක සභාවේ හා සනාතන සභාවේ අනුමැතියෙන් විදෙස් අරමුදල් ලබන ව්‍යාපෘතියක් ලෙස 2002 වසරේදී ස්ථාපිත කරන ලදි. විදෙස් අරමුදල් ලබන මෙම ව්‍යාපෘතිය 2008 වසරේදී අවසන් වූ අතර එම ව්‍යාපෘති කාලසීමාව තුළ මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව, මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හා ආධුනිකත්ව වැඩසටහන යන ප්‍රධාන ක්‍රියාකාරකම් තුන බාරගෙන කටයුතු කරන ලදි. මධ්‍යස්ථානයේ ඉගැන්වීම් පාඨමාලාවන් සඳහා පවතින ඉල්ලුම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වන ලදි. මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය ශාස්ත්‍ර පීඨයේ කන්නන්ගර ගොඩනැගිල්ලේ කාමර අංක 04හි ස්ථාපිත කොට ඇත. මානව හිමිකම් හා මූලික නිදහස යන කරුණු පිළිබඳ නිරවුල්, විචාරශීලී සහ ක්‍රියාශීලී සමාජයක් නිර්මාණය කිරීම මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වන අතර විශ්වවිද්‍යාල ප්‍රජාව සහ මහජනතාව හා සම්බන්ධවන මානව හිමිකම් පිළිබඳ දැනුම බහු ක්ෂේත්‍ර, අධ්‍යාපනික හා පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධනය කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ඉලක්කය වේ.

මධ්‍යස්ථානයේ සංයුතිය පහත පරිදි වේ.

- (i) පාලක මණ්ඩලය
- (ii) අධ්‍යක්ෂ
- (iii) අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු
- (iv) පරිපාලන නිළධාරි

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයට ප්‍රතිපත්ති, අයවැය හා මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ බලය පැවරී ඇත. ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති (සභාපති), දේශපාලන විද්‍යා අංශයේ අංශ ප්‍රධානී, මානව හිමිකම් සම්බන්ධ පාඨමාලා පවත්වනු ලබන මානව හිමිකම් අධ්‍යයන අංශය නියෝජනය කරන ශාස්ත්‍ර පීඨ මණ්ඩලය විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකු හා පීඨ අට නියෝජනය කරමින් පීඨ මණ්ඩල සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් අට දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පාලක මණ්ඩලයේ ලේකම් ලෙස ක්‍රියා කරයි. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු මෙහෙයවනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් අතරින් පුවත්පත් දැන්වීම් හරහා විශ්වවිද්‍යාලයීය බලාධිකාරිය විසින් තොරාගනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසිනි. අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු සහ පරිපාලන නිළධාරියෙකු අධ්‍යක්ෂකවරයාට සහය වේ. මෙම මධ්‍යස්ථානය සතුව ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැති අතර, සියලුම සම්පත්දායක පුද්ගලයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලබාගනු ලබයි. ඔවුහු ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස සේවය කරති.

### ජයග්‍රහණ

2004 සිට 2013 වසර දක්වා වූ කාලය තුළ මෙම මධ්‍යස්ථානය ඉගැන්වීම් වැඩසටහන් දෙකකින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 24ක මුදලක් උපයා ඇති අතර ඉන් ආසන්න වශයෙන් රුපියල් මිලියන 7.6ක මුදලක් ඉතිරි කොට ඇත. මේ වන විට එම ඉගැන්වීම් වැඩසටහන් දෙක සඳහා විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන්ගෙන්, උපාධිධාරීන්ගෙන්, පොලීසියෙන්, යුධ හමුදාවෙන්, බන්ධනාගාර නිලධාරින්ගෙන්, පාසැල් ගුරුවරුන්ගෙන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලින් ද ඉල්ලුම පවතී. 2004 සිට 2013 දක්වා කාලය තුළ මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහතික පත්‍ර සහ ඩිප්ලෝමාධාරීන් පිළිවෙළින් 3151ක් හා 898 දෙනෙකු බිහිකර ඇත.

2012-2013 වසරේදී ද මෙම මධ්‍යස්ථානය සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා පවත්වන ලදි. ඒ සඳහා සහභාගී වූ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

1) මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර : 2013 - සිංහල මාධ්‍ය සිසුන් 273ක්
2) මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමා 2011/12 - සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් 114ක්

### බාධක සහ පිළියම්

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ අයවැය හා නොවැලැක්විය හැකි හේතූන් නිසා 2013 වසරේදී සහතික පත්‍ර පාඨමාලා 04ක් පැවැත්වීමට නොහැකි විය. එනමුත් 2013 වසරේ සහතික පත්‍ර පාඨමාලාවල ප්‍රතිඵල නිසි කලට නිකුත් කිරීමට හැකි විය.

### අනාගත සැලසුම්

- මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා විදෙස් ප්‍රදාන ලබා ගැනීම
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් මානව හිමිකම් පාඨමාලාවක් හඳුන්වා දීම
- මධ්‍යස්ථානය වෙනුවෙන් පුළුල් අත්පොතක් සංග්‍රහ කිරීම

## B6 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ (වැ.බ.) ආචාර්ය ජගත් ගුණතිලක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

සනාතන සභාවේ, පාලක සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය 1992 වසරේ ස්ථාපිත කරන ලදි. පසුගිය අවුරුදු 22 ක කාලයක් පුරා මෙම මධ්‍යස්ථානය පරිසර අධ්‍යාපනය හා පුහුණු ක්ෂේත්‍රයෙන් විශ්වවිද්‍යාලයට හා ජාතියට වැදගත් සේවාවක් ඉටුකර ඇත. කෙසේ වෙතත්, පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ කළමනාකරණය හා විශ්වවිද්‍යාලයේ මධ්‍යම පරිපාලන පද්ධතිය අතර, සංවිධාන මනා සම්බන්ධීකරණ පද්ධතියක් නොමැතිවීම නිසාවෙන් විවිධ අඩුපාඩු සිදුවිය. 2007.01.01 දින පැවැත්වූ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටු රැස්වීමේදී පරිපාලන හා මූල්‍යමය ක්‍රියාපටිපාටි ඇතුළත් යෝජනාවක් සකස් කිරීමට හා සනාතන සභාවෙන් අළුතින් අවසර ලබා ගැනීමට තීරණය විය.

2008 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද එම අවසරයට අනුව "පාරිසරික වශයෙන් තොරතුරු දත් හා වගකීම් සහිත සමාජයක් සහතික කිරීම" පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වේ. "කාර්යක්ෂම පරිසර කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම පිණිස හා විශ්වවිද්‍යාල සිසුන්, වෘත්තිකයන් හා සාමාන්‍ය මහජනතාව තුළ චිරස්ථායි පාරිසරික ආකල්ප ඇති කරලීම සඳහාත්, පුළුල් පාරිසරික දැනුමක් ව්‍යාප්ත කරලීම" පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ මෙහෙවර වේ.

### ජයග්‍රහණ

1. විද්‍යා අධ්‍යාපන ඒකකය සමඟ සහයෝගයෙන් "Water at the Heart of Science 2013" යටතේ 2013 නොවැම්බර් 19 සිට දෙසැම්බර් 06 වන දින දක්වා ඇලියන්ස් ප්‍රැන්චයිස් ද කැන්ඩි හා ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේදී ප්‍රදර්ශන, දේශන හා සාකච්ඡා පවත්වන ලදි.

2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම් මත පදනම්ව 2013 වසරේ පවත්වන ලද/ආරම්භ කළ ක්‍රියාකාරකම් ලැයිස්තුව

    - මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සහයෝගයෙන් පාරිසරික ආරක්ෂණය පිළිබඳ පාසැල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන අවසන් කරන ලදි.
    - ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරම්භ කිරීම.

3. පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම මත පදනම්ව යෝජිත ක්‍රියාකාරකම් ලැයිස්තුව

    - කර්මාන්තකරුවන් සඳහා කර්මාන්ත දූෂණය පාලනය පිළිබඳ පුහුණු වැඩ සටහනක් පැවැත්වීම
    - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අඛණ්ඩව පැවැත්වීම
    - හන්තාන පාරිසරිකව ආරක්ෂිත ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලසුමක් සකස් කිරීම "ආරම්භ කිරීම."
    - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව පාසල් සිසුන් සඳහා පරිසර දූෂණය පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

**4. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පිරිනමන ලද කෙටි පාඨමාලා**

| පාඨමාලාව | කාල පරිච්ඡේදය | පිරිනැමූ දින | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ 9001 හා 14001 සහතිකය | දින 02 | 2013 ජූනි 1-2 දිනයන් | 088 |
| මානව සම්පත් කළමනාකරණය | දින 02 | 2013 මැයි 18 -19 දිනයන් | 127 |
| මානව සම්පත් කළමනාකරණය | දින 02 | 2013 දෙසැම්බර් 21-22 | 057 |

**5. 2013 වසරේ අවසන් කළ උපදේශන ව්‍යාපෘති:**

- ගෝනාදිකවත්ත ඉඩම් ගොඩ කිරීමේ පාරිසරික බලපෑමේ තක්සේරු වාර්තාව සකස් කොට අවසන් කිරීම. මධ්‍යම පරිසර අධිකාරියෙන් දෙවන සහ අවසන් වාරිකය මෙතෙක් ලැබී නොමැත.
- කොළඹ-නුවර විකල්ප මාර්ග ව්‍යාපෘතිය
- ඉල්ලුම් කළ පරිදි මෙහි අවසන් වාර්තාවේ සිංහල හා දෙමළ පරිවර්තනය අවසන් කොට බාර දෙන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසන් වාරිකය ලැබීමට නියමිතයි.
- මොණරාගල ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අතිරේක පාරිසරික අධ්‍යයනය (ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය)
- එහි අධ්‍යයනය අවසන් කොට අවසන් වාර්තාව බාර දෙන ලදි.

## බාධක සහ පිළියම්

1. කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සහභාගි නොවීම නිසා කර්මාන්ත දූෂණය පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් නොපවත්වන ලදි.
2. මුදල් හා පරිපාලන ගැටළු හේතුවෙන් වාර සඟරාව එළිදැක්වීම නවත්වන ලදි.

## අනාගත සැලසුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම මත පදනම්ව යෝජිත ක්‍රියාකාරකම් ලැයිස්තුව ඇමුණුම් i හි දැක්වේ. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය පාරිසරික ගැටළු හා සම්බන්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සහායවීම සඳහා වෙනත් ව්‍යාපෘති රාශියක් සිදුකිරීමට සැලසුම් සකස් කරමින් සිටි. මෙම ක්‍රියාකාරකම් හා වෙනත් ක්‍රියාකාරකම් ඇමුණුම් අංක iii හි දක්වා ඇත.

# B7 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ ආචාර්ය නන්ද ගුණවර්ධන විසින් වාර්තා කරන ලද පරිදි)

## හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල බවට පත් කිරීම සඳහා යෝජනා කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මෙම වැඩසටහන යටතේ නිශ්චිත මුදල් ප්‍රමාණයක් එක් විශ්වවිද්‍යාලයකට වෙන් කොට තෝරාගත් විශ්වවිද්‍යාල හයෙන් යෝජනා කැඳවන ලදි. 2011 ජූනි 25 වැනි දින පවත්වන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 397 වැනි පාලක සභා රැස්වීමේදී බහු ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජනා විය.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2012 අප්‍රේල් මාසයේදී නිල වශයෙන් පිහිටුවන ලදි. උපකුලපතිතුමා විසින් සභාපතිත්වය දරණ හා නියෝජ්‍ය උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨවල පීඨාධිපතීන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී හා මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගෙන් (ලේකම්) සැදුම්ලත් කළමනාකරණ මණ්ඩලයක් විසින් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය පාලනය කරනු ලබයි.

**ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු :-**

- පශ්චාත් උපාධි ආයතන ඇතුළත්ව විශ්වවිද්‍යාලය තුළ අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ සහයෝගිතාවන් ප්‍රවර්ධනය හා සහයෝගය දැක්වීම
- විශ්වවිද්‍යාලය වෙනුවෙන් ප්‍රදාන ආකර්ෂණය කර ගන්නා මධ්‍යස්ථානයක් බවට පත්වීම
- උසස් උපාධි පාඨමාලාවන් සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සිසුන් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කොට සම්බන්ධීකරණය කිරීම
- විශ්වවිද්‍යාලයේ සියලුම පර්යේෂණ ප්‍රකාශන එක්රැස් කොට
- (i) පර්යේෂණ (ii) පේටන්ට් හා (iii) ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් පර්යේෂණ හා සහයෝගිතාවන් ප්‍රවර්ධනය
- ජාත්‍යන්තර පර්යේෂණ, විද්වතුන් හුවමාරුව ප්‍රවර්ධනය කොට සම්බන්ධීකරණය කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ සමුළු, පුහුණු වැඩසටහන් හා විශ්වවිද්‍යාලයේ සම්මන්ත්‍රණ සඳහා සම්බන්ධීකාරක මධ්‍යස්ථානයක් වීම
- විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ක්‍රියාකාරකම් හා ප්‍රකාශන වෙනුවෙන් දත්ත ගබඩාවක් පවත්වාගෙන යෑම

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා අපගේ URL:http://www.pdn.ac.lk/uop/inrc/index.php වෙත පිවිසෙන්න.

## ජයග්‍රහණ

ගෙවී ගිය වසරේදී ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය එහි අරමුණු සක්ෂාත් කර ගැනීම පිණිස විවිධ ක්‍රියාකාරකම්වල නිරත විය. 2013 වසරේ බාරගත් ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් විස්තර වේ.

ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය විසින් අවබෝධතා ගිවිසුම් අටක් (08) ආරම්භ කළ/ සහය දක්වන ලද අතර මෙම මධ්‍යස්ථානය ඒවායේ පාර්ශවකරුවන් සමඟ නිරන්තරයෙන් සන්නිවේදන සබඳතා පවත්වා ගනිමින් වැඩි වැඩියෙන් හුවමාරු හා සහයෝගිතාවන් ඇති කර ගැනීම සඳහා දිරිමත් කරනු ලැබේ.

සහයෝගිතා ක්‍රියාකාරකම් හා හුවමාරු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් විදේශ විශ්වවිද්‍යාලවල දූත කණ්ඩායම් 13 ක් සංවිධානය කොට

සම්බන්ධීකරණය කරන ලදි. ඒ සියලු දෙනාගෙන් ලද සුබවාදී ප්‍රතිචාරයන් අපව දිරිගන්වන සුළුවන අතර, ඉදිරියේදී එම සියලුම ආයතන සමඟ යහපත් හා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිඵලදායි බැඳීම් ඇති කර ගැනීමට අප අපේක්ෂා කරන්නෙමු.

ටෝකියෝ තාක්ෂණික ආයතනය සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩ සටහනක් ආරම්භ කළ අතර, 2014 වසරේදී එම ආයතනයෙන් ශිෂ්‍ය කණ්ඩායමක් ගෙන්වා ගැනීමේ අපේක්ෂාවෙන් පසුවේ. හොකියිඩෝ විශ්වවිද්‍යාලය හා සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලය සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංවිධානය කෙරෙමින් පවතින අතර, 2014 වසරේ මැදභාගයේදී එම වැඩසටහන් ආරම්භ කිරීමට අපේක්ෂිතයි.

ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය විසින් විවිධ විද්වතුන් හා ආයතන සමඟ සහයෝගිතා ප්‍රදාන රාශියක් අයදුම් කළ අතර, ඒ අතුරින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය සමඟ සහයෝගයෙන් නෝර්වේ ලයිෆ් සයන්ස් විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කළ නොහාඩ් ප්‍රදානය හා ආසියා පැසිපික් විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය සමඟ JSP JICA සහයෝගිතා ව්‍යාපෘතිය වැදගත්වේ.

මෙම ආයතනයෙන් වෙන් කරන ලද මුදල්වලින් 2013 වසර පුරාම ප්‍රදාන ලබා දීමට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයට හැකි විය.

| | |
|---|---|
| ගමන් ප්‍රදාන | 88 |
| ප්‍රකාශන ප්‍රදාන | 18 |
| සංවිධානය කළ/අනුග්‍රහය දැක්වූ කාර්යයන් | 12 |
| දර්ශනශූරි අධ්‍යයන/පුහුණු | 05 |
| ආගන්තුක විද්වතුන් | 07 |
| උපකරණ | 16 |
| පර්යේෂණ | 23 |

ශ්‍රී ලංකා ජපන් සහයෝගිතා පර්යේෂණ සමුළුව පැවැත්වීමත් සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් පිරිසක් සමඟ ශ්‍රී ලංකා-ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටුවීමේදී ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය මූලිකත්වය දැරීය. දින දෙකක් පුරා පැවති මෙම සමුළුවේදී ප්‍රධාන දේශකයන් 11 දෙනෙකු හා 150කට වැඩි පර්යේෂණ පත්‍ර ඉදිරිපත් කළ අතර, ජපානයෙන් 45 දෙනෙකු හා ශ්‍රී ලංකාවෙන් 175 දෙනෙකු ඒ සඳහා සහභාගි වූහ. ජපන් ආයතන 25කට වැඩි ප්‍රමාණයක් හා ශ්‍රී ලංකාවේ සියලුම ආයතන මෙම කාර්යය සඳහා නියෝජනය කළහ. මෙම සමුළුව සංවිධානය කිරීමේදී ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ජපන් පදනමේ සහාය ඉල්ලා සිටි අතර, එම පදනම රුපියල් මිලියන 2.4 ක මුදලක් ලබා දෙමින් සහාය දැක්විය.

ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ඇතුළත්ව පුරෝගාමී සම්පත්දායක පුද්ගලයන් සමඟ පර්යේෂණ ප්‍රදාන පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදි. මෙම වැඩමුළුව අතිශයින් සාර්ථක වූ අතර, අනතුරුව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය, පර්යේෂණ ක්‍රමවේදය හා සාර්ථක ප්‍රදාන යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළු පවත්වන ලදි.

මෙම මධ්‍යස්ථානය සඳහා පරිගණක වැඩසටහන්කරුවෙකු බඳවා ගන්නා ලදි. වැඩිදුර විස්තර හා තොරතුරු සඳහා http://www.pdn.ac.lk/uop/inrc/NewsFull.php?value=CurAll වෙත පිවිසෙන්න.

### බාධක හා පිළියම්

සම්බන්ධීකාරකවරයෙකු හා නව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු කුලී පදනමින් බඳවා ගැනීමට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය අදහස් කළ ද, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ප්‍රමාදවීම නිසා එය සාර්ථක නොවීය.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල කාර්යාල, දේශන ශාලා හා මධ්‍යගත විද්‍යාගාරය ඇතුළත් තිල කාර්යාලය සඳහා A6 ගොඩනැගිල්ල ලබා දී ඇති අතර, එහි අළුත්වැඩියා

කටයුතු ඇරඹීමට නියමිතය. මේ වනවිට මෙහි ඉතා සුළු ප්‍රගතියක් දැකිය හැකිය. 2014 වසරේදී මෙම කාර්ය අවසන් කිරීමට අපේක්ෂිතයි.

### අනාගත සැලසුම්

2014 වසරේදී සහයෝගිතා වැඩසටහන් හා දැනුම හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා විදෙස් විද්වතුන් විසි දෙනෙකු පමණ ගෙන්වා ගැනීම සංවිධානය කිරීමට හා සම්බන්ධිකරණය කිරීමට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය අපේක්ෂා කරයි. එමෙන්ම ජාත්‍යන්තර සමුළු අවම තරමින් තුනක්වත් සංවිධානය කිරීමට ද බලාපොරොත්තු වේ. තවද සිසුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පර්යේෂණ කුසලතා සංවර්ධනය කිරීම සඳහා වැඩමුළු පහක් පැවැත්වීමට ද අදහස් කරන අතර, මීට අමතරව පරිපාලන ක්‍රියාදාමයන් හා ආයතනික සක්‍යතාවය ගොඩනැගීම ඉලක්ක කරගත් වැඩමුළු දෙකක් ද පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පවතින උපකරණ පිළිබඳ දත්ත ගබඩාව සම්පූර්ණ කිරීම ඇතුළුව විවිධ දත්ත ගබඩාවන් සංගෘහිත කරනු ඇත. පර්යේෂණ සඟරාවක් ආරම්භ කොට හැකි විගස එය එළිදැක්වීමට ද මෙම මධ්‍යස්ථානය අපේක්ෂා කරයි. අවබෝධතා ගිවිසුම් දහයක් ද ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ඇත.

## B8 හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය
(අධ්‍යක්‍ෂ, ආචාර්ය සම්පත් තෙන්නකෝන් විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය එහි ආරම්භය වූ 2005 වසරේ සිට හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ පුරෝගාමියා බවට පත්වී ඇත. මෙම මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල සමඟ එක්ව අර්බුදයට ලක්ව පවතින ලිංගික හා ප්‍රතිජනන සෞඛ්‍ය සේවාවන් ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික වැඩමුළු එකොළහක් (11) සාර්ථකව පවත්වන ලද බව සඳහන් කරනුයේ ඉමහත් සතුටිනි. එමෙන්ම මෙම මධ්‍යස්ථානය සමහර SRH වැඩසටහන් සඳහා පසු විපරම් වැඩසටහන් ද පවත්වා ඇත.

එපමණක් නොව සෞඛ්‍ය හදිසි අවස්ථා හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට කාර්යාලය සමඟ එක්ව මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා හා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික වැඩමුළු හයක් සාර්ථකව පවත්වා ඇති අතර, මෙම මධ්‍යස්ථානය තෙවන හා සිව්වන වැඩමුළුවල පසු විපරම් වැඩසටහන් ද පවත්වා ඇත. මෙම සියලු ජාතික මට්ටමේ වැඩමුළු අතිසාර්ථකව අවසන් කර ගත හැකි වූයේ විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙනත් සෞඛ්‍ය නිලධාරීන් හා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල අගනා දායකත්වය නිසාවෙනි.

මෙම ඒකකය විසින් සෞඛ්‍ය පරිපාලකයන්, සායනිකයන්, අධ්‍යයන ආයතනවල ආචාර්ය මණ්ඩල, රජයේ පරිපාලකයන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, නගර සභා සාමාජිකයන් හා සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ/පිළිගත් මෙහෙයුම් පටිපාටීන් සකස් කරන/ඉහළ නැංවීම හා සම්බන්ධවී සිටින වෙනත් අත්‍යවශ්‍ය සේවාවන්ට අදාළ සාමාජිකයන් සඳහා හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලා පවත්වනු ලබයි.

### ජයග්‍රහණ

- මෙම මධ්‍යස්ථානය හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික පාඨමාලා හයක්, අර්බුදයට ලක්වූ ලිංගික හා ප්‍රතිජනන සෞඛ්‍ය ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික පුහුණු පාඨමාලා එකොළහක් හා පූර්ව-ආරෝග්‍යශාලා සත්කාරය හා ගිලන් රථ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා දහයක් සාර්ථකව පවත්වා ඇත.

- වෛද්‍යවරුන් පළමු ග්‍රහකයන්, සාත්තු සේවිකාවන් හා පාසල් ළමුන් සඳහා පූර්ව-ආරෝග්‍යශාලා සත්කාරක වැඩසටහන් රාශියක් සාර්ථකව පවත්වා ඇත.

- වෛද්‍ය නිලධාරීන් හා ස්වේච්ඡා සේවකයන් සඳහා ද හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලා බොහෝමයක් පවත්වන ලදි.
- 78 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව හදිසි සෞඛ්‍ය අවස්ථාවන්ට සූදානම්වීම හා ඊට ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව තක්සේරු කිරීම (SEARO) 2012 මැයි මාසයේදී පවත්වන ලදි.

- ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි පාඨමාලා සංවර්ධනය හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ මොඩියුලයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආපදා කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහනට ඇතුලත් කරන ලදි. හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ සම්පත් දායකයන් විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී මෙම මොඩියුලර් ඉගැන්වීම කරනු ලබයි.

## අනාගත සැලසුම්

- මෙම මධ්‍යස්ථානය මේවනවිට හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම සඳහා කටයුතු සකස් කරමින් සිටි. මෙම පාඨමාලාව සති අන්ත පාඨමාලාව ලෙස පවත්වනු ලබන අතර, එය වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයන් සඳහා පමණක් සීමා නොවනු ඇත.

- විදෙස් රටවල අයදුම්කරුවන් සඳහා SRH පාඨමාලාවක් පිළිවෙළ කිරීමට මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය මෑතකදී තීරණය කොට ඇත. අසංවර්ධිතභාවය නිසා පුද්ගල ස්වාධීනත්වය, යුද්ධය, සමානාත්මතාවය, ජාතිවාදය, දරිද්‍රතාවය, නූගත්කම, රෝග හා ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොටගත් ප්‍රචණ්ඩත්වය වැනි ප්‍රධාන ගැටළු පවතින පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීම සඳහා විශේෂ අවධානය යොමු කොට ඇත.

- එමෙන්ම මෙම මධ්‍යස්ථානය පුද්ගලික අංශය සඳහා PHEDMa වැඩ සටහන විවර කිරීමට ද කටයුතු සැලසුම් කරමින් සිටි.

- මෙම මධ්‍යස්ථානය ආපදා කළමනාකරණය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම හා ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ කලාපීය හා ජාත්‍යන්තර සබඳතා සංවර්ධනය කිරීම සඳහා ද කටයුතු සකස් කරයි.

## උපග්‍රන්ථය C – ඉගෙනුම් සහයක සේවාවන්

### C1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය

(පුස්තකාලයාධිපතිනි, ආචාර්ය කේ.ජීපී.ජී. විජේතුංග විසින් වාර්තා කරන ලද පරිදි)

#### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය 1921 වසරේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලය ලෙස ආරම්භ විය. 1952 වසරේදී පේරාදෙණියට ගෙන එන ලද මෙම පුස්තකාලය වත්මන් පරිශ්‍රයේ පිහිටුවන ලද්දේ 1960 වසරේදීය. පේරාදෙණියට ගෙන ඒමෙන් පසු මෙම පුස්තකාලය ප්‍රධාන පුස්තකාලය ඇතුළු කෘෂිකර්ම, සම සෞඛ්‍ය, දන්ත, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා හා පශු වෛද්‍ය යන ශාඛා පුස්තකාල හතකින් සමන්විත පුස්තකාල ජාලයක් බවට සංවර්ධනය විය. නව වැනි ශාඛා පුස්තකාලය කෘෂි විද්‍යා පීඨයේ මහඉලුප්පල්ලම උප මණ්ඩපයට අනුබද්ධ කොට ඇත. මෙම ශාඛා පුස්තකාල අදාළ පීඨවල පිහිටුවා ඇත. නව ගලහ මාර්ගය දිගේ පැමිණ කලාගාර පිවිසුම පසු කොට දකුණට හැරී සනාතන මන්දිරයට පැමිණීමෙන් ප්‍රධාන පුස්තකාලයට පිවිසිය හැකිය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ පැරණිම හා විශාලතම පුස්තකාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලයයි. මෙහි දැක්ම, මෙහෙවර හා ඉලක්කයන්
http://www.lib.pdn.ac.lk/About_us/general_info/general_info.html වෙත පිවිසීමෙන් දැනගත හැකිය.

#### ජයග්‍රහණ

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු 2013/2014 වසර සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතින්ගේ සංගමයට තෝරාපත් කර ගන්නා ලදි. සභාපති ලෙස ආර්.මහේශ්වරන් මහතාද, එස්. ප්‍රේමරත්න මහතා මහ ලේකම් ලෙස ද, සී.ගුණසේකර මිය භාණ්ඩාගාරික ලෙසත්, ඒ.ධර්මරත්න එම සංගමයේ වාර සඟරාවේ සංස්කාරක ලෙසත් තේරී පත් වූහ.

විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතින්ගේ සංගමයේ වාර්ෂික පර්යේෂණ සැසිය - 2013 යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සම්මන්ත්‍රණ ශාලාවේදී 2013 අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලදි. මෙම කාර්යය යාපනයේ විශ්වවිද්‍යාලයේ පවත්වන ලද ප්‍රථම අවස්ථාව මෙය විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය එස්.කේ. හෙන්නායක මෙහි ආරාධිත දේශකයා විය. එහිදී ඉදිරිපත් කිරීම් පහළොවක් (15) ඉදිරිපත් කළ අතර, ඉන් හතරක් (04) පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලදි.

සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි ආචාර්ය පී. විජේතුංග (මිය) 2013 සැප්තැම්බර් මස නැවත රාජකාරි ඇරඹුවාය. ඩී.කේ. අබේරත්න මිය සහකාර පුස්තකාලයාධිපති තනතුරට 2013.07.01 දින සිට පත් කරන ලද අතර, ආර්.බී. හේරත් මහතා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයේ වැඩ සටහන්කරු ලෙස 2013.03.01 දින වැඩ බාර ගන්නා ලදි. 2013.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුස්තකාල සහායකයන් හත් දෙනෙකු (07) පත් කරන ලදි. කම්කරුවන් තිදෙනෙකු පුස්තකාල සේවක තනතුරට උසස් කරන ලදි. ජාත්‍යන්තර උසාවියේ හිටපු උප සභාපති විනිසුරු සී.ජී. වීරමන්ත්‍රි විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයට පරිත්‍යාග කරන ලද කෘති එකතුව විවෘත කිරීමේ සමාරම්භක උත්සවය 2013 ජූලි 15 දින පවත්වන ලදි. මෙම වටිනා නීති කෘති එකතුවට පොත්, වාර සඟරා හා නීති අංශයේ විවිධ අංශවලට අයත් කුඩා පොත් ඇතුළත් ප්‍රකාශන 3500 ක් පමණ අඩංගු වේ.

විශ්‍රාම ගැනීම, මාරුවීම්, මරණයට පත්වීම හා වෙනත් රැකියාවන් සඳහා පුස්තකාල ජාලය හැර ගිය සේවකයන් හත් දෙනෙකුට (07) ගෞරවය දැක්වීම සඳහා පුස්තකාල සුබසාධන සංගමය විසින් සංවිධානය කළ උපහාර පිදීමේ උළෙලක් 2013 මාර්තු මස 22 දින ප්‍රධාන පුස්තකාලයේදී පැවැත්විණ. නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය එස්.කේ. හෙන්නායක මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වී සම්මාන ප්‍රදානය කළේය. මෙම සම්මානලාභීන් වූයේ ඒ.ටී. අල්විස් මයා, කේ.ජී, ජයරත්න මයා, එච්.එච්. චන්ද්‍රදාස මයා, කමනි රඹුක්පොත මිය, හා තම ස්වාමිපුරුෂයා වෙනුවෙන් ඊ.ඒ. ගුණරත්න යන මහත්ම මහත්මීන්ය. එම උත්සවයේදීම හොඳම පුස්තකාල සහායක

හා හොඳම පුස්තකාල සේවකයාට ද මුදල් ත්‍යාග පිරිනැමීය. ඉහත ත්‍යාග ආරම්භ කරන ලද්දේ පුස්තකාල ජාලයේ හිටපු පුස්තකාලයාධිපති එන්.ටී.එස්.ඒ. සේනාධීර මහතා විසින් ඔහුගේ පුද්ගලික මුදල් උපයෝගී කර ගනිමිනි. 2010-2011 වසරවල හොඳම පුස්තකාල සහායකවරුන් වූයේ ඉංජිනේරු පුස්තකාලයේ විජිත නවරත්න මහතා හා කෘෂිවිද්‍යා පුස්තකාලයේ එස්.අමුණුගම මහත්මියයි. ප්‍රධාන පුස්තකාලයේ වී.ටී.ජී. චන්ද්‍රසේකරන් හා එච්.එම්. හේරත් බණ්ඩා යන මහත්වරුන් 2010-2011 වසර සඳහා හොඳම පුස්තකාල සේවකයන් බවට පත්වූහ.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සියවැනි උපන් දිනය සැමරීම සඳහා (1914-2014) ඔහු විසින් රචිත පොත් ප්‍රදර්ශනයක් පුස්තකාලය විසින් සංවිධානය කරන ලදි.

දෙවන වසර දන්ත වෛද්‍ය සිසුන් සඳහා විෂය විශේෂිත ඉගෙනුම සඳහා පරිපූරක විද්‍යුත් ඉගෙනුම් පාඨමාලාව යටතේ මූලික සාක්ෂර කුසලතා පිළිබඳ පාඨමාලාවක් දන්ත වෛද්‍ය පුස්තකාලය විසින් සංවිධානය කොට 2013 ජූනි 18-25 යන දිනවල පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. එස්. ප්‍රේමරත්න මයා, එච්. දිසානායක මිය, එස්. පෙරේරා මිය හා සී.එන්.කේ. අලහකෝන් යන මහත්ම මහත්මීන් එහි සම්පත්දායකයෝ වූහ.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත අගනා නාට්‍ය කෘති එකතුවක් ලලිතා සරච්චන්ද්‍රයන් මහත්මිය විසින් ප්‍රධාන පුස්තකාලයට පරිත්‍යාග කරන ලද අතර, මෙම කෘති එකතුව ජනතාවගේ පරිහරණය සඳහා 2014 වසරේදී විවෘත කරනු ඇත.

## බාධක සහ පිළියම්

ප්‍රධාන පුස්තකාලයේ පවිත්‍රතාවය පවත්වා ගැනීමේදී කම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම විශාල ගැටළුවකි. උපකරණ හා සේවාවන් ලැබීමේ ප්‍රමාදය ප්‍රධාන පුස්තකාලය හරහා කාර්යක්ෂමව හා කාලීන සේවාවක් ලබාදීමේදී මුහුණ පාන තවත් ගැටළුවකි.

## අනාගත සැලසුම්

ප්‍රධාන පුස්තකාලයේ සංකේත අංකනය අවසන් කිරීමටත්, ඩිජිටල් පුස්තකාලය සංවර්ධනය කර ස්වයංක්‍රීයකරණය ආරම්භ කිරීමටත්, සේවක පුරප්පාඩු පිරවීමටත්, ඉලක්ක කොට ඇත. පුස්තකාල ජාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් සිදුකරන පර්යේෂණ හා ප්‍රකාශන දියුණු කිරීමට ද, සැලසුම් සකස් කෙරේ.

## C2 තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්‍ෂ මහාචාර්ය කේ.එම්. ලියනගේ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය 2004 වසරේදී ස්ථාපිත කරන ලදි. මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණක් වනුයේ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්‍ෂක සිසුන්ගේ හා විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් වෙනත් සාමාජිකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කුසලතා දියුණු කර ගැනීම සඳහා ඉඩකඩ සලසා දීමය. මෙම කාර්යය මධ්‍යස්ථානය විසින් සැලසුම් කොට පැවැත්වීමට නියමිත අතර අර්ධ කාලීන හා විධිමත් පුහුණු වැඩසටහන් රාශියක් තුළින් ඉටු කර ගැනීමට අපේක්‍ෂා කෙරේ.

පරිගණක භාවිතා කිරීමේ ස්ථාන 320කට පමණ ඉඩ සැලසිය හැකිවනසේ මධ්‍යස්ථානය සැලසුම් කොට ඇත. Mbps 1000 ක් අතර එම පරිගණක සියල්ලම VLAN කිහිපයකට සම්බන්ධ කර ඇත. එක් පරිගණකයකට දත්ත සැපයීමේ වේගය Mbps 1000 කි. වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානය සතුව ෆයිල් සර්වරයක්, වෙබ් සර්වරයක්, මේල් සර්වරයක්, ප්‍රොක්සි සර්වරයක්, දත්ත ගබඩා කිරීමේ සර්වරයක්, කන්ටෙන්ට් මැනෙජ්මන්ට් සර්වරයක් හා පරිගණක භාවිතා කරන ස්ථාන 300කට වැඩි ප්‍රමාණයක්ද ඇත. ලංකා අධ්‍යයන හා පර්යේෂණ ජාලය හරහා ලැබුණු Mbps ඒකක ධාරිතාවයකින් යුතු අන්තර්ජාල සම්බන්ධතාවය Mbps 20 කි. එම සම්බන්ධතාවය සඳහා ADLS මාර්ග 3 ක්ද ඇත.

### ජයග්‍රහණ

- ප්‍රථම උපාධි අපේක්‍ෂකයන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ වැඩසටහන් හා සාමාන්‍ය ජනතාවට, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා කෙටි පාඨමාලා අඛණ්ඩව පවත්වන ලදි.
- Campus Network Basics and Troubleshooting පිළිබඳ LEARN සහිත පුහුණු වැඩසටහන
- සම සෞඛ්‍ය, කලා, වෛද්‍ය හා පශු වෛද්‍ය යන පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ප්‍රථම උපාධි අධ්‍යාපනයේ විද්‍යුත්-ඉගෙනුම් යොදා ගැනීම පිළිබඳ එක්දින වැඩමුළු හතරක්ම (04) පවත්වන ලදි.
- HETC ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදි.
- HETC ව්‍යාපෘතිය යටතේ UTEL හා UCTIT online විභාග සඳහා පරිගණක පහසුකම් සපයන ලදි.
- සිසුන් විසින් පරිහරණය කරනු ලබන අන්තර්ජාල සම්බන්ධතාවයේ වේගය 2Mbps සිට 20Mbps දක්වා වැඩි කරන ලදි.
- මෙම මධ්‍යස්ථානය විසින් උපයන ලද මුදල් යොදා ගනිමින් නව පරිගණක යන්ත්‍ර 50 මිලදී ගන්නා ලදි.
- තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ල උපයන ලද මුදල් යොදා ගනිමින් ප්‍රතිසංස්කරණ කරන ලදි.

HETC ව්‍යාපෘතියේ අනුග්‍රහය ඇතිව අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුව ලබාදීම පිණිස විශ්වවිද්‍යාල පද්ධතියේ පරිහරණය සඳහා පුහුණු අත්පොතක් සංවර්ධනය කරන ලදි.

## අනාගත සැලසුම්

තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා ගෙන වෘත්තීය සුදුසුකම් අත්කර ගැනීමට ජනතාව වැඩිවැඩියෙන් උනන්දු වන බව දැකිය හැකි නිසා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ කිහිපයක් සමඟ එක්ව උපාධි මට්ටමේ වැඩසටහන් සංවර්ධනය කොට හඳුන්වාදීමේ හැකියාව සොයා බැලීමට මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව තීරණය කරන ලදි.

පරිගණක අධ්‍යයනය සඳහා උනන්දු වන ශිෂ්‍ය සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් පවතින හෙයින් සිසුන්ට පරිගණක සේවාවන් ලබාදීම සඳහා අවශ්‍ය කරන වෙනස්කම් අධ්‍යයනය කිරීමට ද මධ්‍යස්ථානය අදහස් කරයි.

### වැඩසටහන් සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළු පිළිබඳ විස්තර - 2013

2013 වසරේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පාඨමාලා ප්‍රථම උපාධි වැඩසටහන්.

| පීඨය | පාඨමාලා සංකේතය හා නම | ශිෂ්‍ය සංඛ්‍යාව | සිට | දක්වා | කාල පරිච්ඡේදය/පැය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | දේශන | විද්‍යාගාර | එකතුව |
| කෘෂි විද්‍යා | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ATM 2 | 211 | 2013/07/29 | 2013/08/30 | 16 | 32 | 48 |
| සම සෞඛ්‍ය | තොරතුරු තාක්ෂණය AH 1102 | 194 | 2013/04/29 | 2013/08/13 | 20 | 30 | 50 |
| කලා | FND115 තොරතුරු හා සන්නිවේදනය | 1148 | 2013/09/10 | 2014/01/03 | 20 | 50 | 70 |
| පශු වෛද්‍ය | පරිගණක සාක්ෂරතාවය VMEU 312 | 73 | 2014/12/13 | 2013/06/25 | 15 | 30 | 45 |
| කලා | කලා, වානිජ හා කළමනාකරණ විෂයධාරාවන් හදාරන ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධනය | 242 | 2013/02/13 | 2013/04/08 | 24 | 56 | 80 |

## C3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය

(අංශ ප්‍රධානි, ඒ.එන්.එම්. සල්ගාදු මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන සහයක ඒකකයක් වන අතර එහි මූලික අරමුණ වනුයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට අධ්‍යයන, වෘත්තීය හා සාමාන්‍ය කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමයි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය පීඨ අටටම විවිධ මට්ටමේ පාඨමාලා පවත්වන අතර වර්තමානය වනවිට එහි විවිධ මට්ටමේ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 4500කි. අදාළ පීඨවල අවශ්‍යතාවයන්ට අනුව ප්‍රථම, දෙවන සහ තෙවන වසරවලදී ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි. දෙවන භෂාවක් ලෙස ඉංග්‍රීසි (ESL) විශේෂ අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි (ESP) හා අධ්‍යයන කටයුතු සඳහා ඉංග්‍රීසි (EAP) ලෙස ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි.

ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට ඉංග්‍රීසි දැනුම ලබාදෙමින් ඔවුන් බලගන්වන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වේ. සිසුන් අදාළ ක්ෂේත්‍රයන්හි හා අනාගත වෘත්තීන්හි ඵලදායි ආකාරයෙන් නියැලීම සඳහා සිසුන්ගේ ඉංග්‍රීසි කුසලතා දියුණු කිරීම අපගේ අභිලාෂයයි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය උප ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයක් ලෙස සළකනු ලැබූ අතර මුල් කාලීනව එය ප්‍රධාන ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ කොටසක් ලෙස ක්‍රියාත්මක විය. මෙම අංශය ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලද්දේ 1987 වසරේදීය.

පාසල් මට්ටමේදී තම මව් භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ නවක සිසුන් තෘතීය මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යාපනයට යොමු කරවීම පිණිස ඉංග්‍රීසි භාෂා පංති පැවැත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ ප්‍රධාන වගකීම වේ. මෙම ඒකකය මගින් දෙවිදිහක පාඨමාලාවන් පවත්වනු ලැබේ. සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයන් නිසිලෙස හැදෑරීම පිණිස මූලික ඉංග්‍රීසි භාෂා කුසලතාවයන් ලබාදෙන කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව හදාරනු ලබයි. එම පාඨමාලාව අවසන් වූ පසු දෙවනුව මෙම මධ්‍යස්ථානය මාර්ගගත ඉංග්‍රීසි පාඨමාලාව පවත්වයි. මේ වනවිට සමාසික ක්‍රමය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමත් සමඟම "කඩිනම්" යන වචනය භාවිත නොකෙරේ. එසේ වුවත් සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ දින සිට ඉංග්‍රීසි පාඨමාලාවන් ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. ඉංග්‍රීසි වැඩසටහනේ මුල් කොටස ආසන්න වශයෙන් සති 10ක් වුවත් අදාළ පීඨවල අවශ්‍යතා සහ විශේෂතාවලට අනුව එය වෙනස් විය හැකිය. මාර්ගගත පාඨමාලාවල කාල සීමාව වර්ෂ 1-3 දක්වා විවිධ වේ.

ඉංග්‍රීසි පංතිවලට සහභාගිවීම අනිවාර්ය වන අතර මුල් සමාසික (2) දෙක තුළ පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට ශිෂ්‍යයෙකුගේ 80%ක පැමිණීම අවශ්‍ය වේ. ඉංග්‍රීසි පංතිවලට නිතර සහභාගි වීම තුළින් මනා දැනුමක් ලබාගත හැකිවන හෙයින් සිසුන්ට තමන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා දියුණු කර ගැනීම සඳහා පංතිවලට සහභාගිවන ලෙසට දිරිමත් කිරීම් ද කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලට සහභාගි වීම සඳහා සෑම සිසුවෙකුම ඉංග්‍රීසි භාෂාවට “A” සාමාර්ථයක් ලබාගැනීම අනිවාර්ය වේ. වර්තමානයේදී ලෝක බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන HETC ප්‍රදාන කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා ඉංග්‍රීසි වැඩමුළු සංවිධානය කිරීමට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා උපයෝගි කරගනු ලැබේ.

### ජයග්‍රහණ

HETC වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## බාධක සහ පිළියම්

ආචාර්යවරුන්/උපදේශකයන් සමූහ වශයෙන් වෙනත් විශ්වවිද්‍යාලවලින් පරිවාස කථිකාචාර්ය තනතුර ලබාදෙන බැවින් නික්ම යෑම අප මුහුණපා ඇති ගැටළුවකි.

## අනාගත සැලසුම්

HETC වැඩසටහන සියලුම පීඨවල පූර්ණ වශයෙන් දියත් කිරීම.

## C4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

(අධ්‍යක්ෂ, ආචාර්ය ටී.එම්.කේ. පෙරේරා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

2005 වසරේදී WUS සංකීර්ණයේ ස්ථාපිත කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විශ්වවිද්‍යාල ප්‍රජාවට විවිධ අංශවලින් ඵලදායි සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීම අඛණ්ඩව සිදුකරන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය ඉගැන්වීමේ අවිවාදාත්මක නායකයා බවට මෙම ඒකකය මේ වනවිට පත්ව ඇත. මෙම ඒකකයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ නොපසුබස්නා උත්සාහයන් හා විශ්වවිද්‍යාල පරිපාලනයෙන් ලද සහයෝගය නිසා මෙම තත්ත්වයට පත්වීමට හැකිවිය.

වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විසින් බාරගත් ක්‍රියාකාරකම් සමුදාය අතරට, නවක සිසුන්හට දිසානුයෝජනා වැඩ සටහන පැවැත්වීම, සිසුන්ට වෘත්තීය හා සම්බන්ධ උපදෙස් හා සේවාවන් ලබා දීම, HETC ව්‍යාපෘතිය යටතේ සිසුන්ට මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, කම්පනයට පත්වූ සිසුන්ට මනෝවිද්‍යාත්මක උපදේශනය ලබාදීම, මධ්‍යම පළාතේ පාසැල් සිසුන් සඳහා CSR ක්‍රියාකාරකම් පැවැත්වීම, අවසන් වසර සිසුන්ගේ මෘදු කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ සම්බන්ධවීම යනාදි කාර්යයන් ඇතුළත්වේ.

සියලුම වැඩසටහන් පැවති ඉල්ලුමට සරිලන පරිදි පවත්වන ලද අතර, සමස්තයක් ලෙස විශ්වවිද්‍යාලයේ උපක්‍රමික සැලැස්මෙන් අපේක්ෂිත ඵලඹුම්වලට අනුකූලව හා විශේෂයෙන්ම මෙම ඒකකයේ උපක්‍රමික සැලැස්මට අනුව මෙම සියලු වැඩසටහන් පවත්වන ලදි. ශාස්ත්‍ර පීඨයේ සිසුන් වෙනුවෙන් තොරතුරු තාක්ෂණ කුසලතා හා මෘදු කුසලතා ඉගැන්වීම සඳහා සංවර්ධනය කළ තෙදින දෙමුහුන් වැඩ සටහනට ඉතා ඉහළ ඉල්ලුමක් පැවතිණ. තෙවන සහ සිව්වන වසරවල සිසුන්හට ඔවුන්ගේ අනාගත රැකියාවන් සොයා ගැනීමේදී හා ඔවුන් විසින් තෝරාගත් රැකියාවන්ගේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ජීවදත්ත සටහන් ලිවීම, ඵලදායි රැකියාවන් සෙවීමේ උපක්‍රම හා සම්මුඛ සාකච්ඡා සඳහා අවශ්‍ය කුසලතාවන් පිළිබඳ පුහුණුව ලබා දෙන ලදි.

සිසුන්ට මෙන්ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පැවති ඉල්ලුමට අනුව සතියකට උපදේශන සැසි 10-12 පමණ ප්‍රමාණයක් පවත්වන ලදි. වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය සෞඛ්‍ය මධ්‍යස්ථානය සමඟ සමීප සබඳතාවයකින් යුතුව කටයුතු කළ අතර, අවශ්‍ය පුද්ගලයන් හා වෛද්‍යවරුන් හා වෙනත් වෘත්තිකයන් වෙත යොමු කරන ලදි. සිසුන්ට ඒ ඒ අවස්ථාවන්ට අනුකූලව හැඩගැසීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීමට හා ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට හැකි වන පරිදි ශක්තිය ලබා දෙන ලදි. මෙම ඒකකය මානසික ආතතියට ලක්වූ සිසුන්ට අතිසාර්ථක ලෙස උපකාරක කරන ලද අතර, එසේ ඔවුන්ට පිහිට නොවන්නට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අතහැර දමන්නට ඉඩකඩ තිබුණි. කාලීන මැදිහත්වීම හා නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම මෙම සාර්ථකත්වයට හේතු පාදක විය. එමෙන්ම මෙම ඒකකය සියදිවි නසා ගැනීමට තැත් කල සිසුන් කිහිප දෙනෙකුටම මානසික පීඩනය නිසා මතුවන අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීම පිණිස සහයෝගය ලබා දෙන ලදි.

### ජයග්‍රහණ

- වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකයේ අධ්‍යක්ෂ විසින් පුහුණුවන්නන් පුහුණු කිරීම සඳහා පිළිවෙලින් උපදේශනය හා මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ අත්පොත් දෙකක් රචනා කරන ලදි. (HETC ව්‍යාපෘති විසින් සිදුකළ ව්‍යාපෘතියකි)
- ශාස්ත්‍ර පීඨයේ ආචාර්යවරුන්ට හා සිසුන් සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩ සටහන පැවැත්වීම
- ත්‍රිවිධ හමුදා නිලධාරින් සඳහා පුහුණුවන්නන් පුහුණු කිරීමේ මාසික විශේෂ උපදේශන පුහුණු වැඩ සටහනක් රන්ටැඹේ ශිෂ්‍යභට මූලස්ථානයේදී පවත්වන ලදි.

- HETC ව්‍යාපෘතියේ අනුග්‍රහය සහිතව මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩසටහන් හතරක් කලා, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය හා විද්‍යා යන පීඨ සඳහා පවත්වන ලද අතර, මෙම එක් වැඩ සටහනකට 160-180 අතර පිරිසක් සහභාගි වූහ.
- කෘෂිවිද්‍යා පීඨය සිසුන් වෙනුවෙන් වෘත්තීය දේශන තුනක් පවත්වන ලදි. ( එක් සැසියකට 220 දෙනෙකු බැගින්)
- දන්ත වෛද්‍ය පීඨය සඳහා වෘත්තීය වැඩමුළු දෙකක් පවත්වන ලදි. (සිසුන් 96 දෙනෙකු)
- කලා පීඨ හා විද්‍යා පීඨ සිසුන් සඳහා ජීවදත්ත සටහන් ලිවීමේ සායන දෙකක් පවත්වන ලදි. (පිළිවෙලින් සිසුන් 180 හා 120 ක්)
- වානිජ සිසුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදි (එක් සැසියකට 20 දෙනෙකු බැගින් සැසි 10ක්)
- "උපක්‍රමික සැලසුම් හා උපදේශනය" පිළිබඳව ආචාර්යවරුන් සඳහා HETC ව්‍යාපෘතිය විසින් අනුග්‍රහය දක්වන ලද වැඩමුළු පහක් මෙම ඒකකයේ අධ්‍යක්‍ෂ විසින් පවත්වන ලදි. (විවිධ විශ්වවිද්‍යාලවලින් 60-80 අතර පිරිසක් එක් සැසියකට සහභාගි වූහ.)
- වෘත්තීය හා සම්බන්ධ විෂයන් පිළිබඳව යාපනය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු හයක් පවත්වන ලදි. (HETC ව්‍යාපෘතිය)
- සියලුම විශ්වවිද්‍යාලවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුග්‍රහය යටතේ ජාතික මට්ටමේ "උපදේශන වැඩමුළු තුනක්" පවත්වන ලදි.
- "විෂය නිර්දේශයට මෘදු කුසලතා සංවර්ධනය ඇතළත් කිරීම" පිළිබඳ යාපනය, ඌව වෙල්ලස්ස හා සබරගමුව යන විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන් සඳහා වැඩමුළු තුනක් පවත්වන ලදි.
- "මෘදු කුසලතා සංවර්ධනය" පිළිබඳ විවෘත විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් සඳහා වැඩමුළු දෙකක් පවත්වන ලදි. (එක් සැසියකට 30-40)
- "හැඩගැසීම" හා "ආතතිය කළමනාකරණය" පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු දෙකක් පවත්වන ලදි.
- මහනුවර කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුග්‍රහය යටතේ පාසල් ගුරුවරුන් වෙනුවෙන් "ශිෂ්‍ය අවශ්‍යතා අවබෝධ කර ගැනීම හා ඵලදායි උපදේශනය" පිළිබඳ වැඩමුළු තුනක් පවත්වන ලදි. (සැසියකට 80 දෙනෙකු)
- මෙම ඒකකයේ අධ්‍යක්‍ෂතුමා, ගරු අමාත්‍යතුමාගේ නායකත්ව පුහුණු වැඩ සටහනේ සම්පත් දායක පුද්ගලයා ලෙස සේවය ලබා දුන් අතර, අරෝෂා පෙරේරා මහත්මිය මහනුවර දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන දෙකක සිසුන් සඳහා පැවැත්වූ වැඩමුළුවල සම්පත්දායිකාව ලෙස සේවය ලබා දුන්නාය.

**වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය**

වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය හා සම්බන්ධ විවිධ මාදිලියේ ක්‍රියාකාරකම් හැසිරවීමේ හැකියාව මෙම ඒකකය සතුවේ. කෙසේ වෙතත් මෙම ඒකකයේ වහළින් වැසි ජලය කාන්දුවීම නිසා වැසි දිනවල වැඩමුළු පැවැත්වීමේදී ගැටළු මතුවී ඇති අතර, වහළ සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණ කළ යුතුව ඇත. මෙම නඩත්තු කටයුත්ත හැකි විගස ඉටු කර දෙනු ඇතැයි අපේක්‍ෂා කරමි.

## අනාගත සැලසුම්

වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය කර්මාන්ත ක්‍ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් සමඟ පවතින සහයෝගිතාවන් තවදුරටත් ඉහළ නංවාගනු ඇත. කර්මාන්ත ක්‍ෂේත්‍රය සමඟ පවත්වන සබඳතාවයන් එම ක්‍ෂේත්‍රයේ පවතින අවස්ථාවන් සොයා ගැනීමට සිසුන්ට මාර්ගය පෙන්වීම සඳහා යොදා ගනු ලබයි. එතුළින් නවක උපාධිධාරීන්හට කර්මාන්ත ක්‍ෂේත්‍රයේ ආකල්ප, කුසලතා හා අමතර සුදුසුකම් ආදියට අනුව පවතින ඉල්ලුම පිළිබඳව මනා දැනුවත්බවක් ලබාගත හැකිවනු ඇත. කළමනාකරණ පුහුණුවන්නන් ලෙස රැකියාවන් විවෘත කර ගැනීම සඳහා හැදෑරිය යුතු බාහිර පාඨමාලාවන් පිළිබඳව අවසන් වසර සිසුන්හට උපදෙස් ද ලබා දෙනු ඇත.

දීර්ඝ කාලයක සිට තම අපේක්‍ෂාවන් මුදුන් පත් කර ගැනීමේ මංමාවත් සම්බන්ධයෙන් සාකච්ඡා කර ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයන්ට සහයෝගය දැක්වීම සඳහා වෘත්තීය උපදේශනය තවදුරටත් ශක්තිමත් කරනු ඇත. කර්මාන්ත ක්‍ෂේත්‍රය විසින් ඇගයීමට ලක්කරන ගති ලක්‍ෂණ හා ආකල්ප පිළිබඳ දැනුවත් බව ඇති කිරීම වෙනුවෙන් වැඩමුළු පැවැත්වෙනු ඇත.

# උපග්‍රන්ථය D – උපස්ථම්භක සේවාවන්

## D1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

(අධ්‍යක්‍ෂ, ආචාර්ය සී, බෙනරගම විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 1999 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලදි. ස්වාධීන පීඨවල එක චත්‍ර සංවිධානයක් වන අතරම, මෙම මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම බාරගෙන ක්‍රියා කරයි. වර්තමානය වනවිට රටේ අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සංවර්ධනය කිරීමේ සේවාවන් ලබාදීමට ද, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට හැකිවී ඇත.

### කාර්ය මණ්ඩල තත්ත්වය

අර්ධ කාලීන අධ්‍යක්‍ෂවරයෙකු (අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික) හා ස්ථිර ලඝුලේඛිකාවක් හා කම්කරුවෙකු මෙහි කාර්ය මණ්ඩලයේ ඇත. කළමනාකරණ කමිටුවක් විසින් මෙම මධ්‍යස්ථානය කළමනාකරණය කරන අතර වැඩසටහන් කමිටුවක් විසින් මෙහි වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

### ජයග්‍රහණ

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2013 වසරේදී පහත සඳහන් වැඩමුළු හා පුහුණු වැඩසටහනක් පවත්වා ඇත.

**2013 වසරේ පවත්වන ලද වැඩමුළු**

1. **"සේවා ස්ථානයක සාර්ථකත්වයේ" රහස් පිළිබඳ වැඩමුළු**

   විශ්වවිද්‍යාලයේ කම්කරු කාණ්ඩයේ සිටින සියලුම සේවකයන් සඳහා ඉහත සේවාව යටතේ එක් දින වැඩමුළුව සංවිධානය කරන ලදි. මෙම කාණ්ඩය යටතේ කම්කරුවන් 500 ක් පමණ සිටින අතර, ඒ සියලුම දෙනාට කණ්ඩායම් වශයෙන් මෙම වැඩමුළුව පවත්වන්නට විය. මෙම වැඩමුළු මාලාව 2012 වසර අවසානයේදී ආරම්භ කොට ඉතිරි වැඩමුළු 2013 වසරේ ජනවාරි 3,4,8,10,11 යන දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 5.00 දක්වා ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. ඉහත වැඩමුළු දහයේ සම්පත්දායකයන් ලෙස ආචාර්ය චාලින්ද බෙනරගම (අධ්‍යක්‍ෂ/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය) හා ආචාර්ය බී.එම්.කේ. පෙරේරා (අධ්‍යක්‍ෂ/වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය) කටයුතු කළහ.

2. **"ඵලදායී සන්නිවේදනය හා ඉදිරිපත් කිරීමේ කුසලතා"**

   ඉහත තේමාව යටතේ වැඩමුළුවක් 2013 අප්‍රේල් 18 - 19 යන දෙදින තුළ පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. පරිපාලන කාර්ය මණ්ඩලයේ කණ්ඩායම් දෙකක් සඳහා එම වැඩමුළුව පවත්වන ලද අතර එම වැඩමුළු දෙක සඳහා සාමාජිකයෝ 23 දෙනෙකු සහභාගි වූහ. එම වැඩමුළුවල සම්පත්දායකයන් ලෙස මාලින්ද බෙනරගම (අධ්‍යක්‍ෂ/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය) හා ආචාර්ය ජයලත් ඒදිරිසිංහ (අධ්‍යක්‍ෂ/දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය) සේවය කළහ.

3. **"විශ්වවිද්‍යාලයේ පරිපාලනය හා මුදල් රෙගුලාසි" පිළිබඳ වැඩමුළුව**

   ඉහත තේමාව යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් 2013 ජූලි 29 වැනි දින පෙරවරු 9.00 සිට පස්වරු 1.00 දක්වා

වෛද්‍ය පීඨයේදී පවත්වන ලදි. අංශ ප්‍රධානීන් හා වෙනත් මේ පිළිබඳව උනන්දුවක් දක්වන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ තිස් දෙනෙකු (30) මෙම වැඩමුළුව සඳහා සහභාගි වූහ. මහාචාර්ය අනුර වික්‍රමසිංහ (පීඨාධිපති/විද්‍යා පීඨය) හා ඩී.ඩී. උපනන්ද (නියෝජ්‍ය මූල්‍යාධිකාරි) මෙහි සම්පත් දායකයන් ලෙස කටයුතු කළහ.

## 4. "මාගේ රාජකාරිය සහ මම" අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් පැවැත්වූ ප්‍රේරණ වැඩ සටහන

අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අළුතෙන් බඳවාගත් ලිපිකාර හා සම ශ්‍රේණිවල සාමාජිකයන් සඳහා ඉහත වැඩසටහන පවත්වන ලදි. එම වැඩසටහන 2013 ජූලි 3 හා 5 යන දිනවල පෙ.ව.9.30 සිට ප.ව. 4.00 දක්වා ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන්නට විය. අළුතෙන් බඳවාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 28 දෙනෙකු මේ සඳහා සහභාගි වූහ. ආචාර්ය චාලින්ද බෙනරගම (අධ්‍යක්ෂ/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය) ආචාර්ය බී.එම්.කේ. පෙරේරා (වෘත්තීය මාර්ග උපදේශන ඒකකය) මහාචාර්ය එස්.බී.එස්. අබයකෝන් (හිටපු උපකුලපති) කෝසම්බිකා සමරසේකර මිය (ජ්‍යෙෂ්ඨ පුද්ගලික ලේකම්/උපකුලපති) හා සී.එම්.එන්. රණවන (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි) එම වැඩමුළුවේ සම්පත්දායක/දායිකාවන් ලෙස කටයුතු කළහ.

## 5. "මහජන වගවීම හා දෙපාර්තමේන්තු භාණ්ඩ ලේඛන කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව

මෙම වැඩමුළුව 2013 දෙසැම්බර් 4-5 දිනවල සනාතන මන්දිර ශාලාවේදී පවත්වන්නට යෙදුණි. මෙම වැඩමුළුව සඳහා පීඨාධිපතින්, දෙපාර්තමේන්තු, සේවා ඒකක, පුස්තකාල, නේවාසිකාගාරවල ප්‍රධානීන් හා දෙපාර්තමේන්තුවල භාණ්ඩ ලේඛන හසුරුවන්නන් මෙම වැඩමුළුවට ආරාධනා ලබා සිටියහ. වැඩමුළු දෙකම සඳහා සහභාගි වූ මුළු සංඛ්‍යාව 231 දෙනෙකි. එස්.සී. මායාදුන්නේ මහතා (හිටපු විගණකාධිපති) හා එන්.පී.කේ.කේ. සෙනවිරත්න (විශ්‍රාමලත් ප්‍රධාන ගණකාධිකාරි) මෙම වැඩමුළුවල සම්පත්දායකයෝ වූහ.

## 6. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ වැඩමුළුව

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හා මුදල් පරිපාලන අංශයේ සහයෝගය සහිතව ඉහත තේමාව යටතේ මෙම වැඩමුළුව 2013 දෙසැම්බර් මස 18 වැනි දින පෙරවරු 9.00 සිට මධ්‍යහ්න 12.30 දක්වා සනාතන මන්දිර ශාලාවේදී පවත්වන ලදි. එම්.ඩී. ගංතුනේ (මූල්‍යාධිකාරි/පේරාදෙණිය විශ්වවිද්‍යාලය) හා ඩී.ඩී. උපනන්ද මහතා (නියෝජ්‍ය මූල්‍යාධිකාරි) මෙහි සම්පත්දායකයන් ලෙස කටයුතු කළහ. පීඨාධිපතින්, අංශ ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරින්, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරින්, සහකාර ලේඛකාධිකාරීන්/ සහකාර මූල්‍යාධිකාරීන් හා අනධ්‍යයන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් ඇතුළු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ අනූ හත් දෙනෙකු (97) මීට සහභාගි වූහ.

## 7. අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සමඟ එක්ව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (ලිපිකාර හා සම ශ්‍රේණි) සඳහා මූලික පරිගණක කුසලතා හා යෙදුම පිළිබඳ පැය 64 ක පුහුණු වැඩසටහනක් ආරම්භ කර ඇත. මෙහි පළමු වැඩසටහන 2013 නොවැම්බර් 23 සිට 2014 ජනවාරි 11 වෙනි දින දක්වා සෙනසුරාදා දිනවල පවත්වනු ඇත.

**පුහුණු වැඩ සටහන්**

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 6 වැනි හා 7 වැනි ප්‍රේරණ වැඩසටහන (එකිනෙකට වෙන්වූ වැඩසටහන්)

2013 වසරේදී මෙම මධ්‍යස්ථානය පහත සඳහන් දිනවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රේරණ වැඩසටහන් දෙකක් පවත්වන ලදි.

| කොටස | පළමු වැඩසටහන | දෙවන වැඩසටහන |
|---|---|---|
| **1 කොටස** | පෙබරවාරි 12-15 හා 18-22 දක්වා | අගෝස්තු 13-16 හා 19-23 දක්වා |
| **2 කොටස** | මාර්තු 11-15 හා 18-22 දක්වා | සැප්තැම්බර් 09-13 හා 16-20 දක්වා |
| **3 කොටස** | අප්‍රේල් 18 හා 19 දින ල 22-26 දක්වා හා 29 දින | ඔක්තෝබර් 14-15 හා 21-25 දක්වා |

මෙහි පළමු වැඩසටහන සඳහා පේරාදෙණිය, රජරට හා බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාවලින් 25 දෙනෙකු සහභාගි වූ අතර, දෙවන වැඩසටහන සඳහා පේරාදෙණිය, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය හා ඊසාන දිග විශ්වවිද්‍යාලවලින් 24 දෙනෙකු සහභාගි වූහ.

**බාධක සහ පිළියම්**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 937 යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2013 වසරේ ක්‍රියාකාරකම් සඳහා යෝජනාවක් බාරදී ඇත. එම යෝජනාවට අනුව ඉහත වැඩසටහන් පිරිනැමීමට මෙම මධ්‍යස්ථානයට හැකිවූ අතර ඉතිරි යෝජිත වැඩසටහන් ඉදිරි වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කෙරෙනු ඇත.

2014 වර්ෂය අවසාන වනවිට විශ්වවිද්‍යාලයේ සෑම සාමාජිකයෙකුටම අවම තරමින් එක් පුහුණු වැඩ සටහනක් හෝ ලබාදීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය අපේක්ෂා කරයි.

1. විශ්වවිද්‍යාලයේ ඉහළ කළමනාකරණයේ කාර්යයන්වල කාර්යක්ෂමතාවය දියුණු කිරීම සඳහා පුහුණු වැඩ සටහන
2. සේවා ස්ථානයේ අන්තර්-පුද්ගල සබඳතාවය සංවර්ධනය කිරීම පිළිබඳ සියලුම පරිපාලන නිලධාරින් වෙත පුහුණුව ලබාදීම
3. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සේවාවන් ඉහළ නැංවීම

**අනාගත සැලසුම්**

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩවලට අයත් සෑම සාමාජිකයෙකුටම එක් පුහුණු වැඩසටහනක් හෝ ලබාදීමට මෙම මධ්‍යස්ථානය අපේක්ෂා කරයි.

මෙම මධ්‍යස්ථානයේ කාර්යාලය සියලුම අංගෝපාංගවලින් පරිපූර්ණ කාර්යාලයක් ලෙස අළුත් ස්ථානයක ස්ථාපිත කිරීමට ද කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය බලාපොරොත්තු වේ.

## D2 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්

(ප්‍රධාන වෛද්‍ය නිලධාරී, වෛද්‍ය පී.එම්.ඒ. සමරක්කොඩි විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානය රජය මඟින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම ප්‍රමාණයේ රෝහල් හෝ රාජ්‍ය පුද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන ආයතන හා සංසන්දනය කිරීමේදී විශිෂ්ටත්වයක් උසුලයි.

**සෞඛ්‍ය මධ්‍යස්ථානය**

විශ්වවිද්‍යාලයේ සිසුන්, සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් සමන්විත පුද්ගලයන් 20,000 කගේ පමණ සුවකාරක සේවාවන් ලබා දෙයි. විශ්වවිද්‍යාල ප්‍රජාව/පාරිසරික සෞඛ්‍ය නඩත්තුව සඳහා අවශ්‍ය කරන ක්‍රියාකාරකම් ඉටු කිරීමට මෙන්ම කසල බැහැර කිරීමේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ද සෞඛ්‍ය මධ්‍යස්ථානය කටයුතු කරයි.

මෙතරම් විශාල වූ ජනකායකගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් පිරිමසාලීම වෙනුවෙන් නිසි ලෙස සංවිධානය කළ වැඩසටහනක් හඳුන්වාදී ඇති අතර එම එක් එක් පුද්ගලයා වෙනුවෙන් වෙනමම වූ ලිපි ගොනුවක් ද සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබයි. බඳවා ගැනීමේ යෝග්‍යතාවය පිළිබිඹු කරන වෛද්‍ය වාර්තාවෙන්ම සේවකයන් සම්බන්ධ ලිපිගොනුව ආරම්භ වන අතර, සිසුන්ගේ ලිපිගොනුව, ආරම්භ වනුයේ මූලික වෛද්‍ය වාර්තාවක් ඇතුළත් කිරීමත් සමඟය. සේවකයන්ගේ ලිපිගොනු ඔවුන් විශ්‍රාම යන කාලය තෙක්ම පවත්වාගෙන යන අතර, සිසුන්ගේ ලිපිගොනු ඔවුන්ගේ විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු අවසන් කරන තෙක්ම පවත්වාගෙන යනු ලබයි.

මෙතරම් විශාල වූ පිරිසක් වෙනුවෙන් රෝගී හෝ නිරෝගි පුද්ගලයන් සඳහා වෙනම වූ සෞඛ්‍ය ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබන එකම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානය බව ඒ පිළිබඳව නිරීක්ෂණය කරන්නෙකුට අවබෝධ කර ගත හැකිය.

සිසුන්ට සහ සේවකයන්ට සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට අමතරව පහත සඳහන් සේවාවන් ද සෞඛ්‍ය මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

1. දැඩි අවධානමට ලක්වූ සිසුන් එන්නත් කිරීම (හෙපටයිටීස් B/ARV/TT)
2. උපදේශනය
3. ක්‍රීඩා යෝග්‍යතාවය සඳහා වෛද්‍ය පරීක්ෂණ
4. විද්‍යාගාර විමර්ශන
5. ප්‍රථමාධාර වැඩසටහන්
6. සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය මණ්ඩල සංවිධානය කිරීම
7. විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය පහසුකම් පිළිබඳව නවක සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
8. සිසුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම

පිළිගත් රෝහලකින් අපේක්ෂා කරනුයේ ඒ වෙත පැමිණෙන රෝගීන්ට වෛද්‍ය සේවාවන් ලබාදීම පමණි. මෙලෙසින් බලන කළ විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය සුවිශේෂී වනුයේ සෞඛ්‍ය සත්කාරක පහසුකම් සැපයීමට අමතරව පහත සඳහන් ප්‍රජා සේවාවන් ද සපයන බැවිනි.

1. විශ්වවිද්‍යාල අපද්‍රව්‍ය කළමනාකරණය
2. පාරිසරික සනීපාරක්ෂාව
3. ඩෙංගු පාලනය
4. දඩාවතේ යන සුනඛයන් වඳ භාවයට පත් කිරීම / එන්නත් කිරීම හා ජලභීතිකාව පාලනය කිරීම
5. නේවාසිකාගාර පරීක්ෂාව හා සනීපාරක්ෂක කටයුතු අධීක්ෂණය කිරීම
6. ආපන ශාලා පරීක්ෂාව හා සනීපාරක්ෂාව පවත්වා ගැනීම
7. විශ්වවිද්‍යාලයේ සියලුම ගොඩනැගිලිවල වේයන් පාලනය කිරීම
8. ආහාර හා ජල සනීපාරක්ෂාව

පැය 24 පුරා ක්‍රියාත්මක කාර්යක්ෂම ගිලන් රථ සේවාවක් ක්‍රියාත්මක වන අතර, විනාඩි පහක කාලයක් තුළ කිලෝමීටර හයක් ඇතුළත රෝගියෙකු සිටින ස්ථානය දැනුම් දුන් පසු ගිලන් රථය එතැනට ලගාවී වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගියා රැගෙන යනු ලබයි. (මෙම ක්‍රියාදාමය සංවර්ධිත රටවල් හා සංසන්දනය කළ හැකිමුත් මෙරට වෙනයම් ස්ථානයක දැකිය නොහැක.)

දිනපතා රෝගීන් 100ක් පමණ මෙම මධ්‍යස්ථානයේ බාහිර රෝගි අංශයට පැමිණෙන අතර, සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් ඔවුන්ගේ සියලු වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරාලනු ලබයි. යම් අවස්ථාවක කිසියම් ඖෂධයක් මෙම මධ්‍යස්ථානයේ නොතිබුණහොත් කෙටි කාලයක් තුළ එම ඖෂධය පිටතින් මිලදී ගෙන අදාළ රෝගියාට ලබා දෙනු ලබයි. මෙම කාර්යය ද රජයේ රෝහල්වල බාහිර රෝගි අංශවලින් ලබා ගත නොහැකි අමතර සේවාවකි.

විශ්වවිද්‍යාල සේවක වෛද්‍ය පරීක්ෂණ වැඩසටහන සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කළ විශේෂ ක්‍රියාකාරකමකි. එම වැඩසටහනට අනුව විශ්වවිද්‍යාලයේ වයස අවුරුදු 40ට වැඩි සියලුම සේවකයන් ආසන්න වශයෙන් 1600 දෙනෙකු පමණ වාර්ෂිකව හෝ වසර දෙකකට වරක් පරීක්ෂාවට ලක්වන අතර, මේ සියලු අවශ්‍ය විමර්ශනයන් ලබා දෙනුයේ ගාස්තු අය කිරීමකින් තොරවය.

විශ්වවිද්‍යාලයේ සෑම සේවකයෙකුම මෙම වැඩ සටහනට ඇතුළත් වන අතර, ඔවුන් විශ්‍රාම යනතුරුම අවශ්‍ය පරිදි වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කෙරේ. විශ්‍රාමික ජීවිතය නිරෝගි පුද්ගලයෙකු ලෙස ගත කිරීමට අවස්ථාව උදාකරලීම මෙහි අරමුණයි. ඉතා අඩු වියදමකින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට ද සුදුසුය. එසේ කරන්නේ නම් විශ්වවිද්‍යාලයේ මෙම වැඩසටහන අධ්‍යයනය කොට නියමු ව්‍යාපෘතියක් ලෙස සලකා කටයුතු කළ හැකිය.

ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වාර්ෂිකව වන මූලික වියදම රුපියල් 5,500/- ක් වන අතර, විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක පුළුල් සෞඛ්‍ය සංරක්ෂණ වැඩ සටහනින් එක් පුද්ගලයෙකු සඳහා වන වියදම රුපියල් 3000/- කි.

මෙම සියලු ක්‍රියාකාරකම් සඳහා වෙන් කොට ඇති කාර්ය මණ්ඩලයට වෛද්‍ය නිලධාරින් 04 ක්, සාත්තු සේවිකාවන් 09 ක් හා සහය සේවක කාර්ය මණ්ඩලය 40 ක් පමණක් ඇතුළත් වේ.

මෙම සියලු ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානය සතු ගොඩනැගිල්ල පැරණි උඩුමහලකින් හා "ප්‍රජා හා පාරිසරික" ඒකකයකින් යුක්ත වන අතර, එහි භූමි ප්‍රමාණය වර්ග අඩි 2,000 කි.

විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින සෞඛ්‍ය සංරක්ෂණ වැඩ සටහන ඵලදායි ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩ සටහනක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමට රුචිකත්වයක් දක්වන පුද්ගලයෙකුට හෝ සෞඛ්‍ය ආර්ථික කාර්යයෙහි නියුතු විශේෂඥයෙකුට එය අධ්‍යයනය කිරීම යෝග්‍ය බව සටහන් කිරීම වැදගත් වේ.

### අනාගත සැලසුම්

1. දැනට ක්‍රියාත්මක මිල අධික කසල බැහැර කිරීමේ පද්ධතිය වෙනුවට විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කළ කොම්පෝස්ට් කෘෂි පොහොර නිපදවන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
2. විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලබන සේවකයන් වෙනුවෙන් වැඩමුළු පැවැත්වීම. මෙතුළින් ඔවුන්ගේ විශ්‍රාමික දිවිය ඵලදායි ආකාරයෙන් ගත කරන්නේ කෙසේද යන්න හා විශ්‍රාම ලබා අවුරුදු දෙකක කාලය තුළ ඔවුන්ගේ සුබ සාධනය නිරීක්ෂණය කිරීම.
3. පිළිගත් තත්ත්වයන්ට අනුව විශ්වවිද්‍යාලයේ ආපනශාලා ප්‍රතිසංවිධානය කිරීම හා ඒවායේ නඩත්තුව සහතික කිරීම.
4. නේවාසිකාගාර තුළ සනීපාරක්ෂක මට්ටම දියුණු කිරීම හා එම කරුණු පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
5. විශ්වවිද්‍යාලයට බාධකයක් නොවී සෞඛ්‍ය මධ්‍යස්ථානයේ යටිතල (ගොඩනැගිල්ල) දියුණු කිරීම.
6. සිසුන් වෙනුවෙන් වෘත්තීය සෞඛ්‍ය අවධානම නිවාරණ වැඩ සටහනක් පිහිටුවීම
7. සේවකයන් වෙනුවෙන් වෘත්තීය සෞඛ්‍ය අවධානම් නිවාරණ වැඩ සටහනක් පිහිටුවීම
8. විශ්වවිද්‍යාලය තළ අයාලේ යන සුනඛ තර්ජනයට පිළියමක් ලෙස "වගකීම් සහිත සුරතල් සතුන්ගේ හිමිකාරිත්වය" යන තේමාව යටතේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

## D3 21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය
(අධ්‍යක්ෂ, මහාචාර්ය රංජිත් දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි)

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මෙහෙයුම් තාක්‍ෂණික ලේකම් කාර්යාලය**

21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය ජාත්‍යන්තර සංවර්ධන සමාගම (ලෝක බැංකුව) විසින් ශ්‍රී ලංකා රජය වෙත 2011 වසරේ සිට 2016 දක්වා වන කාල පරිච්ඡේදය සඳහා ලබා දෙන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක ණයකි. උසස් අධ්‍යාපන ක්‍රමයේ ශක්තිය ඉහළනැංවීම හා මෙරට සාධාරණ, සමාජ හා ආර්ථික සංවර්ධන, අවශ්‍යතාවයන්ට සමගාමීව ගුණාත්මක උසස් අධ්‍යාපන සේවාවන් ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වේ.

විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන (UDG), ගුණාත්මක හා නව නිපැයුම් ප්‍රදාන (QIG) හා මානව සම්පත් සංවර්ධන ප්‍රදාන (HRD) හරහා මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයට සහය දක්වනු ලබයි. පුස්තකාල සම්පත් ඉහළනැංවීම සඳහා වෙනත් විශේෂ ප්‍රදානයක් වෙන් කොට ඇත.

HETC ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සනාතන මන්දිරයේ පිහිටුවා තිබෙන තාක්‍ෂණික මෙහෙයුම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අධ්‍යක්‍ෂ (අර්ධ කාලීන), නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරුන් දෙදෙනෙකු- ප්‍රසම්පාදන හා මුදල් (අර්ධ කාලීන), ව්‍යාපෘති ලේකම් හා කළමනාකරණ සහයකයෙකු ඇතුළත් වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මෙම ව්‍යාපෘතියේ 2013 වසරේ ප්‍රගතිය පහතින් දැක්වේ.

**විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදානය (UDG)**

මෙම ප්‍රදානය ලබාදෙන ලද්දේ සිසුන් හා කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, ඉංග්‍රීසි භාෂා දැනුම, මෘදු කුසලතා හා ජන වර්ග අතර ඒකාග්‍රතාවය ඉහළනැංවීම සඳහායි. 2013 වසරේදී සියලුම පීඨවල ප්‍රථම වසර සිසුන්ට HETC ව්‍යාපෘතියේ කොළඹ කාර්යාලයෙන් ජාතික වශයෙන් පවත්වන ලද UTEL (ඉංග්‍රීසි භාෂා පරීක්‍ෂණය) හා UCITC (පරිගණක පරීක්‍ෂණයට) පෙනී සිටීමේ අවස්ථාව උදාවිය. මෙම පරීක්‍ෂණ දෙකේ සියලුම කොටස් සම්පූර්ණ කිරීමට පීඨ කිහිපයකට පමණක් හැකි වූ අතර, පීඨවල දැඩි සීමාවන් සහිතව පවත්වාගෙන යනු ලබන අධ්‍යයන වැඩසටහන් තුළ මෙම පරීක්‍ෂණ පැවැත්වීම සංවිධානය කිරීම දුෂ්කර කාර්යයක් විය.

**තත්ත්ව හා නව නිපැයුම් ප්‍රදානය (QIG)**

මෙම ප්‍රදානය තරගකාරි පදනමින් ප්‍රදානය කෙරේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් වැඩිම ප්‍රදාන සංඛ්‍යාවක් එනම් QIG ප්‍රදාන නවයක් ලබා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හැකිවිය. පළමු QIG ප්‍රදාන දෙක පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ලබා ගෙන ඒවා මනා ලෙස ක්‍රියාත්මක වන අතර. 2013 දෙසැම්බර් 17 දිනට ඒවායේ මුදල් ප්‍රගතිය 50% ඉක්මවා ගොස් ඇත.

**මානව සම්පත් සංවර්ධනය (HRD)**

නිපුණතාවයෙන් හෙබි ගුරුවරුන් ගුණාත්මක උසස් අධ්‍යාපනයක් ලබාදීමේ ප්‍රධාන කොටස්කරුවන් වන හෙයින් උසස් අධ්‍යාපන අංශයේ ආයෝජනයන් වෙනුවෙන් මතුවන හදිසි අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධන ප්‍රදානය දියුණු කොට ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ අටේ (එනම් කෘෂි-1, කලා-1, සමසෞඛ්‍ය-3, දන්ත-1, වෛද්‍ය-1, විද්‍යා-1, ඉංජිනේරු-2, ඉං.භා.ඉ.ඒකකය-1) අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 16 දෙනෙකු මේතුළින් සහය ලබා ගනිති. එම සාමාජිකයන් 16 දෙනාම මනා ප්‍රගතියක් ලබා ඇති අතර, 2013 දෙසැම්බර් 17 දිනට මුදල් ප්‍රගතිය 56% ඉක්මවා ඇත.

පුස්තකාල ප්‍රදානය සඳහා ලබාදුන් රුපියල් මිලියන 13න්, රුපියල් මිලියන 10.1 (78%) මුදලකට පොත් සපයා ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

## D4 ශාරීරික අධ්‍යාපන අංශය

(වැඩබලන අධ්‍යක්ෂ, පාලිත කුමාර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා බාර අංශය වශයෙන් ශාරීරික අධ්‍යාපන අංශය තරුණ තරුණියන් තුළ ජීවිත කාලීනව ක්‍රීඩාවන්හි හෝ වෙනත් විනෝද කටයුතුවල නිරතවීම තුළින් ස්වයං වර්ධනයක් හා වඩා යහපත්වූ ස්වස්ථතාවක් හා සෞඛ්‍ය තත්ත්වයක් අත්කර ගැනීම වැනි ද්විතික ප්‍රතිඵල අත්කරගත හැකිය යන හැඟීම ඇතිකරලීම එහි ඉලක්කය කොට සලකයි. ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රධානත්වය දරණ ශාරීරික අධ්‍යාපන අංශයේ වැඩසටහන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා උගත් හා මෙම ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තිමය වශයෙන් සුදුසුකම් සහිත උපදේශකයන් පස් දෙනෙකු මෙම අංශයට අනුයුක්ත කොට ඇත. ප්‍රථම උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා හා විනෝද කටයුතු සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ. එමෙන්ම රාජ්‍ය, දේශීය හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන තරඟකාරී ක්‍රීඩා ඉසව්වලට සහභාගිවීමේ අවස්ථාව උදාකරදීම, ක්‍රීඩා ක්‍රියාකාරකම් පැවැත්වීම කලින් කලට වැඩමුළු හා න්‍යායාත්මක පංති පැවැත්වීම ද, මෙම අංශයේ කාර්ය භාරය වේ. මෙම වැඩසටහන් තුළින් සිසුන්ට ඔවුන්ගේ කායික හා මානසික සුවතාව දියුණු කර ගැනීමට අවස්ථාව උදාවන අතරම එතුළින් ඔවුන්ගේ භෞතික හා අධ්‍යයනයෙහි සහ ජීවිතයේ සාර්ථකත්වය ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා අත්කර ගැනීමට ද අවස්ථාව උදාවේ. සියලුම සිසුන්ගේ ශාරීරික සක්‍යතාවය සෞඛ්‍ය හා සම්බන්ධ යෝග්‍යතාවය, ස්වයං වගකීම හා විනෝදය ඉහළ නැංවීම සඳහා එවැනි වැඩසටහන් පැවැත්වීමට මෙම අංශය සැලසුම් කරයි. එතුළින් ඔවුන් ජීවිත කාලීනව ක්‍රියාශීලි පුද්ගලයන් බවට පත් කිරීමට හැකිවනු ඇත.

### ජයග්‍රහණ

#### 11 වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තරඟ - 2013

මොරටුව විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද එකොලොස්වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තරඟාවලියේදී හොකී (කාන්තා) මල්ලව පොර හා බර ඉසිලීමෙන් (පිරිමි) අභියෝගතා කුසලාන තුනක් දිනා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමත්විය. එපමණක් නොව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා තරඟවලදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට කීර්තියක් අත්කර දෙමින් පේරාදෙණිය ප්‍රථම උපාධි අපේක්ෂක ක්‍රීඩක ක්‍රීඩිකාවන් විවිධ ක්‍රීඩා ඉසව්වලින් දෙවන හා තෙවන ස්ථාන දිනාගැනීමට සමත් වූහ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔවුන්ගේ මූලික ක්‍රීඩා උත්සවයේදීත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තරඟවලදීත් විශිෂ්ට දක්ෂතා පෙන්වමින් සමස්ත පිරිමි අංශයෙන් සිව්වන ස්ථානයත් සමස්ත කාන්තා අංශයෙන් දෙවන ස්ථානයත් ලබා ගෙන රාජ්‍ය විශ්වවිද්‍යාල 14 අතුරෙන් දෙවන ස්ථානය දිනා ගැනීමට සමත් වූහ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩකයන් විවිධ ක්‍රීඩා ඉසව් 20 කටත්, ක්‍රීඩිකාවන් ක්‍රීඩා ඉසව් 14 කටත් සහභාගි වූහ.

#### ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ - 2013

27 වැනි ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ 2013 ජූලි 06-17 දින දක්වා රුසියාවේ කෂාන්හිදී පවත්වන ලදි. මෙම කීර්තිමත් ජාත්‍යන්තර ක්‍රීඩා උත්සවයට රටවල් 159 ක් සහභාගි වූහ. මෙහිදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කණ්ඩායම නියෝජය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඒ.එම්.කේ.ජී. බණ්ඩාර ( මීටර් (4×100), හියන්ති පියදිගම (මීටර් 100) එච්.වයි. වීරතුංග, ඒ.එම්.සී.ජී. රාජපක්ෂ (චෙස්) හසිත් වික්‍රමසිංහ, සී.එස්. මුණසිංහ (ටෙනිස්) එස්.බී.එස්.එල්. ගුණතිලක (බර ඉසිලීම) යන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි වූහ.

### පීඨාන්තර නවකයන්ගේ ක්‍රීඩා තරඟාවලිය

ශාරීරික අධ්‍යාපන අංශය විසින් 2011- පීඨාන්තර නවකයන්ගේ ක්‍රීඩා තරඟාවලිය සාර්ථකව පවත්වන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පවතින සියලුම ක්‍රීඩා ඉසව් මෙම දැවැන්ත තරඟාවලියට ඇතුළත් කොට තිබූ අතර, මෙම තරඟ 2013 සැප්තැම්බර් 26 සිට නොවැම්බර් 09 වැනි දින දක්වා පවත්වන ලදි. මෙම ක්‍රීඩා උත්සවයේ අවසන් දින සැමරුමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය අතුල සේනාරත්න මහතා සහභාගි විය.

### අධ්‍යාපන/පුහුණු වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන අංශය විශ්වවිද්‍යාල සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අධ්‍යාපන සහ ශක්ති පුහුණු වැඩසටහන් වර්ෂය පුරා පවත්වන ලදි. මෙම අංශයේ උපදේශකයන් විසින් පවත්වන ලද මෙම වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර, ජනප්‍රිය ද විය. ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පවතින සියලුම ක්‍රීඩා ඉසව් 23 සඳහාම පුහුණු සැසි හා වැඩමුළු ජනවාරි මාසයේ ආරම්භ කොට වර්ෂය පුරාම පවත්වන ලදි. මෙම සැසි ප්‍රධාන වශයෙන්ම පවත්වන ලද්දේ තරඟකාරී මට්ටමේ ක්‍රීඩාවන් සඳහා සිසුන් සූදානම් කිරීම පිණිස වන අතරම අවස්ථාවෙන් අවස්ථාවට විනෝද ජනක ක්‍රීඩා ක්‍රියාකාරකම් ද පවත්වන ලදි.

### ප්‍රධාන තරඟාවලි/ ආරාධිත තරඟාවලි/ විදෙස් සංචාර

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයෝ ක්‍රීඩා අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ගම්පොල පාපන්දු, ලීගය සහ සියලුම අදාළ ක්‍රීඩා පාලන අංශ විසින් දිස්ත්‍රික්, පළාත් හා සමස්ත ලංකා වශයෙන් පවත්වන ලද ක්‍රීඩා තරඟවලට සහභාගි වූහ. එමෙන්ම විශ්වවිද්‍යාලයේ කැරම්, පාපන්දු, රගර්, හොකී, දැල් පන්දු, චෙස්, බේස් බෝල්, පැසිපන්දු, ක්‍රිකට්, මේස පන්දු ආදි කණ්ඩායම් ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල හා වෙනත් ක්‍රීඩා ආයතන මඟින් සංවිධානය කරන ලද ආරාධිත තරඟාවලි කිහිපයකට සහභාගි වූහ. මෙම විශ්වවිද්‍යාලයේ දැල් පන්දු කණ්ඩායම 2013 ජාතික තරුණ ක්‍රීඩා උළෙලේදී තෙවන ස්ථානය හිමිකරගත් අතර, පාපන්දු කණ්ඩායම එම ක්‍රීඩා උළෙලට සහභාගි වී අර්ධ අවසන් වටයේදී පරාජයට පත්විය.

විශ්වවිද්‍යාලයේ ක්‍රීඩිකාවන් සිව් දෙනෙකු ජාතික කාන්තා හොකී ශූරතාවය-2013 ට සහභාගිවී තෙවන ස්ථානය හිමි කර ගන්නට සමත් වූවෝය.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යයේදී ක්‍රීඩාගාරයට දීර්ඝ කාලයක සිට අවශ්‍යතාවයක්ව පැවති නිසි ආලෝක පද්ධතිය මෙම වසරේදී අවසන් කරන ලදි.

### බාධක සහ පිළියම්

Z-ලකුණු හා නායකත්ව පුහුණු වැඩසටහන්වල පැවති ගැටළු හේතුවෙන් විශ්වවිද්‍යාලයට නවක සිසුන් බඳවා ගන්නා ලද්දේ දැඩි ප්‍රමාදයකින් පසුවය. මේ නිසා පීඨාන්තර තරඟ සැලසුම් කළ පරිදි පැවැත්වීමට ශාරීරික අධ්‍යාපන අංශයට නොහැකි විය.

ජාත්‍යන්තර ක්‍රීඩා රෙගුලාසි හා සන්සන්දනය කරන විට මෙහි පවතින ක්‍රීඩා පහසුකම් යල් පැනගිය හෝ දීර්ඝ කාලයකට පෙර ඉදිකර ඇත. එබැවින් මෙම සම්පත් නිසි ආකාරයෙන් පුනරුත්ථාපනය කළ යුතුව ඇත. පහත සඳහන් ක්‍රීඩා පහසුකම් හැකි විගස සංවර්ධනය කළ යුතු බවට හඳුනා ගෙන ඇත.

1. Cynder Track සංවර්ධනය කිරීම
2. හොකී, ජවන හා පීඨ ක්‍රීඩාගාර ඉදිකිරීම
3. පාපන්දු පිටියේ ක්‍රීඩාගාරය ඉදිකොට වැඩිදියුණු කිරීම
4. ක්‍රිකට් ක්‍රීඩාපිටිය සඳහා සංවර්ධන සැලසුමක් සකස් කිරීම
5. පිහිනුම් තටාකය සඳහා සංවර්ධන සැලසුමක් සකස් කිරීම

6. විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාගාරයට (Gymnasium) යෝග්‍ය ජනේල පද්ධතියක් සවි කිරීම
7. විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාගාරයට අළුතින් දිගුවක් ඉදිකිරීම

## අනාගත සැලසුම්

මෙරට දීර්ඝ කාලයක සිට අවශ්‍යතාවක්ව පවතින පිටස්තර පුද්ගලයන් සඳහා ක්‍රීඩා කළමනාකරණය හා පුහුණු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීමට ශාරීරික අධ්‍යාපන අංශය සැලසුම් කරයි. එමෙන්ම පීඨ කිහිපයක උපාධි අපේක්ෂකයන් සඳහා ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය හා සම්බන්ධ වූ non credit විෂයන් පැවැත්වීමට ද අදහස් කර ඇත.

## D5 ශිෂ්‍ය සේවා අංශය

(නියෝජ්‍ය ලේඛකාධිකාරි පී.එච්. ආරියරත්න මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ශිෂ්‍ය සේවා අංශය සිසුන්හට විවිධ මාදිලියේ සේවාවන් ලබාදීම සඳහා මෙම විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල හා සේවා ඒකකවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භයේදී සියලුම උපාධි අපේක්ෂක සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට සැලසුම් කළ ද විශ්වවිද්‍යාලයට එම පහසුකම් ලබාදීමේ හැකියාව පවතින්නේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 55 කට පමණි. ශිෂ්‍ය නේවාසිකාගාර පහළොවක් හා භික්ෂු නේවාසිකාගාර දෙකක් විශ්වවිද්‍යාලය සතුවේ. එම සෑම නේවාසිකාගාරයකටම පූර්ණ කාලීන උපශාලාධිපතිවරයෙක්, අධ්‍යයන අංශයේ ශාලාධිපතිවරයෙක්, හා අර්ධ කාලීන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උප ශාලාධිපතිවරයෙකු පත්කොට ඇත.

ශිෂ්‍ය උපදේශනය, සංස්කෘතික, ආගමික හා ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරකම් වැනි සුබ සාධන, සංස්කෘතික හා ආගමික අංශයන්හි පුළුල් ක්‍රියාකාරකම් රාශියකට විශ්වවිද්‍යාල ප්‍රජාව සහභාගි වේ.

විශ්වවිද්‍යාලය තුළ සිසු විනය පවත්වා ගැනීම සඳහා පියවර රාශියක් විශ්වවිද්‍යාලය විසින් ගෙන ඇත. විශ්වවිද්‍යාලයේ සිසු විනය හා සම්බන්ධ කටයුතු උපකුලපතිතුමා වෙනුවෙන් ඉටු කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු විශ්වවිද්‍යාලයේ විනය පාලක ලෙස එතුමන් විසින් පත් කොට ඇත. එසේම උපකුලපතිතුමා විසින් අදාළ පීඨ සමඟ සාකච්ඡා කොට සෑම පීඨයක් සඳහාම නියෝජ්‍ය විනයපාලකවරයෙකු ද පත් කොට ඇත.

වර්තමානය වනවිට විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි ශිෂ්‍ය සංගම් 67 ක් ඇත. 1985 අංක 07 හා 1988 අංක 26 සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 112 (3)හි සඳහන් කියවෙන 135 වගන්තිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාල පාලක සභාව විසින් සකස් කළ අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා පේරාදෙණිය ශිෂ්‍ය සංගමය හා සියලුම පීඨ සංගම් ස්ථාපිත කරන ලදි.

විශ්වවිද්‍යාලයේ කලා සංගමය විශ්වවිද්‍යාල ප්‍රජාවගේ යහපත වෙනුවෙන් චිත්‍රපට උළෙලක්, වාර්ෂික කලා උළෙල හා නාට්‍ය, චිත්‍ර, ඡායාරූප, කවි, කෙටි කථා ඇතුළත් සිසු තරඟ හා සංස්කෘතික ක්‍රියාකාරකම් රාශියක් සංවිධානය කරයි. වාර්ෂික නාට්‍ය උළෙල කලා සභාවේ එක් වැදගත් ක්‍රියාකාරකමකි.

### ජයග්‍රහණ

1. සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම
2. මාසික මහපොළ හා ශිෂ්‍යාධාර ක්‍රමානුකූලව නිසිකලට ගෙවීම
3. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 1963 වසරේ විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් ශිෂ්‍යත්ව 63ක් පිරිනැමීම

### බාධක සහ පිළියම්

සිසුන්ට ප්‍රමාණවත් නේවාසික පහසුකම් ලබා දීමට නොහැකිවීම

## අනාගත සැලසුම්

1. සිසුන්ට ලබා දෙන නේවාසික පහසුකම්වල තත්ත්වය දියුණු කොට පුළුල් කිරීම
2. සමාජ හා සංස්කෘතික වැඩසටහන් සඳහා පහසුකම් ශක්තිමත් කොට පුළුල් කිරීම
3. සිසුන්හට අදාළ විනය පටිපාටි සංවිධිත කිරීම
4. සිසුන් ජ්‍යොෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්, විනය පාලක හා නියෝජ්‍ය විනය පාලකවරුන් සමඟ සම්බන්ධ කෙරෙන සංවිධාන ජාලය සංවර්ධනය කිරීම

## D6 ආරක්ෂක සේවාවන්

(වැඩබලන ප්‍රධාන ආරක්ෂක නිලධාරි, එන්.කේ. සූරිය බණ්ඩාර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාල භූමි ප්‍රමාණය අඛණ්ඩ වශයෙන් අක්කර 1795ක් දක්වා ව්‍යාප්ත වේ. ප්‍රධාන ආරක්ෂක නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි, ආරක්ෂක පරීක්ෂක හා ආරක්ෂක නියාමකවරුන්ගෙන් යුක්තවන ආරක්ෂක අංශය විශ්වවිද්‍යාලයේ සියලුම නිශ්චල හා චංචල දේපල ආරක්ෂා කිරීමේ වගකීම දරයි. වර්තමානය වනවිට ප්‍රධාන ආරක්ෂක නිලධාරි හා නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරු පුරප්පාඩු වී පවති. ආරක්ෂක අංශය සතුව ආරක්ෂක පරීක්ෂකවරුන් 08 දෙනෙකු සහ ආරක්ෂක නියාමකවරුන් 60 දෙනෙකු සිටි. එය ප්‍රමාණවත් සංඛ්‍යාව නොවේ. එමනිසා පුද්ගලික ආරක්ෂක අංශවල සේවාව කුලියට ලබාගැනීමට ද ආරක්ෂක අංශයට සිදුව ඇත.

### ජයග්‍රහණ

මුරපොළවල් සහ ජංගම මුර සංචාර මඟින් සමස්ත විශ්වවිද්‍යාලයටම ආරක්ෂාව සැපයීම සඳහා ආරක්ෂක පියවර ගැනීම, නීති විරෝධි කටයුතු වැලැක්වීම, විමර්ශනය කිරීමේ සහ පරිපාලනයට වාර්තා කිරීම, සහය කාර්ය මණ්ඩලය, සිසුන් හා සේවකයන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ ඔවුනට ආරක්ෂාව සැපයීම සිසු විනය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම, සොරකම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සහ සොරකම් වැලැක්වීම, ගිණිගැනීම් වැලැක්වීම හා ආරක්ෂිත පියවර ගැනීම, විශ්වවිද්‍යාලය සහ ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරන උපාධි ප්‍රදානෝත්සවය, විවිධ උත්සව, ප්‍රදර්ශන හා වැඩමුළුවලට ආරක්ෂාව සැපයීම, විශ්වවිද්‍යාල නිල නිවාසවල පදිංචි වී සිටින කථිකාචාර්යවරුන්ගේ හා සේවකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා ඔවුන්ගේ ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගැනීම, පොලිසිය සමඟ සමීප සබඳතා පවත්වා ගනිමින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය නිසි පියවර ගැනීම, දෛනික වාර්තා ලබාදෙමින් එදිනදා සිදුවීම් පිළිබඳව උපකුලපතිතුමා දැනුවත් කිරීම හා ලේ දන්දීම වැනි ආගමික කටයුතු සංවිධානය කිරීම වර්ෂය තුළදී සිදුකරන ලදි.

### බාධක සහ පිළියම්

කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීමට ආරක්ෂක අංශයට නොහැකි විය. වාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා ඵලදායි සහ කාර්යක්ෂම ජංගම මුර සේවාවන් සැපයීම දුෂ්කර කාර්යයකි. සන්නිවේදන උපකරණවල පවතින අඩුපාඩු නිසා තොරතුරු හුවමාරුවට බාධා සිදුවිය. මිට අමතරව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පහසුකම් ද ප්‍රමාණවත් නොවේ.

### අනාගත සැලසුම්

ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම, වාහන සංඛ්‍යාව වැඩි කිරීම, ආරක්ෂක පරීක්ෂකවරුන් විසින් පාලනය කරනු ලබන ආරක්ෂක අනුකාර්යාලයක් පීඨවල ස්ථාපිත කිරීම, පරිගණක විද්‍යාගාර, පුස්තකාල හා ගබඩාවල ආරක්ෂක කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන ප්‍රධාන දොරටුව අසළ ආරක්ෂක මුරපොළක් පිහිටුවීම, දිවා රාත්‍රී ආරක්ෂක සේවාවන් සැපයීම හා ආරක්ෂාව සම්බන්ධ තොරතුරු එකතු කිරීම, වඩා යහපත් වූ ආරක්ෂක සේවාවක් සැපයීම සඳහා පවතින අඩුපාඩු හඳුනා ගැනීම හා ඒවාට අදාළ විසඳුම් ලබාදීම.

## D7 විනයාරක්ෂක අංශය
(ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි, ඩබ්.ඒ.ඒ. වේරහැර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

විනයාරක්ෂක අංශය ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි සහ විනයාරක්ෂකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අංශය නියෝජ්‍ය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවති. විනයාරක්ෂක අංශයේ කාර්යභාරය වනුයේ නියෝජ්‍ය උපකුලපතිතුමාගේ මගපෙන්වීම යටතේ මධ්‍යස්ථාන, ක්‍රීඩාගාරය, ක්‍රීඩාපිටි හා නේවාසිකාගාරවලදී සිසුන්ගේ ක්‍රියාකාරකම් සහ හැසිරීම පිළිබඳව සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කරමින් සිසු විනය පවත්වා ගැනීමයි.

### ජයග්‍රහණ

පීඨවල නවක සිසු කණ්ඩායම්වල නීති කඩකිරීම් අවම කර ගැනීම පිණිස අතුරු ව්‍යවස්ථා සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. සිසුන් සමඟ කටයුතු කිරීමේදී බාහිර පාර්ශවයන්ගේ සේවාව අවශ්‍ය වන හෙයින් හිඳගල, ගලහ හන්දිය, දන්ගොල්ල හන්දිය, පේරාදෙණිය හා මහකන්ද බස් නැවතුම්පල යන ස්ථානවල ත්‍රීරෝද රථ රියදුරන් සමඟ සම්බන්ධතාවය සම්බන්ධීකරණය කරන ලදි. සුබසාධන අංශයේ අධ්‍යක්ෂ සමඟ සම්බන්ධ වී සමාජ සුබසාධන ව්‍යාපෘතියක් හා නවකවදය වැළැක්වීමේ වැඩ සටහනක් දියත් කරන ලදි.

**සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- කරුණු සෙවීමේ මෙහෙයුම.
  මෙම වර්ෂය තුළදී පීඨ, නේවාසිකාගාර, ක්‍රීඩාපිටි හා ක්‍රීඩාගාරය යන ස්ථානවලදී සිදුවීම් 38ක් හඳුනා ගන්නා ලදි.
- කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ආරක්ෂාව ලබා දෙමින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශයට සහය දක්වන ලදි.
- සිසු විනය සම්බන්ධයෙන් පීඨාධිපතීන්ට, විනය පාලකට, නියෝජ්‍ය විනය පාලකවරුන්ට සහ ශාලාධිපතීන්ට සහයෝගය දක්වන ලදි.
- විනය පරීක්ෂණ පැවැත්වීමේදී ලේඛන සහය ඇතුළත්ව සේවාවන් සපයා දෙන ලදි.
- විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවය, ප්‍රදර්ශන හා නාට්‍ය උළෙල වැනි ප්‍රධාන උත්සවවලට සහයෝගය දක්වන ලදි.
- ජාතික ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ආරක්ෂක හා බුද්ධි අංශයට සහයෝගය දක්වන ලදි.
- හිඳගල ග්‍රාමයේ නවාතැන් ගෙන සිටින සිසුන් මුල් කර ගෙන හටගත් ආරවුලක් සාකච්ඡා මාර්ගයෙන් විසඳන ලදි.
- හන්තාන සංරක්ෂණ සංගමය සමඟ එක්ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රුක්රෝපණය කිරීම.
- සියලු සිසුන්ගේ සහභාගිත්වයෙන් සර්ව රාත්‍රික පිරිත් දේශණාවක් පවත්වා 50කට අධික මහා සංඝයාට දන් පිළිගැන්වීම.
- නවක සිසුන්ගේ ක්‍රීඩා උත්සවය සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදි.

# D8 උද්‍යාන අංශය

(උද්‍යාන පාලක ඩී.එම්.එස්.කේ.ඩබ්.බී. පලිපාන මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

## හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 700 කි. එයින් හෙක්ටයාර 230 ක් පමණ පීඨ, නේවාසිකාගාර, කාර්ය මණ්ඩල නිවාස හා අනෙකුත් පහසුකම් සඳහා සංවර්ධනය කොට ඇත. විශ්වවිද්‍යාල උද්‍යානයේ විවිධ මල් පැළ හා ආවරණ ගස් සිටුවා බඩවැටි හා තණ බිම් විශාල ප්‍රමාණයක් කප්පාදු කොට සැළකිය යුතු මට්ටමක භූ අලංකාර සිදුකොට ඇත. උද්‍යාන විද්‍යා නියමයන්ට අනුකූලව පවතින භූ අලංකාර වැඩි දියුණු කරන අතරම, ඒවා නියමාකාරයෙන් පවත්වා ගැනීම උද්‍යාන අංශයේ ප්‍රධාන අරමුණ වේ.

**පහත සඳහන් කටයුතු ඉටු කිරීම උද්‍යාන අංශයේ වගකීම වේ.**

1. විශ්වවිද්‍යාලයේ පවත්නා භූ අලංකාර පවත්වා ගැනීම
2. පැළ තවාන් පවත්වා ගැනීම සහ විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට පැළ බඳුන් සැපයීම
3. විශ්වවිද්‍යාල දේපලවලට හානි විය හැකි හා අනතුරුදායක ගස් සහ ශාඛා කපා ඉවත් කිරීම හා සාමාන්‍ය සේවා අංශය හා ආරක්ෂක අංශය සමඟ එක්ව කොට, කඳන් ටෙන්ඩර් මඟින් විකිණීමේ කටයුතු මෙහෙයවීම
4. විශ්වවිද්‍යාල උද්‍යාන අලංකාර ඉහළ නැංවීම හා වැඩි දියුණු කිරීම
5. නව උද්‍යාන සැලසුම් සකස් කිරීම හා හානියට පත්ව ඇති දෑ සඳහා ඒවායේ තක්සේරු සකස් කොට නව උද්‍යාන රටා ක්‍රියාත්මක කිරීම

## ජයග්‍රහණ

උද්‍යාන අංශය 2013 වසරේදී සිදුකළ කාර්යයන් කෙටියෙන් පහතින් දැක්වේ.

දිරාපත්වූ හා අධිවර්ධිත ගස් ඉවත් කොට අළුතින් ගස් සිටුවීම. විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැළ සිටුවා නොමැති ස්ථානවල පැළ සිටුවීම, විශ්වවිද්‍යාලයේ දේපලවලට හානි විය හැකි ගස් හා අතු ඉවත් කිරීම වැනි නඩත්තු කටයුතු ඇතුළත් භූ අලංකාර කටයුතු සුපුරුදු ලෙස සතුටුදායක ආකාරයෙන් සිදුකරන ලදි. විශ්වවිද්‍යාලයේ සියලුම බඩවැටි කප්පාදු කොට අඩි පාරවල් හා පියගැට පෙළවල්වල වල් පැළෑටි ගලවා පිරිසිදු කොට නියමාකාරයෙන් නඩත්තු කරන ලදි.

ඉහළ හන්තාන, මාර්ස් කන්ද, මාවලවත්ත හා කුරුඳුගොඩැල්ල යන ප්‍රදේශවල විශ්වවිද්‍යාල දේපල ගිණි ගැනීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පුනරුත්ථාපනය වන රැඳිවියන් හා කම්කරුවන් යොදාගෙන ගිණි ආරක්ෂක වැටක් ඉදිකරන ලදි.

උද්‍යාන අංශය මෙම වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන ප්‍රදර්ශන හා වෙනත් උත්සව වැනි විශේෂ අවස්ථාවන්වලදී මල්පෝච්චි සැපයීම වැනි කාර්යයන් ඉටු කර දෙමින් උපරිම සහයෝගය දක්වන ලදි. නාට්‍ය උත්සව සඳහා සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය නඩත්තු කළ අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය හා පේරාදෙණිය පර්යේෂණ සැසිවලට අදාළ කටයුතුවලට සහයෝගය දක්වන ලදි.

**විශේෂ වර්ධනයන් හා ක්‍රියාකාරකම්**

- දැයට කිරුළ රුක්රෝපණ වැඩ සටහන සාර්ථකව අවසන් කරන ලදි
- සොබා සංසඳය සමඟ එක්ව රුක්රෝපණ වැඩ සටහනක් සංවිධානය කොට මාර්ස් ශාලාව පිටුපස ක්‍රියාත්මක කරන ලදි
- ඉහල හන්තාන සංචාරක බංගලාව, පුහුණු මධ්‍යස්ථානය, ගල් බංගලාව ආශ්‍රිත ප්‍රදේශවල උද්‍යාන කටයුතු ප්‍රතිසංවිධානය කරන ලදි

- කපන ලද තණකොළ, කැපූ අතු, ගොම හා වෙනත් යෝග්‍ය ඉවත දමන ද්‍රව්‍ය යොදාගෙන උද්‍යාන අලංකාර කටයුතු සඳහා කොම්පෝස්ට් පොහොර සකස් කරන ලදි.

**උද්‍යාන වර්ධනයන් හා නව උද්‍යාන සැලසුම්**

- විශ්වවිද්‍යාල හිල්ඩා උද්‍යානයේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීම ආරම්භ කරන ලදි.
- මා ඔය, සනාතන මන්දිරය, පීඨ, පොදු ස්ථාන හා නේවාසිකාගාර ආශ්‍රිත ප්‍රදේශවල උද්‍යාන වර්ධන කාර්යයන් සිදුකරන ලදි.
- ඉංජිනේරු පීඨය හා විද්‍යා පීඨය සඳහා උද්‍යාන දියුණු කිරීමේ වැඩසටහන් සකස් කරන ලදි.
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තෘණ බිම් වැඩිදියුණු කරන ලදි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

- තුඹස් ඉවත් කිරීම හා පොළොව මට්ටම් කිරීම ඇතුළුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තෘණ බිම් හා උපකුලපති නිල නිවස ආශ්‍රිත තෘණ බිම් නැවත සකස් කරන ලදි.
- 2012 වසරේ උපාධි ප්‍රධානෝත්සවය හා සම්බන්ධ කටයුතු සඳහා බෝගම්බර බන්ධනාගාරයේ රැඳවියන් යොදා ගන්නා ලදි.
- උද්‍යාන අංශයේ යාන්ත්‍රික හැකියාව වැඩි කරන ලදි.

**බාධක සහ පිළියම්**

- එදිනෙදා උද්‍යාන කටයුතු සිදු කිරීම සඳහා පවතින කම්කරුවන්ගේ හිඟය ප්‍රධාන ගැටළුවකි
- විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතින වැඩ කටයුතු අධීක්ෂණය කිරීමේ හැකියාව ප්‍රමාණවත් නොවීම

**අනාගත සැලසුම්**

**දියුණුව සඳහා කෙරෙන යෝජනා**

- අවම වශයෙන් උද්‍යාන අධීක්ෂකයන් දෙදෙනෙකු (02) බඳවා ගෙන අධීක්ෂණ බලය වැඩි කිරීම
- මෙම අංශයේ ශ්‍රමිකයන් වෙනත් අංශවල ඉල්ලීම මත මාරු නොකිරීම
- බඩ වැටි කප්පාදු කරන්නා, ගස් කපන්නා ආදි තනතුරු නිර්මාණය කොට සේවක පුරප්පාඩු ඉහළනැංවීම
- උද්‍යාන නියමයන්ට අනුකූලව අළුතින් ස්ථාපිත කරන ලද ගොඩනැගිලි සඳහා නව උද්‍යාන රටා සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම

# උපග්‍රන්ථය E – පාලක සභාව සහ සනාතන සභාව

## E1 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පණතේ 44 වැනි වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2013 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| උපකුලපති | මාහාචාර්ය අතුල සේනාරත්න |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හෙන්නායක |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | මහාචාර්ය කේ. සමරසිංහ |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඒ.එම්. නවරත්න බණ්ඩා |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය යූ.බී. දිසානායක |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය එල්. රාජපක්ෂ |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය එම්.ඩී. ළමාවංශ |
| විද්‍යා පීඨය | මහාචාර්ය එස්.එම්.පී.පී. කරුණාරත්න |
| | මහාචාර්ය ඒ. වික්‍රමසිංහ 2013.04.27 සිට බ.පැ.ප. |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න |

**පහත සඳහන් සාමාජිකයන් දෙදෙනා 2012.02.26 දින සිට වසරක කාලයක් සඳහා පාලක සභාව නියෝජනය කිරීම පිණිස සනාතන සභාව විසින් පත් කරන ලදි.**

මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය එස්.කේ. පින්නවල 2013.05.15 සිට බ.පැ.ප (මහාචාර්ය ඒ. වික්‍රමසිංහ වෙනුවට පත් කරන ලදි.)

**පහත සඳහන් සාමාජිකයන් 2011..07..01 දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදි.**

එම්. අබේගුණසේකර මිය
යූ.ඩබ්.බී. අත්තනායක මයා
බී.එම්.එන්. බාලසූරිය මයා
මහාචාර්ය එම්.එල්.ඒ. කාදර්
ආර්. චන්ද්‍රසේකර මයා
ගාමිණි එස්.ජේ. දිසානායක 2013.07.16 සිට (ඩබ්.පී ජයසේකර මිය වෙනුවට පත් කරන ලදි.)
ආචාර්ය ඒ.යූ. ගමගේ
එච්.ඒ. හේවගේ මයා
එම්.එස්. ප්‍රේමවංශ මිය
එස්. රත්වත්තේ මයා
එම්. සමරනායක මයා
එච්.එම්. ගාමිණි සෙනෙවිරත්න මයා
ආචාර්ය එල්. වීරසිංහ

## E2 සනාතන සභාව සහ එහි සාමාජිකත්වය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (1985 අංක 07 දරණ පනතින් සංශෝධිත) 46 වැනි කොටසේ වගන්ති ප්‍රකාරව සංයුක්ත වූ සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වේ.

එහි සාමාජිකයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| **උපකුලපති** | ඉහත සඳහන් කළ පරිදි |
| **නියෝජ්‍ය උපකුලපති** | ඉහත සඳහන් කළ පරිදි |
| **පීඨාධිපතීන්** | ඉහත සඳහන් කළ පරිදි |

**අධ්‍යක්ෂවරුන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය බී.සී.එන්. පීරිස් |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය බී.එස්.සී.බී. කරුණාරත්න |
| | මහාචාර්ය එච්.එම්.බී. නාමල් ප්‍රියන්ත (2013.03.25 සිට) |
| **පුස්තකාලයාධිපති** | ආචාර්ය කේ.ජී.පී.ජී. විජේතුංග (මිය) |

**අංශ ප්‍රධානීන්**

**කෘෂිවිද්‍යා පීඨය**

| | |
|---|---|
| කෘෂිජීව විද්‍යා අංශය | ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර |
| | ආචාර්ය ඩී.එම්. ද කොස්තා (2013.09.14 සිට) |
| කෘෂි ආර්ථික විද්‍යා අංශය | මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා |
| කෘෂි ඉංජිනේරු අංශය | ආචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන |
| කෘෂි ව්‍යාප්ති අංශය | ආචාර්ය ජේ.ඒ.එස්. ද සිල්වා |
| සත්ව විද්‍යා අංශය | මහාචාර්ය එච්.ඩබ්. සිරිල් |
| බෝග විද්‍යා අංශය | ආචාර්ය එච්.එම්.ජී.එස්.බී. හිටිනායක |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි |
| පාංශු විද්‍යා අංශය | ආචාර්ය ඩබ්.ඒ.යූ. විතාරණ |

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර අංශය | වෛද්‍ය එම්.පී.එස්. මුදලිගේ |
| හෙදවේද අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි (වැ.බ) |
| භෞතවේද අංශය | වෛද්‍ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහක (වැ.බ) |
| විකිරණ හා විකිරණ චිකිත්සක අංශය | වෛද්‍ය ආර්.ඩී. ජයසිංහ |
| | වෛද්‍ය එම්.එල්. ජයතිලක (2013.08.07 සිට) |
| ඖෂධවේද අංශය | එම්.එච්.එෆ්. සකීනා (07.11.2012 දින සිට) |

**ශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය | ආචාර්ය එම්.ඉසඩ්.එම්. නෆීල් |
| පුරාවිද්‍යා අංශය | ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න |
| සම්භාව්‍ය භාෂා අංශය | ආචාර්ය වී. එදිරිසිංහ |
| ආර්ථික විද්‍යා අංශය | ආචාර්ය ජේ. නිජල් |
| අධ්‍යාපන අංශය | ආචාර්ය එස්.ඩී.කේ. විජේසුන්දර |
| ඉංග්‍රීසි භාෂා අංශය | ආචාර්ය එස්. සිවමෝහන් |
| ලලිත කලා අංශය | එස්.එම්.ඒ. සමරකෝන් |
| භූගෝල විද්‍යා අංශය | මහාචාර්ය පී. වික්‍රමගමගේ |
| ඉතිහාස අංශය | මහාචාර්ය එච්. ධීරානන්ද හිමි |
| නීති අංශය | ආචාර්ය එන්.ඩී. උඩගම |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ් |
| දර්ශනය හා මනෝ විද්‍යා අංශය | ආචාර්ය ඩී.ඩී.කේ.එස්. කරුණානායක |
| දේශපාලන විද්‍යා අංශය | වී. සිවයෝගලිංගම් |
| | ආර්.ඒ.ඩබ් රණසිංහ (2013.05.27 දින සිට) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | මහාචාර්ය පූජ්‍ය එම්. ඥාණානන්ද හිමි |
| සිංහල භාෂා අංශය | ඊ.එම්.එම්.ආර්.පී.එල්. නුගපිටිය |
| සමාජ විද්‍යා අංශය | මහාචාර්ය එස්.ඒ. කරුණාතිස්ස |
| | මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් (01.03.2013 දින සිට) |
| දෙමළ භාෂා අංශය | මහාචාර්ය වී. මහේෂ්වරන් |

**දන්ත වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| මූලික විද්‍යා අංශය | වෛද්‍ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක |
| සමාජ දන්ත සෞඛ්‍ය අංශය | වෛද්‍ය වී. විජයකුමාරන් |
| මුඛ සෞඛ්‍ය හා පරිදන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය ආර්.ඩී. ජයසිංහ (2013.08.06 සිට) |
| මුඛ ව්‍යාධිවේද අංශය | වෛද්‍ය පී.ආර්. ජයසූරිය |
| | මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග (2013.04.08 සිට) |
| කෘතීම දන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය අයි.පී. තිලකුමාර |
| දන්ත සංරක්ෂණ අංශය | වෛද්‍ය ඩී.අයි. අමරතුංග |
| මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය | වෛද්‍ය ඒ.එම්. ආටිගල |

**ඉංජිනේරු පීඨය**

| | |
|---|---|
| රසායනික හා සැකසුම් ඉංජිනේරු අංශය | ආචාර්ය සී.එස්. කල්පගේ |
| සිවිල් ඉංජිනේරු අංශය | ආචාර්ය ඒ.එල්.එම්. මහරූෆ් |
| පරිගණක ඉංජිනේරු අංශය | ආචාර්ය කේ.ඩබ්.එච්.එම්.ආර්.ඩී. ඇල්කඩුව |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය | ආචාර්ය ඒ. අත්පුතරාජා |
| ඉංජිනේරු ගණිත විද්‍යා අංශය | ආචාර්ය ඩී.එස්.කේ. කරුණාසිංහ |
| යාන්ත්‍රික ඉංජිනේරු අංශය | ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී. ගුණවර්ධන |
| නිෂ්පාදන ඉංජිනේරු අංශය | ආචාර්ය ආර්.ඒ. ඒකනායක මිය |
| ඉංජිනේරු කළමනාකරණ අංශය | ආචාර්ය පී.බී.ජී. දිසානායක |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| කාය ව්‍යවච්ඡේද අංශය | වෛද්‍ය එස්.බී. අධිකාරි |
| නිර්වින්දන වෛද්‍ය අංශය | වෛද්‍ය එම්.වී.ජී. පින්ටෝ |
| ජෛව රසායන විද්‍යා අංශය | වෛද්‍ය පී.එච්.පී. ප්‍රනාන්දු |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය | මහාචාර්ය පී.වී.ආර්. කුමාරසිරි |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු |
| වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය ඩබ්.ඒ.ටී.ඒ. ජයලත් |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය | වෛද්‍ය එෆ්. නූර්දීන් |
| ප්‍රසව හා නාරිවේද අංශය | වෛද්‍ය එස්.ඒ. කරුණානන්ද |
| ළමා රෝග අංශය | වෛද්‍ය ආර්.එම්. මුදියන්සේ |
| පරපෝෂ විද්‍යා අංශය | වෛද්‍ය දේවිකා ඉද්දවල මිය |
| ව්‍යාධිවේද අංශය | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක මිය |
| භිෂග්වේද අංශය | වෛද්‍ය යූ. දන්ගහදෙණිය |
| භෞතවේද අංශය | වෛද්‍ය එස්.ඒ. රාජරත්න |
| මනෝ වෛද්‍ය අංශය | වෛද්‍ය ටී.එන්. රාජපක්ෂ |
| ශල්‍ය වෛද්‍ය අංශය | වෛද්‍ය ඒ.යූ.බී. පෙතියාගොඩ |
| විකිරණ විද්‍යා අංශය | මහාචාර්ය පී.බී. හේවාවිතාරණ |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| උද්භිත විද්‍යා අංශය | ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා |
| රසායන විද්‍යා අංශය | මහාචාර්ය ඒ. වික්‍රමසිංහ |
| | මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා (2013.04.27 සිට) |
| භූගර්භ විද්‍යා අංශය | ආචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල |
| | ආචාර්ය ඒ.ඒ.ජේ.කේ. ගුණතිලක |
| අණුක ජීව විද්‍යා හා ජෛව රසායන අංශය | ආචාර්ය ආර්.ජී.එස්.කේ. රාජපක්ෂ |
| | ආචාර්ය ඩී.එස්.ඩී.එන්.එන්. සූරිය පතිරණ |
| ගණිත විද්‍යා අංශය | ආචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා |
| භෞතික විද්‍යා අංශය | ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර |
| සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අංශය | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු |
| | ආචාර්ය වයි.පී.ආර්.ඩී. යාපා (2013.03.01 සිට) |
| සත්ව විද්‍යා අංශය | මහාචාර්ය කේ.බී. රණවන |
| | ආචාර්ය ආර්.එස්. රාජකරුණා (2013.02.01 සිට) |

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

| | |
|---|---|
| පශු චිකිත්සක අංශය | මහාචාර්ය ඉන්දිරා සිල්වා |
| පශු ව්‍යාධිවේද අංශය | වෛද්‍ය අරුල්කාන්තන් |
| පශු මූලික විද්‍යා අංශය | වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ |
| ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශය | වෛද්‍ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර් |
| පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අංශය | වෛද්‍ය ආර්.එස්. කළුපහන |

## අංශ ප්‍රධානීන් නොවන වෙනත් මහාචාර්යවරුන්

### කෘෂිවිද්‍යා පීඨය

මහාචාර්ය ඩී.සී. බණ්ඩාර
මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක
මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. කොස්තා
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව
මහාචාර්ය යූ.පී. ද ඒ. එදිරිසිංහ
මහාචාර්ය කේ.ජී.ඒ. ගුණසේකර
මහාචාර්ය එල්.එච්.පී. ගුණරත්න
මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන
මහාචාර්ය ඩී.සී.කේ. ඉල්ලපෙරුම
මහාචාර්ය එස්.පී. ඉන්ද්‍රරත්න
මහාචාර්ය ඒ.එන්. ජයකොඩි
මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු
මහාචාර්ය ආර්.බී. මාපා
මහාචාර්ය ඩබ්.පී.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය කේ.එන්. නන්දසේන
මහාචාර්ය එස්.ඊ. පීරිස්
මහාචාර්ය ඒ.එන්.එෆ්. පෙරේරා
මහාචාර්ය ඊ.ආර්.කේ. පෙරේරා
මහාචාර්ය එස්. ප්‍රේමරත්න
මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර
මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ
මහාචාර්ය එස්. සමිත
මහාචාර්ය යූ. සංගක්කාර
මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා
මහාචාර්ය ඩබ්.පී.ආර්.පී.ඩී. ද සිල්වා
මහාචාර්ය සී. සිවයෝගනාතන්
මහාචාර්ය වී.ඒ. සුමනසිංහ
මහාචාර්ය ආර්.ඕ. තටිල්
මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී. වනිගසුන්දර
මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
මහාචාර්ය අයි.පී. වික්‍රමසිංහ
මහාචාර්ය එම්.පී.බී. විජේගුණවර්ධන

### ශාස්ත්‍ර පීඨය

මහාචාර්ය ඒ.එස්.පී. අබේරත්න
මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර
මහාචාර්ය එම්.එස්. එම්. ඇන්ස්
මහාචාර්ය එස්.එච්. හිස්බුල්ලා
මහාචාර්ය එස්.ඒ. කරුණාතිස්ස
මහාචාර්ය පී.බී. කීරවැල්ල
මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ
මහාචාර්ය එස්.ඩබ්. පෙරේරා
මහාචාර්ය එස්.කේ. පින්නවල
මහාචාර්ය කේ. රාහුල හිමි
මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න
මහාචාර්ය එස්. සෙනෙවිරත්න
මහාචාර්ය කේ.ටී. සිල්වා
මහාචාර්ය එම්. සෝමතිලක
මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ

### දන්ත වෛද්‍ය පීඨය

මහාචාර්ය එස්.එල්. ඒකනායක
මහාචාර්ය එස්.පී.එන්.පී. නාගරත්න
මහාචාර්ය සී.ඩී. නානායක්කාර
මහාචාර්ය පී.එස්. රාජපක්ෂ
මහාචාර්ය එම්.ඒ.එම්. සිතීක්
මහාචාර්ය ඒ. තිලකරත්න
මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න
මහාචාර්ය ජේ.යූ. වීරසිංහ
මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ
මහාචාර්ය කේ.එම්. විජේරත්න
මහාචාර්ය ආර්.එල්. විජේවීර

**ඉංජිනේරු පීඨය**

මහාචාර්ය එස්.බී.එස් අබයකෝන්
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
මහාචාර්ය එම්.ඒ.ආර්. එම්. ප්‍රනාන්දු
මහාචාර්ය යූ. ද එස්. ජයවර්ධන
මහාචාර්ය කේ.එම්. ලියනගේ
මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල්

මහාචාර්ය කේ.පී.පී. පතිරණ
මහාචාර්ය එස්.ඩී. පතිරණ
මහාචාර්ය කේ.ජී.එච්.සී.එන්. සෙනෙවිරත්න
මහාචාර්ය ආර්. ශාන්තිනි
මහාචාර්ය කේ.එස්. වල්ගම
මහාචාර්ය එස්.බී. වීරකොන්

**වෛද්‍ය පීඨය**

මහාචාර්ය ඒ. අබේගුණවර්ධන
මහාචාර්ය සී.කේ. අබේසේකර
මහාචාර්ය චන්ද්‍රසේකර මල්කාන්ති
මහාචාර්ය අයි.බී. ගවරමාන්න
මහාචාර්ය සී.ඩී.ඒ. ගුණසේකර
මහාචාර්ය ඩබ්.එම්.සී.ජේ. ජයසිංහ

මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
මහාචාර්ය ආර්. සිවකානේෂන්
මහාචාර්ය වී. තෙවනේසම්
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය ඒ.එස්.බී. විජේකෝන්

**විද්‍යා පීඨය**

මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම්
මහාචාර්ය බී.එම්.ආර්. බණ්ඩාර
මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්
මහාචාර්ය යූ.එන්.බී. දිසානායක
මහාචාර්ය ජේ.පී. එදිරිසිංහ
මහාචාර්ය ඕ.ඒ. ඉල්ලේපෙරුම
මහාචාර්ය බී.එස්.බී. කරුණාරත්න
මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න

මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න
මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු
මහාචාර්ය කේ. ප්‍රේමරත්න
මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්.පී. විජේකෝන්
මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

මහාචාර්ය එච්. අබේගුණවර්ධන
මහාචාර්ය පී. අබේනායක

මහාචාර්ය එස්. පී. ගුණරත්න
මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ

**පීඨ නියෝජිතයන්**

**කෘෂිවිද්‍යා පීඨය**

අචාර්ය ඩබ්.එම්.ටී. මධුජිත්
මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
මහාචාර්ය ඩී.ජී.එන්.ජී. විජේසිංහ (2013.03.20 සිට)

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

වෛද්‍ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර

**ශාස්ත්‍ර පීඨය**

ආචාර්ය එස්.ජේ.එස්. ද මෙල්
එම්.ඒ.එස්. ජයකුමාර
ආචාර්ය ඩබ්.එල්.පී. පෙරේරා (2013.01.31 සිට)

**දන්ත වෛද්‍ය පීඨය**

වෛද්‍ය ආර්.ඩබ්. පල්ලේගම
වෛද්‍ය එන්. වනිගසූරිය
වෛද්‍ය කේ.එස්.එන්. ආරියසිංහ (2013.07.31 සිට)

**ඉංජිනේරු පීඨය**

ආචාර්ය අයි.එම්.එස්. සත්‍යප්‍රසාද්
ආචාර්ය පී.බී. බෝයගොඩ
ආචාර්ය පී.බී.බී. හේරත් (2013.05.15 සිට)

**වෛද්‍ය පීඨය**

වෛද්‍ය ඩී.එස්. දිසානායක
වෛද්‍ය කේ. මාරඹේ

**විද්‍යා පීඨය**

මහාචාර්ය ඒ.එන්. නවරත්න
ආචාර්ය ඒ.ඒ.එස්. පෙරේරා

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

ආචාර්ය ඩී.ඩී.එන්. ද සිල්වා
ආචාර්ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය

# උපග්‍රන්ථය F – ව්‍යාපෘති පිළිබඳ විස්තර

## F1 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/ විදෙස් ආධාර කළ) - 2013

| පීඨය | නම සහ විස්තර | ණය ප්‍රදානය | ආධාරක ආයතනය | ටී.ඊ.සී.රු. | ආර්.එෆ්.ඒ.රු. | ඩී.එෆ්.රු. |
|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා | Genomics &Proteomic approaches of identifying dehydration stress responsive genes from selected rice varieties in SriLanka - RG/2012/BT/01 | ප්‍රදාන | ජා.වි.ප. | 2,706,350.00 | - | 709,013.00 |
| | Development of household food security models for poverty stricken areas of SriLanka - NTRP/2012/FS/PG-05/P-01 | ප්‍රදාන | ජා.වි.ප. | | - | 1,500,000.00 |
| | Production of oyster mushroom using spawn run in different substrstes- RG/AF 2013/01/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 34,000.00 | - | 34,000.00 |
| | Nutrients & water- use efficiency of epiphytes, semi-prasites & their hosts -RG/AF 2013/02/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 445,500.00 | - | 445,500.00 |
| | Effect of natural antioxidants on generation of trans -fatty acids in edible oils during frying-RG/AF 2013/03/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 1,000,000.00 | - | 1,000,000.00 |
| | Effect/s of the Endocrine Disruptor Bisphenol A on the Oveiductal Proteome & Secretome - RG/AF 2013/05/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 2,000,000.00 | - | 2,000,000.00 |
| | Severity & effects of parasitic plant in infestation in export agricultural crops & fruit crops of Sri Lanka-RG/AF 2013/06/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 350,000.00 | - | 350,000.00 |
| | Morphological biochemical & molecular characterization & rapid multiplication of aegle marmelos (Lin). Correa - RG/AF 2013/07/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 843,800.00 | - | 843,800.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | Investigation of the warning vocalizations & behavior of Asian elephants to the sound of the Sri Lankan hornet & other elephant vacalizations - RG/AF 2013/04/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 997,000.00 | - | 997,000.00 |
| | Effect of biochar application on selected properties of three soils of Sri Lanka - RG/AF 2013/08/Ag | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 431,550.00 | - | 431,550.00 |
| | Preliminary analysis of metallothionein - 2A(MT-2A) polymorphisms among selected group of patients of chronic kidney disease of uncertain etiology - RG/AF 2013/09/AG | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 312,000.00 | - | 312,000.00 |
| | Detection of virus - like agents associated with chill narrow leaf disorder through molecular methods - RG/AF 2013/10/AG | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 109,700.00 | - | 109,700.00 |
| | Development of an in vitro culture protocol & gene transformation system for loranthus spp. To study the mechanism of plant parasitim - RG/AF 2013/11/AG | ප්‍රදාන | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 500,000.00 | - | 500,000.00 |
| | Study aboard for students of the Michigan State University,USA | ප්‍රදාන | මිචිගන් ස්ටේට් විශ්වවිද්‍යාලය | 3,937,400.00 | 3,937,400.00 | - |
| | Pest Control - 1st step | ප්‍රදාන | සහභාගිවූවන් | 1,875,000.00 | - | 1,875,000.00 |
| | Pest Control - 2nd step | ප්‍රදාන | සහභාගිවූවන් | 1,725,000.00 | - | 1,725,000.00 |
| | Five-day training programme on Drairy Farming | ප්‍රදාන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 411,092.00 | - | 411,092.00 |
| | Data Analysis & Reporting of the Divi Naguma Project | ප්‍රදාන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 86,845.00 | - | 86,845.00 |
| | Short Coures of Project Management | ප්‍රදාන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 272,100.00 | - | 272,100.00 |
| | Short Courses on Integrated Pest Management | ප්‍රදාන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 242,100.00 | - | 242,100.00 |
| | Development of Web based SAARC Project | ප්‍රදාන | SAARC කෘෂිකර්ම මධ්‍යස්ථානය | 812,500.00 | 406,962.50 | - |
| | SMES Project | ප්‍රදාන | එ.රා. සවුතම්ටන් විශ්වවිද්‍යාලය හා ICRAF | 986,000.00 | 975,731.00 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | Training GCE(A/L)Teachers on Animal Product Development | ප්‍රදාන | අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත | 116,187.00 | - | 116,187.00 |
| | ZEIN 2012 Z121 Project Belgium Project | ප්‍රදාන | VLIR-UOS University Development Coorporation | 5,446,440.00 | 3,169,322.85 | - |
| | Expand the existing culture collection comprised with Soil Bacteria & Fungi | ප්‍රදාන | පරිසර අමාත්‍යාංශය | 360,000.00 | - | 360,000.00 |
| | IFS- 2012-C/5268-1 | ප්‍රදාන | මූලික අධ්‍යයන ආයතනය | 13,900.00 | 13,900.00 | |
| | Identification &establishment of baselineInformation of Socio - Economic Status & Householder | ප්‍රදාන | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 1,276,000.00 | | 765,600.00 |
| | Training GCE(A/L)Teachers on Paddy Cultivation | ප්‍රදාන | අධ්‍යාපන අමාත්‍යාංශය මධ්‍යම පළාත | 97,637.00 | - | 97,637.00 |
| | Training Workshop on Participatory Plant Breeding | ප්‍රදාන | ග්‍රීන් මූව්මන්ට් ව්‍යාපාරය | 197,200.00 | - | 197,200.00 |
| | Milk Processing & Marketing Project | ප්‍රදාන | ICEI - Overseas | 200,000.00 | - | 200,000.00 |
| | The Agricultural Modeling Intercomparison & Improvement project | ප්‍රදාන | AgMIP | 18,699,936.00 | 4,693,268.00 | - |
| | Baseline Nutrition Survey in Udukumbura Village in the Kandy District | ප්‍රදාන | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 1,265,000.00 | 751,300.00 | - |
| | Effect of endrine disrupute mancozeb on oviductal fallopian tube physiology | ප්‍රදාන | මූලික අධ්‍යයන ආයතනය | 1,560,600.00 | 70,304.00 | - |
| | | ප්‍රදාන | | **50,810,837.00** | **14,018,188.35** | **15,581,324.00** |
| ශාස්ත්‍ර පීඨය | Erasmus Mundus Aclion 2 | ප්‍රදාන | - | - | - | - |
| | Mac Arther Foundation Grant | ප්‍රදාන | - | - | - | - |
| | | ප්‍රදාන | - | - | - | - |
| දන්ත වෛද්‍ය පීඨය | SMIL ට්‍රේන් ෆන්ඩ් | ප්‍රදාන | SMAIL ට්‍රේන් ෆන්ඩ් | 300 USD PER-SURGERY300x2 26=67800USD | - | - |
| | | | | - | - | - |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය ගුණවර්ධන RG/2012/33/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 150,000.00 | - | - |
| | ආචාර්ය කල්පගේ RG/2013/28/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 2,000,000.00 | - | - |
| | මහාචාර්ය එම්.ඒ.ආර්.එම්. ප්‍රනාන්දු RG/AF/2013/24/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 1,500,000.00 | - | - |
| | ආචාර්ය එස්.බී.ජී.එස්.පී. ගුණවර්ධන RG/AF/2013/30/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 1,105,000.00 | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ආචාර්ය ඩී.අයි.බී. රන්දෙණිය RG/AF/2013/29/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 775,000.00 | - | - |
| | පී.බී.පී. දිසානායක මයා RG/2013/25/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 610,000.00 | - | - |
| | එස්.එම්.ඩබ්.ටී.පී. ආරියරත්න RG//AF/2013/27/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 120,300.00 | - | - |
| | ජේ.බී. ඒකනායක RG/AF/2013/26/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | 492,000.00 | - | - |
| | ආචාර්ය ජේ.ජේ. විජේතුංග මයා | ජා.වි.ප. | ජාත්‍යන්තර විද්‍යා පදනම | 1,554,800.00 | - | - |
| | SATREPS | විදෙස් ප්‍රදාන | ජපන් ජාත්‍යන්තර සංස්ථාව | 5,000,000.00 | - | - |
| | UNESCO | විදෙස් ප්‍රදාන | යුනෙස්කෝ ප්‍රෝග්‍රැමික් කෝපරේෂන් | 2,619,584.15 | - | - |
| | Tokyo Cement fund | ප්‍රදාන | ටෝකියෝ සිමෙන්ති සංස්ථාව | 300,000.00 | - | - |
| | අඩු වියදම් ඇගයීම් සංවර්ධනය | ප්‍රදාන | ටෙලිකොමියුනිකේෂන් රෙගියුලටරි | 160,000.00 | - | - |
| | | ප්‍රදාන | | **16,386,684.15** | - | - |
| වෛද්‍ය පීඨය | හදිසි හා ආපදා කළමනාකරණ පුහුණු ඒකකය | ප්‍රදාන | WHO / UNFPA | 3,087,238.00 | - | - |
| | | ප්‍රදාන | | **3,087,238.00** | - | - |
| විද්‍යා පීඨය | RG/2012/43/S-13.01.14.12.04 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 150,000.00 | - | - |
| | 13.11.14.11.04 RG/2011/ES/01(NSF) | ප්‍රදාන | ජා.වි.ප. | 1,772,050.00 | - | - |
| | 13.10.11.120.214 RG/2010/NANO/04 | ප්‍රදාන | ජා.වි.ප. | 2,127,258.00 | - | - |
| | 13.11.14.11.05 RG/2011/NRB/08(NSF) | ප්‍රදාන | ජා.වි.ප. | 1905310.00 | - | - |
| | 13.11.14.11.03 RG/2011/NRB/03 | ප්‍රදාන | ජා.වි.ප. | 2,407,322.00 | - | - |
| | 13.11.14.11.02 NSF/Fellow/2011/02 | ප්‍රදාන | ජා.වි.ප. | 7,860,000.00 | - | - |
| | RG/2011/34/S 13.01.14.11.03 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 98,200.00 | - | - |
| | 13.11.14.11.01 RG/2011/NRB/01 | ප්‍රදාන | ජා.වි.ප. | 763,800.00 | - | - |
| | 13.01.14.12.03 RG/2012/42/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 358,400.00 | - | - |
| | 13.11.14.12.06. RG/2012/AG/03 | ප්‍රදාන | ජා.වි.ප. | 1,651,720.00 | - | - |
| | 13.01.14.12.07 RG/2012/CG-1/46/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 140,000.00 | - | - |
| | 13.42.14.11.01 | ප්‍රදාන | Naturee's Beauty Creations Ltd. | 817,000.00 | - | - |
| | 13.01.14.11.07 RG/2011/38/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 50,000.00 | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 13.01.14.11.02<br>RG/2011/33/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 82,215.00 | - | - |
| | 13.01.14.11.06<br>RG/2011/37/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 55,000.00 | - | - |
| | 13.01.14.11.05<br>RG/2011/36/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 60,000.00 | - | - |
| | 13.01.14.11.04<br>RG/2011/35/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 175,000.00 | - | - |
| | 13.01.14.11.08<br>RG/2011/48/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 89,235.63 | - | - |
| | 13.01.14.12.08<br>RG/2012/CG-1/47/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 76,000.00 | - | - |
| | 13.01.14.12.09<br>RG/2012/CG-1/48/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 95,350.00 | - | - |
| | 13.01.14.11.01<br>RG/2011/32/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 75,000.00 | - | - |
| | 13.01.14.12.10<br>RG/2012/CG-1/49S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 200,000.00 | - | - |
| | 13.01.14.12.01<br>RG/2012/40/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 148,000.00 | - | - |
| | 13.01.14.12.02<br>RG/2012/41/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 313,000.00 | - | - |
| | 13.01.14.13.02<br>RG/2013/14/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 123000.00 | - | - |
| | 13.01.14.13.03<br>RG/2013/15/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 150000.00 | - | - |
| | 13.01.14.13.01<br>RG/2013/13/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 156,780.00 | - | - |
| | 13.01.14.13.04<br>RG/2013/16/S | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 168,500.00 | - | - |
| | | | | **22068140.63** | - | - |
| පශු වෛද්‍ය පීඨය | IAEA-RCM onResidue Screening Project-<br>මහාචාර්ය පී. අබේනායක | ප්‍රදාන | ජාත්‍යන්තර පරමාණු බල ශක්ති අධිකාරිය (IAEA) | 7,644,404.00 | 7,644,404.00 | - |
| | EU-Asia Link Elephant Project<br>ආචාර්ය එන්.කේ. ජයසේකර | ප්‍රදාන | යුරෝපා සංගමය | 10,071,494.00 | - | - |
| | Partnership Programme with Royal Vet.College-<br>ආචාර්ය ආර්.එස්. කළුපහණ | ප්‍රදාන | එක්සත් රාජධානියේ රාජකීය පශු වෛද්‍ය විද්‍යාලය | 1,670,572.40 | - | - |
| | IAEA Research Grant-<br>ආචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | ප්‍රදාන | ජාත්‍යන්තර ඇටමික් එනර්ජි ඒජන්සිය (IAEA) | 1,350,000.00 | 1,350,000.00 | - |
| | Dairy Cattle & Buffalo Improvement Project-<br>ආචාර්ය පී.පී.ඒ. පුෂ්පකුමාර | ප්‍රදාන | ආහාර හා කෘෂිකර්ම සංවිධානය | 2,235,200.00 | 2,235,200.00 | - |
| | Who listen to whom? Interspecific communication between common palm squirrels and yellow-billed babblers for predator awareness | ප්‍රදාන | ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) | 1,105,000.00 | 1,105,000.00 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | Use of iiradiated larval vaccine to control haemonchosis in goats in Sri Lanka - ආචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | 2,075,314.00 | - | 2,075,314.00 |
| | Genetic characterization of Sri Lankan indigenous goats using DNA based technologies - මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | 2,190,000.00 | - | 2,190,000.00 |
| | The effect of lipid peroxidation on keeping quality of tilapia presserved using different methods - ආචාර්ය ඩී.එම්.එස්. මුණසිංහ | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | 1,850,000.00 | - | 1,850,000.00 |
| | Epidemiological studies on Mastitis in Central Province- ආචාර්ය එල්.එන්.ඒ. ද සිල්වා | ප්‍රදාන | CARP | 500,000.00 | - | 500,000.00 |
| | Production of genetically superior goat breed dry zone of Sri Lanka- ආචාර්ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර් | ප්‍රදාන | CARP | 280,000.00 | - | 280,000.00 |
| | Rapid diagnosis& control of mycobacterium infection in Fish- ආචාර්ය ඒ. අරුල්කාන්තන් | ප්‍රදාන | CARP | 310,000.00 | - | 310,000.00 |
| | Use offeed supplements to improve the performance & health status of freshwater prawn- ආචාර්ය එම්.එන්.එම්. ෆවුසි | ප්‍රදාන | CARP | 500,000.00 | - | 500,000.00 |
| | Studies on the use of DNA based techniques in the selection of animals- ආචාර්ය එච්.බී.එස්. ආරියරත්න | ප්‍රදාන | CARP | 400,000.00 | - | 400,000.00 |
| | Validation of sexed-semen technology to produce 98% Female calves for commercial dairy Farmers in S.L. | ප්‍රදාන | CARP | 1,200,000.00 | - | 1,200,000.00 |
| | Rapid detection | ප්‍රදාන | CARP | 860,000.00 | - | 860,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | methods for economically important viral dieases of giant tiger shrimp-penaeus monodon - ආචාර්ය එම්.එන්.එම්. ෆවුසි | | | | | |
| | Use of irradiated larval vaccine to control gastrointestinal helminth infection in small ruminants - ආචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | ප්‍රදාන | CARP | 2,350,000.00 | - | 2,350,000.00 |
| | Studies on the use of DNA based techniques in the selection of animals with higher breeding value and disease resistance in goats - ආචාර්ය එච්.බී.එස්. ආරියරත්න | ප්‍රදාන | CARP | 1,000,000.00 | - | 1,000,000.00 |
| | IAEA Technical Cooperation Programme - ආචාර්ය බැසිල් අලෙක්සැන්ඩර් හා පී.පී. අනිල් පුෂ්පකුමාර | ප්‍රදාන | ජා. ඇටමික් එනර්ජි අධිකාරිය (IAEA) | 842,500.00 | 842,500.00 | - |
| | NSF Research - Dr. N Jayasena Who Listens to Whom? Interspecific Communication between common palm squirrels and yellow babblers for predator awareness | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | 556,124.00 | 556,124.00 | - |
| | Proteomic & trascryptomics profile / analysis of indo Sri Lanka haemotoxic snakes - ආචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | ප්‍රදාන | පර්යේෂණ හා තාක්ෂණික අමාත්‍යාංශය | 9,168,000.00 | - | 9,168,000.00 |
| | Building Research Excellence in wildlife and Human Health in Sri Lanka මහාචාර්ය පී. අබේනායක | ප්‍රදාන | ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය | 63,011,163.00 | 63,011,163.00 | - |
| | | | **111,169,771.40** | **76,744,391.00** | **22,683,314.00** | |

# F2 ව්‍යාපෘති වැය පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් ) – 2013

| පීඨය | නම සහ විස්තර | TEC රු. | 2012 වියදම් | 2013 වියදම් | 2013.12.13 සාමුහික වියදම් | භෞතික දියුණුව % |
|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා | A Study of Organic Manures and their Residual Values using 15 N A/C | - | - | 77,426.00 | 77,426.00 | - |
| | Agriculture Biotechnology Centre - Faculty of Agriculture | - | 254,513.37 | 214,351.50 | 468,864.87 | - |
| | Baseline Nutrition Survey in Udukumbura Village in the Kandy District | 126,500.00 | - | 751,300.00 | 751,300.00 | - |
| | Bio Agi: R&D Programe conducted by Department of Crop Science - Faculty of Agriculture | - | 217,821.46 | 29,250.00 | 247,071.46 | - |
| | Biofetilzi | 985,582.00 | - | 35,209.00 | 35,209.00 | - |
| | Data Analysis & Reporting of the Divi Naguma Project | 86,845.00 | - | 38,473.81 | 38,473.81 | - |
| | Development of Web-Based Saarc Pesticide Information Network (Spi Net) | 406,962.50 | - | 304,447.16 | 304,447.16 | - |
| | Expanding the existing Culture Collection of Soil Bacteria & Fungi Leading Enhance | 360,000.00 | - | 132,214.00 | 132,214.00 | - |
| | Fabircating environmentally firendly & moist - proof packging materials for Kithul Treacle & Juggary | 1,500,000.00 | 120,000.00 | 200,000.00 | 320,000.00 | - |
| | Five-days Training Proramme on Driry Faming | 411,092.00 | - | 253,108.66 | 253,108.66 | - |
| | Gef-Ilr Farm Animal Genetic Resources (Fangr) Asia Project-Faculty of Agriculture | 26,756,730.00 | 1,534,230.78 | 1,868,405.88 | 3,402,636.66 | - |
| | Genetic Characterization of Parasitic Resistance in Sri Lankan Indigenous Goats & their Crossbreds | 1,260,000.00 | 1,105,643.43 | 552,503.42 | 1,658,146.85 | - |
| | Laea Research (Grant - Contract No. 13012)/Ro - Fac. of Agri. | - | 89,781.20 | 52,604.40 | 142,385.60 | - |
| | Identification & establishment of baseline information of Socic -Udukubera Area | 127,600.00 | - | 792,778.80 | 792,778.80 | - |
| | Ifs effect of Endocrine Disrupter Mancozeb on Oviductal / Fallopian Tubephysiology | 156,000.00 | - | 14,746.00 | 14,746.00 | - |
| | Ifs Rice Varieties to grown in Phosphorus & Moisture Ltd & Iron Toxic Soil conditions | 1,341,430.00 | - | 143,008.00 | 143,008.00 | - |
| | Impact of the Development Projects Under the Re- Awakening Programme in 10 selected Disitricts of Sri Lanka | 3,500,000.00 | 1,375,850.00 | - | 1,375,850.00 | - |
| | India-Srilanka Conference | - | 1,739,259.65 | 1,764,599.65 | 3,503,859.30 | - |
| | Milk processing and marketing Project - Animal Science -Fac. of Agricuture | - | - | 650,190.66 | 650,190.66 | - |
| | Modeling the impacts of a variable and changing Climate on Rice and Sugarcane Agricultural Sys in Sri Lanka | 18,699,936.00 | - | 3,115,473.32 | 3,115,473.32 | - |
| | Multi Country Research Project,මහාචාර්ය බී. මාරසිංහ, කෘෂිකර්ම පීඨය | - | 329,223.60 | 780,114.83 | 1,109,338.43 | - |
| | NSF Research (Grant No Ntrp/2012/Fs/Pg-05/P-01) ආචාර්ය එස්. පද්මරාජ්, කෘෂිකර්ම පීඨය | 1,500,000.00 | - | 218,720.80 | 218,720.80 | - |
| | National Science Foundation Grant No.Rg/2006/Eb/01- ආචාර්ය උදේනි එදිරිසිංහ, කෘෂිකර්ම පීඨය | 2,322,000.00 | 2,767.50 | - | 2,767.50 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | New Jersey Agricultural Experiment Station - Faculty of Agriculture | - | 9,000.00 | - | 9,000.00 | - |
| | Nsf Research (Grant No Rg-2007-Bt-08)<br>මහාචාර්ය එච්.ඩබ්.සිරිල්, කෘෂිකර්ම පීඨය | 969,065.00 | 197,087.95 | - | 197,087.95 | - |
| | NSF Research (Grant No Rg/2011/Ag/04 )<br>මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ, කෘෂිකර්ම පීඨය | 1,364,700.00 | 554,088.76 | 231,859.00 | 785,947.76 | - |
| | NSF Research (Grant No Rg/2011/Ag/05)<br>ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර, කෘෂිකර්ම පීඨය | 1,484,952.00 | 689,689.07 | 475,513.27 | 1,165,202.34 | - |
| | NSF Research (Grant No Rg/2011/Bs/05)<br>මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි, කෘෂිකර්ම පීඨය | 2,300,095.00 | 46,803.95 | 1,110,582.95 | 1,157,386.90 | - |
| | NSF Research (Grant No Rg/2012/Ag/07 )<br>ආචාර්ය ඩබ්ලිව්.ඒ.යූ. විතාරණ, කෘෂිකර්ම පීඨය | 1,742,960.00 | - | 665,316.05 | 665,316.05 | - |
| | NSF Research (Grant No Rg/2012/Bt/01 )<br>ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ, කෘෂිකර්ම පීඨය | 2,706,350.00 | - | 2,372,328.80 | 2,372,328.80 | - |
| | NSF Research (Grant No Tg/2011/Tech/D/02)<br>ආචාර්ය කේ.පී.එස්. අමරතුංග, කෘෂිකර්ම පීඨය | 1,545,500.00 | 501,839.97 | 33,039.83 | 534,879.80 | - |
| | NSF Research (Grant No Rg/2012/Bt/01 )<br>ආචාර්ය කේ.පී.එස්. අමරතුංග, කෘෂිකර්ම පීඨය | 953,177.00 | 71,156.89 | 1,499,792.00 | 1,570,948.89 | - |
| | NSF Research (Grant No Rg/2011/Bt/01)<br>ආචාර්ය දේවිකා එම්. ද කොස්තා, කෘෂිකර්ම පීඨය | 3,581,997.00 | 1,255,610.59 | 813,604.88 | 2,069,215.47 | - |
| | NSF Research (Grant No Sida/2007/Br/04) -<br>කෘෂිකර්ම පීඨය | 1,630,860.66 | 126,245.48 | - | 126,245.48 | - |
| | NSF Research (Grant No.Nsf-Rg-2007/Bt/05)<br>ආචාර්ය දේවිකා එම්. ද කොස්තා, කෘෂිකර්ම පීඨය | 1,504,000.00 | 165,838.47 | - | 165,838.47 | - |
| | NSF Research (Grant No.Rg-09-Bio Fuel -002 )<br>කෘෂිකර්ම පීඨය | 998,000.00 | 250,000.00 | 158,942.72 | 408,942.72 | - |
| | NSF Research (Grant No.Sida/2007/Bt/01)-<br>කෘෂිකර්ම පීඨය | 2,005,067.00 | 39,527.06 | - | 39,527.06 | - |
| | NSF Research Grant No. Sida/2005/Ss/02 Prof.<br>සී, බෝගහවත්ත, කෘෂිකර්ම පීඨය | - | 4,638.88 | - | 4,638.88 | - |
| | Nutrient and Water Management of Agro Forestry System | - | - | 137,969.20 | 137,969.20 | - |
| | Pest Control | 1,875,000.00 | - | 1,011,447.70 | 1,011,447.70 | - |
| | Pest Control - 2nd Step | 1,725,000.00 | - | 157,782.00 | 157,782.00 | - |
| | Revolving Fund-Fisheries Division of the Dept.of Animal Science | - | 433,134.73 | 376,505.60 | 809,640.33 | - |
| | SAARC Australia Project meeting in Kandy | 5,070,483.00 | 3,730,813.81 | 1,498,063.74 | 5,228,877.55 | - |
| | SCF Funded by the AUS Aid | 9,874,040.00 | 2,957,740.50 | 5,773,641.33 | 8,731,381.83 | - |
| | Semi-Self funded Project of Dept. of Animal Science- Faculty of Agriculture | - | 10,248,596.53 | 11,152,469.38 | 21,401,065.91 | - |
| | ICEI Bio Fertilizer Project | 1,385,623.00 | 750,890.13 | - | 750,890.13 | - |
| | Dairy Farmeir Networks Milk Project | 7,273,800.00 | 4,545,769.50 | - | 4,545,769.50 | - |
| | ICEI Pasture Establishment Project | 460,000.00 | 109,440.00 | - | 109,440.00 | - |
| | Settlement of Expenditure for Video Product - Head Dept.of Agricultural Extension | - | - | 61,400.00 | 61,400.00 | - |
| | Short Course of Project Management | 272,100.00 | - | 159,217.61 | 159,217.61 | - |
| | Short course on Integrated Pest Management | 242,100.00 | - | 32,184.01 | 32,184.01 | - |
| | SME S Research on New Processing Technologies for Underutilized Fruits | 986,000.00 | - | 34,638.46 | 34,638.46 | - |
| | Study abroad for Students of the Michigan State University ,USA | 3,937,400.00 | - | 2,719,374.78 | 2,719,374.78 | - |
| | Study abroad for Students of the Michigan State University,USA- 1st Step | 3,656,150.00 | - | 2,955,030.84 | 2,955,030.84 | - |
| | Survey to Seek Potential Food Industry Project<br>- ආචාර්ය ජල්ප් ජයකොඩි , කෘෂිකර්ම පීඨය | - | - | 125,507.10 | 125,507.10 | - |
| | Technical Proposal for Preparation of Drought Hazard Profile for Sri Lanka Fund Ac.<br>කෘෂිකර්ම පීඨය | - | - | 64,151.01 | 64,151.01 | - |
| | Training Programme for Officials of the Ministry of Economic Development- 1st Step | 360,000.00 | 3,027,711.50 | 53,219.63 | 3,080,931.13 | - |
| | Training Programme for Officials of the Ministry of Economic Development- 2nd Step | 360,000.00 | 3,171,306.30 | 468,573.00 | 3,639,879.30 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | Training GCE(A/L) Teachers on Animal Product Development | 116,187.00 | - | 73,422.00 | 73,422.00 | - |
| | Training GCE(A/L) Teachers on Paddy Cultivation | 97,637.00 | 60,198.22 | 43,166.12 | 103,364.34 | - |
| | Training of Staff of Veterinary Officers and Dairy Farmers | 2,235,200.00 | 171,162.00 | 187,370.00 | 358,532.00 | - |
| | Training Workshop on Participatory Plant Breeding | 197,200.00 | 14,656.80 | 33,147.55 | 47,804.35 | - |
| | Training of Field Officer of "දිවි නැගුම" | 300,000.00 | 147,676.30 | - | 147,676.30 | - |
| | Training of Trainers on Cultivation Under Polytunnels Reawakning | 739,500.00 | 115,000.00 | - | 115,000.00 | - |
| | University Research Grant- ආචාර්ය එස්.එම්.සී. හිමාලි සමරවීර (Rg/2012/61/Ag) | 137,900.00 | - | 64,333.00 | 64,333.00 | - |
| | University Research Grant ආචාර්ය ජේ.පී.කේ. කීර්තිසිංහ | 23,000.00 | - | 55.75 | 55.75 | - |
| | University Research Grant- ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර | 36,000.00 | - | 15,074.00 | 15,074.00 | - |
| | University Research Grant- ආචාර්ය ඩබ්.එම්.ටී.පී. ආරියරත්න | 50,000.00 | - | 50,000.00 | 50,000.00 | - |
| | University Research Grant- ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය | 76,000.00 | - | 7,198.20 | 7,198.20 | - |
| | University Research Grant - ආචාර්ය දේවිකා එම්. ද කොස්තා, කෘෂිකර්ම පීඨය | 55,000.00 | 1,782.00 | - | 1,782.00 | - |
| | University Research Grant- ආචාර්ය දේවිකා එම්. ද කොස්තා, (Rg/2012/01/Ag) | - | - | 61,108.37 | 61,108.37 | - |
| | University Research Grant- ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ, (Rg/2012/12/Ag) | 89,000.00 | - | 76,290.50 | 76,290.50 | - |
| | University Research Grant ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ, කෘෂිකර්ම පීඨය (Rg/2012/10/Ag) | 50,000.00 | - | 35,500.00 | 35,500.00 | - |
| | University Research Grant- ආචාර්ය ජේ.වී.විදානාරච්චි (Rg/2012/03/Ag) | 98,000.00 | - | 60,653.00 | 60,653.00 | - |
| | University Research Grant - ආචාර්ය ඩී.ආර්.ආර්.එම්.ෆොන්සේකා, කෘෂිකර්ම පීඨය | 60,000.00 | 30,093.00 | - | 30,093.00 | - |
| | University Research Grant - ආචාර්ය ආර්.පී. කරුණාගොඩ, කෘෂිකර්ම පීඨය | 100,000.00 | 8,730.62 | - | 8,730.62 | - |
| | University Research Grant - ආචාර්ය ඩබ්.ඒ.යූ. විතාරණ, කෘෂිකර්ම පීඨය | 75,000.00 | 1,859.70 | - | 1,859.70 | - |
| | University Research Grant- ආචාර්ය ඩබ්.ඒ.යූ. විතාරණ, (Rg/2012/60/Ag) | 70,500.00 | - | 65,924.78 | 65,924.78 | - |
| | University Research Grant - ඩී.වී.පී. ප්‍රසාද් මයා, කෘෂිකර්ම පීඨය | 35,000.00 | 5,000.00 | - | 5,000.00 | - |
| | University Research Grant - එන්.යූ. ජයවර්ධන මිය, කෘෂිකර්ම පීඨය | 80,000.00 | 11,864.95 | - | 11,864.95 | - |
| | University Research Grant - මහාචාර්ය ඩී. අහංගම, කෘෂිකර්ම පීඨය | 63,000.00 | 63,000.00 | - | 63,000.00 | - |
| | University Research Grant - Research (Grant No Rg/2008/Ag/01)- කෘෂිකර්ම පීඨය | - | 284,138.00 | - | 284,138.00 | - |
| | University Research Grant - Research (Grant No Rg/2008/Ag/06)- කෘෂිකර්ම පීඨය | - | 17,819.13 | - | 17,819.13 | - |
| | University Research Grant- ආචාර්ය බී.සී. ජයවර්ධන | 55,000.00 | 35,149.66 | - | 35,149.66 | - |
| | University Research Grant- ආචාර්ය අයි.ඩී.බී. සූරියගොඩ | 50,000.00 | 48,158.00 | - | 48,158.00 | - |
| | University Research Grant ආචාර්ය දේවිකා වීරහේවා | - | 30,000.00 | - | 30,000.00 | - |
| | University Research Grant- ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය | 75,000.00 | 47,847.40 | - | 47,847.40 | - |
| | University Research Grant- ආචාර්ය දේවිකා එම්. ද කොස්තා, | 85,832.00 | 19,947.63 | - | 19,947.63 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (Rg/2012/01/Ag) | | | | | |
| | University Research Grant ආචාර්ය එච්.එම්.වී.ජී. හේරත් (Rg/2012/08/Ag) | 99,555.00 | 22,100.00 | 66,055.00 | 88,155.00 | - |
| | University Research Grant- ආචාර්ය ජේ.පී. කීර්තිසිංහ (Rg/2012/11/Ag) | 84,000.00 | 5,576.00 | 18,799.22 | 24,375.22 | - |
| | University Research Grant- ආචාර්ය ඒ.ජේ. මොහොට්ටි (Rg/2012/07/Ag) | 99,700.00 | 44,248.00 | 66,815.00 | 111,063.00 | - |
| | University Research Grant- ආචාර්ය ඒ.ජේ. මොහොට්ටි (Rg/2012/13/Ag) | 11,200.00 | 69,734.40 | 21,423.60 | 91,158.00 | - |
| | University Research Grant- ආචාර්ය පී.සී.ජී. බණ්ඩාරනායක (Rg/2012/09/Ag) | 120,193.00 | 6,160.00 | 103,933.00 | 110,093.00 | - |
| | University Research Grant- කේ.ආර්.එන්.එස්. රාජමන්ත්‍රි | 27,000.00 | 5,000.00 | 12,247.00 | 17,247.00 | - |
| | University Research Grant- මහාචාර්ය එස්.පී. ඉන්ද්‍රරත්න | 90,000.00 | 59,947.80 | 52.20 | 60,000.00 | - |
| | University Research Grant- මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ (Rg/2012/04/Ag) | 37,000.00 | 25,552.00 | 11,448.00 | 37,000.00 | - |
| | Vlir-Uos University Development Cooperation Of Belgium | 5,446,440.00 | - | 2,396,161.13 | 2,396,161.13 | - |
| | | **130870141.2** | **41008422.67** | **49601258.2** | **90609680.87** | - |
| ශාස්ත්‍ර | Erasmus Mundus Action 2 | - | 268,795.50 | - | - | - |
| | Mac Arther Foundation Grant | - | 18,695,018.32 | 1,988,560.00 | - | - |
| | | - | **18,963,813.82** | **1,988,560.00** | - | - |
| දන්ත | Smile Train Project | 1,000,000 | - | 4,311,470.00 | - | 100% |
| | | **1,000,000** | | **4,311,470.00** | | - |
| ඉංජිනේරු | ජේ.ජේ. විජේතුංග | - | 365,440.00 | 774,319.25 | 1,139,759.25 | - |
| | Satreps Project | - | | 4,280,998.35 | 4,280,998.35 | - |
| | Unesco Project | - | 876,520.81 | 857,228.13 | 1,733,748.94 | - |
| | | - | **1,241,960.81** | **5,912,545.73** | **7,154,506.54** | - |
| වෛද්‍ය | Emergency And Disaster Management Training Unit | 4,921,745.00 | 1,086,906.72 | 3,150,970.22 | 4,237,876.94 | 86% |
| | | **4,921,745.00** | **1,086,906.72** | **3,150,970.22** | **4,237,876.94** | - |
| විද්‍යා | RG/2012/43/S- 13.01.14.12.04 ආචාර්ය එච්.එම්.එස්.පී. මැදවල | 150,000.00 | 20,000.00 | 105,546.00 | 125,546.00 | - |
| | 13.11.14.11.04 RG/2011/ES/01(NSF) ආචාර්ය එච්.එම්.එස්.පී. මැදවල | 1,772,050.00 | 437,145.30 | 344,767.50 | 781,912.80 | - |
| | 13.10.11.120.214 RG/2010/NANO/04 මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න | 2,127,258.00 | 365,664.00 | 573,004.60 | 938,668.60 | - |
| | 13.11.14.11.05 RG/2011/NRB/08(NSF) ආචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරිය | 1,905,310.00 | 286,836.00 | 986,352.70 | 1,273,188.70 | - |
| | 13.11.14.11.03 RG/2011/NRB/03 මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල | 2,407,322.00 | 773,498.20 | 743,430.89 | 1,516,929.09 | - |
| | 13.11.14.11.02 NSF/FELLOW/2011/02 ආචාර්ය පී.ආර්.ඒ. කුමාර | 3,000,000.00 | 464,794.11 | 879,601.13 | 1,344,395.24 | - |
| | RG/2011/34/S 13.01.14.11.03 ආචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරිය | 98,200.00 | 16,691.39 | 12,884.80 | 29,576.19 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 13.11.14.11.01<br>RG/2011/NRB/01<br>ආචාර්ය ඩබ්.ඒ.අයි.පී. කරුණාරත්න | 763,800.00 | 82,036.00 | 127,187.00 | 209,223.00 | - |
| | 13.01.14.12.03<br>RG/2012/42/S<br>ආචාර්ය එම්.වයි.යූ. ගනේහේනගේ | 358,400.00 | 0.00 | 106,303.80 | 106,303.80 | - |
| | 13.11.14.12.06.<br>RG/2012/AG/03<br>ආචාර්ය ජේ.ඩබ්. දමුණුපොල | 1,651,720.00 | 0.00 | 771,916.54 | 771,916.54 | - |
| | 13.01.14.12.07<br>RG/2012/CG-1/46/S<br>ආචාර්ය පී.ඒ.ඩී. පෙරේරා | 140,000.00 | 3,394.72 | 139,354.50 | 142,749.22 | - |
| | 13.42.14.11.01<br>(Nature's Beauty creations Ltd.)<br>මහාචාර්ය ඒ.එන්. නවරත්න | 817,000.00 | 220,114.00 | 8,429.00 | 228,543.00 | - |
| | 13.01.14.11.07<br>RG/2011/38/S<br>ආචාර්ය ඩබ්.ඒ.අයි.පී. කරුණාරත්න | 50,000.00 | 20,560.00 | 0.00 | 20,560.00 | - |
| | 13.01.14.11.02<br>RG/2011/33/S<br>ආචාර්ය ජේ.ඩබ්. දමුණුපොල | 82,215.00 | 36,973.08 | 4,495.00 | 41,468.08 | - |
| | 13.01.14.11.06<br>RG/2011/37/S<br>ආචාර්ය ඒ.එම්.ටී.ඒ. ගුණරත්න | 55,000.00 | 22,949.22 | 0.00 | 22,949.22 | - |
| | 13.01.14.11.05<br>RG/2011/36/S<br>ආචාර්ය ආර්.එස්. රාජකරුණා | 60,000.00 | 19,846.00 | 0.00 | 19,846.00 | - |
| | 13.01.14.11.04<br>RG/2011/35/S<br>ආචාර්ය එස්.බී.එස්.එස්. සූරියපතිරණ | 175,000.00 | 31,921.50 | 140,078.50 | 172,000.00 | - |
| | 13.01.14.11.08<br>RG/2011/48/S<br>ආචාර්ය පී.ඒ.ඩී. පෙරේරා | 89,235.63 | 71,866.00 | 0.00 | 71,866.00 | - |
| | 13.01.14.12.08<br>RG/2012/CG-1/47/S<br>ආචාර්ය ඒ.එම්.ටී.ඒ. ගුණරත්න | 76,000.00 | 10,400.00 | 18,526.00 | 28,926.00 | - |
| | 13.01.14.12.09<br>RG/2012/CG-1/48/S<br>ආචාර්ය ජේ.ඩබ්. දමුණුපොල | 95,350.00 | 0.00 | 82,911.32 | 82,911.32 | - |
| | 13.01.14.11.01<br>RG/2011/32/S<br>ආචාර්ය එම්.පී.එස්. කුඹුරේගම | 75,000.00 | 38,976.00 | 17,838.00 | 56,814.00 | - |
| | 13.01.14.12.10<br>RG/2012/CG-1/49S<br>ආචාර්ය එම්.පී.එස්. කුඹුරේගම | 200,000.00 | 0.00 | 146,418.80 | 146,418.80 | - |
| | 13.01.14.12.01<br>RG/2012/40/S<br>ආචාර්ය ආර්.එස්. රාජකරුණා | 148,000.00 | 0.00 | 128,154.99 | 128,154.99 | - |
| | 13.01.14.12.02<br>RG/2012/41/S<br>ආචාර්ය එම්.ඒ.එස්.පී.කේ. මල්ලවආරච්චි | 313,000.00 | 0.00 | 263,318.04 | 263,318.04 | - |
| | 13.01.14.13.02<br>RG/2013/14/S<br>ආචාර්ය ඩබ්.එම්.සී.එස්. විජේසුන්දර | 123,000.00 | 0.00 | 46,425.00 | 46,425.00 | - |
| | 13.01.14.13.03<br>RG/2013/15/S<br>ආචාර්ය පී.ඒ.ඩී. පෙරේරා | 150,000.00 | 0.00 | 58,690.70 | 58,690.70 | - |
| | 13.01.14.13.01<br>RG/2013/13/S<br>ආචාර්ය එස්.සී.කේ. රූබසිංහ | 156,780.00 | 0.00 | 96,195.00 | 96,195.00 | - |
| | 13.01.14.13.04<br>RG/2013/16/S<br>මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න | 168,500.00 | 0.00 | 157,000.00 | 157,000.00 | - |
| | | | **2,923,665.52** | **5,958,829.81** | **8,882,495.33** | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පශු වෛද්‍ය පීඨය | IAEA-RCM Onresidue Screening Project-<br>මහාචාර්ය පී. අබේනායක | 7,644,404.00 | 442,784.15 | 1,145,638.63 | 1,674,059.62 | - |
| | Teasdale-corti Veterinary Public Health Project<br>මහාචාර්ය පී. අබේනායක | 20,987,263.07 | - | 18,615.40 | 6,126,117.90 | - |
| | EU-Asia Link Elephant Project-<br>ආචාර්ය එන්.කේ. ජයසේකර | 10,071,494.00 | - | 39,523.40 | 5,539,922.66 | - |
| | Partnership Programme with Royal Vet.College- ආචාර්ය ආර්.එස්. කළුපහණ | 1,291,684.40 | - | 1,072,088.96 | 1,856,926.16 | - |
| | IAEA Research Grant-<br>මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | 1,350,000.00 | - | 770,872.80 | 1,577,624.68 | - |
| | Dairy Cattle & Buffalo Improvement Project-<br>ආචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර | 2,235,200.00 | 310,220.60 | 177,323.60 | 1,994,807.25 | - |
| | Who listen to Whom? Interspecific Communication between Common Palm Squirrels and Yellow-Billed Babblers for Predator Awareness | 1,105,000.00 | - | 447,221.61 | 447,221.61 | - |
| | Use ofirradiated Larval Vaccine to Control Haemonchosis in Goats in Sri Lanka -<br>මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | 2,075,314.00 | 721,107.10 | 724,445.78 | 1,445,552.88 | - |
| | Genetic Characterization of Sri Lankan Indigenous Goats using Dna based Technologies -<br>ආචාර්ය එච්.බී.එස්. ආරියරත්න | 2,190,000.00 | 404,104.34 | 1,200,000.00 | 1,604,104.00 | - |
| | The Effect of Lipid Peroxidation on Keeping Quality of Tilapia Preserved using different methods -<br>ආචාර්ය ඩී.එම්.එස්. මුණසිංහ | 1,850,000.00 | - | 494,428.89 | 494,428.89 | - |
| | Epidemiological Studies on Mastitis In Central Province-ආචාර්ය එල්.එන්.ඒ. ද සිල්වා | 500,000.00 | 968,823.40 | 435,280.18 | 1,646,361.21 | - |
| | Production of Genetically Superior Goat Breed Dry Zone of Sri Lanka-<br>ආචාර්ය පී.ඒ.බී.ඩී.ඇලෙක්සැන්ඩර් | 280,000.00 | - | - | - | - |
| | Rapid Diagnosis & Control of Mycobacterium Infection in Fish-ආචාර්ය ඒ. අරුල්කාන්තන් | 310,000.00 | - | - | - | - |
| | Use offeed Supplements to Improve the Performance & Health Status of Freshwater - Prawn-ආචාර්ය එම්.එන්.එම්. ෆවුසි | 500,000.00 | - | - | - | - |
| | Studies on the use of Dna based Techniques in the selection of animals<br>ආචාර්ය එච්.බී.එස්. ආරියරත්න | 400,000.00 | - | - | - | - |
| | Validation of Sexed-Semen Technology to produce 98% female Calves for Commercial Dairy Farmers in S.L.F. | 1,200,000.00 | - | - | - | - |
| | Rapid detection methods for economically Important Viral Dieases of Giant Tiger Shrimp-Penaeus Monodon - ආචාර්ය එම්.එන්.එම්. ෆවුසි | 860,000.00 | 90,000.00 | 168,000.00 | 258,000.00 | - |
| | Use of Irradiated Larval Vaccine to control Gastrointestinal Helminth infection in small Ruminants - මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | 2,350,000.00 | 375,917.00 | 80,365.00 | 456,282.00 | - |
| | Studies on the use of DNA based techniques in the selection of animals with higher breeding value and disease resistance in Goats -<br>ආචාර්ය එච්.බී.එස්. ආරියරත්න | 1,000,000.00 | 165,918.01 | 134,081.99 | 300,000.00 | - |
| | IAEA technical cooperation programme -<br>ආචාර්ය බැසිල් ඇලෙක්සැන්ඩර් | 842,500.00 | - | 649,400.40 | 649,400.40 | - |
| | NSF Research - Dr. N Jayasena | 445,237.00 | - | 19,500.00 | 19,500.00 | - |
| | Proteomic & trascryptomics profile / analysis of indo sri lanka haemotoxic snakes -<br>මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | 9,168,000.00 | - | - | 0.00 | - |
| | Building Research Excellence in wildlife and Human Health in Sri Lanka<br>මහාචාර්ය පී. අබේනායක | 63,011,163.00 | - | 5,974,662.62 | 5,974,662.62 | - |
| | | **131,667,259.47** | **3,478,874.60** | **13,551,449.26** | **32,064,971.88** | - |

# උපග්‍රන්ථය G – මුදල් ප්‍රකාශනය

## G1 2013 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර සඳහා රුපියල්වලින් | සටහන | දුරස්ථ මා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය | විශ්වවිද්‍යාලය | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල්වල සමාන අගය | 2 | 14,758,959 | 174,371,336 | 189,130,296 | 165,973,317 |
| අත්තිකාරම්-සැපයුම් හා සේවාවන් | 3 | - | 2,418,259 | 2,418,259 | 3,908,463 |
| සිසුන්ට අත්තිකාරම් | 4 | - | 2,950 | 2,950 | 2,950 |
| අත්තිකාරම්-විවිධ | 5 | - | 120,392,380 | 120,392,380 | 33,462,360 |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් | 6 | 6,750 | 909,732 | 916,482 | 948,399 |
| වෙනත් විශ්වවිද්‍යාලවලින්/ආයතනවලින් අයවිය යුතු මුදල් | 7 | 101,158,215 | 5,015,474 | 106,173,690 | 97,632,469 |
| විවිධ ණය ගැතියෝ/ලැබිය යුතු | 8 | - | 69,559,341 | 69,559,341 | 45,279,393 |
| භාණ්ඩ | 9 | 2,452,828 | 164,531,692 | 166,984,520 | 99,341,023 |
| මාර්ගගත භාණ්ඩ | 10 | - | 527,927 | 527,927 | 5,958,320 |
| පෙර ගෙවීම් | 11 | 7,840 | 2,775,726 | 2,783,566 | 2,265,994 |
| තැන්පතු - ඉන්දන | 12 | 83,000 | 1,366,030 | 1,449,030 | 1,406,530 |
| **මුළු ජංගම වත්කම්** | | **118,467,593** | **541,870,847** | **660,338,440** | **456,179,219** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ගිවිසුම් කඩකිරීම්වලින් ලැබිය යුතු | 13 | - | 207,394,101 | 207,394,101 | 199,081,185 |
| කාර්ය මණ්ඩල ණය | 14 | 2,680,529 | 120,422,757 | 123,103,287 | 119,411,262 |
| ආයෝජන සීමා කළ මුදල් | 15 | - | 148,669,697 | 148,669,697 | 132,528,997 |
| ආයෝජන - වෙනත් මුදල් | 16 | - | 582,567,935 | 582,567,935 | 729,184,832 |
| ජීවවිද්‍යාත්මක වත්කම් | 17 | - | 8,115,588 | 8,115,588 | 8,535,465 |
| කෙරීගෙන යන වැඩ | 18 | - | 440,405,476 | 440,405,476 | 626,794,904 |
| දේපල, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 19 | 3,460,397 | 10,418,835,456 | 10,422,295,853 | 10,186,953,352 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **6,140,926** | **11,926,411,011** | **11,932,551,937** | **12,002,489,996** |
| **මුළු වත්කම්** | | **124,608,519** | **12,468,281,859** | **12,592,890,377** | **12,458,669,215** |
| **ජංගම වගකීම්** | | | | | |
| **විවිධ තැන්පතු** | | | | | |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් | 20 | - | 4,462,764 | 4,462,764 | 7,935,844 |
| විවිධ ණය හිමියන් | 21 | - | 29,241,435 | 29,241,435 | 29,241,435 |
| උපචිත වියදම් | 22 | 622,902 | 218,601,423 | 219,224,325 | 112,386,311 |
| Accrued expenses | 23 | 25,790,507 | 163,964,385 | 189,754,892 | 83,781,737 |
| **මුළු ජංගම වගකීම්** | | **26,413,409** | **416,270,007** | **442,683,415** | **233,345,327** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම පාරිතෝෂිත | 24 | 5,888,148 | 753,641,296 | 759,529,444 | 731,675,069 |
| බැදුම්කර කඩ කිරීම් | 25 | - | 202,093,247 | 202,093,247 | 199,081,185 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **5,888,148** | **955,734,543** | **961,622,690** | **930,756,254** |
| **මුළු වගකීම්** | | **32,301,556** | **1,372,004,550** | **1,404,306,106** | **1,164,101,581** |
| **ශුද්ධ වත්කම්** | | **92,306,963** | **11,096,277,309** | **11,188,584,272** | **11,294,567,634** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ප්‍රාග්ධන මුදල්වල සමාන අගය** | | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ | 26 | 396,935 | 1,373,631,686 | 1,374,028,620 | 1,119,878,101 |
| ප්‍රාග්ධන ප්‍රදාන-වියදම් කළ වැඩ කෙරීගෙන යන | 27 | - | 360,375,337 | 360,375,337 | 590,957,566 |
| ප්‍රාග්ධන ප්‍රදාන-වියදම් නොකළ ගොඩනැගිලි | 28 | - | 209,482,792 | 209,482,792 | 60,466,955 |
| ප්‍රාග්ධන ප්‍රදාන-වියදම් නොකළ උපකරණ, ලී බඩු පුස්තකාල පොත් | 29 | - | (197,083,033) | (197,083,033) | (8,670,072) |
| පුනරුත්ථාපන ප්‍රදාන- spent capital nature කෙරීගෙන යන වැඩ | 30 | - | 80,030,140 | 80,030,140 | 36,725,280 |
| පුනරුත්ථාපන ප්‍රදාන-වියදම් නොකළ | 31 | - | (19,696,313) | (19,696,313) | 90,470 |
| පරිත්‍යාග ගොඩනැගිලි-දන්ත වෛද්‍ය පීඨය | | - | 1,225,101,020 | 1,225,101,020 | 1,225,101,020 |
| පරිත්‍යාග වත්කම් | 32 | 1,468,164 | 1,694,425,780 | 1,695,893,943 | 1,621,712,233 |
| පරිත්‍යාග ගොඩනැගිලි-විදෙස් හා දේශීය | | - | 585,377,836 | 585,377,836 | 585,377,836 |
| | | **1,865,098** | **5,311,645,245** | **5,313,510,343** | **5,231,639,389** |
| **මුදල්වල සමාන අගයේ වෙනත් කොටස්** | | | | | |
| වෙනත් මුදල් | 33 | - | 636,174,923 | 636,174,923 | 524,887,351 |
| Endowment fund | 34 | - | 151,158,037 | 151,158,037 | 135,769,553 |
| ශිෂ්‍යාධාර මුදල් | | - | 42,400 | 42,400 | 42,400 |
| පර්යේෂණ ප්‍රදාන | 35 | - | 68,019,735 | 68,019,735 | 81,649,107 |
| විශේෂ ප්‍රදාන | 36 | - | 2,365,387 | 2,365,387 | 2,441,632 |
| පරිත්‍යාග | | - | 60,038 | 60,038 | 60,038 |
| ස්ථාවර වත්කම් ප්‍රතිගණන ශේෂය | 37 | 4,742,659 | 9,965,988,493 | 9,970,731,152 | 9,977,675,545 |
| සාමාන්‍ය ශේෂය | | 85,699,206 | (5,039,176,949) | (4,953,477,743) | (4,659,597,382) |
| | | 90,441,864 | 5,784,632,064 | 5,875,073,929 | 6,062,928,245 |
| **මුළු ශුද්ධ වත්කම්/සමාන අගය** | | **92,306,963** | **11,096,277,309** | **11,188,584,272** | **11,294,567,634** |

# G2 2013 දෙසැම්බර් 31 දිනට මුදල් කාර්ය සාධන ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර සඳහා<br>රුපියල්වලින් | සාමාන්‍ය | දු.හා.අ. අ.ම. | විශ්වවිද්‍යාලය | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **ආදායම්** | | | | | |
| රජයේ ප්‍රදාන-පුනරාවර්ථන | | - | 2,521,448,830 | 2,521,448,830 | 2,267,351,203 |
| ශිෂ්‍යාධාර | | - | 13,423,100 | 13,423,100 | 11,356,900 |
| මහපොල | | - | 15,531,950 | 15,531,950 | 15,119,650 |
| වෙනත් මුදල් | 38 | - | 430,178,886 | 430,178,886 | 226,866,077 |
| | | **-** | **2,980,582,766** | **2,980,582,766** | **2,520,693,830** |
| **වෙනත් ආදායම්** | | | | | |
| නඩත්තුව සඳහා පුනරුත්ථාපන ප්‍රදාන | | - | 37,843,444 | 37,843,444 | 13,453,598 |
| ජාත්‍යන්තර මට්ටමට පත්වීම සඳහා ප්‍රදාන | | - | 16,625,728 | 16,625,728 | 4,267,097 |
| ආයෝජනවල පොළිය | | - | 74,847,141 | 74,847,141 | 56,297,549 |
| කාර්ය මණ්ඩල ණය පොළිය | | 126,751 | 5,018,593 | 5,145,344 | 4,480,418 |
| දේපලවල කුලිය | | - | 7,460,268 | 7,460,268 | 6,456,585 |
| පැරණි ද්‍රව්‍ය අලෙවිය | | - | 3,701,182 | 3,701,182 | - |
| නිෂ්පාදන අලෙවිය | | - | 635 | 635 | 38,285 |
| විවිධ ලැබීම් | 39 | 737,050 | 19,199,471 | 19,936,521 | 8,400,134 |
| ලියාපදිංචි ගාස්තු :ප්‍රථම උපාධි* | | 2,640,939 | 9,681,469 | 12,322,408 | 43,537,498 |
| ලියාපදිංචි ගාස්තු :පශ්චාත් උපාධි* | | - | 268,000 | 268,000 | - |
| උපකාරක පංති ගාස්තු : පශ්චාත් උපාධි* | | - | 3,124,950 | 3,124,950 | - |
| විභාග ගාස්තු :ප්‍රථම උපාධි* | | 37,338,887 | 126,215 | 37,465,102 | 10,702,808 |
| විභාග ගාස්තු :පශ්චාත් උපාධි* | | - | 625,000 | 625,000 | - |
| ප්‍රකාශන අලෙවිය | | 94,115 | 17,915 | 112,030 | 920,771 |
| පුස්තකාල දඩ මුදල් | | - | 391,280 | 391,280 | 135,067 |
| වෛද්‍ය ගාස්තු | | - | 1,767,600 | 1,767,600 | 256,000 |
| විදෙස් ශිෂ්‍ය ආදායම | 40 | - | 36,970,240 | 36,970,240 | 32,669,391 |
| සහාය ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාවය | 41 | 25,403,356 | 12,810,215 | 38,213,571 | 18,355,273 |
| | | **66,341,099** | **230,479,345** | **296,820,444** | **199,970,475** |
| | | **66,341,099** | **3,211,062,111** | **3,277,403,210** | **2,720,664,304** |
| **අඩුකිරීම්** | | | | | |
| ණය ගෙවීම් සඳහා මාරු කළ | | - | 4,966,329 | 4,966,329 | 4,426,129 |
| විදෙස් ශිෂ්‍ය ආදායම | | - | 1,374,456 | 1,374,456 | 6,124,660 |
| | | **-** | **6,340,785** | **6,340,785** | **10,550,790** |
| | | **66,341,099** | **3,204,721,326** | **3,271,062,425** | **2,710,113,514** |
| **වියදම්** | | | | | |
| පුද්ගල වේතන | | 15,620,632 | 2,346,757,345 | 2,362,377,978 | 1,940,878,600 |
| ප්‍රවාහන | | 28,114 | 9,851,054 | 9,879,168 | 6,023,970 |
| සැපයුම් | | 3,272,602 | 165,107,422 | 168,380,024 | 122,668,198 |
| නඩත්තු | 42 | 493,798 | 25,602,432 | 26,096,230 | 15,314,022 |
| කොන්ත්‍රාත් සේවා | | 4,876,852 | 320,776,218 | 325,653,070 | 275,761,994 |
| සිසුන්ට මුදල් උපකාර | | - | 28,955,050 | 28,955,050 | 26,476,550 |
| ක්ෂයවීම් | | 1,182,875 | 503,467,154 | 504,650,029 | 474,776,103 |
| වෙනත් වියදම් | | 40,063,534 | 145,000,674 | 185,064,208 | 90,371,069 |
| වෙනත් අරමුදල් | 43 | - | 315,879,254 | 315,879,254 | 163,112,894 |
| | | **65,538,406** | **3,861,396,604** | **3,926,935,011** | **3,115,383,400** |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය** | | **802,693** | **(656,675,278)** | **(655,872,586)** | **(405,269,886)** |
| **<u>සිසුවෙකු සඳහා පිරිවැය</u>** | | | | | |
| **ක්ෂයවීම් සහිත** | | | | **378,795** | **292,366** |
| **ක්ෂයවීම් තොරව** | | | | **325,005** | **244,960** |
| **සිසුවෙකු සඳහා රජයේ පුනරාවත්ථන ප්‍රදාන** | | | | **269,386** | **227,076** |

# G3 2013 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා<br>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | 2013 | 2012 |
|---|---|---|
| **සාමාන්‍ය ක්‍රියාකාරකම්වල අතිරික්ත/හිඟය** | (655,872,586) | (405,269,886) |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂයවීම් | 504,650,029 | 474,776,103 |
| පාරිතෝෂික හා ගැලපීම් | 95,198,770 | 80,067,412 |
| පසුගිය වර්ෂයේ ශුද්ධ ගැලපීම | 86,010,155 | (743,423) |
| වෙනත් මුදල් සඳහා ගැලපීම | - | (63,753,183) |
| පොලී ආදායම | (74,847,141) | 56,297,549 |
| විදෙස් ශිෂ්‍ය ආදායම | (36,970,240) | |
| වැඩ මූලධන වෙනස්කම් කිරීමට පෙර මෙහෙයුම් අතිරික්ත (හිඟ) | **(81,831,014)** | **141,374,572** |
| **මූලධන වැඩ වෙනස්කම්** | | |
| තොග (වැඩිවීම්) / අඩුවීම් | (67,643,496) | (1,864,700) |
| මාර්ගගත භාණ්ඩ (වැඩිවීම්)/අඩුවීම් | 5,430,393 | 906,532 |
| බැදුම්කර කඩකිරීමෙන් ලැබිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | (8,312,917) | (55,749,228) |
| වෙනත් විශ්වවිද්‍යාවලින්/ආයතනවලින් අයවිය යුතු මුදල් (වැඩිවීම්)/අඩුවීම් | (8,541,220) | (92,991,325) |
| විවිධ ණයකරුවන්/ලැබිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | 26,098,239 | (12,968,948) |
| අත්තිකාරම්-සැපයුම් හා සේවාවන් (වැඩිවීම්)/අඩුවීම් | 1,490,204 | (1,037,409) |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් (වැඩිවීම්)/අඩුවීම් | (3,692,025) | (3,629,136) |
| අත්තිකාරම් විවිධ (වැඩිවීම්)/අඩුවීම් | (86,930,019) | (19,109,552) |
| පෙර ගෙවීම් (වැඩිවීම්)/අඩුවීම් | (517,572) | (783,906) |
| තැන්පතු (වැඩිවීම්)/අඩුවීම් | (42,500) | 673,869 |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් ලැබි ය යුතු මුදල් (වැඩිවීම්)/අඩුවීම් | - | 37,841,644 |
| විවිධ ණයකරුවන් (වැඩිවීම්)/අඩුවීම් | 106,838,014 | 46,860,009 |
| උපචිත වියදම්(වැඩිවීම්)/අඩුවීම් | 105,973,155 | 36,896,827 |
| ගෙවන ලද පාරිතෝෂිත (වැඩිවීම්)/අඩුවීම් | (67,344,394) | (44,929,845) |
| කාර්ය මණ්ඩලයට ණය (වැඩිවීම්)/අඩුවීම් | (3,692,025) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(79,025,154)** | **31,489,406** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම්වලට එකතු කිරීම් | (524,647,417) | (198,480,202) |
| කෙරීගෙන යන වැඩ සඳහා එකතු කිරීම් | (131,524,168) | (124,247,283) |
| සීමා කළ මුදල් ආයෝජන I | (16,140,700) | 7,401,051 |
| සීමා කළ මුදල් ආයෝජන II | 146,616,897 | (146,225,108) |
| පොලී ආදායම | 71,151,536 | 45,038,968 |
| ස්වයං මූල්‍ය ව්‍යාපෘති | (247,839,841) | (163,112,894) |
| විදෙස් ශිෂ්‍ය ආදායම | 14,088,465 | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ගලනය | **(688,295,228)** | **(579,625,468)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | |
| **රජයේ ප්‍රදාන :** | | |
| උපකරණ, පොත් හා වාර සඟරා | 123,000,000 | 79,400,000 |
| ගොඩනැගිලි වැඩ සටහන් | 274,275,000 | 178,600,000 |
| මූලධන ගණයේ පුනරුත්ථාපන | 97,025,000 | 44,200,000 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන | - | 1,000,000 |
| **ස්වයං මූල්‍ය ව්‍යාපෘති** | 296,177,359 | 226,866,077 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **790,477,359** | **530,066,077** |
| **ශුද්ධ වැඩිවීම මුදල් සහ මුදල්වල සමාන අගය** | 23,156,977 | (18,069,985) |
| **වර්ෂ අආරම්භයේදී මුදල් සහ මුදල්වල සමාන අගය** | 165,973,318 | 184,043,303 |
| **වර්ෂ අවසානයේදී මුදල් සහ මුදල්වල සමාන අගය** | **189,130,296** | **165,973,318** |

## G4 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම්

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා රුපියල්වලින් | සටහන | දූ.හා.අ.අ.ම. | විශ්වවිද්‍යාලය | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | 802,693 | (656,675,278) | (655,872,585) | (405,269,886) |
| **පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය** | | 85,303,274 | (4,746,130,012) | (4,660,826,738) | (4,558,403,902) |
| **එකතු කිරීම්, පෙර වර්ෂයේ ශේෂයට ගැලපීම්** | | - | (163,999) | (163,999) | - |
| | | 85,303,274 | (4,746,294,011) | (4,660,990,737) | (4,963,673,788) |
| | | 86,105,967 | (5,402,969,289) | (5,316,863,322) | (4,963,673,788) |
| **එකතු කිරීම්** | | | | | |
| වත්කම් එකතු කිරීමේ ලාභය | 44 | - | 1,001,428 | 1,001,428 | 3,179,839 |
| විදෙස් මුදල් අත්කර ගැනීම | 45 | - | 2,047,170 | 2,047,170 | - |
| ඉවතලන වාහන ප්‍රතිගනණයේ හායනය | | - | - | - | 3,680,000 |
| පෙර වර්ෂවල ආදායම/ගැලපීම | | 2,500 | - | 2,500 | (27,579,348) |
| රජයේ ප්‍රදාන යොදා ගනිමින් මිළදී ගත් ස්ථාවර වත්කම්වල ක්ෂය වටිනාකමේ හායනය | | - | 425,446,817 | 425,446,817 | 406,803,613 |
| | | 86,108,467 | (4,974,473,874) | (4,888,365,407) | (4,577,589,684) |
| **අඩුකිරීම්** | | | | | |
| පෙර වර්ෂවල ගෙවීම්/ගැලපීම් | | 409,261 | 86,010,155 | 86,419,416 | (19,483,871) |
| වෙනත් අරමුදල්වලට මාරු කිරීම | | - | (114,299,632) | (114,299,632) | (63,753,183) |
| විදේශ ශිෂ්‍ය ආදායම | | - | (35,595,785) | (35,595,785) | - |
| ලබාගත් විදෙස් මුදල්වල හායනය | 44 | - | (2,047,170) | (2,047,170) | - |
| **ශේෂය :** | | 85,699,206 | (5,040,406,306) | (4,954,707,100) | (4,660,826,738) |
| යාපනය විශ්වවිද්‍යාලය | | - | 1,229,356 | 1,229,356 | 1,229,356 |
| **ඉදිරියට ගෙන ආ ශේෂය** | | **85,699,206** | **(5,039,176,949)** | **(4,953,477,743)** | **(4,659,597,382)** |

## G5 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාන අගය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා රුපියල්වලින් | ප්‍රාග්ධන ප්‍රදාන | රඳවාගත් ඉපයීම් | ප්‍රතිගනණ වෙන්කිරීම් | වෙනත් සංචරක කොටස් | එකතුව |
|---|---|---|---|---|---|
| 2011දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,256,621,576 | (4,558,403,903) | 9,980,475,545 | 686,859,023 | 11,365,552,240 |
| මුදල්/ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ ගණුදෙනු | (24,982,187) | - | (2,800,000) | 57,991,058 | 30,208,871 |
| කාල වකවානුව සඳහා අතිරික්තය (හිඟය) | - | (101,193,479) | - | - | (101,193,479) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,231,639,389** | **(4,659,597,382)** | **9,977,675,545** | **744,850,081** | **11,294,567,634** |
| | 81,870,954 | - | (3,300,000) | 112,970,440 | 21,603,151 |
| කාලවකවානුව සඳහා අතිරික්තය (හිඟය) | - | (293,880,361) | - | - | (94,374,365) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,313,510,343** | **(4,953,477,743)** | **9,970,731,152** | **857,820,521** | **11,188,584,272** |

# උපග්‍රන්ථය H - විගණන කමිටු වාර්තාව – 2013

(නියෝජ්‍ය අභ්‍යන්තර විගණන නිලධාරිනී පී.එම්.ටී.ඩී. පොල්ගස්දෙණිය මිය විසින් වාර්තා කරන ලද පරිදි)

## හැඳින්වීම

විගණන කමිටුව විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුකමිටුවකි. යහපාලනය සඳහා වන මහජන ව්‍යවසායක මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව පාලක සභාවේ විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකු හා ලේඛකාධිකාරිවරයා කමිටුවේ සාමාජිකයන් ලෙස සේවය කරති. උපකුලපති, රජයේ විගණන අධිකාරි හා නියෝජ්‍ය අභ්‍යන්තර විගණක පිළිවෙළින් ආරාධිත, නිරීක්ෂක හා රැස්වීම් කැඳවන්නා ලෙස රැස්වීම්වලට සහභාගි වෙති. කමිටුව විසින් ඉල්ලුම් කරන පරිදි මූල්‍යාධිකාරි, සියළුම නියෝජ්‍ය මූල්‍යාධිකාරීන් හා සියළු නියෝජ්‍ය ලේඛකාධිකාරීන් ද රැස්වීම්වලට සහභාගි වෙති. යහපාලනයේ සුවිශේෂි කොට දැක්වෙන විෂය පථයට අනුව විගණන කමිටුව ක්‍රියාකරන අතර, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහාත් මුදල් හා (මුදල්) පටිපාටීන් ඉහළ දැමීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් සිදුකරනු ලබයි.

## ජයග්‍රහණ

සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටුව අවස්ථා පහකදී රැස්වීම් අභ්‍යන්තර විගණන අංශයේ සම්බන්ධිකරණයෙන් රජයේ විගණන විමසුම්වලට පිළිතුරු දීමේ අධ්‍යයන නිවාඩු අනුමත කිරීමට පෙර බැඳුම්කර සහ ගිවිසුම් අත්සන් තැබීමේ ක්‍රියාවලින් සංවිධාන කිරීම, බැඳුම්කර කඩ කරන්නන්ගේ ගාස්තු අය කර ගැනීමේ ක්‍රියාවලිය හා බැඳුම්කර හා ගිවිසුම් පාලනය කිරීමේ ක්‍රියාවලිය, ණය හා උත්සව අත්තිකාරම් බෙදා හැරීම හා අය කර ගැනීම, ගෙවීම් ක්‍රියාපටිපාටීන් සංවිදිත කිරීමේ ක්‍රියාපටිපාටීන් සිදුකරන ආකාරය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලද අතර, විශ්වවිද්‍යාල කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉහළනැංවීම සඳහා මඟ පෙන්වන ලදි.

මාසික මුදල් තත්ත්ව ප්‍රකාශනයක් හා විගණන විමසුම්වලට පිළිතුරුදීමේ තත්ත්ව වාර්තාව පිළිවෙළ කිරීම පිළිබඳව කමිටුවට උපදෙස් ලබා දුන් අතර විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති වගකීම් හා විවිධ ක්‍රියාකාරකම්/කෘත්‍යයන්වලට අදාළ කාලවකවානු පෙන්නුම් කෙරෙන ලේඛණ පද්ධතියක් පවත්වාගෙන යෑමේ වැදගත්කම ද අවධාරණය කරන ලදි.

2012 වසරේ කෝප් වාර්තාවෙන් හා 2014 වසර සඳහාවූ විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් ඉස්මතු කොට පෙන්වන ලද කරුණුවලට අදාළ නිරීක්ෂණ හා පිළියම් පිළිබඳ දළ වාර්තාවක් විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදි. වගකිව යුතු නිලධාරින් විසින් ලබා දෙන ලද විගණන විමසුම්වල සාම්පල හා අදාළ පිළිතුරු අභ්‍යන්තර විගණන අංශයේ කෘත්‍යයන් හා ත්‍රෛමාසික ප්‍රගති වාර්තාද සමාලෝචනය කරන ලදි.

ඊට අමතරව, මෙම කමිටුව 2013 වසරේදී ලද විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය නිරතුරුවම නිරීක්ෂණ කළ අතර, වසර කීපයක් තිස්සේ අඛණ්ඩව නැවත නැවත විමසුමට ලක්වූ විගණන විමසුම් සමාලෝචනය කොට පිළියම් යෙදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

## බාධක සහ පිළියම්

2013 වසර සඳහා වූ වාර්ෂික විගණන සැලසුමෙන් සැලසුම් කළ කාර්යයන්වලින් 50% කට වඩා (දෛනික පූර්ව විගණන ක්‍රියාකාරකම් හැර) අවසන් කිරීමට අභ්‍යන්තර විගණන අංශයට නොහැකි විය. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ කටයුතු සම්බන්ධිකරණය කිරීමේ කාර්යයන් හා COPE හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වාර්තා සකස් කිරීම සහ මානව සම්පත්වල පවතින බාධක යන කරුණු මේ සඳහා බලපෑවේය.

## අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කොට ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට විගණන කමිටුව සැලසුම් සකස් කරයි.

## I1 විගණකාධිපති වාර්තාව - 2013

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } සීඑල්-1/පෙඩී/පේ/පියු/1/13/49    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date }

උපකුලපති,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
වැඩ බලන විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
2. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94 11 2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

2015 මැයි දින.

සීඑල්-1/කේඩී/ජේ/පීයූ/1/13/49

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

-----------------------------------------------------------------------------------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5), 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2014 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 මතය ව්‍යාවනය

------------------

මෙම වාර්තාවේ

2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 4,928,578 ක පුනරාවර්තන වියදම් මූලධන ප්‍රතිපාදන මඟින් ද, රු. 1,065,332 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන ප්‍රතිපාදනවලින්ද දරා තිබුණි.

(ආ) පූර්ව අධිකාරී බලයක් නොමැතිව පර්යේෂණ අරමුදල් 28 ක සහ වෙනත් අරමුදල් 11 ක ප්‍රතිපාදන ඉක්මවා පිළිවෙලින් එකතුව රු.3,321,486 ක සහ රු.2,210,359.08 ක වියදම්ද, ප්‍රතිපාදන නොමැතිව පර්යේෂණ 12 ක් සහ වෙනත් අරමුදල් 02 ක් සඳහා එකතුව රු. 360,508 ක වියදම් දරා තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම අරමුදල්වල ඍණ ශේෂයන් ධන ශේෂයන් සමඟ ගැලපීම් කොට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ සමාලෝචිත වර්ෂයේ රු.71,224,806 ක වියදම මූල්‍ය ප්‍රකාශනවල රු. 65,538,406 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ මුළු වියදම රු. 5,686,400 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය සතු රු. 4,928,561 ක දේපල, පිරියත හා උපකරණ වටිනාකමින් රු. 1,468,164 ක් වටිනා වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ අපහරණ ක්‍රියාවලිය මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද රු. 2,038,387 ක් වූ විවිධ ස්ථාවර වත්කම්වල වටිනාකම පොත්වලින් ඉවත් නොකර දීර්ඝකාලයක් තිස්සේ ගිණුම්වල දක්වා තිබීම නිසා වත්කම්වල ශුද්ධ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අයත් රු. 417,034 ක් වූ පුහුණු අත්පොත් 1913 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසන් තොග පිරිවැයට ඇතුළත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට මිලදී ගන්නා ලද රු.4,950,000 ක පරිගණක යන්ත්‍රවල පිරිවැය වටිනාකම සහ ඒ සඳහා වූ සමාලෝචිත වර්ෂයේ රු. 675,370 ක ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඌ) පසුගිය වර්ෂයට අදාළව තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පවත්වන ලද වැඩමුළු හා පාඨමාලා 16 කට ලැබිය යුතු එකතුව රු. 642,271 ක පාඨමාලා ගාස්තු අනුමැතියකින් තොරව පොදු සංචිතයෙන් කපා හැර තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල පර්යේෂණ ප්‍රදාන උපලේඛනයේ ගිණුම් අංක 1301071201 යටතේ රු. 169,895 ක ඍණ ශේෂයක් දක්වා තිබුණ නමුත්, ප්‍රධාන ලෙජර් ගිණුමේ එවැනි ශේෂයක් නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ ජාතික විද්‍යා පදනම මඟින් ලබාදී තිබූ රු. 907,424 ක් වටිනා උපකරණ සහ වෛද්‍ය පීඨයට අයත් රු. 272,067 ක භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.104,221,372 ක් වියදම් කිරීම හේතුවෙන් ඇති වී තිබුණු ඍණ ශේෂ ධන ශේෂයන් සමඟ ගලපා ශුද්ධ ප්‍රතිඵලය පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු.37,225,638 ක් වූ විදේශ ශිෂ්‍ය ආදායම, ආදායම් ප්‍රකාශයේ රු. 36,970,240 ක් ලෙස දැක්වීම හේතුවෙන් විදේශ ශිෂ්‍ය ආදායම් රු.255,398 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා පැවැති වර්ගීකරණය නොවූ හා ඒකක වටිනාකම් හඳුනා නොගන්නා ලද එකතුව රු.13,168,099 ක තොග ගැලපුම් ගිණුමට බැර කරන ලද ශේෂය නිරවුල් කිරීම සඳහා ආදායම් හා වියදම් විසර්ජන ගිණුමට ආදායමක් ලෙස බැර කර තිබුණි.

(කා) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිමකර භාරදී තිබුණු ශාස්ත්‍ර පීඨයේ රු.1,747,318 ක් වූ කොන්ත්‍රාත්තු 02 ක වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(කැ) පශු වෛද්‍ය පීඨයේ ශික්ෂණ රෝහල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.44,000,000 ක මුදලක් අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ අතර, වැඩ අවසන් කර

ප්‍රාග්ධනිත කිරීමේදී රු.45,471,987 ක් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් රු.1,471,987 ක් වැඩිපුර ප්‍රාග්ධනිත කර තිබුණි.

(කෑ) ශිෂ්‍යත්ව කඩකල ආචාර්යවරුන් හා නිලධාරීන් 122 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.153,137,696 ක ශේෂයක් සේවක අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(කි) මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු දේපල සඳහා 1997 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතුව රු.1,034,839 ක් වූ වරිපනම් බදු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(කී) 2007 / 2008 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ අධ්‍යයන කාලය 2012 වසරෙන් අවසන් වන අතර, එම වර්ෂයට අදාළව සිසුන් 09 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,850,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(කු) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉඩම් අක්කර 1390 රූඩ් 02 පර්චස් 21.6 ක් සහ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් සහ "සී" වර්ගයේ නිවාස 03 ක අගය තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(කූ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට උපචිත වියදම් නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා වෙන්කිරීම් කළ යුතු වුවත්, අදාළ වියදම් හඳුනා ගැනීමකින් තොරව වෙන් කිරීම් කිරීමෙන් රු. 37,733,400 ක උපචිත වියදම් අධි වෙන්කිරීමක් නිරීක්ෂණය විය.

(කෙ) ක්ෂය අඩුකළ පසු අගය ශුන්‍ය වටිනාකම් ඇති ස්ථාවර වත්කම් නැවත ප්‍රයෝජනයට ගන්නේ නම් එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළයුතු වුවද, ගත් මිල රු.1,666,744,282 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(කේ) එකතුව රු. 3,863,394 ක්වූ පර්යේෂණ අරමුදල් ශේෂ වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන ශේෂයන් වන අතර, එම ශේෂ නිරවුල් කිරීමට හෝ අදාල පර්යේෂණ සඳහා අරමුදල් යෙදවීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

විෂයයන් 03 කට අදාල එකතුව රු. 71,653,182 ක් වූ ගිණුම් ශේෂ ඊට අදාල පාලන ගිණුම්වල එකතුව වූ රු. 78,049,609 ක ශේෂ සමඟ සැසඳීමේදී රු. 6,396,427 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති බාහිර ආයතන 36 කින් අයවිය යුතු රු. 1,306,111 ක විදුලි වියදම් ද, අවු. 03 ට වැඩි කාලයක සිට ආයතන 07 කින් අයවිය යුතු රු. 512,783 ක ජල ගාස්තු ද 2013 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් නිල නිවාස සඳහා එකතුව රු. 1,026,154 ක් වූ නිවාස කුලී පදිංචිකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති බාහිර ආයතනවලින් සහ විශ්වවිද්‍යාලය සතු ඉඩම් බද්දට දීමෙන් ආයතන 07 කින් අයකර ගතයුතු රු. 231,187 ක බදු ආදායම් සහ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති ආයතන 03 කින් අවුරුදු 02 ට වැඩිකාලයක සිට අයවිය යුතු එකතුව රු. 119,145 ක දුරකථන ගාස්තු සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1980 - 2009 දක්වා කාලපරිච්ඡේදයට අදාළ විශ්වවිද්‍යාලයේ පීඨ 08 ට අදාළ සිසුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු සහ ඒ මත පැනවූ දඩ රු. 3,809,903 ක මුදලක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු. 351,774 ක් වූ නොපියවූ පර්යේෂණ අත්තිකාරම් 23 න් 11 ක් වර්ෂ 15-19 ත් අතරද, 08 ක් වර්ෂ 02-12 ත් අතර ද, 04 ක් වර්ෂ 08 - 13 ත් අතර ද විය.

(ඊ) අවුරුදු 10 කට වැඩි කාලයක සිට පැවත එන උත්සව අත්තිකාරම් ශේෂ 100 ක රු.223,827 ක එකතුවක්ද, නිලධාරීන් 05 දෙනෙකුට අදාළව 2002 සිට අක්‍රීයව තිබූ ණය ශේෂ 05 ක එකතුව රු.223,524 ක් සහ 2002 වර්ෂයේ සිට පවතින විදේශගත වූ නිලධාරීන්ගේ ණය ශේෂ 03 ක එකතුව රු. 162,987 ක්ද ඇතුළුව ලෙස මුළු වටිනාකම රු.610,338 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ පිහිටි පර්චස් 40.97 ක ඉඩම 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 30 ක කාලසීමාවක් සඳහා බදු ගිවිසුමක් මඟින් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ අතර, 1992 දෙසැම්බර් 31 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 4,720,000 ක හිඟ බිම්කුලී විශ්වවිද්‍යාලය අයකරගෙන නොතිබුණි. 2008 වර්ෂයේ එහි නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවා තිබුණ නමුත්, ඒ සඳහා විශ්වවිද්‍යාලීය කළමණාකාරීවයෙන් කිසිදු විධිමත් අනුමැතියක් ලබා දී නොතිබුණි.

(ඌ) විදේශීය සැපයුම් සේවා ලබා ගැනීම සඳහා පුද්ගලික සමාගමකට 2003 වර්ෂයේදී රු.318,892 ක් ගෙවීම් කර ඇතත්, එම සේවාව ලබාදීම සමාගම විසින් පැහැර හැර තිබූ බැවින් අදාළ මුදල අයකර ගැනීමට විශ්වවිද්‍යාලීය පරිපාලනය අසමත්ව තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 10,646,769,610 ක් වූ පහත දැක්වෙන ගිණුම් විෂයයන් 13 හි ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | --------- | ------------ | ------------------------------ |
| | | රු. | |
| (අ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා දැරූ වියදම | 84,225,964 | අදාළ අරමුණු ඉටුකර ගත් බව තහවුරු කිරීම සඳහා තොරතුරු සහ සනාථ කිරීම් ලියවිලි |
| (ආ) | විවිධ ණයහිමියන් | 1,185,993 | වටිනාකම සනාථ කර ගැනීම සඳහා උපලේඛන හා ශේෂ තහවුරු ලිපි |
| (ඇ) | ශාස්ත්‍ර පීඨයේ කථිකාචාර්යවරුන් 06 ක් සහ නිලධාරීන් 08 දෙනෙකුට ලබා දුන් විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල් | 1,264,019 | පර්යේෂණ ව්‍යාපෘති හා වාර්තා |
| (ඈ) | පීඨ 07 කට අදාළව කථිකාචාර්යවරුන් 61 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා | 11,483,905 | පර්යේෂණ වාර්තා |
| (ඉ) | ඉංජිනේරු පීඨයේ විදුලි හා විද්‍යුත් පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා කථිකාචාර්යවරුන් 05 සිදුකළ දේශන සඳහා ගෙවීම් | 351,000 | පැවැත් වූ දින, පැය සංඛ්‍යාව සහ පැයක් සඳහා ගෙවූ දීමනා |
| (ඊ) | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සේවය කිරීම වෙනුවෙන් 2012, 2013 වර්ෂ තුළදී කළ ගෙවීම් | 342,276 | හඳුන්වාදුන් නව පාඨමාලා සහ විෂය නිර්දේශ සංවර්ධනය කිරීමේ කාර්යයන් |
| (උ) | 2009 සිට 2014 වර්ෂ සඳහා හඳුනා නොගත් ලැබීම් | 46,220,699 | වටිනාකම සනාථ කිරීමට අදාළ උපලේඛන |
| (ඌ) | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන ඒකකයේ ස්ථාවර වත්කම් ප්‍රදාන | 1,468,164 | උපලේඛන සහ ලැබීම් සනාථ කිරීම් |

| | | | |
|---|---|---|---|
| (එ) | ස්ථාවර වත්කම් හා පරිගණක උපාංග | 10,422,295,853 | ස්ථාවර වත්කම් ලේඛනය සහ පරිගණක වත්කම් ලේඛනය |
| (ඒ) | A 0043 ජ'නලයෙන් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබු කොන්ත්‍රාත් වටිනාකම | 68,968,339 | කොන්ත්‍රාත් වටිනාකම්වලට අදාළ සනාථ කිරීම්, පරිවැය වටිනාකම සහතික කළ වාර්තා |
| (ඔ) | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් සහ යාපනය විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු සහ යාපනය විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු වටිනාකම් | 5,520,523 | ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම්, උපලේඛන |
| (ඕ) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු | 359,336 | ශේෂ සනාථ කිරීම් |
| (ක) | ගිවිසුම් කඩකළ ආචාර්යවරු හා නිලධාරීන් 13 දෙනෙකුගේ ඇප බැදුම්කර වටිනාකම අයකර ගැනීමට අයකර ගැනීමට අදාළ සුරක්ෂිතයන් | 3,083,539 | සේවක අර්ථසාධක අරමුදල් හිමිකාරීත්වය පිළිබඳ තොරතුරු |
| | | ------------------ | |
| | | 10,646,769,610 | |
| | | =========== | |

2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------------------ | ------------------ |
| (අ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය<br>---------------------------------- | |
| | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ xxv වැනි පරිච්ජේදයේ 2.2(ඊ) වගන්තිය | 2013 වර්ෂය තුළ සිදු වු රු. 161,470 ක වටිනාකමින් යුතු වාහන අනතුරු මඟින් සිදු වී ඇති හානි විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටස IX පරිච්ඡේදය 03 ඡේදය | පුනරාවර්තන ගිණුමට අතිකාල දීමනා ගෙවීම සඳහා ප්‍රාග්ධන වැය ගිණුමින් රු. 8,000,000 ක මුදලක් මාරු කර තිබුණි. |
| | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ 99(1) වගන්තිය | විශ්වවිද්‍යාල අරමුදලට බැර විය යුතු මුදල් රු.22,022,236 ක් පශු වෛද්‍ය පීඨය මඟින් පාලනය වන විවිධ අරමුදල් 18 ට බැර කොට තිබුණි. |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2005 පෙබරවාරි 03 දිනැති අංක 2005/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව හා සේවක අර්ථසාධක හා සේවා නියුක්ති භාරකාර අරමුදල් පනත් අනුව | එකතුව රු. 114,192 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් දායකය අදාළ අරමුදල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| | 2012 අප්‍රේල් 16 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 7/2012 සහ 2003 දෙසැම්බර් 29 දිනැති අංක 837 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, දේශන දීමනා පැයකට 1500 ක් හා ප්‍රායෝගික පුහුණු සඳහා පැයකට රු.200 ක් ගෙවිය හැකි වුවද, පුහුණු වැඩසටහන් 09 ක් සඳහා දේශන පැය 01 කට රු.1,750 ක් හා ප්‍රායෝගික පුහුණු සඳහා පැය 01 ක් සඳහා රු. 1,500 ක් බැගින් රු.160,250 ක් ගෙවා තිබීම හේතුවෙන් වැඩිපුර රු.64,150 ක් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------------------- | |
| | (i) මුදල් රෙගුලාසි 71 | ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය මානව හිමිකම් මධ්‍යස්ථානයේ කටයුතු කිරීම වෙනුවෙන් එකතුව රු. 745,520 ක දීමනා ගෙවා තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 104, 104(3) | 2011 පෙබරවාරි 08 දින අනතුරටපත් අංක CPPB - 5574 දරන වාහනයේ රු. 651,452 ක අනතුරට අදාළ ඇස්තමේන්තු වටිනාකම සම්බන්ධව හා 2013 ජුලි 31 දින ශාස්ත්‍ර පීඨයට අයත් අංක CPNB 3979 දරන වෑන් රථයට සිදු වූ රු. 27,922 ක අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 371 | i. තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය යුත්තේ අවශ්‍ය ප්‍රමාණයට වුවත් ඉංජිනේරු පීඨයේ අවස්ථාවන් |

07 කදී සහ වෛද්‍ය පීඨයේ අවස්ථා 06 කදී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර රු.192,890 ක අත්තිකාරම් ලබා දී තිබුණි.

ii. වෛද්‍ය පීඨයේ ආචාර්යවරයෙකු වෙත අවස්ථා 03 කදී රු.950,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි.

මුදල් රෙගුලාසි 371(1)

i. කෘෂිකර්ම විද්‍යා පීඨයේ එකතුව රු. 201,468 ක වටිනාකමින් යුතු අත්තිකාරම් මුදල් බාහිර ආයතන 05 ක් වෙත අවස්ථා 06 කදී ලබාදී තිබුණි.

ii. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලබාගත් එකතුව රු. 655,700 ක අත්තිකාරම් මුදල්වලින් රු. 629,760 ක් ක්‍රීඩා උපදේශවරුන් වෙත ලබා දී තිබුණි.

මුදල් රෙගුලාසි 371(2)(ආ)

ඉංජිනේරු පීඨයේ අවස්ථා 08 කදී රු.335,325 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ද, වෛද්‍ය පීඨයේ නිලධාරීන් 05 දෙනෙකුහට අවස්ථා 06 කදී එකතුව රු. 675,000 ක වටිනාකමින් යුත් අත්තිකාරමක් ද, කෘෂිකර්ම විද්‍යා පීඨයේ අවස්ථා 52 කදී එකතුව රු.2,403,993 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ද සීමාව ඉක්මවා ලබා දී තිබුණි.

මුදල් රෙගුලාසි 754, 756(1) සහ 758(1)

ඉංජිනේරු පීඨයේ වැඩ ඒකකය සතු ආයුධ හා පාරිභෝජ්‍ය භාණ්ඩ ගබඩා 02 ට අදාළව වාර්ෂික සමීක්ෂණ කටයුතු 1997 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂය දක්වා සිදුකර නොතිබුණු අතර, ඇතැම් ආයුධ දීර්ඝ කාලයක සිට පාවිච්චිය අත්හැර දමා තිබුණි.

(ඇ) චක්‍රලේඛ

-----------

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 40/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

මාස 06 කට වරක් වාහනවල ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් වගකිවයුතු මාණ්ඩලික නිලධාරී මගින් පරීක්ෂා කර බලා මාසික ඉන්ධන තුලනයට කටයුතු කළයුතු වුවත්, පශු වෛද්‍ය පීඨය සතු වාහන 10 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. එසේ වුවත්, වාහනවල ඉන්ධන සඳහා

| | |
|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළදී රු. 2,628,578 ක් වටිනා ඉන්ධන ලීටර් 21389 ක් භාවිතා කර තිබුණි. |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කළයුතු වුවද, පීය 03 ක සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ රු. 81,004,368 ක් වටිනා පරිගණක සම්බන්ධව එවැනි ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

(ඇ) කළමනාකරණ හා අභ්‍යන්තර නියෝග

-----------------------------------------

| | |
|---|---|
| 2002 සැප්තැම්බර් 21 දිනැති 307.10.2 පාලක සභා තීරණයේ 4.2 ජේදය | වර්ෂ 05 කට වරක් නිවාස කුලී සංශෝධනය කර නොතිබීම හේතුවෙන් 2008 ජනවාරි 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා රු. 11,877,000 ක කුලියක් හා 2013 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට 2013 වර්ෂයට අදාළව රු.5,344,650 ක කුලියක් විශ්වවිද්‍යාලය විසින් අඩුවෙන් අයකර තිබුණි. |

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 835(2)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස මෙම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා අගුනාවල සහ කිරිබත්කුඹුර ප්‍රදේශවලින් ගොඩනැගිලි 03 ක් මසකට රු. 196,000 ක් බැගින් වර්ෂයකට කුලිය රු.2,352,000 ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඊට අදාලව මාස 06 ක කුලිය ගෙවා තිබුණි.

(ආ) ස්ථිර සේවයේ නියුතු අචාර්යවරුන් සිටියදී එම විෂයන් ඉගැන්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ශාස්ත්‍ර පීඨයේ විෂයයන් 103 ක් හා ඉංජිනේරු පීඨයේ විෂයයන් 20 ක් සඳහා පිළිවෙලින් රු.4,652,160 ක් හා රු. 1,132,322 ක්ද ලෙස භාහිර දේශකයින්ට දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) 1990 පෙබරවාරි 06 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 422 චක්‍රලේඛය, 1994 ජුනි 14 දිනැති ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 95 චක්‍රලේඛයේ 02 වගන්තිය, 2003 ජනවාරි 09 දිනැති අංක PEI/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ

චක්‍රලේඛය යන චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව අනුමැතියකින් තොරව, පාඨමාලා සම්බන්ධීකරණ දීමනා වශයෙන් රු.628,800 ක්ද, ගෞරවාන්විත දීමනා වශයෙන් රු.102,500 ක්ද, පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් රු.84,500 ක්ද ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 655,872,586 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.405,269,886 ක ඌනතාවයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය රු.250,602,700 කින් වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇතිකර එහි අරමුණු ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා දී තිබුණි. මේ සඳහා කිසිදු සැලැස්මකින් තොරව අරමුණු හා ඉලක්කවලට පරිභාහිරව රු. 84,255,964 ක් වැයකර පීඨ සඳහා කාර්යාල උපකරණ සහ වැටුප් හා දීමනා ලබා දීම සිදුකර තිබුණි.

(ii) ජාත්‍යන්තර වැඩමුළුවලට සහභාගී වීම සඳහා කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයින් වෙනුවෙන් රුපියල් මිලියන 04 ක මුදලක් වෙන්කර රු. 7,371,998 ක් වැයකර ඇතැත් කිසිදු ශිෂ්‍යයකු හෝ ආචාර්යවරයෙකු එම අරමුණු සඳහා යොදවාගෙන නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාල පනතේ 101(ඇ) වගන්තියට අනුව නිශ්චිත අරමුණක් සඳහා ලැබුණු මුදල් එම කාර්යයට පරිභාහිර කාර්යය සඳහා වැය නොකළ යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි ඉකුත් වර්ෂයේ විශ්වවිද්‍යාලීය මූලධන ප්‍රතිපාදන මඟින් රු. 4,033,627 ක මුදලක් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ වියදම් සඳහා වැය කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ II 27(1) වන වගන්තිය ප්‍රකාරව, අධ්‍යයන නිවාඩු ලබාගත හැකි උපරිම කාල සීමාව මාස 39 ක් වුවද, 2003 වර්ෂයේ ආචාර්ය උපාධියක් ලබා ගැනීම සඳහා මාස 06 වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබුණු

කථිකාචාර්යවරියක් සඳහා නැවත එංගලන්තයේ ලීසෙස්ටර් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා 2007 සිට 2012 දක්වා මාස 50 කුත් දින 09 ක් ලබාගෙන ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ආචාර්ය උපාධිය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් මෙම කථිකාචාර්යවරිය විදේශගත වූ බවට සනාථ කර ගත හැකි සාක්ෂි වන විදේශ ගමන් බලපත්‍රය සහ ලබාගත් ආචාර්ය උපාධි සහතිකය විගණනයට ඉදිරිපත් නොවුණු අතර, විශ්වවිද්‍යාල අරමුදලින් ඇය වෙනුවෙන් දරා ඇති රු. 2,426,474 ක මුදල ඵලදායී වැටුප් වශයෙන් නිරීක්ෂණය නොවුණි.

(ඈ) ඉංජිනේරු පීඨයේ වාහන වැඩ ඒකකය 2013 මාර්තු මාසයේදී ආරම්භ කර සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් හා දීමනා සඳහා රු.1,529,610 ක වියදමක් දරා තිබුණු නමුත්, විශ්වවිද්‍යාලය සතු සෑම වාහනයක්ම වාහන වැඩ ඒකකය වෙත අලුත්වැඩියාවන් සහ නඩත්තු සඳහා යොමුකර නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේදී ද රු. 10,186,609 ක වියදමක් දරමින් වාහන පුද්ගලික ආයතන මඟින් අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදු කර තිබුණි.

(ඈ) පශු වෛද්‍ය පීඨයේ ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ගොවිපල කළමණාකරුවකු අනුමත කර තිබුණද, විගණන දිනය වූ 2014 ජනවාරි 17 දින වන විටත්, වර්ෂය තුළ පර්යේෂණ අරමුදල්වලින් රු. 251,336 ක් වැටුප් ගෙවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති නිලධාරියෙකුහට මාවලවත්ත ගොවිපලේ අධික වටිනාකමකින් යුක්ත වූ සතුන් හා දේපලවල භාරකාරීත්වය හා වගකීම පවරා තිබුණි.

(ඉ) පශු වෛද්‍ය රෝහල සඳහා මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව, නව තනතුරු ඇතිකිරීමට සහ අනුමත සේවක සංඛ්‍යාව වැඩිකිරීමට කටයුතු කර නොමැතිව පශු වෛද්‍ය රෝහල නඩත්තු අරමුදලින් සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 1,213,597 ක වැටුප් ගෙවමින් තාවකාලික පදනමින් සේවකයින් 10 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඊ) 2013 ජනවාරි 14 දිනැති ඒ/05 ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගේ (පාලන) ලිපිය පරිදි 2013 වර්ෂය තුළදී හදිසි රාජකාරී ගමන් සඳහා පීඨයේ වාහන ප්‍රමානවත් නොවේ නම් වෙනත් පීඨයකින් වාහනයක් සපයා ගතයුතු අතර එසේ නොහැකිනම් පමණක් පෞද්ගලික වාහනයක සේවය ලබා ගැනීම කළයුතු වුවත්, පශු වෛද්‍ය පීඨය සතුව වාහන 08 ක් තිබියදී 2013 වර්ෂයේ පෞද්ගලික වාහන සැපයුම්කරුවකුගේ සේවය ලබාගෙන පර්යේෂණ අරමුදල්වලින් පෞද්ගලික වාහන සැපයුම්කරුට රු.531,019 ක් ගෙවා තිබුණි.

(උ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයින්ගේ අධ්‍යයන පර්යේෂණ සඳහා වූ රසායනාගාර 05 ක් මඟින් සිදුකළ යුතු අධ්‍යයන පර්යේෂණ වෙනුවට විශ්වවිද්‍යාලයේ මානව හා භෞතික සම්පත් උපයෝගී කර ගෙන සාමාන්‍ය රාජකාරී වේලාවේදී බාහිර පාර්ශවයන්ගෙන් පරීක්ෂණ භාර ගෙන පරීක්ෂණ වාර්තා නිකුත් කර ඒ සඳහා 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.6,137,738 ක් සහ රු.13,362,371 ක ආදායමක් උපයා ගෙන ඉන් පිළිවෙලින් රු.3,521,704 ක් සහ රු.4,136,194 ක් රසායනාගාර තුළ සේවය කරන රසායනාගාර භාර

කථිකාචාර්යවරුන් සහ රසායනාගාර කාර්යභාර නිලධාරීන් සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ107(6)(අ) වගන්තිය අනුකූල නොවන පරිදි ගෙවා තිබුණි.

(ඌ) මූලධන ගෙවීම් යටතේ නේවාසිකාගාර සඳහා බෙදා දීමට 2013 මාර්තු 05 දින රු.5,366,770 ක වටිනාකමින් යුතු ලී පුටු සහ ලී මේස මිලදී ගෙන තිබූ අතර, ඒවා නියමිත පිරිවිතරවලට අනුකූල නොවූ අතර, එයින් රු. 417,600 ක් වටිනා මේස 36 ක් 2014 ජනවාරි 31 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(එ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ 08 පරිච්ඡේදයේ 6.2 ඡේදය ප්‍රකාරව, රජයේ සේවයෙන් ලබාගත් පුහුණුව සහ දැනුම භාවිතා කරමින් කාර්යාල වේලාවෙන් බැහැරව හෝ අනුමැතියක් ඇතිව කාර්යාලීය වේලාව තුළ කරනු ලබන කාර්යාලීය නොවන වැඩ වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් සියයට 10 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වුවත්, පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන කථිකාචාර්යවරුන් 07 දෙනෙකුහට ගෙවන ලද සම්බන්ධීකරණ ගාස්තුවලින් සියයට 10 ක් වූ රු.43,000 ක් විගණන දින වූ 2014 ජනවාරි 20 වන විටත් විශ්වවිද්‍යාලීය අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ III පරිච්ඡේදයේ 26 ඡේදය පරිදි බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් දේශනයකට වැයවන මුදල ඉතා අධික වන හෙයින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීමේ පුරුද්ද අධෛර්ය කළයුතු බවට උපදෙස් දී ඇතත්, අනුමත කථිකාචාර්යවරුන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගෙන ඒ සඳහා එකතුව රු.14,282,952 ක් ගෙවා තිබුණි.

(ඔ) විවිධ ණයහිමියන් යටතේ දක්වා ඇති රු. 5,902,577 ක ණයහිමි ශේෂ 03 ක් වර්ෂ 02 සිට වර්ෂ 08 ක කාලයක් ගත වී ඇතත්, නිරවුල් කිරීමට අදාළ වගකිවයුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් සහ නිලධාරීන් 214 දෙනෙකුගේ ඇප බැඳුම්කර වටිනාකම රු.203,720,109 ක් වී තිබූ අතර, එයින් රු.200,062,201 මුදලක ඇප බැඳුම්කර මඟින් අය නොකිරීමේ කාලය 1970 වර්ෂයේ සිට 2013 දක්වා වසර 40 කට වැඩි වී තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය ආරම්භයේ අරමුදල් 12 ක ශේෂයන්ගේ එකතුව රු. 9,024,433 ක් වූ අතර, වර්ෂය තුළදී එම අරමුදල් වෙනුවෙන් රු. 1,651,725 ක් ලැබී, වර්ෂය අවසාන දිනට රු. 10,676,158 ක ශේෂයක් දක්වා වර්ධනය වී තිබුණු අතර, අදාළ අරමුදල්වල අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමට විශ්වවිද්‍යාලීය කළමනාකාරීත්වය කටයුතු කර නැති බව නිරීක්ෂණය විය.

(කා) කෙටි කාලීන පාඨමාලා පවත්වා ආදායම් ඉපයීම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයෙහි එක් අරමුණක් වී තිබුණද, 2012 වර්ෂය තුළ කිසිදු ආදායමක් උපයාගෙන නොමැති බවත්, 2013 වර්ෂයේදී එක් පාඨමාලාවක් පමණක් පවත්වා රු.240,000 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව මෙම මධ්‍යස්ථානය ආරම්භයේ පැවති කෙටි කාලීන

පාඨමාලා ප්‍රමාණය අඩු වී ඇති බවත්, ආදායම් වැඩිකර ගැනීම සඳහා ඉදිරි සැලසුම් හෝ නව පාඨමාලා හඳුන්වාදීම් හෝ සිදුකර නොමැති බවද නිරීක්ෂණය විය.

(කැ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ අපහරණය කළයුතු භාණ්ඩ ඉවත් නොකර කාමර 02 ක ගොඩගසා තිබුණු අතර, පරිගණක විද්‍යාගාර සියල්ලේම පාවිච්චි කළ නොහැකි පරිගණක උපාංග ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉන්වෙන්ට්‍රි ලේඛණය ITC - SB 2 පරිදි 2010 වර්ෂයේදී රු. 528,257 ක බඩු ඉවත්කර තිබුණද, මු.රෙ.770, 772 හා 747 පරිදි කටයුතු කර නොතිබුණි.

(කෑ) විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ එක් ප්‍රධාන නිර්ණායකයක් වශයෙන් විශ්වවිද්‍යාලවල සිදුකරන පර්යේෂණ සලකනු ලබන අතර, ඒ සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු. 12,400,000 ක මුදල අදාළ කාර්යයන් සඳහා නොයොදා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(කි) ආර්ථික අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා බාහිර පුද්ගලයින් විසින් විශ්වවිද්‍යාලයට ලබා දී තිබු පරිත්‍යාග ආයෝජනය කර ලැබෙන පොලියෙන් සියයට 80 ක ප්‍රමාණයක් අදාල කාර්යය සඳහා යොදා ගැනීමට පාලක සභාව විසින් තීරණය කර තිබුණද ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් අඛණ්ඩව ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා යොදාගත යුතු රු. 12,801,890 ක මුදලින් සියයට 28 ක් වු රු. 3,577,098 ක් පමණක් ඒ සඳහා යොදා ගෙන තිබුණි.

(කී) 2004 වර්ෂයේ ලියාපදිංචි වු විදේශීය වෛද්‍ය ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කාලසීමාව වසර 05 කින් අවසන් වන නමුත්, 2011 වර්ෂයේ අවසානය වන විට ශිෂ්‍යයන් තිදෙනෙකුගේ ලැබීම් ලෙස රු. 1,640,310 ක් ගිණුම්ගත කර තිබුණි.

(කු) දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු. 1,821,032 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(කූ) 2010 මැයි 22 දිනැති 306.3.1.15 පාලක සභා තීරණය අනුව මහාචාර්යවරයෙකුගෙන් මසකට රු. 15,000 බැඟින් නිවාස කුලිය අයකළයුතු වුවත්, මසකට රු. 1,000 ක් බැඟින් මාස 31 ක් සඳහා රු.31,000 ක් පමණක් අයකිරීම හේතුවෙන් රු. 434,000 ක අලාභයක් විශ්වවිද්‍යාල අරමුදලට සිදුවී තිබුණි.

(කෙ) 2013 වර්ෂයේ සැප්තැම්බර් 15 දින වන විට විශ්‍රාම ගිය නිලධාරියෙකුහට අර්ථසාධක අරමුදලේ මුදල් නිදහස් කර ඇතත්, ඔහුගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලිය වන රු.45,989 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(කේ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් රත්මලේ ඉඩමේ පර්චස් 25 ක ඉඩම් කොටසක් 1975 වර්ෂයේ සිට මහනුවර කඩවත් සතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත බදු පදනම මත පවරා දී තිබු අතර, නව තක්සේරු අනුව බදු ගිවිසුම්වලට එළඹිය යුතු වුවද, 1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම බදු ගිවිසුම් අත්සන් නොකර අදාල දේපල භුක්ති විඳීමට කටයුතු කර තිබීම හේතුවෙන් මෙම ඉඩමට අදාලව ප්‍රාදේශීය සභාව වෙතින්

අයවිය යුතු රු.6,724,000 ක බදු කුලියක් 2013 දෙසැම්බර් 31 දින වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලීය ස්ථිර සේවයේ ආරක්ෂක නිලධාරීන් සහ තාවකාලික ආරක්ෂක සේවයේ නිලධාරීන් වෙනුවෙන් පිළිවෙලින් රු. 40,596,609 ක් සහ රු.55,885,826 ක් වශයෙන් එකතුව රු. 96,482,435 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර, එම සේවකයින් අතර අතිරික්ත ආරක්ෂක නිලධාරීන් 111 ක් සිටියදී රු. 10,672,211 ක අතිකාල වියදමක් දරා තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) 1995 අංක 01 දරන විශ්වවිද්‍යාල පනතේ 02 ඡේදය පරිදි යම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පාලක සභාවේ එකඟත්වය ලබා ගෙන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්ති ප්‍රකාරව, අදාළ පාර්ශව සමග විශ්වවිද්‍යාලීය පරිපාලනය ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස කටයුතු කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 සැප්තැම්බර් 27 දිනැති UCC/C/PS/7/2 ලිපිය අනුව කොළඹ පිහිටුවා තිබුණු Lanka Education & Research Network (LEARN) ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ 2013 ජනවාරි මස සිට ස්ථාපිත කර තිබුණි. 2013 දෙසැම්බර් මස වන විටත් එම ආයතනයට ලබා දෙන පහසුකම් වෙනුවෙන් කිසිදු මුදලක් පාලනාධිකාරිය අය කර ගැනීමට කටයුතු කර නොතිබූ නමුත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් 2013 වර්ෂයේදී එකතුව රු. 1,985,489 ක් LEARN ආයතනය වෙත ගෙවීම් කර තිබුණි.

(ii) ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය (ICSU) මඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල සේවා කටයුතු සහ එහි නඩත්තු සිදුකරනු ලබන අතර, අන්තර්ජාල පහසුකම් ලබාගැනීම සඳහා Lanka Education & Research Network (LEARN) නමැති පෞද්ගලික ආයතනය මඟින් සේවාව ලබාගෙන ඇතත්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 45 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලීය පරිපාලනය එම ආයතනය සමග ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එම සේවාව සඳහා රු. 22,189,833 ක් ගෙවා තිබුණි.

(ආ) 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා සැපයීම සඳහා ලැබෙන මුදලින් විශ්වවිද්‍යාලීය පරිපාලන ගාස්තු ලෙස සියයට 5 ක් වෙන් කරනු ලබයි. විශ්වවිද්‍යාලීය කළමණාකාරීත්වය අභිමතය පරිදි මෙම පරිපාලන ගාස්තු මුදලින් සියයට 30 ක් විශ්වවිද්‍යාලයේ පරිපාලන ගාස්තු ලෙස වෙන් කරනු ලබන අතර, මෙම මුදලින් සියයට 25 ක් මුල්‍යාධිකාරී අරමුදලට බැර කරනු ලබයි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ vii වන පරිච්ඡේදයට පටහැනිව මෙම අරමුදලට වෙන් කරන මුදලින් මුල්‍යාධිකාරී සිය අභිමතය පරිදි තීරණය කරනු ලබන විවිධ වූ ප්‍රතිශතයන්ට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් අංශයේ නිලධාරීන් අතර, 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.2,513,645 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ඇ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දෛනික රාජකාරී කටයුතුවල යෙදීම සඳහා මාසික ගෙවීම් ක්‍රමය යටතේ ලබාගත් බස් රථය සඳහා 2013 මාර්තු සිට දෙසැම්බර් කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.1,273,500 ක මාසික කුලියක්ද, රු.348,813.60 ක ඉන්ධන දීමනාද ගෙවා තිබුණු අතර, මෙම කාලය තුළ ධාවනය කළ මුළු කිලෝමීටර් ගණන 9374 ක් වී තිබුණි. ඒ අනුව එක් කිලෝමීටරයක් සඳහා රු. 113.13 සිට රු. 206.90 ක් දක්වා පිරිවැයක් දරා තිබුණි. 2013 මාර්තු 17 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එක් කිලෝමීටරයක් සඳහා දරා ඇති සාමාන්‍ය වියදම රු. 173.06 කි. විශ්වවිද්‍යාලය සතුව තිබෙන බස්රථ උපරිම ලෙස උපයෝජනයට ගැනීමට අවධානය යොමු නොකර මාසික කුලී පදනම මත ලබාගත් මෙම වාහනයට වැඩි පිරිවැයක් දැරීමට සිදු වීමෙන් මේ නිසා විශ්ව විද්‍යාලීය අරමුදලට පාඩුවක් සිදු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 ඡේදය II කොටසේ IX පරිච්ඡේදයේ 2.2 ඡේදය ප්‍රකාර අනුමැතියක් නොලබා 2013 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු සහ එහි අධීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් නිලධාරීන් 89 ක් සඳහා ඔවුන්ගේ වැටුපෙන් සියයට 40 සිට සියයට 85 ක් දක්වා ප්‍රතිශතයක දීමනාවන් වශයෙන් රු. 1,474,042 ක් නිලධාරීන්ට ගෙවාතිබුණි.

(ඉ) පරිගණක මිලදී ගැනීමේ අරමුණු හෝ සැලැස්මකින් තොරව ඉදිරිපත් කරන ලද සාම්පල් හා සපයා තිබූ පරිගණක අතර නිමැවුම් හා ගුණාත්මකභාවය පිළිබඳ වෙනසක් තිබියදී 2013 අප්‍රේල් 05 වන දින රු.4,950,000 ක් වැය කර පරිගණක 50 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ අතර, එම පරිගණකවල වගකීම් කාලය 2014 මාර්තු 27 දිනෙන් අවසන් වී තිබූ අතර ඇතැම් පරිගණක ඒ වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඊ) 2013 පෙබරවාරි 13 සිට 2013 මාර්තු 07 අතර කාලය තුළදී අම්පාර, මොණරාගල, රත්නපුර හා කොළඹ යන දිස්ත්‍රික්ක හතරක ගෘහස්ථ ඖෂධ භාවිතය මිනුම් කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් වෛද්‍ය පීඨය ඉටුකරන ලද ක්ෂේත්‍ර චාරිකා සඳහා නවාතැන් පහසුකම්, ආහාර පාන සහ ප්‍රවාහනය පහසුකම් සඳහා වියදම් දරා ඇති අතර, එම වියදම අදාළ දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවන්ගෙන් ලබා නොගෙන මහනුවර පෞද්ගලික ආයතනයෙන් ලබා ගෙන එකතුව රු. 2,068,265 ක් ගෙවීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඕස්ට්‍රේලියාවේ නිව් කාසල් විශ්වවිද්‍යාලය මඟින් වෛද්‍ය පීඨයට ප්‍රතිපාදන ලැබී

ඇත්තේ 2013 මැයි 14 දින වුවත්, එම ප්‍රතිපාදන ලැබීමට පෙර එනම්, 2011 වර්ෂයේදී ව්‍යාපෘති උපදේශන සේවා සහ දත්ත සැකසීමේ හා විශ්ලේෂණ ගාස්තු වශයෙන් රු. 807,500 ක අත්තිකාරම් විශ්වවිද්‍යාල අරමුදලින් ලබා ගෙන ඇති අතර, එම මුදල් නැවත විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

4.4 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 18 දින ඉංජිනේරු පීඨයේ විශ්‍රාම ගොස් ඇති නිලධාරියෙකුට ලබා දී තිබූ රු.230,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම මුදල විගණිත දින දක්වා පියවා නොතිබුණු අතර, මෙම නිලධාරියාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට නිල නිවාස කුලී සහ හිඟ විදුලි ගාස්තු රු. 188,415 ක්ද අය කිරීමට තිබුණි. තවද, නිලධාරියාගේ සේවා කාලය තුළ ඉංජිනේරු පීඨයට අයත් රු. 554,520 ක මිලදී ගැනීම් තොග ලේඛනවල සටහන් නොකිරීම නිසා ඔහුගෙන් අය කළයුතු රු. 554,520 ක මුදලද අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා ආයතනයට සිදුවී තිබෙන රු. 972,935 ක අලාභයක් පාරිතෝෂික මුදලින් අයකර ගැනීමකින් තොරව, 2012 මාර්තු 22 දින රු. 900,700 ක් වටිනා පාරිතෝෂික මුදල නිදහස් කර තිබුණි. මෙම මුදල් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණු බැවින් විශ්වවිද්‍යාල පනතේ 94 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතුව තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 2.1 සහ 2.2 ඡේද ප්‍රකාරව, අතිකාල වැඩ සඳහා බලය දිය හැක්කේ ඒ කටයුතු ඉටුකිරීමට වෙනත් කිසිදු මාර්ගයක් නැති අතිවිශේෂ අවස්ථාවලදී සහ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දාවුද, සාමාන්‍ය වැඩ කටයුතුවලින් ඒකාන්තයෙන් පරිබාහිරවූද, හදිසිවූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වැඩ සඳහා පමණක් වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2013 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා වැඩ දෙපාර්තමේන්තුවේ අතිකාල සඳහා එකතුව රු. 1,590,435 ක් ගෙවා තිබුණි.

4.5 අරමුදල් ඌන උපයෝජනය

-------------------------------

එකතුව රු. 392,000 ක් වූ ශාස්ත්‍ර පීඨයේ පර්යේෂණ අරමුදල් 05 ක් අරමුණුගත පර්යේෂණයට යොදා නොගෙන 2013 වර්ෂයේදී ආපසු පියවා තිබුණි.

4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ඈ) 2004 වර්ෂයේ ආරම්භ කර තිබු පරිගණක තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීමේ මූලික අරමුණු ලෙස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පරිගණක පාඨමාලා සහ පුහුණුවීම් ලබාදීමත් බාහිර ආයතන සඳහා කෙටි කාලීන පරිගණක පුහුණුවීම් ලබාදී ආදායම් ඉපයීමත් ලෙස දක්වා ඇතත්, එකී අරමුණු කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් ඉටු වී නොමැති බැව්, ආයතනයේ පරිගණක සහ විද්‍යාගාර වැඩි කාලයක් තුළ නිශ්ක්‍රීයව පැවතීමෙන් අනාවරණය විය.

(ආ) රු. 33,249,967 ක වටිනාකමින් යුතු වෙනත් අරමුදල් ශේෂ 40 ක් ඒවායේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනයට නොගෙන දීර්ඝ කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට හෝ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය සතු Surge Protectors නමැති උපකරණ අයිතම 06 ක් නිෂ්ක්‍රීයව පැවති අතර, 2012 නොවැම්බර් 21 දින මිලදී ගන්නා ලද සංයුක්ත තැටි 2400 න් රු.43,400 ක් වටිනා සංයුක්ත තැටි 560 ක් 2013 නොවැම්බර් මස වන විටත් පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු එකතුව රු.1,928,200 ක අරමුදල් වර්ෂය අවසාන වන විටත්, වියදම් නොකර තිබුණි.

4.7 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සිට 2013 වර්ෂය දක්වා සිදු වූ රිය අනතුරු හේතුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට දැරීමට සිදු වූ සමස්ථ අලාභය රු. 207,030 ක් වී තිබුණි.

(ආ) ඉංජිනේරු පීඨයට අදාල 2013 පෙබරවාරි 08 දින සිදු වූ CPKC 4977 දරන වාහන අනතුරෙන් සිදු වූ රු. 161,396 ක හානි ඇස්තමේන්තුවට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.127,542 ක් ලැබී ඇතත්, රු. 33,854 ක් වූ අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ජනවාරි 06 වන දින තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සියලුම ස්ථානවල තිබු පරිගණක සහ මධ්‍යම සැකසුම් ඒකක භෞතිකව පරීක්ෂා කළ අතර, එහිදි රු.1,880,358 ක වටිනාකමින් යුතු පරිගණක සහ උපාංගවල ඌනතාවයක්ද රු.539,460 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා කම්කරු කොමසාරිස්ගේ අංක ප්‍ර/ආයතන/11 හා 2001 අගෝස්තු 24 දිනැති ලිපියට අනුකූල නොවන පරිදි අධ්‍යයන දීමනාව අර්ථසාධක අරමුදල් දායකය, විශ්‍රාම වැටුප් අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය හා පාරිතෝෂික ගණනය සඳහා අදාළ කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ 08 ට අදාළව අධ්‍යයන

කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු. 48,812,616 ක එකතුවක් ගෙවීම නිසා විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් සිදු කර තිබුණි.

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශාස්ත්‍ර පීඨයේ විවිධ දුෂ්කරතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීමේ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කළමණාකරු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රමාණ පත්‍රය අනුව ඇස්තමේන්තුගත වටිනාකම රු.2,548,806ක් වුවද, අංක 269.4 දරන මුදල් කමිටුව විසින් අනුමත කරන ලද වටිනාකම රු.2,980,006 ක් වේ. ඒ අනුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ප්‍රමාණ පත්‍රය ප්‍රසම්පාදනය කැඳවීම් ලද ප්‍රමාණ පත්‍රය අතර රු.431,200 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම වැඩ විෂයයන් 11 ක ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු. 374,047 ක් අනුමැතියකින් තොරව වැය කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ලියවිලි විවෘත කරනු ලබන කමිටුව විසින් අදාල ප්‍රසම්පාදන ලියවිලි ඇගයීම් කිරීම සඳහා උක්ත අත්පොතෙහි 6.3.3 ප්‍රකාරව, විවෘත කරන ලද ප්‍රසම්පාදන ලියවිලි නැවත මුද්‍රා තබා ඇගයීම් කමිටු වෙත යැවිය යුතු වුවත්, පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් කිසිම අවස්ථාවක එලෙස කටයුතු කර නොතිබුණි. ඇගයීම් කමිටුව විසින් කළයුතු කාර්යයන් සියල්ලම මූලධන අංශ විසින් සිදුකර අත්සන් කිරීම සඳහා පමණක් ඇගයීම් කමිටුව වෙත අදාල ලියවිලි ඉදිරිපත් කර තිබුණි.

(ඇ) මාක්ස් ප්‍රනාන්දු ශාලාවට ජලය සැපයීම සඳහා වූ අංක HE/IDD/PFN/2010/05 දරන කර්මාන්තය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.2.2 ට අදාළ නොවන පරිදි අධික කාලයක් වැඩ නිම කිරීමට ලබා දීම, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලයට වැඩ අවසන් නොකිරීම, නිර්මාණය හා සැලසුම් පාලක සභාව අනුමත කර නොතිබීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.7 හා 4.8 වගන්ති ප්‍රකාරව අනුමැතිය ලබා නොගැනීම සිදුව තිබු අතර, කර්මාන්තයට අදාළව අත්සන් කරන ලද ගිවිසුමේ 5.1(a)(i) ප්‍රකාරව, ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු මුදලින් සියයට 60 ක් වු රු. 4,200,000 ක අත්තිකාරම් මුදලක් ද නිදහස් කර තිබුණි.

(ඈ) වෛද්‍ය පීඨයේ කාණු පද්ධතිය නවීකරණය කිරීමේ කර්මාන්තය පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත දින 90 කින් වැඩ අවසන්කර භාරදීම සඳහා 2013 මැයි 10 දින රු.1,952,242 ක මුදලකට ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. උක්ත කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කරන ලද අවසන් බිල්පත අනුව වැඩ වටිනාකම රු. 1,714,072 ක් වන අතර, ඊට අදාළ වැට් බදු මුදල රු. 205,688 ක් විය. එහෙත් මෙම කොන්ත්‍රාත්තුවේ ඉටු කරන ලද වැඩවල ගුණාත්මකභාවය නිසිලෙස දක්නට නොලැබුණු අතර, ප්‍රමිතියට අදාළව ඉදිකිරීම් කර නොතිබුණි.

(ඉ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පිහිනුම් තටාකයේ පැති බැම්ම අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ අතර, එහි රු. 825,211 ක් වටිනා වැඩ කොටස් ඉටු කර නොතිබීම, පිරිවිතර ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබීම, ජල කාණුව ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.369,803 ක් හෙවත් සියයට 148 ක් අනුමැතියකින් තොරව ගෙවීම් කිරීම, රු.608,550 ක් අධි ඇස්තමේන්තු සකස් කිරීම සහ පස් කියුබ් 42.96 ක් සඳහා රු.155,129 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබීම නිරීක්ෂණය විය.

(ඊ) මාවලවත්ත ශික්ෂණ ගොවිපල කම්කරුවන් කුලියට බඳවා ගැනීම 2013 වර්ෂයේ වාර්ෂික මුළු වටිනාකම රු. 2,789,435 ක් වු අතර, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ ප්‍රසම්පාදන සීමාව වු රු. 2,000,000 කට යටත් වන පරිදි අවස්ථා 02 කදී විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) 2012 වර්ෂයේදී අදාළ පාර්ශව සමග ගිවිසුම්වලට එළඹී අලුත්වැඩියාවන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත් එකතු වටිනාකම වු රු. 26,315,427 ක්වු කොන්ත්‍රාත් 06 ක් ගිවිසුම් ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිමකොට නොමැති බව නිරීක්ෂණය විය.

(ඌ) 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ටෙන්ඩර් කැඳවා ගිවිසුම් අත්සන් කරන ලද කර්මාන්ත 43 ක් සඳහා එකතුව රු. 69,144,925 ක් ගෙවීම් කර ඇතත්, විගණන දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තවල වැඩ නිමකර නොතිබුණු නමුත්, අදාළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) රාමනාදන් ශාලාවේ තීන්ත ආලේප කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසුකරුවන් 06 දෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, අවම මිල ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත් ආයතනයේ මිල ගණන් පිළිනොගැනීමට හේතු නොදක්වා දෙවන අවම මිල ඉදිරිපත් කළ පෞද්ගලික ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම හේතුවෙන් රු.1,779,657 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඒ) රු. 98,564,200 ක් වටිනා කෘෂිකර්ම ඉංජිනේරු ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි කමිටුවේ හා පාලක සභාවේ අනුමැතිය ලබා නොගෙන, ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගතහැකි කරුණු ඉදිරිපත් නොකර, අවම මිල වු රු.747,500 ක් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුට නොදී දෙවන අවම මිල වු රු.828,000 කට ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර, උපදේශකයින් යෙදවීම පිළිබඳ වියදම් දැරීමට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා නොගෙන 2005 වර්ෂයේදී රු.1,142,640 ක් ගෘහ නිර්මාණ හා උපදේශන සේවා සඳහා ගෙවීම් කර තිබුණද ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ අනෙක් වැඩ 2013 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඔ) මහඉලුප්පල්ලම උප විශ්වවිද්‍යාල අංශයේ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2005 ජනවාරි 31 දින රු. 324,279 ක ගිවිසුමකට එළඹ 2005 අප්‍රේල් 30 දිනට පෙර කොන්ත්‍රාත්තුව නිමකිරීමට නියමිතව

තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී අදාළ කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්කර නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත රු.294,082 ක වාරික මුදල් ගෙවීම් කර තිබුණි.

(ඕ) මාර්ස් ශාලාවේ පළමු මහලේ පිරිමි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2011 නොවැම්බර් 14 වෙනි දින එළඹි ගිවිසුම අනුව රු.1,115,940 කට කොන්ත්‍රාත්තුව පිරිනමා 2012 පෙබරවාරි 13 වන දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත්, 2013 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර විශ්ව විද්‍යාල කළමනාකාරීත්වයට භාර දී නොතිබුණු නමුත්, මේ සඳහා රු. 330,305 ක වාරික ගෙවීමක් සිදුකර තිබුණි.

(ක) විශ්වවිද්‍යාලය කළමණාකාරීත්වය විසින් පෞද්ගලික ආයතනයක් වෙත රු.7,629,409 ක වටිනාකමින් යුතු කොන්ත්‍රාත් ව්‍යාපෘතින් 05 ක් පිරිනමා ඇතත්, අදාළ කොන්ත්‍රාත් ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලීය කළමණාකාරීත්වය සමඟ එළැඹි ගිවිසුම් කඩකර තිබුණි. නමුත්, ඒ සඳහා අදාළ වගකිවයුතු නිලධාරීන් විධිමත් පියවර ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(කා) කෘෂි විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ඇලුමිනියම් රාමුවෙන් ජනේල සකස් කිරීමේ ඇස්තමේන්තුව අනුව කොන්ත්‍රාත් වටිනාකම රු.1,752,750 ක් වු අතර කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ලංසුකරුගේ වටිනාකම රු.959,400 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ලංසුකරුගේ අවම මිල අතර රු. 793,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කැ) මිල රු.1,444,643 කට වැඩ ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරන ලද ගල් බංගලාව අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2013 මාර්තු 04 දින මිල විවෘත කිරීමේදී අවම මිල වු රු.971,040 කට කොන්ත්‍රාත්කරු මිල ගණන් ඉදිරිපත් කර තිබුණද, 2013 ජුනි 11 දින එළඹි කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම රු.1,273,440 ක් වී තිබුණු අතර, කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු මුදලට වඩා රු. 302,400 ක් වැඩිපුර ගිවිසුම් අත්සන් කර තිබුණි.

(කෑ) සිවිල් ඉංජිනේරු අංශ වැඩ බිම වායුසමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීමට අදාළව 2012 අගෝස්තු 21 වන දින ප්‍රථම වරට මිල ගණන් විවෘත කිරීමේදී අවම මිල ලෙස රු.784,500 ක් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් විසින් මිල ඉදිරිපත් කරන ලද අතර, දෙවන අවම මිල ලෙස රු. 882,680 ක් වෙනත් පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලදී. මෙම මිල ගණන් නොසලකා හැර නැවතත් 2013 පෙබරවාරි 13 දින මෙම ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවීමේදී දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කළ පෞද්ගලික ආයතනය පමණක් රු.1,050,270 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එම ආයතනය වෙත අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් රු. 265,770 ක අලාභයක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට සිදු වී තිබුණි.

(කි) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ විදුලි පද්ධතිය නවීකරණය කිරීම සඳහා වු කොත්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත පිරිනමා රු.6,351,248 ක් ගෙවීම් කර තිබුණද, එය නිසියාකාරව ක්‍රියාත්මක නොවීම, සවි කොට තිබු විදුලි පහන් ඒකීය ධාරිතාවයකින් යුක්ත නොවීම, ක්‍රීඩාගාරය සඳහා සම ආලෝකයක් නොලැබීම වැනි

අඩුපාඩු පැවති අතර, විගණන දින වන විට රු. 339,000 ක් වටිනා දැල්නොවන බල්බ 20 ක්ද ගලවා ඉවත් කර තිබුණි. මෙම බල්බ වෙනුවට නව බල්බ මෙරට තුළදී මිලදී ගත නොහැකි බවත් ඒ සඳහා වූ තාක්ෂණික දැනුමක් විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට නොමැති බවත් අනාවරණය වූ අතර බල්බ සඳහා ලබාදුන් වගකීම් කාලයක්ද නොතිබුණි.

(කී) සම්මේලන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2009 ජනවාරි 20 දින පිඹුරුපත් සැකසීම වෙනුවෙන් රු.1,500,000 ක සංචලන අත්තිකාරම් මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබූ නමුත්, අවුරුදු 05 ක කාලයක් ඉක්ම වී ඇතත්, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හෝ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.9 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රු. 18,715,197 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක් වෙනුවෙන් සියයට 20 සංචලන අත්තිකාරම් වූ රු. 3,450,238 ක් ලබා දී තිබුණු අතර, ඇප සුරැකුම් කාලය ඉක්ම වී ඇතත්, අදාළ ව්‍යාපෘතීන් නිමකර නොතිබුණි.

4.10 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 03 වන පරිච්ඡේදයේ 02 උපඡේදය පරිදි පත්කිරීමක් හෝ උසස් කිරීමක් කළ හැක්කේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරකට පමණක් වුවද, අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොමැති ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකයේ තනතුරු 02 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු පත්කර එකතුව රු. 2,348,289 ක් වූ මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ආ) ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ අනුමත නොවූ තනතුරකට නිලධාරියෙකු බඳවා ගෙන භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, 2012 අප්‍රේල් 02 දින සිට මසකට රු. 125,000 ක් බැගින් මාස 21 ක් සඳහා වැටුප් හා දීමනා ලෙස රු.2,625,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18(2)(3)(ඊ) වගන්තිය ප්‍රකාරව, නිසි බලධාරීන් වෙතින් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කාර්ය මණ්ඩලය බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස රු.4,234,062 ක් ගෙවීම් කර තිබුණු අතර, ආයතනයේ කාර්යභාරය ඉටුකරගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කර නොතිබුණි.

(ඈ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.8 වගන්තිය ප්‍රකාරව, ඉංජිනේරු පීඨයේ වාහන නඩත්තු ඒකකයේ සහ වැඩ ඒකකයේ සේවය කරනු ලබන නිලධාරීන් / සේවකයින් සඳහා රාජකාරී බෙදා දීමක් සිදුකර නොතිබුණු නමුත්, 2013 වර්ෂය සඳහා එම ඒකකවලට අනුයුක්තව සේවය කරන ලද නිලධාරීන් / සේවකයින් සඳහා එකතුව රු. 18,020,276 ක වැටුප් ගෙවා තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව, අදාල කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවන ප්‍රතිපාදන හෝ අරමුදලේ ප්‍රභවය කුමක් වුවත්, කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරී බලය ලබාගත යුතුය. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කර නොගෙන තනතුරු 04 ක නිලධාරීන් 06 දෙනෙකු සඳහා 2013 වර්ෂයේදී එකතුව රු. 1,474,347 ක වැටුප් ගෙවා තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ අනුමත ස්ථිර සේවයේ ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 69 ක් වුවත්, තථ්‍ය ආරක්ෂක නිලධාරීන් 63 ක් සහ පුද්ගලික ආරක්ෂක සේවා මඟින් ආරක්ෂක නිලධාරීන් 117 ක් වශයෙන් ආරක්ෂක නියාමකවරු සහ ආරක්ෂක පරීක්ෂකවරු 180 ක් සේවයේ යොදවා තිබුණ බැවින්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 111 දෙනෙකු පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා තිබුණි.

(උ) අංක PED/12 හා 2003 ජුනි 01 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වුවත්, වෛද්‍ය පීඨයට අයත් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් පුරප්පාඩු 45 හා 26 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛය ප්‍රකාරව, සංයුක්ත සැලැස්ම ආයතනයේ පාලක සභා නිලධාරීන්ගේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් ආයතනය පිළිබඳ ඉදිරි දැක්ම වෙනුවෙන් සකස් කරන ලද ප්‍රතිබිම්භයක් විය යුතු වුවද, පහත අඩුපාඩු නිසා සංයුක්ත සැලැස්මෙහි එවැනි අරමුණු ඉටු වී නොතිබුණි.

(i) වාර්ෂික අයවැය සමඟ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත සෑම මුල්‍ය වර්ෂයක් ආරම්භවීමට අඩුම වශයෙන් දින 15 කට පෙර ඉදිරිපත් කළයුතු වුවද, 2013 වර්ෂයේ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර තිබුණේ 2013 ජූලි 02 වන දීය.

(ii) සංයුක්ත සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්ෂික අයවැය සමඟ ඇතුළත්කළයුතු වුවද, අයවැයේ ඇතුළත් කර තිබූ රු. 396,025,000 ක් වූ ප්‍රාග්ධනිත වියදම් 04 ක් සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.2 ඡේදය පරිදි තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණ අතර, සංයුක්ත සැලැස්මේ අරමුණු ඉටුකරගත හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කර ද නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 83,550,000 ක් වු අයිතම 32 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද, මුල්‍ය ප්‍රකාශන සමඟ එම අරමුණු ඉටු වු බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ විෂයයන් 31 කට අදාලව එකතුව රු. 211,850,000 ක වටිනාකමේ වෙනසක් නිරීක්ෂණය විය.

5.3 පාලක සභා රැස්වීම්

----------------------

සමාලෝචිත වර්ෂය තුළ පාලක සභා රැස්වීම් වාර 11 ක් පවත්වා තිබුණු නමුත්, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 4.2.2 ප්‍රකාරව, කාර්යක්ෂමතාවය අගය කිරීම හා මඟ පෙන්වීම සඳහා ඉදිරිපත් කළයුතු වාර්තා හා තොරතුරු පාලක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

-------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, ආයතනයේ ඒ ඒ ඒකකය වෙන වෙනම අභ්‍යන්තර විගණනයක් සිදු කළයුතු වුවද, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ආරම්භ කළ 2004 වර්ෂයේ සිට විගණන දිනය වු 2014 ජනවාරි 08 වන දිනය දක්වාම කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැඩ, සැපයුම් සහ සේවා සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ වටිනාකම් ඇතුළත් කර තිබුණද, වාර්ෂික අයවැය සමඟ එකතුව රු.4,344,861,500 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අයවැය මඟින් ඇස්තමේන්තු කරන ලද නමුත්, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු වටිනාකම රු. 18,317,000 ක්වූ ව්‍යුහගත සේවා 03 ක් නිරීක්ෂණය විය.

5.6 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම පිළිවෙලින් රු.57,955,000 ක් සහ රු.26,527,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය ආදායම සහ වියදම පිළිවෙලින් රු. 66,341,099 ක් සහ රු.65,538,406 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම සහ වියදම ඉක්මවීම පිළිවෙලින් රු. 8,386,356 ක් සහ රු.39,011,406 ක් හෙවත් පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 147 ක් විය.

(ආ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජූනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2.5 ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මේ වාර්තා අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවද, පහත දැක්වෙන වෙනස්කම් නිසා අයවැය සඵල මූල්‍ය පාලකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) වැය විෂයයන් 37 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවීම්වල එකතුව රු.354,137,482 ක්වූ අතර, වැය විෂයයන් 29 ක අධි ඇස්තමේන්තු කිරීම්වල එකතුව රු.348,673,163 ක් වී තිබුණි.

(ii) අයවැය ලේඛනයට ඇතුළත් නොවූ වැය විෂයයන් 06 කට අදාළව එකතුව රු.155,504,977 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂය තුළදී වැය කොට තිබුණි.

(iii) වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇතත්, වැය විෂයයන් 05 ක් සඳහා සියයට 100 ක් රු. 702,000 ක වටිනාකමින් යුතු ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ඉතිරි වී තිබුණි.

(iv) අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් සැසඳීමේදී වැය විෂයයන් 04 කට අදාළව රු.54,503,907 ක ඌන ආදායමක් දක්නට ලැබුණි.

(v) අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් ප්‍රභවයන් 11 කට අදාළ රු. 133,334,989 ක අධි ආදායම් දක්නට ලැබුණි.

(vi) අයවැයගත ආදායම් ලෙස හඳුනා නොගත් ආදායම් ප්‍රභවයන් 03 ක් යටතේ රු.91,439,412 ක් ආදායම් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණි.

(vii) අයවැයගත තොරතුරු අනුව අය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.58,955,000 ක් ආදායම් වෙන්කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායම් විෂයයන් වෙනුවෙන් ආදායම් ලබාගෙන නොතිබුණි.

(ඇ) M. Phill හා PHD උපාධි අපේක්ෂකයින් වෙත විදේශීය ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම වෙනුවෙන් රුපියල් මිලියන 10 ක මුදලක් වෙන්කර ඇතැත්, කිසිදු අයකු වෙත එම කටයුතු සඳහා මුල්‍යාධාර සපයා නොතිබුණි.

(ඈ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව, අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කළයුතු වුවද, 2013 වර්ෂය සඳහා අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම

(ඇ) තොග පාලනය

(ඈ) වාහන පරිපාලනය

(ඉ) පර්යේෂණ ප්‍රදාන සහ අරමුදල් උපයෝජනය

(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය

(උ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ඌ) සේවක ණය පරිපාලනය

(එ) කොන්ත්‍රාත් පරිපාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

## I2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර

| | |
|---|---|
| **2.** | **මූල්‍ය ප්‍රකාශන** |
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| **2.2.1** | **ගිණුම්කරණ අඩුපාඩු** |
| **(අ)** | මෙම විගණන විමසුමෙන් විමසා ඇත්තේ රු. 4,928,578.00 ක් වූ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයට අදාලව කරන ලද වසර තුල දරන ලද වියදම් සමූහයක එකතුවකි. ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2011 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ නිර්දේශ මත පිහිට වූ මධ්‍යස්ථානයක් වන අතර එකී මධ්‍යස්ථානයට ලැබෙන සියලු වියදම් මහා භාණ්ඩාගාරය මඟින් මූලධන ශීර්ෂය යටතේ ලැබෙන අතර එය විශ්වවිද්‍යාල පනතේ 45.2 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල පාලකසභාවට ලැබී ඇති බලතල අනුව ක්‍රියාකර ඇත. විශ්වවිද්‍යාලය තුල මෙම පරීක්ෂණ මධ්‍යස්ථානය මානව ප්‍රාග්ධනය වර්ධනයට පමණක් ඉවහල් වන ශීර්ෂයක් වේ. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන තුල මෙම පරීක්ෂණ මධ්‍යස්ථානයට අදාලව කරනු ලබන සියලු වියදම් පුනරාවර්ථන හා මූලධන ලෙස වෙන් කර පැහැදිලිව දක්වා ඇත. මෙහිදී නියමිත ගිණුම්කරණ නිවැරදි ආකාරයෙන් සිදුකර ඇති බව දැනුම් දෙන අතරම අයවැය හා ගිණුම් කට්ටලයෙහි අනුරූපී බවද ආරක්ෂා වන පරිදි මෙම ක්‍රියාවලිය සිදුකර ඇත.<br><br>පුනරාවර්තන ප්‍රතිපාදන වලින් දරණ ලද නමුත් ප්‍රාග්ධන වියදම් බවට විමසුම් කර ඇති රු. 1,065,332.00 ක මුදලින් රු. 681,476.00 ක් පමණක් ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් බවට හඳුනාගත් බැවින් පහත සඳහන් ආකාරයෙන් නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. ඉතිරි රු. 383,856.00 ක ප්‍රමාණය පුනරාවර්තන ස්වභාවයේ වූ වියදම් වේ.<br><br>• විමසුමෙහි වවුචර් අංක 03163 සහ 02822 මඟින් රු. 456,390.00 හා රු. 225,086.00 බැගින් හල්මැහිකඳුර නේවාසිකාගාරයේ ඉදිකිරීම් වලට අදාලව කරන ලද ගෙවීම් J 14 හා J22 ජ්නල් වවුචරයන් මඟින් කෙරීගෙන යන වැඩ ගිණුමට ගිණුම් ගතකර ඇත. මෙම නේවාසිකාගාරය සාදා නිමකර විශ්වවිද්‍යාලයට භාරදුන් පසු අදාල ගෙවීම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>• D 01196 යටතේ මිලදී ගත් බේස් බෝල් අත් මේස් රු. 150,000.00 ක් දීර්ඝ කාලීනව ප්‍රයෝජනයට ගත නොහැක. එබැවින් මූල්‍ය වටිනාකම වැඩි වුවද ස්ථාවර වත්කම් ලෙස සැලකිය නොහැක. බේස් බොල් පිත්ත වසර 1 කට වැඩි කලක් පාවිච්චි කිරීමට නොහැකි බැවින් ඒ සඳහා වියදම් කල රු. 40,000.00 ක මුදල පුණරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත.<br><br>• D 01406 යටතේ රු. 98,856.35 ප්‍රොජෙක්ටර් මිලදී ගැනීමක් සිදු වී නොමැත. එය ප්‍රොජෙක්ටර් 3ක් හා ප්‍රොජෙක්ටර් තිර 3ක් උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් කුලියට ලබාගැනීමක් පමණි. ඒ අනුව මෙය මිල දී ගැනීමක් නොව කුලියට ගැනීමක් වන අතර උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් දරණ ලද වියදම් යටතේ පුනරාවර්ථන වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර ඇත.<br><br>• D 101358 යටතේ රු. 95,000.00 මිලදී ගෙන ඇත්තේ ක්‍රිකට් සඳහා භාවිතා කරන කලාලයකි. මාස 3-6 දක්වා කෙටි කාලයක් පමණක් භාවිතා කල හැකි බැවින් පුනරාවර්තන වියදම් ලෙස සලකා ගිණුම් ගත කර ඇත. |

(ආ) **<u>අරමුදල් ශේෂ 11 - රු. 2,210,359.08</u>**

**1101011103 - රු.. 25,500.00**

මෙම ගිණුම ආරම්භ කර ඇත්තේ ක්‍රීඩා වෛද්‍ය සහතික පත්‍ර පාඨමාලාව සඳහාය. නමුත් ඒ සඳහා ලියාපදිංචි වී ඇත්තේ එක් සිසුවකු පමණි. එහිදී එම ශිෂ්‍යයා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අනුයුක්ත කර ලද ආදායම ජ'නල් සටහනක් මගින් ක්‍රීඩා වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලා ගිණුම සඳහා මාරු කිරීම සිදුකර ඇති අතර එම ජ'නල් සටහන දෙවරක් සටහන් වීම නිසා මෙලෙස හර ශේෂයක් පෙන්නුම් කර ඇති අතර ජ'නල් අංක 79 මගින් එය නිවැරදි කර ඇත.

**1101011104 - රු. 641,511.31 - Diploma Course in Exercise & Sport Science Fund**

ඉහත ගිණුමේ ක්‍රීඩා වෛද්‍ය පශ්චාත් උපාධි ගිණුමට සහ House Hold Survey ගිණුමට පිළිවෙලින් හර විය යුතු රු. 32,025.00 සහ රු. 115,000.00 මෙම ගිණුමට වැරදීමකින් හර කර ඇත. දැනට මෙම ගිණුමේ බැර ශේෂයක් පවතින අතර ගිණුම සක්‍රීයව ක්‍රියාත්මක වන බවද දන්වමි. ජ'නල් අංක 81 මගින් නිවැරදි කිරීම් සිදු කර ඇත.

**1101020401 - රු. 89,939.24**

ශාස්ත්‍ර පීඨයෙහි විශේෂ අවශ්‍යතා ඒකකයට අදාල මෙම ගිණුමෙහි වැරදි සටහනක් මත රු. 89,939.24 හර ශේෂයක් පෙන්නුම් කරයි. මෙම වරද ජ'නල් අංක 204K0004 මගින් නිවැරදි කරන ලද අතර එම ගිණුමෙහි දැනට බැර ශේෂය රු. 17,511.90 වේ. ඒ අනුව ගිණුම නිසි පරිදි නිවැරදි කර ඇත.

**1101020703 - රු. 332,560.15**

මෙය ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ චක්‍රිය අරමුදල් ගිණුමයි. (EDC Revolving fund account) මෙය නිශ්චිත වූ අරමුදලක් නොවේ. ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ සියළුම වියදම් මෙම ගිණුමට හර කොට වියදම් කරන ලද ප්‍රමාණය ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ ආදායම් ගිණුමෙන් ප්‍රතිපූර්ණය කර ගනිමින් රු. 2,000,000.00 ක මුදලක් අග්‍රිමය වශයෙන් පවත්වාගනී.

**11-01-03-00-06 - රු. 924,815.26**

මෙම ගිණුම සඳහා 2013 වර්ෂයේ ලද රු. 1,000,000.00 ක චෙක්පතක් නොවැම්බර් මස 22 ලැබී ඇති අතර එය වැරදීමකින් 13-41-00-00-03 යන ගිණුමට බැර කිරීම නිසා ශේෂය ඍණ වීම සිදු වී ඇත. එකී වැරැද්ද හඳුනාගත් වහාම 2014 වසරේ ජ'නල් සටහන් 08 මගින් නිවැරදි කර ඇත.

**1101041102 - රු. 59,530.00**

වෛද්‍ය අධ්‍යාපන ඒකක ගිණුමට යා යුතු රු. 41,630.00 ක මුදල වැරදීමකින් අදාල ගිණුමට හර කිරීම හා ව්‍යාධිවේදී ආදායම් ගිණුමට යා යුතු රු. 18,900.00 ක මුදල ඉහත ගිණුමට ඇතුලත් වීම නිවැරදි කිරීම සඳහා යෙදූ ජ'නල් සටහන දෙවරක් සටහන් වීම නිසා මෙලෙස ඍණ ශේෂයක් පෙන්නුම් කර ඇති අතර එය ජ'නල් අංක 77 මගින් නිවැරදි කර ඇත.

**1101041111 - රු. 6,877.47**

මෙම ගිණුමට ආදායම් ලැබීම ඉතා සුළු මට්ටමක පවතින නිසා මෙම ආදායම් විවිධ ආදායම් ගිණුමට ඇතුලත් කිරීමටත් ගෙවීම් විවිධ වියදම් ගිණුම යටතේ සටහන් කිරීමත් සිදුකරනු ලබන අතර වැරදීමකින් මෙම ගිණුමට ඇතුලත් වූ රු. 6,877.47 ක වියදම ජ'නල් අංක 82 මගින් පෙර වර්ෂ ගැලපීමක් ලෙස නිවැරදි කර ඇත.

**1101042103 - රු. 53,725.65**

අදාළ ගිණුම දන්ත චිකිත්සාවෙන් ලැබෙන මුදල් හා එම චිකිත්සාවන්ට අදාළ පරිභෝජන ද්‍රව්‍ය මිලට ගැනීම ගිණුම්ගත කිරීම සඳහා ආරම්භ කරනු ලැබ ඇති අරමුදල් ගිණුමකි. රෝගීන්ගෙන් දන්ත චිකිත්සාවන් සඳහා අයකරන මුදල්

ප්‍රමාණවත් නොවීම හා මෙම කටයුතු සඳහා භාවිතා කරන පාරිභෝජන ද්‍රව්‍ය තොගය මෙම ගිණුමට නොගැලපීම නිසා මෙලෙස තාවකාලික ඍණ ශේෂයක් ඇතිව තිබීමට හේතුව වේ. දැනට මෙම ගිණුම් ශේෂය නිවැරදි පරිදි පවත්වාගෙන යනු ලැබේ.

**11-01-07-04-02 - රු. 35,000.00**

මෙම ශේෂය විශ්වවිද්‍යාලයේ දීර්ඝ කාලයක් පැවත එන ශේෂයක් වන අතර ඒවා මුදල් කමිටුවට වාර්ථා කර ඇත. එහිදී මුදල් කමිටු 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරීම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට විශ්වවිද්‍යාලීය සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය ශේෂයක් ලෙස නොපවතී.

**110114900-207- රු.3,400.00**

මෙය භූ තාක්ෂණ පශ්චාත් උපාධි පාඨමාලා අරමුදලයි. 110114900-207 යනු මෙම උපාධි පාඨමාලාව සඳහා පෙර ලබා දී තිබු ගිණුම් කේතයයි. පසුකාලීනව මෙම උපාධි පාඨමාලාව වෙනුවෙන් 11012170007 ගිණුම් කේතය ලබා දී ඇත. විගණන ජේදයේ සඳහන් රු. 3,400.00 ක මුදල නව ගිණුම් කේතයට ඇතුලත් විය යුත්තකි. එහෙයින් 2014.09.11 දිනැති JV/2014/74 යන ජ්නලයෙන් මෙය නිවැරදි කර ඇත.

**11015200 - රු.37,500.00**

**Medical Faculty Alumini Fund**

චක්‍රීය අරමුදලට හර විය යුතු රු. 37,500.00 ක් ආදාල ගිණුමට හරවීම නිසා මෙම හර ශේෂය පෙන්නුම් කරයි. එය ජ්නල් අංක 80 මඟින් නිවැරදි කර ඇත.

**<u>පර්යේෂණ අරමුදල් ශේෂ 28 - රු. 3,321,486.00</u>**

**1301040001- රු. 298,500.00**

ගිණුම්කරණමය අතපසු වීමක් මත මෙම තත්ත්වය ඇති වී තිබෙන අතර ජ්නල් අංක K01, K12 හා K43 මඟින් නිවැරදි කරන ලදි.

**1301041210- රු. 3,771.00**

ගිණුම්කරණමය අතපසු වීමක් මත මෙම තත්ත්වය ඇති වී තිබෙන අතර ජ්නල් අංක K01, K12 හා K43 මඟින් නිවැරදි කරන ලදී.

**1301071201- රු. 169,894.63**

අචාර්ය ඒ. යු. ඒ. ඩබ්. ගුණවර්ධන මහතා වෙත ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයක් වන මෙම ගිණුම් කේතයට මීට සමගාමීව කරන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රදානයෙන් මිලදී ගන්නා ලද විදේශ ඇණවුම් වියදම් හර කිරීම තුලින් පර්යේෂණ ප්‍රදාන උපලේඛනයේ පෙන්වූ ඍණ ශේෂය 2014.11.11 දිනැති ජ්නල් අංක 60 මඟින් පීඨය විසින් නිවැරදි කරගන්නා ලදි.

**1301110904- රු. 13,425.00**

13-01-11-09-04 ගිණුම් අංකය යටතේ පෙර වර්ෂයේ සිට පැවත එන ඍණ ශේෂය වන රු. 13,426.00 ක මුදලින් රු. 12,495.00 ක මුදල වෙනත් ගිණුමට හරවිය යුතු වුවත් වැරදීමකින් මෙම ගිණුමට හර වී ඇත. ඉතිරි රු. 931.00 ක මුදල වෛද්‍ය ඩී. එන්. අතපත්තු මිය ආපසු ගෙවන ලදී. රිසිට්පත් අංක 36675 යටතේ 2014.10.14 වන දින නිවැරදි කිරීම් සිදුකර ඇත.

**1301111201 - රු.   57,856.00**
**1301111203 - රු. 142,104.00**
**1301111204 - රු. 258,979.00**

**1301111205 - රු.   5,696.00**
**1301111206 - රු.  78,991.00**

දැනට මෙම ගිණුම්වල බැර ශේෂයන් පෙන්නුම් කෙරේ. (ධන ශේෂයන්) අදාල නිවැරදි කල ගිණුම්වල පිටපත් යටතේ දක්වා ඇත.

**1301141201 - රු.  54,155.00 - අචාර්ය ආර්. එස්. රාජකරුණා  ව්‍යාපෘතිය: RG/2012/40/S**
**1301141202 - රු. 106,818.00 - ආචාර්ය එම්. ඒ. එස්. පී. කේ. මලවිආරච්චි ව්‍යාපෘතිය: RG/2012/41/S**
**1301141204 - රු.  50,546.00 - ආචාර්ය එච්. ඇම්. එස්. පී. මඩවල ව්‍යාපෘතිය: RG/2012/43/S.**
**1301141207 - රු.  70,000.00 - ආචාර්ය පී. ඒ. ඩී. පෙරේරා ව්‍යාපෘතිය: RG/2012/GG-1/46/S**
**1301141209 - රු.  35,161.00 - ආචාර්ය ජේ. ඩබ්ලිව්. දමුණුපොල ව්‍යාපෘතිය: RG/2012/GG-1/48/S**
**1301141210 - රු.  46,419.00 - ආචාර්ය එන්. පී. එස්. කුම්බුරේගම ව්‍යාපෘතිය: RG/2012/GG-1/49/S**
**1301141301 - රු.  17,945.00 - ආචාර්ය එස්. සි. කේ. රූබසිංහ ව්‍යාපෘතිය: RG/2013/13/S**
**1301141304 - රු. 7 2,750.00 - ආචාර්ය ඩී. එන්. කරුණාරත්න ව්‍යාපෘතිය: RG/2013/16/S**

ඉහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අරමුදල් වලින් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපෘති 2013 වර්ෂයේ ආරම්භ කර ඇති අතර අදාළ වර්ෂයේ අග වන විට ප්‍රතිපාදන ලබා දී තිබුණේ ඇස්තමේන්තුගත මුදලින් කොටසක් පමණි. 2013 වර්ෂයේ වියදම් වලට සාපේක්ෂව මෙම එක් එක් ව්‍යාපෘති වලට ලැබී ඇති මුදල ප්‍රමාණවත් නොවීම මත පොදු අරමුදල් ගිණුමෙන් අදාල වියදම් කර ගෙන යාමට සිදුවිය. එසේම මෙම ව්‍යාපෘතිවල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදු වූ හෙයින් 2013 වර්ෂයේ අවසානයේදී ආදායම ඉක්මවා වියදම පෙන්වීමට සිදු වුවත් 2014 වර්ෂයේදී  පර්යේෂණ  අරමුදල් නිසි පරිදි ලැබීම නිසා මෙම සෘණ වූ ශේෂ පියවා ඉතිරි මුදල ලබා ගැනීමට හැකිවීමත් සමඟ මෙම ව්‍යාපෘතිවල නිවැරදි පරිදි ශේෂයන් පවත්වා ගැනීමට හැකිවිය.

**1301211202- රු. 44,000.00**
**1301211301- රු. 58,217.00**

RG/2012/31/D - ගිණුම් අංක 1301211202 හා RG/2013/07/D - ගිණුම් අංක 1301211301 පර්යේෂණ අරමුදල් වලට අදාලව ලැබී තිබූ ප්‍රතිපාදන ඉක්මවා 2013.12.31 දිනට පිළිවෙලින් රු. 44,000.00 ක් හා රු. 58,217.00 ක් වියදම් දරා තිබුණි. ආචාර්යවරුන්ගේ පර්යේෂණ අරමුදල් වලට අදාලව ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය විසින් අනුමත කිරීමෙන් අනතුරුව ඒ සඳහා මුදලින් ප්‍රතිපාදන නොලැබී තිබුණද වෙනත් ආචාර්යවරුන් සඳහා ලද පර්යේෂණ අරමුදල් ප්‍රතිපාදන ඉතිරිව පවත්නා විට එම මුදල් අනුමත වී ඇති වෙනත් පර්යේෂණ කටයුතු සඳහා යොදවා ගනු ලබයි. පසුව ඉහත පරික්ෂණ සඳහා 2014 වර්ෂයේ ලද මුදල් වලින් නිවැරදි ගැලපීම් කිරීමට කටයුතු කර ඇත.

**1301441202- රු. 59,848.00**

මෙම ශේෂය මේ වන විට අදාල නිවැරදි ගිණුමට ගිණුම් ගත කර ඇත.

**131024119-211  - රු. 1,109,949.00**
**131005118-0211- රු.    16,925.00**

13-10-05-118-0211 ගිණුමේ 2013.12.31 දිනට සෘණ ශේෂයක් පෙන්නුම් කරනුයේ අදාළ පර්යේෂණ කටයුත්ත අඛණ්ඩව කරගෙන යායුතු නිසා පර්යේෂකයා විසින් කළ වියදම් අදාල ගිණුමට හර කිරීම හේතුවෙනි. නමුත් 2014.03.28 දිනද රු. 246,023.00 ක මුදලක් මෙම පර්යේෂණ සඳහා ලැබී ඇත. එය රිසිට්පත් අංක 1087966 යටතේ ගිණුම්ගත වී ඇත. එම නිසා දැනට මෙම ගිණුමේ සෘණ ශේෂයක් නොපෙන්වයි.

**1311070003 - රු. 12,055.00**
**1342070001 - රු. 128,941.00**

මෙම ගිණුම් දෙක ගිණුම්කරණ පද්ධතිය විමධ්‍යගත කිරීමට පෙර පැවති ශේෂයන් වන අතර මේ පිළිබඳව 2015 ජනවාරි මස 07 වැනි දින පැවති 339 වැනි මුල්‍ය කමිටු අනුමැතිය මත ලෙජරයේ ගලපා ඇත.

**1311070712 - රු. 40,949.00**

විදේශ ඇණවුමකින් වත්කම් මිලදී ගැනීමේදී පැන නැගුණු නිසි ලෙස නිශ්චය කළ නොහැකි වු වරාය කුලී හා රක්‍ෂණ ගාස්තුවල ඉහළ යාමත්, විදේශ විනිමය අනුපාතයේ බලපෑමත් මත ජාතික විද්‍යා පදනමේ ප්‍රදානය ඉක්මවා ගිය වියදම මත පැන නැගුණු මෙම හර ශේෂය පසුව විශ්වවිද්‍යාලීය වාර්ෂික ප්‍රතිපාදන වලින් පියවා නිරවුල් කරන ලදී. 2014.12.31 දිනට කිසිදු ශේෂයක් මෙම කේතයේ නොමැත.

**1311141103 - රු. 47,429.00 - මහාචාර්ය ඩී. එම්. ඩී. යකන්දාවල ව්‍යාපෘතිය (RG/2011/NRB/03)**

මෙම ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනම් ආයතනයේ (NSF) ප්‍රතිපාදන මත පවත්වාගෙන යන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය අවසන් වනතුරු කරගෙන යාම සඳහා මුදල් ලැබෙනුයේ කොටස් වශයෙනි. 2013 වර්ෂය අග භාගයේදී ලබා දී තිබුණ ප්‍රතිපාදන වලට අදාළ චෙක්පත (වටිනාකම රු. 105,000.00) එවා ඇති බව ලිපියකින් දන්වා තිබූ නමුත් එම චෙක්පත අප වෙත ප්‍රමාද වී ලැබීම නිසා ගිණුම් ගත කිරීමට සිදු වූයේ 2014 ජනවාරි මාසයේදීය. එම නිසා 2013 වර්ෂයේ ආදායම ඉක්මවා වියදම පෙන්වීමට සිදු වුවත් මෙම ඍණ ශේෂය 2014 ජනවාරි මාසයේදී නිවැරදි කර ගැනීමට හැකිවිය.

**1312000001 - රු. 28,355.00**

මෙම රු. 28,355.00 ක මුදල 2015.06.12 දින රිසිට්පත් අංක 1361043 න් පියවා ඇත.

**13-11-07-12-16 - රු. 291,808.00**

ජාතික විද්‍යා පදනමින් විදේශ ඇණවුමකින් මිලදී ගන්නා ලද වත්කමක් වෙනුවෙන් ගෙවිය යුතු වු අතිරේක වියදම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන වලින් විදේශ සැපයුම් අංශයට බැර කර දරන ලද වියදම පීඨයේ ඉහත ගිණුම් කේතයට හර කිරීමෙන් සිදු වු වරදින් පැන නැගී ඇති මෙම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

**පර්යේෂණ අරමුදල් - රු. 360,508.00**

**පර්යේෂණ අරමුදල් 12 - රු. 319,608.00**

**1301021204 - රු. (7,052.00)**

මෙය විශ්වවිද්‍යාලයේ පර්යේෂණයක් වන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයට නියමිත කාල වකවානුවට මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබුණු හෙයින් ද පර්යේෂණ කටයුතු අතරමග නතරකර නොහැකි බැවින් ද අවශ්‍ය වියදම් විශ්වවිද්‍යාලයෙහි අනෙකුත් අරමුදල් මඟින් වියදම් කර ඇත. තවද 2014 වර්ෂයේ මුදල් ලැබුණු වහාම මෙම ගිණුමෙහි ඍණ අගය පියවා ඇත. තවද මෙම පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර මෙම ව්‍යාපෘතියෙහි කිසිදු ශේෂයක් 2014.10.20 දිනට නොමැත.

**1301021207 - රු. (3,148.00)**

මෙය විශ්වවිද්‍යාලයේ පර්යේෂණයක් වන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයට නියමිත කාල වකවානුවට මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබුණු හෙයින් ද, පර්යේෂණ කටයුතු අතරමග නතරකර නොහැකි බැවින් ද අවශ්‍ය වියදම් විශ්වවිද්‍යාලයෙහි අනෙකුත් අරමුදල් මඟින් වියදම් කර ඇත. තවද 2014 වර්ෂයේ මුදල් ලැබුණු වහාම මෙම ගිණුමෙහි ඍණ අගය පියවා ඇත. තවද මෙම පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර මෙම ව්‍යාපෘතියෙහි කිසිදු ශේෂයක් 2014.10.20 දිනට නොමැත.

**1301021213 - රු.(5,234.00)**

මෙය විශ්වවිද්‍යාලයේ පර්යේෂණයක් වන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයට නියමිත කාල වකවානුවට මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබුණු හෙයින් ද පර්යේෂණ කටයුතු අතරමග නතරකර නොහැකි බැවින් ද අවශ්‍ය වියදම් විශ්වවිද්‍යාලයෙහි අනෙකුත් අරමුදල් මඟින් වියදම් කර ඇත. තවද 2014 වර්ෂයේ මුදල් ලැබුණු වහාම මෙම ගිණුමෙහි ඍණ අගය පියවා ඇත. තවද මෙම පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර මෙම ව්‍යාපෘතියෙහි කිසිදු ශේෂයක් 2014.10.20 දිනට නොමැත.

**1301040001 - රු. (91,282.00)**

විශ්වවිද්‍යාලයෙහි තීරණයක් මත 2013 වර්ෂයේ සිට පර්යේෂණ අරමුදල් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් ලබා දීම අත්හිටුවා ඇති අතර 2013 වර්ෂයෙහි සියලු පර්යේෂණ අරමුදල් එක් එක් පීඨයන් වෙත ලබා දී ඇති තනි ලෙජර් ගිණුමක් හරහා පාලනය කරයි. 2013 වර්ෂයේදී මෙම ගිණුමෙන් දරා ඇති මුදල රු. 91,282.00 වශයෙන් පෙන්වයි. 2013 වර්ෂය තුලදී මෙම ගිණුමට ලබාදුන් ප්‍රතිපාදන ගිණුම්ගත නොවීම මත මෙම ඍණ ශේෂය හටගෙන ඇත. ජනල් අංක K-001-02-12,40 මගින් මෙම තත්ත්වය නිවැරදි කර ඇත.

**1301071101 - රු. (16,996.00)**

මෙය විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයකි. මෙම ප්‍රදානයන් වෙනුවෙන් වූ මුළු මුදලම එකවර පීඨය වෙත ලබා නොදෙන අතර මුලින් 50% ක් ද ඉන් පසුව වියදම් දැරීමෙන් පසුව ඉතිරි මුදල ප්‍රතිපූර්ණය කිරීම ද සාමාන්‍ය පිළිවෙතයි. මේ අනුව ඉහත සඳහන් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය යොදාගනිමින් එම පර්යේෂණලාභියා විදේශිය ඇණවුමකින් පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන ඇති අතර විදේශ විනිමය උච්ඡාවචනය මත පැන නැගුණු අතිරේක වියදම මත අනුමත ප්‍රදානය ඉක්මවා වියදමක් දැරීමට සිදුවිය. මේ අනුව ඇති ඍණ ශේෂය විශ්වවිද්‍යාලීය පර්යේෂණ සභාවේ අනුමැතිය මත අතිරේකව ප්‍රතිපාදන ලබාදීම මගින් නිරවුල් කර ඇත.

**1301111102 - රු. (8,468.00)**
**1301111103 - රු. (9,180.00)**
**1301111106 - රු. (11,493.00)**
**1301111109 - රු. (8,995.00)**

විමසුමේ සඳහන් වෛද්‍ය පීඨයේ කථිකාචාර්යවරුන් විසින් 2011 වර්ෂයේ දී කරන ලද විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල් වලින් 2013.12.31 දින වන විට ඉහත සඳහන් ශේෂයන් පැවති බව දැක්වේ. එම ශේෂයන් මේ වන විටත් පියවා අදාල ලෙජර් ගිණුම් තුලනය කර ඇත. විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අරමුදල් ලැබීම ප්‍රමාදය නිසා පීඨයේ ඉපයූ ආදායම් වලින් මෙම වියදම් සමාලෝචිත වර්ෂයේදී දරා ඇත. එම නිසා අදාල පර්යේෂණ ගිණුම් වල ඍණ ශේෂයක් පෙන්නුම් කරයි. නමුත් 2014 වර්ෂයේදී අදාල ප්‍රතිපාදන විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල් මගින් ලැබී ඇත. දැනට මෙම පර්යේෂණ නිමවා ඇති අතර ගිණුම් වල පෙන්වා ඇති ශේෂයන් විශ්වවිද්‍යාල පර්යේෂණ ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර ඇත.

**1311070003 - රු. (12,055.00)**

මෙම ගිණුම ගිණුම්කරණ පද්ධතිය විමධ්‍යගත කිරීමට පෙර පැවති ශේෂයන් වන අතර මේ පිළිබඳව 2015 ජනවාරි මස 07 වැනි දින පැවති 339 වැනි මූල්‍ය කමිටු අනුමැතිය මත ලෙජරයේ ගලපා ඇත.

**1311141104 - රු. (25,045.00) - :RG/2011/ES/01/NSF - කථිකාචාර්ය එච්. එම්. එස්. පී. මඩවල**

මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය සඳහා රු. 1,772,050.00 ක මුදලක් ඇස්තමේන්තු කොට අනුමත කර ඇත. ඒ අනුව අදියර තුනක් යටතේ එනම් 2011/2012 වර්ෂය සඳහා රු. 805,550.00 ක්ද 2012/2013 වර්ෂය සඳහා රු. 538,600.00 ක්ද 2013/2014 වර්ෂය සඳහා රු. 427,900.00 ක්ද වශයෙන් ප්‍රතිපාදන ලබාදීමට ජාතික විද්‍යා පදනම ආයතනය විසින් එකඟ වී ඇත. 2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු. 437,145.30 ක මුදලක් වියදම් කිරීමට සිදුවුණි. ඒ වන විට ව්‍යාපෘතිය සඳහා රු. 412,100.00 ක් ලබා දී තිබුණු අතර එම මුදල 2012 වර්ෂයට ප්‍රමාණවත් නොවන බව අදාල ආයතනයට දැනුම් දී තිබුණි. ඒ අනුව ජාතික විද්‍යා පදනම් ආයතනය විසින් 2012 දෙසැම්බර් 18 දින මෙම ව්‍යාපෘතිය සඳහා රු. 425,450.00 ක් මාරුකර ඇති බව අප වෙත දුරකථන පණිවිඩයක් මගින් දැනුම් දී තිබුණි. එම මුදල ලැබීමේ විශ්වාසය මත සහ ව්‍යාපෘතියේ කටයුතු අතරමග නවතා දැමීමට නොහැකි වීම නිසා වියදම් පවත්වාගෙන ගිය ද එම චෙක්පත අප වෙත ලැබුනේ 2013 ජනවාරි 10 වැනි දිනය. එබැවින් 2013 වර්ෂ අවසානයේ දී මෙම ව්‍යාපෘතියේ රු. 25,045.30 ක හිඟයක් පෙන්වීමට සිදු වුවද එය 2014 ජනවාරි 10 වැනි දින වනවිට පියවී අදවන විට මෙම ගිණුමේ රු. 618,112.20 ක ඉතිරියක් ඇත.

**අරමුදල් 02 - රු.40,900.00**

**110114900-207 - භූ තාක්ෂණ ඉංජිනේරු පශ්චාත් උපාධි පාඨමාලා අරමුදල් ගිණුම - රු. 3,400.00**

මෙය භූ තාක්ෂණ ඉංජිනේරු පශ්චාත් උපාධි පාඨමාලා අරමුදල් ගිණුමයි. මෙම පාඨමාලාව සඳහා අංක 110114900-207 යන කේතය පැරණි ගිණුම් ක්‍රමය යටතේ ලබා දී තිබුණි. පසුව නව ගිණුම් කේතය වන 11-01-217-00-07 අංකයට හරවිය යුතු වූ රු. 3,400.00 ක් වැරදීමකින් පැරණි ගිණුම් කේතයට හර කිරීම නිසා මෙලෙස ඍණ ශේෂයක් ගිණුමේ නිරීක්ෂණය

| | |
|---|---|
| | විය. එසේම මෙය 2014.09.11 දිනැති ජනල් අංක JV/2014/74 මගින් නිවැරදි කර තිබේ.<br><br>**11015200 - ආදී වෛද්‍ය පීඨ විද්‍යාර්ථයින්ගේ අරමුදල් රු. 37,500.00**<br><br>චක්‍රීය අරමුදලට බැරවිය යුතු වියදමක් මෙම ගිණුමට වැරදීමකින් ඇතුළත් කර ඇත. එය ජ'නල් අංක 80 මගින් නිවැරදි කර ඇත. |
| **(ඇ)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වියදම රු. 65,538,406.00 ලෙස ගණනය කර ඇති අතර විගණන විමසුමට අනුව එය ගණනය කර ඇත්තේ බැංකු ප්‍රකාශනයට අනුව වියදම රු. 44,811,397.00 ක් උපචිත වියදම රු. 25,790,507.00 ක් හා විවිධ ණය හිමියෝ රු. 622,902.00 ක් එකතු කිරීමෙන් ලද රු. 71,224,806.00 ක් අගය ලෙසය. මෙම අගයන් දෙක අතර වෙනස රු. 5,686,400.00 ක මුදල විගණන විමසුමේ දක්වා ඇත. එයට හේතු වූයේ 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගෙවිය යුතු වියදම හා ගෙවිය යුතු ණය මුදල් වෙනුවෙන් දරණ ලද වියදම් එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් නොවීමයි. නමුත් විගණනය කරන අවස්ථාවේදී බැංකු ශේෂය ලබා ගැනීමේදී පෙර වර්ෂයේ වියදම් සඳහා අදාල වර්ෂයේදී කරන ලද ගෙවීම් ගැලපීමකින් තොරව සියලුම ගෙවීම්, වියදම් ලෙස සළකා කටයුතු කර ඇත. එය නිවැරදි කළ පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයට සමාන වේ. ඒ ආකාරයට ගිණුම් නිවැරදි කර ඇත. |
| **(ඈ)** | 2007 වර්ෂයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වූ Distance Education Moderation ව්‍යාපෘතිය යටතේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත ලබා දී තිබූ රු. 1,468,164.00 ක් වූ වත්කම් 2007 සිටම නිවැරදිව ගිණුම් වල වත්කම් වශයෙන් ගලපා ඇති අතර ඒ සඳහා ක්ෂය වෙන්කිරීම් නිසි පරිදි 2007 වර්ෂයේ ගිණුම් වල ගලපා ඇත. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීමක් අවශ්‍ය නොවේ. |
| **(ඉ)** | ආයතනයේ අපහරණ ක්‍රියාවලිය මගින් භාවිතයෙන් ඉවත්කරන ලද දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට අයත් භාණ්ඩවලට අදාල ස්ථාවර වත්කම්වල වටිනාකම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර එයට අදාල වත්කම්වල වටිනාකම් හා ක්ෂය ගැලපීම් 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වීමට කටයුතු කර ඇති බව මෙයින් දන්වා සිටිමි. |
| **(ඊ)** | පුහුණු අත්පොත් 1913 ක වටිනාකම වු රු. 417,034.00 ක් සමාලෝචිත වර්ෂයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසන් තොග පිරිවැයට ඇතුලත් කර නොමැත. එය 2014 වර්ෂයේ පෙර වර්ෂ තොග ගැලපුමක් ලෙස නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| **(උ)** | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට මිලදී ගන්නා ලද රු. 4,950,000 ක වටිනාකමින් යුතු පරිගණක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම්වලට ඇතුළත් නොකොට වියදම් ගිණුමට හර කිරීම මත මෙය පැන නැගී ඇත. මෙම වත්කම් 2014 වර්ෂයේදී නිවැරදි ලෙස ගිණුම්ගත කර ඇත. ක්ෂය කිරීම්ද නිවැරදි ලෙස 2014 වර්ෂයේ ගිණුම්වල ගලපා ඇත. |
| **(ඌ)** | ලියාපදංචි වු සිසුන් පාඨමාලාවට සහභාගි නොවීම, අතරමගදී අත්හැරයාම වැනි කරුණු මත පදනම්ව පැන නැගී තිබූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු. 642,271.00 ක මුදල තවදුරටත් නොලැබෙන බැවින් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් වලින් ඉවත් කිරීමට ජ'නල් අංක 2013/11 මගින් කටයුතු කර ඇත. ඒ අනුව කළමණාකරණ කමිටුවේ හා මුදල් කමිටුවේ අනුමැතිය මත තවදුරටත් ලැබිය යුතු ආදායමක් ලෙස නොසළකා ගිණුම් වලට ගැලපීමට කටයුතු කර ඇත. |
| **(එ)** | **13-01-07-12-01 - රු. 169,894.63**<br><br>අචාර්යවරයෙකු වෙත ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයක් වන මෙම ගිණුම් කේතයට මීට සමගාමීව කරන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රදානයෙන් මිලදී ගන්නා ලද විදේශ ඇණවුම් වියදම් හර කිරීම තුලින් පර්යේෂණ ප්‍රදාන උපලේඛනයේ පෙන්වූ සෘණ ශේෂය 2014.11.11 දිනැති ජ'නල් අංක 60 මගින් නිවැරදි කරන ලදි. |
| **(ඒ)** | විමසුමේ දක්වා ඇති ජාතික විද්‍යා පදනම මගින් ලබාදී තිබූ Co2 Incubator ය සඳහා අදාල පර්යේෂණ ව්‍යාපෘතිය මගින් රු. 907,424.00 ක මුදලක් ලබාදී ඇති නමුත් අදාල උපකරණය සඳහා සත්‍ය වශයෙන් වියදම් කර ඇත්තේ රු. 761,600.00 ක් වන අතර ඉතිරි මුදල රු. 145,824.00 නැවත එම ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇත. ඒ අනුව අදාල උපකරණයේ සත්‍ය වටිනාකම රු. 761,600.00 ක් වන අතර එය 2012 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන යටතේ ප්‍රග්ධනිත කර ඇත.<br><br>විමසුමෙන් පෙන්වාදී ඇති වෛද්‍ය පීඨයට අයත් රු. 272,067.00 ක භාණ්ඩ සම්බන්ධ වටිනාකම් නිවැරදි නොවන අතර ඊට අදාල නිවැරදි වටිනාකම් පහත දැක්වෙන වර්ෂයන්ට අදාලව ප්‍රග්ධනිත කර ඇත. |

| අයිතමය | වටිනාකම | ගිණුම්ගතකළ වර්ෂය |
|---|---|---|
| Stain steel Arc Welding Machine | 94,450.00 | 2012 |
| Hamstic Analyzer | 530.00 | 2002 |
| Hegue duty magnitoldgaugest set | 6,400.00 | 2002 |
| Miter SAW | 24,000.00 | 2002 |
| Digital Vane Anometer | 18,600.00 | 2002 |

| | |
|---|---|
| (ඔ) | 2013 වර්ෂය තුලදී බොහොමයක් පීඨයන් සඳහා Z-core ගැටළුව විසඳීමේ දී අතිරේක ශිෂ්‍යයන් සංඛ්‍යාවක් ඇතුලත් කිරීමට සිදුවිය. ඒ අනුව අදාළ පීඨවල ඉගැන්වීමේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා විගණන ජේදයේ සඳහන් ස්ථාවර වත්කම් මිල දී ගැනීමට සිදුවිය. මේ සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කලත් 2013 වර්ෂයේදී එම අතිරේක ප්‍රතිපාදන වෙනුවෙන් ප්‍රමාණවත් මුදල් භාණ්ඩාගාරයෙන් නිදහස් නොකළ බැවින් සහ මිලදී ගැනීමට ඇනවුම් කළ බොහොමයක් වත්කම් සඳහා විශ්වවිද්‍යාලයට වෙනත් පර්යේෂණ අරමුදල් සඳහා වූ ප්‍රතිපාදන යොදාගෙන ගෙවීමට සිදුවිය. මේ හේතුවෙන් වත්කම් මිලදී ගැනීමට වෙන් කල මුදල ඉක්මවා වියදම් දැරීමට සිදු විය. කෙසේ වෙතත් මෙම තත්ත්වය යටතේ ප්‍රාග්ධන වියදම්වල හිලව් කිරීමක් සිදු වී නොමැත. එසේම අතිරේක ප්‍රතිපාදන සඳහා වූ රු.මිලියන 240 ක් 2014 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති බැවින් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් පැන නොනගී. |
| (ඕ) | විදේශිය ශිෂ්‍ය ආදායම, ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත්, එසේම යම් වියදමක් දැරුවේ නම් එය වියදමක් ලෙස ගිණුම්ගත කළයුතු වුවත්, එසේ නොවී ලද ආදායමෙන් වෛද්‍ය පීඨයේ සිසුන් 5 දෙනෙකු මැලේසියාවේ ජාත්‍යන්තර තරඟාවලියකට සහභාගි වීමට අවශ්‍ය ගුවන් ටිකට්පත්‍ර මිලදීගැනීමේ වූ වියදම් ලද විදේශ ශිෂ්‍ය ආදායමෙන් දැරීම නිසා වූ ශුද්ධ ආදායම ගිණුම්ගත වීමක් හේතුවෙනි. නමුත් ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ දෝෂ ඇති නොවීමට ක්‍රියාමාර්ග හා උපදෙස් ලබා දී ඇත. තවද මෙම ගිණුම් තැබීමේ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ක) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුල තොග ගැලපුම් ගිණුම නමින් (12-01-68-00) ගිණුමක් 1995 වසරේ සිට පැවතුන අතර එහිදී එය ආරම්භ කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ විශ්වවිද්‍යාලයේ පවතින ගබඩාවල වාර්ෂික තොග ආගනන වටිනාකම් හා තොග පොත් වල අගයන් සැසඳීමයි. මෙහිදී මෙම අගයන් අතර වෙනස මෙම ගිණුමට මාරු කරනු ලැබ ඇත. පසුකාලීනව මෙම ගිණුමේ ශේෂය නිරීක්ෂණය කරනු ලැබූ අතර සැසඳීමේ දෝෂ ද, ගණනය කිරීමේ හෝ මිල කිරීමේ දෝෂ නිසාද අතුරු ගබඩාවල වාර්ෂික සංගණනයේදී ද්විගණනය තුලින් පර්යේෂණ සඳහා අධාර හා මිලදී ගනු ලැබූ භාණ්ඩ ගිණුම් ක්‍රියාවලියට පරිභාහිරව ගබඩා කිරීම තුලින්ද මෙවැනි අධි තොග ඇතිවීමට හේතු වශයෙන් හදුනාගන්නා ලදී.<br><br>තොග ගැලපුම් ගිණුමේ බැර ශේෂයක් ලෙස පැවතුන මෙම ශේෂය ඉහතින් සඳහන් කල පරිදි පෙර වර්ෂවලදී තොග ගැලපීමේදී සිදුකල වැරදි නිසා ඇති වූ හඳුනානොගත් ලැබීම් ගිණුම් ශේෂයක් නිසා විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස එම ශේෂය ආදායම් වියදම් විසර්ජන ගිණුමට බැර කිරීමෙන් තොග ගැලපුම් ගිණුම නිරවුල් කරන ලදි.<br><br>මෙම ගිණුම නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර එම කමිටු නිර්දේශය අනුව, මුදල් මණ්ඩල අනුමැතියද සහිතව සිදුකරන ලදි. මෙම තොග ගැලපුම් ගිණුම පියවීම සිදුකල යුතු නිවැරදිම ආකාරයට ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සිදුකර ඇති අතර මෙම ගිණුම පියවීම මගින් විශ්වවිද්‍යාලය තුල තොග ගැලපුම් ගිණුමක් නොපවතින අතර එමගින් තොග සම්බන්ධ ගිණුම් කටයුතු නිවැරදිව හා නිරවුල්ව සිදුකර ගැනීමට මේ වන විට හැකි වී ඇත. |
| (කා) | කොන්ත්‍රාත් අංක CW/CON/2012/938 කොන්ත්‍රාත්තුවෙහි 2013 වර්ෂයට අදාලව රු.300,405.84 සහ CW/CON/2013/978 කොන්ත්‍රාත්තුවට අදාලව රු.221,852.79 මුදල A0025 ජර්නලය මගින් 2014.12.31 ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත.<br><br>CW/CON/2012/938 කොන්ත්‍රාත්තුවෙහි 2012 වර්ෂයට අදාලව රු.1,262,031.00 මුදල ප්‍රාග්ධනිත කර නොමැති අතර එය 2015 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. |
| (කැ) | පශු වෛද්‍ය පීඨ රෝහල ඉදිකිරීම වෙනුවෙන් SAR/CW/CON/650 කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරුට 2007 සිට 2012 දක්වා රු. 40,800,000.00 ක මුදලක් ගෙවා ඇති අතර නිදහස් නොකල රැඳවුම් මුදල රු. 3,200,000.00 කි. එසේම කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත නිදහස් කිරීමේ දී නිරීක්ෂණය කළ අඩුපාඩු වෙනුවෙන් අමතර රුපියල් මිලියනයක් ද රඳවාගෙන ඇත. ඒ අනුව කොන්ත්‍රාත්තුව සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය වූ රු. 44,000,000.00 ඉක්මවා වියදම් කොට නොමැත. |

එසේම 2011.06.02 දින පශු වෛද්‍ය පීඨ රෝහල වෙනුවෙන් විදුලි සැපයුම විශ්වවිද්‍යාලයේ පුනරුත්තාපන අරමුදල් යොදාගෙන ලබා ගැනීම සඳහා ඉහත කොන්ත්‍රාත්තුවට අමතරව විදුලිබල මණ්ඩලය වෙත ගෙවන ලද රු. 1,471,987.00 ක මුදල ඉහත රුපියල් මිලියන 44ට අමතරව ප්‍රාග්ධනීත කර ඇත. ඒ අනුව පශු වෛද්‍ය පීඨ රෝහල් ව්‍යාපෘතිය යටතේ දරණ ලද මුළු වියදම වූ රු. 45,471,987.00 ක් වුවද ප්‍රතිපාදන ඉක්මවූ වටිනාකමක් ප්‍රාග්ධනීත කර නොමැත.

**(කෑ)**

- විගණන ජේදයේ සඳහන් පහත නම් සඳහන් ආචාර්යවරුන්ගේ ලිපිගොනු පරික්ෂාවේදී මෙම අයවලුන් විසින් බැඳුම්කර කඩකරන ලද දිනයේ සිට වර්ෂ 2013 දක්වා කාලය තුල බැඳුම්කර කඩ කල කාලය අවුරුදු 15 - 40 දක්වා පැරණි අය වේ. මෙම අයගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීම නීති මාර්ගයෙන් කටයුතු කිරීමේ කාල සීමාව ඉකුත් වී ඇති බැවින් නඩු පවරා අයකර ගැනීම කල නොහැක. තවද මෙම අයගේ වර්තමාන ලිපිනයන් සොයා ගත නොහැකි වීම හේතුවෙන්ද මෙම අයගේ ලිපිගොනුවෙහි ඇති ලිපිනයන්ට ලිපි යොමු කලද ඒවා ආපසු ඒම හේතුවෙන් ඔවුන්ව සම්බන්ධ කර ගැනිමට නොහැකි වී ඇත.

| නම | විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුදල | නම | විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුදල |
|---|---|---|---|
| 1. ජී සී ජේ ප්‍රනාන්දු මහතා | 1,686,683.51 | 2. ටී කිරුබරාජන් | 273,389.65 |
| 3. එස් එස් ජයනායකම් මහතා | 1,889,215.00 | 4. ජේ ජේ සී ලොරොයි මයා | 881,759.94 |
| 5. කේ ජෙගසෝති මහතා | 1,493,874.00 | 6. ඊ පොන්නම්පලම් මයා | 122,790.00 |
| 7. ආචර්ය කේ කයාලාසපති | 822,580.00 | 8. එස් ශාන්ති කුමාරි මිය | 408,644.64 |
| 9. ආර් සී මිල්ස් මහතා | 428,689.00 | 10. ජේ පී ශාන්තිකුමාර් මයා | 60,000.00 |
| 11. කේ නඩරාජා මහතා | 1,630,074.00 | 12. එස් තමිල්සේරම් මයා | 313,445.55 |
| 13. වී පවනසිවම් මහතා | 65,000.00 | 14. ආචාර්ය වී තේවේන්ද්‍රන් | 41,562.00 |
| 15. එල් ඒ පෙරේරා මහතා | 1,126,624.00 | 16. පී ඩබ් කොඩිතුවක්කු | 383,728.56 |
| 17. එස් පරරාජසිංහම් මයා | 1,641,697.00 | 18. වයි මරියනායගම් මයා | 46,080.00 |
| 19. එස් ඒ ප්‍රතාප මහතා | 1,240,048.63 | 20. එස් නාගලිංගම් | 128,210.00 |
| 21. පී පුනිදදාස් | 205,081.00 | 22. කේ ඒ නාථවිතාරන මයා | 333,921.00 |
| 23. පී පුවිරාජසිංහ මහතා | 1,867,493.00 | 24. වී නෙර්මිනාදන් මයා | 49,920.00 |
| 25. එස් වී රාජකුලේන්ද්‍රන් | 1,435,075.00 | 26. සී පද්මනාදන් මයා | 32,640.00 |
| 27. ජී පී සෙල්වේන්ද්‍රන් මයා | 274,374.00 | 28. ජී ජී එල් එම් ද සිල්වා මයා | 37,019.00 |
| 29. ඒ ශ්‍රීකාන්ත මයා | 2,425,529.00 | 30. ආචාර්ය එල් වී කේ ද සිල්වා | 67,459.00 |
| 31. එන් ශ්‍රී ස්කන්ධරාජා මයා | 33,408.00 | 32. එම් තවරාජා මයා | 71,558.00 |
| 33. එස් ශ්‍රී ස්කන්ධරාජා මයා | 31,680.00 | 34. වී උමාචන්ද්‍රන් මයා | 111,200.00 |
| 35. ඒ තිරුකේතීස්වරන් මයා | 3,357.00 | 36. කේ ආනන්දරාජා මයා | 618,818.83 |
| 37. පී චැන්ද්‍රපුටන් මයා | 53,321.00 | 38. කේ බාලශන්මුගම් මයා | 38,904.68 |
| 39. එම් එස් විජේසිංහ මයා | 20,000.00 | 40. ඒ කුමාරස්වාමිය මිය | 15,655.92 |
| 41. ආර් එස් කනගරාජා මයා | 504,364.00 | 42. එස් දයානන්ද මයා | 88,083.81 |
| 43. එම් ඩී දයානන්ද මයා | 52,634.00 | 44. එස් කනගනාතන් මයා | 53,420.00 |
| 45. එම් එස් ඩී කේ දිවිසේකර මයා | 59,059.00 | 46. එස් සී පෙරේරා මෙනවිය | 421,689.00 |
| 47. එච් එම් ෆොන්සේකා මයා | 30,472.00 | 48. එම් එක්ස් ජේ මෝතා මයා | 59,308.00 |
| 49. එච් බී ජයවීර මයා | 42,220.00 | 50. ආර් නරේන්ද්‍රන් මයා | 579,345.00 |
| 51. ටී ඒ කුරුප්පුආරච්චි මයා | 72,827.00 | 52. ඒ බාලචන්ද්‍රන් මයා | 80,000.00 |
| 53. එස් ඒ මීගම මයා | 25,000.00 | 54. ආචාර්ය ඒ එන් එම් පෙරේරා | 97,454.00 |
| 55. එම් එල් සී මෙල් මිය | 5,700.00 | 56. එස් පෙතියාගොඩ මයා | 46,754.00 |
| 57. එම් ඒ එම් ශුක්රි මයා | 53,900.00 | 58. ජී ඒ කේ රණවීර මයා | 54,347.00 |
| 59. ආචාර්ය ජේ සී එල් දෙනිපිටිය | 101,187.00 | 60. ආචාර්ය ඒ ත්‍යාගරාජා මයා | 80,000.00 |
| 61. ජේ එන් හුවර් මයා | 107,399.00 | 62. කේ විනයාගමූර්ති මයා | 81,831.00 |
| 63. එෆ් එම් ආර් කොරයා මයා | 263,360.72 | 64. ඒ යසෝදරන් මයා | 537,311.20 |
| 65. ඒ එච් ඊ ධර්මරාජා මයා | 230,645.11 | 66. ආර් ඩී චන්ද්‍රසේන මයා | 59,449.00 |
| 67. කේ කන්දසාමි මයා | 122,776.00 | 68. ආචාර්ය පී ගොපාල ක්‍රිෂ්නකෝන් | 62,466.00 |

- එසේම බැඳුම්කර ගිවිසුම් සහිත වුවත් විශ්වවිද්‍යාල පනතේ අංක 94 (ඇ) ප්‍රකාරව අර්ථසාධක අරමුදලේ ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් වගන්තීන් ඇතුලත් කොට නොමැති වීම හේතුවෙන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත නිදහස් කර ගැනීමේ අපහසුතාවයන් පවතින අතර නීතිපතිවරයාගේද උපදෙස් ලැබී ඇත්තේ අදාල ආචාර්යවරයාගේ කැමැත්ත නොමැතිව එකී අරමුදල් විශ්වවිද්‍යාලය වෙත ලබාගත නොහැකි බවයි.

- මේ සම්බන්ධයෙන් පසුගිය COPE සභාවකදී ගත් තීරණයක් ප්‍රකාරව මෙලෙස මෙම බැඳුම්කර හිමියන්ට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිබෙන අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මැදිහත්වීම මත මෙම ශේෂයන් විශ්වවිද්‍යාලය වෙත ලබා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

- එකී විගණන වාර්තාවේ සඳහන් පහත නම් සඳහන් ආචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදල ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට ප්‍රමාණවත් වේ. අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

| නම | විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුදල |
|---|---|
| 1. ඊ එම් ඒකනායක | 315,000.00 |
| 2. ජේ කේ ඩී ජේ ඒ යූ ජයවර්ධන | 324,903.00 |
| 3. ඩී එම් ඒ පියතිලක | 74,054.60 |
| 4. කේ කිරිදරන් මයා | 102,204.74 |
| 5. එස් සිවනාදන් | 789,847.54 |
| 6. ආචාර්ය සී ජේ පියතිලක | 186,255.38 |
| 7. සී ඒ එස් සෙනෙවිරත්න | 610,990.00 |
| 8. ජී එන් සෙල්වරාජ් | 202,718.74 |

- පහත නම් සඳහන් ආචාර්යවරුන්ගේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත.

| නම | විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුදල |
|---|---|
| 1. ඒ ටී එල් තාලිබ් | 203,916.70 |
| 2. එම් වෙත්තසිංහ | 712,447.00 |
| 3. පී බාස්කරන් | 56,878.10 |
| 4. එස් සිවතලායන් මයා | 495,623.46 |
| 5. ආචාර්ය ඩබ් කේ සී වීබැද්ද | 1,868,641.00 |

පහත නම සඳහන් අයගේ බැඳුම්කර ගිවිසුම සම්බන්ධයෙන් තීරණය කිරීමට බැඳුම්කර කමිටුව වෙත යොමු කොට ඇති අතර මේ සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා පත්කරන ලද උපකමිටුවේ තීරණය ප්‍රකාරව කටයුතු කරමි.

| නම | විශ්වවිද්‍යාලයට අයවීමට ඇති මුදල |
|---|---|
| ඊ ජේ එච් කොරයා | 5,410,710.00 |

| | |
|---|---|
| **(කි)** | මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු දේපල සඳහා 1997 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ගෙවිය යුතු වරිපනම් බදු මුදල රු. 1,034,839 ක්ව සඳහන් කර ඇත. එම ගෙවිය යුතු වරිපනම් බදු මුදල 1997 සිට 2008 වසර දක්වා ගිණුම් වල උපචිත වියදම් ලෙස වෙන් කොට නොමැත.<br><br>1994 වසරේ සිට 2007 වසර දක්වා පැවති හිඟ මුදල දේපල විස්තරය ලබා ගැනීමෙන් පසු එම දේපල පරීක්ෂා කොට නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු 2015.03.12 වන දින පැවති මුදල් කමිටුවේ අනුමැතිය පරිදි 2015.04.22 වන දින පේරාදෙණිය මහජන බැංකුවේ අංක “032690” දරණ රු. 976,635.03 වටිනා චෙක්පතක් මඟින් පියවා ඇති අතර සියළුම හිඟ වරිපනම් මේ වන විට ගෙවා නිමකර ඇත. |
| **(කී)** | මේ වන විට ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| **(කු)** | පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු ඉඩම් අක්කර 1390 රූඩ් 02 පර්චස් 21.6 ක් සහ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් සහ සී වර්ගයේ නිවාස 03 ක අගය තක්සේරු කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා පියවර ගෙන ඇත. තක්සේරු වාර්තා මේ දක්වා ලැබී නොමැති අතර වාර්තාව ලද විගස මූල්‍ය වාර්තාවල ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. |
| **(කූ)** | 2013 වර්ෂයේ උපචිත වියදම් ලෙස රු. 37,733,400.00 ක වටිනාකමක් අධි වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත වී නොමැති අතර ඉන් රු. 11,299,508.33 ක වටිනාකමක් අධි වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත වී ඇත. එම දෝෂය මේ වන විට පෙර වර්ෂ ගැලපීමක් ලෙස නිවැරදි කර ඇත. කෙසේ වෙතත් 2014 වර්ෂයේ සිට නිවැරදි පරිදි උපචිත වියදම් වෙන්කිරීමට අදාළ නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| **(කෙ)** | විශ්වවිද්‍යාලය විසින් විමසුමේ සඳහන් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එක් එක් දෙපාර්තමේන්තු සතු වත්කම් පිළිබඳ විස්තර මුදල් අංශ වෙත ලබාගනිමින් පවතින අතර බොහෝමයක් අංශ විසින් ඒ සඳහා විස්තර මුදල් අංශය වෙත ලබාදී ඇත.විශ්වවිද්‍යාලයේ අනෙකුත් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වන සියළුම විස්තර ලැබුණු පසු එම වත්කම් පිළිබඳ විස්තර විශ්වවිද්‍යාලයේ පීඨ, දෙපාර්තමේන්තු, අංශ, මධ්‍යස්ථාන සැලකිල්ලට ගනිමින් සවිස්තරාත්මක උපලේඛන පිළියල කොට 2015 වර්ෂය අවසන් වීමට පෙර රජයේ තකසේරුකරු ලවා නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන අතර ඒ අනුව 2015 වර්ෂයේ ගිණුම් සමඟ මෙම ප්‍රත්‍යාගණන ශේෂයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(කේ)** | **13-01-07-00-02 - රු. 49,174.00**<br><br>දීර්ඝ කාලයක් පුරා අක්‍රියව පැවති මෙම ගිණුම් ශේෂය පීඨ සංවර්ධන අරමුදලට JV/2015/10 මඟින් මාරු කරන ලදි.<br><br>**13-02-07-00-02 - රු. 200.00**<br><br>ඉංජිනේරු පීඨයේ විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි ගිණුමේ ඉතිරිව තිබු මෙම මුදල 2014 ඔක්තෝබර් මසදී මුල්‍යාධිකාරී පේරාදෙණිය විශ්වවිද්‍යාලය නමට ලියන ලද චෙක්පත් අංක 373771 මඟින් පර්යේෂණ සැසි අරමුදලට බැර කිරීම පිණිස පියවා හරින ලදි.<br><br>**13-11-17-00-01 - රු. 80,562.00**<br><br>1999 වර්ෂයේදී ජාතික විද්‍යා පදනම මගින් ප්‍රදානය කරන ලද මෙම ප්‍රදානය පීඨ ලෙජරයෙන් ඉවත් කර පීඨ සංවර්ධන අරමුදලට මාරු කර ඇත.<br><br>**13-11-07-00-02 - රු. 250,000.00**<br>**13-11-07-00-04 - රු. 5,000.00**<br>**13-11-07-00-05 - රු. 25,000.00**<br>**13-11-07-00-06 - රු. 26,056.00**<br><br>2015 ජනවාරි මස 07 වැනි දින පැවති 339 වැනි මුල්‍ය කමිටු අනුමැතිය යටත්ව ලෙජරයේ ගලපා ඇත.<br><br>**13-11-07-00-07 - රු. 9,112.75** |

දීර්ඝ කාලයක් පුරා නිෂ්ක්‍රියව පැවති මෙම ගිණුම් ශේෂය JV/2015/10 ජ'නලය මගින් පීඨ සංවර්ධන අරමුදලට මාරු කරන ලදි .

**13-34-07-00-01 - රු. 174,377 .85**

SIDA SAREC ප්‍රදානයේ විගණන කටයුතු බාහිර විගණන ආයතනයක් වන Ford Rhodes විගණන අයතනය මගින් සිදුකර විගණන වාර්තා සැපයීම 2013 වර්ෂයේදී අවසන් කරන ලදි . මෙම ඉතිරි මුදල ප්‍රේෂණය කිරීම සඳහා සම්බන්ධීකාරක වෙත දන්වා ඇති අතර ඔහුගේ උපදෙස් මත අරමුදල් මාරු කිරීමට කටයුතු කරමි.

**13-42-07-00-03 - රු. 42,457.00**

දීර්ඝ කාලයක් පුරා නිෂ්ක්‍රියව පැවති මෙම ගිණුම් ශේෂය පීඨ සංවර්ධන අරමුදලට JV/2015/10 මගින් මාරු කරන ලදි .

**1301021202 - රු. 37,250.00**

මෙම ගිණුමෙහි ඉතිරිව ඇති ශේෂ මුදල මේ වන විට විශ්වවිද්‍යාලය වෙත යැවීමට කටයුතු කර ඇත. පර්යේෂණ නිලධාරිනි අසනීප තත්ත්වයේ සිටින බැවින් පරීක්ෂණ කටයුතු එම කාලසීමාව තුල කරගැනීමට නොහැකි විය. දැනට මෙම ගිණුමේ ශේෂයක් නොමැත.

**1301021205 - රු. 28,900.00**

මෙම ගිණුමෙහි ඉතිරිව ඇති ශේෂ මුදල මේ වන විට විශ්වවිද්‍යාලය වෙත යැවීමට කටයුතු කර ඇත. පර්යේෂණ නිලධාරිනි අසනීප තත්ත්වයේ සිටින බැවින් පරීක්ෂණ කටයුතු එම කාලසීමාව තුල කරගැනීමට නොහැකි විය. දැනට මෙම ගිණුමේ ශේෂයක් නොමැත.

**1301021206 - රු. 45,000.00**

මෙම ගිණුමෙහි රු. 45,000.00 මුදලක් ඉතිරිව තිබුණි. නමුත් පර්යේෂණ නිලධාරී විසින් රු. 53,818.00 ක බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා එවා තිබුණි. එම මුදල් මූල්‍යාධිකාරිගේ අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාලය මඟින් නිදහස්කර තිබූ බැවින් එම මුදල ඔහුට ගෙවන ලදී. එම නිසා ගිණුමෙහි ඉතිරි වී තිබුණු මුදල වන රු. 45,000 ක මුදල මේ වන විට විශ්වවිද්‍යාලය වෙත යවා ඇත. දැනට මෙම ගිණුමෙහි ශේෂයක් නොමැත.

**1322000002 - රු. 243,070.00**

මේ වන විට 12/02/2014 දින ජ'නල් අංක K0061 යටතේ මෙය පියවා ඇත. දැනට මෙම ගිණුමෙහි ශේෂයක් නොමැත.

**13.01.14.12.06 - ආචාර්ය M මීගස්කුඹුර RG/2012/45/S**

මෙය විශ්වවිද්‍යාල අරමුදලින් ප්‍රදානය කර ඇති ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා රු. 380,000.00 වෙන් කර තිබුණු අතර ලබා දී තිබුණේ රු. 190,000.00 ක මුදලක් පමණි. මෙම ව්‍යාපෘතියේ වියදම් වලට අදාළව ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති බැවින් ව්‍යාපෘතියට ලබා දී තිබූ මුදල නොවෙනස්ව පවත්වා ගෙන ආ නිසා 2014.12.23 දින එම මුදල් නැවත ප්‍රධාන මුදල් අංශය වෙත මාරු කර යවා ඇත. ඒ අනුව 2014.12.23 න් පසුව මෙම ව්‍යාපෘතියට අදාළ ගිණුමේ මුදල් ශේෂයක් නොමැත.

**13.01.14.12.05 - ආචාර්ය V N සෙනවිරත්න RG/2012/44/S**

මෙයද විශ්වවිද්‍යාල අරමුදල් යටතේ ප්‍රදානය කර ඇති පර්යේෂණ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා රු. 250,000.00 ක මුදලක් වෙන් කර තිබුණද ගිණුමට මාරු කර තිබුණේ රු. 125,000.00 ක් පමණි. මෙම ව්‍යාපෘතියට අදාළ වියදම් සඳහාද ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා ලැබුණු මුදල දිගටම ශේෂයක් වශයෙන් පැවතීම නිසා 2014.12.23 වන දින එම ශේෂය නැවත ප්‍රධාන ගිණුම් අංශයට මාරුකර යවා ඇත. ඒ අනුව 2014.12.23 දිනයෙන් පසුව මෙම ව්‍යාපෘතියේ මුදල් ශේෂයක් ඉහත ගිණුමේ නොපවතියි. මෙම ව්‍යාපෘතියට මුදල් වෙන් කර තිබූ නමුත් එම මුදල් භාවිතා නොකර ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇති බව පර්යේෂණ කමිටුව විසින්ද පිළිගෙන ඇත.

**13-11-07-07-14 - රු. 108,864.00**

දීර්ඝ කාලයක් පුරා නිෂ්ක්‍රීයව පැවති, මෙම ගිණුම් ශේෂය ජනල් සටහන් අංක JV/2015/10 මඟින් පීඨ සංවර්ධන අරමුදලට මාරු කරන ලදි .

**1332440004 - රු. 75,250.00**

මෙම ශේෂය මේ වන විට නිරවුල් කර ඇත.

**13-42-07-00-05 රු. 93,907.00**

Flood Inundation Modeling Research grant ව්‍යාපෘතිය මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු වු තොරතුරු ලැබීමේ ප්‍රමාදය මත නතර වී ඇත. ගිණුම් ශේෂය පියවිය යුතු ආකාරය පිළිබඳව දැනුම්දීමක් කිරීමට ප්‍රදාන ලාභියා එකඟවිය.

**1312160701- රු. 54,440.00**

මෙම ශේෂයෙන් රු.20,000 ක අත්තිකාරමක් 2015 වසරේ දී ලබා ගෙන ඇති අතර ඉතිරි ශේෂය අදාල පර්යේෂකයාගේ වැටුපෙන් අයකර ගෙන ඇත.

**1342160001- රු.137,752.00**

2015.05.08 දින වන විට මෙහි ශේෂය රු.6,440.58 දක්වා අඩු වී ඇති අතර එම ශේෂය අදාල පර්යේෂකයාගේ වැටුපෙන් අයකර ගෙන ඇත.

**1342160004 - රු.164,916.00**

**1342160005 - රු. 11,071.00**

මෙම ගිණුම් වල ශේෂයන් දිර්ඝ කාලයක් තිස්සේ නිශ්ක්‍රියව පැවති බැවින් විශ්වවිද්‍යාලයේ අරමුදලට මාරු කර ඇත.

**1342161001 - රු.10,619.00**

මෙහි ශේෂය මේ වන විටත් ශුන්‍යව ඇත.

**1301161102 - රු.33,756.00**

2014.12.16 වන විට මෙහි ශේෂය ශුන්‍යව ඇත.

**1301110801 - රු.17,540.00**
**1301110901 - රු.16,353.00**
**1301110902 - රු.1,502.00**
**1301110903 – රු.1,665.00**

පර්යේෂකයන් විසින් අදාල පර්යේෂණ කටයුත්ත නිමකල බවට මෙතෙක් දැනුම්දීමක් කර නොතිබූ බැවින් ශේෂයන් වාර්ෂිකව ඉදිරියට ගෙන එනු ලැබීය. නමුත් මේ වන විට එම පර්යේෂණ අවසන් කර ඇති බව දන්වා ඇත. ඒ අනුව ශේෂයන් ආදායමට ගැනීමට කටයුතු කර ඇත. වර්තමානයේ ගිණුම් වල ශේෂයන් නොමැත.

**1311110001 – රු.69,267.00**
**1311110703 – රු.81,259.00**

මෙම අරමුදල් 02 ජාතික විද්‍යා පදනමටත් ලබාදෙන පර්යේෂණ අරමුදලක ඉතිරි ශේෂයක් වන අතර මෙම ඉතිරි අරමුදල් නැවත ජාතික විද්‍යා පදනම වෙත යැවීම සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනම වෙත දැනුවත් කර ඇති මුත් මේ දක්වා ජාතික විද්‍යා පදනමෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. ඒ අනුව නැවත සිහිකැඳවීමෙන් පසුව ප්‍රතිචාර නොමැත්තේ නම් විශ්වවිද්‍යාල අරමුදලට බැරකිරීමට කටයුතු කරමි.

**1301041105 - රු. 150,000.00 (ආචාර්ය ඩබ්.ඇම්.ඩබ්.පී.සී.එස්.එම් වික්‍රමසිංහ මිය)**

මෙම පර්යේෂණයේ කටයුතු අවසන් කර ඇත. නමුත් ඉදිරිපත් කර ඇති බිල්පත් හි පවත්නා යම් යම් ගැටළු සහගත තත්වයන් මත මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇත.

**1301041106 - රු. 178,665.00 (ආචාර්ය ජීවක සමන් කුමාර මයා)**

මෙම පර්යේෂණයේ කටයුතු අවසන් කර නොමැති අතර 07.03.2013 දිනැති ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / පාලක සභා හා අධ්‍යක්ෂකගේ ලිපියට අනුව 30.03.2013 දින දක්වා පර්යේෂණයේ අවසන් වාර්තාව ලබා දීම සඳහා කල් ලබා දී ඇත. මෙම පර්යේෂණ අරමුදල් සඳහා රු. 190,000/- ලබා දී ඇති අතර රු. 11,335/- පමණක් වියදම් දරා ඇත.

**1301041107 - රු. 75,000.00 (ආචාර්ය ඩබ්.එම්.එස්. කේ විජේසුන්දර මයා)**

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කාර්යය අවසන් කර ඇති නමුත් ලබාදුන් අරමුදල භාවිතා කර නොමැත. එබැවින් මෙම මුදල් වෙනත් පර්යේෂණ අරමුදලක් සඳහා යොදා ගැනිමට කටයුතු කර ඇත.

**1301040901 - රු. 30,000.00 - (ඒ.එස්.ටී රාජපක්ෂ මයා)**

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘතිය සඳහා ලබා දුන් රු. 110,000/- මුදලින් ඉතිරි රු. 30,000/- පමණක් ගිණුමේ ඇත. එම මුදල ඉවත් කර ගිණුම අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

**1301040902 - රු. 36,000.00 (ඒ.එස්.එම්. නවුෆාල් මයා)**

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් නොමැති අතර ව්‍යාපෘතිය සඳහා ලබා දුන් රු. 60,000/- ක මුදලින් රු. 24,000/- වියදම් කර ඇති අතර රු. 36,000/- ඉතිරියක් පවතී. මෙම මුදල නැවත මාරු කිරීමට කටයුතු කර ඇත.

**1301041104 - රු. 80,475.00 (ආචාර්ය ටී. ඩබ්. ඇම්. ටී. ඩබ් බණ්ඩාර මයා)**

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘතියට ලබා දුන් මුදලින් ඉතිරිය ගිණුමේ පෙන්නුම් කරයි. මෙම මුදල නැවත පීඨ අරමුදල් ගිණුමෙන් ප්‍රධාන පර්යේෂණ අරමුදල් ගිණුමට මාරු කර ඇත.

**1301041105 - රු. 150,000.00 (ආචාර්ය ඩබ්.ඇම්.ඩබ්.පී.සී.එස්.එම් වික්‍රමසිංහ මිය)**

මෙම පර්යේෂණයේ කටයුතු අවසන් කර ඇත. නමුත් ඉදිරිපත් කර ඇති බිල්පත් හි පවත්නා යම් යම් ගැටළු සහගත තත්වයන් මත මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇත.

**130104122 - රු. 86,500.00 (මහාචාර්ය ඇම් සෝමතිලක මයා)**

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘතියට ලබා දුන් මුදලින් ඉතිරිය ගිණුමේ පෙන්නුම් කරයි. මෙම මුදල නැවත පීඨ අරමුදල් ගිණුමෙන් ප්‍රධාන පර්යේෂණ අරමුදල් ගිණුමට මාරු කර ඇත.

**1301041209- රු. 216,500.00 (මහාචාර්ය අමරසිංහ ද සිල්වා මයා)**

මෙය අවසන් නොකල පර්යේෂණ ව්‍යාපෘතියක් වන අතර පර්යේෂකවරයා සේවයෙන් විශ්‍රාම ගෙන ඇත. පර්යේෂණ අරමුදල දැනටමත් හරවා යවා ඇත. ගිණුමේ මුදල් ශේෂයක් නොපවතී.

**134221002- රු. 107,512.00**

මෙම ගිණුම 2013.12.31 දින වන විට නිරවුල් වී තිබූ අතර එහි ශේෂයක් නොමැත.

**1342210903- රු. 374,782.00**

මෙම ගිණුම ට අදාලව සිදුකරනු ලැබූ පර්යේෂණ කටයුත්ත නිමාවී ඇති අතර එහි අතිරික්තය වූ රු. 374,782.00 ක මුදල වෙනත් පර්යේෂණ කටයුත්තකට යෙදවීමට කටයුතු යොදා ඇත.

| | |
|---|---|
| **2.2.2** | **නොසැසඳූ පාලන ගිණුම්** |
| | මෙහි ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු ශේෂය ගිණුමට අනුවත් උප වාර්තාවට අනුවත් අගයන් පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කොට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2014 වර්ෂයේ සිට මෙම අගයන් නිවැරදිව දැක්වේ. ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් වැඩිපුර අයකර ගත් ශේෂය ගිණුමට අනුව ශේෂය සහ නීති අංශයේ උපලේඛනයේ ශේෂය අදාල පෞද්ගලික ලිපිගොනු සමග සසඳා බලා වැඩිපුර ගෙවා ඇති මුදල් එකී පුද්ගලයන්ට ගෙවීමට කටයුතු කර ඇත. |
| **2.2.3** | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්** |
| **(අ)** | **හිඟ විදුලි ගාස්තු** |

විශ්වවිද්‍යාලය තුළ ඇති බාහිර ආයතනවලින් 2013.12.31 වන විට හිඟ විදුලි ගාස්තු වශයෙන් අයකර ගැනීමට තිබූ රු. 1,257,748.00 ක මුදලින් 2014 වර්ෂයේ දී රු. 960,796.00 ක් අයකර ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| සේවා ආයතනය | වගකිව යුතු නිලධාරියා | හිඟ විදුලි ගාස්තු රු. 2013.12.31 දිනට | 2014 වර්ෂයේ අය කරගෙන ඇති මුදල | හිඟ මුදල රු. | විස්තරය |
|---|---|---|---|---|---|
| වෛද්‍ය පීඨ සුහසාධක සංගම් ඡායා පිටපත් මධ්‍යස්ථානය | භාණ්ඩාගාරික | 24,739.00 | 23,500.00 | 1,239.00 | අදාළ හිඟ ගාස්තු පියවීම සඳහා විශ්වවිද්‍යාල 342 වන මුදල් කමිටුව විසින් මාස 05 ක සහන කාලයක් ලබා දී ඇත. එම කාලය තුළ අදාළ හිඟ ගාස්තු පියවීමට කටයුතු කරන ලෙස සංගමය දැනුවත් කර ඇත. |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් ඡායා පිටපත් මධ්‍යස්ථානය | භාණ්ඩාගාරික | 16,648.00 | 14,500.00 | 2,148.00 | විශ්වවිද්‍යාල 342 වන මුදල් කමිටු අනුමැතිය පරිදි ශිෂ්‍ය සංගම් නියෝජිතයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| තැපැල් කාර්‍යාලය | තැපැල් ස්ථානාධිපති | 25,408.91 | | 25,408.91 | මෙම මුදල පියවීම සඳහා ප්‍රාදේශීය තැපැල් අධිකාරි/ මහනුවර දකුණ දැනුවත් කරමින් ලිපි යොමුකර ඇත. |

| සේවා ආයතනය | වගකිව යුතු නිලධාරියා | හිඟ විදුලි ගාස්තු රු. 2013.12.31 දිනට | 2014 වර්ෂයේ අය කරගෙන ඇති මුදල | හිඟ මුදල රු. | විස්තරය |
|---|---|---|---|---|---|
| සනාතන මන්දිර ආපන ශාලාව | අනධ්‍යයන ආයතන අංශ සුභසාධක සංගමය | 59,477.00 | 15,000.00 | 44,477.00 | මේ වන විට සියලු හිඟ මුදල් අයකර ගෙන ඇත. |
| ශිෂ්‍ය මධ්‍යස්ථාන සමුපකාරය (WUS) | විශ්වවිද්‍යාල මිනි සුපර් මාර්කට් | 37,037.00 | - | 37,037.00 | අදාළ රු. 37,037.00 හිඟ ගාස්තු 2014 නොවැම්බර් මස දී පියවා ඇත.<br><br>ඉදිරි වර්ෂය සඳහා වන හිඟ මුදල් පියවීමට කටයුතු කරන ලෙස සංගමය දැනුවත් කර ඇත. |
| වෛද්‍ය පීඨ සුභසාධක සංගමය | භාණ්ඩාගාරික | 78,889.00 | 15,000.00 | 63,889.00 | අදාළ හිඟ ගාස්තු පියවීම සඳහා විශ්වවිද්‍යාල 342 වන මුදල් කමිටුව විසින් මාස 05 ක සහන කාලයක් ලබා දුන් අතර එම කාලය තුල අදාළ හිඟ ගාස්තු පියවීමට කටයුතු කරන ලෙස සංගමය දැනුවත් කල අතර 344 වන මුදල් කමිටුව විසින් අදාල නිලධාරීන්ගෙන් හිඟ ගාස්තු අයකර ගැනීමට තීරණය විය. |
| WUS සමුපකාර සංගමය | කළමණාකරු | 13,500.00 | - | 13,500.00 | අදාළ හිඟ ගාස්තු පියවීම සඳහා විශ්වවිද්‍යාල 342 වන මුදල් කමිටුව විසින් මාස 05 ක සහන කාලයක් ලබා දුන් අතර එම කාලය තුළ අදාළ හිඟ ගාස්තු පියවීමට කටයුතු කරන ලෙස සංගමය දැනුවත් කල අතර 344 වන මුදල් කමිටුව විසින් අදාල නිලධාරීන්ගෙන් හිඟ ගාස්තු අයකර ගැනීමට තීරණය විය. |
| විශ්වවිද්‍යාල සමුපකාර සමිතිය (USO) | කළමණාකරු | 23,820.00 | 2000.00 | 21,820.00 | මෙම මුදල පියවීම සඳහා සමිතිය දැනුවත් කරමින් ලිපි යොමුකර ඇත. |
| WUS තැපැල් කාර්යාලය | තැපැල් ස්ථානාධිපති | 13,212.00 | 8¸000.00 | 5,212.00 | අදාළ හිඟ මුදල පියවීම සඳහා තැපැල් ස්ථානාධිපති දැනුවත් කරමින් ලිපි යොමුකර ඇත. |

**<u>හිඟ ජල ගාස්තු - 12-01-56-00</u>**

විශ්වවිද්‍යාලය තුළ ඇති බාහිර ආයතනවලින් 2013.12.31 වන විට හිඟ ජල ගාස්තු වශයෙන් අයකර ගැනීමට තිබූ රු. 512,783.00 ක මුදල අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| සේවා ආයතනය | වගකිව යුතු නිලධාරියා | හිඟ ජල ගාස්තු රු. 2013.12.31 දිනට | 2014 වර්ෂයේ අය කරගෙන ඇති මුදල | හිඟ මුදල රු. | විස්තරය |
|---|---|---|---|---|---|
| මුස්ලිම් පල්ලිය | ප්‍රධාන පූජකතුමා | 29,464.00 | 30,000.00 | - | අදාළ රු. 29,464.00 හිඟ ගාස්තු 2014 අප්‍රේල් මස දී පියවා ඇත. ඉදිරි වර්ෂය සඳහා වන හිඟ මුදල් පියවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන පූජකතුමා දැනුවත් කර ඇත. |
| පීඨ සමාජ ශාලාව | සභාපති | 21,330.00 | 317 වන මුදල් කමිටුව මගින් 2013 ජනවාරි සිට විදුලි ගාස්තු අය නොකිරීමට තීරණය කර ඇත. | 9,406.00 | ඉතිරි හිඟ මුදල පියවීම සඳහා පීඨ සමාජ ශාලාව දැනුවත් කර ලිපි යොමු කොට ඇත. |
| මාලනී අධිකාරම් | - | 16,785.00 | 10,000.00 | 6,785.00 | ඉතිරි හිඟ මුදල පියවීම සඳහා මාලනී අධිකාරම් මිය දැනුවත් කර ලිපි යොමු කොට ඇත. |
| සරසවි උයන විදුහල | විදුහල්පති | 22,969.50 | - | 22,969.50 | හිඟ මුදල පියවීම සඳහා විදුහල්පති දැනුවත් කර ලිපි යොමු කොට ඇත. |
| නව ශාස්ත්‍ර පීඨ ගොඩනැගිල්ල පුළුල් කිරීම | - | 83,218.00 | මෙම ව්‍යාපෘති අවසානයේ දී මූලධන අංශය මඟින් ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී අදාළ මුදල අයකර ගෙන ඇත. | | |
| රසායන විද්‍යාගාරය අළුත්වැඩියා කිරීම | - | 17,650.00 | | | |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ගොඩනැගිල්ල | - | 68,200.00 | මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් ටෙන්ඩර්පත් කැඳවීමෙන් සිදුකරන අතර අදාළ ගෙවීම් සියල්ල එම ආයතනය මඟින් සිදු කරයි. මේ සම්බන්ධයෙන් පශ්චාත් උපාධි ආයතනය දැනුවත් කර ඇත. | | |

**හිඟ කුලී ආදායම් - 12-01-51-00**

විශ්වවිද්‍යාලය තුළ ඇති බාහිර ආයතනවලින් 2013.12.31 වනවිට හිඟ බිම් කුලී වශයෙන් අයකර ගැනීමට තිබූ රු. 212,187.00 ක මුදලින් 2014 වර්ෂයේ දී රු. 202,237.00 ක් අයකර ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| සේවා ආයතනය | වගකිව යුතු නිලධාරියා | හිඟ විදුලි ගාස්තු රු. 2013.12.31 දිනට | 2014 වර්ෂයේ අය කරගෙන ඇති මුදල | හිඟ මුදල රු. | විස්තරය |
|---|---|---|---|---|---|
| ශිෂ්‍ය සේවා සමුපකාරය | විශ්වවිද්‍යාල සමුපකාර සමිතිය | 9,000.00 | - | 9,000.00 | අදාළ හිඟ ගාස්තු පියවීම සඳහා විශ්වවිද්‍යාල 342 වන මුදල් කමිටුව විසින් මාස 05 ක සහන කාලයක් ලබා දී ඇත.<br><br>එම කාලය තුළ අදාළ හිඟ ගාස්තු පියවීමට කටයුතු කරන ලෙස සංගමය දැනුවත් කර ඇත. |
| සම සෞඛ්‍ය සේවා ඡායා පිටපත් මධ්‍යස්ථානය | කේ.ජී.සී. කුලතුංග මයා | 10,950.00 | - | - | මෙම ඡායා පිටපත් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම වෙනුවෙන් කුලතුංග මයා විසින් විශ්වවිද්‍යාලයේ තැන්පත් කර ඇති තවමත් නිදහස් කර නොගත් රු. 10,000.00 ක ඇප තැන්පත් මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| ලංකා බැංකුව | කළමණාකරු | 69,117.00 | 69,117.00 | - | අදාළ හිඟ ගාස්තු 2014 මාර්තු මස පියවා ඇත. |
| ලොන්ඩ්‍රි සේවාව | එම්. රාජ් ගෝපාල් මයා | 62,200.00 | 62,200.00 | - | අදාළ හිඟ මුදලින් රු.55,800.00 ක් පියවා ඇති අතර, ඉතිරි රු. 6,200.00 අය කර ගැනීම සඳහා ඔහු විසින් මීට පෙර විශ්වවිද්‍යාලයේ තැන්පත් කර ඇති රු.10,000.00 ක ඇප තැන්පත් මුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| විද්‍යාපීඨ පුස්තකාල ඡායා පිටපත් මධ්‍යස්ථානය | ඩී.ඩී.ඩී.බී, පතිරණ මයා | 10,920.00 | | - | මෙම ඡායා පිටපත් මධ්‍යස්ථානය වෙනුවෙන් පතිරණ මයා තැන්පත් කර ඇති රු. 15,000.00 ක මුදල අයකරගෙන ඇත. |
| WUS සැලොන් | ඒ.ජී.ජී.කේ. ලසන්ත මයා | 50,000.00 | 50,000.00 | - | අදාළ හිඟ මුදලින් රු.45,000.00 ක් පියවා ඇත. ඉතිරි රු.5,000.00 ක මුදල අයකර ගැනීම සඳහා ඔහු විසින් මීට පෙර විශ්වවිද්‍යාලයේ තැන්පත් කර ඇති රු.10,000.00 ක ඇප තැන්පත් මුදලින් අයකරගෙන ඇත. |

**(ආ)** මේ වන විට මෙම හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර ඇත.

| | |
|---|---|
| (ඇ) | **<u>දුරකථන ගාස්තු අයකිරීම</u>**<br><br>විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති ආයතන 03 කින් අවුරුදු 02 කට වැඩිකාලයක සිට අයවියයුතු රු. 19,145.00 ක හිඟ දුරකථන ගාස්තු පහත සඳහන් පරිදි අයකරගෙන ඇත.<br><br>1. **<u>IRQUE ව්‍යාපෘතිය - ශාස්ත්‍ර පීඨය</u>**<br><br>IRQUE ව්‍යාපෘතියේ ශාස්ත්‍ර පීඨ ශාඛාවෙන් දුරකථන ගාස්තු වශයෙන් අය විය යුතු රු. 24,788.00 ක මුදල ලදුපත් අංක 10026223 මගින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත.<br><br>**<u>IRQUE ව්‍යාපෘතිය, කෘෂිකර්ම පීඨය</u>**<br><br>IRQUE ව්‍යාපෘතියේ කෘෂිකර්ම පීඨ ශාඛාවෙන් අයකර ගත යුතු වූ රු. 36,540.00 ක හිඟ දුරකථන ගාස්තුව විශ්වවිද්‍යාලීය 328 වන මුදල් කමිටු තීරණය පරිදි කපා හැරීමට කටයුතු කර ඇත.<br><br>2. **<u>මහජන බැංකු ශාඛාව</u>**<br>මහජන බැංකු ශාඛාවෙන් හිඟ දුරකථන ගාස්තු වශයෙන් දක්වා ඇති රු. 19,401.00 ක මුදල මේ වන විට අයකරගෙන ඇත.<br><br>3. **<u>ලංකා බැංකු ශාඛාව</u>**<br>ලංකා බැංකු ශාඛාවෙන් හිඟ දුරකථන ගාස්තු වශයෙන් අයවීමට ඇති රු. 38,416.00 ක මුදලින් මේ වන විට රු. 22,686.64 ක මුදලක් අයකරගෙන ඇති අතර, ඉතිරි රු. 15,729.36 ක මුදල අයකර ගැනීමට බැංකුව දැනුවත් කරමින් ලිපි යොමුකොට ඇත. |
| (ඈ) | 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන්ගෙන් අයවිය යුතු දඩ හා ශාලා ගාස්තු නැවත අයකර ගැනීමේ දී මෙතෙක් අනුගමනය කළ ක්‍රමවේදයට අමතරව සිසුන්ගේ අධ්‍යයන කටයුතු අවසන් වූ විගස දඩ මුදල් පරීක්ෂා කර ගෙවීම් කටයුතු අවසන් කළ යුතු බවට දන්වා ඇති බැවින් දැනට අයවිය යුතු ශාලා දඩ මුදල් අයකර ගැනීමේ ප්‍රවණතාවයක් ඇත.<br><br>ඒ අනුව පහත සඳහන් ආකාරයට අයවිය යුතු ශාලා හා දඩ මුදල් පෙන්වා දිය හැකිය.<br><br>දඩ සහිත සහතික පත්‍ර 246,822.50<br>පාඨමාලා සම්පූර්ණ කර නොමැති 641,596.00<br>දඩ මුදල් සහතික පත්‍ර නොමැති <u>3,069,409.50</u><br>එකතුව <u>3,957,828.00</u><br><br>ඉන් අය කළ නොහැකි ශේෂය වන 3,069,409.50 මුදල පොත් වලින් කපාහැරීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඉ) | මෙම අත්තිකාරම් මුදල් වලින් රු. 206,486.00 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ලබා ඇති ආචාර්යවරුන් මේ වන විට විශ්වවිද්‍යාලයේ නොමැති අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් එකී ලැබිය යුතු අත්තිකාරම් මුදල් අයකර ගෙන විශ්වවිද්‍යාලට එවන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති අතර එකී මුදල් ලැබීමෙන් පසු මෙම අත්තිකාරම් මුදල පියවනු ලැබේ.<br><br>ඉතිරි අත්තිකාරම් මුදල් වලින් රු. 98,290.00 ක මුදලක් මේ වන පියවා ඇත.<br><br>Dr. D. K. ගුණසේකර - PF 01876 - රු. 9,000.00<br>Dr. B. R. K. ඔබේසේකර - PF 06827 - <u>රු. 197,486.95</u><br><u>රු. 206,487.95</u><br>ආචාර්ය වික්‍රමගේ විසින් ලබාගත් රු. 4,977.00 ක අත්තිකාරම් මුදල හා ආචාර්ය I. M. S. සත්‍යප්‍රකාශ ලබාගත් රු. 20,000.00 ක අත්තිකාරම් මුදල් 2015.08.06 දින පැවති 345 වන මුදල් කමිටු අනුමැතිය මත වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br><br>රු. 22,000.00 ක් වූ අත්තිකාරම් මුදල අදාල පර්යේෂකයා ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

| (ඊ) | **උත්සව අත්තිකාරම් - රු. 223,827.00** |
|---|---|

| ගිණුම් සංකේත අංකය | වටිනාකම | අයකරගත් මුදල | අයකරගත හැකි මුදල | හඳුනාගත නොහැකි සහ අයකර ගත නොහැකි මුදල |
|---|---|---|---|---|
| 12-02-03-01 | 65,210.00 | 62,960.00 | 2,250.00 | - |
| 12-02-03-02 | 97,670.00 | 21,750.00 | 46,900.00 | 29,020.00 |
| 12-02-03-03 | 50,880.00 | 9,000.00 | 27,780.00 | 14,100.00 |
| 12-02-03-04 | 104,509.85 | 15,750.00 | 63,850.00 | 24,909.85 |
| 12-02-03-07 | 4.494.00 | - | - | 4.494.00 |
| 12-02-03-08 | 10,544.41 | - | 5,000.00 | 5,541.41 |
| | **333,307.50** | **109,460.00** | **145,780.00** | **78,067.85** |

ඉහත හඳුනාගත නොහැකි ණය ශේෂයන් පොත් වලින් කපාහැරීමට කටයුතු කරමි.

**අක්‍රියව තිබූ ණය ශේෂ - රු. 223,524.00**

P 08156 ඩී. එම්. ඩබ්. ජෙ. ආර්. දහනායක, P 08268 ඒ. සී. සී. හනාස්

අර්ථසාධක අරමුදලින් එම මුදල් අය කරගෙන ඇත.

P 04986 ඩී. එම්. බී. ප්‍රේමදාස, P 09120 එස්. සී. එස්. මැටිවලගෙදර

අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැති අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී එම ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

P 00990 එම්. එම්. තිලකරත්න

අර්ථසාධක අරමුදලෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.

**විදේශගත වූ නිලධාරීන්ගේ ණය ශේෂ - රු. 162,987.00**

මෙම නිලධාරීන් අතුරින් එස්. බී. ටී. විජේරත්න මහතාගේ (P 05274) අර්ථසාධක අරමුදලින් රු. 139,936.00 ක මුදල මේ වන විට අය කරගෙන ඇත.

තවද සේවයේ හැරගිය හෝ විශ්‍රාම ගිය සේවකයෙකුගේ ණය මුදල් පියවා ගත හැක්කේ ඔහුගේ හෝ ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී පමණි. ඩී. ආර්. කේ. ඔබේසේකර මහතාගේ අර්ථසාධක අරමුදල් මේ වන තෙක් නිදහස් කර නොමැති අතර ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී රු. 23,051.00 වූ එම ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

| (උ) | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව 1987.12.31 වන දින විශ්වවිද්‍යාලයත් සමඟ ඇති කරගන්නා ලද ගිවිසුම පරිදි පළමු වසර පහ වෙනුවෙන් රු. 12,000.00 බැගින් වාර්ෂිකව බදු ගෙවා ඇත. නමුත් ගිවිසුමේ 3 වන ජේදයට අනුව 1992 වසරේ සිට රජයේ තක්සේරු කිරීමක් මත බදු කුලිය සංශෝධනය කර ඇත. අදාල බදු මුදල ගෙවන ලෙස වාර ගණනාවකදි සිහි කැඳවීම් යවා ඇති නමුත් ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. මෙම ගැටලු මෙතෙක් නිරාකරණය කර ගැනීමට නොහැකි වූ බැවින් 2013.04.19 වන දින ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව දැනුවත් කරන ලදී. ඉන් පසුව මේ සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනිම ආරම්භ කරන ලදි. 2013.06.06 වන දින උසස් අධ්‍යාපන |
|---|---|

| | |
|---|---|
| | අමාත්‍යය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යයවරුන් දැනුවත් කොට මෙම දේපල නැවත විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලෙස ඉල්ලා ඇත. 2014.05.28 වන දින නිතිපති වෙත යොමු කොට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. රජයේ අධිනීතිඥ විසින් අදාල පාර්ශවය කැඳවා සමථකරණය පිලිබඳව මුලික සාකච්ඡාවක් පවත්වා ඇති අතර ඉන් පසු නැවත 2015.06.10 දින විශ්වවිද්‍යාලයේ පාර්ශවය කැඳවා කරුණු සාකච්ඡා කරන ලදී. ඒ අනුව පවතින තත්ත්වය පිළිබඳව සම්පුර්ණ වාර්තාවක් රජයේ අධිනීතිඥ වෙත යොමු කරන ලදී. ඒ අනුව නැවත අදාල පාර්ශවය දැනුවත් කොට ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව විශ්වවිද්‍යාලය දැනුවත් කරන බව රජයේ අධිනීතිඥ විසින් දන්වා සිටින ලදී.<br><br>පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ ගැටඹේ පිහිටි ඉඩම මුලික පිඹුරු අංක සහ 1972 කැබලි අංක 1,2,3,4, පිඹුරු අංක 1896 යටතේ 1987.12.31 වන දින සිට 2017.12.30 වන දින දක්වා භූමිය පමණක් බදු ලබාදී ඇත. මෙම දේපලේ බදුකරු වන්නේ උඩරට ගැමිපුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වු අතර, 2005 අංක 26 දරණ පනත අනුව උඩරට සංවර්ධන අධිකාරය පිහිටුවා ඇත. මෙම ආයතන දෙකම එකම අමාත්‍යාංශයකට අයත්වන බව අදාල ආයතනය විසින් දන්වා ඇත. |
| **(ඉ)** | එකී විමසුමෙහි සඳහන් පරිදි ඉහත ආයතනයෙන් රු. 318,892.00 ක මුදලක් අයකර ගැනීමට ඇති බව සඳහන් කර ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව අය කර ගැනීමට ඇති මුදල රු. 145,000.00 ක් බව ගණනය කර ඇත.<br><br>මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ අතර එහිදී ලබාදෙන ලද උපදෙස් පරිදි පාලක සභාවේ අනුමැතිය මත පත්කරන ලද බේරුම්කරුවෙකු විසින් බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරන ලදී. නමුත් බේරුම්කරණය සඳහා Madhu freighter පෞද්ගලික සමාගමෙන් කිසිදු ඉදිරිපත් වීමක් සිදු නොවු බැවින් බේරුම්කරණ සභාවේ තීරණය මත නඩු පැවරීමට කටයුතු කර ඇත. |
| **2.2.4** | **විගණනය සඳහා සාක්ෂි නොවීම** |
| **(අ)** | ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරකරණය කිරීමේ වැඩසටහනේ එක අදියරයක් වශයෙන් ස්ථාපනය කරන ලද්දකි. ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය අන්තර්ජාතික වශයෙන් ප්‍රසිද්ධියට පත් කිරීමටත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීමටත් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය කටයුතු කරන ලදී. අපගේ විශ්වාසය අනුව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය එහි අරමුණු වලට ඉදිරියෙන් තවත් පියවරක් තබමින් විශ්වවිද්‍යාල වෙබෝමෙට්‍රික්ස් ස්ථානගතකිරීම් අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉහළ ස්ථානයකට රැගෙන ඒමටත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා අධ්‍යන කටයුතු වලින් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගැනීමටත් සමත් විය.<br><br>2013-2014 වර්ෂය තුළ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඇතුලත් වාර්තා ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ විධිමත්ව ඇත. |
| **(ආ)** | දැනට මෙම ශේෂය සඳහා වූ උපලේඛන පිළියෙල කර ඇත. |
| **(ඇ)** | මීට අදාල පර්යේෂණ ව්‍යාපෘති වාර්තා ශාස්ත්‍ර පීඨයේ ඇත. |
| **(ඈ)** | සෑම වර්ෂයකම පර්යේෂණ දීමනා ගෙවීමට අදාලව පර්යේෂණ කමිටු මගින් අනුමත කරන ලද පර්යේෂණ වාර්තා උපකුලපති වන මාගේ අනුමැතිය යටතේ අධ්‍යයන / අනධ්‍යයන ආයතන අංශය මගින් ගිණුම් අංශය වෙත යොමු කරනු ලැබේ. මෙම අනුමත කරන ලද පර්යේෂණ වාර්තාවන් සඳහා පර්යේෂණ දීමනා හිමි කාලපරිච්ඡේදයට අදාලව මෙම දීමනා ගෙවීම් සිදු කරනු ලබයි.<br><br>මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් 11/02/2014 දින නිකුත් කල 02/2014 යන චක්‍රලේඛය තුල විගණන විමසුමේ පරිදි මාස 06 ක් තුල ප්‍රගතිය ඇතුලත් අන්තර් පර්යේෂණ වාර්තාවක් ලබා ගත යුතු බව සඳහන් වුවද පසුව 28/05/2014 දින නිකුත් කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 05/2014 (i) තුලින් පරීක්ෂණ දීමනා සඳහා අදාල වූ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2011 හා 01/2011 (i) දරණ චක්‍රලේඛ දෙක 01/01/2014 දින සිට බලාත්මක කර ඇත. එනම් වර්තමානය වන විට 02/2014 යන චක්‍රලේඛ වෙනුවට 01/2011 හා 01/2011 (i) චක්‍රලේඛ බලාත්මක වන අතර එම චක්‍රලේඛ දෙකෙහි ප්‍රතිපාදන අනුව මාස 06 තුල ප්‍රගතිය ඇතුලත් අන්තර් පර්යේෂණ වාර්තාවක් ලබා ගත යුතු බව සඳහන් නොවේ.<br><br>ඉහත පැහැදිලි කිරීමට අනුව මේ වන විට බලාත්මක සියලු චක්‍රලේඛ විධිවිධාන පර්යේෂණ දීමනා ගෙවීමේ දී උපයෝගී කරගෙන නිවැරදි ආකාරයට පර්යේෂණ දීමනා ගෙවා ඇති බවත් දැනුම් දෙනු කැමැත්තෙමි. |

| | |
|---|---|
| **(ඉ)** | ඉංජිනේරු පීඨයේ විදුලි හා විද්‍යුත් පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා කථිකාචාර්යවරුන් 05 දෙනෙකු වෙනුවෙන් සිදුකල දේශනා සඳහා ගෙවීම වෙනුවෙන් පැයක් සඳහා වූ දීමනාව මූල්‍ය කමිටුවේ අනුමැතිය ලද අයවැය පුරෝකථනයෙහි (Budget) දක්වා ඇති අතර පැවැත්වූ දින හා පැය සංඛ්‍යාව අදාල ගෙවීම් වවුචර් සමග අමුණා ඇත. |
| **(ඊ)** | වෛද්‍ය නිල්මිණි වනිගසූරිය මහත්මිය විසින් මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ඉගෙනුම් පහසුකම් (Learning Resource) ලෙස මූලිකව දායක වූයේ නව විෂයය නිර්දේශ සංවර්ධන වැඩ කටයුතුවලටයි. මේ සඳහා මූලිකවම ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ නව විෂයය මාලා සංවර්ධනය කිරීමට අදාළ මූලික වැඩමුළු කිහිපයක් සියලුම අංශ ප්‍රධානීන් හා විෂයය විශේෂඥයින් එකතුව පවත්වන ලදි. එමගින් නව විෂයය සංවර්ධනයට අදාළ වැඩමුළු හා ශාස්ත්‍රපීඨ ආචාර්යවරු සමග සම්බන්ධීකරණ කටයුතු කරන ලදී. එසේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 861 ප්‍රකාරව විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත ලබාදුන් පත්වීමක් මත ඇය වෙත ගෙවීම් කර ඇත. |
| **(උ)** | ලියාපදිංචි ගාස්තු ගෙවන ලද විදේශ සිසුන්ගේ මුදල් සෘජුව බැංකුවෙහි තැන්පත් කරන බැවින් නිවැරදිව ගිණුම් ගතවී ඇතත් එම ශේෂයන් කිනම් සිසුවා විසින් ගෙවන ලද්දක්ද යන්න සොයා ගැනීමට නොහැකි වී ඇත. මේ වන විට එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අදාලව හඳුනානොගත් ශේෂය රු. මිලියන 13ක් වන අතර, ඔවුන් සඳහා අනුග්‍රහය දක්වා ඇත්තේ භූතාන් රාජ්‍ය විසිනි. ඒ අනුව, භූතාන් රාජ්‍ය අනුග්‍රහය දක්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙසට භූතාන් රජයට මේ වන විට දන්වා යවා ඇත. |
| **(ඌ)** | විගණන විමසුමේ දක්වා ඇති රු. 1,468,164.00 වටිනාකමකින් යුක්ත වත්කම් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට ප්‍රදානයක් වශයෙන් Distance Education Modernization Project තුලින් ලබාදී ඇත. ඊට අදාල උපලේඛණ හා ලියවිලි මේ වන විට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගොනු කර ඇත. |
| **(එ)** | මුදල් රෙගුලාසි 502(2) හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 11 වන පරිෂ්ඨය පරිදි විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් සඳහා ලේඛනයක් නඩත්තු කර ඇත. තවද ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ සඳහා 502(2) මුදල් රෙගුලාසි ප්‍රකාරව සියළුම විස්තර ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛනයක් ද, ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ සම්බන්ධයෙන් ස්ථාවරවත්කම් ලේඛනයේ සඳහන් වටිනාකම සහ ගිණුම්වල සඳහන් වටිනාකම එකිනෙකට සමාන වන අතර ඒ අනුව එම ස්ථාවරවත්කම් ලේඛනය ගිණුම්කරණ දිනට යාවත්කාලීන කර ඇත. එබැවින් ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ යන වත්කම් ත්‍රිත්වයට අදාල මුළු අගය වන රු. 9,788,890,563 සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති බව සඳහන් කිරීම නිරවද්‍ය නොවේ.<br><br>භාණ්ඩාගාර ලේඛම්ගේ IAI/2002/02 චක්‍රලේඛයේ සඳහන් පරිදි විශ්වවිද්‍යාලයේ භාවිතා කරණු ලබන පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් පරිගණක වත්කම් ලේඛනයක් විශ්වවිද්‍යාලය විසින් පිළියල කර ඇති අතර එහි පිටපතක් මේ සමග විගණනයට ඉදිරිපත් කරමි. ඒ අනුව ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ සම්බන්ධයෙන් මෙම විමසුමේ දක්වා ඇති කරුණු පිළිගත නොහැකි බව දන්වමි. |
| **(ඒ)** | ජනල් අංක A0043 මගින් කෙරීගෙනයන වැඩ ලෙස දක්වා තිබූ රු. 68,968,339 ට අදාල උපලේඛනය විස්තරාත්මක අවසන් ගිණුම් කට්ටලයේ පිටු අංක 75 සිට 78 දක්වා ඉදිරිපත්කර ඇත. ඒ අනුව රු. 68,968,339 ක වටිනාකම නිර්මානයවී ඇති ආකාරය සහ විස්තරාත්මකව වටිනාකම් කොන්ත්‍රාත් අනුව ඉදිරිපත්කර ඇත. |
| **(ඔ)** | යාපනය විශ්වවිද්‍යාලයෙන් ලැබියයුතු රු 3,819,554 මුදලට සමාන මුදලක් එම විශ්වවිද්‍යාලය වෙත ගෙවීමට ඇති වගකීම් ප්‍රමාණයක්ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග දක්වා ඇත.<br>මේ සඳහා ලිඛිත සාක්ෂි දැනට විශ්වවිද්‍යාලය සතුව නොපවතින බැවින් විශ්වවිද්‍යාල විගණන කමිටු නිර්දේශය මත 447 වන පාලක සභා අනුමැතිය යටතේ ගිණුම් පොත් වලින් හිලව් කිරීමට කටයුතු කර ඇත. |
| **(ඕ)** | මේ සඳහා සනාථ කිරීමේ ලිපි ලබාගෙන ඇත. |
| **(ක)** | අදාල අචාර්යවරුන් 15 දෙනාගෙන් 05 දෙනෙකුගේ පමණක් දැනට අර්ථසාධක අරමුදල් අංක හඳුනාගෙන ඇති අතර එම අයවළුන්ගේ ඇප බැඳුම්කර වටිනාකම ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. එය තවදුරටත් ජංගම නොවන වගකීමක් යටතේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව දක්වා ඇත. එමෙන්ම S. C. B. රත්නායක මහතා සහ A. L. D. Z. ද සමරසේකර මහතාගෙන් අයවිය යුතු බැඳුම්කර පිළිවෙලින් රු. 52,451.47 සහ 32,274.41 ලෙස නිවැරදි විය යුතුය.<br><br>එමෙන්ම අනෙකුත් ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල නිශ්චිතවම හඳුනාගෙන ඇති නිසාත් ඔවුන්ගේ අනන්‍යතාවයද හඳුනාගෙන ඇති නිසා තවදුරටත් ජංගම නොවන වත්කමක් ලෙස දක්වා ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් |

| | |
|---|---|
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත වාර්තා කර උපදෙස් ඉල්ලා ඇත. |
| **2.2.5** | **නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම** |
| **(අ)** | **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය** |

**විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXV වැනි පරිච්ඡේදයේ 2.2(ඊ) වගන්තිය**

**2013 වර්ෂය**

| **වාහන අංකය** | **අනතුරු දිනය** | **ඇස්තමේන්තුව** | **රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු මුදල** | **ගෙවූ මුදල** | **අලාභය** |
|---|---|---|---|---|---|
| KC 8280 | 2013.02.06 | රු. 40,850/- | රු. 40,850/-<br>බාහිර පාර්ශවයෙන් ගෙවා ඇත. | රු. 40,850/- | බාහිර පාර්ශවයෙන් අයකරගෙන ඇත. |
| KC 4977 | 2013.02.18 | රු. 161,900/- | රු. 127,542/- | රු. 161,396/- | රු.33,854/- බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගෙන ඇත. |
| KI 8061 | 2013.03.14 | රු. 11,500/- | රු.11,500/-<br>බාහිර පාර්ශවයෙන් ගෙවා ඇත. | රු.11,500/- | - |
| 32-1352 | 2014.04.10 | රු. 22,000/- | රු. 13,100/- | රු. 24,650/- | රු.11,500/- ක් රිය අනතුරට වගකිව යුතු බාහිර පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට නීතිමය පියවර ගෙන ඇත. |
| LW 0638 | 2013.04.23 | රු.33,000/- | රු.32,000/- | රු.33,000/- | රු.1,000/- ක අලාභය රියදුරුගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| 16-6360 | 2013.06.13 | රු.250,000/- | රු.146,020/- අත්තිකාරම් ලෙස රක්ෂණ සංස්ථාවෙන් | - | අළුත්වැඩියා කෙරෙමින් පවතී. |
| **එකතුව** | | | | | **රු.46,354/-** |

ඉහත කරුණු අනුව විශ්වවිද්‍යාලයට සත්‍ය වශයෙන්ම සිදුවී ඇති අලාභය රු. 46,354/- කි. මෙම හානි පිළිබඳ වාර්තා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කොට පිටපත් විගණකාධිපති වෙත යොමු කොට ඇත.

| | |
|---|---|
| | **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටස IX වැනි පරිච්ඡේදයේ 03 ඡේදය**<br><br>2013 නොවැම්බර්, දෙසැම්බර් මාසවල භාණ්ඩාගාරයෙන් අනුමත මුදල් ප්‍රමාණයන් නිසියාකාරව නොලැබීම නිසා දෙසැම්බර් මාසයේ අතිකාල දීමනා ගෙවීමට ප්‍රමාණවත් මුදලක් නොතිබූ බැවින් ප්‍රාග්ධන වැය සඳහා වූ මුදල් පොතෙන් (මුදල් පොත් අංක 20000400) පුනරාවර්තන වැය සඳහා වූ මුදල් පොතට (මුදල් පොත් අංක 20000005) රුපියල් මිලියන 8 ක් 2013/12/09 දින මාරුකරගෙන ඇත. එම මුදල් පොත් රිසිට් අංක 1151387 මගින් ස්ථාවර තැන්පතු උපලබ්ධිකර ගැනීමෙන් ලබාගත් මුදල් මගින් නැවත පියවා ඇත. මෙය අතිකාල ගෙවන අවස්ථාවේ අදාල හිඟය පියවා ගැනීමට තාවකාලිකව දින 14 ක් වෙනුවෙන් කළ මාරු කිරීමකි. |
| | **1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ 99(1) වගන්තිය**<br><br>විශ්වවිද්‍යාල අරමුදලේම කොටසක් වන මෙම අරමුදල් ගිණුම් වෙන් වෙන් වශයෙන් ඒ ඒ පීඨයන්හි පරිපාලනය හා ගිණුම් පහසුව සඳහා මුදල් කමිටුවේ අනුමැතිය යටතේ පිහිටුවා ඇත. වර්ෂ අවසානයේ ශේෂ පත්‍රයේ විශ්වවිද්‍යාල අරමුදල ලෙස ගිණුම් තබනු ලැබේ. |
| | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2005 පෙබරවාරි 03 දිනැති අංක 2005/01 දරණ චක්‍රලේඛය ප්‍රකාරව හා සේවක අර්ථසාධක හා සේවා නියුක්ති භාරකාර අරමුදල් පනත් අනුව**<br><br>කොන්ත්‍රාත් හෝ පැවරුම් පදනම මත පත් කරන ලද පත්වීම් සම්බන්ධයෙන් වූ අර්ථසාධක අරමුදල් ගෙවීම් පිළිබඳව කම්කරු කොමසාරිස් විසින් ලබා දෙන ලද නිර්දේශයන්ට අනුව කටයුතු කර ඇත. |
| | **2012 අප්‍රේල් 16 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 7/2012 සහ 2013 දෙසැම්බර් 29 දිනැති අංක 837 දරන චක්‍රලේඛය**<br><br>විගණන විමසුමට අදාල ප්‍රායෝගික පුහුණු වැඩසටහන''අන්තර් ජාතික පරමාණු බලශක්ති අධිකාරී (IAEA)" විසින් සංවිධානය කරනු ලබන අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පශු වෛද්‍ය පීඨයට භාරදෙන ලද්දේ ඒ සඳහා යෝග්‍ය දේශකවරුන් පීඨයේ සිටිනා බැවිනි. මෙම පුහුණු වැඩසටහන් විශේෂයෙන්ම විදේශිය පශු වෛද්‍යවරුන් හා ඊට අදාල නිලධාරීන් වෙනුවෙන් සිදු කරනු ලබන අතර ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලයට අමතර අරමුදලක් ලැබේ. එපමණක් නොව අප විශ්වවිද්‍යාලය අන්තර්ජාතික පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීමක් ද හිමි වේ.<br><br>මෙම පුහුණුවීම් පාඨමාලා සඳහා යොදාගන්නා සම්පත් දායකයා වෙනුවෙන් සිදුකරන ගෙවීම් සඳහා 22.12.2012 දින පවත්වන ලද 317 වැනි මුදල් කමිටුවෙහි අනුමැතිය ලබාගත් අතර එහිදි අනුමත කරන ලද අයවැය හා එම මුදල් කමිටුවේ වාර්තාවක් ද මේ සමග අමුණා ඇත. මීට අදාල විගණන විමසුමෙහි සඳහන් චක්‍රලේඛ 7/2012 සහ අංක 837 (2003) අදාල වනුයේ විශ්වවිද්‍යාලය තුල පවත්නා දේශන හා ප්‍රායෝගික පුහුණු සඳහාය. මෙහි සඳහන් පුහුණුවීම් පාඨමාලා ඉන් බැහැර වෙනමම අරමුදල් යටතේ විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර පාර්ශවයන් සඳහා ක්‍රියාත්මක කරන ඒවා වේ. එබැවින් මෙහි සඳහන් චක්‍රලේඛ මෙම පාඨමාලා සඳහා අදල නොවේ. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** |
| | **(i) මුදල් රෙගුලාසි 71**<br><br>මේ සඳහා අනුමැතිය ලබාගෙන ඇත. මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේ පරිපාලන කාර්යයෙහි නිරතවන අධ්‍යාපන හා පරිපාලන කාර්යය මණ්ඩලයට එම වගකීම ඔවුන්ගේ රාජකාරී කාර්යයට අමතර වගකීමක් වන හෙයින් එම කේන්ද්‍රයේ උත්පාදිත ආදායමෙන් දීමනාවක් ගෙවනු ලබයි. |

| | |
|---|---|
| | **(ii) මුදල් රෙගුලාසි 104, 104(3)**<br><br>CPPB 5574 වාහනය 2011.02.08 දින අනතුරට පත්වීම<br><br>මෙම වාහනය අනතුරට භාජනය වීම සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පවත්වා ඇති අතර අලාභය රු. 6,870.83 ලෙස දක්වා ඇත. එකී වාර්තාව පදනම් කරගෙන අදාල වගකිවයුතු නිළධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.<br><br>CPNB 3979 වාහනය 2013.07.31 දින අනතුරට පත්වීම<br><br>මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව හා විමර්ෂණ වාර්තාව සකස් කිරීමෙන් අනතුරුව මෙම අනතුර සම්බන්ධයෙන් වගකිම සෘජුවම අදාළ රියදුරු වෙත පැවරිය නොහැකි බව මූලික වාර්තාවෙන් නිර්දේශ කර ඇති බැවින් අදාළ අලාභය රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. එසේම මෙම වාර්ථාව විගණකාධිපති හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇත. |
| | **(iii) මුදල් රෙගුලාසි 371**<br><br>i. මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කළ යුතු බවට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| | ii. 2015 වර්ෂය තුලදී අත්තිකාරම් මුදල් ලබාදීමේදී එය රු.20,000 ක උපරිමයට යටත්ව අදාල දෙපාර්තුමේන්තු ප්‍රධානියා වෙත ලබාදී ඇත. තවද, එම මුදල ඉක්මවූ අත්තිකාරම් මුදල් ලබාගැනීමේදී ඒ සඳහා උපකුලපතිතුමාගේ අනුමැතියට යටත්ව ලබාදීම සිදුකර ඇත. (අදාල කාර්යය රු.20,000 ක මුදලින් නිමකිරීමට නොහැකි වූ අවස්ථාවලදී) |
| | **මුදල් රෙගුලාසි 371(1)**<br><br>i. මෙම රු. 201,468 මුදල අත්තිකාරම් වශයෙන් අංශ ප්‍රධාන 6 දෙනෙක් වෙත නිකුත් කර ඇත. නමුත් මෙම සියලු අත්තිකාරම් මුදල් වලින් වාහන නඩත්තු කිරීම, ද්‍රව්‍ය මිලදී ගැනීම, ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සහ අනෙකුත් කාර්යයන් සඳහා එම ආයතනය වෙත නිකුත්කර ඇත. තවද මෙම ආයතන ණය පදනම මත භාණ්ඩ සැපයීම නොකරන හෙයින් මෙම අත්තිකාරම් මුදල් නිකුත්කර ඇත. |
| | ii. විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති රේටයන්ට අනුකූලව සංයුක්ත දීමනා ඒ ඒ ක්‍රිඩා පැවැත්වෙන අවස්ථාවේදී ලබා දීමට අත්තිකාරම් වශයෙන් ගෙන වියදම් කිරීම සිදු වේ. මෙම අත්තිකාරම් නිවැරදි පරිදි පියවා ඇත. ප්‍රායෝගිකව සෑම උපදේශකයෙක් සහ ශිෂ්‍යයෙක් සඳහා වෙන් වෙන්ව චෙක්පත් ලිවීම කළ නොහැකි බැවින් අත්තිකාරම් වශයෙන් ලබාදීමට කටයුතු කර ඇත. |
| | **මුදල් රෙගුලාසි 371(2)(ආ)**<br><br>කෘෂිවිද්‍යා පීඨය<br>මෙම අත්තිකාරම් මුදල් වලින් ඉන්ඩෙන්ටු මත ආයතන වල භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. 2,205,138 (91.73%) හා විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කටයුතු සඳහා අදාල කථිකාචාර්ය වරුන්ට ලබා දුන් මුදල් රු. 134,878 ක (5.61%) හා අනෙකුත් භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.63,980 ක් (2.66%) ක මුදලක් වශයෙන් රු. 20,000 ක අත්තිකරම් මුදල ඉක්මාව ගෙවීම් කර ඇත. තවද ආයතන වෙත ඉන්ඩෙන්ට් මත කරන ගෙවීම් තුල මහ ඉලුප්පල්ලම කෘෂි උප ඒකකය සඳහා කරන ලද ගෙවීම් (භාණ්ඩ සහ අනෙකුත් මිලදී ගැනීම් සහ ඉන්ධන) වෙනුවෙන් රු.390,910 ක් සහ දොඩන්ගොල්ල ගොවිපල (භාණ්ඩ සහ අනෙකුත් මිලදී ගැනීම් සහ ඉන්ධන) සඳහා රු. 319,185 ක් ගෙවීම් කර ඇත. එම ගොවිපල වලට භාණ්ඩ මිලදී ගන්නා විට අදාල සැපයුම්කරුවන් ණය පදනම මත භාණ්ඩ ලබා නොදෙන බව දන්වා සිටිමි.<br><br>ඉංජිනේරු පීඨය<br>දැනට රු 20,000 සීමාව තුල පුනරාවර්තන අත්තිකාරම් ලබාදීමක් සිදු වේ. |

| | |
|---|---|
| | වෛද්‍ය පීඨය<br><br>මෙම මුදල් ලබාදී ඇත්තේ අවසන් වසර සිසුන්ගේ ප්‍රායෝගික විභාග කටයුතු සඳහාය. එම මුදල්වලින් දින 7 පමණ පවත්නා විභාග කටයුතු සඳහා බාහිර විභාග පරීක්ෂකවරු සඳහා ආහාරපාන ලබාදීම, වෙනත් රෝහල්වලින් එන රෝගීන්ට මුදල් ගෙවීම, (චක්‍රලේඛණ අනුව) රෝගීන්ගේ ප්‍රවාහන ගාස්තු, රෝගීන්ගේ ආහාරපාන හා තේ ආදීය ලබාදීම යනාදිය සිදුකරනු ලබයි. වෛද්‍ය පීඨයේ විභාග පැවැත්වීමේදී මෙම ක්‍රමය දැනට අනුගමනය කරනු ලබයි. |
| | **මුදල් රෙගුලාසි 754, 756(1) සහ 758(1)**<br><br>2014 වර්ෂයේ වාර්ෂික තොග සමීක්ෂණයේදී ඉංජිනේරු පීඨයේ සියලු දෙපාර්තමේන්තු, අංශ හා සියලු ගබඩා සත්‍යාපනය කර ඇත.<br><br>ඉංජිනේරු පීඨයේ පීඨාධිපති තුමා විසින් පත්කරනු ලැබූ ගබඩා පාලකවරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් 07 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් අදාළ ගබඩාවේ සමීක්‍ෂණ කටයුතු සිදුකර ඇත. |
| **(ඇ)** | **චක්‍රලේඛ** |
| | **1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 40/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**<br><br>1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 40/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුකූලව මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා සිදුකරනු ලැබේ. |
| | **2002 නොවම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය**<br>තොරතුරු තාක්ෂණ<br><br>දැනට යාවත්කාලීන වූ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ.<br><br>ශාස්ත්‍ර පීඨය<br><br>ශාස්ත්‍ර පීඨය විසින් සකස් කර ඇති භාණ්ඩ වට්ටෝරු ලේඛණය නියමිත ලේඛණයක් නොවන බව විගණන අංශය පෙන්වා දුන් පසු නැවත නියමිත භාණ්ඩ වට්ටෝරු ලේඛණයක් යාවත්කාලීන කර ඇත.<br><br>කෙසේ වෙතත් 2002/10/10 දිනැති අංක IAI/2002/02 දරණ චක්‍රලේඛ උපදෙස් පරිදි මෙය නැවත සකස් කර ඇති බව දන්වමි.<br><br>වෛද්‍ය පීඨය<br><br>වෛද්‍ය පීඨයේ සියළුම දෙපාර්තමේන්තු මගින් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යනු ලබන අතර පීඨාධිපති කාර්යාලයේ ප්‍රධාන බඩු වට්ටෝරු පොතෙහි දෙපාර්තමේන්තුවලට අයත් බඩු ලේඛනගත කොට ඇත. විගණන විමසුමෙහි සඳහන් කර ඇති පරිගණක උපාංග හා මෘදුකාංග සියල්ල වට්ටෝරු ගතකර ඇත. |
| **(ඈ)** | **කළමණාකරණ හා අභ්‍යන්තර නියෝග**<br>නිල නිවාස කුලී සංශෝධනය පිළිබඳව 4.12 ඡේදයේ දක්වා ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලය වෙත නිවාසවලින් ලැබෙන ආදායම වෙනුවෙන් ගිණුමක් තැන්පත් කොට නිල නිවාස සංවර්ධනයේ සිට අළුතින් නිවාස ඉදිකිරීමට හා නඩත්තුව සඳහා යොදා ගැනීමට තීරණය කොට ඇත.<br><br>අදාල පාලක සභා තීරණය පරිදි වසර 5 කට පසුව නිල නිවාස කුලී සංශෝධනය සඳහා මූල්‍යාධිකාරී වෙත ලිපියක් ඉදිරිපත් කොට ඇති අතර, මෙය 102 වන කාර්ය මණ්ඩල නිවාස කමිටුව වෙත වාර්තා කරන ලදි. එහිදී පාලක සභා තීරණය අනුව එම නිල නිවාස කුලිය වෙනම ගිණුමකට බැර කිරීම සිදුකර නොමැති බැවින් ඉහත සඳහන් 4.12 ඡේදයෙහි ප්‍රතිපාදන දැනට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවන බව 102 වන කාර්ය මණ්ඩල නිවාස කමිටුවේදී තීරණය විය.<br><br>නැවත මේ පිළිබඳව 119 වන කාර්ය මණ්ඩල නිවාස කමිටුවේදී සාකච්ඡා කරන ලද අතර, මෙම කුලී සංශෝධනය නොකිරීමට එහිදී තීරණය විය. මේ පිළිබඳව පාලක සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. කෙසේ නමුත් ඉදිරියේදී නිල නිවාස කුලී සංශෝධනය පිළිබඳව අදහස් හා යෝජනා මීලඟ කමිටුවේ දී සාකච්ඡා කිරීමට තීරණය විය. |

**2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

**(අ)**

2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුලත් කර ගැනීම පෙර වර්ෂ වලට සාපේක්ෂව ප්‍රමාණාත්මකව වැඩි වූ අතර යොමු අංක UGC/AD/AS/NR-official/I හා 2012.09.18 දිනැති ලිපියට අනුව සියලුම පීඨ සඳහා සිසුන් 770 ක් පමණ වැඩිපුර ලියාපදිංචි කිරීමට සිදුවිය. එසේම තෙවන වසර අධ්‍යයන කටයුතු හදාරමින් සිටි සිසුන් සඳහාද මෙම විශ්වවිද්‍යාලයේ සැපයෙන නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොවූ තත්වයක් තුල ශිෂ්‍යයාවන් 60 ක් නේවාසික කළ හැකි සංඝමිත්තා නේවාසිකාගාරයට අයත් පොකුරු නිවාසයක බිත්ති පිපිරීම නිසා එය භාවිතයෙන් ඉවත් කරන ලදී.

ඒ අනුව තෙවන වසර සිසුන් සඳහාද නේවාසික පහසුකම් සියල්ල සපයා දීමට නොහැකි තත්වයක් තුල හා ඉහත පරිදි අතිරේක සිසුන් බඳවා ගැනීම තුලින් නේවාසිකාගාර පහසුකම් සැපයීම පිළිබඳව දැඩි අර්බුධකාරී තත්වයක් විශ්වවිද්‍යාලය තුල උද්ගත විය. මේ සම්බන්ධයෙන් සිසුන් විශ්වවිද්‍යාලය තුලදී මෙන්ම පිටතදීද දැඩි උද්ඝෝෂණයන් වල නිරත වූ අතර විශ්වවිද්‍යාල පරිපාලනය ශිෂ්‍ය සංගම් හා කරන ලද සාකච්ඡාවලදී එළඹි එකගතා මත පැන නැගී තිබූ දැඩි අර්බුදකාරී තත්වය ඉතා ඉක්මනින් සමනය කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අවටින් නේවාසික පහසුකම් ලබාදීමට සුදුසු නිවාස/ගොඩනැගිලි බද්ධට හෝ කුලියට ගෙන සිසුන් වෙත ලබාදීමට තීරණය කරන ලදී. අර්බුධකාරී තත්වය ඉතා ඉක්මණින් සමනය කිරීමට කටයුතු කිරීමට ඉහල පාලන අධිකාරියෙන් ලද උපදෙස් අනුව මෙම කටයුත්ත හැකි ඉක්මනින් කල යුතු වු නිසාත්, AQ 40 නිවස හැර විශ්වවිද්‍යාලයට අයත් වෙනත් ගොඩනැගිලි කිසිවක් නොමැති වූ හෙයින්ද, මෙම නිවාස කුලියට ගැනීම හුදෙක් පොදුජන කාර්‍යයක් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ කාර්‍යයක් වූ හෙයින්ද, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ලැබී ඇති බලතල ප්‍රකාරව අදල ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් තාක්‍ෂණික ඇගයීම් කමිටු 02 ක නිර්දේශ මත, ප්‍රසම්පාදන කමිටු අනුමැතිය හා මුදල් කමිටු අනුමැතිය මත නිවාස/ගොඩනැගිලි 04 ක් කුලියට ගැනීමට කටයුතු කළ බව දන්වා සිටිමි.

එසේම ඊළඟ 2013/14 අධ්‍යයන වර්ෂය තුලදී උපකුලපතිතුමාගේ උපදෙස් මත මනා කළමණාකාරීත්වයකින් යුතුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට නේවාසික පහසුකම් ලබා දීමේ කටයුතු සිදුකිරීම හේතුවෙන් මෙම කුලියට ලබාගත් නිවාස/ගොඩනැගිලි පළමු බදු කාල සීමාවෙන් පසු තව දුරටත් බදු කාල සීමාව දීර්ඝ කිරීමට අවශ්‍ය නොවූ බැවින් පහත සඳහන් දිනයන්හිදී මෙම බදු පදනම මත ලබාගත් නිවාස/ගොඩනැගිලි සියල්ල ආපසු එහි මුල් අයිතිකරුවන් වෙත පවරන ලදී.

1. පී. බී. මනම්පේරී, අංක 25/A/1, නුවර ගෙදරවත්ත, කිරිබත්කුඹුර දරණ නිවාසය
   2014/06/30 දින ආපසු භාරදී ඇත.
2. එම්. එම්. ඒ. ඊ. මනම්පේරී, අංක 25/A/2,නුවර ගෙදරවත්ත, කිරිබත්කුඹුර දරණ නිවාසය
   2014/06/30 දින ආපසු භාරදී ඇත.
3. කේ. ඒ. මාලනීමහත්මිය, 272, වලව්වත්ත, පේරාදෙණිය දරණ නිවාසය
   2014/06/03 දින ආපසු භාරදී ඇත.
4. පී. පී. ආර්. එස්. ගල්ගංගොඩ මයා, අංක 14 ගාල්කොහෝ, හොඩියාදෙණිය දරණ නිවාසය
   2014/08/29 දින ආපසු භාරදී ඇත.

ඒ අනුව විගණන විමසුමෙන් පෙන්වා දුන් පරිදි මු.රේ. 835(2)(ඇ) යටතේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තව දුරටත් අවශ්‍ය නොවූ අතර ඉදිරියේදී යම් හෙයකින් නැවත නිවාස/ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් මු.රේ. 835(2)(ඇ) යටතේ කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කර ඇත.

**(ආ)**

<u>**ශාස්ත්‍ර පීඨය**</u>

විමසුමෙහි සඳහන් කරුණු අනුව ස්ථිර කථිකාචාර්යයවරුන්ගේ වැටුප් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 1318 ක් වන අතර බාහිර කථිකාචාර්යයවරුන් සඳහා එම වර්ෂය තුල දරා ඇති වියදම රුපියල් මිලියන 14 ක් වේ. පැයට රුː500.00 ක්ව පැවති බාහිර කථිකාචාර්යය ගාස්තුව 1:3 (300) අනුපාතයකින් ඉහල යෑම මතද එම වියදම ඉහල ගොස් ඇති බව සඳහන් කරන අතර මෙම වියදම ස්ථිර කථිකාචාර්යයවරුන් සඳහා දැරූ වියදමෙන් 1.08% කි.

ආයතන සංග්‍රහයෙහි පරිදි බාහිර කථිකාචාර්යයවරුන් බඳවා ගැනීම අධෛර්යමත් කළ යුතු බව සඳහන්ව ඇතත් එමඟින් ආචාර්යවරුන් නිවාඩු ගත්විට ඒ සඳහා තාවකාලික සහ බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම වලක්වා නොමැත. එබැවින් අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී ඇති සහ ජාතික සේවය සඳහා මුදවා ඇති හා පුරප්පාඩු ගත තනතුරු සඳහාත් සහ විශේෂ විශේෂඥතා ඇති සම්පත් දායකයන් මඟින් විෂයයන් ඉගැන්වීම සඳහා බාහිර

කථිකාචාර්යවරු බඳවා ගැනීමට අවශ්‍යවන බව සඳහන් කරමි.

කෙසේ වුවද විශ්වවිද්‍යාල ආචාර්යයවරුන්ට ගෙවන වැටුපෙන් 1.08% ප්‍රමාණයක් බාහිර කථිකාචාර්යය වරුන් සඳහා වැය ප්‍රතිශතය පවත්වාගෙන යෑමෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සඳහන් පරිදිම බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්මත් කර ඇති බව විද්‍යාමාන වේ.

එසේම විමසුමේ යෝජනා කර ඇති පරිදි පුරප්පාඩු ගත තනතුරු සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගන්නේ නම් ඔවුනට ගෙවිය යුතු පඩිනඩි හා අනෙකුත් දීමනා සලකා බැලීමේදී වැටුප් වියදම මීට වඩා විශාල අගයක් ගැනීමට ඉඩ තිබුණි. කෙසේ නමුත් බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ලබා ගත හැකි සේවය සීමිත බැවින් ආචාර්යය මණ්ඩලයේ පුරප්පාඩුගත තනතුරු පිරවීමට කටයුතු කරමින් පවතී. 2013 සහ 2014 වර්ෂවල නව බඳවා ගැනීම් පිළිබඳ දත්ත අතර වාර්ෂිකව හඳුනා ගත් පුරප්පාඩු පිරවීම ද නොකඩවා සිදු කරමින් පැවති බව සඳහන් කළ යුතු ය.

එබැවින් බාහිර කථිකාචාර්යයවරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්යමත් කර ඇති බව සඳහන් කරන අතර එසේ වුවද අධ්‍යාපනික අවශ්‍යතා ප්‍රමුඛතාවය මත ඉදිරියේදී බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හිදී එසේ බඳවා ගැනීමට සිදු වේ.

**ඉංජිනේරු පීඨය**

ඉංජිනේරු පීඨයේ අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව සිසුන් 150 කට අනුකූල සේ සකසන ලද්දකි. දැනට E 11 කණ්ඩායමේද සිසුන් 480 ක් සිටී. එසේ වූ පසුබිමක අනුමත තනතුරු ප්‍රමාණයට වඩා කථිකාචාර්යවරුන් සංඛ්‍යාවක් සේවයේ යෙදවීමටත්, එයද ප්‍රමාණවත් නොවන කල බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමටත් සිදුවී ඇත.

බාහිර කථිකාචාර්යවරුන් යොදවා ඇති විෂයන් ඉගැන්වීමට ස්ථිර සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සිටිය ද බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාවේ වූ සැළකිය යුතු වැඩි වීමත්, පන්ති කාමර වල පවතින ඉඩකඩ ප්‍රමාණය සීමාවීමත් මත එකම දේශනය දෙවරක් හෝ සිව් වරක් පැවැත්වීමටත් එම විෂයට අදාළ කථිකාචාර්යවරයාට සිදුවේ. එවිට නියමිත පැය ගණන ඇතුළත දැරිය යුතු වැඩ ප්‍රමාණයේ වැඩි වීමක් ද ඇත. එමෙන්ම වොෂින්ටන් ඇක්‍රිඩේෂන් කමිටුව වැනි අධ්‍යාපන ප්‍රමිති ආයතනය මඟින් ද කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් ලබා ගන්නා දේශනයන් ද නිර්දේශ කර ඇති හෙයින් ඉංජිනේරු පාඨමාලාවන්ට අදාළව බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගත යුතු වන්නේය.

(ඇ) **තොරතුරු තාක්ෂණ**

සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සම්බන්ධීකරණ දීමනා ගෙවන ලද්දේ මුදල් කමිටුවලදී අනුමත කරගන්නා ලද පාඨමාලා ඇස්තමේන්තු (Course budgets) පදනම් කරගනිමිනි. ඒ සඳහා කළමනාකරණ කමිටුවේත් මුදල් කමිටුවේත් පූර්ණ අනුමැතියන් ලබාගෙන ඇත.

1990 පෙබරවාරි 06 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චකලේඛ 422 3 (5) ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලයට ගෞරවාන්විත දීමනා ගෙවිය හැකි වන්නේ එම කාර්යයන් කිරීම සඳහා අවශ්‍ය දක්ෂතාවය තිබීමත්, එම පවරා අති කාර්යය සාමාන්‍ය රාජකාරි වලට පරිභාහිර වීමත්, එම පවරන ලද රාජකාරි සඳහා වෙනත් මාර්ගයකින් තවත් ගෙවීමක් නොලැබීමත් මතය. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය බාහිර ආදායම් උපයන ආයතනයක් වන අතර එහි ගිණුම් කටයුතු සඳහා ස්ථිර සහකාර මූල්‍යාධිකාරිවරයෙකු පත්කොට නොමැති හෙයින් ඉංජිනේරු පීඨ සහකාර මූල්‍යාධිකාරි වශයෙන් කටයුතු කල කේ.ඒ.අයි.එස්. රණසිංහ මහත්මියට තමාගේ කටයුතුවලට පරිබාහිරව මෙම මධ්‍යස්ථානයේ ගිණුම් කටයුතු භාරව කටයුතුවල යෙදීමත්, එම කටයුතු සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බැහැරව කරගෙන යන අවස්ථා තිබීමත්, එම ගිණුම් කාර්යයන් කිරීමේ හැකියාවත් තිබිමත් වෙනත් මාර්ගයකින් එම මූල්‍ය කාර්යය සඳහා ගෙවීමත් නොලැබීමත් මත මූල්‍ය කමිටුවේ අනුමැතියට යටත්ව ඇයට ද එම ගිණුම් කටයුතු වලට සහාය දැක්වීම වෙනුවෙන් ප්‍රධාන ගිණුම් අංශයේ සේවයේ නියුතු එම්.එච්.එම්. රියාස් සහ එච්.එම්.ඒ. බණ්ඩාර යන මහත්වරුන්ට ද මෙසේ ගෞරවාන්විත දීමනා ගෙවනු ලැබුවේ චක්‍රලේඛයට අනුකූලවය.

**ඉංජිනේරු පීඨය**

මුදල් කමිටු අනුමැතියත්, 1990 පෙබරවාරි 06 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 422 4(5) ප්‍රකාරව ගෙවීම් කර ඇත.

| | |
|---|---|
| | **<u>ශාස්ත්‍ර පීඨය</u>**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 422 හි a,b,c,d,e විධිවිධාන අනුව විමසුමෙහි සඳහන් ගෙවීම් සම්බන්ධ කිසිදු බාධාවක් නොපවතී.එසේම රජයේ ආයතන සංග්‍රහයේ XXX විධිවිධාන අනුව ද මෙම ගෙවීම් සඳහා බාධාවක් නොපවතින අතර මෙම ගෙවීම් සඳහා උපයන විට බදු අයකර තිබෙන බවද වැඩි දුරටත් දන්වමි. |
| **3.** | **මූල්‍ය සමාලෝචනය** |
| **3.1** | **මූල්‍ය ප්‍රතිඵල** |
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** |
| **4.1** | **කලමණාකරණ අකාර්යක්ෂමතා** |
| **(අ)** | i. විගණන විමසුමට අනුව රු. 84,225,964.00 ක් වැය කර පීඨ සඳහා කාර්යාල උපකරණ ලබා දීම සිදු කර ඇති බව සඳහන් කර තිබුණ ද, ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය මගින් කිසිදු පීඨයකට කාර්යාල උපකරණ ලබා දීමක් සිදු කොට නැත. එම මුදල් වැය කර තිබුණේ, අප මධ්‍යස්ථානයේ අරමුණු පෙරදැරි කොට ගනිමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතියක් ගොඩ නැගීමට පර්යේෂණ උපකරණ මිලදී ගැනීමටයි. එසේ 2013 වර්ෂයේ දී මිල දී ගත් පර්යේෂණ උපකරණ (High-End Instrument) 02 ක තොරතුරු පහතින් දක්වා ඇති අතර ඊට අදාළ බිල්පත් මේ සමඟ අමුණා ඇත.<br>* Automated DNA Sequencer (Genetic Analyzer) – Rs. 23,905,400.00<br>* Scanning Electron Microscope – Rs. 55,349,000.00<br><br>ඉහත සඳහන් කරන ලද පර්යේෂණ මෙවලම් මේ වන විට විද්‍යා පීඨයේ ස්ථාන ගතකර ඇති අතර ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල අතුරින් Scanning Electron Microscope පවතින්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව පමණක් වන අතර DNA Sequencer උපකරණය පවතින්නේ ද සීමිත විශ්වවිද්‍යාල සංඛ්‍යාවක පමණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සියලු විශ්වවිද්‍යාල වල සිදු කෙරෙන විද්‍යාත්මක පර්යේෂණ සඳහා විශාල පිටුවහලක් මෙම පර්යේෂණ උපකරණ මඟින් ලැබේ. එමෙන්ම මෙම උපකරණ භාවිතා කොට දැනටමත් ජාත්‍යන්තර පර්යේෂණ වාර්තා විශාල ප්‍රමාණයක් මේ වන විට ප්‍රකාශනය වී ඇත. එය විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය ඉහල නැංවීමට බෙහෙවින් ඉවහල් වී ඇත. |
| | ii. ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ජාත්‍යන්තර වැඩමුළු වලට සහභාගි වීම සඳහා අයවැයෙන් දක්වා ඇති ආකාරයට අරමුදල් පිරිනමන ලදි. මෙම මුදල් පිරිනමන ලද්දේ විධිමත් රෙගුලාසි වලට අනුකූලව වන අතර එසේ සමුළුවකට සහභාගි වීමෙන් අනතුරුව සහභාගී වූ පුද්ගලයා විසින් ඒ පිළිබඳව වාර්තාවක් ලබා දීම මෙන් ම සහභාගී වී වසරක් ඇතුලත එම සමුළුවට අදාල පර්යේෂණ වාර්තාව ජාත්‍යන්තර ජ'නලයක pdn email ලිපිනය යොදා ගනිමින් ප්‍රකාශනය කිරීම මීට ඇතුලත් වේ. මෙසේ ජාත්‍යන්තර වැඩමුළුවලට සහභාගි වීමට ඔවුන්ට දායකත්වය ලබා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉතා ඉහළ පිළිගැනීමක් අන්තර්ජාතික මට්ටමෙන් ලැබී ඇති අතර, දැනුම බෙදා හැරීමටද ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ සම්බන්ධතා සහ සහයෝගිතා වැඩි දියුණු කිරීම සඳහා ඉතා ශක්තිමත් අඩිතාලමක් දැමීමටද අප මධ්‍යස්ථානයට හැකියාව ලැබී ඇත. |
| | iii. 2012 වර්ෂයේ දී රු. 4,033,627.00 ක මුදලක් අප මධ්‍යස්ථානය මගින් වැය කර තිබුණේ අප ව්‍යාපෘතියේ අරමුණුවලට අනුකූල කාර්යයන් සඳහාය. ඒ අනුව එම වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ 26 දෙනෙකුට ජාත්‍යන්තර සමුළුවලට සහභාගි වීමට අරමුදල් ලබා දුන් අතර, විශ්වවිද්‍යාලයේ පවත්වන ලද වැඩමුළු මෙන්ම සම්මන්ත්‍රණ සඳහා ද මුදල් වෙන් කරන ලදි. |
| **(ආ)** | අදාල කථිකාචාර්යවරිය හට එංගලන්තයේ ලීසෙස්ටර් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා උපකුලපතිගේ 2007.08.06 දිනැති ලිපිය මඟින් 2007.08.13 දින සිට අවුරුදු 02 ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුනු අතර පහත පරිදි එම වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සංශෝධනය කර හා දීර්ඝ කර ඇත.<br><br>2007.08.13 සිට 2008.01.01 දක්වා -මාස 04 දින 19<br>2008.08.18 සිට 2009.06.25 දක්වා -මාස 10 දින 08<br>2009.10.15 සිට 2011.06.14 දක්වා -අවුරුදු 01 මාස 08<br>2012.02.13 සිට 2012.06.17 දක්වා -මාස 04 දින 04<br>} අවුරුදු 03 මාස 03 (මාස 39) |

| | |
|---|---|
| | ඒ අනුව ඇය ලබාගෙන ඇත්තේ මාස 39 ක් වූ ආචාර්යය උපාධිය සඳහා අනුමත වැටුප් සහිත අධ්‍යයන නිවාඩු පමණි. ලීසෙස්ටර් විශ්වවිද්‍යාලය විසින් නිකුත් කර ඇති 2014.11.01 දිනැති ලිපිය මඟින් ඇය ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ඇත.<br><br>චීනයේ ෆුඩන් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා උපකුලපතිගේ 15.08.2003 දිනැති ලිපිය මඟින් චූලනී රඹුක්වැල්ල මිය හට 24.08.2003 දින සිට අවුරුදු 02ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබු නමුත් අසනීප තත්වය මත චීනයේ භාෂා පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට යලි වාර්තා කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 445-1990-07-31 දිනැති ප්‍රකාරව භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවන රටක අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේදී එම රටේ භාෂාව හැදෑරීමට මාස 06 ක අතිරේක අධ්‍යයන නිවාඩු සඳහා අනුමැතිය ඇත. ඒ අනුව ඇය වෙත ලබා දී ඇති මාස 45 ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා ගෙවන ලද වැටුප් චක්‍රලේඛ අනුව නිවැරදි වේ. |
| (ඇ) | වාහන නඩත්තු කිරීමේ ඒකකය සතුව ඇති මානව සහ භෞතික සම්පත් ප්‍රමාණවත් නොවන නිසා ඇතැම් වාහනවල අලුත්වැඩියාවන් බාහිර ආයතන මඟින් ඉටුකිරීමට සිදුව තිබුණි. එහෙත් වාහන නඩත්තු කිරීමේ ඒකකය සතුව ඇති මානව සම්පත් වැඩිදියුණු කිරීමට අදාළව මෙම ඒකකය සඳහා අවශ්‍ය සේවක තනතුරු අනුමත කරවාගෙන අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමට ඉල්ලීම්කර ඇති අතර ඒ සඳහා කටයුතු කෙරෙමින් පවතී. භෞතික සම්පත් වලට අදාළව උපකරණ/ආවුද ලබාගැනීමට ද කටයුතු කෙරෙමින් පවතින අතර අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලැබීමෙන් අනතුරුව වාහන අලුත්වැඩියාව සඳහා බාහිර ආයතතන වෙත යොමුකිරීම අවශ්‍ය නොවනු ඇත.<br><br>තවද වාහන නඩත්තු කිරීමේ ඒකකය මඟින් ඉංජිනේරු පීඨයේ වාහන පමණක් නොව විශ්වවිද්‍යාලයේ සියලුම වාහන සම්බන්ධවද (වාහන නඩත්තු කටයුතුවලට අදාල) කටයුතු කරනු ලබයි. |
| (ඈ) | පීඨාධිපති කාර්යාලයේ පරිපාලනය යටතේ තිබූ පශු වෛද්‍ය පීඨ ශික්ෂණ සත්ත්ව ගොවිපලේ සියළු කටයුතු 256 වෙනි පීඨ මණ්ඩල රැස්වීමේ පූර්ණ අනුමැතිය යටතේ ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. එබැවින් ගොවිපලේ සියලු පරිපාලන අධ්‍යයන හා වෙනත් කටයුතු ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානියාගේ උපදෙස් මත සිදු කරනු ලැබේ.<br><br>එසේම ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන විසින් ගොවිපලේ ප්‍රගතිය සම්බන්ධව මාස්පතා පීඨ මණ්ඩල රැස්වීමට කරුණු ඉදිරිපත් කල යුතුය.<br><br>කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටි ගොවිපල සුපවයිසර් මහතා 2015.02.01 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ගොස් ඇති අතර ඔහුගේ වැඩ ආවරණය කරන්නේ ද ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේතුවේ අංශ ප්‍රධානගේ උපදෙස් පරිදි එම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන් විසින් ය. ගොවිපල සඳහා සුපවයිසර්වරයෙකු බඳවාගැනීමට කටයුතු කරමින් පවතී. ඒ සඳහා පුවත්පත් දැන්වීම්ද මේ වන විට පලකර ඇත. |
| (ඉ) | නව පශු ශික්ෂණ රෝහල බාහිර රෝගී ප්‍රතිකාර පවත්වාගෙන යමින් උපාධි අපේක්ෂක ප්‍රායෝගික පුහුණුව පිණිස 2012 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. පශු සායනික විද්‍යා අංශයට අනුමත සේවක සංඛ්‍යාවෙන් පශු රෝහල පවත්වාගෙන යාම අපහසු බව දන්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට මු.රෙ. 71 ප්‍රකාරව සකස් කරන ලද අයදුම්පත් 2011 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳව වරින් වර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අදාල බලධාරීන් හමු වී සාකච්ඡා වට කිහිපයක්ද පවත්වන ලදී.<br><br>ඒ අනුව පශු ශික්ෂණ රෝහල වෙත ලබා දෙන ලෙස අනුමතකර ඇති සේවක සංඛ්‍යාව සඳහන් කර උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් අනුමත කර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇත. එහි සඳහන් සේවක සංඛ්‍යාව පහත දැක්වේ.<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II 04<br>තාවකාලික කථිකාචාර්ය 06<br>කාර්මික නිලධාරී 01<br>විකිරණ ශිල්පී 01<br>ඖෂධවේදී 01<br>සරප් 01<br>විද්‍යාගාර උපස්ථායක 04<br>කම්කරු 03 |

| | |
|---|---|
| | 2012 වර්ෂයට අනුමත කර ඇති සේවක සංඛ්‍යාව පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවා ඇති වාර්තාව අනුව තාවකාලික කථිකාචාර්යවරුන් 06 දෙනා වෙනුවට තාවකාලික ප්‍රදර්ශක තනතුරු 10 ක් ලබාදී ඇත. එම තාවකාලික ප්‍රදර්ශක තනතුරු 10 න් 06 ක් පශු ශික්ෂණ රෝහල සඳහා වෙන්කර එවා ඇතත් පශු පීඨය තුල එම තනතුරු බෙදාහැර රෝහල වෙත ලබාදී ඇත්තේ තනතුරු 02 ක් පමණි. තාවකාලික ප්‍රදර්ශක තනතුරු සඳහා පළමු හා දෙවන පෙල උපාධිධාරීන් වැටුප් මදිකම නිසා සේවයට බැඳීමට අකැමැත්තක් දක්වයි.<br><br>සම්පූර්ණ සේවක සංඛ්‍යාව නොලැබීමත් සතියේ දින 07 ම දවසේ පැය 24 පුරාම රෝහල විවෘතව තැබීමත් සිසුන්ගේ සායනික කටයුතු නිසිලෙස සිදු කිරීම අපගේ වගකීම වේ. එබැවින් සේවා අවශ්‍යතා අනුව තාවකාලික කථිකාචාර්යය වරුන් හා අත්‍යාවශ්‍ය අනධ්‍යයන සේවක සංඛ්‍යාවක් පත්කර සේවය පවත්වාගෙන යාම හැර වෙනත් විකල්පයක් නැත. |
| **(ඊ)** | පීඨයේ රජකාරි ගමන් සඳහා පෞද්ගලික වාහන කුලියට ගැනීමේදී ප්‍රථමයෙන් පීඨය සතු වාහන වෙන්කර ගැනීම සඳහා වාහන වෙන්කිරීමේ පොරෝමයක් වාහන ඉල්ලුම් කරන නිළධාරියා විසින් ඉදිරිපත් කල යුතුය. එම ඉල්ලීම සඳහා පීඨයේ වාහනයක් සැපයීමට නොහැකි වූ විට විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ හා ආයතනවලින් වාහනයක් සපයා ගැනීමට හැකිද යන්න පිළිබඳව සොයා බලයි. එමඟින්ද වාහනයක් ලබා ගැනීමට නොහැකි වූ විට පමණක් අදාල වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකුගෙන් වාහනයක් කුලියට ගැනීමට පීඨයේ පරිපාලන නිළධාරීගේ ලිඛිත උපදෙස් ලබා දෙනු ලැබේ. |
| **(උ)** | මුදල් කමිටුවේ අනුමැතියට යටත්ව නිසි නිර්දේශයන් මත බාහිර පාර්ශවයන්ට පරීක්ෂණ වාර්තා සැපයීම මඟින් උපයාගත් අදායමින් 60% කට ආසන්න ප්‍රමාණයක් ඊට දායක වූ කථිකාචාර්යවරුන් හා කාර්ය මණ්ඩලවලට ගෙවීම් කරන ලදි.<br><br>කෙසේ වුවත් 446 වන පාලක සභාව මඟින් මෙසේ පරීක්ෂණ වාර්තා සැපයීම සම්බන්ධයෙන් ගෙවීමට අදාලව, මුළු විශ්වවිද්‍යාලයේ සෑම පීඨයකටම අදාල වන පරිදි විධිමත් ක්‍රියාපටිපාටි හා රෙගුලාසි නිර්දේශ කිරීම සඳහා පීඨාධිපතිවරු තිදෙනෙකු සමඟ නිළධාරින් හතරදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇත. එම නිර්දේශ මත ඉදිරියේදී කටයුතු කරනු ඇත. |
| (ඌ) | මූලධන ගෙවීම් යටතේ නේවාසිකාගාර සඳහා මිලදී ගන්නා ලද ලී බඩු නියමිත පිරිවිතරයන්ට අනුකූලව සපයා ඇති බව දන්වා සිටිමි. භාණ්ඩ පිළිගැනුම් කමිටු (Goods Acceptance Committee) නිර්දේශය මේ සඳහා ලැබී ඇත.<br><br>වාර්තාවේ සඳහන් භාවිතයට නොගත් මේස 36 න් 20 ක් විජේවර්ධන ශාලාවේ සහ මේස 16ක් රාමනාදන් ශාලාවේ සිසුවියන්ගේ ප්‍රයෝජනයට  ලබා දී ඇත.ඒ අනුව අදාල තොග පොත්වල ගැලපීම් සිදුකර ඇත. |
| **(එ)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 291 ප්‍රකාරව රාජ්‍ය සේවයෙන් ලබාගත් දැනුම හා පුහුණුව භාවිතා කරමින් කාර්යාල වේලාවෙන් බැහැරව හෝ අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ කරන ලද කාර්යාලීය නොවන වැඩ වෙනුවෙන් 10% ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලීය අරමුදලට බැර කිරීම සම්බන්ධයෙන් උපකුලපති තුමාගේ අනුමැතිය පරිදි ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන සලසා ඇති බැවින් ඒ අනුව කටයුතු කර ඇත. |
| **(ඒ)** | විගණන ඡේදයෙහි සඳහන් කරුණු අනුව ස්ථිර කථිකාචාර්යයවරුන්ගේ වැටුප් සඳහා දරා ඇති වියදම රුපියල් මිලියන 1318 ක් වන අතර බාහිර කථිකාචාර්යයවරුන් සඳහා එම වර්ෂය තුල දරා ඇති වියදම රුපියල් මිලියන 14 ක් වේ. පැයට රු:500.00 ක්ව පැවති බාහිර කථිකාචාර්යය ගාස්තුව 1:3 (300) අනුපාතයකින් ඉහල යෑම මතද එම වියදම ඉහල ගොස් ඇති බව සඳහන් කරන අතර මෙම වියදම ස්ථිර කථිකාචාර්යයවරුන් සඳහා දැරූ වියදමෙන් 1.08% කි.<br><br>ආයතන සංග්‍රහයෙහි පරිදි බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම අධෛර්යමත් කළ යුතු බව සඳහන්ව ඇතත් ආචාර්යවරුන් අධ්‍යයන නිවාඩු ගත්විට ඒ සඳහා තාවකාලික සහ බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම වැලැක්විය නොහැක. තවද විශේෂඥතා ඇති සම්පත් දායකයන් මඟින් විෂයයන් ඉගැන්වීම සඳහා සහ අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී ඇති සහ ජාතික සේවය සඳහා මුදවා ඇති හා පුරප්පාඩු ගත තනතුරු සඳහාත් බාහිර කථිකාචාර්යවරු බඳවා ගැනීමට අවශ්‍යවන බව සඳහන් කරමි.<br><br>කෙසේ වුවද විශ්වවිද්‍යාල ආචාර්යයවරුන්ට ගෙවන වැටුපෙන් 1.08% ප්‍රමාණයක් බාහිර කථිකාචාර්යය වරුන් සඳහා වැය ප්‍රතිශතය පවත්වාගෙන යෑමෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සඳහන් පරිදිම බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්මත් කර ඇති බව විද්‍යාමාන වේ.<br><br>එසේම විමසුමේ සඳහන් පරිදි පුරප්පාඩු ගත තනතුරු සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගන්නේ නම් ඔවුනට ගෙවිය යුතු පඩිනඩි හා අනෙකුත් දීමනා සලකා බැලීමේදී වැටුප් වියදම මීට වඩා විශාල අගයක් ගැනීමට ඉඩ තිබුණි. කෙසේ නමුත් බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ලබා ගත හැකි සේවය සීමිත බැවින් ආචාර්යය මණ්ඩලයේ පුරප්පාඩුගත තනතුරු පිරවීමට කටයුතු කරමින් පවතී. 2010 සිට මේ දක්වා  නව බඳවා ගැනීම් අනුව වාර්ෂිකව හඳුනා ගත් පුරප්පාඩු පිරවීම ද |

| | |
|---|---|
| | නොකඩවා සිදු කරමින් පවතින බව සඳහන් කළ යුතුය.<br><br>එබැවින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලය විසින් අධෛර්යමත් කර ඇති බව සඳහන් කරන අතර එසේ වුවද අධ්‍යාපනික අවශ්‍යතා ප්‍රමුඛතාවය මත ඉදිරියේදී බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හිදී එසේ බඳවා ගැනීමට සිදු වේ.<br><br>එසේම වෛද්‍ය පීඨය සඳහා පහත සඳහන් කර ඇති හේතුන් නිසා බාහිර කථිකාචාර්යයවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී ඇත .<br><br>වෛද්‍ය සිසුන් සඳහා දේශන පැවැත්වීමට සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීමට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගන්නා අතර. එසේ සේවය ලබා ගන්නා විෂයන් සඳහා පීඨය තුල විශේෂඥ දැනුම ඇති කථිකාචාර්යවරුන් පත් කොට නොමැත.<br><br>ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් ස්නායු ශල්‍ය විශේෂඥ දැනුම ඇස්, කන්, නාසා, උගුර සම්බන්ධ දැනුම, විකලාංග රෝග පිළිබඳව දැනුම ලබාගනු ලබන්නේ බාහිර කථිකාචාර්යවරුන් මගිනි. එම විෂයන් පිළිබඳව විශේෂඥයින් විශ්වවිද්‍යාලීය කථිකාචාර්යවරුන් වශයෙන් බඳවාගෙන නොමැති අතර රජයේ රෝහල් වල සහ රජයේ විශ්‍රාමික විශේෂඥයින් අතරින් බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් තෝරා ගනු ලැබේ.<br><br>වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් හමේ රෝග, පිළිකා රෝග, සමාජ රෝග වැනි විෂයන් පිළිබඳ විශේෂඥයන්ගේ සේවය ලබා ගනී. එයට හේතුව එම විෂයන් පිළිබඳ විශේෂඥයින් පීඨය තුල නොමැති වීමය.<br><br>ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් වෛද්‍ය ශිෂ්‍යයන්ට සමාජයේ විවිධ අංගයන්හි ප්‍රායෝගික දැනුම ලබා දේ. රෝග බෝ වීම සහ වැලැක්වීම පිළිබඳව අවබෝධය,මාතෘ සායන කටයුතු පිළිබඳව ඉගැන්වීම සඳහා පවුල් සෞඛ්‍යය සේවිකාවන් ,පවුල් සෞඛ්‍ය හෙදියන් මහජන සෞඛ්‍යය පරීක්ෂකවරුන් ,අඳ, ගොලු, බිහිරි පාසල් කාර්ය මණ්ඩලය, හෝටල් කාර්ය මණ්ඩලය ,සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට සිදු වේ. ඒ එම නිළධාරීන් ඒ ඒ විෂයන් පිළිබඳ විශේෂඥ දැනුම ලබා ඇති බැවිනි.<br><br>ඖෂධවේදී දෙපාර්තමේන්තුව මගින් වසංගත රෝග පිළිබඳව විශේෂඥ දේශකවරයෙකුගේ සේවය ලබා ගෙන ඇත. එම විෂයෙහි විශේෂඥයන් පීඨය තුල නොමැත.<br><br>නිර්වින්දන වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් බාහිර කථිකාචාර්යවරයෙකුගේ සේවය ලබා ගෙන ඇත්තේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතුව සිටින්නේ එක් කථිකාචාර්යවරියක් පමණක් බැවිනි. කථිකාචාර්යවරුන් දෙදෙනෙක් පශ්චාත් පුහුණුව සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇති හෙයින් මෙම අධ්‍යයන කටයුතු සියල්ල එක කථිකාචාර්යවරියකට පැවරී ඇත. එම දෙපාර්තමේන්තුව මගින් පේරාදෙණිය රෝහල සඳහා විශේෂඥ වෛද්‍ය වරුන්ගේ සේවාව සපයන අතර සිසුන්ගේ සායනික පංති පැවැත්වීමද සිදු කරනු ලැබේ.<br><br>මෙම විෂයන් සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී විශ්වවිද්‍යාලයට විශාල වැය බරක් දැරීමට සිදු වේ. බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ඊට වඩා අඩු වියදමකින් එම කාර්යය ඉටුකර ගත හැක.<br><br>**සම සෞඛ්‍ය විද්‍යා පීඨය** ඉතා මෑතකදී ආරම්භ කල හෙයින් දැනට පීඨයේ සියලු ස්ථිර පුරප්පාඩු පුරවා නොමැති හෙයින් දැනට පීඨයේ සියලු ස්ථිර පුරප්පාඩු පුරවා නොමැති හෙයින් , බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම අනිවාර්යය වී ඇත. කෙසේ වෙතත් ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගත් විට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම ඉතා සීමිත වනු ඇත.<br><br>**ඉංජිනේරු පීඨයේ** ස්ථිර පුරප්පාඩු පිරවීම අපහසු වී ඇත්තේ එම වැටුපට විශ්වවිද්‍යාලයට බැඳීමට සුදුසුකම් ලත් ඉංජිනේරුවන් අකමැති වී ඇති හෙයිනි. ඔවුන්ට මෙරටේත් , විදේශ රටවලත් වඩාත් ඉහල වැටුපකට රැකියාවක් ලබා ගැනීමට ඉතා විශාල ඉඩකඩක් ඇත. මෙම තත්ත්වය තුළ ඉංජිනේරු පීඨයේ බොහෝ දෙපාර්තමේන්තුවල දේශන සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී ඇත. |
| **(ඔ)** | විවිධ ණය ගිවිසුම් යටතේ පහත ඇති රු.5,902,577.00 මුදල සම්බන්ධයෙන් පහත පියවර ගෙන ඇත.<br><br>CW/CON/2008/781 - රු.61.191.00<br><br>ගෙවීම් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කර නැත. ඉල්ලීම කල විගස මෙම මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| | SAR/CW/CON/650 - රු.3,200,000.00<br><br>මෙම කොන්ත්‍රාත්තුවේ මුදල් ගෙවීමේ අඩුපාඩු ඇති බැවින් අඩුපාඩු සැකසීම සඳහා විශ්වවිද්‍යාල සේවකයින් ඉටුකල වැඩ වටිනාකම තක්සේරු කර,අඩු කල පසු ඉතිරි මුදල ගෙවීම වැඩ ඉංජිනේරුගේ නිර්දේශය මත සිදුකරමින් පවතී.<br><br>CW/CON/2009/824 - රු.7,947.00<br><br>මෙම මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වැඩ ඉංජිනේරුගේ නිර්දේශය මේ වන තෙක් ලැබී නොමැති බැවින් ඉහත ගිණුමේ රඳවාගෙන ඇත.<br><br>CW/CON/2007/749 - රු.142,313.00<br><br>මෙය නිදහස් නොකරන ලෙස ව්‍යාපෘති කළමණාකරු විසින් දන්වා ඇති හෙයින් 2014 වර්ෂයේ දී ආදායමට ගෙන ඇත.<br><br>CW/CON/2009/847 - රු.39,484.00<br><br>මෙය 2014 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත.<br><br>රු.2,401,745.00 - මෙම ශේෂය CECB ආයතනය වෙත ගෙවිය යුතු වටිනාකමක් වන අතර දැනට මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර ඇත.<br><br>රු.49,897.00 - නිරවුල් කර ඇත.<br><br>අදාළ පුද්ගලයන් හඳුනාගැනීමට නොහැකි වීම මත සියළුම රඳවා ගැනීම් හිඟ මුදල් කමිටුවේ තීරණය අනුව රජයේ ආදායමට ගැලපීමට තීරණය කර අවශ්‍ය ගැලපීම්ද කර ඇත. |
| **(ඕ)** | 1970 සිට 1989 දක්වා අවුරුදු 20 ක කාලසීමාව තුල ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 70 දෙනෙකු බැඳුම්කර වටිනාකම් රු. 23,952,255.58 වන අතර මෙම ආචාර්යවරුන්ගේ ලිපිගොනු පරීක්ෂාවේදී මෙම අයවලුන් විසින් බැඳුම්කර කඩකරන ලද දිනයේ සිට වර්ෂ 2013 දක්වා කාලය තුල බැඳුම්කර කඩකල කාලය අවුරුදු 21 - 40 දක්වා පැරණි වේ. මෙම අයගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට නීති මාර්ගයෙන් කටයුතු කිරීමේ කාල සීමාව ඉකුත් වී ඇති බැවින් නඩු පවරා අයකර ගැනීම කල නොහැක. තවද මෙම අයගේ වර්තමාන ලිපිනයන් සොයා ගත නොහැකි වීම හේතුවෙන්ද මෙම අයගේ ලිපිගොනුවෙහි ඇති ලිපිනයන්ට ලිපි යොමු කලද ඒවා ආපසු ඒම හේතුවෙන් ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට නොහැකි වී ඇත.<br><br>බැඳුම්කර ගිවිසුම් සහිත වුවත් විශ්වවිද්‍යාල පනතේ අංක 94 (ඇ) ප්‍රකාරව අර්ථසාධක අරමුදලේ ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් වගන්තීන් ඇතුලත් කොට නොමැති වීම හේතුවෙන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් විශ්විද්‍යාලය වෙත නිදහස් කර ගැනීමේ අපහසුතාවයන් පවතින අතර නීතිපතිවරයාගේද උපදෙස් ලැබී ඇත්තේ අදාල ආචාර්යවරයාගේ කැමැත්ත නොමැතිව එකී අරමුදල් විශ්වවිද්‍යාලය වෙත ලබාගත නොහැකි බවයි. මේ සම්බන්ධයෙන් පසුගිය COPE සභාවකදී ගත් තීරණයක් ප්‍රකාරව මෙලෙස මෙම බැඳුම්කර හිමියන්ට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිබෙන අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මැදිහත්වීම මත මෙම ශේෂයන් විශ්වවිද්‍යාලය වෙත ලබා ගැනීමට කටයුතු කෙරෙනු ඇත.<br><br>විගණන වාර්තාවේ දක්වා ඇති බැඳුම්කර කඩකල නිලධාරීන් 214 දෙනෙකුගේ ඇප බැඳුම්කර මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති ආකාරය විශ්වවිද්‍යාලය විසින් ආදාල විගණන විමසුමට ලබා දෙන ලද පිළිතුරෙහිද සංක්ෂිප්තව දක්වා ඇති බැවින් එම තත්ත්වය නැවතත් පහත සඳහන් පරිදි දක්වා ඉදිරිපත් කර සිටිමි.<br><br>1. 2013 වර්ෂයේ ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ලේඛනයට අනුව වර්ෂ 90-99 වකවානුව තුල ගිවිසුම් කඩ කල ආචාර්යවරුන් 33 දෙනෙකු වන අතර බැඳුම්කර වටිනාකම රු. 22,627,793.13 වේ. 2015.05.31 දින වන විට<br><br>(අ) ඉන් 6 දෙනෙකුගෙන් සම්පූර්ණ බැඳුම්කර වටිනාකම වන රු. 4,148,203.33 අයකර ගෙන අවසන් කොට ඇත.<br><br>(ආ) තවත් ආචාර්යවරු 6 දෙනෙකු සම්බන්ධයෙන් බැඳුම්කර වටිනාකම් රු. 4,507,305.62 අය කර ගැනීමට |

නීති ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ඇ) තවත් ආචාර්යවරුන් 9 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම් රු. 3,911,838.04 අර්ථසාධක අරමුදලින් අය කර ගැනීමට ප්‍රමාණවත්ව පවතී.

මෙම අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලියවිලි ඉදිරිපත් කල නමුදු එම ලිපිගොනු වල දායක මුදල් සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩු ඇති බව දන්වා ඇති අතර එකී අඩුපාඩු සකසා නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(ඈ) තවද මෙම වකවානුවේ ආචාර්යවරුන්ගෙන් ආචාර්යවරුන් 10 දෙනෙකුගේ අර්ථසාධක අරමුදල් ශේෂයන් දැනටමත් විශ්වවිද්‍යාලය වෙත අයකර ගෙන ඇති අතර හිඟ බැඳුම්කර වට්නාකම අයකර ගත නොහැකි තත්ත්වයක් පවතින බැවින් බැඳුම්කර කමිටුව හා මුදල් කමිටුවේ අනුමැතීන්ට යටත්ව එකී ශේෂයන් පොත් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.

(ඉ) මෙම ආචාර්යවරුන් 33 දෙනා අතුරින් දෙදෙනෙක් ඉතා පැරණි ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ගණයට වැටේ. මෙම අයගේද අර්ථසාධක අරමුදල් දැනටමත් විශ්වවිද්‍යාලය වෙත අයවී ඇති බැවින් හිඟ මුදල ඉහත සඳහන් පරිදි කපා හැරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

**<u>2015 මැයි මස වන විට ඉහත බැඳුම්කර වට්නාකමෙන් රු. 9,083,836.15 ක මුදලක් බැඳුම්කර වට්නාකම් වශයෙන් අයකර ගෙන ඇත.</u>**

2. 2013 ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ලේඛනයට අනුව වර්ෂ 2000 - 2009 වකවානුව තුල ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 74 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම රු. 126,903,441.90 වන අතර 2015.05.31 දින වන විට

(අ) ඉන් ආචාර්යවරුන් 30 දෙනෙකුගෙන් බැඳුම්කර වට්නාකම වන රු. 126,903,441.90 සම්පූර්ණයෙන් අය කරගෙන අවසන් කොට ඇත.

(ආ) තවත් ආචාර්යවරුන්ගෙන් 15 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම වන රු. 12,186,315.52 අයකර ගැනීමට අර්ථසාධක අරමුදලේ ශේෂය ප්‍රමාණවත් වන අතර ඉන් ආචාර්යවරුන් 10 දෙනෙකුගේ ලිපිගොනු දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට තිබේ. තවත් ලිපිගොනු 04 ක අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ වැඩ කටයුතු ගිණුම් අංශයෙන් සිදු වෙමින් පවතින අතර එක් ලිපිගොනුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යම් යම් අඩු පාඩු ඇති බව දන්වා ඇති අතර එකී අඩුපාඩු සකසා නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(ඇ) ආචාර්යවරුන් 4 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම වන රු. 11,900,175.63 අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත.

(ඈ) තවත් ආචාර්යවරු 12 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම වන රු. 42,909,560.62 වාරික වශයෙන් ගෙවමින් සිටින අතර මේ වනවිට රු. 22,390,270.96 ගෙවා ඇත. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයන්ද විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී.

(ඉ) එක් ආචාර්යවරයෙකුගේ හිඟ මුදල වන රු. 58,369.50 අය කර ගැනීමට ඔහුගේ පාරිතෝෂික මුදල ප්‍රමාණවත් වේ. පාරිතෝෂික මුදල මෙම මුදල පියවා ගැනීමට කැමැත්ත ලබා දී ඇත.

(ඊ) එක් අයෙකු නැවත සේවයේ පිහිටුවා ඇත.

(උ) 03 දෙනෙකුගේ බැඳුම්කර වට්නාකම ගණනය කිරීම් සම්බන්ධව ගැටළු පවතින බැවින් එම ගැටළු නිරාකරණය කර ගනිමින් පවතී.

(ඌ) මීට අමතරව තවත් ලිපිගොනු 3 ක් අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත අයකර ගැනීමෙන් අනතුරුව ඉතිරි ශේෂයන් අයකර ගැනීමට එම පුද්ගලයන්ගේ වර්තමාන ලිපිනයන් සොයා ගත නොහැකි වීම හේතුවෙන් ගිණුම් වලින් කපා හැරීම සඳහා බැඳුම්කර කමිටුව හා මුදල් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කර අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දන්වමි.

(ඵ) තවත් ලිපිගොනු 4 කට අදාල බැඳුම්කර වටිනාකම් සම්බන්ධව තීරණ ගැනීම සඳහා බැඳුම්කර කමිටුව වෙත ඉදිරිපත් කොට තිබේ.

(ඒ) මෙම වකවානුව තුල ගිවිසුම් කඩකල අය අතරින් එක් නිලධාරියෙකුට ඔහුගේ අසනීප තත්ත්වයක් හේතුවෙන් ආදාල පශ්චාත් උපාධිය නිම කිරීමට නොහැකි වීම සලකා බලා පාලක සභාව විසින් ඔහුට වෙනත් පශ්චාත් උපාධියක් හදාරා අදාල සහතිකය ලබා දෙන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව ඔහු විසින් පශ්චාත් උපාධිය නිම කර සහතිකය ලබාදුන් පසු ඔහුගේ නම ගිවිසුම් කඩ කල අයගේ ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2015 මැයි මස වන විට ඉහත බැඳුම්කර වටිනාකමෙන් රු. 24,331,484.76 ක මුදලක් බැඳුම්කර වටිනාකම් වශයෙන් අයකර ගෙන ඇත.**

3. 2013 ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ලේඛනයට අනුව වර්ෂ 2010 පසු මේ දක්වා ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 29 දෙනෙකු සිටි අතර බැඳුම්කර වටිනාකම රු. 42,669,721.73 වේ. 2015.05.31 දින වනවිට

(අ) ඉන් අචාර්යවරුන් 09 දෙනෙකුගෙන් බැඳුම්කර වටිනාකම් වන රු. 16,008,407.93 සම්පූර්ණයෙන් අයකරගෙන අවසන් කොට ඇත.

(ආ) මෙම වකවානුවේ ආචාර්යවරුන්ගෙන් 06 දෙනෙකුගේ අර්ථසාධක අරමුදලේ ශේෂය බැඳුම්කර වටිනාකම වන රු. 5,167,280.68 අයකර ගැනීමට ප්‍රමාණවත් වේ. මෙම දෙදෙනාගේ ලිපිගොනු දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට තිබේ.

(ඇ) ආචාර්යවරුන් 2 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම් වන රු. 11,312,669.39 අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. තවත් එක් ලිපි ගොනුවක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නියමිතව ඇත.

(ඈ) තවත් ආචාර්යවරු 08 දෙනෙකු වාරික වශයෙන් බැඳුම්කර වටිනාකම වන රු. 12,966,589.30 ගෙවමින් සිටින අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයන්ද විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී.

(ඊ) ආචාර්යවරුන් 04 දෙනෙකුට බැඳුම්කර මුදල ගෙවන ලෙසට දැනුම් දී ඇත. ඒ අනුව ඔවුන් විමසන ලද වැඩි විස්තර ඔවුන් වෙත යවා ඇත. ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර අනුව ඉදිරි පියවර ගනු ලැබේ.

**වර්ෂ 2010 ට පසු ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් 2015 මැයි මස වන විට රු. 21,796,536.13 ක මුදලක් බැඳුම්කර වටිනාකම් වශයෙන් අයකර ගෙන ඇත.**

**(ක)**

**1101040002 - රු. 718,687.54**

මුදල් කමිටු අංක 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරීම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය ශේෂයක් නොවේ.

**11-01-04-00-01 Kandy Road Sales Account 170,687.50**

මෙය Kandy Road නම් ග්‍රන්ථය විකිණීමෙන් ලද ආදායම් හා ඒ සඳහා යන වියදම් ගිණුම්ගත කිරීමට පිළියෙල කල ගිණුමක් වේ. මෙම ගිණුමේ ශේෂය ප්‍රකාශන ගිණුමට මාරුකර නිරවුල් කර ඇත.

**11.01.04.14.01 - රු. 570,301.56 - Physics Dept. Revenue Fund**

මෙම අරමුදලේ 2013.01.01 දිනට රු. 568,301.56 2013.12.31 දිනට රු. 570,301.56 ක ශේෂයන් ද පැවති අතර වර්තමානයේ එම ගිණුම් ශේෂය රු. 599,801.56 ක් වේ. මෙම ශේෂය ඵලදායිව වියදම් කිරීමට කටයුතු කරමි.

**11-01-06-07-02 - රු 3,146, 723.49**

ඉංජිනේරු වැඩපල බාහිර ආයතනයන්ට හා පුද්ගලයින්ට සේවා සැපයීම වෙනුවෙන් උපයන ලද මෙම ආදායම ඉදිරි වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු යොදා ඇත.

**11-01-02-07-01 - රු. 329,797.00**

මෙම අදායම් පරිගණක මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සඳහාත් අවශ්‍ය වත්කම් මිලදී ගැනීම සඳහාත් භාවිතයට ගැනීමට කටයුතු යොදා ඇත.

**1101040203 - රු.234,198.00 - Soil science fund- Faculty of Agriculture**

මෙම ගිණුම පාංශු විද්‍යා දෙපාර්තුමේන්තුවේ විසින් බාහිර පාර්ශ්‍යවයන්ට කරනු ලබන විද්‍යාගාර සේවා වලින් ලැබෙන ආදායම බැර කර ඇත. මෙම ගිණුමෙහි මුදල් අත්‍යවශ්‍ය අවස්ථාවකදී පමණක් වියදම් කරනු ලැබේ.

**1101031601 රු.642,490.97**

මෙම ගිණුමෙන් පෙන්නුම් කරන්නේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල්ය.පීඨයෙහි ආචාර්යවරුන් පසුගිය වර්ෂයේ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා මුදල් ඉල්ලීම් කර නොමැති හෙයින් මෙම ගිණුමෙන් කිසිදු වියදමක් දරා නොමැත.තවද 2014 වසරේ පීඨයෙහි ආචාර්යවරුන්ගේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා රු.140,000.00 වියදම් කර ඇත. මෙදිනට මෙම ගිණුමෙහි ශේෂය රු.502,490.97 කි. ඒ බැවින් මෙම අරමුදල් ශේෂය මගින් අරමුණු ඉටු වී ඇත.

**1101041603 රු.2,581,429.67**

මෙම ගිණුමේ ශේෂය මගින් නියෝජනය වන්නේ Revolving fund of lab service සඳහා ඇති මුදල්ය. 2013 වර්ෂය තුල මෙම ගිණුමෙන් කිසිදු වියදමක් දරා නොමැත. එයට හේතුව විද්‍යාගාර පරීක්ෂණ සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය විශාල තොගයක් පැවති බැවින් මිල දී ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබීමය. තවද 2015 වසර වන විට රු.819,318.84 ක වියදම් දරා ඇත. එබැවින් මෙම අරමුදල්වල ශේෂයන් මගින් අරමුණු ඉටු වී ඇත.

**<u>11-01-04-11-03 - රු:270,890.16</u>**

කායච්ඡේදන දෙපාර්තුමේන්තුව මගින් 1997 වර්ෂයේ ආරම්භකර ඇති මෙම ගිණුම එම දෙපාර්තුමේන්තුවේ ශිෂ්‍යන්ට අත්පොත් මුද්‍රණය කරදීම වෙනුවෙන් ආරම්භ කර ඇත. මෙම ගිණුමේ ඇති මුදල් ඉතා දිගුකාලයක් අදාල අරමුණ වෙනුවෙන් භාවිතා නොවන බැවින් අදාල මුදල් එම දෙපාර්තුමේන්තුවේ ඉදිකෙරෙමින් පවතින කෞතුකාගාරයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කිරීමට එම දෙපාර්තුමේන්තු ප්‍රධානියා තීරණය කර ඇති අතර එම ගිණුමේ ශේෂය එලෙසම පවත්වා ගනිමින් එම ගිණුමේ නම "Museum Development Fund" ලෙස වෙනස් කිරීමට මුදල් කමිටුවේ අනුමැතියට යොමු කර ඇත. 2011-05-11 දින පැවති මුදල් කමිටුව මගින් ඒ සඳහා අනුමැතියට ලබාදී ඇත.

මෙම කෞතුකාගාරයේ වැඩකටයුතු මෙතෙක් නිම වී නොමැති අතර එම වැඩකටයුතු නිම වූ විගස එම මුදල් කෞතුකාගාරයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදාගනු ලැබේ.

**<u>1101032102 - රු. 314,097.50</u>**

දන්ත වෛද්‍ය පීඨයට අදාළ 1101032102 දරණ ගිණුමෙහි තාවකාලිකව මෙවැනි මුදලක් පැවතියද මුඛ ව්‍යාධිවේදී අංශයේ උපකරණ නඩත්තු කිරීම ඇතුලු විවිධ කටයුතු වලට අවශ්‍ය අවස්ථාවන්හිදී මෙය ප්‍රයෝජනයට ගන්නා බව දන්වමි.

**1101040004 - රු.1,668,025.00**

මෙම ගිණුම මෙම අංශයේ ක්‍රීඩා පිටි භාවිතා කිරීම වෙනුවෙන් එකතුවන මුදල් රැස් කිරීම සඳහා වෙන් කරනු ලැබූවකි. ක්‍රීඩා පිටිවල මනා නඩත්තුව, නිරන්තර භාවිතය හේතුවෙන් ඇතිවන අලාභ හානි සපුරා ගැනීම හා ඒවායේ සංවර්ධන කටයුතු උදෙසා එසේ එක් රැස්වන මුදල් භාවිතා කිරීම කළමනාකරණයේ අරමුණ වේ.

වර්තමානයේ බොහෝ අඩුපාඩුකම් සහිත මෙම විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටි සංවර්ධනය උදෙසා විවිධ ව්‍යාපෘති රැසක් යෝජනා කොට ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවේ අනුමැතිය ලබා ඇතත් මෙතෙක් ක්‍රියාත්මක තත්වයේ නොමැති බැවින් අදාල මුදල් භාවිතා කොට නොමැති බව දන්වමි. යෝජිත ව්‍යාපෘතිවලින් කොටසක් පවත්නා ශ්‍රම සංචිතය භාවිතා කොට විශ්වවිද්‍යාලය මගින් සිදු කර ගැනීමටත් එසේ සිදු කර ගත නොහැකි ව්‍යාපෘති බාහිර කොන්ත්‍රාත් ක්‍රමය මගින්

| | |
|---|---|
| | සිදුකර ගැනීමටත් අපේක්ෂා කරන බැවින් දැනට ශේෂව පවත්නා එකී මුදල් ඉදිරියේදී අනිවාර්යයෙන්ම වැය කිරීමට සිදු වේ.<br><br>**1101041104 - රු. 28,819.71**<br><br>මෙය මේ වන විට නිශ්ක්‍රීය මට්ටමේ නොපවතී. |
| **(කා)** | මෙම ආයතනයේ මූලික අරමුණ විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම වන අතර මෙවන් පාඨමාලා පවත්වනු ලබන්නේ ආයතනයේ ඇති තොරතුරු තාක්ෂණ උපකරණ නිසි ලෙස නඩත්තු කිරීමට වැය වන මුදලින් කොටසක් හෝ පියවා ගැනිමේ අරමුණෙනි. කෙසේ වුවද ආදායම් ඉපයීමේ අරමුණින් පාඨමාලා සැලසුම් කිරීමක් සිදුනොවේ. |
| **(කැ)** | මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. |
| **(කෑ)** | අදාල මුදල් ස්ථාවර තැන්පතු වල යොදවා ඇත්තේ පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා විශ්වවිද්‍යාලය වෙත ලැබුණු නමුත් ගිණුම්කරණ දින වන විට උපයෝගී කර නොගන්නා ලද UnutilizedFunds අරමුදල්වේ. මෙම අරමුදල් තාවකාලිකපදනම මත කෙටිකාලින ආයෝජනවල තැන්පත්කර ඇත. කෙසේ වෙතත් 12-04-14-00 දරණ පර්යේෂණ ව්‍යාපෘතීන් යටතේ ස්ථාවර තන්පතු වල ආයෝජනය කර තිබූ රු. මිලියන 5 ක මුදල 2013-12-26 දින අදාල තැම්පතු වලින් නිදහස් කර පර්යේෂණ ව්‍යාපෘති වියදම් සඳහා භාවිතයට ගෙන ඇත. |
| **(කි)** | සියලුම ශිෂ්‍යත්ව නීති රීති හා රෙගුලාසි අනුව අදාල පීඨයන් විසින් ලබාදීමට කටයුතු කරනු ලැබේ. බොහොමයක් ශිෂ්‍යත්ව සඳහා නීති රීති හා රෙගුලාසි වලට අනුව සුදුසුකම් ලබන සිසුන් නොමැති අවස්ථාවල ශිෂ්‍යත්ව ප්‍රධානය කරනු නොලබයි. මේ දක්වා සුදුසුකම් ලබා ඇති සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇති අතර 80% ක ප්‍රමාණය ශිෂ්‍යත්ව ප්‍රදානයට සැලසුම් කළත් සුදුසුකම් නොලැබීම මත එම ප්‍රමාණය ප්‍රදානය කිරීම කළ නොහැකි අවස්ථා ඇතිවේ. මෙම ශිෂ්‍යත්ව අරමුදල් නිවැරදිව ගිණුම්ගත කර ඇති බැවින් ගිණුම්කරණ දුර්වලතාවක් ලෙස පෙන්වා දිය නොහැක. |
| **(කී)** | 2004 වසරේ ලියාපදිංචි වී ඇති මෙම සිසුන්ගේ අධ්‍යයන කටයුතු ඇරඹුනේ 2005 වසරේ සිටය. ඒ අනුව එම සිසුන්ගේ අවසන් වසර වන්නේ 2010 වසර වන බැවින් 2011 වසරේ ආදායම ලෙස මුදල් ලැබු වසර දක්වා ඇත. |
| **(කු)** | **<u>අය නොවන ණය ශේෂ</u>** |

| අ.අ. අංකය | නම | 2013-12-31 දිනට ශේෂය | පිළිතුර |
|---|---|---|---|
| P 03486 | එච් එච් චන්ද්‍රදාස | 1,825.00 | විශ්‍රාම ගොස් ඇත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 11108 | පී ජී එස් වික්‍රමනායක | 1,870.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 06975 | එච් ඒ ජයතිලක | 8,000.00 | විශ්‍රාම ගොස් ඇත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 01140 | එස් එස් වික්‍රමසිංහ | 45,830.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 08305 | ඒ ඩී පී සරත්චන්ද්‍ර | 3,910.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 14181 | ඩබ් පී ආර් වික්‍රමරත්න | 3,060.00 | අධ්‍යයන නිවාඩු ලබා ඇත. |
| P 03418 | ආර් එම් එස් කේ රත්නායක | 7,990.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 01643 | කේ එච් ජයවර්ධන | 34,349.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 01894 | එම් ඒ සී එස් අල්විස් | 21,979.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 01932 | ඒ ජී පීරිස් | 67.500.00 | විශ්‍රාම ගොස් ඇත. අර්ථසාධක අරමුදල් මෙතෙක් |

| | | | |
|---|---|---|---|
| | | | නිදහස් කර නොමැත. |
| P 03418 | ආර් එම් එස් කේ රත්නායක | 14,405.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 03759 | එම් එන් එම් කමල් අසඩ් | 41,758.00 | සේවයෙන් ඉල්ලා අස් වී ඇත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 04545 | ආර් එම් ඒ එස් රත්නායක | 55,179.00 | සේවයේ නොමැත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 05510 | එස් කාරියවසම් | 16,104.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 05769 | එස් අයි එල් බී රත්නායක | 35,390.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 07047 | පී ඊ එම් ඩී සී බණ්ඩාර | 101,378.00 | සේවයේ නොමැත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 09127 | ඩබ් පී සරත්චන්ද්‍ර | 34,664.00 | සේවයේ නොමැත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 10120 | එස් ආර් විජේරත්න | 32,498.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 10463 | එච් එම් එන් ඩී හේරත් | 38,746.00 | සේවයේ නොමැත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 10679 | කේ එම් පී එස් එස් කේ නවරත්න | 3,099.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 11840 | ඒ යූ බණ්ඩාරනායක | 8,780.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 08607 | බී පී චන්ද්‍රානන්ද | 26,000.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 02424 | ඩබ් ආර් එම් යූ වික්‍රමසිංහ | 193,796.00 | විදේශ ගත වී හෝ රැකියාව හැර ගොස් ඇත. අර්ථසාධක අරමුදල් මෙතෙක් නිදහස් කර නොමැත. |
| P 04249 | එස් යූ පී සමන්ත කුමාර | 32,705.00 | 2001.12.18 දින සිට සේවය අවසන් කර ඇති මොහුගේ අර්ථසාධක අරමුදල මුදා හැරීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ලියවිලි විශ්වවිද්‍යාලයට භාර දී ඇත්තේ 2011.06.28 දිනයි. එහිදී ඔහුගේ අර්ථසාධක අරමුදල් මුදා හැරීමේදී සිදු වූ ප්‍රමාදය සඳහා ඔහු වගකිවයුතු බවද දැනුම් දෙන ලදී. ගිණුම් අංශය විසින් මෙම ලියකියවිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත 2012 දෙසැම්බර් මස යවා ඇත. අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් මෙම අර්ථසාධක අරමුදල මුදා හැරීමේ ප්‍රමාදය පිළිබඳ වගකීම අදාල පුද්ගලයා විසින් භාරගන්නා බවට ඔහුගෙන් ලබා ගත් ලිපියක් ඉදිරිපත් කරන ලෙසට දැනුම් දෙන ලදී. ඒ බව සමන්ත කුමාර මහතා වෙත දැනුම් දුන්නද මෙතෙක් ඔහු විසින් එම ලිපිය ඉදිරිපත් කර නොමැත. |

| අ.අ. අංකය | නම | 2013-12-31 දිනට ශේෂය | පිළිතුර |
|---|---|---|---|
| P 04796 | වයි එම් රණසිංහ බණ්ඩා | 21,902.00 | වැඩ තහනමකට ලක් වී ඇති මොහු විසින් විශ්වවිද්‍යාලයට විරුද්ධව කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ පවරා ඇති නඩුව විභාග වෙමින් පවතී. එබැවින් ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමට හැකියාවක් නොමැත. එබැවින් අදාල ණය මුදල අයකර ගැනීම ප්‍රමාද වී ඇත. |
| P 06351 | එස් කේ අරඹේපොල | 90,529.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 07193 | එච් එම් චරිත හේරත් | 93,312.00 | මෙම නිලධාරියා විශ්වවිද්‍යාල සේවයෙන් වැටුප් රහිතව නිදහස් කර සිටි අතර පරිසර අමාත්‍යංශයේ ලේකම්වරයා ලෙසත්, ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයා ලෙසත් පත්කර සිටි බැවින් විශ්වවිද්‍යාලයෙන් වැටුප් ගෙවීම අත්හිටුවා තිබුණි. මේ වන විට නැවත විශ්වවිද්‍යාල සේවයට එක් වී ඇති නිසා වැටුපෙන් නැවත ණය වාරික අයවීම ආරම්භ වී ඇත. |
| P 10016 | ජී වී ඒ ඩී අයි පී පීරිස් | 21,900.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 10900 | ආර් එම් ඩී රත්නායක | 40,555.00 | අයකරගෙන අවසන් වී ඇත. |
| P 10929 | එම් ජී එම් රසාක් | 31,815.00 | අධ්‍යයන නිවාඩු (වැටුප් රහිත) ලබා විදේශගත වී ඇත. |
| P 11774 | අයි ජී එල් පී වීරසේන | 64,050.00 | |
| P 12118 | ඩී එම් කුමාරසිංහ | 32,645.00 | |
| P 11480 | ඒ යූ බණ්ඩාරනායක | 8,780.00 | අර්ථසාධක අංක P 11480 - ඒ යූ බණ්ඩාරනායක මහතාට අදාලව ආපදා ණය පැරණි ගිණුමෙහි රු. 8,780.00 ක ණය ශේෂයක් පෙන්නුම් කරයි. නමුත් ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සොයා බැලීමේදී අදාල ණය ශේෂය ඒ මහතාට අදාල එකක් නොවන බවත් උපලේඛණය පිළියෙල කිරීමේදී සිදු වූ වරදක් බවත් අනාවරණය විය. ඒ අනුව මේ වන විටත් එය 2015 උපලේඛණ වලින් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| P 11975 | ජී ඒඑ මි ගුණවර්ධන | 66,660.00 | අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දන්වා ඇත. |
| P 12195 | ඒ පරාක්‍රම | 168,300.00 | 2014 මැයි මස සිට නැවත අයවෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| P 12322 | ආර් එම් එස් රත්නායක | 349,769.00 | 2008-09-22 දිනැති ලිපියෙන් ඔහුගේ ඉල්ලා අස්වීම දැනුම් දී ඇති අතර 2008.10.21 දිනැති උපකුලපතිතුමාගේ ලිපියෙන් ඔහුගේ ඉල්ලා අස්වීම අනුමත කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. |

**(කු)** මීට අදාල මහාචාර්ය කේ.ජී. නන්දසේන මහතාගෙන් අය කර ගැනීමට ඇති සියළුම හිඟ මුදල් එම මහතාගේ වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.

**(කෙ)** මීට අදාල විශ්‍රාම ගිය ආර්.එම්. රත්නායක මහතා 2012.08.15 වන දින සිට විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ගෙන ඇති අතර, 2012.02.16 දිනැති ලිපිය මගින් අදාල නිවාස බාර දෙන ලෙස ඔහු වෙත දන්වා ඇත. ඔහු 2013.02.26 දින AQ/38 අංක දරණ නිල නිවස විශ්වවිද්‍යාලය වෙත බාරදී ඇත. 2012.08.15 දින සිට 2012.11.15 දින දක්වා මධ්‍යම ශ්‍රේණියේ නිවසකට අය කරනු ලබන සාමාන්‍ය කුලීය වන රු.500/- බැගින්ද, ඉතිරි කාලය සඳහා දඩ කුලී ලෙස මසකට රු.7,500/- බැගින්ද, අය කර ගැනීමට කටයුතු කොට ඇත. ඒ අනුව ඔහුගේ අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීමේදී සියළුම හිඟ මුදල් අය කර ගෙන ඇත.

**(කේ)** අදාල හිඟ මුදල ඇතුලත්ව 2015.05.30 දින දක්වා විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු හිඟ ගාස්තුව අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඇතුළුව මහඉළුප්පල්ලම, දොඩම්ගොල්ල, මාවලවත්ත සහ මීවතුර යන ගොවිපලවල් සඳහා විශ්වවිද්‍යාලයේ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම මගින් සේවය සපයනු ලබන සේවා ස්ථාන සංඛ්‍යාව පහත සඳහන් වේ.

| | |
|---|---|
| ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන | 28 |
| රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සේවා ස්ථාන | 56 |
| | **84** |

මෙම සේවා ස්ථාන 84 පැය 08 සේවා මුර 03 යටතේ **(එක් දිනක් සඳහා)** ආවරණය කිරීමට අවශ්‍ය වන ආරක්ෂක නියාමකයන් සංඛ්‍යාව

| | |
|---|---|
| 84 x 3 සංඛ්‍යාව | 252 |
| 5% නිවාඩු | 12 |
| | **264** |

දැනට සේවයේ යොදවා ඇති සමස්ත සේවක සංඛ්‍යාව 186 කි. ඒ අනුව මේ වනවිටත් දෛනික ආරක්ෂක සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාමේදී මුහුණපා ඇති සේවක හිඟය පහත පරිදි වේ.

| | |
|---|---|
| අවශ්‍ය සේවක සංඛ්‍යාව | 264 |
| යොදවන ආරක්ෂක නියාමක සංඛ්‍යාව | 186 |
| **හිඟය** | **78** |

ඒ අනුව නියමිත ප්‍රමිතියෙන් යුතු ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැනට යොදවා ඇති සමස්ත සේවක පිරිසට අමතරව තවත් ආරක්ෂක නියාමකයන් **78** දෙනකුගේ හිඟයක් ඇති බව පැහැදිලි වේ.

ආරක්ෂක දෙපාර්තමේන්තුව අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනයක් බැවින් සේවක හිඟය හෝ වෙනයම් හේතුවක් මත සේවා ස්ථාන හිස්ව තැබිය නොහැකි වන අතර, මෙහි මුලින් සඳහන් කර ඇති අන්දමට ආරක්ෂක නියාමකයන් 78 දෙනකුගේ හිඟය පියවීම සඳහා මාසිකව වැඩකළ යුතු පැය ගණනින් නම්, **78 x 192 = පැය 14,976** ක් වේ. මෙම පැය ගණන ආවරණය කිරීම පිණිස සීමාව ඉක්මවා අතිකාල අනුමත කිරීමට සිදුවේ. මෙම හිඟ පැය 14,976 ආවරණය කිරීම සිදුකරනු ලබන්නේ දැනට සිටින අභ්‍යන්තර ආරක්ෂක අංශයේ නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම මගින් වුවත්, එහිදී

<table>
<tr><td></td><td>මෙම අතිකාල ප්‍රමාණයට වඩා සැළකිය යුතු අඩු සංඛ්‍යාවකින් සේවයේ යෙදවීම සාමාන්‍ය වශයෙන් සිදුකරනු ලබයි.</td></tr>
<tr><td>4.3</td><td>මතභේදයට තුඩුදෙන ගණුදෙණු</td></tr>
<tr><td>(අ)</td><td>i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් 2012 සැප්තැම්බර් 27 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා වෙත LEARN ආයතනය ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථානය වශයෙන් මෙම විශ්වවිද්‍යාලය තෝරාගෙන ඇති බව දන්වා එවා ඇත.<br><br>ඒ අනුව 325 වන මුදල් කමිටුව මඟින් විශ්වවිද්‍යාලය මඟින් LEARN ආයතනය වෙත ලබා දෙන පහසුකම් සඳහා අය කර ගත යුතු ගාස්තු අනුමත කොට ඇති අතර, 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි LEARN ආයතනය හා විශ්වවිද්‍යාලය අතර, ගිවිසුම් අත්සන් කොට ඇත. ඒ අනුව අදාල අයවීම් LEARN ආයතනය විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත.</td></tr>
<tr><td></td><td>ii. මෙම ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි සමාගමක් වන අතර සෑම විශ්වවිද්‍යාලයකම අන්තර්ජාල පහසුකම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ මෙම ආයතනය හරහාය. ඒ අනුව මෙම ආයතනයට ගෙවීම් සිදු කරනු ලබයි.</td></tr>
<tr><td>(ආ)</td><td>19/01/2000 අංක 380 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ පළමු ඡේදයට අනුව විශ්වවිද්‍යාලය තුල සිටින සියලුම සේවකයන්ට බාහිර උපදේශන සේවා හා පරීක්ෂණ සඳහා පෙළඹවිය යුතු බවත් එකී උපදේශන සේවා හා පරීක්ෂණ සඳහා වැඩි අවධානයක් යොමුකලයුතු බවත් අවධාරණය කර ඇත. මෙහිදී මෙම නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිසංස්කරණ ජනාධිපති කාර්යය බලකාය මඟින් ලබා දුන් නිර්දේශ බවත් පැහැදිලිව දක්වා ඇත. මෙහිදී විගණන විමසුමේ සඳහන් පරිදි මුළු ආදායමින් 5% ක් විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සඳහා වෙන් කරනු ලබන බව සත්‍ය වේ. එහිදී එම 5 % පහත කාර්යයට බෙදා දේ.<br><br>1. පරීක්ෂණ නැංවීම සඳහා 40%<br>2. විශ්වවිද්‍යාල උපයෝගිතා ගාස්තු 10%<br>3. විශ්වවිද්‍යාල පරිපාලන ගාස්තු 30%<br>    a. උපකුලපති අරමුදල 35%<br>    b. පීඨාධිපති අරමුදල 30%<br>    c. ලේඛකාධිකාරි අරමුදල 10%<br>    d. මුල්‍යාධිකාරි අරමුදල 25%<br>4. පීඨ/ මධ්‍යස්ථාන පරිපාලන ගාස්තු 20%<br>100%<br><br>මෙහිදී මුල්‍යාධිකාරි අරමුදල සඳහා වෙන් කරනු ලබන මුදල මුලු ආදායමින් 0.0375 % ක් පමණක් වන අතර මෙහිදී එකී අරමුදලෙන් ද 75 %ක් එනම් ලැබෙන මුලු ආදායමින් 0.028125 % ක් විශ්වවිද්‍යාලයේ ගිණුම් අංශයේ කාර්යය මණ්ඩලය සඳහා ගෙවීම් කරනු ලබයි. මෙය 2002 පාලක සභා අනුමැතියකට අනුව 2007 වසරේ නොව 2002 වසරේ සිට ගෙවනු ලබයි.<br><br>විශ්වවිද්‍යාලයට ඉතා විශාල ආදායමක් උපයා දීමට දායක වන මෙම පරීක්ෂණ හා උපදේශන සේවා වල චක්‍රව සේවයෙහි නියුතු ගිණුම් අංශ නිලධාරින් පහත රාජකාරි ඉටු කරනු ලබයි.<br><br>i. විදේශ ආයතන සමඟ කටයුතු කර මුදල් ගෙන්වා ගැනීම.<br>ii. මහා භාණ්ඩාගාරයේ හා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වී මුදල් ගෙන්වා ගැනීම.<br>iii. ගෙවීම් සඳහා වවුචර පිළියෙල කිරීම.<br>iv. නියමිත අනුමැතිය ලබා ගැනීම.<br>v. මිලදී ගැනීම් සිදුකිරීම.<br>vi. ගෙවීම් සහතික කිරීම.<br>vii. අවශ්‍ය මූල්‍ය දත්ත පිළියෙල කිරීම.<br>viii. ගිණුම් මනාව පවත්වාගෙන යාම.<br><br>ඉහතින් සඳහන් කල මූලික රාජකාරීන් ගිණුම් අංශයේ සේවකයින් අතින් සිදුවන අතර එකී රාජකාරීන් 2000 වර්ෂයේ නිකුත් කරන ලද අංක 380 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයෙහි 7.3 ඡේදයට අනුව ශුද්ධ ආදායමින් 65 % - 85 % ක් පමණ</td></tr>
</table>

| | |
|---|---|
| | ඍජු හා වක්‍ර සේවයේ නිරත වූවන්ට ලබා දීම කල හැකි බැවින් මුදල් අංශයේ දායකත්වය වෙනුවෙන් එම මුදල් ගෙවීම කර ඇත.<br><br>මෙහිදී විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සඳහන් වන්නේ විශ්වවිද්‍යාල සේවකයින් සඳහා විශ්වවිද්‍යාල අරමුදල මගින් දීමනාවක් නොගෙවිය යුතු බවයි. මෙම ගෙවීම විශ්වවිද්‍යාල අරමුදලින් සිදුකර නොමැති අතර 2000 අංක 380 දරණ චක්‍රලේඛයට අනුව බාහිර ආයතන මගින් විශ්වවිද්‍යාල සඳහා උපයාගත් ආදායමින් එය ගෙවීම කර ඇත. ඒ අනුව මෙය නීත්‍යානුකූල ගෙවීමක් වේ. |
| (ඈ) | විශ්වවිද්‍යාල වාහන සංචිතයේ පාලන අංශය සතුව එක් බස් රථයක් පමණක් ඇති අතර, පීඨ සතුව පවතින බස් රථ ප්‍රධාන වශයෙන් ඒ ඒ පීඨවල අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනේ. එබැවින් ඉහත සඳහන් පාලන අංශය සතුව පවතින බස් රථය අනෙකුත් සියළුම අවශ්‍යතා සඳහා යොදා ගැනීමට සිදුවේ. මෙම බස් රථය අනෙකුත් කටයුතුත් සමඟ සිසුන් ප්‍රවාහනයට යොදා ගැනීමෙන් අඛණ්ඩ සේවයක් ලබා දීමට නොහැකි වේ. මෙම හේතුව මත සිසුන් ප්‍රවාහනය සඳහා කුලී පදනම මත බස් රථ ලබා ගෙන ඇත.<br><br>විශ්වවිද්‍යාලය තුල කෙටි දුර ප්‍රවාහන කටයුතු සිදුකෙරෙන බැවින් හා එම ගමන් වාරවලදී වැඩි මගින් සංඛ්‍යාවක් ප්‍රවාහනය කරන බැවින් ඉන්ධන දහනය යම් ඉහල මට්ටමක පවතී. කෙසේ නමුත් වර්තමානයේ මේ සඳහා මිල ගණන් කැඳවීම කර සුදුසු බස්රථයක් යෙදවීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | විගණන විමසුමේ සඳහන් පරිදි විශ්වවිද්‍යාලයේ තොග සමීක්ෂණ කණ්ඩායම්වල නිළධාරින් හා සේවකයින් සඳහා මුදල් ගෙවා ඇති බව සත්‍යයකි. එහිදී ආයතන සංග්‍රහයේ xxvi පරිච්ඡේදයට අනුකූලව මෙම ව්‍යවස්ථාපිත කාර්යය ඉටු කිරීම සඳහා මෙකී ගෙවීම සිදු කර ඇත. විගණන විමසුමේ සඳහන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ii කොටසේ ix පරිච්ඡේදයේ 2.2 ඡේදය තුල ඇත්තේ අතිකාල දීමනා අනුමත කල හැක්කේ සාමාන්‍ය වැඩ වලින් පරිබාහිරව සාමාන්‍ය කාල වේලාවෙන් පරිබාහිර අවස්ථාවන් සඳහා බවයි. මෙම තොග සමීක්ෂණ කණ්ඩායම්වල නිළධාරින් හා සේවකයින් සඳහා මුදල් ගෙවීම අතිකාල දීමනා ගෙවීමක් නොවන අතර එකී පරිච්ඡේදයේ කිසිම තැනක අනෙකුත් දීමනාවන් ගෙවීම පිළිබඳව සඳහන් නොවේ. මෙහිදී 1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල සංශෝධන පනතේ vii කොටසේ 45 iv ප්‍රකාරව පාලක සභාවට ලැබී ඇති බලතල අනුව මෙම ගෙවීම පාලක සභාවේ අනු කමිටුවක් වන මූල්‍ය කමිටුව මඟින් අනුමත කර ඇත.<br><br>විශ්වවිද්‍යාලයේ ගිණුම් පද්ධතිය තුල 1995 වසරේ සිට පැවත එන නොසැසඳුනු තොග පාලන ගිණුමක් විය. මෙය නිරාකරණය කර ගැනීම සඳහා තොග කළමණාකරන අංශය ස්ථාපිත කර වාර්ථාකරණය, ගබඩාකරණය නිවැරදි කිරීමට පියවර ගනු ලැබීය. එහෙත් අපගේ නිරීක්ෂණායන්ට අනුව තොග සත්‍යාපනයේ බොහෝ දුර්වලතා පැවති බව අනාවරණය විය. මෙය විශ්වවිද්‍යාලය වෙනුවෙන් වගකීමකින් යුතුව ඉටු කිරීමට අදාල නිලධාරීන්ට අමතර රාජකාරියක් ලෙස පවරා එය සාර්ථක කර ගැනීමට දිරි දීමනාවක් ගෙවීමට තීරණය කලේය. එම තීරණය නිවැරදි වූ අතර තොග සත්‍යාපනය ඉතා සාර්ථක මට්ටමකට ගෙන ඒමට විශ්වවිද්‍යාලයට හැකි විය.<br><br>එහිදී 1995 වසරේ සිට පැවති තොග නොසැසඳීම් ගිණුමේ ශේෂය වන රු. 13,168,099.00 ක නොගැලපීම් සැසඳීම සඳහාද මෙම භෞතික තොග සත්‍යාපනය ඉතා වැදගත් විය. මෙහිදී විශ්වවිද්‍යාලයේ තොග පාලනයේ පැවති දුර්වලතා රැසක් මෙම තොග සත්‍යාපනය මඟින් හෙලිදරව් කර ගැනීමට හැකි විය. මෙහිදී විශේෂයෙන්ම කලින් පැවති නොහඳුනාගත් තොග විශාල ප්‍රමාණයක් හඳුනාගැනීමට සත්‍යාපන කණ්ඩායම් වලට හැකි විය. එහිදී 2010 වසර මුලු තොග ශේෂය වූ රු. 63,136,289.20 ක භෞතික තොගය 2011 වන විට රු. 95,509,319.00 ක් විය.<br><br>තවද එය 2012 වන විට රු. 99,341,023.00 ක් වූ අතරම 2013 වන විට රු. 166,980,387.00 ක් දක්වා වැඩි වී ඇත. විශ්වවිද්‍යාලයේ තොග සම්බන්ධ ගැටලු රැසක් විසදා හඳුනා නොගත් තොග රාශියක් මෙම තොග සත්‍යාපනය මඟින් හඳුනාගත් බවද එමගින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්වය හැකිතාක් නිවැරදි කල බවද, තොග සත්‍යාපනය සඳහා කල ගෙවීමෙන් මුදල්වල උපරිම ආර්ථික වාසිය විශ්වවිද්‍යාලය ලබා ඇති බවද දන්වනු කැමැත්තෙමි.<br><br>කෙසේ වෙතත් මේවන විට මෙම ගෙවීම අත්හිටුවා ඇති බව දන්වමි. |
| (ඉ) | 2013 වසර අවසානයේ පටන් මේ දක්වා නව පාඨමාලාවන් රැසක් ආරම්භ කර පවත්වාගෙනයන ලදී. ඒ වගේම 2012 වසරේ ආරම්භ කරන ලද පාඨමාලාවන් 2013 වසර දක්වා පවත්වා ඇත. එබැවින් මෙම නව පරිගණක ඒ වන විට ප්‍රයෝජනයට ගෙන තිබිණි. මේ සඳහා නව පරිගණක ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගත හැකි වී ඇත. එපමණක් නොව මෙම පරිගණක නවතම තාක්ෂණයෙන් නිපැයු ඒවා බැවින් විශ්වවිද්‍යාල සිසුන්ගේ තාක්ෂණ දැනුම වර්ධනය කිරීමට ඔවුනට දෛනිකව විද්‍යාගාර පහසුකම් සැපයීමේදී ද මෙම පරිගණක භාවිත කිරීමට ඉඩ සලසන ලදී. එමගින්ද මෙම පරිගණක මනා ලෙස ප්‍රයෝජනයට ගැනිමට අවස්ථාවක් ලැබී ඇත. |

| | |
|---|---|
| **(ඊ)** | 2013 මැයි මස 14 දින ගෘහස්ථ ඖෂධ භාවිතය මිනුම් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඔස්ට්‍රේලියාවේ නිව්කාසල් විශ්වවිද්‍යාලය මගින් ප්‍රතිපාදන ලැබී ඇත.කෙසේ වුවද අදාල ව්‍යාපෘතියට නියමිත කාලසීමාවක් තුළ අවසන් කල යුතු බැවින් අදාල ව්‍යාපෘතියේ වැඩකටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලෙස විශ්වවිද්‍යාල අරමුදලින් ලබාගෙන ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් මහබැංකුව වෙත 2012 නොවැම්බර් මස 29 වෙනි දින ලැබී තිබුණද එම මුදල් නිදහස් කර ගැනීමේදී ප්‍රමාදයන් සිදු වූ බැවින් විශ්වවිද්‍යාල අරමුදලින් මුදල් ලබාගෙන අදාල ව්‍යාපෘතිය අඛණ්ඩව සිදුකර ඇත.<br><br>2013 මැයි මස 14 දින මුදල් නිදහස්කර ගැනීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල අරමුදලින් ලබාගන්නා ලද රු:1,102,450.43/- ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත නැවත ලබාදී ඇත.ඒ අනුව විගණන විමසුමේ සඳහන් කර ඇති 807,500/- ඇතුලත්ව (769,000+38,645=807,645 වියයුතුයි) මුදල නැවත එම අරමුදලට බැර කර ඇත.<br><br>කෙසේ වුවද මෙලෙස ක්ෂේත්‍ර පර්යේෂණ ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ සේවාවන් සපයන සැපයුම් කරුවන් විශ්වවිද්‍යාලය සමඟ ලියාපදිංචි වී නොමැත. වෙනත් දිස්ත්‍රික්ක වලින් ද එවන් සේවා සපයන්නන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොමැත. මේ අනුව ඉහත සඳහන් 317.8.5 සහ 320.2.4 යන මූල්‍ය කමිටු වාර්තා සටහන් වලට අනුකූලව ලබා දී තිබූ අනුමැතිය අනුව යමින් වෛද්‍ය පීඨ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් අදාල දිස්ත්‍රික්ක සඳහා වෙන වෙනම සේවා සපයන්නෙකු අඩුම මිල පදනම යටතේ තෝරා ගන්නා ලදී. |
| **4.4** | **දෘශ්‍ය අක්‍රමිකතා** |
| **(අ)** | 2015.07.05 දින පැවැති 442 වැනි පාලක සභා රැස්වීමේදී ගත් තිරණය ප්‍රකාරව මු. රෙ. 104 යටතේ කමිටුවක් පත්කර විමර්ශණයක් පැවැත්වීමට කටයුතු සිදුකර ඇත.<br><br>විශ්වවිද්‍යාලයට සිදුවී ඇති පාඩුව පිළිබඳව අවසන් තීරණය ගන්නා තෙක් මෙම අයගෙන් දැනටමත් රු. 1,040,434.98 ක මුදලක් ඔහුගේ අර්ථසාධක අරමුදලින් පහත සඳහන් අයවීම් සම්බන්ධයෙන් රඳවා ගෙන ඉතිරි මුදල ඔහු වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලදී.<br><br>නොපිය වූ අත්තිකාරම් මුදල - රු. 287,500.00<br>(රු. 230,000 + 25% දෙපාර්තමේන්තු ගාස්තු)<br>නිල නිවාස කුලිය සහ විදුලි ගාස්තු - රු. 198,414.98<br>ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් - රු. 554,520.00<br>එකතුව - රු. 1,040,434.98<br><br>කෙසේ වුවද මෙම රඳවා ගත් මුදල විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම, දැනටමත් අදාල අය විසින් ඔහුගේ අර්ථසාධක අරමුදල කිසිදු අඩු කිරීමකින් තොරව ලබා ගැනීමට දිසා අධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුවට යටත් වන බව වැඩි දුරටත් දන්වා සිටිමි. |
| **(ආ)** | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 2.1 හා 2.2 ඡේද ප්‍රකාරව අතිකාල වැඩ සඳහා බලය දිය හැක්කේ ඒ කටයුත්ත ඉටුකිරීමට වෙනත් කිසිදු මාර්ගයක් නැති අතිවිශේෂ අවස්ථාවලදී සහ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූ ද සාමාන්‍ය වැඩ කටයුතු වලින් ඒකාන්තයෙන් පරිබාහිර වූ ද හදිසි වූ ද වැඩ සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වූ ද වැඩ සඳහා පමණක් බව දක්වා ඇත.<br><br>ඊට අනුකූල නොවන පරිදි වැඩ දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අතිකාල ගෙවා ඇති බවට කරුණු දක්වා තිබීම සම්බන්ධයෙන් එවකට එම මුල් විගණන විමසුම (CL/KD/J/A/PU/2013/46) සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත්තේ එහි කටයුතු සඳහා වැඩ දෙපාර්තමේන්තුව සතු සමස්ථ ශ්‍රම බලකාය ප්‍රමාණවත් නොවීම නිසා අවශ්‍ය තරම් කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තුරු දැනට සිටින සේවකයින්ට උපරිම අතිකාල ප්‍රමාණයක් ගෙවීමට තීරණයක් ගත් බවයි.<br><br>වැඩ දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව මේ වන විට 254 ක් වන අතර ඉන් 2007 වසරට පෙර පුරප්පාඩු වී තිබූ තනතුරු 37 ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී නොමැති බව දන්වා සිටිමි. ඊට අමතරව එම දෙපාර්තමේන්තුවේ මේ වන විට පුරප්පාඩු 15 ක් පවතී. ඒ අනුව එම පුරප්පාඩුගත තනතුරු වල කාර්යභාරය ඉටු කර ගැනීමට සිදු වී ඇත්තේ දැනට සිටින 202 ක් පමණ වූ සේවකයින්ට වැඩිපුර අතිකාල දීමනා ගෙවීම මගින් බව පෙන්වා දෙමි. දැනට එම පිරවිය නොහැකි පුරප්පාඩු 37 පිරවීමට හා මෙම වසර සඳහා වැඩ දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අලුතින් ඉල්ලා ඇති නව තනතුරු 107 ක් ඇතිකර ගැනීම |

සඳහා අනුමැතිය ලබා ගැනීමට සේවක සංඛ්‍යා සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බවද දන්වා සිටිමි.

ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසුව අතිකාල සේවය අඩුකර ගැනීමට හැකි වනු ඇත.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

2013 වර්ෂයේදී මෙම පර්යේෂණ අරමුදල් අරමුණුගත පර්යේෂණයට යොදවා නොගත් බැවින් අරමුදල් සම්පාදකයන් වෙත ආපසු හරවා යවන ලදි.

**4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

**(අ)** විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පරිගණක පාඨමාලා සහ පුහුණුවීම් ලබාදීමත් බාහිර ආයතන සඳහා කෙටි කාලීන පරිගණක පුහුණුවීම් ලබා දීමටත් මීට අමතරව සතියේ දින 7 පුරාවටම සිසුන් තම අධ්‍යාපන කටයුතු සිදු කිරීමට ආයතනයට පැමිණෙන විට ඒ සඳහා පහසුකම් සහ උපදෙස් ලබාදීම ද මූලික අරමුණෙහිම කොටසකි. තවද එම පැය ගණන් ලේඛණගත කිරීමක් සිදු නොකරයි. එබැවින් විගණන පැනයන්හි සඳහන් කර තිබෙන ගණන් මිණුම් ප්‍රායෝගික ගණන් මිණුම් පිළිබිඹු නොකරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

බාහිර ආයතන සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා සහ කෙටි කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ සති අන්තයේ පමණි. තවද එවැනි පාඨමාලා පවත්වනු ලබන්නේ බාහිර ආයතනයක් මඟින් ඉල්ලීම් කළ විට සහ කෙටි කාලීන පාඨමාලා සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව ආයතනයට ආදායමක් ලබා ගැනිමට ප්‍රමාණවත් නම් පමණි. එම නිසා මෙවැනි පාඨාමාලා මඟින් වාර්ෂිකව ලැබෙන ආදායම වසරින් වසර වෙනස් විය හැකිය.

**(ආ)**

| ගිණුම් අංකය | වටිනාකම | ගිණුම | පිළිතුර |
|---|---|---|---|
| 1101040201 | 161,276.44 | sales of plants | මෙම ගිණුම්හි ශේෂයන් 2014 වර්ෂයේ 326 වැනි මුදල් කමිටුවේ අංක 326.02(1) හි අනුමැතියට යටත්ව ජ'නල් අංක RJE/KA/14/117හාRJE/KA/15/51යට තේ පීඨ සංවර්ධන අරමුදලට බැර කර ඇත. |
| 110122200-202 | 94,858.25 | Staff of department offices heads funds | |
| 11016302 | 2,020.00 | ELTU Fund A/C Faculty of Agriculture | |
| 110126100-202 | 4,000.00 | UGC current account | |

**11-01-03-04-07 - රු. 301,032.60**

මෙම ශේෂය විශ්වවිද්‍යාලයේ දීර්ඝ කාලයක් පැවත එන ශේෂයක් වන අතර ඒවා මුදල් කමිටුවට වාර්ථා කර ඇත. එහිදී මුදල් කමිටු 326.02 (1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරීම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය නොවේ.

**11-01-05-00-03 - රු. 1,357,082.83**

මුදල් කමිටු අංක 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරීම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය ශේෂයක් නොවේ.

**11-01-07-00-10 - රු. 11,334,105.83**

මුදල් කමිටු අංක 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරීම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය ශේෂයක් නොවේ.

**11-01-07-04-02 - රු. 35,000.00**

මෙම ශේෂය විශ්වවිද්‍යාලයේ දීර්ඝ කාලයක් පැවත එන ශේෂයක් වන අතර ඒවා මුදල් කමිටුවට වාර්ථා කර ඇත. එහිදී

මුදල් කමිටු 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරිම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරිමට සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය නොවේ.

**11-01-31-600 - රු. 326,013.25**

මෙම ගිණුම 2013 වසරේ නිශ්ක්‍රීයව පවතීය යන්න පිලිගත නොහැක. මෙහිදී මෙම නමින් ලෙජර් ගිණුම් 02ක් පවතින අතර එකී ගිණුම ක්‍රියාකාරිව පවතී. එසේ ගිණුම් දෙකක් පැවතීම නිසා මෙය අක්‍රිය ලෙස නිරීක්ෂණය වී ඇති අතර අක්‍රිය ගිණුමේ ශේෂය සක්‍රිය ගිණුම වෙත මාරුකර ඇත.

**11-01-34-500-204 - රු. 19,390.60**

මෙම ශේෂය විශ්වවිද්‍යාලයේ දීර්ඝ කාලයක් පැවත එන ශේෂයක් වන අතර ඒවා මුදල් කමිටුවට වාර්තා කර ඇත. එහිදී මුදල් කමිටු 326.02(1) අනුව මෙම ශේෂය උපරිම ආර්ථික ඵලදාව ලැබෙන පරිදි භාවිතා කිරිම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරිමට සංවර්ධන අරමුදලට බැර කර ඇති අතර තවදුරටත් ඉහත ශේෂය නිශ්ක්‍රීය නොවේ.

**11-01-05-07-01 - රු 25,590.94**

මෙම ගිණුම වර්තමානයේ සක්‍රීය ලෙස පවත්වාගෙන යනු ලැබේ.

**11-01-176-00-207 - රු. 7,307.00**

2014.09.19 දිනැති ජ'නල් අංක JV/2014/78 මගින් පීඨ සංවර්ධන අරමුදලට බැර කරන ලදී.

**11-01-346-00-207 - රු. 600,000.00**

මෙය ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවකි. ගිවිසුම අනුව මෙම අරමුදලේ පොලී ආදායම පමණක් පීඨයේ ආරාධිත දේශකයන්ගේ ගමන් වියදම්ල ආහාරපාන සහ නවාතැන් වියදම් සඳහා යොදාගැනීමට අනුමැතිය දී ඇත. අවශ්‍යතාවයක් පැන නැගුණ විට මෙම අරමුදල ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිතය.

**1101041602 - රු. 54,055.00**

මෙම ගිණුමේ ශේෂය විශ්වවිද්‍යාල ගිණුම්වලට මාරු කර ඇත. තවද 2014.10.24 දිනට ශේෂයක් නොමැත.

**11-01-01-04-03 - රු. 267.75**

මෙය 204K0045ජ'නලය මගින් නිවැරදි කරන ලදි.

**11-01-325-00-204 - රු. 229.00**

අදාල ආචාර්යවරිය වෙත පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා දී තිබුණු රු.100,000.00 මුදලින් අදාල පර්යේෂණ අඛණ්ඩව සිදුකර ඉතිරිව ඇති මුදල මෙම ගිණුමෙහි දැක්වේ. මෙම සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ඇත.

**11-01-01-04-07 - රු. 653,210.97**
**11-01-07-04-07 - රු. 76,344.60**
**11-01-07-04-04 - රු. 2,045,787.71**

උක්ත ලෙජර් ගිණුම් 03 සම්බන්ධයෙන් අමුණා ඇති මුදල් කමිටු තීරණය වෙත හා නව ව්‍යපෘතිය සම්බන්ධ යෝජනාවලිය වෙත අවධානය යොමු කරමි.

ඒ අනුව නිෂ්ක්‍රීයව පැවති උක්ත ගිණුම් වල ඉතිරි මුදල් යොදවා 10.04.2014 දින පැවති මුදල් කමිටු රැස්වීමේදී ලබාදුන් අනුමැතිය පරිදි නව ව්‍යාපෘතියක් සිදු කරන ලදි. එබැවින් මෙම ගිණුම් වල මේ වන විට ශේෂයක් නොපවතී. නව ව්‍යාපෘති සඳහා අංක 11-01-05-04-05යන ලෙජර් ගිණුම් විවෘත කර ඇත.

**11-01-07-04-08 - රු. 82,940.96**
**11-01-03-04-04 - රු.   1,500.00**
**11-01-03-04-05 - රු. 762,248.00**

මෙම ගිණුම වර්තමානයේ සක්‍රිය ලෙස පවත්වාගෙන යනු ලැබේ.

**11-01-03-04-03  - රු. 7,177,170.13**

ශාස්ත්‍ර පීඨයේ මානව හිමිකම් කේන්ද්‍රය සඳහා වූ ගිණුමකි. මෙහි සමුච්චිතව ඇති මුදල භාවිතා කරමින් ශාස්ත්‍ර පීඨයට හා මානව හිමිකම් කේන්ද්‍රයට අවශ්‍ය නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම සඳහා යෙදවීමට නියමිතය. මේ පිළිබඳ සැලසුම් සකස් කරමින් පවතී.

**11-01-07-04-09 - රු. 500,000.00**

ආර්ථික විද්‍යා අංශයේ ස්ථාවර තැන්පතුවකි. මෙම ස්ථාවර තැන්පතුවෙන් උපයන පොළී ආදායම උපයෝගී කරගෙන සිසුන් වෙත ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.

**11-01-13-20-02-14 රු. 2,720.50**

| ගිණුම් අංකය | වටිනාකම | ආරම්භක වර්ෂය | නිෂ්ක්‍රිය වර්ෂය |
|---|---|---|---|
| 11/01.13.200.214 | 2,720.50 | 2011 | වසර 04 |

මෙම අරමුදල් ගිණුමේ රු. 2,720.50 ශේෂයක් පැවති අතර එය මුදල් කමිටුවේ අනුමැතිය ලබා ගෙන (340.02(c)) විශ්ව විද්‍යාල සංවර්ධන අරමුදලට (University Development Fund) බැර කර ඇත. මේ අනුව ඉහත අරමුදලේ ශේෂය දැනට ශුන්‍ය වී ඇත.

**11-01-07-07-03        රු. 19,918.64**

මෙය ඉංජිනේරු පීඨ ප්‍රදර්ශන අරමුදලයි. ඉංජිනේරු පීඨය වසර 05 කට වරක් පවත්වන ප්‍රදර්ශනයේදී ලැබෙන අදායම මෙයට බැර කරන අතර එම ප්‍රදර්ශනයට අදළ සියළුම වියදම් හරකල පසු ශේෂය ඊළඟ ප්‍රදර්ශනයේ කටයුතු සඳහා භාවිතා කිරීමක් කරයි. ඒ අනුව අදාළ අරමුණ ඉටුකර ගැනීම සඳහාම මෙම අරමුදල භාවිතා වේ.

**110112600 -216 - රු.145,686.31**

මෙම ගිණුමෙහි ශේෂය විශ්වවිද්‍යාල ගිණුම් වලට මාරු කර ඇති අතර මේ වන විට එහි ශේෂය ශුනය වී ඇත.

(ඇමුණුම් 01)

| | | |
|---|---|---|
| **1101042106** | 11,103.25 | මෙම මුදල් දන්ත වෛද්‍ය පීඨයේ ඡායා පිටපත් මධ්‍යස්ථානයේ ලැබීම් වේ. මෙය ප්‍රධාන ශාඛාවේ ගිණුම් අංශය සතු වුවකි. |
| **1101052102** | 30,668.59 | ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය (Division of Microbiology) සඳහා ආරම්භ කර තිබු ගිණුමකි. මේ වන විට අදාල ගිණුමේ ශේෂය පීඨ සංවර්ධන ගිණුමට මාරු කොට ප්‍රයෝජනයට ගෙන ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| **1101052104** | 1607.70 | මෙම මුදල දන්ත වෛද්‍ය පීඨ පුස්තකාල සංවර්ධන අරමුදල හා ප්‍රජා සෞඛ්‍ය අංශයන් සඳහා අදාළ වේ. මෙය පීඨ සංවර්ධන ගිණුමට මාරු කොට ප්‍රයෝජනයට ගැනිමට ක්‍රියා කර ඇත. |
| **1101072103** | 13556.24 | |
| **110117700-221** | 130,994.50 | මුඛ ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ විශේෂඥ පුහුණුව සඳහා ආරම්භ කර ඇති ගිණුමකි. ඊට අදාලව අවශ්‍ය අවස්ථාවකදී ප්‍රයෝජනයට ගන්නා බව කාරුණිකව දන්වමි. |

**1101041105 - රු.17,970.41, 110134200-211 - රු.420,647.00**

ගිණුම් අංක 1101041105 වෛද්‍ය පීඨ පුස්තකාල සංවර්ධන අරමුදල හා 110134200-211 දරණ කාර්ය මණ්ඩල කුසලතා සංවර්ධන අරමුදල යන මුදල් හි පවතින ශේෂයන් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන අතර මුදල් කමිටු අනුමැතියක් මගින් පීඨ සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

**1101040009 - රු. 159,178.84**

මෙම ගිණුම 2015.09.30 දින වන විට නිවැරදි කර ඇත. මේ නිසා මෙය තවදුරටත් නිශ්ක්‍රිය මට්ටමේ නොපවතී.

**110125900 - රු.2,260,886.31**

**110125901 - රු. 261,816.19**

සුනාමි අරමුදලේ ඇති මුදල් ප්‍රයෝජනයට ගෙන ස්වාභාවික විපත් උපකාරක අරමුදලක් පිහිටුවීම සඳහා රු. 339.02 මුදල් කමිටුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එයට සුදුසු වාර්තා නිර්දේශයක්(Guideline) සකස් කිරීමේ කටයුතු දැනට කෙරීගෙන යයි.

**1101040005 - රු. 3,023,962.65**

මෙම මුදල පහත සඳහන් පුස්තකාල ලී බඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලද බව දන්වා සිටිමි.

1. UPS යන්ත්‍ර 25 ක් සමග පරිගණක යන්ත්‍ර 25ක් පුස්තකාලයේ ඇති කල් ඉකුත් වූ පැරණි යන්ත්‍ර සඳහා ප්‍රතිෂ්ඨාපනය කිරීම. (Replacement)
2. ලී වලින් නිපදවන ලද පොත් රාක්ක 20 ක් මිලදී ගැනීමට දැනට සැලසුම් කර ඇත. ඒ අනුව ඉහත ශේෂය ඉදිරියේදී නිශ්ක්‍රිය ශේෂයක් ලෙස නොපවතී.

**1101010405 -1,058,669.57**

මෙහි සඳහන් පරිදි රු.500,000/- මුදලක් ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවට පුද්ගලික ආයතනයක් විසින් ලබා දී ඇත්තේ එම දෙපාර්තමේන්තුවෙහි ශිෂ්‍ය සුහසාධන හා උපකරන ක්‍රියාකාරීත්වයන් සඳහාය.

එබැවින් මෙම මුදල ස්ථාවර තැම්පතුවක ආයෝජනය කර අවශ්‍යතා ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමක් සිදු කරනු ලබයි. එය සිදු කරනු ලබන්නේ මෙම මුදල් ලබාදීමේ අපේක්ෂිත අරමුණට බව දන්වමි. එබැවින් මෙම මුදල් 2011 වර්ෂයේ සිට අරමුණු ගත කාරණය සඳහා යොදවාගෙන ඇත. ඒ අනුව මෙම ශේෂයද නිශ්ක්‍රිය ශේෂයක් නොවන බව දන්වමි.

**(ඇ)** අන්තර්ජාල සහ සන්නිවේදන සේවා ඒකකය සතුව Surge Protector නැමැති උපකරණ කිසිවක් අමතරව හෝ නිෂ්ක්‍රීයව නොමැති බවත් Surge Protector සවි කරන ලෝහ පැනල හයක් පමණක් ඒකකය සතුව ඇති බවත් මීට පෙර කරන ලද විගණන විමසුමට අදාළ පිළිතුරු සැපයීමේදී පෙන්වා දෙන ලදි. එම පැනල අනාගතයේදී ඇතිවිය හැකි අවශ්‍යතාවයකදී භාවිතයට ලබාගැනීම සඳහා මෙම ඒකකය විසින් තබාගෙන ඇති බවද එහිදී පෙන්වාදී ඇත. මීට පෙර කරන ලද විගණන විමසුමට අදාළ පිළිතුරු සැපයීමේදී පෙන්වා දුන් පරිදි මෙම DVD තැටි 2012 වසරේ පැවති උපාධි

| | |
|---|---|
| | ප්‍රධානෝත්සවයේ වීඩියෝ පටය පටිගත කර උපාධිධාරීන් වෙත ලබාදීම සඳහා එම උපාධි ප්‍රධානෝත්සව සංවිධාන කමිටුවේ තීරණයකට අනුව ශිෂ්‍යසේවා අංශය විසින් මිලදීගෙන ඇති අතර එම වීඩියෝ පටිගත කිරීම ඉංජිනේරු පීඨයේ පරිඝනක ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදි.<br><br>අදාළ තැටි හුවමාරුකිරීමේ පහසුව සඳහා කිසිදු අමතර ප්‍රතිලාභයක් නොමැතිව හුදෙක්ම සහයෝගයක් පිණිස මෙම ඒකකය විසින් ගබඩාකර විටින් විට කොටස් වශයෙන් අදාල අංශ වෙත භාරදීම සිදුකරන ලදි. විගණනය සිදුවන අවස්ථාවේද එම කාර්යය සිදුවෙමින් පැවතුණු අතර අදාළ අංශ වල ඉල්ලුම පරිදි පමණක් DVD තැටි නිකුත් කරන ලදි. ඉතිරි DVD තැටි ප්‍රමාණය නැවත ශිෂ්‍ය සේවා අංශය වෙත භාරදීමට කටයුතු කරන ලදි. |
| (ඈ) | **1301441301 - රු. 62,500.00**<br><br>මෙම මුදල මේ වන විට අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා වියදම් කර ඇත.<br><br>**13-01-04-13-02 - අතුල සමරකෝන් මහතා (RG/2013/06/A) - රු. 347,000.00**<br><br>දැනට මෙම මුදලින් රු. 99,758.40 වියදම් කර ඇත. දැනට පර්යේෂණ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වමි.<br><br>**13-24-14-13-02 - රු. 1,000,000.00**<br><br>ඉහත සඳහන් ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත්තේ තාක්ෂණ පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යාංශය විසිනි. ඒ අනුව ව්‍යාපෘතියට අදාල ගිවිසුම 2013 ජූලි මාසයේ අත්සන් කොට පළමු අදියරය වෙනුවෙන් 2013.10.15 වන දින රු. 1,000,000.00 ක ප්‍රතිපාදන ලබා දී ඇත. එය එදිනට ගිණුම් ගත කර ඇත. ඉන්පසු මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ස්ථාවර වත්කම් මිලදී ගැනීමට නියමිතව තිබූ අතර එම උපකරණ දේශීය වෙළඳපලේ නොතිබූ හෙයින් විදේශයෙන් ආනයනය කිරීමට සිදුවිය. එමෙන්ම 2013 ප්‍රතිපාදන මුදල එම උපකරණ මිලදී ගැනීමට ප්‍රමාණවත් නොවුනි. එම නිසා ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කර ඇත්තේ 2014 වර්ෂයේ මුල් මාසයේ සිටය. එබැවින් 2013 වර්ෂයේ අගදී ලැබුනු එම මුදල 2013 වර්ෂයේ අවසාන ශේෂය වශයෙන් පෙන්වීමට සිදුවී ඇත. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් නොවන බැවින්, තව දුරටත් ඉදිරියට ක්‍රියාත්මකව පවතී.<br><br>1301111301 - 34,700<br>1301111302 - 50,000<br>1301111303 - 35,000<br>1301111304 - 50,000<br>1301111305 - 122,500<br>1301111306 - 400,000<br><br>සමාලෝචිත වර්ෂයේදී පර්යේෂකයන්ට ඉහත පර්යේෂණ කටයුතු වෙනුවෙන් අදාල මුදල් ලැබුණේ 2013 සැප්තැම්බර් 30 දිනටය. මෙනිසා එම පර්යේෂණ කටයුතු 2013-12-31 දිනට නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. ආචාර්යවරුන් ශිෂ්‍ය ඉගැන්වීමේ කටයුතු සමඟ එම පර්යේෂණ කටයුතු කිරීමට සිදුවී ඇති බැවින් වර්ෂයේ මාස 3 ක් වැනි සුළු කාලයකදී ඔවුනට ඒවායේ නිරතවීමට නොහැකි වී තිබුණි.අදාල පර්යේෂණ කටයුතු මේවන විට සිදුකරමින් පවතී. |

| 4.7 | හඳුනාගන්නා ලද අඩුපාඩු |
|---|---|
| (අ) | |

**2011 වර්ෂය**

| | ඇස්තමේන්තුව | රක්ෂණ සංස්ථාවෙන් ලැබුනු මුදල | අළුත්වැඩියාව සඳහා වූ වියදම | අලාභය |
|---|---|---|---|---|
| VU 9946 | රු. 10,350/- | රු. 8,000/- | රු.8,000/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 77-0547 | රු. 78.100/- | - | රු.36,813/- | රු. 36,813/-<br>පරීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව අලාභය පිළිබඳව සඳහන් කර නොමැති බැවින් තවදුරටත් විමර්ශනය කොට අලාභය අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| 62-3555 | රු. 59,500/- | රු. 38,110/- | රු.38,110/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 22-6134 | රු. 50,960/- | රු. 40,404/- | රු.50,960/- | රු. 10,556/-<br>පරීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව අලාභය පිළිබඳව සඳහන් කර නොමැති බැවින් තවදුරටත් විමර්ශනය කොට අලාභය අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| PB-5574 | රු. 651,452/- | රු. 473,187/- | රු.473,187/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| PA-2531 | රු. 28,000/- | රු. 20,500/- | රු.20,500/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| KC-8280 | රු. 162,512/- | රු. 130,759/- | රු.130,759/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| GF-7069 | රු. 85,960/- | රු. 73,757.50 | රු.73,757.50 | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| CPUV-0316 | රු. 12,650/- | රු. 10,650/- | රු.10,650/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 30-9472 | රු. 29,550/- | රු. 25,365/- | රු.25,365/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| CPNA -2531 | රු. 47,305/- | රු. 39,778/- | රු.46,705.60 | රු.6,926.85<br>මෙය අදාල බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් දියත් කර ඇත. |
| 65-6451 | රු.100,329/- | රු.80,837.50 | රු.80,837.50 | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| CPVV -0316 | රු.10,350/- | රු.8,000/- | රු.8,000/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| **එකතුව** | | | | **රු.54,295.85** |

| 2012 වර්ෂය | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු මුදල | ගෙවූ මුදල | අලාභය |
| 62-3650 | රු. 13,500/- | බාහිර පාර්ශවයන්ගෙන් රු. 13,500/-ක් අය කරගෙන ඇත. | රු.13,500/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 58-2210 | රු. 6,900/- | රු. 4,500/- | රු. 4,500/- | කෙසේ නමුත් ඉහත අගයන්හි වෙනස අදාල රියදුරුගෙන් අය කර ඇත. |
| 40-3550 | රු. 53,000/- | රු.42,300/- | රු.42,300/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 54-3598 | රු. 121,300/- | රු. 41,125/- | රු. 41,125/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| එකතුව | | | | |

| 2013 වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|
| වාහන අංකය | අනතුරු දිනය | ඇස්තමේන්තුව | රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු මුදල | ගෙවූ මුදල | අලාභය |
| KC 8280 | 2013.02.06 | රු. 40,850/- | රු. 40,850/- බාහිර පාර්ශවයෙන් ගෙවා ඇත | රු. 40,850/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| KC 4977 | 2013.02.18 | රු. 161,900/- | රු. 127,542/- | රු. 161,396/- | රු.33,854/- බාහිර පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට දිසා අධිකරණයේ නඩු පවරා ඇත. |
| KI 8061 | 2013.03.14 | රු. 11,500/- | රු.11,500/- බාහිර පාර්ශවයෙන් ගෙවා ඇත. | රු.11,500/- | විශ්වවිද්‍යාලයට අලාභයක් සිදුවී නොමැත. |
| 32-1352 | 2014.04.10 | රු. 22,000/- | රු. 13,100/- | රු. 24,650/- | රු.11,500/- ක් රිය අනතුරට වගකිව යුතු බාහිර පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. දිසා අධිකරණයේ නඩු පවරා ඇත. |
| LW 0638 | 2013.04.23 | රු.33,000/- | රු.32,000/- | රු.33,000/- | රු.1,000/- ක අලාභය රියදුරුගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| 16-6360 | 2013.06.13 | රු.250,000/- | රු.146,020/- අත්තිකාරම් ලෙස රක්ෂණ සංස්ථාවෙන් | - | අළුත්වැඩියා කෙරෙමින් පවතී |
| එකතුව | | | | | **රු.46,354/-** |

| | |
|---|---|
| (ආ) | ඉංජිනේරු පීඨයට අයත් CPKC 4977 දරණ වාහනයට 2013 පෙබරවාරි 08 දින සිදුවූ අනතුරෙන් වූ හානි ඇස්තමේන්තුව අළුත්වැඩියාවට වැයවූ මුළු මුදල රු. 161,396.00 කි. ඉන් රක්ෂණ සංස්ථාවෙන් ලද මුදල රු. 1 27,542.00 කි. ඉතිරි හිඟ මුදල වූ රු. 33,854.00 පොලිස් රථවාහන අංශය විසින් වරදකරු ලෙස නම් කර ඇති ඩී.එම්.කේ.බී. සෙනෙවිරත්න යන අයගෙන් අයකර ගැනීමට දිසා අධිකරණයේ නඩු පවරා ඇත. |
| (ඇ) | පරිගණක හා උපාංග භෞතික පරීක්ෂාවේ දී හඳුනාගෙන ඇති ඌනතාවයක් හා අතිරික්තයන් නිවැරදි නොවන අතර මෙය ගණන් කිරීමේදී සිදු වී ඇති දෝෂයකි. භෞතික තොග නැවත ගණන් කිරීමෙන් පසුව ශේෂයන්හි දෝෂයක් නොවන බව අනාවරණය විය. ඒ අනුව ශේෂ නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධනයන්ට යටත්ව විශ්වවිද්‍යාල කොමිෂන් සභා බලතල අනුව කලින් කල නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව විශ්වවිද්‍යාල කටයුතු කල යුතුය.<br><br>ඒ අනුව, 2011 අප්‍රේල් මස 28 දින නිකුත් කල විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර 955 හි 3 වන පරිච්ඡේදයට අනුකූලව අධ්‍යයන දීමනාව විශ්වවිද්‍යාල අර්ථසාධක ගණනය හා සේවක භාරකාර අරමුදල් ගණනය සඳහා පාදක කර නොගන්නා ලෙස දන්වා ඇත. එකී විධිවිධාන වලට අනුව එවකට විශ්වවිද්‍යාලය කටයුතු කල අතර 2013 ජනවාරි මස 08 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම නිකුත් කල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1000 හි 4 වන පරිච්ඡේදයට අනුකූලව එකී අධ්‍යයන දීමනාව, සේවක අර්ථසාධක හා සේවක අරමුදල් ගණනය සඳහා පාදක කර ගතයුතු බවට උපදෙස් ලබා දී ඇත. එකී උපදෙස් වලට අනුව විශ්වවිද්‍යාල කටයුතු කර ඇත.<br><br>මෙම ගණනය කිරීම් සියල්ල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ චක්‍රලේඛ උපදෙස් අනුව කල ඒවා නිසා මෙසේ විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් වූ බව විමසුමේ සඳහන් වීම පිලිගත නොහැක. එය විශ්වවිද්‍යාලය දැරිය යුතු වියදමක් බව තව දුරටත් දන්වා සිටින අතර විශ්වවිද්‍යාලය සේවක අර්ථසාධක, සේවක භාරකාර සහ විශ්‍රාම වැටුප් යන ගණනය කිරීම් සියල්ල නිවැරදිව කර ඇත.<br><br>තවද මෙම ගෙවීම සම්බන්ධව අප විශ්වවිද්‍යාලයට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා චක්‍රලේඛ උපදෙස් පිළිපැදීම හැර වෙනත් විකල්පයක් නොමැති බව පෙන්වා දෙමු. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා චක්‍රලේඛ අංක 1000 හි යම් දෝෂයක් ඇත්නම් එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවෙන් ප්‍රශ්ණ කිරීම වඩාත් උචිත බව වැඩිදුරටත් දන්වමි.<br><br>එමෙන්ම ඉහත සඳහන් පරිදි විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලයට අධ්‍යයන දීමනා මත සේවක අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් අරමුදල් හා සේවා නියුක්තීන්ගේ භාරකාර අරමුදල් ගෙවීම් සිදුකරන බව දන්වා සිටිමි. |
| 4.8 | **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** |
| (අ) | ශාස්ත්‍ර පීඨයේ විවිධ දුෂ්කරතා ඇති පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව - CW/CON/2012/931 - විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවට විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කළමණාකරු විසින් මූලික අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති මිල ප්‍රමාණ පත්‍රයේ වටිනාකම වනුයේ රු. 2,980,006.26 ක මුදලකි. ඉන් අනතුරුව මෙම ටෙන්ඩර්පත්‍ර ඇගයීම පිණිස 2012.03.06 දාතම පැවති විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අගැයීම් කමිටුව වෙත ඉදිරිපත් කල අතර එහිදී තීරණය කර ඇත්තේ මිල ප්‍රමාණ පත්‍රයේ යම් යම් වෙනස්කම් කර නැවත ටෙන්ඩර් කැඳවන ලෙසය. ඒ අනුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අගැයීම් කමිටුවේ නිර්දේශ වලට අනුව සංශෝධිත ඇස්තමේන්තුවක් ව්‍යාපෘති කළමණාකරු විසින් නැවත ඉදිරිපත් කර ඇත. එලෙස ඉදිරිපත් කල ඇස්තමේන්තුව සහ මුල් අනුමත ඇස්තමේන්තුව අතර මිල වෙනසක් පවතින බව දන්වා සිටිමි. කෙසේ වෙතත් මේ වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇති අතර ශාස්ත්‍ර පීඨයේ ආබාධිත සිසුන් මේ වන විටත් එය පාවිච්චි කරනු ලබන බව දන්වා සිටිමි.<br><br>ශාස්ත්‍ර පීඨයේ විවිධ දුෂ්කරතා ඇති පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව රු. 1,929,716.10 මුදලකට ප්‍රදානය කර ඇති අතර එකී කොන්ත්‍රාත්තුවට අදාල අවසන් කල කාර්යයන් පමණක් සැලකිල්ලට ගෙන අවසාන බිල්පත සඳහා ගෙවා ඇත්තේ රු. 1,179,381.24 ක මුදලක් බව කාරුණිකව දන්වා සිටිමි. මෙම ව්‍යාපෘතියේ යම් යම් මිල ප්‍රමාණ පත්‍ර අයිතම ප්‍රමාණයන් වැඩි වී ඇති අතර තවත් සමහර අයිතම වල ප්‍රමාණයන් අඩු වී ඇත. ඒ අනුව විමසුම මඟින් පෙන්වා දෙනු ලබන අයිතම වල ප්‍රමාණයන් වැඩි වී ඇත. මෙම කාර්යය විශේෂිත වූ කාර්යයක් වන අතර ඒවායේ මිල ප්‍රමාණ පත්‍ර සැකසීමේදී අපේක්ෂිත කාර්යයන්ගේ යම් යම් වෙනස්කම් සිදුවීම මත මේ අයුරින් ප්‍රමාණයන් වෙනස් වී ඇති බවත් ටෙන්ඩර් ප්‍රදානය කරන ලද මුදලට වඩා අඩු මුදලක් වැය වී ඇති බවත් වැඩිදුරටත් දන්වමි. |

| | |
|---|---|
| **(ආ)** | ඇගයීම් කමිටුව කරනු ලබන සියළු කාර්යයන් මූලධන අංශයෙන් සිදුකර නොමැති අතර අදාල මිල ලැයිස්තු පත්‍ර සැකසීම පමණක් මූලධන අංශයෙන් සිදුකර ඇත. කෙසේ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තිය ප්‍රකාරව එවැන්නක් අනුගමනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ විවෘත කරන ලද ටෙන්ඩර්පත්‍ර වැඩ ඉංජිනේරු වෙත යැවීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.<br><br>එසේ වුවත් වර්තමානයේ 6.3.3 වගන්තිය ප්‍රකාරව නිවැරදිව විවෘත කරන ලද ටෙන්ඩර්පත්‍ර ඇගයීම් කමිටුවේ සභාපති වෙත යැවීමට කටයුතු කර ඇත. |
| **(ඇ)** | මෙම ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 2.9 යැයි සඳහන් කර ඇතත් මෙහි වටිනාකම රුපියල් මිලියන 07 ක් ලෙස නිවැරැදි විය යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අත්පොතේ 4.2.2 ප්‍රකාරව මිලියන 05 ට වැඩි ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් කාලය සති 30 ක් දක්වා දක්වා ලබාදිය හැකිය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සති 24 ක් ලබාදීම කිසිසේත්ම මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව ක්‍රියා කිරීමක් නොවේ.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයෙන් ක්‍රියාත්මක වූ අදාල කොන්ත්‍රාත් කටයුතු කිරීමේදී කාලගුණ තත්වයේ හානිය අවම කර ගැනීම සඳහා දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. අදාල කොන්ත්‍රාත්තුවේ ජලනල එලීම් කටයුතු වලදී මාර්ගය හරහා ජලනල එලීමට සිදුවූ අතර ඒ සඳහා ආයතන කිහිපයකින් අවසර ගැනීමට සිදුවිය. තවද, මහා මාර්ගයේ කැනීම් (ජලනල එලීම සඳහා) කටයුතු වලදී මාර්ගය භාවිත කරන්නන් හට අපහසුතාවයකින් තොරව මාර්ගය යාබදව කටයුතු කිරීමට සිදුවිය. මෙම කරුණු මත අදාල කොන්ත්‍රාත්තුව සඳහා වැඩි කාලයක් ගතවිය.<br><br>මෙම කාර්යය රාජ්‍යය ආයතනයක් වන ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහණ මණ්ඩලය වෙත ප්‍රදානය කර ඇත. ඒ අනුව එකී ආයතනය විසින් කාර්යය ආරම්භ කිරීමට ප්‍රථම මුලු කොන්ත්‍රාත් වටිනාකම ගෙවන ලෙසට ඉල්ලීම් කර තිබුනි. එම ඉල්ලීම සලකා බැලූ විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුව ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව මුලු වටිනාකමෙන් සියයට 60 ගෙවීමට කටයුතු කර ඇත.<br><br>2013/09/11 වන විට සමස්ථ කාර්යයෙන් 65% ක් අවසන් කර ඇති බව ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය විසින් පවසා ඇති අතර ඒ මත ඔවුනගේ ඉතිරි මුදල්ද නිදහස් කරන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව පෙනී යනුයේ විමසුම මගින් පෙන්වා දී ඇති පරිදි ගෙවා ඇති මුදල නිශ්කාර්ය වියදමක් නොවන බවයි.<br><br>මෙවැනි කොන්ත්‍රාත් කාර්යයන්හි කානු කැපීම සහ බට එලීම එකම මොහොතේ සිදුකල යුතු යයි නියමයක් නොපවතී. යම් මොහොතක කානු කපා ඉන් අනතුරුව බට එලනු ලබයි. විමසුමේ සඳහන් පරිදි කානු කපා ඇති මීටර් 900 ප්‍රමාණය සඳහාද බට එලනු ඇත. මේ වන විට අදාල ව්‍යාපෘතියේ සියලු කාණු කැපීම් සහ බට එලීමේ කටයුතු අවසන් කර ඇත. මේ සඳහා ගෙවීම් කිරීමේදී මෙම තත්වයන් පරික්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් නිර්දේශ කිරීමට කටයුතු කරනු ඇත. |
| **(ඈ)** | මෙම කර්මාන්තයේ වැඩ කෙරීගෙන යන අවස්ථාවේදී හදිසියේ ඇතිවූ වර්ෂාපතනය හේතුවෙන් කර්මාන්තය සඳහා යොදන ලද කොන්ක්‍රීට් සේදීයාමට ලක්විය. ඉතා විශාල වශයෙන් මෙම කාණු පද්ධතියේ වැසි ජලය ගලාගොස් තිබීම නිසා මෙම හානිය සිදුවී තිබුණි. නමුත් පසුව වර්ෂාව නිසා සේදී ගොස් තිබූ කොන්ක්‍රීට් කොටස් කඩා ඉවත්කර කිසිදු අතිරේක වියදමකින් තොරව නැවත කොන්ක්‍රීට් යොදා නිසි ප්‍රමිතියකට අනුව කර්මාන්තය නිමකර ඇත. |
| **(ඉ)** | ඇස්තමේන්තුවක් සැකසීමේදී සමහර අයිතම සඳහා අනුමාන විනිශ්චය මත ප්‍රමාණ සමීක්ෂණය කලයුතු අවස්ථා පවතී. ඇස්තමේන්තු ගත මුදලට වඩා කරන ලද කාර්ය ප්‍රමාණය අඩුවීමට මෙම කරුණ හේතු වේ. දැලෙහි ඝනකම ගේජ් 12 නොව ගේජ් 10 වේ. එම වැටෙහි උස අඩි 11 නොව අඩි 5 ක් වේ. වැඩ විෂය අංක 12 සඳහා ඇස්තමේන්තු ගත වියදම රු. 250,000.00 ක මුදල ප්‍රමාණ පත්‍රයේ සඳහන්ව ඇත්තේ මිණුම් කර ගෙවීම් පදනම මත නොව අනුමාන කුට්ටි මුදලක් වශයෙනි. (provisional Sum) මෙහිදී අදාල වෙළඳපල බිල්පත් සහිතව කාර්ය සඳහා මිල පත්‍රයක් ඉදිරිපත් කලවිට තාක්ෂණ කමිටුවේ අනුමැතිය පරිදි ගෙවීම් කටයුතු කරනු ලබයි. මෙම ගෙවීම් කර ඇත්තේ තාක්ෂණ කමිටුවේ අනුමැතිය පරිදි වේ. ඇස්තමේන්තුවක් සැකසීමේදී සමහර අයිතම සඳහා අනුමාන විනිෂ්චය මත ප්‍රමාණ සමීක්ෂණය කලයුතු අවස්ථා පවති. ඇස්තමේන්තු ගත මුදලට වඩා කරන ලද කාර්ය ප්‍රමාණය අඩුවීමට හේතුව ඉහත කරුණ වේ.<br><br>වැඩ අංක 01 යටතේ සඳහන් ව ඇත්තේ බැම්ම කඩා වැට්මෙන් අනතුරුව ඉවත් කලයුතුව තිබු පස් ප්‍රමාණයයි.<br>වැඩ අංක 02 යටතේ ඇත්තේ බැම්මේ දුර්වල ලෙස රැඳි තිබුණු ඉවත් කල යුතු ගල් හා පස් ප්‍රමාණයයි.<br>වැඩ අංක 03 යටතේ ඇත්තේ නව ගල් බැම්ම සඳහා පාදම සකස් කිරීමේදී ඉවත් කල යුතු පස් ප්‍රමාණයයි.<br>වැඩ අංක 05 යටතේ ඇත්තේ ගල් බැම්මේ පරිමාවයි.<br>වැඩ අංක 09 යටතේ සඳහන් ව ඇත්තේ පිටතින් පස් ගෙනවිත් බැම්මට ඇතුල් පැත්තෙන් පිරවිය යුතු පරිමාවයි.<br>එබැවින් උක්ත වැඩ අංක 01, 02 සහ 03 යටතේ සඳහන් පස් හා ගල් පරිමාවේ ඓක්‍ය හා වැඩ අංක 05 සහ 09 යටතේ |

| | |
|---|---|
| | සඳහන් ගල් හා පස් පරිමාවේ ඓක්‍ය අතර සම්බන්ධතාවයක් නොමැත. |
| (ඊ) | පශු වෛද්‍ය පීඨ ශික්ෂණ සත්ත්ව ගොවිපලේ කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් බඳවා ගැනීමේ දී විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලගණන් කැඳවා විශ්වවිද්‍යාලයේ නීති රීති වලට අනුව විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව 2015 වර්ෂය සඳහා කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. එසේම ඉහත ප්‍රසම්පාදන සීමාව පනවා ඇත්තේ 1990 මුදල් කමිටු තීරණයක් අනුවය. පසුව 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව එම සීමාව මිලියන 05 දක්වා වැඩිකර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලය නිවැරදි ලෙස ක්‍රියාකර ඇත. |
| (උ) | මෙහි සඳහන් ව්‍යාපෘති 06 පහත සඳහන් ඒවා වන අතර එහි විස්තර පහත අයුරු වේ.<br><br>1. CW/CON/2012/885<br>මෙම කාර්යය 2013.04.06 දාතම අවසන් කර ඇත.<br><br>2. CW/CON/2012/931<br>මෙම කාර්යය 2013.04.30 දාතම අවසන් කර ඇත.<br><br>3. CW/CON/2012/932<br>මෙම කාර්යය 2013.01.15 දාතම අවසන් කර ඇත.<br><br>4. CW/CON/2012/933<br>මෙම කාර්යය 2013.02.28 දාතම අවසන් කර ඇත.<br><br>5. CW/CON/2012/934<br>මෙම කාර්යය මේ වන විට අවසන් කර ඇත.<br><br>6. CW/CON/2012/937<br>මෙම කාර්යය 2013.05.16 දාතම අවසන් කර ඇත. |
| (ඌ) | මෙම විමසුම මඟින් කරුණු විමසා ඇත්තේ වසර 10 කට වඩා පැරණි ව්‍යාපෘති 43 ක් පිලිබඳවයි. ඒ අනුව විමසුමෙන් කරුණු විමසා ඇති එම ව්‍යාපෘති පිලිබඳව විස්තර පහතින් දැක්වේ. |

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්කරු | ගෙවා ඇති මුදල | වර්ථමාන තත්වය |
|---|---|---|---|
| SAR/CW/CON/458 | ගීතාංජලී සප්ලයර්ස් | 1,469,278.24 | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/463 A | හයිටෙක් බිල්ඩර්ස් | | මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම මත 2002.12.11 දාතම අවසන් බිල්පත ගෙවා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | SAR/CW/CON/476 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | | මෙය දන්ත වෛද්‍ය පීඨ ආපන ශාලාව දීර්ඝ කිරීම සඳහා උපදේශණ සේවා හා ගෘහ නිර්මාණ සැලසුම් සකස් කිරීම පිණිස ලබා ගත් උපදේශණ සේවාව වන අතර මීට අදාල ගෙවීම් සිදුකර ව්‍යාපෘතිය නිම කර ඇත. | |
| | SAR/CW/CON/492 | ගුණතිලක ඇසෝසියේට්ස් | | මෙය කම්කරු ශ්‍රමය සැපයීම ස4හා වන ව්‍යාපෘතියක් වන අතර 2002.02.21 දින අවසාන බිල්පත ගෙවා ව්‍යාපෘතිය නිමකර ඇත. | |
| | SAR/CW/CON/495 | ගනේගෙදර බිල්ඩර්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම  ව්‍යාපෘතියේ කටයතු 2007.05.27 දාතම අවසන් කර ඇත. | |
| | SAR/CW/CON/505 | පර්නි ඩයිනමික් ඉංජිනියරින් | | මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර අවසාන බිල්පත 2003.12.31 දින ගෙවා ව්‍යාපෘතිය අවසන් කර ඇත. | |
| | SAR/CW/CON/514 | චාන්ස් ඉංජිනියරින් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම  ව්‍යාපෘතියේ කටයතු 2007.05.27 දාතම අවසන් කර ඇත. | |
| | SAR/CW/CON/520 | දීප්ත කන්ට්‍රැක්ටර් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම  ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. | |
| | SAR/CW/CON/522 | ලකී කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම  ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| | SAR/CW/CON/534 | ගුණතිලක ඇසෝසියේට්ස් | | මෙම ව්‍යාපෘතිය කම්කරු ශ්‍රමය සැපයීම සඳහා වන කාර්යයක් වන අතර වැඩ කටයුතු අවසන් කර අවසාන බිල්පත 2002.11.22 දින ගෙවා ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| | SAR/CW/CON/536 | සිවිල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| | SAR/CW/CON/546 | එස්. එම්. එන්. කන්ස්ට්‍රක්ෂන්ස් | | ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශ මත විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව පාලක සභාව විසින් මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට තීරණය කර ඇත. |
| | SAR/CW/CON/549 | සිවිල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| | SAR/CW/CON/552 | නෙත්තිකුමාර කන්ස්ට්‍රක්ෂන්ස් | 1,781,611.65 | මෙකී කොන්ත්‍රාත්තුව රු. 2,499,000.00 කට නෙත්තිකුමාර කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනයට ප්‍රදානය කර තිබූ අතර එකී කාර්යයන් සඳහා අධ්‍යක්ෂක/ඉංජිනේරු නිර්මාණගේ නිර්දේශය මත රු. 1,674,177.52 ක් ගෙවා ඇත. පසුව කොන්ත්‍රාත්කරුගේ අවසාන බිල්පත රු. 1,963,021.96 කට අධ්‍යක්ෂක/ඉංජිනේරු නිර්මාණ විසින් නිර්දේශ කර තිබීම මත ගෙවීම් සම්බන්ධයෙන් වූ ගැටළුවක් මත උපකුලපතිතුමා පත්කළ කමිටුවක් මගින් නිර්දේශ කර තිබුණේ ඒ වන විටත් රු. 57,596.76 ක වටිනාකමක් වැඩිපුර ගෙවා ඇති බවයි. ඒ අනුව ඒ වැඩිපුර ගෙවූ මුදල නැවත ගෙවන ලෙස දන්වා සිටීම මත කොන්ත්‍රාත්කරු විසින් දිසා අධිකරණයේ නඩු පවරන බව 2008.07.28 දින නීතිඥයකු මාර්ගයෙන් දන්වා ඇත. කෙසේ වුවත් මේ වන විට කොන්ත්‍රාත් කාර්යය අවසන් කර ඇති බැවින් 2015 වර්ෂයේ කළ වැඩ පදනම් කරගෙන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | SAR/CW/CON/564 | ඒ. ඇන්ඩ් පී. | | මෙම කාර්යයෙහි වැඩ අවසන් කර ඇතත් අවසන් බිල්පත ගෙවීම සඳහා ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | කන්ස්ට්‍රක්ෂන්ස් | | නොකිරීම මත ගෙවීම් අවසන් කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් 2015 වර්ෂයේදී කළ වැඩ පදනම් කරගෙන අදාල කොන්ත්‍රාත් කාර්ය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| SAR/CW/CON/569 | මන්චනායක කන්ස්ට්‍රක්සන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/571 | චාන්ස් ඉංජිනියරින් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/583 | පයනියර් කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/585 | ඩෙල්මේජ් ඉන්ටිරියර් | | මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර අවසාන බිල්පත 2004.08.09 දින ගෙවා ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| SAR/CW/CON/589 | පර්නි ඩයිනමික් ඉංජිනියරින් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/598 | නෙත්තිකුමාර කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙම ව්‍යාපෘතියේ එතෙක් කරන ලද වැඩ කටයුතු සලකා අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද බිල්පත අවසාන බිල්පත සේ සලකා වැඩ ඉංජිනේරුගේ නිර්දේශ මත සහ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවේ නිර්දේශ ප්‍රකාරව |

| | | | |
|---|---|---|---|
| | | | සහ පාලක සභාවේ අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු 2007.05.27 දාතම අවසන් කර ඇත. |
| SAR/CW/CON/604 | චාන්ස් ඉංජිනියරින් | | ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශ මත ගෙවා ඇති බිල්පත අවසාන බිල්පත සේ සලකා 2011.06.29 දාතම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත. |
| SAR/CW/CON/613 | දීප්ත කන්ස්ට්‍රක්ෂන්ස් | | මෙය කම්කරු ශ්‍රමය සැපයීම සඳහා වන ව්‍යාපෘතියක් වන අතර 2004.06.21 දින අවසාන බිල්පත ගෙවා ව්‍යාපෘතිය නිමකර ඇත. |
| CW/CON/2005/656 | ආර්කෝ පුද්ගලික සමාගම | - | මෙම කෘෂි ඉංජිනේරු අංශ ගොඩනැගිල්ල ඉදිකිරීම කාර්යයේ උපදේශන සේවා සැපයිම වෙනුවෙන් කරන ලද ප්‍රදානයක් වන අතර එහි කාර්යයන් අවසන් කර ඇත. |
| CW/CON/2005/658 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | | මෙය කෘෂි විද්‍යා පීඨයේ ආහාර විද්‍යා අංශයේ රසායනාගාරය ඉදිකිරීම සඳහා වන උපදේශන සේවවාවන් ලබා ගැනිම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් වන අතර එය අවසන් කර තිබීම මත ඉදිකිරීම් කොන්ත්‍රාත් ව්‍යාපෘතියේ කටයුතුද අවසන් වෙමින් පවතී. |
| CW/CON/2005/661A | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | | මෙය ඉංජිනේරු පීඨයේ ප්‍රධාන සැලැස්ම සැකසීම වෙනුවන් වන උපදේශන සේවා සැපයීමක් වන අතර එය අවසාන කිරීම මත 2007.06.27 දින අවසාන බිල්පත ගෙවා ඇත. |
| CW/CON/2005/662 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | | මෙය වෛද්‍ය පීඨයේ පාරා රසායනික ගොඩනැගිල්ල ඉදි කිරීමේ කාර්යයේ උපදේශන සේවා ලබාගැනීම සඳහා වන කාර්යයක් වන අතර මෙම කාර්යය අවසන් කිරීම මත මෙහි ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයේ පලමු අදියර අවසන් කර ඇති අතර දෙවන අදියරේ කටයුතුද අවසන් කරමින් පවතී. |
| CW/CON/2005/665 | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය | | මෙය කලා පීඨයේ පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශන සේවාවන් ලබා ගැනිම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් වන අතර එය අවසන් කිරීම මත එහි ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයද අවසන් කර ඇත. |
| CW/CON/2005/672 | රෝලර් මාස්ටර් | | කාර්යය අවසාන කිරීම මත 2007.08.24 දාතම අවසාන බිල්පත ගෙවීම සිදුකර ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| CW/CON/2005/682 | සෙනවිරත්න එන්ටප්‍රයිසස් | | කාර්යය අවසාන කිරීම මත 2006.03.07 දාතම අවසාන බිල්පත ගෙවීම සිදුකර ව්‍යාපෘතිය අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | CW/CON/2005/687 | ඇක්වා ටෙන්නොලොජි | | කාර්යය අවසාන කිරීම මත 2006.02.10 දාතම අවසාන බිල්පත ගෙවීම සිදුකර ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| | CW/CON/2005/700 | පාම්හිල් කන්සට්‍රක්ෂන්ස් | | මෙය ශ්‍රමය සැපයීම සඳහා වූ කාර්යයක් වන අතර රු. 138,000.00 මුදලකට ප්‍රදානය කර ඇති අතර එකී මුදල ගෙවීම් කර කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2005/702 | වීරක්කොඩි ඇසෝසියේට්ස් | | මෙය කම්කරු ශ්‍රමය සැපයීම සඳහා වන කාර්යයක් වන අතර අදාල කම්කරු ශ්‍රමය ලබාගැනීමෙන් අනතුරුව මෙම කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2005/743 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | මෙය සම සෞඛ්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම කාර්යයේ උපදේශණ සේවා සැපයීම සඳහා වන කාර්යයක් වන අතර අදාල මුදලෙන් 50% ක මුදලක් ගෙවා ඇති අතර සියලු කොන්ත්‍රාත් කාර්යයන් නිම වූ පසු ඉතිරි අර්ධය ගෙවීමට කටයුතු කරනු ඇත. |
| | CW/CON/2008/744 | සෙනවිරත්න එන්ටප්‍රයිසස් | | මෙය කම්කරු ශ්‍රමය සැපයීම සඳහා වන කාර්යයක් වන අතර අදාල කම්කරු ශ්‍රමය ලබාගැනීමෙන් අනතුරුව මෙම කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2008/745 | මධ්‍යම ඉංජිනෙරු උපදේශණ කාර්යාංශය | | මෙම කාර්ය අවසාන කිරීම මත 2011.05.10 දාතම අවසාන බිල්පත ගෙවා ව්‍යාපෘතිය අවසාන කර ඇත. |
| | CW/CON/2008/746 | ඩෙනන් ඉංජිනියරින් | | මෙය කුලි පදනම මත යන්ත්‍ර ලබා ගැනීම සඳහා වන කාර්යයක් වන අතර අදාල සේවාව ලබා ගැනීමෙන් අනතුරුව යන්ත්‍ර පැය ගණන සඳහා වන ගෙවීම සිදුකර කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2007/761 | මධ්‍යම ඉංජිනෙරු උපදේශණ කාර්යාංශය | | මෙය උපදේශන සේවා කාර්යයක් වන අතර අදාල සේවාව ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් සිදුකර කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2008/763 | සෙනවිරත්න එන්ටප්‍රයිසස් | | මෙය කම්කරු ශ්‍රමය සැපයීම සඳහා වන කාර්යයක් වන අතර මෙහි අවසාන බිල්පත 2008.10.13 දාතම ගෙවා කාර්යය අවසාන කර ඇත. |
| | CW/CON/2008/777A | මධ්‍යම ඉංජිනේරු උපදේශණ කාර්යාංශය | | මෙය උපදේශන සේවා කාර්යයක් වන අතර අදාල සේවාව ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම් සිදුකර කාර්යය අවසන් කර ඇත. |
| | CW/CON/2010/786 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | කැබිනට් අනුමැතිය ලද ව්‍යාපෘතියක් වෙනුවෙන් සමෝච්ච රේඛා සිතියමක් ඇඳීම වෙනුවෙන් කරන ලද රු. 34,020.00 ක ගෙවීමකි. අදාල කාර්යය අවසන් කර ඇත. |

<table>
<tr><td></td><td>
<table>
<tr><td>CW/CON/2008/791</td><td>අජිත් කන්ස්ට්‍රක්ෂන්ස්</td><td></td><td>නියමිත පරිදි ඇලුමිනියම් සවිකිරීම සම්බන්ධයෙන් තත්ත්ව සහතික ලබාගත යුතු වුවත් එසේ නොකිරීම හා නියමිත ප්‍රමිතියට අනුව ප්‍රමාණ පත්‍රයන්හි සඳහන් පිරිවිතරයන්ට අනුකූල නොවීම මත අභ්‍යන්තර විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි නොකිරීම හේතුවෙන් ගෙවීම් අත්හිටුවා ඇත.</td></tr>
</table>
</td></tr>
<tr><td>(එ)</td><td>රාමනාදන් ශාලාවේ තීන්ත ආලේප කිරීම<br><br>මෙම කොන්ත්‍රාත් කාර්යයේ අවම මිලගණන් ඉදිරිපත් කර තිබූ කේ. එච්. පී. එන්ටප්‍රයිසස් ආයතනය විසින් සමාන ව්‍යාපෘති ඉදිරිපත් කර නොතිබීම (Similar Projects), වාර්ෂික පිරිවැටුම ඉදිරිපත් කර නොතිබීම (Annual Turn Over) මූල්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම යන හේතු මත ප්‍රතික්ෂේප කර ඇත. විමසුම මගින් අඩුම මිල ගණන් ඉදිරිපත් කල ආයතනය ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වා නොමැති බව ප්‍රකාශ කර ඇතත් තාක්ෂණ අගැයීම් කමිටු වාර්තාවේ එයට හේතු දක්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.</td></tr>
<tr><td>(ඒ)</td><td>මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලීය පාලක සභාව විසින් කමිටුවක් පත්කර නිර්දේශ ලබාගෙන 410 වන පාලක සභාවේ 410.3.1.8 මගින්, ඉහත කොන්ත්‍රාත් කාර්යය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට කිසිදු අලාභයක් සිදුවී නොමැති බවත් එවැනි සිදුවීම් නැවත සිදුනොවීමට සුදුසු ක්‍රමවේදයක් සකස්කරන ලෙසත් නිර්දේශ කර ඇත. එසේම මෙම පාලක සභා තීරණය, විගණකාධිපති වෙත පිළිතුරක් ලෙස ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇත.</td></tr>
<tr><td>(ඔ)</td><td>මහඉලුප්පල්ලම උප විශ්වවිද්‍යාලයේ පුනරුත්ථාපනය කිරීමේ කාර්යය 2005.04.10 දාතම අවසන් කර ඇත. නමුත් මෙම කාර්යයට අදාල අමතර වැඩ සඳහා ගෙවීම් අනුමත නොවීම මත අවසාන බිල්පත සඳහා ගෙවීම් කර නොමැති බව කාරුණිකව දන්වා සිටින අතර ඒ මත මෙම කාර්යය අවසන් වී නොමැති සේ පෙන්නුම් කර ඇත. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතිය නිසියාකාරව අවසන් කර ඇත.</td></tr>
<tr><td>(ඕ)</td><td>මාර්ස් ශාලාවේ වැසිකිළි අලුත්වැඩියා කිරීමේ කටයුතු 2013.10.10 දින අවසන් කර ඇත. ඒ අනුව නියමිත කාලයට මෙම කොන්ත්‍රාත් කාර්යය අවසන් නොකිරීම මත උපරිම ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත.</td></tr>
</table>

**(ක)** එකී කාර්යයන්ගේ වර්ථමාන තත්ත්වය පහත අයුරු වේ.

| | කාර්යය | වර්ථමාන තත්වය |
|---|---|---|
| 01 | මාර්ස් ශාලාවේ නාන කාමර අලුත්වැඩියා කිරීම CW/CON/2011/908 | වැඩ ඉංජිනේරු නිර්දේශය හා කාර්යය අවසන් කිරීම මත උපරිම ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර අවසාන බිල්පත ගෙවා ඇත. |
| 02 | සත්ව විද්‍යා අංශයේ සිමෙන්ති ටැංකි ඉදි කිරීම CW/CON/2012/945 | වැඩ ඉංජිනේරු නිර්දේශය හා කාර්යය අවසන් කිරීම මත උපරිම ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර අවසාන බිල්පත ගෙවා ඇත. |
| 03 | වෛද්‍ය පීඨයේ දේශන ශාලා නවීකරණය කිරීම CW/CON/2012/940 | කාර්යය අවසන් කිරීම හා වැඩ ඉංජිනේරු නිර්දේශය අවසාන මත බිල්පත ගෙවා ඇති අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. |
| 04 | අක්බාර් නෙල් ශාලාව පිටුපස වැට ඉදි කිරීම<br><br>CW/CON/2013/957 | කාර්යය අවසන් කිරීම හා වැඩ ඉංජිනේරු නිර්දේශය අවසාන මත බිල්පත ගෙවා ඇති අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. |
| 05 | කාර්යය අවසන් කිරීම මත අවසාන බිල්පත ගෙවා ඇති අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. | කාර්යය අවසන් කිරීම හා වැඩ ඉංජිනේරු නිර්දේශය අවසාන මත බිල්පත ගෙවා ඇති අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. |

**(කා)** මෙම කාර්යයේ විශ්වවිද්‍යාල ඇස්තමේන්තුව වනුයේ රු. 1,752,750.00 ක මුදලකි. විමසුමේ සඳහන් පරිදි රු. 959,400.00 ක මුදලකට මෙම කාර්යය ප්‍රදානය කර නොමැත. කාර්යය ප්‍රදානය කර ඇත්තේ රු. 1,476,000.00 ක මුදලකටය. ඒ අනුව මෙම දෙක අතර පරතරය වනුයේ රු. 276,750.00 ක මුදලකි. එය 15.78% ක අනුපාතයක් වන අතර විමසුමේ සඳහන් ලෙස රු. 793,350.00 ක මුදල් පරතරයක් නොමැති බව දන්වා සිටිමි.

**(කැ)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංගහයේ 7.9.2 ප්‍රකාරව මිලෙහි ගණිතමය දෝෂ නිවැරදි පරිදි ගණනය කර ටෙන්ඩර් ප්‍රදානය කළ යුතු බැවින් ඒ අනුව ගිවිසුමට එළඹී ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලය ගෙන ඇති ක්‍රියාමාර්ගය නිවැරදි වේ.

**(කෑ)** සිවිල් ඉංජිනේරු වැඩබිම වායුසමීකරණ සපයා සවිකිරීමේ කාර්යයට අදාලව 2012.12.04 දින පැවති තාක්ෂණ අගැයීම් කමිටුව තීරණය කර ඇත්තේ මුලින් ඉල්ලුම් කර තිබූ වායු සමීකරණ ධාරිතාව අදාල පරිශ්‍රය සඳහා ප්‍රමාණවත් නොවන බවයි. එසේම තවත් යම් යම් තාක්ෂණික අඩුපාඩු ඇති බවද පෙන්වා දී ඇත. ඒ අනුව ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරයාගේ ද උපදෙස් සහිතව පිරිවිතරයන් යලි සකස්කර වැඩ ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව සකස් කරන ලද සංශෝධිත පිරිවිතරයන් යටතේ මිල ගණන් කැඳවූ අවස්ථාවේ ඉදිරිපත් වූ එකම කොන්ත්‍රාත්කරු වන ප්‍රොස්ටෙයා ආයතනය වෙත 129 වන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව මෙම කොන්ත්‍රාත් කාර්යය ප්‍රදානය කර ඇත.

**(කි)** ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සැලසුම් පරිදි ලමිනෙක්ස් ආයතනය මඟින් කොන්ත්‍රාත් පදනම මත නිමා කරන ලද ඉහත විදුලි පද්ධතියේ අළුත්වැඩියාවන් හෝ නවීකරණයන් කිරීම සඳහා අවශ්‍ය ඉහල තාක්‍ෂණ දැනුමක් වැඩ දෙපාර්තමේන්තුවේ විදුලි අංශය සතුව ඇත.

ගෘහස්ථ ක්‍රීඩා පිළිබඳ විශේෂඥ නිර්දේශ අනුව විවිධ ක්‍රීඩා සඳහා ආලෝක තීව්‍රතාවය වෙනස් වන අතර එම තීව්‍රතා මට්ටම (Lux Level) පවත්වාගෙන යා හැකි පරිදි විදුලි බුබුළු වල ධාරිතාවය වෙනස් කර තිබුණි.

මෙම විදුලි පද්ධතියට අදාල සියළුම උපාංග ශ්‍රී ලංකා වෙළඳපලෙන් මිළදී ගැනීමට ඇත. මෙම විදුලි පද්ධතිය විමසුමේ සඳහන් දෝෂය නැත. පුද්ගලයින්ගේ හා උපකරණයන්හි ආරක්‍ෂාව සලකා බලා ප්‍රමිතියෙන් කරනු ලබන විදුලි පද්ධතියක් අකුණු ගැසීම ආදී අවස්ථාවන්හිදී සිදුවන කාන්දු විදුලි ධාරා හේතුවෙන් විසන්දි වන ලෙස සකසා ඇත. නැවත දැල්වීමෙන් පසු උපරිම තීව්‍රතාවයට පත්වීමට සුළු කාලයක් ගතවේ.

මෙම කොන්ත්‍රාත්තුවට අදාල ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් පරිදි වසරක වගකීම් කාලය තුලදී අක්‍රීය හෝ දැවී යන ලද සියළුම උපාංග හා විදුලි බුබුළු කොන්ත්‍රාත් සමාගම මගින් නැවත සවිකරන ලදි.

**(කී)** මෙම කාර්යය 2008.09.03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රුපියල් මිලියන 328 ක මුලු පිරිවැය ඇස්තමේන්තුවකට 2009 වසරේ සිට ක්‍රියාත්මක කිරීම පිණිස අනුමත කර ඇත. ඒ අනුව කොන්ත්‍රාත් කාර්යය ආරම්භ කල යුතු වන්නේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මිල ප්‍රමාණ පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ අගැයීම් කමිටුවේ අනුමත වීමෙන් අනතුරුව බවත් මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඉදිකල යුතු ව්‍යාපෘතියක් බවත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. ඒ අනුව සමෝච්ච රේඛා සිතියම් සැකසීමෙන් තොරව ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු හා මිල ප්‍රමාණ පත්‍රිකා සැකසීම කල නොහැකි බැවින් උපදේශක ආයතනය ලෙස මෙම කාර්යයට අදාල සමෝච්ච රේඛා සිතියම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සකස්කර ඉදිරිපත් කර ඇත. එම සමෝච්ච රේඛා සිතියම් මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/පාලන යටතේ සුරක්ෂිතව ඇත. එම සමෝච්ච රේඛා සිතියම් ඇඳීම සිදුකල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් රු. 1,725,000.00 ක මුදලක් ඉල්ලුම් කර තිබුනි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති හෙයින් සහ උපකුලපති විසින් මේ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග කරන ලද සාකච්ඡාවේ තීරණයන්ට අනුව මෙම සමෝච්ච රේඛා සිතියම් නිසි ලෙස පිළියෙල කිරීම වෙනුවෙන් එකී ආයතනයට රු. 1,500,000.00 මුදලක් ගෙවීමට අනුමත කර ඇතත් වැය ඇස්තමේන්තුව පියවා ගැනීම පිණිස ප්‍රමාණවත් මුදලක් එනම් රු. 500,000.00 ක මුදලක් පමණක් ගෙවීමට කටයුතු කර ඇත. තවද අමාත්‍ය මණ්ඩලයේ අනුමත වූ මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලසුමටද ඇතුලත් කර ඇති අතර දැනට ක්‍රියාත්මක කිරීමට යෝජිත සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම් කටයුතු සැලසුම් කිරීම සඳහා මෙම සමෝච්ච රේඛා සිතියම බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇති බව කාරුණිකව දන්වමි.

**4.9 ප්‍රමාද වූ ව්‍යාපෘති**

මෙම විමසුම මගින් විමසා ඇත්තේ ගාමිණී ඉංජිනියරින් ආයතනය වෙත ප්‍රදානය කර ඇති ව්‍යාපෘති 04 ක් පිලිබඳව වන අතර එහි වර්ථමාන තත්වය පහත සඳහන් පරිදි වේ. එසේම පහත සඳහන් ව්‍යාපෘති වල සංචලන අත්තිකාරම් සියල්ලම අයකරගැනීමට කටයුතු කර ඇත.

| | |
|---|---|
| දන්ත වෛද්‍ය පීඨයේ දේශණ ශාලාව ඉදි කිරීම CW/CON/2013/1019 | මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර අවසාන බිල්පත මේ වන විටත් ගෙවා ඇත. |
| ඉංජිනේරු පීඨයේ ඉහල ධාරිතා රසායනාගාරය නවීකරණය කිරීම CW/CON/2013/1016 | මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර අවසාන බිල්පත මෙතෙක් ගෙවා නොමැත. කෙසේ වෙතත් සියලු සංචලන අත්තිකාරම් මුදල් මේ වන විටත් පියවාගෙන ඇත. |
| පශු වෛද්‍ය පීඨයේ පැතලොජි අංශය නවීකරණය කිරීම CW/CON/2013/997 | මෙම ව්‍යාපෘතිය අවසන් වෙමින් පවතින අතර සියලු සංචලන අත්තිකාරම් මුදල් මේ වන විටත් පියවාගෙන ඇත. |
| පශු වෛද්‍ය පීඨයේ ජෛව රසායන අංශය නවීකරණය කිරීම CW/CON/2013/998 | මෙම ව්‍යාපෘතිය අවසන් වෙමින් පවතින අතර සියලු සංචලන අත්තිකාරම් මුදල් මේ වන විටත් පියවාගෙන ඇත. |

**4.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ)** අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය විශ්වවිද්‍යාලය තුල ඉතා වැදගත් මෙන්ම වටිනා කාර්යභාරයක් ඉටු කරනු ලබන ඒකකයක් හෙයින් එම ඒකකය ප්‍රති සංවිධානය කොට නිසිපරිදි ස්ථාපනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

මීට අනුකුලව :-

- ජාල සහ සන්නිවේදන සේවා ඒකකය ප්‍රති සංවිධානය සඳහා මෙමෝ පත්‍රයක් 434 වැනි පාලක සභාවට ඉදිරිපත් කොට ඇති අතර ඒ සඳහා පාලක සභා අනුමැතිය ලැබී ඇත.

| | |
|---|---|
| | • එම තීරණයට අනුව උක්ත ඉල්ලීම NAE-E/17, 2015.01.17 දාතම ලිපියෙන් අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කර ඇති අතර ඊට පිළිතුරු වශයෙන් ඉදිරියේ පැවැත්වීමට නියමිත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු පුරප්පාඩු සමාලෝචන කමිටුව (Cadre Review Committee) සඳහා යොමුකරන මෙන් දන්වා 12.02.2014 දින UGC/HR/09/01/151 දරණ ලිපියෙන් දන්වා ඇත. ඒ අනුව ඉහත ක්‍රියාදාමය හරහා ජාල සහ සන්නිවේදන ඒකකය ස්ථාපනය කිරීමට කාර්යමණ්ඩලය බඳවා ගැනීම සඳහා නීත්‍යානුකූල අනුමැතිය ලැබෙන අතර උක්ත විගණන විමසුමෙහි දක්වා ඇති අඩුපාඩු නිවැරදි වීම සිදුවනු ඇත. |
| **(ආ)** | 2011 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමට පත් කිරීමේ අවශ්‍යතාවය මත පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කර ඇති බව දන්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/F/CE /2011 හා 2011-01-10 දිනැති ලිපියෙන් දක්වා ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2011 ජුනි 17 වන දින ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාව 2011 ජුනි 21 වන දින UGC/F/CE/TSUIL/2011 දරණ ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කර ඇති බව දන්වා ඇත. අන්තර්ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ එහි කාර්ය මණ්ඩල සංයුතිය සහ කලමනාකරණ මණ්ඩල සඳහා අනුමැතිය 2012 සැප්තැම්බර් 22 දින පැවැති 412 පාලක සභා රැස්වීමේදී අනුමැතිය ලැබී ඇති බව දන්වමි. ඒ අනුව 2012 අප්‍රේල් මාසයේ සිට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය හා එහි අධ්‍යක්ෂක (කොන්ත්‍රාත් පදනම) ක්‍රියා කරන  බව දන්වමි.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද එම ව්‍යාපෘති වාර්තාවෙහි මුල් වර්ෂය තුල සිදුකිරීමට දක්වා ඇති ව්‍යාපෘති අතරට අන්තර් ශික්ෂණ පර්යේෂණ මධ්‍යස්ථානය  "Interdisciplinary Research Centre"  ස්ථාපිත කිරීම ප්‍රධාන වශයෙන් යෝජනාකොට තිබේ. 2011 ජුනි 21 වන දින UGC/F/CE/TSUIL/2011 දරන ලිපියෙන් සමස්ථ යෝජනාවලිය අනුමත වීම හරහා පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා විධිමත් අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘති සැලැස්ම) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අරමුදලින් පාලනය වන ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ එකී සියලුම පත්කිරීම් මුදල් කමිටුවේ සහ පාලක සභා අනුමැතිය ඇතිව සිදු කර ඇත. තවද භාණ්ඩාගාරයේ හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙස දන්වමින් 2014 මාර්තු 10 වන දින UP/CMD/INRC/GENERAL/01 ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මගින් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් වෙත යවා ඇත. |
| **(ඇ)** | 2011 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමට පත් කිරීමේ අවශ්‍යතාවය මත පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කර ඇති බව දන්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/F/CE /2011 හා 2011-01-10 දිනැති ලිපියෙන් දක්වා ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2011 ජුනි 17 වන දින ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාව 2011 ජුනි 21 වන දින UGC/F/CE/TSUIL/2011 දරණ ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කර ඇති බව දන්වා ඇත. අන්තර්ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ එහි කාර්ය මණ්ඩල සංයුතිය සහ කලමනාකරණ මණ්ඩල සඳහා අනුමැතිය 2012 සැප්තැම්බර් 22 දින පැවැති 412 පාලක සභා රැස්වීමේදී අනුමැතිය ලැබී ඇති බව දන්වමි. ඒ අනුව 2012 අප්‍රේල් මාසයේ සිට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය (කොන්ත්‍රාත් පදනම) ක්‍රියා කරන  බව දන්වමි.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද එම ව්‍යාපෘති වාර්තාවෙහි මුල් වර්ෂය තුල සිදුකිරීමට දක්වා ඇති ව්‍යාපෘති අතරට අන්තර් ශික්ෂණ පර්යේෂණ මධ්‍යස්ථානය  "Interdisciplinary Research Centre"  ස්ථාපිත කිරීම ප්‍රධාන වශයෙන් යෝජනාකොට තිබේ. 2011 ජුනි 21 වන දින UGC/F/CE/TSUIL/2011 දරන ලිපියෙන් සමස්ථ යෝජනාවලිය අනුමත වීම හරහා පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා විධිමත් අනුමැතිය ලැබී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අරමුදලින් පාලනය වන ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ එකී සියලුම පත්කිරීම් මුදල් කමිටුවේ සහ පාලක සභා අනුමැතිය ඇතිව සිදු කර ඇත. තවද භාණ්ඩාගාරයේ හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙස දන්වමින් 2014 මාර්තු 10 වන දින UP/CMD/INRC/GENERAL/01 ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මගින් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් වෙත යවා ඇත. |
| **(ඈ)** | මෝටර් රථ අළුත්වැඩියා ඒකකයේ වැඩ අධිකාරීවරයා විසින් රාජකාරී කරනු ලබන දිනයන්හිදී අදාල රාජකාරී අදාල සේවකයන් වෙත පැවරීම කරනු ලබයි. අදාල සෑම වැඩ කටයුත්තකටම පාහේ වැඩපතක් ආරම්භ කර ඇති අතර අදාල වැඩපතෙහි යොදා ඇති සේවකයන් පිළිබඳව විස්තර දක්වා ඇත. මීට අමතරව මෙම ඒකකයේ ඇති සේවක අඩුපාඩුකම් නිසා උපකුලපතිතුමාගේ අනුමැතිය ඇතිව මෙම අංශයේ සේවය කරනු ලබන කාර්මිකවරයකු සහ විදුලි කාර්මිකවරයකු |

| | |
|---|---|
| | (තමන්ගේ රාජකාරියට අමතරව) තාවකාලිකව වැඩ පරීක්ෂක හා ගබඩාපාලකට අයත් රාජකාරීවලද නියුක්තව ඇත.<br><br>මේ අනුව මෙම අංශයේ සියළුම සේවකයන් සඳහා රාජකාරි බෙදා දීමක් සිදුව ඇත. ඉංජිනේරු පීඨ කර්මාන්තශාලාවේ ඉංජිනේරු මහතා විසින් කර්මාන්තශාලාවේ එදිනෙදා කෙරෙන සෑම වැඩකටයුත්තටම පාහේ වැඩ පතක් ආරම්භකරනු ලබන අතර එම වැඩ කටයුත්ත අධීක්ෂණයට කාර්මික නිලධාරින් වෙනම අනුයුක්ත කිරීම කරනු ලැබේ. කාර්මික නිලධාරීන් විසින් එම රාජකාරියට සුදුසු වන සේවකයන් අනුයුක්ත කර ඔවුන් ලවා රාජකාරිය ඉටුකරනු ලබයි.<br>මීට අමතරව අවශ්‍ය කාල වකවානු වලදී යන්ත්‍ර නඩත්තුව ආදී කටයුතු කාර්මික නිලධාරීවරයකුගේ වැඩ අධීක්ෂණය යටතේ සුදුසු සේවකයන් අනුයුක්ත කර ඉටු කිරීම ඉංජිනේරු මහතා විසින් ඉටුකරනු ලබයි. ස්ථාවර භාණ්ඩ පොත් නඩත්තු, සුළු මුදල් පාලනය කිරීම ආදියද වෙන වෙනම කාර්මික නිලධාරීන් වෙත පවරා ඇත. මේ අනුව කර්මාන්තශාලාවේ රාජකාරි කටයුතු බෙදා හැරීම නිසි ලෙස ඉටු වී ඇත. බඳවාගත් සේවකයන් හට නියමිත පාරිශ්‍රමික ගෙවීම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ ප්‍රකාරව සිදුකර ඇත. |
| (ඉ) | මෙම සේවකයන් ස්ථිර සේවකයන් නොව පැවරුම් පදනම මත බඳවා ගත් සේවකයන් වේ. එබැවින් මු. රෙ. 71 වගන්තිය මේ සඳහා බල නොපායි. ඒ අනුව මෙහිදී සිදු වී ඇත්තේ අනුමත කාර්ය මණ්ඩලය ඇති කිරීමක් නොවන අතර පැවරුම් පදනම මත පමණක් බඳවා ගෙන වැටුප් ගෙවීමක් සිදු කර ඇති බැවිනි. කෙසේ වුවත් මේ වන විට පැවරුම් පදනම මත නිලධාරීන් පමණක් සේවයේ යොදවා ඇත. |
| (ඊ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය පසුගිය කාලසීමාව තුළ ඉතා සීඝ්‍ර දියුණුවකට ලක්වෙමින් පැවැති අතර, නව පීඨ, දෙපාර්තමේන්තු සහ ආයතන සැළකිය යුතු සංඛ්‍යාවක් ඊට එකතුවී ඇත. ඒ අනුව ශිෂ්‍ය සංඛ්‍යාව, ආචාර්ය මණ්ඩලය, අනධ්‍යයන සේවකයින් මෙන්ම ගොඩනැගිලි සංකීර්ණ ද අළුතින් එකතුවී ඇත. මෙම වර්ධනයට සාපේක්ෂව ආරක්ෂක වියදම් මෙන්ම අනෙකුත් පුනරාවර්තන වියදම්ද වැඩිවීම තර්කානුකූලය. විගණන විමසුමෙහි මෙම වර්ධනීය තත්ත්වය නොසළකා 2010 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය ස්ථාවරව පවතීයයි උපකල්පනය කොට ගණනය කිරීම් සිදුකර ඇති බැවින්, අපේක්ෂිත වර්ධන ඉලක්ක සඳහා වන ගැලපීම් නොසළකා හැර ඇති බැවින් මෙම ගණනය කිරීම් නිවැරදි නොවේ<br><br>**2010 වර්ෂයේ සිට වර්ධනය වූ පීඨ, දෙපාර්තමේන්තු, පශ්චාත් උපාධි ආයතනවල විස්තර පහත දැක්වේ.**<br><br>(see table below)<br><br>ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි ක්‍රමය සකස්ව ඇත්තේ දිනකට පැය 24 සේවා කාලයක් වෙනුවෙනි. මෙය සාමාන්‍යයෙන් පැය 08 සේවා මුර 03 ක් ලෙසට ආවරණය කරනු ලබයි. ඒ අනුව ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට සේවය සපයනු ලබන සේවා ස්ථාන 28 සඳහා පහත පරිදි ආරක්ෂක නියාමකයන් අවශ්‍ය වේ.<br><br>28 x 3 = 84<br>5% නිවාඩු = 04 |

| අංශය | අළුතින් යෙදවූ ආරක්ෂක නියාමක සංඛ්‍යාව |
|---|---|
| සමසෞඛ්‍ය විද්‍යා පීඨය | 06 |
| නීති දෙපාර්තමේන්තුව | 02 |
| කළමනාකරණ දෙපාර්තමේන්තුව | 02 |
| පශු ශික්ෂණ රෝහල | 04 |
| කලා පශ්චාත් උපාධි ආයතනය | 02 |
| වැඩ දෙපාර්තමේන්තු කාර්යාල පරිශ්‍රය | 02 |
| එකතුව | **18** |

එසේ නමුත් දැනට සේවයේ නිරතව සිටිනුයේ ආරක්ෂක නියාමකයන් 60 දෙනකු වන අතර, දෛනික සේවා අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ආරක්ෂක නියාමකයන් 28 දෙනකුගේ හිගයක් පවතී.

**මෙම හිගය මාසයකට වැඩ කරන පැය ගණනින් පහත දැක්වේ.**

28 x 192=5,376

මෙම පැය 5,376 ක හිගය පියවීම සඳහා සිටින ආරක්ෂක නියාමකයන් අතිකාල සේවයේ යෙදවීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු අතර, එසේ නොමැත්තේ නම්, බිලියන ගණනක් වටිනා විශ්වවිද්‍යාල දේපල අනාරක්ෂිත තත්ත්වයට පත්වන අතර, විශ්වවිද්‍යාලයේ නීතිය හා සාමය පවත්වා ගැනීමත්, සාමකාමී අධ්‍යයන වටපිටාව පවත්වා ගැනීමත් සිදුකළ නොහැකි කාර්යයක් වේ.

විශේෂ ආරක්ෂක අවශ්‍යතා නිර්මාණය වන උපාධි ප්‍රදානෝත්සවයන්, පර්යේෂණ සැසි, සම්මන්ත්‍රණ ආදිය හේතුවෙන් මෙම සාමාන්‍ය ආරක්ෂක අවශ්‍යතාවය ඉක්මවා යන තත්ත්වයන් බොහෝ අවස්ථාවල ඇතිවන අතර, එබඳු අවස්ථාවලදී ද සිටින ආරක්ෂක නියාමකයන් අතිකාල සේවයේ යෙදවීමට සිදුවන බැවින් මෙම පැය ගණන් ඉක්මවා යන කාලයන් සඳහාද අතිකාල සේවයේ යෙදවීමට සිදුවන ඇත.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.**

| | |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 01 |
| ආරක්ෂක පරීක්ෂක | 11 |
| ආරක්ෂක නියාමක | 97 |
| | 110 |
| කම්කරු | 01 |
| | 111 |
| මහඉලුප්පල්ලම කෘෂි ගොවිපල | 07 |
| | **118** |

**දැනට සේවයේ යොදවා ඇති ආකාරය**

| | |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 01 |
| ආරක්ෂක පරීක්ෂක | 08 |
| ආරක්ෂක නියාමක | 60 |
| | 69 |
| රක්නා ආරක්ෂක ලංකා සමාගම | 117 |
| | **186** |

**මේ අනුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවය සඳහා ඇති පිරිස**

186
118
**68**

මෙම අනුමත සංඛ්‍යාව 1970 දශකයේ පමණ අනුමැතිය ලබාගත් සංඛ්‍යාවක් වන අතර, එම කාලයේ සිට මේ දක්වාම විශ්වවිද්‍යාලය පීඨ 08 ක් සහ ශිෂ්‍ය සංඛ්‍යාව 12,000 ක් දක්වා වර්ධනය වී ඇත. ආචාර්ය මණ්ඩලය, අනධ්‍යයන සේවකයන් ඇතුළු සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව 20,000 කට ආසන්න වේ. එසේ නමුත් එම වර්ධනයට සාපේක්ෂකව ආරක්ෂක සේවය සඳහා වන අනුමත සේවක සංඛ්‍යාව ක්‍රමිකව වර්ධනය වී නැත. ආරක්ෂක සේවය අත්‍යාවශ්‍ය සහ අනිවාර්ය සේවයක් වන බැවින් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් 68 දෙනකු සේවයේ යොදවා ගැනීමට සිදුව ඇත.

| | |
|---|---|
| **(උ)** | සියලු පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. |
| **5.** | **ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය** |
| **5.1** | **සංයුක්ත සැලැස්ම** |
| **(අ)** | 2015 වර්ෂයේ සිට නියමිත දිනට පෙර යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ලබාදීමට කටයුතු කර ඇත. |
| **(ආ)** | විශ්වවිද්‍යාලයේ එක් එක් මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම සංයුක්ත සැලැසුම් සහ ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කරනු නොලබන අතර තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයද ඒකරාශි කරගෙන සමස්ථ විශ්වවිද්‍යාලය සඳහාම සංයුක්ත සැලස්ම සහ ක්‍රියාකාරී සැලස්මක් දැනටමත් පිළියෙල කර ඇත. |
| **5.2** | **ක්‍රියාකාරී සැලැස්ම** |
| **(අ)** | විගණන විමසුමට ප්‍රධාන හේතුව වන්නේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී සියලු විස්තර සහිතව සකස්කළද, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වල නිර්දේශ වලට අනුව සැකසීමට සිදුවීමයි. එනම් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සියලු වියදම් ශීර්ෂ 9 ක් යටතේ ගොනු කලද, ක්‍රියාකාරී සැලැස්ම සෑදීමේදී එකී වියදම් වර්ගීකරණය පිළිබඳව සලකා බලනු නොලැබේ. උදහරණයක් ලෙස උසස් විශිෂ්ට පරීක්ෂකයන් කැඳවා පරීක්ෂණ කමිටුවලට සූදනම් කිරීම හා සම්බන්ධීකරණය සඳහා රු. 5,000,000.00 වැය කල යුතු බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වුවද එකී වියදම මූල්‍ය ප්‍රකාශයේ සෘජුවම සඳහන් නොවුවද, එකී වියදම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය තුල වියදම් වල ඇතුලත් වේ. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛණය පදනම් කරගෙන සියලු වියදම් දරා ඇත |
| **(ආ)** | සංයුක්ත සැලැස්ම යටතේ 2013 - 2017 යන වර්ෂ 04 සඳහා අපේක්ෂිත පිරිවැය දක්වා ඇති අතර 2013 වර්ෂය සඳහා සකස් කල ක්‍රියාකාරී සැලැස්මෙහි 2013 වසරට අපේක්ෂිත පිරිවැය/අයවැයගත වටිනාකම පමණක් දක්වා ඇත. ඒ අනුව මෙම වෙනස අවුරුදු 05 ක ඇස්තමේන්තුගත වටිනාකම හා 2013 වර්ෂයේ පමණක් ක්‍රියාකාරී සැලැස්ම සමඟ නිවැරදි නොවේ. |
| **5.3** | **පාලක සභා රැස්වීම** |
| | PED / 12 චක්‍රලේඛණයේ 4.2.2 ප්‍රකාරව විශ්වවිද්‍යාලය මඟින් පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු සියලුම ලේඛණ 2014 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.<br>එමෙන්ම ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණ හා පැරණි, නිෂ්ක්‍රීය හා සෙමෙන් චලනය වන තොග යන ලේඛන PED / 12 චක්‍රලේඛනයේ 4.2.2 ප්‍රකාරව සඳහන් නොවන බැවින් පාලක සභාව වෙත ඉදිරිපත් නොකළ බව දන්වා සිටිමි. |

**5.4 අභ්‍යන්තර විගණනය**

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය තුල ස්ථාපිත කර ඇති තවත් එක් මධ්‍යස්ථානයක් වන අතර අභ්‍යන්තර විගණන අංශය විසින් පිලියෙල කරනු ලබන විගණන සැලැස්මට මෙකී මධ්‍යස්ථානයද ඇතුළුව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන දෙපාර්තමේන්තු 74 කින් සමන්විත පීඨ 8 ක්, පරිපාලන සහ මුදල් අංශ 51 ක්, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතන 2 ක් සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ඇතුළුව මධ්‍යස්ථාන 17 කින් සමන්විත අතර අභ්‍යන්තර විගණන අංශය මඟින් මෙම ඒකකවලින් 90% ක් පමණ ආවරණය වන පරිදි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කර ඇත. අභ්‍යන්තර විගණන අංශයේ දිනපතා රාජකාරි (Routine duties) ලෙස පාරිතෝෂික දීමනා පූර්ව විගණනය, අර්ථසාධක අරමුදල් මුදවා හැරීම පූර්ව විගණනය, කොන්ත්‍රාත් බිල්පත් පූර්ව විගණනය සිදු කරනු ලැබේ. තවද, රජයේ විගණන විමසුම් සඳහා අදාල අංශ වලින් ලැබෙන පිළිතුරු පරීක්ෂා කිරීම සහ සැකසීම සම්බන්ධීකරණය සිදු කළ අතර, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය මඟින් කලින් කලට නියම කරනු ලබන වෙනත් රාජකාරී කටයුතු ද සිදු කරන ලදී.

2007 වසරේ සිට 2014 වසර දක්වා අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉටුකල කාර්යයන් සහ අංශයේ සේවා නියුක්තිකයන් ගණන පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් දක්වා ඇති අතර එකී කාල සීමාව ආවරණය වන පරිදි සකස් කළ කාර්තුමය සහ අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ලක්ම අදාල කාලසීමාවන් අවසානයේදී විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව මඟින් සමාලෝචනය කිරීමෙන් පසුව නිර්දේශ කර ඇත.

2008 දෙසැම්බර්, 2009 ජනවාරි සහ 2010 දෙසැම්බර් යන මාසවලදී (අවස්ථා 3කදී) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයන් සිදුකර ඇත.

i. බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා හා බැංකු ජංගම ගිණුම්වල පවතින මුදල් ආයෝජනය කිරීමේ හැකියාව පිළිබඳව පරීක්ෂා කිරීම.
ii. භාණ්ඩ සහ සේවා මිලදී ගැනීම පිළිබඳව අභ්‍යන්තර පාලනය පරීක්ෂා කිරීම.
iii. භාණ්ඩ වට්ටෝරු ලේඛන පරීක්ෂා කිරීම.
iv. පාරිභෝගික භාණ්ඩ භෞතික පරීක්ෂාව හා ලේඛනගත කිරීම පරීක්ෂාව.
v. සුළු මුදල් භෞතික පරීක්ෂාව සහ සුළු මුදල් වවුචර්පත් පරීක්ෂාව.
vi. ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීම පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පරීක්ෂාව

ඉහත අංක ii සිට vi දක්වා අයිතමයන් පිළිබඳව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකලද වාර්තා නිකුත් කර නොමැත. ඉහත අංක (i) හි සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව අභ්‍යන්තර විගණනයන් සිදු කර 2010.03.24 දිනැති IA/UP/OBS/2010/04 අංක දරණ "Possibility of Investing Excess Cash Idling in Bank Current Accounts" සහ 2011.07.30 දිනැති IA/UP/CH6/2011/06 අංක දරණ "Checking of Bank Reconciliation Statements" යන අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර ඇත. තවද 2014.09.30 දිනැති අභ්‍යන්තර පාලන පද්ධති පරීක්ෂාව නැමැති අභ්‍යන්තර විගණන වාර්තාව අභ්‍යන්තර විගණන අංශය මඟින් නිකුත් කර ඇත.

එබැවින් අභ්‍යන්තර විගණන අංශය විසින් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පිහිට වූ 2004 වර්ෂයේ සිට විගණන දිනය වූ 2014 ජනවාරි 08 වන දින දක්වා එම මධ්‍යස්ථානය තුල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී ඇත.

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

**(අ)** ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු සියලු ව්‍යාපෘති කාර්යයන් හා අදාල මිලදී ගැනීම් ඇතුළත් කරනු ලැබුවද විශ්වවිද්‍යාල වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ දී ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ ව්‍යාපෘති වලින් ප්‍රමුඛතා පදනම මත ව්‍යාපෘති තෝරාගැනීමට සිදුවේ. සම්පූර්ණ වාර්ෂික ඇස්තමේන්තුව සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ප්‍රතිපාදාන ලබා නොදෙන බැවින් එලෙස තෝරාගත් ව්‍යාපෘති සඳහා කළ ඇස්තමේන්තු නැවත වරක් අනුමත වූ වාර්ෂික අයවැයට අනුව සංශෝධනය කිරීමට සිදුවේ. එම හේතුව මත මෙලෙස ප්‍රසම්පාදන සැලැස්ම හා ඇස්තමේන්තු අතර වෙනසක් පවතී.

**(ආ)** ප්‍රසම්පාදිත ප්‍රවාහන වියදම් ප්‍රසම්පාදන සැලැස්මෙහි කොන්ත්‍රාත් පදනම මත ලබා ගන්නා සේවා යටතේ කුළී හා ගාස්තු යටතේ ඇතුළත් වේ. සන්නිවේදන ගාස්තු හා තැපැල් ගාස්තු අනිවාර්යය වියදම් වන බැවින් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොමැත.

| 5.6 | **අයවැය ලේඛණමය පාලනය** |
|---|---|
| **(අ)** | මෙම අරමුදල් වෙන් කිරීම හා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් අතර ප්‍රමාණාත්මක වෙනසක් සෑම වසරකම ඇති අතර විශ්වවිද්‍යාලය කටයුතු කරන්නේ සත්‍ය අරමුදල් ප්‍රතිපාදන මතය. මේ නිසා අයවැය ලේඛනය වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීම අසීරු කරුණක් වන අතර වියදම් පාලනය තුළින් අයවැය හා සත්‍ය වියදම් අතර නිරතුරුවම විචලනයන් දක්නට ඇත. |
| **(ආ)** | පහත සඳහන් පරිදි වාර්ෂිකව විශ්වවිද්‍යාලීය සේවකයන්ගේ වැටුප් වැඩිවීම මත අයවැයගත හා සත්‍ය පිරිවැය විචලනයන් ඇති වී ඇත. |

| විෂයය | 2013 | | |
|---|---|---|---|
| | අයවැයගත වියදම | සත්‍ය වියදම | අයවැයගත ඉක්මවා දරා ඇති වියදම |
| අධ්‍යයන අර්ථසාධක | 86,788,500.00 | 111,099,881.00 | 24,311,381.00 |
| අධ්‍යයන විශ්‍රාම වැටුප් | 16,941,500.00 | 25,275,975.00 | 8,334,475.00 |
| සේවක භාරකාර අරමුදල | 17,326,000.00 | 27,325,291.00 | 9,999,291.00 |
| අධ්‍යයන දීමනා | 214,870,000.00 | 294,998,039.00 | 80,128,039.00 |
| පාරිතෝෂික | 9,267,000.00 | 50,104,501.00 | 40,837,501.00 |
| පර්යේෂණ දීමනා | 90,000,000.00 | 129,211,907.00 | 39,211,907.00 |
| **අනධ්‍යයන** | | | |
| අතිකාල දීමනා | 75,427,000.00 | 85,671,237.00 | 10,244,237.00 |
| පාරිතෝෂික අනධ්‍යයන | 37,654,000.00 | 45,094,268.00 | 7,440,268.00 |

(02) අය වැය පාලනය

(අ) **විශ්වවිද්‍යාල අර්ථසාධක, විශ්‍රාම වැටුප්, සේවක භාරකාර අරමුදල්, පාරිතෝෂික හා අතිකාල දීමනා**

2013 වර්ෂයට අදාල අය වැය ලේඛණය 2012 වර්ෂයේ මැද භාගයේදී සකස් කරනු ලබන අතර එහිදී 2012 වර්ෂයේ අය වැය ඇස්තමේන්තු හා සත්‍ය වියදම් පදනම් කරගෙන ඉදිරි වර්ෂය සඳහා අය වැය සකසනු ලැබේ. ඉහත ඇස්තමේන්තු වියදම අභිබවා සත්‍ය වියදම වැඩි වීම සඳහා පහත කරුණු සෘජුවම බලපා ඇත.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2013, 03/2013 (i), 3/2013 (ii) යන චක්‍රලේඛන මඟින් වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ඒ තුළින් සෑම සේවකයෙකුගේම මූලික වැටුප වැඩිවීම.

II. ජීවන වියදම් දීමනාව, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික ගණනය කිරීම සඳහා යොදා ගැනීම.

III. වාර්ෂික වැටුප් වර්ධකයන් පැවති අගයන් වලට වඩා සමාලෝචිත වර්ෂයේදී වැඩිවීම.

**පර්යේෂණ දීමනා**

2013 වර්ෂයේ පර්යේෂණ දීමනා සත්‍ය වියදම අයවැයගත වියදම ඉක්මවීමට ඉහත කරුණු වලට අමතරව 2013 වසරේ පර්යේෂණ දීමනා ඉල්ලුම් කළ ප්‍රමාණය 2012 වසරට සාපේක්ෂව වැඩිවීම යන කරුණු සෘජුව බලපා ඇත.

**අධ්‍යයන දීමනා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1000 අනුව 2013 වර්ෂයේදී අධ්‍යයන දීමනාව විශාල ප්‍රතිශතයකින් ඉහළ දැමීම අධ්‍යයන දීමනා සත්‍ය වියදම් ඇස්තමේන්තු වියදම අභිබවා යාමට හේතු වී ඇත.

(ආ) **අධ්‍යයන, අනධ්‍යයන විශේෂ දීමනා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 998 මඟින් විශ්වවිද්‍යාල සේවකයන් සඳහා රු. 2,500.00 ක විශේෂ දීමනාවක් 2013 වර්ෂයේ නොවැම්බර් මස සිට ගෙවීම මේ සඳහා බලපා ඇති අතර මේ වන විට 2013 වර්ෂයේ අය වැය ලේඛනය පිළියෙල කර ඇති බැවින් මෙම දීමනා අය වැය ලේඛනයට ඇතුලත් වී නොමැති බව දන්වමි.

විශ්වවිද්‍යාලය විසින් සිය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී පවත්නා වියදම් පරිමාව හා ඉදිරි සැලසුම් හා මිල විචලනයන් මෙන්ම මහා භාණ්ඩාගාරයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අප වෙත ලබා දිය හැකි යැයි නිගමනය කරනු ලබන මුදල මත ගණනය කරනු ලබයි.

මෙම අරමුදල් වෙන් කිරීම හා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් අතර ප්‍රමාණාත්මක වෙනසක් සෑම වසරකම ඇති අතර විශ්වවිද්‍යාලය කටයුතු කරන්නේ සත්‍ය අරමුදල් ප්‍රතිපාදන මතය. මේ නිසා අයවැය ලේඛනය වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීම අසීරු කරුණක් වන අතර වියදම් පාලනයේ දී අයවැය හා සත්‍ය වියදම් අතර නිරතුරුවම විචලනයන් දක්නට ඇත. කෙසේ වුවද 2015 වර්ෂයේදී විචලනයන් අවම කර ගැනිමට කටයුතු කරනු ලැබේ.

පහත දැක්වෙන සත්‍ය වියදම් විශේෂිත හේතු මත 2013 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම ඉක්මවා ඇත.

(1) **සන්නිවේදන වියදම**

2013 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට විශ්වවිද්‍යාලය වෙත LEARN ආයතනය මඟින් ලබා ගනු ලබන අන්තර් ජාල සම්බන්ධතාවයන් සඳහා ප්‍රවේශවීමේ ධාරිතාවයන් 1560Kbps සිට 5000Kbps දක්වා වැඩි කිරීම සිදුකළ අතර, එම නිසා ඒ සඳහා වැය වන ගාස්තු ප්‍රමාණයන් ඉහල යාම සිදුවිය. ඒ අනුව රු.982,650/- ක් පමණ වූ මාසික බිල්පත රු.2,710,640/- ක් පමණ දක්වා වැඩිවිය (275% ක්වූ ප්‍රතිශතයක්). එසේම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ අන්තර්ජාල ප්‍රවේශවීමේ ධාරිතාවද වැඩිකරන ලද අතර, රු. 135,390/- වූ මාසික බිල්පත රු.355,420/- දක්වා වැඩි විය. (262%ක්)

2013 වසරේ ඇඟිලි සලකුණු යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහාද දොඩම්ගොල්ල ගොවිපල සඳහාද ADSL සම්බන්ධතාවයන් ලබා ගත් අතර, ඒ සඳහාද බිල්පත් පියවීමට සිදුවිය.

කොන්ත්‍රාත් පදනම මත ශිෂ්‍ය නේවාසිකාගාර ලෙස ලබා ගනු ලැබූ නිවාස සහ විශ්වවිද්‍යාලය සමග සන්නිවේදන සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා නව දුරකථන පහසුකම් ලබා ගැනීමට කටයුතු කොට ඇති අතර, ඒ සඳහාද අමතර බිල්පත් ගෙවීමට සිදුවිය.

2013 වසරේදී විධායක නිලධාරීන් නව දෙනෙකු ස්ථාන මාරු ලැබීමෙන් /නව පත්වීම් ලබා ගැනීමෙන් විශ්වවිද්‍යාලයට පැමිණි අතර, එම නිලධාරීන් සඳහා දුරකථන බිල්පත් සඳහා ගාස්තු ගෙවීම සිදුවිය.

2013 වර්ෂයේදී අළුතෙන් ඉදිකල වැඩ ආරම්භ කරන ලද පශු වෛද්‍ය රෝහල, භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය, දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය සඳහා සන්නිවේදන පහසුකම් සැපයූ අතර, ඒ සඳහා ගෙවීම් කිරීමට සිදුවිය.

(2) **සංග්‍රහ වියදම්**

විදේශ දූත මණ්ඩලයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත පැමිණීම 2013 වර්ෂයේ දී ඉහළ ගොස් තිබීම සංග්‍රහ වියදම් ඉහළ යාමට විශේෂයෙන් හේතු විය.

| | |
|---|---|
| | (3) **කුලී ගාස්තු**<br><br>2013 වර්ෂයේ වෛද්‍ය කෘෂි හා සම සෞඛ්‍ය පීඨයන් සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම්, ඇස්තමේන්තුගත වියදම් ඉහල යාමට හේතු විය.<br><br>(4) **වරිපනම් හා බදු**<br><br>ආදායම් වෙනුවෙන් රඳවා ගැනීම් බදු ගෙවීම් හේතුවෙන් ඉහල ගොස් ඇත.<br><br>(5) **මුද්‍රණ හා ප්‍රචාරණ වියදම්**<br><br>2014 වර්ෂය වෙනුවෙන් වැඩිපුර සිසුන් 2569 ක් බඳවා ගැනීම සඳහා පහසුකම් සැපයීම පවත්නා පුරප්පාඩු පිරවීම යනාදී කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේ ප්‍රචාරණ වියදම් හා ශිෂ්‍ය අත්පොත් ඇතුළු ශිෂ්‍ය කටයුතු සම්බන්ධ මුද්‍රණ වියදම් ඉහල යාමත් විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයන් හි තත්ත්වය වැඩි දියුණු කිරීමට පියවර ගැනීමත් ප්‍රකාශනයන් වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කිරීමට සිදුවීමත් හේතුවෙන් අනුමත වූ ඇස්තමේන්තුගත වියදම ඉක්මවා ඇත.<br><br>(6) **විදුලිය වියදම්**<br><br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2013 වර්ෂය සඳහා බඳවා ගනු ලැබූ නවක සිසුන්ගේ නේවාසිකාගාර වශයෙන් කොන්ත්‍රාත් පදනම මත ලබා ගනු ලැබූ නිවාස 06 ක් සඳහා විදුලි ගාස්තු ගෙවීමට සිදුවිය.<br><br>විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘති සඳහා විදුලිය සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීම විශ්වවිද්‍යාලය මගින් සිදුකරනු ලබන අතර. එම ව්‍යාපෘතිය අවසානයේදී එම විදුලිය සැපයීම වෙනුවෙන් වැයවූ මුදල ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ අය කර ගැනීම සිදුවේ. ඒ අනුව 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති 72 ක් සඳහා විදුලි ගාස්තු විශ්වවිද්‍යාල බිල්පත්වලට ඇතුලත්ව ඇත.<br><br>ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සන්නිවේදන හා විදුලි වියදම් ඇස්තමේන්තු ගත වියදම ඉක්මවා වියදම්වී ඇත.<br><br>(7) **තැපැල් ගාස්තු**<br><br>2012/2013 අධ්‍යයන වර්ෂයට අදාලව 2013 වසරේදී විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවූ අතර, එම සිසුන් සංඛ්‍යාවට අදාලව වැඩි මුද්දර ගාස්තු ප්‍රමාණයක් වැය කිරීමට සිදුවිය.<br><br>2013 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයට අදාල ලිපි යොමු කිරීමේදී වැඩි වූ ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව ලිපි යැවීමට සිදුවූ බැවින් ඒ සඳහා වැඩි මුද්දර ගාස්තුවක් දැරීමට සිදුවිය.<br><br>(8) **වාහන නඩත්තු**<br><br>මෙම විශ්වවිද්‍යාලය වෙත අළුතින් වාහන මිලදී ගැනීමට කටයුතු කර ඇති අතර අළුතින් ලබා ගත් වාහන, වාහන ඒජන්තවරු වෙතම යොමු කොට අළුත්වැඩියා සිදුකරන බැවින් ඒවායේ නඩත්තුව සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වී ඇත. ඊට අමතරව අළුත්වැඩියාව සඳහා අමතර කොටස්වලද මිල නිතර ඉහත වන බැවින් වාහන නඩත්තුවේ දී ඇස්තමේන්තු අගය ඉක්මවා ගොස් ඇත.<br><br>(9) **ප්‍රවාහන**<br><br>විශ්වවිද්‍යාලයට වාහන සපයා දීමට නොහැකි සෑම අධ්‍යයන හා රාජකාරී ගමනක් සඳහාම පෞද්ගලික අංශයෙන් ප්‍රවාහන පහසුකම් සපයා දීමට සිදුවී ඇත. රාජකාරී අවශ්‍යතා හේතුවෙන් ඉල්ලුම් කරන ප්‍රවාහන අවශ්‍යතා ලබා දිය යුතුව ඇති බැවින් ඇස්තමේන්තු වියදම ඉක්මවා ප්‍රවාහන වියදම දැරීමට සිදු වී ඇත. එසේම විශ්වවිද්‍යාල සිසුන් ප්‍රවාහයට හා විනයාරක්ෂක අංශය වෙත අත්‍යාවශ්‍ය සේවා සඳහා සැපයූ වාහන සඳහා වියදම් දැරීමට සිදුවේ.<br><br>(10) **ශිෂ්‍ය සංවර්ධන වියදම්**<br><br>2013 වර්ෂයේ ඉක්වදෝරයේ පැවැති ලෝක යොවුන් හා ශිෂ්‍ය උළෙල සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් එයට සහභාගි වීම පිණිස ඉදිරිපත් කරන ලද සිසුන් වෙනුවෙන් ගෙවූ ගුවන් ටිකට්පත් හා අනිකුත් දීමනා සඳහා වූ රු. 700,000 ක (රු. 350,000.00 බැගින්) මුදල මෙම ශිෂ්‍ය සංවර්ධන වියදම් යටතේ උපකුලපති අනුමැතියට යටත්ව ගෙවන ලදී. |

| | |
|---|---|
| | (11) **අනධ්‍යයන කාර්ය මණ්ඩල වියදම් - පාරිතෝෂික**<br><br>03/2013 චක්‍රලේඛනයට අනුව 2013 වසරේ වැටුප් වැඩිවීමක් සිදු වී ඇති අතර පාරිතෝෂික දීමනා ගණනය කිරීමේ දී එම වැටුප් වැඩිවීමද අදාල කරගෙන ඇත. ඊට අමතරව විශ්‍රාම ගිය සහ සේවයෙන් ඉල්ලා අස් වූ සේවක සංඛ්‍යාව මෙම වර්ෂය තුළදී වැඩි වී ඇත. |
| **(ඇ)** | M.Phil හා phd උපාධි අපේක්ෂකයන් හට විදේශීය ආයතන වල පාඨමාලා හැදෑරීම සඳහා වසර පුරාවටම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් අරමුදල් පිරිනමන ලදි. කෙසේ වෙතත් මෙම අරමුදල් පිරිනැමීමේ දී සීමිත සංඛ්‍යාවක් තෝරා ගන්නා අතර එසේ කිරීමට හේතුව වූයේ අයදුම්පත් ඇගයීමේ දී ඔවුන්ගේ පුහුණු පාඨමාලාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය ඉහළ නැංවීමට දායකත්වය ලබා දේ නම් පමණක් ඔවුන් තෝරාගැනීම නිසාවෙනි. |
| **(ඈ)** | 2015 වර්ෂයේ සිට අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| **6.** | **පද්ධති හා පාලනයන්** |
| (අ) | විශ්වවිද්‍යාලය වෙත විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සියල්ලම ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇති බව දන්වන අතර යම් යම් අවස්ථාවලදී ගිණුම් අතර ගිණුම් වර්ග කිරීමේ දෝෂයන් පැවතියද සියලුම ආදායම් රජයේ ප්‍රදානද ඇතුළුව ගිණුම්වලට ගෙන ඇති බව දන්වමි. |
| (ආ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව දින 14 ක් ඇතුලත ලබා ගන්නා අත්තිකාරම් පියවන ලෙසට විශ්වවිද්‍යාලයේ සියලුම නිලධාරීන් දැනුවත් කර චක්‍ර ලේඛන නිකුත් කර ඇති අතර එකී චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව මේ වන විට අත්තිකාරම් පියවීමට කටයුතු කර ඇත. |
| (ඇ) | ප්‍රධාන ගබඩා හතරට අදාල තොග පාලන කටයුතු නිවැරදි හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මේ වන විට නොයෙකුත් තොග පාලන ක්‍රම හඳුන්වා දී ඇති අතර තොග සම්බන්ධ ලැබීම්, නිකුත් කිරීම් හා තොග පවත්වාගෙන යාමේදී පවතින බොහොමයක් දුර්වලතා හඳුනාගෙන ඇති අතර ඒවා නිවැරදි හා කර්යක්ෂම කරගැනීම සඳහා අවශ්‍ය පියවරයන් මේ වන විට ගබඩා කළමණාකරන අංශය මගින් ගෙන ඇත.<br><br>මේ වන විට ප්‍රධාන ගබඩාව තුල තොග පවත්වාගෙන යාමට අවශ්‍ය විවිධ තොග මට්ටම් හඳුන්වා දී ඇති අතර එහිදී ගබඩාව තුල තොග ඌනතාවයකින් තොරව තොග පවත්වාගෙන යාමට හැකි වී තිබේ. ආරක්ෂිත තොග මට්ටම, අවම තොග මට්ටම, යළි ඇනවුම් මට්ටම, උපරිම තොග මට්ටම ආදි තොග මට්ටම් හඳුන්වා දී ඇති අතර මෙමගින් තොග සම්බන්ධ කටයුතු කාර්යක්ෂම වී ඇත.<br><br>එසේම ගබඩාවල තොග පාලනයන් නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා බින් කාඩ්පත් පවත්වාගෙන යාම අනිවාර්ය කරන ලදි. එහිදී ප්‍රධාන ගබඩාවලට අමතරව විශ්වවිද්‍යාලයේ තොග පවත්වාගෙන යන අනෙකුත් දෙපාර්තමේන්තු, අංශ හා ශිෂ්‍ය නේවාසිකාගාර ආදි අංශවලටද මෙම බින් කාඩ්පත් ක්‍රමය හඳුන්වා දෙන ලදි.<br><br>ප්‍රධාන ගබඩා හතරට අදාලව මාසික තොග ශේෂයන් ගබඩා කළමණාකරන අංශය වෙත ලබා ගන්නා අතර එහිදී තොග ඌනතාවයන් හඳුනාගෙන ඒ පිළිබඳව ගබඩාවලින් විමසා නිවැරදි තොග මට්ටම් පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.<br><br>මේ වන විට ගබඩාවල භාවිතා කරන තොග ලෙජර නව ආකෘතියකට අනුව සකස් කර ඇති අතර තොග ලැබීම්, නිකුත් කිරීම් හා තොග ශේෂයන් වල සියළු තොරතුරු ඇතුලත්ව එනම් ප්‍රමාණය, ඒකක මිල හා මුළු වටිනාකම් ඇතුලත් වල අතර තොග පොත පරීක්ෂාවෙන් අදාල තොගය සම්බන්ධ සියළු තොරතුරු ලබා ගත හැක.<br><br>මේ ආකාරයට තොග පවත්වාගෙන යාම සම්බන්ධව ගබඩා කළමණාකරන අංශය මගින් නිරන්තර අවධානයකින් සිටින අතර ගබඩා භාරකරුවන් හා අනෙකුත් ගබඩා කටයුතු සම්බන්ධ සේවකයින් දැනුවත් කිරීම ගබඩා කළමණාකරන අංශයේ සහකාර මූල්‍යාධිකාරීවරයා විසින් නිරතුරුව සිදුකරයි. ඒ අනුව වර්තමානය වන විට තොග සම්බන්ධ කටයුතු සාර්ථකව සිදුවන අතර මින් ඉදිරියට දැනට පවතින අඩුපාඩු දුර්වලතා හඳුනාගෙන ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමුකරන බව දන්වනු කැමැත්තෙමි. |
| (ඈ) | සෑම විටම විශ්වවිද්‍යාලයේ සියලුම වාහන ලියාපදිංචි කිරීම ඒ හා අදාල ලේඛණ නිසිපරිදි පවත්වාගෙන යන අතර හානි වාර්තා කිරීමේ දී යම් යම් අවස්ථාවලදී ප්‍රමාදයන් සිදුවුණු සියලු හානි වාර්තා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වමි. කෙසේ වුවත් හානි වාර්තා කිරීම සම්බන්ධයෙන් නිළධාරීන්ගේ ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |

<table>
<tr><td>(ඉ)</td><td>

**පර්යේෂණ ප්‍රධාන උපයෝජන**

වර්තමානය වන විට පර්යේෂණ ප්‍රධාන සඳහා ලැබෙන මුදල් උපයෝජනය ඉහල අගයක් ගන්නා බව සඳහන් කරනු කැමැත්තෙමි. මෙහිදී බොහෝ  පර්යේෂණ ඌන උපයෝජනය දැක්වීමට ප්‍රධාන හේතුව වන්නේ එකී  පර්යේෂණ පවත්න ස්වභාවය නිසාවෙනි. උදාහරණයක් ලෙස බොහෝ පරීක්ෂණ වසරකට වඩා වැඩි කාලයක් ගත වේ. එකී හේතුව නිසා සෑම වසරකම එක ආකාරයෙන් වියදම් බලාපොරොත්තුවිය නොහැකි අතර සමහර වසර වල ඉතා විශාල ලෙස වියදම් දැරීමට සිදුවන අතර සමහර වසරවල ඉතා අඩු වශයෙන් වියදම් දැරීමට සිදු වේ.

කෙසේ වෙතත් පසුගිය වසර තුල පර්යේෂණ අරමුදල් උපයෝජනය පිළිබඳව ලද විගණන විමසුම් නිසාවෙන් විශ්වවිද්‍යාලය පහත තීරණවලට එළඹිය.

1. නියමිත කාලය තුලදීම පර්යේශණ කටයුතු අවසාන කලයුතු බවට තීරණය කිරීම.

2. මුල් අදියරේදී  පර්යේෂණ  වටිනාකමින් 20% ක් නිදහස් කිරීම හා පර්යේෂණ ප්‍රගතිය අනුව ඉතිරි මුදල් නිදහස් කිරීමට නියම කිරීම.

3. එක් පරීක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් පර්යේෂණයක් පමණක් ලබා දීම.

ඉහත තීරණ හේතුවෙන් පරීක්ෂණ සඳහා ලබා දුන් මුදල් බොහොමයක් මේ වසරේ නිෂ්ක්‍රීය මට්ටමේ නොවන බවත් ඉදිරියේදී තව තවත් මේ පිළිබඳව අවධානය යොමුකිරීමට සටහන් කරගෙන ඇත.

**අරමුදල් උපයෝජනය**

විශේෂයෙන්ම විවිධ දක්ෂතා ඇති සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා විවිධ දානපතියන්ගේ අනුග්‍රහයෙන් ශිෂ්‍යත්ව අරමුදල් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය සතුව පවතින අතර එම අරමුදල් උපයෝජනය කිරීමේදී සෑම විටම අරමුදල පිහිටුවීමේදී එකඟ වී ඇති නිර්ණායකයන්ට අනුකූලව මුදල් වියදම් කිරීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී. එබැවින් අපේක්ෂිත පරිදි අරමුදල් උපයෝජනය කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වුවත් එම අරමුදල් පිහිටු වීමේ දී එකඟ වී ඇති නිර්ණායකයන් පරිදිම උපයෝජනය කර ඇත.

</td></tr>
<tr><td>(ඊ)</td><td>විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල Carder අනුකූලව හැකි සෑම විටම බඳවා ගැනීම් කළ අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පීඨයන්ගේ අවශ්‍යතාවය මත අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරන අතර සුදුසුකම්ලත් ආචාර්යවරුන්ගේ ඉල්ලුම්පත් නොලැබීම මත පමණක් යම් යම් ප්‍රමාදයන් සිදු වී ඇති බව දන්වමි. කෙසේ වුවද හැකිතරම් Carder එකට අනුකූලව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(උ)</td><td>2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛයන් පදනම් කර ගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත.</td></tr>
<tr><td>(ඌ)</td><td>මහාභාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයන්ට අනුකූලව සේවක ණය ලබා දීමට කටයුතු කරන අතර ණය අයකර ගැනීමේදී යම් යම් ප්‍රායෝගික දුෂ්කරතා පැවතියද හැකි පමණ උපරිමයෙන් ණය අයකර ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(එ)</td><td>විශ්වවිද්‍යාලයේ විශාලත්වය අනුව එකවර කොන්ත්‍රාත් කාර්යයන් විශාල ගණනක් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වීම මත ඇතැම් කොන්ත්‍රාත් කාර්යයන්ගේ යම් ප්‍රමාදයන් ඇති වීම නිරීක්ෂණය වී ඇත. එබැවින් ඉදිරියේදී කොන්ත්‍රාත් පරිපාලන කාර්යයන් කෙරෙහි විශ්වවිද්‍යාල ක්‍රියාකාරීත්වයෙන් වැඩි අවධානය යොමු කිරීමට කටයුතු සලසා ඇත.</td></tr>
</table>

**මහාචාර්ය උපුල් බී දිසානායක**

**උපකුලපති**

සංඛ්‍යාලේඛණ හා තොරතුරු අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය ශ්‍රී ලංකාව
www.pdn.ac.lk